330 වන කාණ්ඩය - 08 වන කලාපය
தொகுதி 330 - இல. 08
Volume 330 - No. 08

2026 ඔක්තෝබර් 23වන සිකුරාදා
2026 ஒக்ரோபர் 23, வெள்ளிக்கிழமை
Friday, 23rd October, 2026



පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:

ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් [පිටුව 1399]

ආරක්ෂක අමාත්‍යාංශයේ ආපදා කළමනාකරණ අංශය විසින් පවත්වනු ලබන දැනුවත් කිරීමේ වැඩසටහන [පිටුව 1399]

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව [පිටුව 1401]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [පිටු 1402-1440]

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:

ජපානයේ පැවැත්වෙන 20වන ආසියානු ක්‍රීඩා උළෙල සඳහා වන ශ්‍රී ලංකා කණ්ඩායමට ෆාතිමා ශෆියා යාමික් ඇතුළත් කර නොගැනීම [පිටුව 1440]

පාසල්වලට අනුයුක්ත සංවර්ධන නිලධාරීන් ගුරු සේවයට අන්තර්ග්‍රහණය කිරීම [පිටුව 1442]

මඩකලපුව දිස්ත්‍රික්කයේ තණබිම්වල බලහත්කාරයෙන් පදිංචි වීම සහ වගා කිරීම්:

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගේ ප්‍රකාශය [පිටුව 1448]

"දිට්වා" සුළි කුණාටුවෙන් හානි වූ වාරි පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම සහ බහුකාර්ය වාරි ව්‍යාපෘතිවල වත්මන් තත්ත්වය:

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගේ ප්‍රකාශය [පිටුව 1455]

උතුරු සහ නැගෙනහිර පළාත්වල පළාත් පාලන ආයතනයන්හි පවතින මූල්‍ය, යටිතල පහසුකම් සහ පරිපාලනමය ගැටලු:

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගේ ප්‍රකාශය [පිටුව 1467]

ජලභීතිකා රෝගය තුරන් කිරීමේ සහ සුනඛයන් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත:

දෙවන වර කියවීම - විවාදය කල් තබන ලදී [පිටු 1478-1575]

කල්තැබීමේ යෝජනාව:

බෙන්තර, කරන්දෙණිය සහ ඇල්පිටිය නව සංචාරක කලාප ලෙස සංවර්ධනය කිරීම [පිටු 1576-1587]

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු [පිටු 1588-1606]

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:

பயங்கரவாதத்திலிருந்து அரசைப் பாதுகாப்பதற்கான சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு [ப: 1399]

பாதுகாப்பு அமைச்சின் அனர்த்த முகாமைத்துவப் பிரிவால் நடத்தப்பட்ட விழிப்புணர்வு நிகழ்ச்சி [ப: 1399]

அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை [ப: 1401]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 1402-1440]

தனி அறிவித்தல் மூல வினா:

ஜப்பானில் நடைபெற்ற 20ஆவது ஆசிய விளையாட்டுப் போட்டிக்கான இலங்கை அணியில் பாத்திமா ஷாபியா யாமிக் உள்வாங்கப்படாமை [ப: 1440]

பாடசாலைகளுடன் இணைக்கப்பட்டுள்ள அபிவிருத்தி உத்தியோகத்தர்களை ஆசிரியர் சேவைக்குள் உள்வாங்குதல் [ப: 1442]

மட்டக்களப்பு மாவட்டத்தில் மேய்ச்சல் நிலங்களில் அத்துமீறி குடியேறுதல் மற்றும் பயிரிடல்:

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரினது கூற்று [ப: 1448]

"தித்வா" சூறாவளியால் சேதமடைந்த நீர்ப்பாசன முறைமையைச் சீரமைத்தல் மற்றும் பலநோக்கு நீர்ப்பாசனத் திட்டங்களின் தற்போதைய நிலை:

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரினது கூற்று [ப: 1455]

வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களிலுள்ள உள்ளூராட்சி மன்றங்களில் நிலவும் நிதி, உட்கட்டமைப்பு மற்றும் நிருவாகச் சிக்கல்கள்:

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரினது கூற்று [ப:1467]

விசர்நாய்க்கடி நோயை ஒழித்தல் மற்றும் நாய்களைப் பதிவுசெய்தல் சட்டமூலம்:

இரண்டாம் மதிப்பு - விவாதம் ஒத்திவைக்கப்பட்டது [ப:1478-1575]

ஒத்திவைப்புப் பிரேரணை:

பெந்தர, கரந்தெனிய மற்றும் எல்பிட்டிய பிரதேசங்களை புதிய சுற்றுலா வலயங்களாக அபிவிருத்தி செய்தல் [ப: 1576-1587]

வினாக்களுக்கு எழுத்துமூல விடைகள் [ப: 1588-1606]

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Protection of the State from Terrorism Bill: Petition to the Supreme Court [Col. 1399]

Awareness Programme Conducted by Disaster Management Unit of Ministry of Defence [Col. 1399]

PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 1401]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1402-1440]

QUESTION BY PRIVATE NOTICE:

Non-inclusion of Fathima Shafiya Yamik from Sri Lankan Contingent for 20th Asian Games held in Japan [Col. 1440]

Absorption of Development Officers Attached to Schools into Teacher Service [Col. 1442]

ENCROACHMENT AND CULTIVATION OF PASTURELANDS IN BATTICALOA DISTRICT:

Statement by Minister of Agriculture, Livestock, Land and Irrigation [Col. 1448]

RESTORATION OF IRRIGATION SYSTEMS DAMAGED BY "DITWAH" CYCLONE AND CURRENT STATUS OF MULTI-PURPOSE IRRIGATION PROJECTS:

Statement by Minister of Agriculture, Livestock, Land and Irrigation [Col. 1455]

FINANCIAL, INFRASTRUCTURE AND ADMINISTRATIVE ISSUES OF LOCAL AUTHORITIES IN NORTHERN AND EASTERN PROVINCES:

Statement by Minister of Public Administration, Provincial Councils and Local Government [Col. 1467]

ELIMINATION OF RABIES AND REGISTRATION OF DOGS BILL:

Second Reading - Debate Adjourned [Cols. 1478– 1575]

ADJOURNMENT MOTION:

Development of Benthara, Karandeniya and Elpitiya as New Tourist Zones [Cols. 1576-1587]

WRITTEN ANSWERS TO QUESTIONS [Cols. 1588-1606]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2026 ඔක්තෝබර් 23වන සිකුරාදා
2026 ஒக்ரோபர் 23, வெள்ளிக்கிழமை
Friday, 23rd October, 2026

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්
பயங்கரவாதத்திலிருந்து அரசைப் பாதுகாப்பதற்கான சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு
PROTECTION OF THE STATE FROM TERRORISM BILL: PETITION TO THE SUPREME COURT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2026 ඔක්තෝබර් 07, 08, 20, 21 සහ 22 දිනැති නිවේදනවල සඳහන් පෙත්සම් හතළිහට අමතරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද තවත් පෙත්සමක පිටපතක් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි.

II

ආරක්ෂක අමාත්‍යාංශයේ ආපදා කළමනාකරණ අංශය විසින් පවත්වනු ලබන දැනුවත් කිරීමේ වැඩසටහන
பாதுகாப்பு அமைச்சின் அனர்த்த முகாமைத்துவப் பிரிவால் நடத்தப்பட்ட விழிப்புணர்வு நிகழ்ச்சி
AWARENESS PROGRAMME CONDUCTED BY DISASTER MANAGEMENT UNIT OF MINISTRY OF DEFENCE

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ජාතික ආපදා කළමනාකරණ ඒකාබද්ධ යන්ත්‍රණයක් සැකසීම හා 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යවස්ථාපිත කළමනාකරණ පනත සංශෝධනය කිරීම සඳහා නිර්දේශ ලබා දීමේ කමිටු වාර්තාව පිළිබඳ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමේ රැස්වීමක් ආරක්ෂක අමාත්‍යාංශයේ ආපදා කළමනාකරණ අංශය විසින් 2026 ඔක්තෝබර් 23වන සිකුරාදා, එනම් අද දින පෙරවරු 10.00 සිට මධ්‍යාහ්න 12.00 දක්වා පාර්ලිමේන්තුවේ කාරක සභා කාමර අංක 4 හිදී පැවැත්වීමට නියමිත බැවින්, ඒ සඳහා සහභාගි වන ලෙස සියලුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ගෞරවයෙන් ආරාධනය කිරීමට කැමැත්තෙමි.

III

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ සහ තේරීම් කාරක සභාවේ රැස්වීම්
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டமும் தெரிவுக் குழுக் கூட்டமும்
MEETINGS OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS AND COMMITTEE OF SELECTION

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2026 ඔක්තෝබර් 23වන සිකුරාදා, එනම් අද දින මධ්‍යාහ්න 12.00ට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් සහ එය අවසන් වූ වහාම තේරීම් කාරක සභාවේ රැස්වීමක් කාරක සභා කාමර අංක 2 හි දී පැවැත්වීමට නියමිත බැවින්, අදාළ රැස්වීම් සඳහා පැමිණ සහභාගි වන ලෙස සියලුම සාමාජික මන්ත්‍රීවරයන්ට දැනුම්දීමට කැමැත්තෙමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාතුමිය වෙනුවෙන් මම 2025 වර්ෂය සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාතුමා සහ බලශක්ති අමාත්‍යාතුමා වෙනුවෙන් මම 2025 වර්ෂය සඳහා ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් හි වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

මෙම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
PUBLIC FINANCE COMMITTEE REPORT

ගරු නිමල් පලිහේන මහතා
(மாண்புமிகு நிமல் பலிஹேன)
(The Hon. Nimal Palihena)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම, එම කාරක සභාව වෙත යොමු කරන ලද 2027 වර්ෂය සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අජිත් පී. පෙරේරා මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, නෙළුම්දෙණිය, මොරවක, ගස්නාව ජනපදය යන ලිපිනයෙහි පදිංචි ඩී.එන්. ජයවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා
(மாண்புமிகு ஆர்.எம். சமந்த ரனசிங்ஹ)
(The Hon. R.M. Samantha Ranasinghe)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) මාවනැල්ල, ගලතර, උඩුවේවෙල, බෝගහහේන යන ලිපිනයෙහි පදිංචි ජේ.බී.එල්. ජයසිංහ මහතා සහ වෙනත් අයෙකුගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) දෙවනගල, බලවත්ගම, 'කොටුවෙ වත්ත' යන ලිපිනයෙහි පදිංචි පී.එම්.ආර්. ගුණතිලක බණ්ඩා මහතාගෙන් ලැබුණු පෙත්සම.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

විදේශ රටවල සැඟවී සිටින ශ්‍රී ලාංකික අපරාධකරුවන්: විස්තර
வெளிநாடுகளில் தலைமறைவாகியுள்ள இலங்கை குற்றவாளிகள்: விபரம்
SRI LANKAN CRIMINALS HIDING IN FOREIGN COUNTRIES: DETAILS

788/2025

1. ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) රතු නිවේදන නිකුත් කර ඇති මේ වනවිට විදේශ රටවල සැඟවී සිටින ශ්‍රී ලාංකික අපරාධකරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුද්ගලයන්ගේ නම් සහ සැඟවී සිටින රටවල් කවරේද;

(iii) 2020 වර්ෂයේ සිට ඔවුන් විසින් මෙහෙයවන ලද අපරාධ සහ ත්‍රාසජනය කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම අපරාධකරුවන් මෙරටට ගෙන්වා ගැනීම සහ ඔවුන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சிவப்பு அறிவித்தல் பிறப்பிக்கப்பட்டுள்ள நிலையில், தற்போது வெளிநாடுகளில் தலைமறைவாகியுள்ள இலங்கை குற்றவாளி களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி ஆட்களின் பெயர்கள் மற்றும் அவர்கள் தலைமறைவாகியுள்ள நாடுகள் யாவை என்பதையும்;

(iii) 2020ஆம் ஆண்டு தொடக்கம் அவர்களின் வழிநடத்தலின்கீழ் இடம்பெற்ற குற்றச்செயல் களினதும் கொல்லப்பட்ட ஆட்களினதும் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) மேற்படி குற்றவாளிகளை இலங்கைக்கு அழைத்து வருவதற்கும் அவர்களுக்கு எதிராகச் சட்டத்தை நடைமுறைப்படுத்துவதற்கும் மேற் கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security and Parliamentary Affairs:

(a) Will he inform this House the -

(i) number of Sri Lankan criminals currently hiding in foreign countries, against whom Red Notices have been issued;

(ii) names of those individuals and the countries in which they are hiding;

(iii) crimes directed by them and the number of persons killed since the year 2020; and

(iv) measures that will be taken to bring those criminals back to the country and enforce the law against them?

(b) If not, why?

ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 236කි.

ඒ අතරින් 97දෙනෙකු සංවිධානාත්මක අපරාධකරුවන් සහ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් වේ.

(ii) ජාත්‍යන්තර පොලිස් රතු නිවේදන යනු, අවශ්‍ය කරන සැකකරුවන්ගේ / චූදිතයන්ගේ ජීව දත්ත, ජාත්‍යන්තර පොලිස් දත්ත පද්ධතිය තුළ ප්‍රසිද්ධියට පත් කිරීම සඳහා භාවිත කරන රහස්‍ය මෙවලමක් වන බැවින්, එම තොරතුරු හෙළි කළ නොහැක.

(iii) රතු නිවේදන නිකුත් කර ඇති අපරාධකරුවන් මනුෂ්‍ය ඝාතන, මත්ද්‍රව්‍ය ජාවාරම, මිනිස් ජාවාරම, මුදල් විශුද්ධිකරණය, නීති විරෝධී වත්කම් රැස් කිරීම, අපරාධවලට කුමන්ත්‍රණය කිරීම හා අපරාධ සඳහා ආධාර අනුබල දීම ඇතුළු විවිධ ගණයේ අපරාධවලට සම්බන්ධ වූ පුද්ගලයන් වේ. ඒ අය අතරින් අපරාධකරුවන් 32ක් මනුෂ්‍ය ඝාතන සිදු කර ඇති අතර, අනෙකුත් අපරාධකරුවන් මත්ද්‍රව්‍ය ජාවාරමේ යෙදීම හෝ වෙනත් බරපතළ ගණයේ අපරාධවලට සම්බන්ධ සැකකරුවන් වේ.

එක් අපරාධකරුවෙකු වෙනුවෙන් රතු වරෙන්තු එකකට වැඩි සංඛ්‍යාවක් නිකුත් කරනු නොලැබේ. ජාත්‍යන්තර පොලිස් නිවේදන මඟින් සැකකරුවන්ගේ ජීව දත්ත තොරතුරු ජාත්‍යන්තර පොලිස් තොරතුරු පද්ධති තුළ සංසරණය කර ඇති අතර, සැකකරුවෙකු අත්අඩංගුවට පත්වන තෙක් එය රහස්‍ය ලේඛනයක් වේ. එබැවින්, මෙතෙක් හඳුනාගෙන ඇති සැකකරුවන් අත්අඩංගුවට පත්වන තෙක් එම තොරතුරු ප්‍රසිද්ධියට පත්වීම මඟින් මෙම සැකකරුවන් අත්අඩංගුවට පත්වීමේ අවස්ථා ගිලිහී යා හැකි බැවින්, මෙම අවස්ථාවේදී අදාළ තොරතුරු ලබා දිය නොහැක.

2020 වර්ෂයේ සිට 2026 වර්ෂය දක්වා සිදු කරන ලද මනුෂ්‍ය ඝාතන සංඛ්‍යාව පහත පරිදි වේ.

වර්ෂය	2020	2021	2022	2023	2024	2025	2026	එකතුව
මනුෂ්‍ය ඝාතන සංඛ්‍යාව	02	04	23	16	42	29	18	134

(iv) 1977 අංක 08 දරන උද්දර්පණ පනතේ ප්‍රතිපාදන හෝ එක් එක් රටවල් සමඟ අත්සන් කර ඇති ගිවිසුම්වල ප්‍රතිපාදන අනුව කටයුතු කරනු ලැබේ.

(ආ) පැන නොනඟී.

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ගරු ඇමතිතුමනි, පිළිතුර ලබා දුන්නාට බෙහෙවින්ම ස්තුතියි. 2020 අවුරුද්දේ ඉඳලා මේ දක්වා අපරාධ නිසා වාර්ෂිකව මේ රටේ මරණයට පත් වුණු ජනතාව සම්බන්ධයෙන් තිබෙන සංඛ්‍යාලේඛන ඔබතුමා ඉදිරිපත් කළා. එහිදී අපි දැක්කා, දිගින් දිගටම කුඩා දරුවෝ මරණයට පත් වෙලා තිබෙන බව. අත්බෝම්බ වාගේ ඉතාම භයානක බෝම්බ භාවිතය නිසාත්, ටී-56 වාගේ ඉතාම භයානක අවි භාවිත කිරීම නිසාත් මේ වනකොට අහිංසක දරුවෝ මරණයට පත් වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ වාගේම මේ අපරාධ ක්‍රියාත්මක කරන කණ්ඩායම්, අපරාධ ක්‍රියාත්මක කරන වෙනත් කණ්ඩායම් ඉලක්ක කරගෙන ප්‍රහාර එල්ල කරනකොට කිසිම වරදකට සම්බන්ධ නැති සාමාන්‍ය ජනතාවත් මරණයට පත් වෙනවා අපි දකිනවා.

ගරු ඇමතිතුමනි, 2024 අවුරුද්දේ ඉඳන් 2025 - 2026 දක්වා කාල සීමාව තුළදී තමයි ඒ ආකාරයට වැඩි ප්‍රමාණයක් මරණයට පත් වෙලා තිබෙන්නේ. මේ පිළිබඳව ඔබතුමන්ලා මොකක් හෝ ක්‍රියාමාර්ගයක් අරගෙන තිබෙනවාද, එහෙම නැත්නම් ඒ මරණ ප්‍රමාණය මේ තරම් ඉක්මනට වැඩි වුණේ කොහොමද කියලා යම් විමර්ශනයක් කරලා හඳුනාගෙන තිබෙනවාද?

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු කථානායකතුමනි, මේ පිළිබඳව විමර්ශනයක් කරලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, මේවාට කිසිම සම්බන්ධයක් නැති අහිංසක දරුවන් දෙදෙනෙක් පසුගිය දිනක පාතාල ක්‍රියාකරුවන් විසින් ඝාතනය කරනු ලැබුවා. ඒ පිළිබඳව අපේ කනගාටුව ප්‍රකාශ කරනවා. පාතාල ක්‍රියාකරුවන් අතර සහ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් අතර ඇති වන ගැටුම් හේතුවෙන් තමයි එවැනි ඝාතන සිද්ධ වෙන්නේ. අපි හැම අවස්ථාවකදීම උත්සාහ කරන්නේ මේ ගැටුම් නතර කර මහජනයාගේ ආරක්ෂාව තහවුරු කරන්නයි. අපි විශේෂ කාර්ය බලකායේ කණ්ඩායම් 17ක් යොදවා තිබෙනවා, මේ අපරාධකරුවන් පිළිබඳව සොයන්න. මේ අපරාධකරුවන් ක්‍රියාත්මක වෙන්නේ විදේශගතව හිඳිමින්. මේ වෙනකොට එක් පැත්තකින් අපරාධකරුවන් නීතියේ රැහැනට හසු කරගන්න මෙහෙයුම් යන්ත්‍රණය ශක්තිමත් කර තිබෙන අතරම, විදේශගතව මෙහෙයුම් කරනු ලබන අපරාධකරුවන් මෙරටට ගෙන ඒම සඳහාත් අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, සමහර තොරතුරු මේ වෙලාවේදී මේ සභාවට හෙළි කරන්න නොහැකි වුණත්, විශේෂ කණ්ඩායම් යොදා අපි මේ වෙනකොට ඒ අපරාධකරුවන් රැඳී සිටින රටවල ජාත්‍යන්තර පොලීසියත් සමඟ ඒකාබද්ධව මේ මෙහෙයුම් යන්ත්‍රණය ශක්තිමත් කර තිබෙනවා. මේ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් අතර ඇති වන ගැටුම් උග්‍ර වීමේ ප්‍රතිඵලයක් හැටියට තමයි මේ වෙඩි තැබීම් සිද්ධ වෙලා තිබෙන්නේ. කෙසේ වුවත්, මේ වර්ෂය

[ගරු ආනන්ද විජේපාල මහතා]

වෙනකොට අපි විශාල වශයෙන් මේ තත්ත්වය පාලනය කර තිබෙනවා. මනුෂ්‍ය ඝාතන ප්‍රමාණය 2026 වර්ෂයේදී 18ක් දක්වා අඩු වෙලා තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේම අවාසනාවන්ත සිද්ධියක් වුණා. මේ දේවල්වලට කිසිදු සම්බන්ධයක් නැති දරුවන් දෙදෙනෙක් පාතාල ක්‍රියාකරුවන් විසින් පසුගිය දිනක වෙඩි තබා ඝාතනය කර තිබුණා. මේ සියල්ල පිළිබඳව විමර්ශනය වෙනවා වාගේම මේ පාතාල අපරාධකරුවන් නීතියේ රැහැනට හසු කරගෙන ඔවුන්ට නිසි දඬුවම් ලබා දීම සඳහා අපේ ගරු අධිකරණ ඇමතිතුමා විසින් මෙම මස 20වැනි දා සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පත මේ ගරු සභාවට ඉදිරිපත් කළා. මෙවැනි පනත් අවශ්‍යයි. මොකද, මේ පාතාල අපරාධකරුවන්, මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් මේ සමාජයට දැවැන්ත ව්‍යසනයක් සිදු කරමින් ඉන්නවා. ඒකට එරෙහිව අණපනත් සංශෝධනය කරමින්, නීතිය ක්‍රියාවේ යොදවමින්, විමර්ශන පුළුල් කරමින් අධිකරණ ක්‍රියාවලිය ශක්තිමත් කර තිබෙනවා වාගේම මෙහෙයුම් යන්ත්‍රණ ශක්තිමත් කර තිබෙනවා. නිරන්තරයෙන් STF එකේ කණ්ඩායම් 17ක් මේ පාතාල ක්‍රියාකාරකම් සම්බන්ධ මෙහෙයුම් සඳහා යොදාගෙන තිබෙනවා. ශ්‍රී ලංකා පොලිසිය, විශේෂ කාර්ය බලකාය වාගේම මේකට සම්බන්ධ අනෙකුත් විමර්ශන ආයතන ශක්තිමත්ව ක්‍රියා කරමින් සිටිනවා.

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා අහනවා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා කියනවා අපි අහගෙන හිටියා, පිට රට ගිහිල්ලා පාතාලයේ ඉන්න බොහෝ දෙනා අල්ලාගෙන එනවාය කියලා. ඒක හොඳයි. හැබැයි අපි දකිනවා, දැන් මේ රටේ දේශපාලනික වශයෙන් ඔබේ ආණ්ඩුව රැක ගන්න උත්සාහ කරමින් විවිධාකාරයෙන් මහා පරිමාණ විධියට අල්ලස් ගත්, හොරා කාපු බොහෝ දෙනා අල්ලනවා. ඔවුන්ව සිරගත කරලා නඩු දමනවා, බන්ධනාගාර බස්වල ගෙන යනවා පෙන්වනවා. හැබැයි අපි දැක්කා, ඒ සිරගත කරන සමහර කට්ටියට අල්ලස් දීපු කට්ටියගෙන් රට ගිහිල්ලා කටඋත්තර අරගෙන එනවා. ගරු ඇමතිතුමනි, අල්ලස් දීමත් වරදක් කියන එක ඔබතුමා දන්නවා. අල්ලස් දුන් පුද්ගලයාගෙන් තමයි මේ කටඋත්තරය අරගෙන එන්නේ. අල්ලස් දීපු පුද්ගලයා මම අල්ලස් දුන්නා කියලා කිව්වාට පස්සේ කට්ටිය ගිහිල්ලා, ෆොටෝ ගහලා, වීඩියෝ දාලා එනවා වාගේ ඒ පුද්ගලයාවත් කුදලාගෙන එන්න රටේ නීතියක් නැද්ද? ඒ යන මිනිස්සුන්ට කොන්දක් නැද්ද ඒක කරන්න? එතකොට මේ නඩුවටත් හොඳයි, ඔබේ ආණ්ඩුවටත් හොඳයි. ගරු ඇමතිතුමනි, මම මේ කියන කාරණය ඔබතුමා දන්නවා ඇති. සිරගත කරගෙන ඉන්නවාට වඩා ඔහු වරදකාරයා කරන්න පුළුවන්, මේ දෙදෙනාම ඒවා ගෙනැල්ලා දුන්නු විධියයි, ගත්ත විධියයි, දීපු තැනයි කිව්වාම. ඒ රටවලට ගිහිල්ලා ඒ සැකකරුගෙන් කටඋත්තරයක් අරගෙන ඇවිල්ලා දිවුරුම් ප්‍රකාශයක් දීම සමාජය තුළ සිදු වන නාට්‍ය රංගනයක් වාගේ තමයි අපි දකින්නේ. එම නිසා මම ඔබතුමාගෙන් අහනවා, ඒ ක්‍රියාදාමය ඔබතුමා අනුමත කරනවාද, ඔබතුමන්ලා ඒ ක්‍රියාදාමය හිතාමතා කළාද, එහෙම නැත්නම් මේක දේශපාලන නාඩගමක් හැටියට කළාද කියලා.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු කථානායකතුමනි, එතුමා මගෙන් විමසන්නේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම පිළිබඳ ප්‍රශ්නයක්. යම් කෙනෙක් අල්ලස් දීමත්, අල්ලස් ගැනීමත් වැරැද්දක් බව අපි සාමාන්‍යයෙන් දන්නවා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ සිදුවන විමර්ශන පිළිබඳව ප්‍රකාශ කරන්න මම මේ අවස්ථාවේ සූදානම් නැහැ. කෙසේ වුණත්, ජාත්‍යන්තරව ගිහිල්ලා යම් වැරදිකරුවෙකු, පාතාල අපරාධකරුවෙකු සම්බන්ධව ශ්‍රී ලංකා පොලීසියේ CID එක, STF එක විමර්ශන ක්‍රියාවලියක යෙදෙන්නේ, ජාත්‍යන්තර පොලීසියේ සහාය ඇතුව ඒ රටේ නීතියට අනුගතව. යම් කෙනෙක් යම් තැනක රැඳිලා ඉන්නවා කිව්වාම, එතැනට ගිහිල්ලා ඒ කෙනා කුදලාගෙන ඒමේ හැකියාවක් අපට නැහැ. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම විසින් අල්ලස් ගැනීම්වලට එරෙහිව කටයුතු කරනවා. ඒ සම්බන්ධයෙන් අධිකරණයේදී අවශ්‍ය ක්‍රියාමාර්ග තීන්දු වෙයි කියලා තමයි මම විශ්වාස කරන්නේ.

කොළඹ මහ නගර සභා සීමාව: 2015 සිට වාර්තා වූ ක්ෂය රෝගීන්

கொழும்பு மாநகர சபை அதிகார எல்லை: 2015 முதல் பதிவாகிய காசநோய் நோயாளிகள்

COLOMBO MUNICIPAL COUNCIL AREA: TUBERCULOSIS PATIENTS REPORTED SINCE 2015

949/2025

2. ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා කොළඹ මහ නගර සභා බලප්‍රදේශයෙන් වාර්තා වී ඇති ක්ෂය රෝගීන් සංඛ්‍යාව වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ක්ෂය රෝගය ඇතිවීමට බලපාන සාධක කවරේද;

(iii) කොළඹ මහ නගර සභා සීමාව තුළ ක්ෂය රෝගය පැතිර යෑම වැළැක්වීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு முதல் இற்றைவரை கொழும்பு மாநகர சபை அதிகார எல்லைக்குள் பதிவாகிய காசநோய் நோயாளிகளின் எண்ணிக்கை, ஆண்டுவாரியாக யாது என்பதையும்;

(ii) காசநோய் ஏற்படுவதற்கு ஏதுவாக அமையும் காரணிகள் யாவை என்பதையும்;

(iii) கொழும்பு மாநகர சபை அதிகார எல்லைக்குள் காசநோய் பரவுவதைத் தடுக்க எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House the -

(i) number of tuberculosis patients reported from the Colombo Municipal Council area in each year during the period from 2015 to date, separately;

(ii) factors influencing the occurrence of tuberculosis; and

(iii) measures that have been taken to prevent the spread of tuberculosis within the limits of the Colombo Municipal Council?

(b) If not, why?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) Case detection of all forms of Tuberculosis in CMC (2019-2025) - MOH-wise distribution

MOH Area	2019	2020	2021	2022	2023	2024	2025
D1	248	193	201	301	309	293	285
D2A	236	210	216	270	315	284	251
D2B	115	101	144	179	178	167	175
D3	171	155	161	233	222	201	173
D4	52	46	38	75	62	84	55
D5	49	31	36	35	44	35	29
Total patients in CMC	**871**	**736**	**796**	**1093**	**1130**	**1064**	**968**

TB Cases in Colombo District (2015-2018)

. Approximately 25 per cent of the cases in Colombo District are from CMC.

Year	No. of total cases in Colombo District
2015	2264
2016	2156
2017	2051
2018	2088

ගරු මන්ත්‍රීතුමනි, ගත වූ කාලය තුළ, කොළඹ මහනගර සභා බලප්‍රදේශයෙන් 2023 වර්ෂයේදී තමයි අපට වැඩිම ක්ෂය රෝගීන් සංඛ්‍යාවක් වාර්තා වන්නේ. ඒ අනුව කොළඹ දිස්ත්‍රික්කයෙන් වාර්තා වන රෝගීන්ගෙන් සියයට 25ක් පමණ කොළඹ මහනගර සභා සීමාව තුළින් තමයි වාර්තා වන්නේ.

(ii) Mycobacterium Tuberculosis නැමැති බැක්ටීරියාව ආසාදනය වීමෙන් පසු, ශරීරයේ ප්‍රතිශක්තිකරණය හීන වන අවස්ථාවලදී එය පසු කාලීනව සක්‍රිය ක්ෂය රෝගය දක්වා වර්ධනය වේ.

පෙණහලු ක්ෂය රෝගියෙකු කහින විට, කිවිසුම් යවන විට, කථා කරන විට හෝ සිනාසෙන විට ක්ෂය රෝග කාරක බැක්ටීරියාව සහිත ක්ෂුද්‍ර බිඳිති - airborne droplets - වාතයට මුදා හැරේ. එම බිඳිති ආශ්වාස කිරීම මඟින් නීරෝගී පුද්ගලයෙකුගේ ශ්වසන පද්ධතියට බැක්ටීරියාව ඇතුළු වන අතර, එමඟින් මෙලෙස රෝගය ව්‍යාප්ත වීම සිදු වේ.

එහිදී ප්‍රධාන අවදානම් සාධක මෙසේය.

අඩු ප්‍රතිශක්තිකරණය: HIV ආසාදනය, පාලනය නොකළ දියවැඩියාව, පිළිකා රෝග හෝ ප්‍රතිශක්තිය හීන කරන ඖෂධ භාවිතය, නිදන්ගත පෙණහලු රෝග.

ජනාකීර්ණ සහ අසතුටුදායක වාසස්ථාන: නිසි වාතාශ්‍රය සහ හිරු එළිය නොලැබෙන, අධික ලෙස ජනාකීර්ණ නිවාස/පරිසරවල ජීවත්වීම.

මන්දපෝෂණය: සිරුරේ ප්‍රතිශක්තිකරණය පවත්වා ගැනීමට අවශ්‍ය පෝෂණය නොලැබීම.

ජීවන රටා සාධක: අධික ලෙස දුම්පානය කිරීම, මත්පැන් සහ මත්ද්‍රව්‍ය භාවිතය.

සමීප ආශ්‍රය: නොසැලකිලිමත් ලෙස ප්‍රතිකාර නොගන්නා ක්ෂය රෝගීන් සමඟ දීර්ඝ කාලීනව හෝ සමීපව ආශ්‍රය කිරීම.

(iii)

- සියලුම රෝගීන්ට නොමිලේ ඖෂධ ලබා දීම සහ "සෘජු නිරීක්ෂණ යටතේ ප්‍රතිකාර ලබා දීම" - Directly Observed Treatment, Short-course - DOTS - මඟින් රෝගීන් නිසි ලෙස ඖෂධ මාත්‍රාව ලබා ගන්නා බව තහවුරු කිරීම.
- ජංගම එක්ස්-රේ - mobile X-ray - යන්ත්‍ර සහිත රථ සෞඛ්‍ය කණ්ඩායම් යොදා ගනිමින් කොළඹ නගරයේ අධික අවදානම් සහිත ප්‍රදේශ -අඩු හසුකම් සහිත නාගරික ජනාවාස/වතු- ඉලක්ක කර ගනිමින් නොමිලේ පරීක්ෂණ සායන පැවැත්වීම.
- හඳුනාගත් රෝගීන්ගේ පවුලේ සාමාජිකයින් සහ සමීපතමයන් පරීක්ෂාවට ලක් කිරීම සහ අවශ්‍ය අවස්ථාවලදී පූර්ව ආරක්ෂණ ප්‍රතිකාර - TB Preventive Treatment, TPT - ලබා දීම.
- නාගරික ප්‍රජාව හා පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හා සෞඛ්‍ය උපදේශකවරුන්ගේ ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- ලෝක ක්ෂය රෝග දිනයට සමගාමීව ක්ෂය රෝගය පිළිබඳ ප්‍රජා දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම සහ හඳුනාගත් අධි අවදානම් කණ්ඩායම් ඉලක්ක කර ගනිමින් පරීක්ෂණ සායන පැවැත්වීම.
- විශේෂ ආවේක්ෂණ සහ පාලනය අධි අවදානම් කණ්ඩායම්වල රෝගීන් හඳුනාගෙන ප්‍රතිකාර සඳහා යොමු කිරීම හා ආබාධිත හා වයස්ගත පුද්ගලයින්ගේ රෝග අවදානම පරීක්ෂා කිරීම සඳහා ඒකාබද්ධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(ආ) පැන නොනඟී.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

ගරු ඇමතිතුමනි, ක්ෂය රෝගීන් සඳහා තිබෙන ප්‍රධාන රෝහල තමයි, වැලිසර රෝහල. එම රෝහලෙන් වාර්තා වනවා, රෝහලට අවශ්‍ය ඖෂධ සහ වෛද්‍යවරුන් හා කාර්ය මණ්ඩලවල විශාල අඩුපාඩුවක් තිබෙනවා කියලා. ඔබතුමා ඒ පිළිබඳව දැනුවත් ද? ඒ වාගේම ඒ සම්බන්ධව ගන්නා වූ ක්‍රියාමාර්ග පිළිබඳවත් අප දැනුවත් කරන්න පුළුවන්ද?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ක්ෂය රෝගයට ලබා දෙන ඖෂධවල යම් හිඟයක් පැවතීමේ අවදානමක් අපට තිබුණා. හිඟයක් නොවෙයි, ඇත්තටම අවදානමක් තිබුණේ. එම කටයුතු අපේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව කරන්න ගියොත් සෑහෙන කාලයක් ගත වනවා. එම නිසා අපි ඉන්දියානු රජයෙන් ඉල්ලීමක් කළා, ක්ෂය රෝගයට ලබා දෙන ඖෂධ අපට ලබා දෙන්න කියලා. ඒ අනුව, පසුගිය සතියේ රුපියල් බිලියන 52ක් වටිනා ඖෂධ කිලෝග්‍රෑම් 2,600ක් ඉන්දියානු රජය මඟින් අපට ලබා දීලා තිබෙනවා. අපි ඒ ඖෂධ අවශ්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානවලට, රෝහල්වලට සහ සායනවලට ලබා දීලා තිබෙන්නේ. දැන් ප්‍රශ්නයක් නැතුව එම ඖෂධ බෙදා හැරීමේ කටයුතු වාගේම ප්‍රතිකාර කටයුතුත් සිදු වනවා.

ගරු මන්ත්‍රීතුමා අහපු වැලිසර රෝහලේ කාර්ය මණ්ඩලය පිළිබඳ ප්‍රශ්නයට පිළිතුර මෙයයි. අපි අලුතෙන් කාර්ය මණ්ඩල බඳවා ගනිමින්, 2017 cadre එක අනුව එම ස්ථානවලට අවශ්‍ය කාර්ය මණ්ඩල ලබා දෙමින් ඉන්නවා. අපි නොවැම්බර් 01වැනි දා තවත් හෙද කණ්ඩායමක් බඳවා ගන්නවා. එතැනිනුත් ඔය හෙද පුරප්පාඩු ප්‍රමාණය අපි සම්පූර්ණ කරනවා. ඒ වාගේම තවත් ස්ථාන මාරුවීම් එතැනට ලැබෙනවා. ඒ නිසා මේ අවුරුද්ද ඇතුළතදී අපිට පුළුවන්, 2017 වර්ෂයේ cadre එක අනුව සහ ඒ අතරවාරයේදී විශේෂ අනුමැතීන් ලද කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සිදු කරන්න. සෞඛ්‍ය කාර්ය සහායක පත්වීම් ලබා දෙමින් පවතිනවා. ඒ වාගේම අපේ මධ්‍යම ආණ්ඩුවට අයත් රෝහල්වල තිබෙන පුරප්පාඩු අපි සම්පූර්ණ කරමින් සිටිනවා. දැනට ඉතුරු වෙලා තිබෙන විකිරණවේදීන් ඇතුළු පරිපූරක වෘත්තීය සේවාවලට අදාළව බඳවා ගැනීම් කරලා තිබෙනවා වාගේම ඔවුන් පුහුණු කරමින් පවතිනවා. මාස කිහිපයක් ඇතුළත ඔවුන්ව අනුයුක්ත කරන්න පුළුවන්කමක් තිබෙනවා.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම කොළඹ මහ නගර සභාව යටතේ පාලනය වන මාතෘ නිවාස 14ක් එම මහ නගර සභා සීමාව තුළ තිබෙනවා. කොළඹ මහ නගර සභා බලප්‍රදේශය තුළ ජීවත් වන ගර්භිණී මව්වරුන් තමන්ගේ delivery එකට අදාළ කටයුතු සඳහා පසුගිය කාලය පුරාවටම ඒ මාතෘ නිවාස 14ම පාවිච්චි කළා. ඒ නිසාම කොළඹ නගරයේ පිහිටා තිබෙන ද සොයිසා කාන්තා රෝහලේ සහ කාසල් රෝහලේ තිබෙන තදබදය යම් ප්‍රමාණයකට අඩු වෙලා තිබුණා. මොකද, ඒ අවට ඉන්න ජනතාව කොළඹ මහ නගර සභාව විසින් පාලනය කළ ඒ මාතෘ නිවාස වෙත තමයි ගියේ. නමුත් අපට පෙනෙනවා, පසුගිය කාලය පුරාවටම එම මාතෘ නිවාස function වෙලා නැහැ කියන එක. ඒවා දැන් delivery කටයුතු සඳහා ක්‍රියාත්මක වෙන්නේ නැහැ. එතකොට, ඒවා ක්‍රියාත්මක වෙන්නේ නැති හේතුව නිසාම ඒ delivery එක කර ගැනීම සඳහා කොළඹ අවට ජීවත් වන ජනතාවට කාසල් වීදියේ කාන්තා රෝහලට වාගේම ද සොයිසා කාන්තා රෝහලට යන්න සිදු වෙලා තිබෙනවා. ඔබතුමා දන්නවා, ඒ ජනතාවට එතැනට යන්න ත්‍රී වීලර් සඳහා විශාල ලෙස ගමන් වියදම් දරන්න වෙන බව. මොකද, මට්ටක්කුලියේ ඉන්න කෙනෙකුත් සොයිසා කාන්තා රෝහලට කිලෝමීටර 6, 7ක දුරක් එන්න ඕනෑ. සාමාන්‍යයෙන් ත්‍රී වීලරයක එනවා නම් රුපියල් 1,000කට වැඩිය ගන්නවා. නගර සභාවෙන් ඇහුවාම ඒගොල්ලන් කියන්නේ, සෞඛ්‍ය අමාත්‍යාංශය දොස්තරවරු සහ ඒ අවශ්‍ය කාර්ය මණ්ඩලය ලබා නොදීම නිසා තමයි මේවා අක්‍රිය වෙලා තිබෙන්නේ කියන එකයි. ඒ හින්දා මම විශේෂයෙන් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඔබතුමා මේ සම්බන්ධව මැදිහත් වෙලා, කොළඹ මහ නගර සභාව යටතේ පාලනය වන මේ මාතෘ නිවාස ටිකට අවශ්‍ය වෛද්‍යවරු සහ කාර්ය මණ්ඩලය ලබා දීලා නැවත මේවා පණ ගන්වන්න කියලා. මොකද, ඒ තුළ විශේෂයෙන්ම කාසල් වීදියේ කාන්තා රෝහලේ සහ ද සොයිසා කාන්තා රෝහලේ තිබෙන තදබදය අඩු කර ගන්නත් පුළුවන්. ඒ සඳහා විශාල පිටුවහලක් වෙනවා, මේ මහ නගර සභාව යටතේ පාලනය වන මාතෘ නිවාස ටික.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, කොළඹ මහ නගර සභා සීමාවේ දරු ප්‍රසූති සම්බන්ධයෙන් ප්‍රශ්නයක් අපට වාර්තා වෙලා නැහැ. අපේ මධ්‍යම ආණ්ඩුවේ රෝහල් සහ පළාත් සභාව යටතේ තිබෙන රෝහල්වලින් මේ දරු උපත් සඳහා අවශ්‍ය කරන පහසුකම් සපයමින් තිබෙනවා. ඒ සම්බන්ධ ප්‍රශ්නයක් සෞඛ්‍ය අමාත්‍යාංශයට වාර්තා වෙලා නැහැ, ගරු මන්ත්‍රීතුමනි. පළාත් පාලන ආයතන යටතේ පාලනය වන මේ මාතෘ සායන ඇත්තටම සෞඛ්‍ය අමාත්‍යාංශයේ මෙහෙයුම් යටතේ නොවෙයි පවතින්නේ. සමහර විට වෛද්‍යවරු ප්‍රමාණයක් අපේ ලැයිස්තුවලින් ලබා දෙන අවස්ථා තිබෙනවා. ඒ හැරුණාම මෙය මුළුමනින්ම සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් පාලනය වන කොටසක් නොවෙයි. නමුත් මට කියන්න තිබෙන්නේ එහෙම කොහේ හරි ප්‍රශ්නයක් තිබෙනවා නම් සෞඛ්‍ය අමාත්‍යාංශය ඒ සඳහා මැදිහත් වෙනවා කියන එකයි. ලංකාවේම මේ තොරතුරු අපට වාර්තා වෙනවා නේ. එලෙස තොරතුරු වාර්තා වීමේදී දරු උපත් සම්බන්ධයෙන් කොතැන හරි ප්‍රශ්නයක් තිබෙනවා නම් සෞඛ්‍ය අමාත්‍යාංශය ඒ සඳහා මැදිහත් වෙනවා. දැනට මට ඒ තොරතුරු වාර්තා වෙලා නැහැ. මම තවදුරටත් ඔබතුමා එක්කත් කථා කරලා මේ ගැන හොයා බලන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 3 -1042/2025- (1), ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 4 -1079/2025- (1), ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

විදේශ රටවලදී අත්අඩංගුවට පත්වූ ධීවරයින් සහ බෝට්ටු: විස්තර
வெளிநாடுகளில் கைதுசெய்யப்பட்ட கடற்றொழிலாளர்கள் மற்றும் படகுகள்: விபரம்
FISHERMEN AND BOATS TAKEN INTO CUSTODY IN FOREIGN COUNTRIES: DETAILS

1339/2025

5. ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2020 වර්ෂයේ සිට මේ දක්වා විදේශ රටවලදී අත්අඩංගුවට පත්වූ ධීවරයන් සංඛ්‍යාව සහ ධීවර බෝට්ටු සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ධීවරයන් සහ බෝට්ටු නිදහස් කර ගැනීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச் சரைக் கேட்ட வினா:

(அ) (i) 2020ஆம் ஆண்டு முதல் இதுவரையான காலப் பகுதியில் வெளிநாடுகளில் கைது செய்யப்பட்ட கடற்றொழிலாளர்களின் எண்ணிக்கையும் மீன்பிடிப் படகுகளின் எண்ணிக்கையும் ஆண்டு வாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(ii) மேற்படி கடற்றொழிலாளர்களையும் படகுக ளையும் விடுவித்துக்கொள்வதற்காக எடுக்கப் பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries, Aquatic and Ocean Resources:

(a) Will he inform this House -

(i) separately, the number of fishermen and fishing boats that have been taken into custody in foreign countries during each year from 2020 to date; and

(ii) the steps that have been taken to secure the release of the said fishermen and fishing boats?

(b) If not, why?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, මුලින්ම අහලා තිබෙන්නේ 2020 වර්ෂයේ සිට මේ දක්වා විදේශ රටවලදී අත්අඩංගුවට පත්වූ ධීවරයන් සහ බෝට්ටු සංඛ්‍යාව ගැන. ඒ සම්බන්ධයෙන් මට කරුණු කිහිපයක් කියන්න පුළුවන්. නැත්නම් මම පිළිතුර සභාගත කරන්නම්.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු කථානායකතුමනි, උත්තරය දෙන්න විෂය භාර අමාත්‍යතුමා සහ නියෝජ්‍ය අමාත්‍යතුමා කියන දෙපළම සභාවේ නැහැ. එතුමන්ලා දෙපළම සභාවේ නැතිව ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා විසින් උත්තරය දෙනවා. ගරු ඇමතිතුමනි, මේ ප්‍රශ්නයට උත්තර දෙන එක ගැන ඔබතුමාට මගේ ගෞරවය පිරිනමනවා. හැබැයි, ඒ උත්තර දීමෙන් ප්‍රතිඵලයක් ලැබෙන්නේ නැහැ. ඒකට හේතුව මේකයි. මට අතුරු ප්‍රශ්න දෙකක් අහන්න තිබෙනවා. ඒ අතුරු ප්‍රශ්න දෙක ඇසීමේ අයිතිය මට අද නැති වෙනවා. ඒක සමස්ත ධීවර ජනතාවගේ අයිතිය නැති වන වැඩක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, ඔබතුමා පිළිතුර ලබා දෙන්න.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ලිඛිත පිළිතුරක් තිබෙන්නේ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඉතින්, වෙන දවසකට දමන්න.

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
දැන් ප්‍රශ්නය අහලා ඉවරයි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
දැන් ප්‍රශ්නය අහලා ඉවරයි නේ. මම උත්තර දෙනවා.

ගරු කථානායකතුමනි, ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i)

වර්ෂය	අත්අඩංගුවට පත් ධීවර යාත්‍රා සංඛ්‍යාව	අත්අඩංගුවට පත් ධීවර කාර්මිකයින් සංඛ්‍යාව	නිදහස් වූ ධීවර යාත්‍රා සංඛ්‍යාව	නිදහස් වූ ධීවර කාර්මිකයින් සංඛ්‍යාව	නිදහස් නොවූ ධීවර යාත්‍රා සංඛ්‍යාව	නිදහස් නොවූ ධීවර කාර්මිකයින් සංඛ්‍යාව
2020	22	126	9	121	13	5 (මත්ද්‍රව්‍ය)
2021	24	134	12	124	12	10 (මත්ද්‍රව්‍ය)
2022	20	103	12	103	8	0
2023	23	116	7	115	16	1
2024	30	165	11	160	19	5
2025	19	111	12	103	7	8
2026	7	40	3	27	4	13

2024 වර්ෂයේ සංඛ්‍යාලේඛන දත්තවලට අනුව ලියාපදිංචි බහුදින යාත්‍රා සංඛ්‍යාව 4,869ක්ද, එක්දින - one-day - යාත්‍රා 880ක්ද, පිටත එන්ජිම සහිත යාත්‍රා - OFRP - 24,823ක්ද, සාම්ප්‍රදායික යාන්ත්‍රික යාත්‍රා - MTRB - 2,709ක්ද, සාම්ප්‍රදායික යාත්‍රා - NTRB - 15,037ක්ද, යාන්ත්‍රික නොවන මාදැල් යාත්‍රා - NBSB- 953ක් වශයෙන් සම්පූර්ණ යාත්‍රා 49,271ක් සක්‍රියව ධීවර කර්මාන්තයේ යෙදී සිටියි.

මේ අතරින් බහුදින යාත්‍රා 4,869ක් ජාත්‍යන්තර මුහුදේ රැකියාව කිරීම සඳහා නීත්‍යානුකූලව බලපත්‍ර ලබා ඇත. මෙම යාත්‍රා අතරින් යාත්‍රා කිහිපයක් හැරුණු කොට ඉතිරි යාත්‍රා සියල්ලම අඩි 60කට අඩු කුඩා ධීවර යාත්‍රා වේ. මෙවැනි කුඩා පරිමාණ යාත්‍රා මෙතරම් ප්‍රමාණයක් මෙහෙයවනුයේ ඉතා සීමිත රටවල් ප්‍රමාණයක් පමණි.

ඇතැම් අවස්ථාවල විවිධ හේතු මත ධීවර යාත්‍රා වෙනත් රටවල අනන්‍ය ආර්ථික කලාපයන්ට ඇතුළු වන අවස්ථා වාර්තා වේ. සමහර විට ස්වාභාවික

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

ආපදාවලින්, එනම් අයහපත් කාලගුණ තත්ත්වයන් සහ අධික සුළං තත්ත්වයන්වලදී හෝ කාර්මික දෝෂ හේතුවෙන් ද ඇතුළු වන අවස්ථා වාර්තා වේ.

ඊට අතිරේකව ඇතැම් යාත්‍රා නියමුවන් විසින් හිතාමතාම වෙනත් රටවල මුහුදු සීමාවන්ට ඇතුළුව එම මුහුදු සීමාවන්හි මත්ස්‍ය සම්පත් නෙළා ගන්නා අවස්ථා ද වාර්තා වේ.

ගරු මන්ත්‍රීතුමනි, මම කලින් ඉදිරිපත් කළේ 2020 ඉඳන් 2026 දක්වා වුණු එවැනි සිදුවීම් සහ අත්අඩංගුවට ගැනීම්, නිදහස් කිරීම් ඇතුළු ඒ වාර්තාව.

ඉහත දත්ත අනුව, විදේශයන්හිදී අත්අඩංගුවට පත් වන ධීවරයින් සංඛ්‍යාව ශීඝ්‍රයෙන් අඩු වෙමින් පවතින බව නිරීක්ෂණය වේ. 2026 වර්ෂයේදී අත්අඩංගුවට පත් වූ යාත්‍රා සංඛ්‍යාව 7ක් වන අතර, අත්අඩංගුවට පත් වූ ධීවරයින් සංඛ්‍යාව 40කි. මෙම තත්ත්වයට හේතුව සියලු ධීවර ප්‍රජාව මේ පිළිබඳව දැනුවත් කිරීම හා සැමට එක ලෙස නීතිය ක්‍රියාත්මක කිරීමයි.

(ii) විදේශ රටවල අත්අඩංගුවට පත් ධීවරයින් සහ ධීවර යාත්‍රා සම්බන්ධයෙන් ඍජුවම කටයුතු කරනු ලබනුයේ එම රටවල පිහිටුවා තිබෙන ශ්‍රී ලංකා තානාපති කාර්යාලයයි.

ඒ අනුව අත්අඩංගුවට පත් ධීවර යාත්‍රා සහ ධීවරයින් සම්බන්ධයෙන් අවශ්‍ය සියලුම නීතිමය හා රාජ්‍ය තාන්ත්‍රික මැදිහත්වීම් එම තානාපති කාර්යාල මඟින් සිදු කරනු ලබයි.

එමෙන්ම ආපදාවන්ට ලක් වන යාත්‍රා සම්බන්ධයෙන් සහ අනෙකුත් යාත්‍රා සම්බන්ධයෙන් අවශ්‍ය තාක්ෂණික වාර්තා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබයි. නීතිමය කටයුතුවලදී එම වාර්තා වැදගත් වේ.

මේ වන විට ධීවර කටයුතු හේතුවෙන් අත්අඩංගුවේ පසුවන ධීවරයින් හා ධීවර යාත්‍රා පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

- 2020 වර්ෂයේදී මත්ද්‍රව්‍ය හා සම්බන්ධව ධීවර කාර්මිකයින් පස්දෙනෙකු ඉන්දියානු අත්අඩංගුවේ ඇත. ධීවර යාත්‍රා 7ක් ඉන්දියාවේද, 2ක් සීෂෙල්ස්හිද, 4ක් බංග්ලාදේශ අත්අඩංගුවේද ඇත.

- 2021 වර්ෂයේ මත්ද්‍රව්‍ය හා සම්බන්ධව ධීවර කාර්මිකයින් දහදෙනෙකු ඉන්දියානු අත්අඩංගුවේ ඇත. ධීවර යාත්‍රා 5ක් ඉන්දියාවේද, 4ක් මාලදිවයිනේද, 1ක් සීෂෙල්ස්හිද, 2ක් මියන්මාර් අත්අඩංගුවේද ඇත.

- 2022 වර්ෂයේ ධීවර යාත්‍රා 8ක් ඉන්දියාවේද, 2ක් මාලදිවයිනේද අත්අඩංගුවේ ඇත. මාලදිවයිනේ ධීවර යාත්‍රා 2ක නිදහස් කර ඇතත් මෙරටට රැගෙනවිත් නැත.

- 2023 වර්ෂයේදී ධීවර කාර්මිකයකු නීති විරෝධී ලෙස කුළු බඩුවක් වන කහ දිවයිනට රැගෙන ඒම හේතුවෙන් ඉන්දියානු අත්අඩංගුවේ ඇත. ධීවර යාත්‍රා 9ක් ඉන්දියාවේද, 2ක් සීෂෙල්ස්හිද, 3ක් මියන්මාරයේද, 1ක් මොරිසස්හිද, 1ක් රියුනියන් අත්අඩංගුවේද ඇත.

- 2024 වර්ෂයේ ධීවර කාර්මිකයින් 5දෙනෙකු ඉන්දියානු අත්අඩංගුවේ ඇත. ධීවර යාත්‍රා 9ක් ඉන්දියාවේද, 1ක් මාලදිවයිනේද, 7ක් සීෂෙල්ස්වලද, 2ක් මැඩගස්කරයේද අත්අඩංගුවේ ඇත. මෙයින් සීෂේල්ස්හි යාත්‍රා 3ක් විනාශ කර ඇත.

- 2025 වර්ෂයේ ධීවර කාර්මිකයින් දෙදෙනෙකු ඉන්දියාවේද, පස්දෙනෙකු මාලදිවයිනේද - මත්ද්‍රව්‍ය සම්බන්ධව - අත්අඩංගුවේ ඇත. ධීවර යාත්‍රා 2ක් ඉන්දියාවේද, 1ක් මාලදිවයිනේද, 2ක්_සීෂෙල්ස්වලද, 1ක් මැඩගස්කරයේද, 1ක් බංග්ලාදේශයේද අත්අඩංගුවේ ඇත. මෙයින් සීෂෙල්ස්හි යාත්‍රා 2 විනාශ කර ඇත.

- 2026 වර්ෂයේ ධීවර කාර්මිකයින් 13දෙනෙකු මාලදිවයිනේද අත්අඩංගුවේ ඇත. ධීවර යාත්‍රා 1ක් ඉන්දියාවේද, 3ක් මාලදිවයිනේද, 1ක් සීෂෙල්ස්වලද අත්අඩංගුවේ ඇත. මෙයින් සීෂෙල්ස්හි යාත්‍රාව විනාශ කර ඇත.

ඇතැම් අවස්ථාවලදී මෙම ධීවරයින් ගෙන්වා ගැනීමට අවශ්‍ය ගුවන් ටිකට් පත් පවා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ලබා දීම සිදුකරනු ලබයි.

තවද, මෙම ධීවර යාත්‍රා නිදහස් කර ගැනීමට විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයෙන් ඉල්ලීම් සිදු කර ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! I wish to announce that this House cordially welcomes the Delegation from the World Health Organization now present in the Speaker's Gallery.

ගරු හෙක්ටර් අප්පුහාමී මන්ත්‍රීතුමා, ඔබතුමාගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු හෙක්ටර් අප්පුහාමී මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු කථානායකතුමනි, පළමුවෙන්ම මම ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මොකද, මම අහපු ප්‍රශ්නයට සවිස්තරාත්මක පිළිතුරක් ලබා දීලා තිබෙනවා. එයට එකඟයි. හැබැයි, ධීවර අමාත්‍යතුමා හෝ නියෝජ්‍ය අමාත්‍යතුමා මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ නැති එක ගැන මට කනගාටුවක් තිබෙනවා.

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. අපේ ධීවරයින් ඉන්දියාවේ සහ අනෙක් රටවල අත්අඩංගුවේ ඉන්නවා. බොහෝ වෙලාවට සමහර බෝට්ටු ගෙනෙන්න බැහැ, රාජසන්තක කරනවා. ඒ වාගේ වැඩ කටයුතු සිද්ධ වෙනවා.

එය සිදු වන අතරතුරම ඉන්දියානු trawling කණ්ඩායමක් මෙහේට ඇවිල්ලා අපේ මුහුදු සම්පූර්ණයෙන්ම හාරාගෙන යනවා. ගරු කථානායකතුමනි, ඒගොල්ලන්ගේ trawling ක්‍රමයේදී සමහර වෙලාවට රේල් පීලි වාගේ බර දේවල් දැල්වලට දාලා තමයි මුහුදු යටින් ඇදගෙන යන්නේ. එසේ ඇදගෙන යද්දී මුහුදු පැළෑටිවල

ඉඳලා, පුංචි මාළුන්ගේ ඉඳලා, මාළු බිත්තරවල ඉඳලා සියල්ල ඇදගෙන යනවා. ඒගොල්ලෝ ටික දුරක් ඇදගෙන ගිහිල්ලා තමන්ට අවශ්‍ය ලොකු මාළු ටික විතරක් අරගෙන ඉතිරි ඔක්කෝම වීසි කරලා දමනවා. එතකොට අපේ මුහුදු සම්පූර්ණයෙන් විනාශ වෙනවා. එතැනදී විශේෂ දෙයක් සිද්ධ වුණා. කල්පිටියේ ධීවරයෝ මුහුදේ දැල් දාලා තිබියදී ඉන්දියන් trawling කණ්ඩායම ඇවිල්ලා ඒගොල්ලන්ගේ දැල් බලෙන් දාලා ඇදගෙන යද්දී අපේ ධීවරයෙක් ඔවුන්ගේ දැලේ මඩියට අහුවෙලා ගියා. ඒ ධීවරයා මඩියට අහුවෙලා ඇදිලා යනකොට කල්පිටියේ ධීවරයන්ගේ දක්ෂතාව නිසා තමයි ඔවුන් එතැනට ගිහිල්ලා දැලේ මඩිය කපලා ඒ පුද්ගලයාව අරගත්තේ. එහෙම නැත්නම් අඩු ගණනේ ඔහුගේ මිනියවත් හම්බ වෙන්නේ නැහැ.

ඔබතුමන්ලා ඉන්දියාවත් එක්ක බොහොම ළඟින් කටයුතු කරනවා නේ. මම අහනවා ඔබතුමන්ලාගෙන් ප්‍රශ්නයක්. ඉන්දියාවේ ස්වාමිවරු මෙහේ එනවා, අනෙක් අයත් එනවා, හැම කෙනෙක්ම එනවා. ඒ එන අයට ලොකු සැලකිල්ලක් තිබෙනවා. ඒ ප්‍රදේශය ඉන්දියාවේ යටත් විජිත ස්ථානයක් විධියට තිබෙනවාද කියලා අපි දන්නේ නැහැ. හැබැයි, ඒ trawling ක්‍රමය නිසා අපේ ධීවර සම්පත, අපේ මුහුදු සම්පූර්ණයෙන්ම විනාශ වෙනවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමන්ලා ඉන්දියාවත් එක්ක කථා කරලා අරගෙන තිබෙන තීන්දුව මොකක්ද කියන එක සම්පූර්ණයෙන් රටට හෙළි කරන්න කියන විශේෂ ඉල්ලීම මා කරනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ඉන්දියානු සංචාරකයන් ලංකාවට එන එක අහඹු දෙයක් නොවෙයි. ආවේ කවුද, ආවේ ව්‍යාපාරිකයෙක්ද, වෘත්තිකයෙක්ද, ස්වාමිවරයෙක්ද කියන එක මතු කරන්න අවශ්‍යතාවක් නැහැ. ඉන්දියානු සංචාරකයෝ විශාල ප්‍රමාණයක් ලංකාවට එනවා. ඒ අය අපේ ආණ්ඩුව යටතේ විතරක් නොවෙයි, තමුන්නාන්සේලා ආණ්ඩු කරපු කාලවලත් ආවා. *[බාධා කිරීමක්]* ඉන්දියානු සංචාරකයන්ට ලංකාවට එන්න එපා කියලා ද තමුන්නාන්සේලා කියන්නේ? *[බාධා කිරීමක්]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
සංචාරකයෝ නොවෙයි, - *[බාධා කිරීමක්]*

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ඒක සාමාන්‍ය දෙයක්.

අපි රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් මේ කියපු ප්‍රශ්නය සම්බන්ධයෙන් ඉන්දියානු රජයත් එක්ක නිරන්තරයෙන් සාකච්ඡා කරනවා. ඉන්දියාවේදී අපට ඒ රාජ්‍ය තාන්ත්‍රිකයන් මුණගැහිච්ච වෙලාවට පමණක් නොවෙයි, ඉන්දියාවේ ඇමතිවරු, රාජ්‍ය නිලධාරීන් ලංකාවට පැමිණි වෙලාවලදීත් අපි මේ ප්‍රශ්නය සැලකිල්ලට භාජන කර තිබෙනවා. ඒ වාගේම ඔබතුමා දකින්න ඇති, මේ සම්බන්ධයෙන් ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණයෙන් මේ ළඟදී ලබා දී තිබුණු තීන්දුව. මේ ගැන තිබුණු නිල සාකච්ඡාත් ඉදිරියට පැවැත්වෙනවා. මේක කාලයක් තිස්සේ තිබුණු ප්‍රශ්නයක්. මෙය සැලකිය යුතු මට්ටමකට නිරාකරණය කර ගන්න තමයි අප දැන් සාකච්ඡා කරමින් ඉන්නේ. එහි සුබවාදී පැත්තකුත් පවතිනවා. එම නිසා අපි ඒ ප්‍රශ්නය නිරාකරණය කර ගන්නවා. අපේ මුහුදු සම්පතේ අපේ මත්ස්‍ය සම්පත ආරක්ෂා කරගෙන, අපේ ධීවරයා ආරක්ෂා කරගෙන යන ගමනකට තමයි අපේ ධීවර අමාත්‍යාංශයත්, අපේ විදේශ කටයුතු අමාත්‍යාංශයත් අත තියලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, එම නිසා ඒ ප්‍රශ්නයට අපි ආණ්ඩුව හැටියට මැදිහත් වෙලායි ඉන්නේ.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ඔබතුමා පැහැදිලි උත්තරයක් දුන්නේ නැහැ. කමක් නැහැ, ගරු ඇමතිතුමනි. ඔබතුමා වෙනත් විස්තරයක් කළා. ඒකටත් ස්තුතිවන්ත වෙනවා. ඔබතුමන්ලා තමයි ඉන්දියාවට විරුද්ධ වුණේ. නමුත්, ඔබතුමන්ලා දැන් ඉන්දියාවත් එක්ක ගොඩක් යාළු නිසායි මම ඒක ඇහුවේ. එහෙම නැතිව අපි ඒක තරහකට ඇහුවේ නැහැ. ඉන්දියාවේ අයට අපේ රටට එන්න එපා කියලා ඉස්සෙල්ලාම කිව්වේ ඔබතුමන්ලායි, අපි නොවෙයි. හැබැයි, එවැනි පැමිණීම්වලට හැමදාම අපේ එකඟත්වය තිබුණා.

ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. අපේ ධීවරයෝ සාමාන්‍යයෙන් ඉතාම අමාරුවෙන් තමයි මුහුදට ගිහිල්ලා මාළු ටික අල්ලාගෙන එන්නේ. ඒ ධීවරයන්ට යන වියදම දරලා විතරක් නොවෙයි, දිය රකුසාත් එක්ක හැප්පිලා, පොර බඳලා තමයි ඔවුන් ඒ වැඩ කටයුත්ත කරන්නේ. එම නිසා අපේ රටට ධීවරයෝ ඉතාම විශේෂයි; වැදගත්. ජනාධිපතිතුමා ප්‍රමුඛ ඔබතුමන්ලා බලයට එන්න පෙර කිව්වා, ධීවරයන්ට මාළු අල්ලන්න app එකක් හදලා, ඒ app එකේ සියලු කටයුතු අඩංගු කරනවා, ඊට පස්සේ 'මෙතැන තමයි මාළු ඉන්නේ" කියලා ඒ ධීවරයන්ට screen එකෙන් බලාගෙන අන්න එතැනට ගමන් කරලා මාළු ටික අරගෙන එන්න පුළුවන් ක්‍රමවේදයක් හදනවා කියලා. ඒ කථාව සමස්ත ධීවර ප්‍රජාවටම ඔබතුමන්ලා කිව්වා. ඒ නිසා ධීවරයෝ ලොකු බලාපොරොත්තුවකින් සිටියා. අද ධීවරයෝ අපෙන් අහනවා, ඒ app එක කෝ කියලා. මොකද, ඒකෙන් මාළු ඉන්න තැන් හොයා ගන්න ඒගොල්ලන්ට පහසුයි. ඒකට වියදමක් යන්නේ නැහැ. 'අන්න අතැන මාළු ඉන්නවා' කියලා ඒගොල්ලෝ මාළු ඉන්න තැන් දැන ගන්නවා. එතකොට ඒගොල්ලන්ට මුහුදු වටේම යන්න ඕනෑ නැහැ. හරි තැනට ගියා; දැල දැම්මා; මාළු අල්ලා ගත්තා; ආවා. ඇත ඉතිහාසයේ අපේ ආගමෙත් විශේෂයෙන්ම දෙවියන් වහන්සේගේ ආශීර්වාදයෙන් එවැනි වැඩ කොටසක් කර තිබුණා. ඔබතුමන්ලාත් එවැනි වැඩ කොටසක් ගැන කිව්වා. ඔබතුමන්ලා කියපු ඒ app එක කරුණාකර මේ උත්තරීතර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා, රටේ ඉන්න සමස්ත ධීවරයන්ට විතරක් නොවෙයි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටත් ඒ app එක ගැන දැනගැනීම සඳහා. ඒ වාගේම ඒ app එක හඳුන්වා දීම සඳහා වැඩසටහනක්, වැඩමුළුවක් පවත්වන්න කියලාත් මම ඉල්ලා සිටිනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, 2025දී ඉන්දියානු ට්‍රෝලර් යාත්‍රා 43ක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා; 2026දී 23ක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. අපේ රටේ මුහුදු සම්පතේ ප්‍රධාන ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ගැන ඔබතුමාත් දන්නවා ඇති. අපේ මත්ස්‍ය සම්පත දැන් හීන වෙලායි තිබෙන්නේ. මෙය නාරා ආයතනයත් වාර්තා කර තිබෙනවා. වසර ගණනාවක් තිස්සේ අපේ මත්ස්‍ය සම්පත ක්‍රමයෙන් අඩු වෙමින් යනවා. ඒ නිසා මේ ප්‍රශ්නයට පිළියමක් සොයන්න ඕනෑ. මේ තරගය ඇති වෙලා තිබෙන්නේත් ඒ නිසායි. අපි ධීවරයාට දෙන්න පුළුවන් සහන උපරිමයෙන් ලබා දෙමින් තිබෙනවා. පසුගිය දවස්වල ඉන්ධන මිල වැඩි වීමේදීත් අපි ධීවරයන් සම්බන්ධයෙන් කල්පනා කරලා සහනාධාර ලබා දීලා තිබෙනවා. ධීවරයා සහ ධීවර කර්මාන්තය ශක්තිමත් කිරීම වෙනුවෙන් අපි හැම පැත්තෙන්ම කටයුතු කරගෙන යනවා. ඒ වාගේම, මෙකත් මතක තබාගන්න. ඒ app එක නොවෙයි, දුෂණ වංචා කරපු ඒවාත් අපි හොඳහැටි අල්ලාගෙන යනවා. ඒ නිසා මේවාට භය වෙන්න එපා; කලබල වෙන්නත් එපා. ධීවරයාට දෙන්න පුළුවන් සහනය අපි ඉහළින්ම ලබා දෙමින් තිබෙනවා. ධීවරයා මාළු ටික අල්ලයි. පොලිසිය හොරු අල්ලයි. *[බාධා කිරීම්]* බලාගෙන ඉන්නකෝ.

ඉදිකිරීමට යෝජිත පාලම්: අම්පාර දිස්ත්‍රික්කය

நிர்மாணிப்பதற்குப் பரிந்துரைக்கப்பட்டுள்ள பாலங்கள்: அம்பாறை மாவட்டம்

BRIDGES PROPOSED TO BE CONSTRUCTED: AMPARA DISTRICT

1367/2025

6. ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2026 වර්ෂයේ අමාත්‍යාංශයේ මුදල් ප්‍රතිපාදන යටතේ අම්පාර දිස්ත්‍රික්කයේ පාලම් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ඉදිකිරීමට යෝජිත පාලම්වල නාම ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(ii) කල්මුනේ-අක්කරපත්තුව ප්‍රධාන මාර්ගයේ අට්ටප්පලම් පාලම සෑම ගංවතුර තත්ත්වයකදීම හානියට පත් වන බැවින් එම මාර්ගයේ ගමනාගමනයට බාධා ඇති වන අතර, ගංවතුර අවස්ථාවලදී ඒ වෙනුවට තාවකාලික පාලම් ඉදි කරනු ලබන බව දන්නේද;

(iii) එම පාලම ස්ථිර පාලමක් ලෙස ඉදි කිරීම සඳහා කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2026ஆம் ஆண்டில் அமைச்சின் நிதி ஒதுக்கீட்டின்கீழ் அம்பாறை மாவட்டத்தில் பாலங்களை அபிவிருத்தி செய்யும் வேலைத்திட்டத்தின்கீழ், நிர்மாணிப்பதற்கு உத்தேசிக்கப்பட்டுள்ள பாலங்களின் பெயர்ப்பட்டியலைச் சமர்ப்பிப்பாரா என்பதையும்;

(ii) கல்முனை - அக்கரைப்பற்று பிரதான வீதியில் அமைந்துள்ள அட்டப்பளம் பாலமானது ஒவ்வொரு வெள்ளப்பெருக்கு நிலையின்போதும் சேதத்துக்குள்ளாவதால் அவ்வீதியில் போக்குவரத்துத் தடைப்படுவதுடன், வெள்ள நிலைமைகளின்போது அதற்கு மாற்றீடாகத் தற்காலிகப் பாலங்கள் அமைக்கப்படுவதை அறிவாரா என்பதையும்;

(iii) அந்தப் பாலத்தை நிரந்தரப் பாலமாக நிர்மாணிப் பதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டு வருகின்றனவா என்பதையும்;

(iv) ஆமெனில், அது தொடர்பாக மேற்கொள் ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he inform this House -

(i) whether he will submit a list of the bridges proposed to be constructed in the Ampara District under the Bridge Development Programme for the year 2026, utilizing the financial allocation of the Ministry;

(ii) whether he is aware that the Attappalam Bridge on the Kalmunai-Akkaraipattu main road is damaged during every flood, causing transport disruptions along that route, and that the temporary bridges are constructed in its place during flood periods;

(iii) whether actions will be taken to construct the aforesaid bridge as a permanent structure; and

(iv) if so, the steps that will be taken in that regard?

(b) If not, why?

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා (ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Prasanna Gunasena - Deputy Minister of Transport and Highways)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

අම්පාර දිස්ත්‍රික්කය තුළ ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීම හා මාර්ග සම්බන්ධතා තවදුරටත් ශක්තිමත් කිරීම අරමුණු කර ගනිමින් 2026 වර්ෂය සඳහා අමාත්‍ය මුදල් ප්‍රතිපාදන යටතේ පහත දක්වා ඇති ප්‍රධාන පාලම් 3 නැවත ඉදි කිරීමට නියමිතය.

1. කාරතිව් - අම්පාර මාර්ගයේ (A031) අංක 1/2 පාලම නැවත ඉදිකිරීම.
2. පල්ලං ඔය - ඉහිනියාගල මාර්ගයේ (B350) අංක 3/2 පාලම නැවත ඉදිකිරීම.
3. පානම - කුඹුක්කන මාර්ගයේ (B355) අංක 8/1 පාලම නැවත ඉදිකිරීම.

(ii) ඔව්.

කල්මුණේ - අක්කරෙයිපත්තුව A4 ප්‍රධාන මාර්ගයේ පිහිටා ඇති අට්ටප්පලම් පාලම - අංක 375/5 කියන පාලම - සෑම ගංවතුර තත්ත්වයකදීම දැඩි ලෙස හානියට පත් වන අතර, එමඟින් මාර්ගයේ ගමනාගමනයට දැඩි බාධා ඇති වේ.

2024 නොවැම්බර් මාසයේදී ප්‍රදේශයට ඇති වූ ප්‍රබල ගංවතුර තත්ත්වයක් හේතුවෙන් එම පාලම ගිලා බැසීමකට ලක් විය. පාලම ගිලා බැසීමෙන් පසු ඇති වූ මගී ප්‍රවාහන බාධා මහ හරවා ගැනීම සඳහා හානි වූ පාලමට සමාන්තරව තාවකාලික බේලි පාලමක් - Bailey bridge එකක් - ස්ථාපනය කර ඇති අතර දැනට මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා එය භාවිත කරනු ලැබේ.

(iii) ඔව්.

(iv) තාවකාලික බෙලි පාලමක් මත යැපීම දිගු කාලීන විසඳුමක් නොවන බැවින්, A4 මාර්ගයක් වන කොළඹ - රත්නපුර - වැල්ලවාය - මඩකලපුව මාර්ගයේ පිහිටා තිබෙන 375/5 අට්ටප්පලම් පාලම පාලම ස්ථිර පාලමක් ලෙස ප්‍රතිසංස්කරණය කිරීමට චීන අරමුදල් සපයන ලද ව්‍යාපෘතියක් වන "ගංවතුරෙන් හා නායයාම්වලින් හානි වූ පාලම් 14ක චීන ආධාර ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය" යටතේ ප්‍රතිපාදන හිමි වී ඇත. ඒ අනුව අදාළ ඉදිකිරීම් කටයුතු 2026 නොවැම්බර් මස 01වන සතිය වන විට නිල වශයෙන් ආරම්භ කිරීමට නියමිත අතර, මාස 15ක කාලයක් තුළ මෙම ඉදිකිරීම් කටයුතු නිම කිරීමට අපේක්ෂිතය. පාලම සැලසුම් කිරීම, වියදම් දැරීම හා ලංසු කටයුතු චීන මහජන සමූහාණ්ඩුවේ අරමුදල් මඟින් සිදු කරන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය මෙහි සම්බන්ධීකරණ කටයුතු සිදු කරයි.

මේක ළඟදී වෙච්ච දෙයක් නොවෙයි. එය ආපදාවට ලක් වුණාට පසුව අපි funding source එක මොකක්ද කියලා තීරණය කරන්න ඕනෑ. ඊට පස්සේ design කර ගන්න ඕනෑ. ඊටත් පස්සේ ඇස්තමේන්තු සකස් කරලා, ටෙන්ඩර් ක්‍රියාවලියට ගිහිල්ලා තෝරා ගැනීම් කරලා තමයි ඉදිකිරීම් කරන්නේ. ඒ කාලය ගත වෙලා තමයි නොවැම්බර් මාසයේ පළමුවැනි සතිය වනකොට ඉදිකිරීම් ආරම්භ කිරීමට අපට හැකියාව ලැබී තිබෙන්නේ.

(ආ) අදාළ නොවේ.

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා
(මාණ්පුමිකු එම්.එස්. උදුමාලෙප්පෙ)
(The Hon. M.S. Uthumalebbe)

කෞරව ප්‍රධාන අමාත්‍යාංශ ඇමැතිතුමා, අම්පාරෙ දිස්ත්‍රික්කෙ අපේ මන්ත්‍රීවරු, ඒ වගේම ගරු කථානායකතුමනි, අම්පාරෙ දිස්ත්‍රික්කෙ මහ ඇමැතිතුමා

[ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා]

"කරුණු එසේ වුවද, අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සාකච්ඡාවේදී ගරු ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාතුමා විසින් සමන්තුරේ උප ඩිපෝව නැවත ස්ථාපිත කිරීමට පියවර ගන්නා ලෙස උපදෙස් දී ඇති බවත්, ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බවත් ශ්‍රීලංගම ප්‍රධාන විධායක නිලධාරි විසින් වාර්තා කර ඇති බව කාරුණිකව වාර්තා කරමි."

කෞරව අමෙච්චර් අවර්කලුටෙය තලෙමෙයිල් නටෙපෙට්ර කූට්ටත්තිල්තාන් ඉතු තීර්මානික්කප්පට්ටතු. ඉතු නියායමාන ඔරු විටයමාකුම්. කෞරව පිරති අමෙච්චර් අවර්කළේ, තර්කාලිකමාක ඉණෙක්කප්පට්ට උප 'ටිප්පෝ'වෙ මීණ්ටුම් චම්මාන්තුරෙයිල් අමෙප්පතු එන්පතු, චිරියතොරු විටයමාකුම්. ඉතනෙච් චෙය්වතර්කු ඉන්නුම් කාල අවකාචම් තේවෙයා? එනක් කේට්කින්රේන්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු චපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය අමාත්‍යාතුමා.

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා
(මාණ්පුමිකු (වෛත්තියර්) පිරචන්න කුණචේන)
(The Hon. (Dr.) Prasanna Gunasena)
ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා ඒ අතුරු ප්‍රශ්නයට උත්තර ලබා දෙනවා.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එතුමාගේ අතුරු ප්‍රශ්න දෙකටම මම පිළිතුරු ලබා දෙනවා.

කල්මුණේ-අක්කරෙයිපත්තුව අට්ටප්පලම් පාලම ගැන එතුමා අහපු ප්‍රශ්නයට මම මුලින් පිළිතුරු දෙන්නම්. "දිට්වා" යටතේ ආධාර ලෙස චීනයෙන් පාලම් 15කට ආසන්න ප්‍රමාණයක් සකස් කරන්න භාරගෙන තිබෙනවා. දැනට තිබෙන සැලසුම් අනුව ලබන නොවැම්බර් 01වැනි දා චීන ආධාර යටතේ සකස් කෙරෙන පාලම්වල කටයුතු පටන් ගන්නවා. ඒ අනුව මේ අට්ටප්පලම් පාලමේ කටයුතුත් චීන ආධාර යටතේ ඉදිරි මාස දෙක, තුන ඇතුළතදී පටන්ගන්න පුළුවන් වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ඒක අපි මත තීරණය වන දෙයක් නොවෙයි, චීන ආධාර මත තීරණය වන දෙයක්.

දෙවැනි කාරණය මේකයි. ඒ ප්‍රදේශයේම කාරතිව් ප්‍රදේශයේ පාලමේ වැඩ කටයුතු අපි මීට මාස ගණනකට කලින් පටන් ගත්තා. ඒ වැඩ කටයුතු හරියාකාරව timeline එකට සිද්ධ වෙනවා.

අවසාන වශයෙන් එතුමා අහන්නේ සම්මන්තුරෙයි ලංගම උප ඩිපෝව ගැනයි. ඒ ගැන එතුමා අවස්ථා ගණනාවකදි කියලා තිබෙනවා. අපේ අබූබකර් අතම්බාවා මන්ත්‍රීතුමාත් ඒ ගැන ඉල්ලීමක් කර තිබෙනවා.

නමුත් ඔබතුමාට අපි DCC එකේදීත් කියා තිබෙනවා, තිබිලා වහපු එකක් නිසා ඒක පටන් ගැනීමේ වගකීමක් අපට තිබෙනවා කියලා. නමුත් මම ඉතා පැහැදිලිව කියා තිබෙනවා, ශ්‍රීලංගම ආයතනයේ තිබෙන තත්ත්වය අනුව එතැන අලුත් ඩිපෝවක් පටන් ගන්න අවශ්‍ය කරන බස්, නිලධාරීන්, ඒ කාර්ය මණ්ඩලය නැතුව ඒ ඩිපෝව පටන් අරගෙන වැඩක් නැහැ කියන කාරණය. ලංගමයේ රියදුරන් අඩුයි; කොන්දොස්තර මහත්තුරු අඩුයි; බස් අඩුයි; පහසුකම් අඩුයි. විශාල බිඳ වැටීමක තිබෙන්නේ, ලංගම ආයතනය. බිඳ වට්ටපු තැනක් එතැන. ඒ නිසා දැන් මට ඔබතුමාට කියන්න තිබෙන්නේ, හැමදාම කියන එකම තමයි. සම්මන්තුරේ බස් ඩිපෝ එක අවශ්‍යතාව අනුව නැවත පිහිටුවීම සම්බන්ධව මගේ විරෝධතාවක් නැහැ. නමුත් ඒ සඳහා අවශ්‍ය සම්පත් සහ මානව සම්පත් ලබාගෙන තමයි එතැනට යන්න පුළුවන්කම තිබෙන්නේ. මොකද, ලංගම ආයතනය සුනු විසුනු කරලා තිබෙන්නේ, පසුගිය අවුරුදු 10, 20 තිස්සේ.

සුවඳ විලවුන් සහ රූපලාවණ්‍ය නිෂ්පාදන: නියාමනය
வாசனைத் திரவியங்கள் மற்றும் அழகுசாதனப் பொருட்களின் உற்பத்தி: ஒழுங்குறுத்தல்
PRODUCTION OF PERFUMES AND COSMETIC PRODUCTS: REGULATION

1381/2025

7. ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) සුවඳ විලවුන් සහ රූපලාවණ්‍ය ආලේපන වර්ග විෂවීම පිළිබඳ සිද්ධීන් රාශියක් මෑත කාලයේ වාර්තා වූ බව දන්නේද;

(ii) මෙම සුවඳ විලවුන් හා රූපලාවණ්‍ය ද්‍රව්‍ය නියාමනය කිරීමේ වගකීම පැවරී ඇති රාජ්‍ය ආයතනය කවරේද;

(iii) සුවඳ විලවුන් හා රූපලාවණ්‍ය ද්‍රව්‍ය නිසි පරිදි නියාමනය කිරීම සඳහා අවශ්‍ය වැටලීම් සිදු කිරීමට සහ මෙවැනි විෂවීම් සම්බන්ධ සිදුවීම් වැළැක්වීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

සුකාතාරම් මර්රුම් වෙකුචන ඌටක අමෙච්චරෙක් කේට්ට වින්නා:

(අ) (i) වාසනෙත් තිරවියංකළ් මර්රුම් අළකුචාතනප් පොරුට්කළ් විචමාතල් කුරිත්ත පල චම්පවංකළ් අණ්මෙක් කාලත්තිල් පතිවාකියුළ්ළමෙයෙ අරිවාරා එන්පතෙයුම්;

(ii) ඉන්ත වාසනෙත් තිරවියංකළ් මර්රුම් අළකුචාතනප් පොරුට්කළෙ ඔළුංකුරුත්තුකෙ චෙය්යුම් පොරුප්පු ඔප්පටෙක්කප්පට්ටුළ්ළ අරච නිරුවනම් යාතු එන්පතෙයුම්;

(iii) වාසනෙත් තිරවියංකළ් මර්රුම් අළකුචාතනප් පොරුට්කළෙ උරිය මුරෙයිල් ඔළුංකුරුත්තුකෙ චෙය්වතර්කුත් තේවෙයාන චුර්රි වළෙප්පුකළෙ මේර්කොළ්වතර්කුම්, ඉත්තකෙය විචමාතල් තොටර්පාන චම්පවංකළ් ඒර්පටුවතෙත් තටුප්පතර්කුම් මේර්කොළ්ළප්පටවුළ්ළ නටවටික්කෙකළ් යාවෙ එන්පතෙයුම්;

අවර් ඉච්චපෙක්කු අරිවිප්පාරා?

(ආ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) whether he is aware that a large number of incidents regarding poisoning caused by perfumes and cosmetics have been reported in recent times;

(ii) the state institution vested with the responsibility of regulating the said perfumes and cosmetics; and

(iii) the measures that will be taken to conduct the necessary raids to properly regulate perfumes and cosmetic products, and to prevent such incidents of poisoning?

(b) If not, why?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමිය අසා තිබෙන්නේ, සුවඳ විලවුන් සහ රූපලාවණ්‍ය ආලේපන වර්ග විෂ වීම පිළිබඳ සිද්ධීන් වාර්තා වීම ගැන. එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්. මේ සම්බන්ධයෙන් ජාතික ඖෂධ නියාමන අධිකාරියට ලැබුණු පැමිණිලි ප්‍රමාණය විතරයි මට කියන්න පුළුවන්කම තිබෙන්නේ.

මෙරට තුළ ලියාපදිංචි නොවූ මෙරට තුළ නිෂ්පාදනය කරන ලද හෝ මෙරටට ගෙන්වන ලද විවිධ ආලේපන වර්ග සම්බන්ධයෙන් සමාජ මාධ්‍ය හරහා සිදු කුළ ප්‍රචාරණය කිරීම් පිළිබඳ වූ පැමිණිලි 13ක්ද, එවැනි වූ මිලදී ගත් නිෂ්පාදන තුළින් පාරිභෝගිකයා අපේක්ෂා කළ ගුණාත්මකභාවය නොමැතිවීම සම්බන්ධයෙන් වූ පැමිණිලි 3ක්ද, මිලදී ගත් නිෂ්පාදනවල දක්නට තිබූ ගුණාත්මක දෝෂ සම්බන්ධයෙන් වූ පැමිණිලි 6ක්ද, වෛද්‍යවරුන් හා හෙදියන් විසින් සිදු කළ යුතු ප්‍රතිකාර, සුදුසුකම් නොලත් පුද්ගලයන් විසින් කරමින් සහ නිසි පරීක්ෂණයකින් තොර රසායන ද්‍රව්‍ය යොදා ගනිමින් පවත්වාගෙන යන රූපලාවණ්‍යාගාර සම්බන්ධයෙන් වූ පැමිණිලි 1ක්ද යනාදී වශයෙන් දැක්විය හැක. ඒ පැමිණිලි සංඛ්‍යාව තමයි දැනට අපට ලැබී තිබෙන්නේ.

(ii) මේ වන විට ජාතික ඖෂධ නියාමන අධිකාරිය වෙත හෝ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත විලවුන් සහ රූපලාවණ්‍ය ද්‍රව්‍ය නියාමනය කිරීම සඳහා නීතිමය ප්‍රතිපාදන සකස් වී නොමැත.

(iii) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත තුළින් සුවඳ විලවුන් සහ රූපලාවණ්‍ය ද්‍රව්‍ය සම්බන්ධයෙන් වූ පැමිණිලි අධීක්ෂණය සහ එම බලාත්මක කටයුතු සම්බන්ධයෙන් මෙතෙක් ප්‍රතිපාදන සකස් වී නොමැත. 2016.05.16 දිනැති MH/AD/01/04/42/2016 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය මඟින් සුවඳ විලවුන් නියාමනය සඳහා නව පනතක් සකස් කිරීමටත්, එකී යෝජිත පනත පාර්ලිමේන්තුව මඟින් සම්මත කරන තෙක් විලවුන් උපකරණ සහ ඖෂධ පනතෙහි විලවුන් පිළිබඳ විධිවිධාන සහ රෙගුලාසි භාවිත කරමින් සුදුසු විද්වත් කමිටුවක් පත්කොට පරිපාලනමය ක්‍රියාමාර්ගයක් ගැනීම සඳහා 2026.05.31 දිනැතිව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. (ඇමුණුම 01)

2017.09.27 දිනැති තවත් අමාත්‍ය මණ්ඩල සටහනක් මඟින් නව පනත සම්මත කර ක්‍රියාත්මක කරන තෙක් 1980 අංක 27 දරන පනත යටතේ විලවුන් සම්බන්ධයෙන් වන නියෝග උපයෝගී කොටගෙන අමාත්‍යවරයා විමසා ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් පත් කරනු ලබන විශේෂඥ කමිටුවේ නිර්දේශ පරිදි විලවුන් නියාමනය සඳහා අනුමැතිය ඉල්ලා ඇති අතර, ඊට අදාළ අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2017.10.10 ලැබී ඇත. (ඇමුණුම 02)

2017.11.07 දින ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් විලවුන් නියාමනය සඳහා විද්වත් කමිටුව පත්කොට ඇති අතර, පරිපාලනමය වශයෙන් අමාත්‍ය මණ්ඩලයේ උපදෙස් පරිදි 1980 අංක 27 දරන පනත යටතේ විලවුන් සම්බන්ධයෙන් වන නියෝග උපයෝගීකොට ගනිමින් එතැන් සිට මේ දක්වා විලවුන් නියාමනය සිදු කරනු ලබනවා. (ඇමුණුම 03)

විලවුන් නියාමනය සම්බන්ධයෙන් නෛතික ප්‍රතිපාදන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතට ඇතුළත් කරමින් ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත (සංශෝධිත) යටතේ ඉදිරියට සිදු කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසට අධිකාරියේ සභාපති වෙත උපදෙස් ලබා දී ඇති අතර, ඒ අනුව දැන් කටයුතු සිදු වෙමින් පවතිනවා.

ජාතික ඖෂධ නියාම අධිකාරිය පනතට විලවුන් නියාමනය සම්බන්ධයෙන් ප්‍රතිපාදන ඇතුළත් කරමින් අදාළ සංශෝධනයන් සහිතව ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා 2026.07.16 දින ඉදිරිපත් කර ඇති අතර, මේ වන විට එකී සංශෝධන සම්බන්ධයෙන් සලකා බැලීම් සිදු කෙරෙමින් පවතිනවා.

ගරු මන්ත්‍රීතුමියනි, සෑහෙන කාලයකට කලින් විශේෂඥ කමිටුවක් පත්කර තිබුණා. නමුත් ඒ කටයුතුවල යම් ප්‍රමාදයන් පැවතුණා. ඒ විශේෂඥ කමිටුවේ වාර්තාව අනුව අපි ඒ සංශෝධන ඉදිරිපත් කරලා තිබෙනවා ජාතික ඖෂධ නියාමන අධිකාරියට. දැන් පවතින තත්ත්වය අනුව ලබන සතියේ විතර අපට පුළුවන්කම ලැබෙයි මහජන අදහස් විමසීමට ඒක ඉදිරිපත් කරන්නට. මහජන අදහස් ඇතුළත් කරගෙන ඊළඟට අපි ඒක නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යවනවා. ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත් සංශෝධනය, උපරිම ගත්තොත් අපට ඉදිරි මාස 3ක් ඇතුළත මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ හැකියාවක් ලැබෙනවා. මේක තමයි දැන් තිබෙන තත්ත්වය.

ඇමුණුම් 01, 02 සහ 03 **සභාගත*** කරනවා.

(ආ) පැන නොනඟී.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)

ගරු අමාත්‍යතුමනි, බොහොම ස්තුතියි. මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි.

2025 මාර්තු මාසයේ ඉදිරිපත් කරන ලද කෝප් කමිටු වාර්තාවට අනුවත්, - මම හිතනවා ගරු අමාත්‍යතුමාත් එකඟ වුණා කියලා - වර්තමානයේ පවතින නීති රාමුව තුළ ලංකාවේ නිෂ්පාදනය කරන සුවඳ විලවුන්, රූපලාවණ්‍ය ආලේපන සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන සම්බන්ධව හරි නියාමනයක් සිදු වෙන්නේ නැහැ.

අපි ලංකාව ගත්තොත්, දළ වශයෙන් මෙවැනි දේශීය නිෂ්පාදකයින් 100,000කට ආසන්න සංඛ්‍යාවක් ඉන්නවා. බොහෝ අවස්ථාවල සමහර නිෂ්පාදකයින් තමන්ගේ නිවසේ බේසමක් තබාගෙන අපිරිසිදු ජලය පාවිච්චි කර, සෞඛ්‍යයට අහිතකර අමුද්‍රව්‍ය භාවිත කර ආලේපන නිෂ්පාදනය කරනවා. COPE එකේ මේ වාර්තාවට අනුව NMRA Act එකට මේක ඇතුළත් කළේ තාවකාලික විසඳුමක් හැටියටයි. මම හිතන විධියට, ගරු අමාත්‍යතුමාත් මේකට එකඟ වුණා. මම දැක්කා, ගිය අවුරුද්දේ මාර්තු මාසයේ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා කිව්වා, අවුරුද්දක් ඇතුළත මීට අදාළව නව පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරනවා කියලා. විශේෂයෙන්ම 1980 අංක 27 දරන විලවුන්, උපකරණ සහ ඖෂධ පනත අහෝසි කර තිබෙන නිසා. මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ අපට මේකට ඉක්මනට විසඳුමක් ලබා දෙන්න කියලායි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු මන්ත්‍රීතුමියනි, ඇත්තටම මෙවැනි ද්‍රව්‍ය ලංකාවේ නිෂ්පාදනය කරනවා විතරක් නොවෙයි, පිට රටිනුත් ගෙන්වනවා. ඒවා නීති විරෝධී ක්‍රමවලටත් ගෙන්වනවා; baggageවලිනුත් ගෙනෙනවා. ඒක ප්‍රශ්නයක්. ඒ නිසා තමයි දැන් අපි කඩිනමින් මේ කටයුතු කරගෙන යන්නේ. ලබන මාර්තුවලට කලින් අපට මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කරගන්න පුළුවන් වෙයි.

ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)

මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි.

ගරු අමාත්‍යතුමනි, ඔබතුමාත් කියපු විධියට, වර්තමානයේ අන්තර්ජාලය හරහා සුවඳ විලවුන් සහ ආලේපන market කරනවා. සාමාන්‍යයෙන් රසදිය සම්බන්ධයෙන් ජාත්‍යන්තරව පිළිගත් උපරිම සීමාව තමයි මිලියනයකට එක් කොටසක් කියන එක. ඒකට කියනවා, 1 ppm කියලා. නමුත්, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය - CAA එක - විසින් නිකුත් කරන ලද වාර්තාවකට අනුව, අපේ රටේ විකුණන සමහර රූපලාවණ්‍ය ආලේපනවල මිලියනයකට 30,000ක්, 40,000ක් දක්වා ඉහළ මට්ටමකින් රසදිය අඩංගු වෙලා තිබෙනවා. මේ තුළින් අපේ රටේ ජනතාවගේ සෞඛ්‍යයට දැඩි තර්ජනයක් එල්ල වෙලා තිබෙනවා. විශේෂයෙන්ම වකුගඩු ආශ්‍රිත, ස්නායු පද්ධතිය ආශ්‍රිත, සම ආශ්‍රිත රෝගවලට බලපෑමක් ඇතිවෙලා තිබෙනවා. ප්‍රවීණ ශිල්පීනියන් භාවිත කර අන්තර්ජාලය හරහා මේවා market කරන ආකාරයත් අපි දැක තිබෙනවා.

අපි දැක්කා, මේ අවුරුද්දේ අගෝස්තු මාසයේදී CAA එක විසින් සිදු කරන ලද වැටලීමකදී පිට රටින් ගෙන්වපු රුපියල් මිලියන 10කට ආසන්න වටිනාකමක් සහිත online ක්‍රමයට විකුණන ආලේපන අල්ලාගෙන තිබුණු ආකාරය. ඒ වාගේම ගිය මාසයේදී පිටකොටුව ප්‍රදේශයේ කරපු වැටලීම්වලිනුත් එවැනි ආලේපන විශාල තොගයක් සොයා ගන්නට හැකි වුණා.

ඒ පනත් කෙටුම්පත සම්මත වන තෙක්, අන්තර්ජාලය හරහා අළෙවි වන ආලේපන සම්බන්ධයෙන් ඔබතුමන්ලා ගැනීමට බලාපොරොත්තු වන ක්‍රියාමාර්ගය මොකක්ද කියලා මා දැනගන්න කැමැතියි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ඒකයි මම කිව්වේ ලංකාවේ නිෂ්පාදන විතරක් නෙවෙයි, විදේශීය නිෂ්පාදනත් විවිධාකාර ක්‍රමවලට ලංකාවේ අළෙවි වෙමින් පවතිනවා කියලා. දැනට පවතින නීතිය යටතේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ඇතුළු ආයතන මේ සඳහා යම් මැදිහත් වීමක් කරමින් ඉන්නවා. ඔබතුමිය මේ ප්‍රශ්නය අහපු එක හොඳයි. මම ජනතාවට මේ වෙලාවේ කියනවා, අපි මේ නිෂ්පාදන සම්බන්ධයෙන් නියාමනය දැඩිව සිදු කරන තෙක් අවධානයෙන් කටයුතු කරන්න කියලා. ජනතාව සම්බන්ධයෙන් අපටත් වගකීමක් තිබෙනවා නේ. සුවඳ විලවුන් සහ ආලේපන භාවිත කරන්නේ ජනතාව. එම නිසා නිසි උපදෙස් සහිතව නියම ක්‍රමයට ඒ දේවල් භාවිත කරන්න ඕනෑ. එහෙම නැතුව දැක්ක දැක්ක එක ගාන්න හොඳ නැහැ. ඒ අවබෝධයෙන් අපි කටයුතු කරමු. සමහර නීති සකස් වෙන්න කාලයක් ගත වනවා. එහි ප්‍රමාදයක් තිබෙනවා. 2017දී කියපු එකක් තමයි දැන් අපි මේ සකස් කරමින් යන්නේ. ඒක සකස් කරලා නියාමන අධිකාරියට ඒ බලය පවරා, ඒකට අදාළ කරන කටයුතු කරන තෙක් ඒ විධියට වැඩ කරගෙන යමු. ඖෂධ සම්බන්ධයෙන් අපේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය කටයුතු කරගෙන යනවා නේ. ඒ වාගේ මේකත් අපට කරන්න පුළුවන්. නමුත් ඒ සම්බන්ධව අපි දැනුවත්ව කටයුතු කළ යුතුයි. එතෙක් ජීවිතය ආරක්ෂා කරගෙන ඉන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 8 -1982/2026- (1), ගරු ලාල් ප්‍රේමනාත් මහතා.

ගරු ලාල් ප්‍රේමනාත් මහතා
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු කථානායකතුමනි, අසා ඇති ප්‍රශ්නය සම්බන්ධයෙන් තොරතුරු එක්රැස් කිරීම මේ වනකොට සිදු වනවා. එම නිසා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මාසයක පමණ කාලයක් ලබා දෙන මෙන් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ අභයභූමි: විස්තර
அநுராதபுரம் மாவட்டத்திலுள்ள சரணாலயங்கள்: விபரம்
SANCTUARIES IN ANURADHAPURA DISTRICT: DETAILS

2399/2026

9. ගරු සුසන්ත කුමාර නවරත්න මහතා
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මේ වන විට හඳුනාගෙන ඇති අභයභූමි කවරේද;

(ii) එම අභයභූමිවල ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම අභයභූමි අතරින් ගැසට් කර ඇති අභයභූමි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அநுராதபுரம் மாவட்டத்தில் தற்போது அடையாளம் காணப்பட்டுள்ள சரணாலயங்கள் யாவை என்பதையும்;

(ii) மேற்படி சரணாலயங்களின் நிலப்பரப்பு வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி சரணாலயங்களில் வர்த்தமானிமூலம் பிரகடனப்படுத்தப்பட்டுள்ள சரணாலயங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா;

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he inform this House the -

(i) names of the sanctuaries that have currently been identified within the Anuradhapura District;

(ii) extent of each such sanctuary; and

(iii) names of the sanctuaries among the said sanctuaries that have been gazetted?

(b) If not, why?

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මිහින්තලේ

අනුරාධපුරය

මහකනදරාව වැව (සම්පූර්ණ ජලාශය වටා යාර 400)

කහල්ල-පල්ලෙකැලේ අභයභූමියේ කොටසක්

පදවිය අභයභූමිය

(ii)

අනු අංකය	නම	ප්‍රමාණය (හෙක්ටෙයාර)
1	මිහින්තලේ	999.6
2	අනුරාධපුර	3,500.5
3	මහකනදරාව වැව (සම්පූර්ණ ජලාශය වටා යාර 400)	519.33
4	කහල්ල-පල්ලෙකැලේ අභයභූමියේ කොටසක්	මුළු ප්‍රමාණය 21,690 (අනුරාධපුර දිස්ත්‍රික්කය 8,231)
5	පදවිය අභයභූමිය	6,475

(iii)

අනු අංකය	නම	ගැසට් කරන ලද දිනය
1	මිහින්තලේ	1938.05.27
2	අනුරාධපුර	1938.05.27
3	මහකනදරාව වැව (සම්පූර්ණ ජලාශය වටා යාර 400)	1966.12.09
4	කහල්ල-පල්ලෙකැලේ අභයභූමියේ කොටසක්	1989.07.11
5	පදවිය අභයභූමිය	1963.06.21

- කහල්ල-පල්ලෙකැලේ අභයභූමිය අනුරාධපුර හා කුරුණෑගල දිස්ත්‍රික්ක දෙකටම අයත් වේ. එයින් අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් භූමි ප්‍රමාණය හෙක්ටෙයාර 8,231ක් පමණ වේ.
- මහකනදරාව- නාච්චදුව අලි සංක්‍රමණ අභයභූමිය ප්‍රකාශයට පත් කිරීම සඳහා හඳුනාගෙන ඇත.
- මීට අමතරව වනඅලි සංක්‍රමණ ප්‍රදේශ ගණනාවක් හඳුනාගෙන ඇති අතර, ඒවායේ මායිම් හඳුනා ගැනීමේ කටයුතු අවසන් අදියරේ පවතී.
- මිහින්තලේ අභයභූමියක් බවට 1938 වර්ෂයේදී ප්‍රකාශයට පත් කරන ලද ගැසට් පත්‍රය මේ වන තෙක් සංශෝධනයට ලක් වී නොමැති අතර, නගරයෙන් විශාල කොටසක් අභයභූමියෙන් පිටත පවතී. නමුත්, ඇතැම් ගම්මාන සහ නිවාස ප්‍රමාණයක් අභයභූමිය තුළද පිහිටා ඇති බව වැඩිදුරටත් සඳහන් කරමි.

(ආ) අදාළ නොවේ.

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

විශේෂයෙන්ම අනුරාධපුර දිස්ත්‍රික්කයේ අනුරාධපුර, පදවිය, මිහින්තලේ වාගේ ප්‍රදේශවල ඇති සමහර අභයභූමි ගැසට් කරලා තිබෙන්නේ වසර 70කට, 80කට, 90කට පෙර කාලයකදී. ගරු කථානායකතුමනි, දැන් අනුරාධපුර නගරයත් අභයභූමියට යටත්

[ගරු සුසන්ත කුමාර නවරත්න මහතා]

වෙලා තිබෙන්නේ, පදවිය නගරයක් අභයභූමියට යටත් වෙලා තිබෙන්නේ. මේ ප්‍රදේශවල ජීවත් වන ජනතාවට සමහර තැන්වල බරපතළ ප්‍රශ්න මතු වෙලා තිබෙනවා, විශේෂයෙන්ම පදවිය නගරයේ, අනුරාධපුර නගරයේ සංවර්ධන කටයුතු ඉදිරියට කරගෙන යනකොට ඒවා තවදුරටත් විධිමත් ලෙස නිරවුල් කරගෙන යන්න බැරි වීම නිසා. ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම 1938දී ගැසට් කළ අනුරාධපුර, 1960 දශකයේ ගැසට් කළ පදවිය වැනි අභයභූමි සම්බන්ධයෙන් සමාලෝචනයක් කරන්න අවශ්‍යයි. මොකද, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත්, එහෙම නැත්නම් අපේ රටේ වන ජීවීන් ඇතුළු පරිසර පද්ධතිය ආරක්ෂා කර ගන්නකොට එහි මැද තැනකට ඇවිල්ලා ජනතාවටත් මේ තුළින් අවශ්‍යතා සපුරා ගැනීමට හැකිවන පරිදි මේ අභයභූමි සම්බන්ධයෙන් සමාලෝචනයක් කරන්න සූදානම්ද, ඒ පිළිබඳව තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද කියලා මම ගරු ඇමතිතුමාගෙන් දැනගන්න කැමැතියි.

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ගරු කථානායකතුමනි, අභයභූමියක් තුළ පෞද්ගලික ඉඩම් සහ රජයේ ඉඩම් කියන ආකාර කිහිපයෙන්ම ඉඩම් තිබෙන්න පුළුවන්. සාමාන්‍යයෙන් අභයභූමියක් තුළ තිබෙන ඉඩම් කළමනාකරණය කිරීමක් තමයි සිදු කෙරෙන්නේ. එම නිසා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට දැනුම් දීලා අපට ඒ අවශ්‍ය වෙනස්කම් කරන්න පුළුවන්. ඒක තමයි අභයභූමියක තිබෙන නිල තත්ත්වය. ඒ ගැටලු සාකච්ඡා කරලා, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ තිබෙන කළමනාකරණ සැලැස්මට අනුව අපට ඒ අවශ්‍ය වෙනස්කම් සිදු කර ගන්න පුළුවන්.

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම අපි දන්නවා, වනඅලි ප්‍රශ්නය දවසින් දවස සමහර තැන්වල වැඩි වෙමින් තිබෙන බව. ඒ වාගේම අමාත්‍යාංශය විධියට ඔබතුමන්ලා මේ වනඅලි ප්‍රශ්නය කළමනාකරණය කිරීම වෙනුවෙන් පසුගිය කාලයේදී විශාල වෙහෙසක් දරා තිබෙනවා. විශාල වරප්‍රසාද ප්‍රමාණයක් ඒ වෙනුවෙන් ලබා දීලා තිබෙනවා. පුරප්පාඩු පුරවා තිබෙනවා. වාහන අරගෙන දීලා තිබෙනවා. මෝටර්සයිකල් අරගෙන දීලා තිබෙනවා. මානව සම්පත් පුරප්පාඩු සියල්ල පුරවා තිබෙනවා.

මේ වනඅලි ප්‍රශ්නය නිරාකරණය කිරීමේදී අපි දිගින් දිගටම කථා කළ කාරණයක් තමයි, 'අලි කොරිඩෝ' කියන එක. විශේෂයෙන්ම අනුරාධපුර දිස්ත්‍රික්කය සඳහා අලි කොරිඩෝවක් ගැසට් කරලා තිබෙනවා. දැන් මෙතැනින් එහාට ගැසට් කරන අලි කොරිඩෝ ටික ඊළඟ ක්‍රියාමාර්ගය දක්වා ගෙන යාමට තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද කියන එක මම ඔබතුමාගෙන් දැනගන්න කැමතියි.

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ගරු කථානායකතුමනි, අපි මේ වසරේදී මොනරාගල දිස්ත්‍රික්කය සහ හම්බන්තොට දිස්ත්‍රික්කය සම්බන්ධ කර ගනිමින් අලි කොරිඩෝ තුනක් ගැසට් කළා. ඒ වාගේම අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහකනදරාව, නාච්චදුව අලි සංක්‍රමණ අභයභූමිය ප්‍රකාශයට පත් කිරීම සඳහා දැනට අපි හඳුනාගෙන තිබෙනවා. ඒ අනුව ඉදිරියේදී අපි මහකනදරාව, නාච්චදුව අලි සංක්‍රමණ අභයභූමිය ප්‍රකාශයට පත් කරන්න බලාපොරොත්තු වනවා. අපි එය ප්‍රකාශයට පත් කරන්නේ අලිමංකඩක් හැටියටයි. ඒ වාගේම ඉදිරියේදී අපි නාකොළගනේ අභයභූමිය ප්‍රකාශයට පත් කරන්න කැබිනට් අනුමැතිය අරගෙන තිබෙනවා. අපි ඒ හරහාත් අලිමංකඩක් ප්‍රකාශයට පත් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම හතරවෙනි සහ පස්වෙනි අලිමංකඩ ප්‍රකාශයට පත් කිරීමටත් අවශ්‍ය කරන කටයුතු සූදානම් කිරීම් සිදු කරගෙන යනවා.

අපිට මෙය පළමු අවස්ථාවේදී අභයභූමියක් හැටියට තමයි ප්‍රකාශයට පත් කරන්න වෙන්නේ. ඒ, මේවා තුළ තිබෙන සමහර පෞද්ගලික ඉඩම්, ජනාවාස එකවර ඉවත් කරන්න තිබෙන ගැටලුකාරී තත්ත්වය නිසායි. නමුත්, ආරම්භයේදී අභයභූමියක් ලෙස ප්‍රකාශයට පත් කරලා, ඉන්පසු ඒ ජනාවාස ඉවත් කිරීමේ වැඩ පිළිවෙළක්, ඔවුන්ට ඒ සුදුසු ස්ථානවල පදිංචි වීම සඳහා අවශ්‍ය කරන තත්ත්වයන් හදලා නිශ්චිත වශයෙන් ඒ ප්‍රදේශය අලිමංකඩ හැටියට භාවිත කිරීමට හැකි වන තත්ත්වයක් අපට හදා ගන්න පුළුවන්. අපි ඉතා ඉක්මනින් මේ ක්‍රියාවලිය ආරම්භ කරලා අවසන් කරන්න බලාපොරොත්තු වෙනවා.

වසර 22ක සේවය සම්පූර්ණ කර විශ්‍රාම ගිය රණ විරුවන්: උපරිම විශ්‍රාම වැටුප ලබා දීම
22 ஆண்டுகள் சேவையை நிறைவு செய்து ஓய்வு பெற்ற போர் வீரர்கள்: அதிகபட்ச ஓய்வூதியம் வழங்குதல்
WAR HEROES RETIRED COMPLETING A 22-YEAR SERVICE: GRANT OF FULL PENSION

2412/2026

10. ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2009.05.19 දිනට සහ ඉන් අනතුරුව වර්ෂ 22 ක සේවා කාලයක් සම්පූර්ණ කර විශ්‍රාම ගන්නා රණ විරුවන්ට 85%ක උපරිම විශ්‍රාම වැටුපක් ලබා දීමේදී ඇතැම් නිලධාරීන්ට අසාධාරණයක් සිදුව ඇති බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම අසාධාරණයට ලක්වූවන්ට උපරිම විශ්‍රාම වැටුප ලබා දීමට පවතින බාධා කවරේද;

(iii) එම නිලධාරීන්ට හිමි විය යුතු විශ්‍රාම වැටුපට අදාළ හිඟ මුදල් ගෙවීමට ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2009.05.19ஆந் திகதியன்றும், அதன் பின்னரும் 22 வருட சேவைக் காலத்தை நிறைவு செய்து, ஓய்வுபெறும் படை வீரர்களுக்கு 85% அதிகபட்ச ஓய்வூதியத்தை வழங்கும்போது, சில உத்தியோகத்தர்களுக்கு அநீதி ஏற்பட்டுள்ளதை அவர் ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(ii) ஆமெனில், அவ்வாறு அநீதி இழைக்கப் பட்டவர்களுக்கு அதிகபட்ச ஓய்வூதியத்தை வழங்குவதில் நிலவும் தடைகள் யாவை என்பதையும்;

(iii) அவ்வுத்தியோகத்தர்களுக்கு உரித்தான ஓய்வூதி யத்துடன் ஏற்புடைய நிலுவைத் தொகையை செலுத்துவதற்கான வழிமுறையொன்றைத் தயாரிப்பதற்கு நடவடிக்கை மேற்கொள்ளப் படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Defence:

(a) Will he inform this House -

(i) whether he admits that an injustice has been caused to certain officers when granting the maximum pension of 85 per cent to war heroes who retired upon completing 22 years of service on or after 19.05.2009;

(ii) if so, the obstacles that exist to granting the maximum pension to those who suffered the said injustice; and

(iii) whether actions will be taken to formulate a mechanism to pay the arrears related to the pension to the said officers?

(b) If not, why?

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

ගරු කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) විශ්‍රාම වැටුපක් හිමිවීම සඳහා අවශ්‍ය නියමිත සේවා කාලය සම්පූර්ණ කරනු ලබන සහ 2009.05.19 දින වනවිට සේවයේ යෙදී සිට ඉන් අනතුරුව විශ්‍රාම ගන්නා නිලධාරීන් හා සෙසු නිලයන් වෙත සියයට 85ක විශ්‍රාම වැටුපක් හිමි ගැන්වීම සඳහා විධිවිධාන පවතී.

නමුත්, 2009.05.19 දිනට පෙර වසර 22ක සේවා කාලයකින් පසු විශ්‍රාම ගෙන සිටින සන්නද්ධ සේවා නිලධාරීන්ට හා සෙසු නිලධාරීන්ට සියයට 85ක විශ්‍රාම වැටුපක් ලබා ගැනීමට අවශ්‍ය අනුමත ප්‍රතිපාදනය වන්නේ, අවම වශයෙන් වසර 5ක සේවා කාලයක් ක්‍රියාන්විත රාජකාරියේ නිරතව සිටිය යුතු වීමයි. ඒ අනුව, එහි අනුමත ප්‍රතිපාදනය යටතට ගැනෙන නිලධාරීන් හා සෙසු නිලයන් ඒ සඳහා සුදුසුකම් ලබයි.

(ii) ඉහත (i) පිළිතුර අනුව අනුමත ප්‍රතිපාදනය යටතට ගැනෙන නිලධාරීන්ට හා සෙසු නිලයන්ට අදාළ ගෙවීම් සිදු කරනු ලබයි.

(iii) ඒ සඳහා අදාළ නිර්දේශ/ යෝජනා රජයේ නිලධාරීන්ගේ වැටුප් හා විශ්‍රාම වැටුප් කොමිෂන් සභාව වෙත විසඳුමක් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර තිබෙනවා.

(ආ) අදාළ නොවේ.

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

ගරු කථානායකතුමනි, ඇත්තටම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ පිළිතුර සම්බන්ධයෙන් මම කනගාටු වෙනවා. මම හිතන විධියට, මෙම ප්‍රශ්නයට නිවැරදි අධ්‍යයනයකින් තොරව තමයි ගරු නියෝජ්‍ය ඇමතිතුමා පිළිතුරු දුන්නේ. මොකද, වසර 22ක සේවා කාලයක් සම්පූර්ණ කර විශ්‍රාම ගන්නා රණ විරුවන්ට සියයට 85ක උපරිම විශ්‍රාම වැටුපක් ලබා දීමේදී ඇතැම් රණ විරුවන්ට අසාධාරණයක් වෙලා තිබෙනවාය කියන එක ඔබතුමා ආරක්ෂක නියෝජ්‍ය ඇමතිවරයා විධියට පිළිගන්නවාද කියන කාරණය තමයි මම ඇහුවේ.

ඇත්තටම ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම නිර්ලෝභීව ඔබතුමාව රණ විරුවෙක් විධියට හඳුන්වන්න කැමතියි. ඒ කුරිරු යුද පිටිය තුළ හිටපු කෙනෙක් වාගේම අද ආරක්ෂක නියෝජ්‍ය ඇමතිවරයා විධියට විශ්‍රාම ගන්නා ඒ රණ විරුවන්ට අසාධාරණයක් වුණාද, නැද්ද කියන එක සම්බන්ධයෙන් නිශ්චිත පිළිතුරක් තිබෙන්න ඕනෑ. නමුත්, ඔබතුමාගේ පිළිතුරේදී මම දැක්කේ මම අහපු ප්‍රශ්නයට එහි ක්‍රමවේදය පැහැදිලි කිරීම විතරයි. ගරු කථානායකතුමනි, ඇත්තටම මේ පිළිතුර සභාව නොමඟ යැවීමක් විධියට තමයි අපට හැඟෙන්නේ.

පසුගිය හැන්සාඩ් වාර්තා පරීක්ෂා කර බැලුවොත් පෙනේවි, ඔබේ නායකයා වන වත්මන් ජනාධිපතිතුමා විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු විධියට සිටියදී ස්ථාවර නියෝග 27(2) යටතේ මේ ප්‍රශ්නය අකුරක් නෑර මේ විධියටම අහලා තිබෙන බව. 2015 දෙසැම්බර් 01වැනි දා මේ ප්‍රශ්නය අද චානක මාදුගොඩ වන මම ඇසූ විධියටම එදා වත්මන් ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා අහලා තිබෙනවා. එදා එතුමා මේක ප්‍රශ්නයක් විධියට දැක්කා. එහෙම ප්‍රශ්නයක් විධියට ඒක දැකපු නිසා තමයි එතුමා ඒ ගැන ඇහුවේ. ඒ අවස්ථාවේදී එම ප්‍රශ්නයට පිළිතුරු දුන්නේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා හැටියට අපේ වර්තමාන විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමායි. වර්තමාන ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා 2015 වර්ෂයේදී අහපු ප්‍රශ්නයට එතුමා ඉතාම සාධනීය පිළිතුරක් ලබා දීලා තිබුණා. ඇත්තටම මම මේ ප්‍රශ්නය යොමු කරලා දීර්ඝ කාලයක් බලා ගෙන හිටියා, පිළිතුරක් ලබා ගැනීම සඳහා. නමුත්, ඒ දීර්ඝ කාලය තුළ පිළිතුරක් ලැබුණේ නැති නිසා අපිට යම් කනගාටුවක් දැනුණා.

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. අඩුම ගණනේ, ත්‍රිවිධ හමුදාවේ 10,600ක් පමණ වන මේ පිරිසට සිදු වුණේ අසාධාරණයක් කියන එක ඔබතුමා පිළිගන්නවාද? මොකද, අවුරුදු 5ක් යුද පිටියේ හිටියා කියන කාරණය නොවෙයි, අවුරුදු 22ක සේවා කාලය තුළ යුද්ධය තිබෙන සමයේදීත් ඒ රණ විරුවන් තමන්ගේ ජීවිත පරදුවට තබා සිදු කළේ විශිෂ්ට කාර්යභාරයක්. ඒ නිසා ඔබ ඉතාම ගෞරවනීය රණ විරුවෙක් විධියටත්, ඊට නායකත්වය දීපු කෙනෙකු විධියටත් මේ සම්බන්ධයෙන් ඉතාම පැහැදිලි පිළිතුරක් අද මේ සභාව හමුවේ ප්‍රකාශ කරනවා නම් වටිනවා කියන කාරණය මේ මොහොතේදී මම සිහිපත් කරනවා.

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය ඇසීම සම්බන්ධව ගරු මන්ත්‍රීතුමාට මම බෙහෙවින් ස්තුතිවන්ත වනවා. මේක ඉතාම වැදගත් ප්‍රශ්නයක්. අපි අවුරුදු 2ක් තිස්සේ උපරිම වශයෙන් උත්සාහ කරනවා, මේ සම්බන්ධව පිළිතුරක් සොයා ගැනීම සඳහා.

ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම ඔබතුමා කිව්වා වාගේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් 2010 ජූලි මාසයේ 16වැනි දා නිකුත් කර තිබෙන චක්‍රලේඛය තමයි මේ ප්‍රශ්නයට මූලික වෙන්නේ. ඒ, එවකට යුද්ධයත් අවසන් වෙලා අවුරුද්දයි මාස 2කට පස්සේ. මේ කියන කාණ්ඩයට නැවතත් සියයට 85ක විශ්‍රාම වැටුපක් හදා දීම සඳහා ඒ චක්‍රලේඛයේ තිබෙන ප්‍රතිපාදන අපි වෙනස් කර ගත යුතුයි. මොකද, ඒකේ බොහොම පැහැදිලිවම කියලා තිබෙනවා, 2009 මැයි 19ට කලින් විශ්‍රාම යන අවුරුදු 22ක සේවා කාලය සම්පූර්ණ වුණු අයට අවුරුදු 5ක ක්‍රියාන්විත සේවයක් තිබිය යුතුමයි කියලා. ඒක තමයි අප වෙනස් කර ගත යුතුව තිබෙන්නේ. අපි බලයට පත් වුණාට පසුව ගරු ජනාධිපතිතුමා, විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක ජනරාල්තුමා සහ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්තුමා කියන ඒ සියලු දෙනාත් එක්ක සාකච්ඡා සෑහෙන ප්‍රමාණයක් පැවැත්වුවා. මේ කාණ්ඩය යටතේ රණ විරුවන් විශාල ප්‍රමාණයක් සිටිනවා. එතකොට පවතින නීතිමය ප්‍රතිපාදන සහ චක්‍රලේඛ අනුව තමයි ඒ අවස්ථාවේදී මේක දීමට නොහැකි වෙලා තිබෙන්නේ. රජයක් විධියටත්, මේ සභාවේ ඉන්න කෙනෙකු හැටියට මමත් ඉතාම උනන්දුවෙන් මේ ගැන කටයුතු කරලා තිබෙනවා. ඒ අනුව දැනට රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් හා විශ්‍රාම වැටුප් කොමිෂන් සභාව පත් කරලා තිබෙනවා. ආරක්ෂක අමාත්‍යාංශය විසින් මේ කියන කරුණත් ඇතුළුව තවත් තිබෙන විශ්‍රාම වැටුප් විෂමතා සියල්ලක්ම ගොනු කරලා, පසුගිය 09වැනි දා එම කොමිෂන් සභාවේ සභාපතිතුමාටත් ඉදිරිපත් කළා. එම විශ්‍රාම වැටුප් කොමිෂන් සභාවෙන් මේකට නිර්දේශයක් ලබා ගන්න පුළුවන් වෙයි කියලා අපි බොහෝ දුරට බලාපොරොත්තු වෙනවා. එතකොට මේ විෂමතාව තිබෙන කාණ්ඩයට සාධාරණයක් ලබා ගන්න පුළුවන් වෙයි කියලා අපට බලාපොරොත්තුවක් තිබෙනවා. විශේෂයෙන්ම ත්‍රිවිධ හමුදාව, පොලීසිය, විශේෂ කාර්ය බලකාය, සිවිල් ආරක්ෂක බළඇණි අපේ රටේ තිබුණු ඒ ත්‍රස්තවාදී කටයුතුවලට එරෙහිව කටයුතු කරපු එක රජයක් හැටියට අපි කවදත් අගය කරනවා වාගේම ඒ අය අපේ ගෞරවයට පාත්‍ර වෙනවා. ඒ සඳහා ඔවුන්ට ලැබෙන්න තිබෙන සියලු දීමනා, සහන, සුබසාධන කටයුතු සම්බන්ධයෙන් විශේෂයෙන් අපි සැලකිලිමත් වෙනවා. ඔබතුමන්ලා දන්නවාත් ඇති, පසුගිය මැයි මාසයේ 18වැනි දා විශේෂයෙන්ම සියලු ආබාධිත රණ විරුවන් සම්බන්ධයෙන් තිබෙන ඒ වැටුප් විෂමතා, දීමනා, ස්ථාවර දීමනා, ඔවුන්ගේ යැපෙන්නන්, වැන්දඹුවන්ගේ ඒ සියලු ගැටලු නිරාකරණය කරලා ඒ චක්‍රලේඛයත් අපි නිකුත් කළ බව. ඒ වාගේම මේකත් අපි කොහොම හරි කර ගනිමු කියන එක තමයි ගරු මන්ත්‍රීතුමාට කියන්න තිබෙන්නේ.

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

ගරු කථානායකතුමනි, පිළිතුරු ලබා දීම සම්බන්ධයෙන් මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා රණ විරුවෙක් විධියට වාගේම මේ ප්‍රශ්නය පිළිබඳව ඉතාම හොඳින් දන්නා කෙනෙක් විධියට රණ විරුවාට ඒ ගෞරවය, ඒ වටිනාකම ලබා දීම සම්බන්ධයෙන් වාගේම මේ සභාව තුළ ඒ සම්බන්ධයෙන් කථා කිරීමට කොන්දක් තිබීම පිළිබඳවත් මම අතිශයින්ම මේ අවස්ථාවේදී ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ඔබතුමා කිව්වා, මේ පිළිබඳ නිර්දේශ සහ යෝජනා විශ්‍රාම වැටුප් කොමිසමට යවා තිබෙනවාය කියලා. ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය වෙන්නේ මේ නිර්දේශ සහ යෝජනා යැව්වේ කවදාද, ඒ පිළිබඳව වර්තමාන ප්‍රගතිය කුමක්ද, අපට මොන දින වකවානුවල මේ කටයුත්තට පිළිතුරක් ලබා ගන්න පුළුවන් වෙයිද කියන එකයි. රණ විරුවන්ට දීර්ඝ කාලයක් රජයන් කිහිපයක් යටතේ විසඳා ගන්න බැරි වෙච්ච මේ ගැටලුව කවදා අපට විසඳා දෙන්න පුළුවන්ද කියන ඒ සුබ පණිවුඩය අපට දැනගන්න පුළුවන්ද කියන කාරණය වාගේම ඔබේ ආණ්ඩුව කාලයේ මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන්ද කියන කාරණයත් මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ගරු මන්ත්‍රීතුමනි, මම කලිනුත් කිව්වා වාගේ ඔක්තෝබර් 09වැනි දා මේ කියන විෂමතාවත් ඇතුළත්ව තව කරුණු 8ක් සන්නද්ධ හමුදා, පොලීසිය, විශේෂ කාර්ය බලකායට අදාළව ඉදිරිපත් කළා. ආරක්ෂක ලේකම්ගේ අත්සනින් යුතුවම සභාපතිතුමාටම එය භාර දුන්නා. මම දන්නා විධියට ලබන අවුරුද්දේ ජනවාරි හෝ පෙබරවාරි වෙනකම් ඔවුන්ට - කොමිෂන් සභාවට - කාලය ලබා දීලා තිබෙනවා. මට ඉතාම ධනාත්මක විශ්වාසයක් තිබෙනවා, ඔවුන් මේ ගැන සැලකිල්ලට භාජන කරලා නිර්දේශ ලබා දෙයි කියලා. නමුත් මේ නිර්දේශ ලබා දෙන දිනයක් හරියටම කියන්න බැහැ. නමුත් මම හිතන විධියට ලබන අවුරුද්දේ පෙබරවාරි වාගේ වෙනකොට නිර්දේශ ඉදිරිපත් කරයි. අපේ රජය යටතේ රණ විරුවන්ගේ ඒ සියලු දීමනා, එහෙම නැත්නම් සහන, විශ්‍රාම වැටුප් විෂමතා සම්බන්ධ ගැටලු විසඳනවා කියන එක අපි ඉතාම වගකීමෙන් යුතුව කියනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

ප්‍රශ්න අංක 3 -1042/2025- (1), ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

විදේශ දූත මණ්ඩල වෙත ලැබෙන විදේශ ගමන් බලපත්‍ර අයදුම්පත් සැකසීම: ප්‍රමාදය

தூதரகங்களால் பெறப்பட்ட கடவுச்சீட்டு விண்ணப்பங்களுக்கான செயலாக்கம்: தாமதம்

PROCESSING PASSPORT APPLICATIONS RECEIVED BY DIPLOMATIC MISSIONS: DELAY

1079/2025

4. ගරු ධර්මප්‍රිය වීජේසිංහ මහතා (ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා වෙනුවට)

(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ - மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி சார்பாக)

(The Hon. Darmapriya Wijesinghe on behalf of the Hon. Rajeevan Jeyachandramoorthy)

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) විදේශ දූත මණ්ඩලවලදී විදේශ ගමන් බලපත්‍ර අයදුම්පත් සැකසීම සඳහා ගතවන සාමාන්‍ය කාලය කොපමණද;

(ii) නියමිත විදේශ ව්‍යවහාර මුදල් ගාස්තු ගෙවා තිබියදීත්, එම කටයුතු ප්‍රමාද වීමට හේතු කවරේද;

(iii) හදිසි අවස්ථා සඳහා කඩිනම් ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) විදේශ කොන්සියුලර් කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාව සහ කාර්ය සාධනය අධීක්ෂණය කිරීමේ සහ ඇගයීමේ ක්‍රියාපටිපාටිය කවරේද;

(ii) දූත මණ්ඩල කාර්ය මණ්ඩලයට එරෙහිව ලැබෙන පැමිණිලි විසඳීම සඳහා පවතින යාන්ත්‍රණ කවරේද;

(iii) අල්ලස් ලබාගැනීම සඳහා තැරැව්කරුවන් සමඟ රහසිගතව සම්බන්ධවී කටයුතු කරන බවට එල්ලවී ඇති චෝදනා සම්බන්ධයෙන් විගණන හෝ විනය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) මෙහි කාර්යක්ෂමතාව සහ විනිවිදභාවය වැඩිදියුණු කිරීම සඳහා ගනිමින් සිටින පියවර කවරේද;

(ii) විදේශයන්හි සිටින අයදුම්කරුවන් සඳහා මාර්ගගත අයදුම්පත් නිරීක්ෂණ පද්ධතියක් හඳුන්වා දීමට කටයුතු කරන්නේද;

(iii) දුක්ගැනවිලි විසඳීමට, ප්‍රමාදවූ අයදුම්පත් සඳහා ප්‍රමුඛතාවය ලබාදීමට සහ අධික ලෙස ප්‍රමාදවීම් සඳහා වන්දි ලබාදීම සලකා බැලීමට යෝජනා කර ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

වෙළිනාට්ටලුවල්කල්, වෙළිනාට්ටු වේලෙවාය්ප්පු මර්රුම් සුර්රුලා අමෙච්චරෙක් කේට්ට විනා:

(அ) (i) வெளிநாட்டுத் தூதரகப் பணியகங்களில் கடவுச்சீட்டு விண்ணப்பங்களுக்கான சராசரிச் செயலாக்கக் காலம் எவ்வளவு என்பதையும்;

(ii) குறித்துரைக்கப்பட்ட வெளிநாட்டு நாணயக் கட்டணங்கள் செலுத்தப்பட்டிருந்தும் தாமதங்களுக்கான காரணங்கள் என்ன என்பதையும்;

(iii) அவசர சூழ்நிலைகளுக்கென துரிதமான செயலாக்க நடைமுறைகள் உள்ளனவா என்பதையும்;

அவர் இச்சபைக்கு அறியத்தருவாரா?

(ஆ) (i) வெளிநாட்டுத் தூதரகப் பணியகப் பணியாளர்களின் வினைத்திறனையும் செயலாற்றுகையையும் கண்காணித்து மதிப்பிடுவதற்கான நடைமுறையையும்;

(ii) தூதரகப் பணியகப் பணியாளர்களுக்கு எதிரான முறைப்பாடுகளைக் கையாண்டு ஆவன செய்வதற்காக இருக்கும் பொறிமுறைகளையும்;

(iii) இலஞ்சத்துக்காகத் தரகர்களுடன் கூட்டுச் சதியில் ஈடுபட்டமை பற்றிய சார்த்துதல்கள் தொடர்பாக கணக்காய்வுகள் அல்லது ஒழுக்காற்று நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டுள்ளனவா என்பதையும்;

அவர் இச்சபைக்கு அறியத்தருவாரா?

(இ) (i) வினைத்திறன் மற்றும் வெளிப்படைத் தன்மையை மேம்படுத்துவதற்கு எடுக்கப்பட்டு வரும் நடவடிக்கைகளையும்;

(ii) வெளிநாட்டு விண்ணப்பதாரர்களுக்கான நிகழ் நிலைக் கண்காணிப்பு முறைமை அறிமுகப் படுத்தப்படுமா என்பதையும்;

(iii) குறைகளை நிவர்த்தி செய்வதற்கும் தாமதமான விண்ணப்பங்களுக்கு முன்னுரிமையளிப்பதற்கும் அதீத தாமதங்களுக்காக நட்டஈடு வழங்குவதைக் கருத்திற்கொள்வதற்கும் முன்மொழியப்பட்டுள்ள நடவடிக்கைகளையும்;

அவர் இச்சபைக்கு அறியத்தருவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs, Foreign Employment and Tourism:

(a) Will he inform this House -

(i) the average processing time for passport applications at overseas diplomatic missions;

(ii) the reasons for delays despite prescribed foreign currency fees being paid; and

(iii) whether fast-track procedures are in place for urgent cases

(b) Will he also inform this House -

(i) the procedure for monitoring and evaluating the efficiency and performance of overseas consular staff;

(ii) the mechanisms available to address complaints against mission staff; and

(iii) whether audits or disciplinary action have been taken regarding allegations of collusion with brokers for bribery?

(c) Will he further inform this House -

(i) the steps being taken to improve the efficiency and transparency;

[ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා]

(ii) whether an online tracking system will be introduced for overseas applicants; and

(iii) the measures proposed to address grievances, prioritize delayed applications and consider compensation for excessive delays?

(d) If not, why?

ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා (සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ - சுற்றுலாப் பிரதி அமைச்சர்)
(The Hon. (Prof.) Ruwan Ranasinghe - Deputy Minister of Tourism)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) (අ) විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීම සහ ඊට අදාළ කටයුතු සිදු කිරීම ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ විෂය පථයට අයත් වේ. විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල සහ කොන්සල් කාර්යාල, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව, විදේශ ගමන් බලපත්‍ර අයදුම්පත් භාර ගැනීමට පහසුකම් සලසන අතර, විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයන්ට විදේශ ගමන් බලපත්‍ර සහ වෙනත් විවිධ වර්ගයේ ශ්‍රී ලාංකික සංචාරක ලේඛන සම්බන්ධයෙන් අවශ්‍ය කොන්සල් සහාය ලබා දෙයි.

(ආ) විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල සහ කොන්සල් කාර්යාල හරහා ඉදිරිපත් කරන විදේශ ගමන් බලපත්‍ර අයදුම්පත් සැකසීමට ගතවන කාලය; අදාළ කලාපය, ඉදිරිපත් කරන ලද ලේඛනවල සම්පූර්ණත්වය සහ අවශ්‍ය තහවුරු කිරීමේ ක්‍රියාවලීන් සම්පූර්ණ කිරීමට ගතවන කාලය මත පදනම්ව වෙනස් විය හැකිය.

- මැදපෙරදිග කලාපයේ ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාල: අවශ්‍ය සියලුම ලේඛන නිවැරදිව ඉදිරිපත් කර ඇත්නම්, අයදුම්පතක් සැකසීමට සාමාන්‍යයෙන් සති තුනක පමණ කාලයක් ගතවේ.
- යුරෝපා සහ උතුරු ඇමරිකානු කලාපයේ ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාල: අවශ්‍ය සියලුම ලේඛන ඉදිරිපත් කර, අදාළ තහවුරු කිරීමේ ක්‍රියාවලීන් සම්පූර්ණ කර ඇත්නම්, අයදුම්පතක් සැකසීමට සාමාන්‍යයෙන් මාස දෙකක පමණ කාලයක් ගතවේ. කෙසේවෙතත්, එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව සහ නවසීලන්තයේ පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාල හරහා ඉදිරිපත් කරන විදේශ ගමන් බලපත්‍ර අයදුම්පත් සාමාන්‍යයෙන් මාසයක පමණ කාලයක් තුළ සකසා අවසන් කරනු ලැබේ.
- අලුත උපන් දරුවන් සඳහා වන විදේශ ගමන් බලපත්‍ර අයදුම්පත්: අවශ්‍ය සියලුම ලේඛන ඉදිරිපත් කර, අදාළ සැකසුම් කටයුතු සම්පූර්ණ කර ඇත්නම්, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත අයදුම්පත ලැබුණු දින සිට සාමාන්‍යයෙන් සතියක පමණ කාලයක් තුළ මෙවැනි අයදුම්පත් සකසා අවසන් කරනු ලැබේ.
- ස්වාධීන දූත මණ්ඩල/කාර්යාල මඟින් යොමු කෙරෙන අයදුම්පත්: දකුණු අප්‍රිකාව සහ සීෂෙල්ස් වැනි රටවල පිහිටි දූත මණ්ඩල/කාර්යාල හරහා ඉදිරිපත් කරන අයදුම්පත්, අවශ්‍ය සියලුම ලේඛන සම්පූර්ණව ඉදිරිපත් කර ඇත්නම් සහ අදාළ තහවුරු කිරීමේ ක්‍රියාවලීන් සම්පූර්ණ කර ඇත්නම් සාමාන්‍යයෙන් සති දෙකක පමණ කාලයක් තුළ සකසා අවසන් කරනු ලැබේ.

(ii) (අ) නියමිත ගාස්තුව ගෙවීමෙන් පමණක් ගමන් බලපත්‍ර අයදුම්පතක් කඩිනමින් සැකසීම සිදුවන බව සහතික නොකරයි. අවශ්‍ය ලේඛන අසම්පූර්ණව පවතින විට හෝ අවශ්‍ය තහවුරු කිරීම් සිදු කිරීම සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට අතිරේක ලේඛන හෝ තොරතුරු අවශ්‍ය වන විට ප්‍රමාදයන් ඇති විය හැකිය.

(ආ) එවැනි ලේඛනවලට පුරවැසිභාවය පිළිබඳ සාක්ෂි, උප්පැන්න සහතික, ජාතික හැඳුනුම්පත්, පෙර ගමන් බලපත්‍ර හෝ අදාළ වෙනත් සහායක ලේඛන ඇතුළත් විය හැකිය.

(ඇ) අවශ්‍ය සියලුම ලේඛන නිවැරදිව ඉදිරිපත් කර ඇති අතර වැඩිදුර තහවුරු කිරීම් අවශ්‍ය නොවන අවස්ථාවකදී අයදුම්පත සකසනු ලබන අතර ගමන් බලපත්‍රය හැකි ඉක්මනින් අදාළ ශ්‍රී ලංකා දූත මණ්ඩලය/කාර්යාලය වෙත යවනු ලැබේ. ඉන්පසු අදාළ අවස්ථාවලදී පැරණි ගමන් බලපත්‍රය භාරදීමෙන් අනතුරුව අදාළ දූත මණ්ඩලයෙන්/කාර්යාලයෙන් නව ගමන් බලපත්‍රය ලබා ගත හැකිය.

(iii) (අ) ඔව්. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ස්ථාපිත ක්‍රියා පටිපාටිවලට අනුකූලව යම් අයදුම්කරුවෙකුට විදේශ ගමන් බලපත්‍රයක් ලබා ගැනීමට හදිසි හෝ අත්‍යවශ්‍ය අවශ්‍යතාවක් පවතී නම්, එම හදිසි හෝ අත්‍යවශ්‍ය තත්ත්වය තහවුරු කරන සාක්ෂි සහිතව අදාළ ශ්‍රී ලංකා දූත මණ්ඩලය/කාර්යාලය හරහා ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකිය;

(ආ) එම තත්ත්වයන් තහවුරු කර ගැනීමෙන් අනතුරුව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ අදාළ ක්‍රියා පටිපාටිවලට යටත්ව සහ එහි අනුමැතිය ඇතිව එම අයදුම්පත කඩිනමින් සැකසීමට කටයුතු කළ හැකිය;

(ඇ) තවද, ශ්‍රී ලංකාව තුළදී 'එක් දින විදේශ ගමන් බලපත්‍ර සේවාව' අවශ්‍ය වන අයදුම්කරුවන්ට සුදුසු අවස්ථාවලදී තමන් පදිංචි රටේ පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලය/කාර්යාලය හෝ සමගාමී ප්‍රතිනිධිත්වය ලත් වෙනත් දූත මණ්ඩලයක්/කාර්යාලයක් විසින් නිකුත් කරනු ලබන 'හදිසි ගමන් ලේඛනයක්' - Emergency Travel Document එකක් - භාවිතා කරමින් ශ්‍රී ලංකාවට පැමිණිය හැකිය. ශ්‍රී ලංකාවට පැමිණි පසු අදාළ අවශ්‍යතා සහ ක්‍රියා පටිපාටිවලට යටත්ව අයදුම්කරුට තම විදේශ ගමන් බලපත්‍ර අයදුම්පත සෘජුවම ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර එක් දින විදේශ ගමන් බලපත්‍ර සේවාව හරහා විදේශ ගමන් බලපත්‍රය ලබා ගත හැකිය.

(ආ) (i) (අ) කොන්සියුලර් නිලධාරීන්ගේ සහ කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනය අමාත්‍යාංශයේ සහ අදාළ රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල/කාර්යාලවල ස්ථාපිත පරිපාලන සහ අධීක්ෂණ යන්ත්‍රණයන් හරහා නිරීක්ෂණය කෙරේ. කොන්සියුලර් කාර්ය මණ්ඩලය දූත මණ්ඩල/කාර්යාල පරිපාලනය සඳහා වගකිව යුතු රාජ්‍ය තාන්ත්‍රික නිලධාරියෙකු වන චාන්සරි ප්‍රධානියාගේ සෘජු අධීක්ෂණය යටතේ හෝ අදාළ වන විට කොන්සියුලර් කාර්යයන් අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතු කොන්සියුලර් ප්‍රධානියා/කොන්සියුලර් අංශ ප්‍රධානියාගේ සෘජු අධීක්ෂණය යටතේ දූත මණ්ඩල ප්‍රධානියාගේ සමස්ත මගපෙන්වීම සහ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ;

(ආ) දූත මණ්ඩල / කාර්යාලවල කොන්සියුලර් නිලධාරීන් සහ කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනය සහ හැසිරීම සම්බන්ධයෙන් වාර්තා කරන ලද ගැටලු සහ සිදුවීම් කෙරෙහි ද අමාත්‍යාංශය අවශ්‍ය අවස්ථාවන්හිදී අවධානය යොමු කරයි. දූත මණ්ඩල/කාර්යාල මඟින් ඉදිරිපත් කරන වාර්ෂික ප්‍රගති වාර්තා සමඟ එක් එක් නිලධාරියාගේ අනිවාර්ය වාර්ෂික කාර්ය සාධන වාර්තා, කොන්සියුලර් කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනය සහ ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීමේදී සහ ඇගයීමේදී සැලකිල්ලට ගනු ලැබේ;

(ඇ) තවද, විශේෂයෙන් නව පද්ධති, ක්‍රියා පටිපාටි හෝ තාක්ෂණික වේදිකා හඳුන්වා දෙන විට අවශ්‍ය විටෙක කොන්සියුලර් නිලධාරීන්ට සහ කාර්ය මණ්ඩලයට පුහුණු වැඩසටහන්, උපදෙස් සහ මග පෙන්වීම් ලබා දෙනු ලැබේ.

කොන්සියුලර් කාර්ය මණ්ඩලයේ දැනුම, කුසලතා සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ මහජනතාවට කොන්සියුලර් සේවාවන් ඵලදායී හා කාර්යක්ෂමව සැපයීම සහතික කිරීම මෙම පියවරයන් මඟින් අරමුණු කර ඇත.

(ii) (අ) මහජනතාවට තම පැමිණිලි හෝ දුක්ගැනවිලි, අදාළ ශ්‍රී ලාංකික රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩලයේ/කාර්යාලයේ නිල විද්‍යුත් තැපැල් ලිපිනයන් සහ වෙනත් ස්ථාපිත සන්නිවේදන මාර්ග හරහා ඍජුවම දූත මණ්ඩල ප්‍රධානියා වෙත හෝ එම දූත මණ්ඩලයේ/කාර්යාලයේ වගකිවයුතු ජ්‍යෙෂ්ඨ නිලධාරියා(නි) වෙත, එසේත් නොමැති නම් කොන්සියුලර් කටයුතු අංශය ඇතුළුව විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ හැකිය.

(ආ) පැමිණිල්ලක් ලැබුණු පසු අදාළ පරිපාලන ක්‍රියා පටිපාටිවලට අනුකූලව එම පැමිණිල්ල පරීක්ෂා කරනු ලැබේ. අවශ්‍ය අවස්ථාවලදී පැමිණිල්ලේ සත්‍යතාව මෙන්ම ඊට අදාළ කරුණු සහ තත්ත්වයන් නිසි මාර්ග ඔස්සේ තහවුරු කරගනු ලැබේ. මෙවැනි පරීක්ෂාවක හෝ විමර්ශනයක ප්‍රතිඵල මත පදනම්ව අදාළ නීති සහ ක්‍රියා පටිපාටිවලට අනුකූලව සුදුසු පියවර ගනු ලබන අතර, අවශ්‍ය යැයි හැඟෙන අවස්ථාවලදී නිවැරදි කිරීමේ පියවර ද හඳුන්වා දෙනු ලැබේ.

(iii) අල්ලස් ඉල්ලා සිටීමේ හෝ ලබා ගැනීමේ අරමුණින් දූත මණ්ඩල/කාර්යාල කාර්ය මණ්ඩලය සහ තැරැව්කරුවන් හෝ අතරමැදියන් අතර සිදුවිය හැකි කුමන්ත්‍රණ සම්බන්ධ පැමිණිලි හෝ චෝදනා ඉතා දුර්ලභය. කෙසේ වෙතත් එවැනි පැමිණිලි හෝ චෝදනා ලැබුණු විට ස්ථාපිත පරිපාලන සහ විනය ක්‍රියා පටිපාටිවලට අනුකූලව ඒවා පරීක්ෂා කර විමර්ශනය කරනු ලැබේ. නිසි විමර්ශනයකින් සහ කරුණු තහවුරු කිරීමකින් අනතුරුව චෝදනා සනාථ වුවහොත් ආයතනයේ සහ එහි කාර්ය මණ්ඩලයේ සුපිළිපන්භාවය, වගවීම සහ වෘත්තීයභාවය පවත්වාගෙන යාමේ අරමුණින් අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූලව සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ.

(ඇ) (i) (අ) විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකික පුරවැසියන් වෙත සපයනු ලබන විදේශ ගමන් බලපත්‍ර ආශ්‍රිත සේවාවන්හි කාර්යක්ෂමතාව, ප්‍රවේශ වීමේ පහසුව, විනිවිදභාවය සහ සමස්ත ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ අරමුණින් විදේශයන්හි පිහිටි ශ්‍රී ලාංකික රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල සහ කොන්සල් කාර්යාල හරහා 'මාර්ගගත විදේශ ගමන් බලපත්‍ර අයදුම් කිරීමේ පද්ධතියක්' හඳුන්වා දීමට පියවර ගෙන ඇත.

(ආ) මෙම වැඩසටහනේ පළමු අදියර ලෙස ශ්‍රී ලාංකික දූත මණ්ඩල/කාර්යාල 25ක් ඊට සම්බන්ධ කර ගැනීමට හඳුනාගෙන ඇත. සංක්‍රමණිකයන් සඳහා වන ජාත්‍යන්තර සංවිධානයේ -IOM- තාක්ෂණික සහාය ඇතිව ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සහ විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණයෙන් මෙම 'විදේශයන්හි සිට විදේශ ගමන් බලපත්‍ර සඳහා අයදුම් කිරීමේ පද්ධතිය' සංවර්ධනය කර ඇත.

(ඇ) පරිශීලක පිළිගැනීමේ පරීක්ෂාවන් 2026 ජූනි 25 වන දින අවසන් කරන ලද අතර, දැනට සේවාදායක -server- ස්ථාපනය කිරීම සහ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ අදාළ පද්ධති සමඟ එය ඒකාබද්ධ කිරීමේ කටයුතු සිදුවෙමින් පවතී. අවසාන තාක්ෂණික සහ මෙහෙයුම් සූදානම මත පදනම්ව, 2026 ඔක්තෝබර් මාසයේදී මෙම පද්ධතිය නියමු ක්‍රියාත්මක කිරීමේ අදියර වෙත යොමු කිරීමට අපේක්ෂා කෙරේ.

(ii) (අ) ඔව්. හඳුන්වා දෙනු ලබන මාර්ගගත විදේශ ගමන් බලපත්‍ර අයදුම් කිරීමේ පද්ධතිය තුළ අයදුම්කරුවන්ට තම විදේශ ගමන් බලපත්‍ර අයදුම්පත්වල තත්ත්වය මාර්ගගතව නිරීක්ෂණය කළ හැකි පහසුකමක් ඇතුළත් කිරීමට අපේක්ෂිතය. එමඟින් විදේශයන්හි වෙසෙන අයදුම්කරුවන්ට වඩාත් විනිවිදභාවයක් සහ පහසුවක් සැලසෙනු ඇත.

(ආ) මෙම පද්ධතිය පුළුල් ලෙස ක්‍රියාත්මක කිරීමට පෙර එහි මූලික අදියරේ ප්‍රතිඵල මෙන්ම අවශ්‍ය තාක්ෂණික සහ මෙහෙයුම් සූදානම මත පදනම්ව තෝරාගත් ශ්‍රී ලාංකික දූත මණ්ඩල/කාර්යාල පහක මෙම පද්ධතිය ප්‍රථමයෙන් අත්හදා බැලීමේ පදනම මත ක්‍රියාත්මක කරනු ලැබේ.

(iii) (අ) සැබෑ හදිසි අවස්ථාවක් හෝ කඩිනම් තත්ත්වයක් පැන නඟින අවස්ථාවලදී අදාළ තත්ත්වයන් තහවුරු කර ගැනීම සහ ස්ථාපිත ක්‍රියා පටිපාටිවලට යටත්ව ගමන් බලපත්‍ර අයදුම්පත් හඳුනාගෙන ඒවාට ප්‍රමුඛතාව ලබා දීම සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණයෙන් පියවර ගනු ලැබේ;

(ආ) අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද ලේඛනවල අඩුපාඩු හෝ මඟ හැරීම් හේතුවෙන් අයදුම්පතක් ප්‍රමාද වී ඇත්නම් එම අඩුපාඩු සහ අවශ්‍ය අතිරේක ලේඛන හෝ තොරතුරු පිළිබඳව අයදුම්කරු දැනුවත් කරනු ලැබේ. එවැනි අඩුපාඩු නිවැරදි කර අවශ්‍ය ලේඛන ඉදිරිපත් කළ පසු අවශ්‍යතාවය අනුව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ස්ථාපිත ක්‍රියා පටිපාටිවලට අනුකූලව එම අයදුම්පතට ප්‍රමුඛතාව ලබා දිය හැකිය;

(ඇ) ප්‍රමාදයන්, කඩිනම් සැකසුම් ක්‍රියාවලීන්, ලේඛන අතුරුදහන් වීම හෝ අසම්පූර්ණ වීම සහ ගමන් බලපත්‍රවලට අදාළ වෙනත් ගැටලු සම්බන්ධයෙන් අදාළ ශ්‍රී ලංකා දූත මණ්ඩලය/කාර්යාලය, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ කොන්සියුලර් කටයුතු අංශය සහ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව අතර සම්බන්ධීකරණය මඟින් එක් එක් සිද්ධියට අදාළ තත්ත්වය අනුව විසඳුම් ලබා දෙනු ලැබේ;

(ඈ) ප්‍රමාදයන් සඳහා වන්දි ලබා දීම සම්බන්ධයෙන් ගත් කළ අදාළ සිද්ධියේ තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් මෙන්ම අදාළ නීති, රෙගුලාසි සහ ස්ථාපිත පරිපාලන ක්‍රියා පටිපාටිවලට අනුකූලව එක් එක් සිද්ධියට අදාළව සුදුසු නිවැරදි කිරීමේ පියවර පිළිබඳව සලකා බලනු ලැබේ.

(ඈ) එවැනි තත්ත්වයක් පැන නොනඟී.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු කේ. කාදර් මස්තාන් මහතා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

ජපානයේ පැවැත්වෙන 20වන ආසියානු ක්‍රීඩා උළෙල සඳහා වන ශ්‍රී ලංකා කණ්ඩායමට ෆාතිමා ශෆියා යාමික් ඇතුලත් කර නොගැනීම
ஜப்பானில் நடைபெற்ற 20ஆவது ஆசிய விளையாட்டுப் போட்டிக்கான இலங்கை அணியில் பாத்திமா ஷாபியா யாமிக் உள்வாங்கப்படாமை
NON-INCLUSION OF FATHIMA SHAFIYA YAMIK IN SRI LANKAN CONTINGENT FOR 20TH ASIAN GAMES HELD IN JAPAN

ගරු කේ. කාදර් මස්තාන් මහතා
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ சபாநாயகர் அவர்களே, பாராளுமன்ற நிலையியற் கட்டளை 27(2)இன்கீழ் கௌரவ இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர் அவர்களிடம் வினா எழுப்புவதற்கு அனுமதித்தமைக்கு நன்றி.

2026ஆம் ஆண்டு ஐச்சி-நகோயா - Aichi-Nagoya - நகரில் நடைபெற்ற 20ஆவது ஆசிய விளையாட்டுப் போட்டிக்காக இலங்கையைப் பிரதிநிதித்துவப்படுத்தும் 156 விளையாட்டு

[ගරු කේ. කාදර් මස්තාන් මහතා]

වීරාංගනාවන් කොණ්ඩ අණි උත්තියෝගපූර්වමාක අතිවික්කප් පට්ටිරුන්තතු. ඉතිල් 100 ආණ් විළෙයාට්ටු වීරාංගනාවන්ගළුම් 56 පෙණ් විළෙයාට්ටු වීරාංගනාවන්ගළුම් අටංකියතුටන්, අවාංකළ් 25 විළෙයාට්ටුප් පිරිවුකළිල් පෝට්ටියිට්ටනාංක. එනිනුම්, ආච්චරියප්පටුම් විතමාක, වළාංන්තු වරුම් තේසිය චාතනෙයාළරාන පාත්තිමා ෂාපියා යාමික් ඉන්ත අණියිල් චේර්ක්කප්පටවිල්ලෙ.

කණ්ඩි විහාර මහාදේවි මහළිර් විත්තියාලයත්තින් පළෙය මාණවියුම් ඉලංකෙ ඉරාණුවත්තෙප් පිරතිනිතිත්තුවප්පටුත්තුම් විළෙයාට්ටු වීරාංගනෙයුමාන පාත්තිමා ෂාපියා යාමික් අවාංකළ් චුවට්ටු මෙතානප් පෝට්ටිකළිල් කුරිප්පිටත්තක්ක චාතනෙකළෙප් පටෙත්තුළ්ළාර්. කුරිප්පාක, 2025 තෙර්කාසිය තටකළ චාම්පියන්ෂිප් පෝට්ටිකළිල් 100 මීට්රර්, 200 මීට්රර් ඕට්ටප් පෝට්ටි මර්රුම් 4 X 100 මීට්රර් අංචල් ඕට්ටප් පෝට්ටිකළිල් තංකප් පතක්කංකළෙ වෙන්රුළ්ළාර්. අවාර්, 100 මීට්රර් ඕට්ටප්පන්තයත්තිල් 11.53 විනාටිකළිල් ඉලක්කෙක් කටන්තු තංකප් පතක්කම් වෙන්රුළ්ළතුටන්, පුතිය චාතනෙයෙයුම් පටෙත්තුළ්ළාර්. 200 මීට්රර් ඕට්ටප්පන්තයත්තිල් 23.58 විනාටිකළිල් ඉන්තිය වීරාංගනෙ පි.ටි. උෂා අවාංකළින් 32 වරුට චාතනෙයෙයෙ මුරියටිත්තු තංකප් පතක්කම් වෙන්රුළ්ළාර්. මේලුම්, 4 X 100 මීට්රර් අංචල් ඕට්ටප්පෝට්ටියිල් 44.7 විනාටිකළිල් ඉලක්කෙක් කටන්තු ඉලංකෙ තංකප් පතක්කම් වෙල්ල පංකළිප්පුච් චෙය්තුළ්ළාර්.

පින්වරුම් විනාක්කළුක්කාන පතිල්කළෙ කෙළරව අමෙච්චර් අවාංකළිටම් එතිර්පාර්ක්කින්රේන්:

(අ) 20ආවතු ආචිය විළෙයාට්ටුප් පෝට්ටිකළිල් (ඉච්චි-නකෝය 2026) ඉලංකෙයෙප් පිරතිනිතිත්තුවප්පටුත්ත විළෙයාට්ටු වීරාර්කළෙත් තෙරිවුචෙය්වතර්කාකක් කෙයාළප්පට්ට තෙරිවු අළවුකෝල්කළ් මර්රුම් නටෙමුරෙකළ් යාවෙ? අත්තුටන්, චම්පන්තප්පට්ට තේසිය විළෙයාට්ටුච් චංකංකළ් මර්රුම් ඉලංකෙයින් තේසිය ඔලිම්පික් කුළුවාල් පින්පර්රප්පට්ට අළවුකෝල්කළ් යාවෙ?

(ආ) පාත්තිමා ෂාපියා යාමික් අවාර්කළෙ කුරිත්ත ආචිය විළෙයාට්ටුප් පෝට්ටිකළුක්කාන ඉලංකෙක් කුළුවිල් චේර්ප්පතර්කාක උත්තියෝක පූර්වමාකප් පරිචීලික්කප්පට්ටාරා? අව්වා රාෙයින්, අවාර් තෙරිවු චෙය්යප්පටාමෙ එතෙ අටිප්පටෙයාකක්කොණ්ටු තීර්මානික්කප්පට්ටතු?

(ඉ) අව්වාරු පරිචීලික්කප්පටවිල්ලෙයෙනිල් අල්ලතු තෙරිවු චෙය්යප්පටවිල්ලෙයෙනිල්, 2025 තෙර්කාසිය පෝට්ටිකළිල් අවරතු චිරප්පාන තිරමෙයුම් අතන් පින්නරාන තේසිය මට්ටත්තිලාන තිරමෙකළුම් කවනත්තිර් කොළ්ළප්පට්ටතා? අවර්රෙප් පුරක්කණිප්පතර්කාන කාරණංකළ් යාවෙ?

(ඊ) ෂාපියා යාමික් මූන්රු මුරෙ කටිතම් එළුතියුම් නිරුවාකම් ඒන් උරිය නේරත්තිල් අවරුක්කුප් පතිලළික්කත් තවරියතු?

(උ) පිරතාන චර්වතේච විළෙයාට්ටු නිකළ්වුකළිල් ඉලංකෙයෙප් පිරතිනිතිත්තුවප්පටුත්ත විළෙයාට්ටු වීරාර්කළෙත් තෙරිවුචෙය්යුම් චෙයර්පාටානතු, තෙළිවාන මර්රුම් පොතුමක්කළුක්කු වෙළිප්පටෙයාන තෙරිවු අළවුකෝල්කළුටන්, ඔළිවුමරෙවර්ර, පක්කච්චාර්පර්ර මර්රුම් චෙයර්රිරනෙ අටිප්පටෙයාකක් කොණ්ට මුරෙයිල් නටෙපෙරුවතෙ උරුතිප්පටුත්ත නටවටික්කෙ එටුක්කප්පටුමා?

(ඌ) ඉන්රේල්, ඒන්?

ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)
(මාණ්පුමිකු චුනිල් කුමාර කමකේ - ඉළෙඤර් විවකාරංකළ් මර්රුම් විළෙයාට්ටුත්තුරෙ අමෙච්චර්)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)

ගරු කථානායකතුමනි, මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව, ජාතික තේරීම් කමිටුව, මලල ක්‍රීඩා සංගමය සහ ජාතික ඔලිම්පික් කමිටුව යන ආයතනවලින් පැහැදිලි කිරීම් ලබා ගන්න ඕනෑ. ඒ නිසා මෙම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු චපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා.

II

පාසල්වලට අනුයුක්ත සංවර්ධන නිලධාරීන් ගුරු සේවයට අන්තර්ගුහණය කිරීම

பாடசாலைகளுடன் இணைக்கப்பட்டுள்ள அபிவிருத்தி உத்தியோகத்தர்களை ஆசிரியர் சேவைக்குள் உள்வாங்குதல்

ABSORPTION OF DEVELOPMENT OFFICERS ATTACHED TO SCHOOLS INTO TEACHER SERVICE

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(මාණ්පුමිකු චාණක්කියන් රාජපුත්තිරන් இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මම ඉදිරිපත් කරන ප්‍රශ්නය මෙයයි.

ගුරු බඳවා ගැනීමේ ක්‍රියාවලියේ විනිවිදභාවය සහ වසර හයක් පමණ පාසල්වල ඉගැන්වීම් කටයුතුවල නිරත වූ සංවර්ධන නිලධාරීන්ගේ අනාගතය පිළිබඳව මෙම සභාවේ අවධානය යොමු කරවමි.

ගුරුවරුන් 23,800ක් බඳවා ගන්නා බව ප්‍රකාශ කළද, සම්මුඛ පරීක්ෂණ සඳහා නම් 17,688ක් පමණක් ප්‍රකාශයට පත් කර ඇත. දෙවන හා තෙවන නාමලේඛන පිළිබඳව ද පැහැදිලි තොරතුරු නොමැත.

ගරු අග්‍රාමාත්‍යතුමියනි, මේ පිළිබඳ ඔබතුමියගේ අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් අමල් එදිරිසූරිය මහත්මයාගේ ප්‍රකාශ පරස්පර විරෝධී ලෙස තිබෙනවා. එතුමා බඳවා ගන්නවා යනුවෙනුත් කියලා තිබෙනවා. බඳවා ගන්න අවශ්‍ය වෙන්නේ නැති වෙයි කියලාත් කියා තිබෙනවා. ගුරුවරුන්ට කියා තිබෙන්නේ. මට නොවෙයි.

ජනාධිපති ලේකම් කාර්යාලය ඉදිරිපිට උපවාසයක නිරත වූ පාසල්වලට අනුයුක්ත සංවර්ධන නිලධාරීන් සමඟ පැවැති සාකච්ඡාවේදී, ඔවුන්ට ගුරුවරුන්ගේ සේවා කාලසටහන ලබා

දෙන බවට ජනාධිපතිවරයා පොරොන්දු වූ බව වාර්තා වේ. එහෙත් එය ද මෙතෙක් කල් ක්‍රියාත්මක වී නොමැත.

වසර හයක් ගුරු පුරප්පාඩු ආවරණය කරමින් අධ්‍යාපන පද්ධතිය පවත්වාගෙන යාමට දායක වූ මෙම නිලධාරීන්ගේ සේවය ලබාගෙන, දැන් ඔවුන් ඉවත් කිරීම සාධාරණද? ඒ අනුව පහත ප්‍රශ්න ඉදිරිපත් කරමි.

1. ගුරුවරුන් 23,800ක් බඳවා ගැනීමට සැලසුම් කර තිබියදී 17,688ක් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමට හේතුව කුමක්ද, තෝරා ගැනීමේ ලකුණු, කුසලතා අනුපිළිවෙළ සහ විෂය පදනම් මොනවාද?

2. දෙවන හා තෙවන නාමලේඛන ප්‍රකාශයට පත් කරන්නේද? එසේ නම් කවදා ද?

3. වසර හයක් පමණ ඉගැන්වීම් කටයුතුවල නිරත වූ සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව කොපමණද? ඔවුන් ස්ථිර ගුරු සේවයට අන්තර්ග්‍රහණය කිරීමේ සැලැස්ම කුමක්ද?

4. ජනාධිපතිවරයා ලබා දුන් සේවා කාලසටහන වෙනස් කිරීමේ පොරොන්දුව ඉටු නොකළේ ඇයි? අනෙකුත් පොරොන්දු ඉටු කරන්නේ කවදාද?

ගරු අග්‍රාමාත්‍යතුමියනි, ඔබතුමියත් දන්නා පරිදි, එම උද්ඝෝෂණයේ නිරත වෙච්ච තරුණයන් ගරු ජනාධිපතිතුමා එක්ක සාකච්ඡා කරලා, ජනාධිපතිතුමාගේ මැදිහත්වීමෙන් අනතුරුව ලබා දුන්නු යම් පොරොන්දු මත තමයි, තමන්ගේ ඒ උද්ඝෝෂණය හකුළාගෙන ගියේ. ඒ කියන්නේ, අවුරුදු 10කට වඩා හිටපු අයට timetable එක දෙනවා කිව්වා; ඒගොල්ලන් ගුරු සේවයෙන් ඉවත් කරන්නේ නැහැ කිව්වා. දැන් මේ වනකොට අපට ආරංචියක් තිබෙනවා, ජනවාරි වනකොට ඒගොල්ලන්ගෙන් වැඩිපුර කියලා හඳුනා ගත්තු කට්ටිය අයින් කරනවා කියලා. ඒකේ පොඩි ගැටලුවක් මතු වෙනවා, ගරු අග්‍රාමාත්‍යතුමියනි.

5. එළඹෙන ජනවාරි මාසයේදී ඔවුන්ගේ සේවා තත්ත්වය වෙනස් කිරීමට හෝ ඉගැන්වීම් කටයුතුවලින් ඉවත් කිරීමට සැලසුමක් තිබේද? ඔවුන්ගේ රැකියා සුරක්ෂිතභාවය සහතික කරන්නේ කෙසේද?

කෞරව සභානායකතුමනි, මෙම නිලධාරීන්ගේ සේවය අගයමින් ඔවුන්ට ස්ථිර හා සාධාරණ විසඳුමක් ලබා දීමට රජය අපොහොසත් වී ඇත්තේ ඇයිද යන්නත් ඉදිරි ක්‍රියාමාර්ග සහ කාලරාමුව පිළිබඳවත් ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් සවිස්තරාත්මක පිළිතුරක් ඉල්ලා සිටිනවා.

ගරු අග්‍රාමාත්‍යතුමියනි, ඔබතුමිය මේ ගැන දන්නවා. මොකද, මම අවස්ථා කිහිපයකදීම ඔබතුමිය එක්ක ඔවුන්ගේ ගැටලුව පිළිබඳව සාකච්ඡා කරලා තිබෙනවා. ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා එක්කත් සාකච්ඡා කරලා තිබෙනවා. මා හිතන විධියට, දැන් යම් නිත්දුවකට ඇවිල්ලා තිබෙනවා. හැබැයි, මේ උගන්වන DOsලාට අසාධාරණයක් නොවන විධියට කටයුතු කළ යුතුයි. පව්, ඒගොල්ලෝ අවුරුදු 6ක් ඉස්කෝලවල ඉතාම අමාරුවෙන් වැඩ කරපු අය. තවම ඉස්කෝලවල පුරප්පාඩු තිබෙනවා. මේ සියලු කාරණා එකතු කරගෙන පිළිතුරක් දෙන්න කියලා තමයි මම ඔබතුමියගෙන් ඉල්ලා සිටින්නේ.

බොහොම ස්තුතියි.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු කථානායකතුමනි, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියට බඳවා ගැනීමට අදාළව, රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්ය මණ්ඩල කළමනාකරණය සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද නිලධාරී කමිටුවේ අනුමැතිය ප්‍රකාරව බඳවා ගැනීමට නියමිත මුළු පුරප්පාඩු සංඛ්‍යාව 23,006කි. එම සංඛ්‍යාව, ජාතික පාසල් පුරප්පාඩු ද ඇතුළුව පහත පරිදි වේ.

අනු අංකය	පළාත	ගුරු පුරප්පාඩු
01.	ජාතික පාසල්	4,484
02.	බස්නාහිර පළාත	2,500
03.	මධ්‍යම පළාත	3,480
04.	දකුණු පළාත	1,417
05.	උතුරු පළාත	1,885
06.	නැගෙනහිර පළාත	2,267
07.	වයඹ පළාත	2,025
08.	උතුරු මැද පළාත	1,345
09.	ඌව පළාත	1,606
10.	සබරගමුව පළාත	1,997

මෙම සංඛ්‍යාව බඳවා ගැනීමට අදාළව පළ කරන ලද ගැසට් නිවේදන අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවිය යුතු අතර, ඒ අනුව එක් එක් විෂයයන් යටතේ පවතින පුරප්පාඩු මෙන් දෙගුණයක් වන සේ විභාග දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති සුදුසුකම්ලාභී නාම ලේඛනය අනුව සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට නියමිතය.

ගරු කථානායකතුමනි, ඒ කියන්නේ විෂයය අනුව තිබෙන පුරප්පාඩුව මෙන් දෙගුණයක් තමයි interviewsවලට call කරන්න පුළුවන් වෙන්නේ.

කෙසේ වුවද, මෙම බඳවා ගැනීමට අදාළව පළ කරන ලද ගැසට් නිවේදන අනුව එක් අයදුම්කරුවෙකුට අ.පො.ස. (උසස් පෙළ) විෂයයන් 2කට හා අ.පො.ස. (සාමාන්‍ය

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

පෙළ) විෂයයන් 2කට ලෙස සමස්ත විෂයයන් 4කට ද ජාතික, ජාතික හා පළාත්, පළාත් යන පාසල් ගණ යටතේ අයදුම් කිරීමට අවස්ථාව සලසා දී ඇත.

ඒ කියන්නේ, අ.පොෂ. (උසස් පෙළ) විෂයයන් 2කට හා අ.පොෂ. (සාමාන්‍ය පෙළ) විෂයයන් 2කට ජාතික පාසල්, ජාතික හා පළාත් සහ පළාත් පාසල් යන categories අතර එකම අයදුම්කරුවෙකුට ඉල්ලන්නත් පුළුවන්. ගරු කථානායකතුමනි, 2022දී පළ වුණු ගැසට් නිවේදනය අනුව තමයි අපට කටයුතු කරන්න සිද්ධ වෙන්නේ. මොකද, මේක නඩු ගණනාවක් තුළින් එන ක්‍රියාවලියක්. එම අධිකරණ තීන්දුවලට බැඳිලා තමයි අපට මේ ක්‍රියාවලිය කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

ඒ අනුව, විභාග දෙපාර්තමේන්තුවෙන් ලබා දී ඇති විභාග ප්‍රතිඵල මත එකම අයදුම්කරු විෂයයන් කිහිපයක් යටතේ හා ජාතික හා පළාත් යටතේත් සම්මුඛ පරීක්ෂණ සඳහා සුදුසුකම් ලබා ඇති බැවින් මෙම අදියර යටතේ සම්මුඛ පරීක්ෂණ සඳහා සුදුසුකම් ලබා ඇති මුළු සංඛ්‍යාව (ආබාධිත අයදුම්කරුවන් ද ඇතුළුව) 17,688ක් වේ. මෙහිදී එකම අයදුම්කරු විෂයයන් කිහිපයක් යටතේ සුදුසුකම් ලබා තිබීම මත විවෘත පදනම යටතේ විෂය සංකලන 11,906ක් ලෙස ද සීමිත පදනම යටතේ විෂය සංකලන 23,665ක් ලෙස ද පුරප්පාඩු 23,006 වෙනුවෙන් සම්මුඛ පරීක්ෂණ සඳහා ඉදිරිපත්වීමට නියමිතව ඇත.

2. පළමු අදියරේ සම්මුඛ පරීක්ෂණ මඟින් බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවන් බඳවා ගැනීමෙන් අනතුරුව තවදුරටත් මෙම අදියර යටතේ බඳවා ගැනීමට නොහැකිව ඉතිරි වන පුරප්පාඩු සඳහා විභාග ප්‍රතිඵල මත, සුදුසුකම් ලත් අයදුම්කරුවන් සිටී ද යන්න සලකා දෙවන හා තෙවන වශයෙන් අදියර යටතේ සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම සිදු කළ යුතු වේ. ගරු කථානායකතුමනි, එකම අයදුම්කරුවකුට විෂයයන් ගණනාවකට ඉල්ලන්න පුළුවන් නිසා, අපට මේ අදියරේදී සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ට අදාළ ක්‍රියාවලියෙන් පසුව තමයි ඊළඟට ඉතිරි වන්නේ කුමන පුරප්පාඩුද කියලා බලන්න පුළුවන් වෙලා තිබෙන්නේ. මේක ගොඩක් සංකීර්ණ ක්‍රියාවලියක්. ඒ වෙලාවේ තිබුණු ගැසට් එක අනුව යන්න සිදු වෙලා තිබෙන නිසා තමයි මේ විධියේ සංකීර්ණත්වයක් ඇති වෙලා තිබෙන්නේ.

3. පාසල්හි කාර්යාල කටයුතු සඳහා සංවර්ධන නිලධාරීන් පාසල් වෙත අනුයුක්ත කර ඇති අතර, ඔවුන් සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාව යටතේ ගැනෙන නිලධාරීන් පිරිසකි. එලෙස යොදවන ලද ඇතැම් සංවර්ධන නිලධාරීන් සමහර විදුහල්පතිවරුන් විසින් පාසල්හි අධ්‍යාපන කටයුතු අබාධිත පවත්වාගෙන යෑම සඳහා පන්ති කාමර වෙත ගුරුවරුන්ගේ අවශ්‍යතා ආවරණය කර ගැනීම සඳහා යොදාගෙන තිබෙනවා. ගරු කථානායකතුමනි, වසර ගණනාවක් තිස්සේ ගුරුවරුන් බඳවා නොගැනීමේ තත්ත්වය තුළ විදුහල්පතිවරුන්ට මේක කරන්න සිද්ධ වෙලා තිබෙනවා. මේක අප තේරුම් ගත යුතු දෙයක්.

වරින් වර යොදවා ගෙන තිබූ එවැනි නිලධාරීන් ගණන 8,788ක් ලෙස වාර්තා වී තිබෙනවා. සංවර්ධන නිලධාරීන්ද ඇතුළුව රාජ්‍ය සේවයේ නියුතු උපාධිධාරීන් ගුරු සේවයට බඳවා ගැනීමේදී ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව තරග විභාගයක හා සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත සිදු කළ යුතු බැවින්, කිසිදු නිලධාරියකු ගුරු සේවයට උක්ත ක්‍රමවේදයෙන් පරිබාහිරව අන්තර්ග්‍රහණය කිරීමේ හැකියාවක් නොමැත.

ගුරු සේවා ව්‍යවස්ථාව අනුව තමයි අපට නිල වශයෙන් ගුරුවරුන් බඳවා ගන්න පුළුවන් වෙන්නේ. නමුත්, අන්තර්ග්‍රහණය කරන්න ක්‍රමයක් නැහැ, ගරු කථානායකතුමනි.

4. මෙම ප්‍රශ්නය එච්චර පැහැදිලි නැහැ. සේවා කාලසටහන කියන එකෙන් අදහස් කරලා තිබෙන්නේ මොකක්ද කියලා පැහැදිලි නැහැ. *[බාධා කිරීමක්]* එහෙම එකක් නැහැ, ගරු මන්ත්‍රීතුමා. මේ process එක ගිහිල්ලා ඊට පසුව තමයි අපට තීරණය කරන්න වෙන්නේ, ඉතිරි වන පුරප්පාඩු සහ දැනට ගුරුවරුන් හැටියට සේවය කරමින් සිටින සංවර්ධන නිලධාරීන්ට මොකක්ද කරන්නේ කියලා. අප ඒ පිළිබඳව සැලසුම් කරන්න යනවා කියන කාරණය තමයි ගරු ජනාධිපතිතුමා ඒ සාකච්ඡාවේදී කියලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]* එහෙම එකක් නැහැ. ඒගොල්ලන්ට timetable එකක් එහෙම දෙන්න පුළුවන් හැකියාවක් නැහැ.

5. මෙම බඳවා ගැනීම යටතේ සම්පූර්ණ කිරීමට හැකියාව ලැබෙන ගුරු සේවයේ පුරප්පාඩු සංඛ්‍යාව අනුව තවදුරටත් උක්ත විභාගයෙන් සුදුසුකම් නොලැබීම මත පාසල්හි සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව හඳුනා ගන්න පුළුවන්.

ඒ කියන්නේ, පාසල්වල අධ්‍යයන කටයුතු කරන සංවර්ධන නිලධාරීන් කී දෙනෙකු ඉතිරි වෙනවා ද කියන එක අපට හඳුනා ගන්න පුළුවන් වන්නේ මේ ක්‍රියාවලියෙන් පසුවයි. එලෙස හඳුනා ගැනීමෙන් පසු ඔවුන් සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කිරීමට අපි කටයුතු කරනවා. තවද, සංවර්ධන නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු යටතේ ස්ථාන මාරු කර ඇති, දැනට පාසල් පද්ධතිය තුළ සේවය කරනු ලබන සංවර්ධන නිලධාරීන්ගේ ස්ථාන මාරු අනිවාර්යෙන්ම ක්‍රියාත්මක කළ යුතු බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් දන්වා ඇති නමුත්, මෙම බඳවා ගැනීම අදියර කිහිපයක් යටතේ සිදු කිරීමට සිදුව ඇති බැවින්, මෙම බඳවා ගැනීම් කටයුතු අවසන් වන තෙක් ගුරු සේවයට පත්වීම් ලැබීමට සුදුසුකම් ලබන සුදුසුකම්ලාභීන් කවුරුන්ද යන්න හඳුනා ගැනීමේ හැකියාවක් ද නොමැත. අපි මේ process එකේ යන්න ඕනෑ.

එබැවින්, එතෙක් පාසල් වෙත අනුයුක්ත කර ඇති සංවර්ධන නිලධාරීන් ස්ථාන මාරු නොකරන ලෙස අදාළ බලධාරීන් වෙත තවදුරටත් මෙම තත්ත්වය දක්වමින් ඉල්ලීමක් ඉදිරිපත් කරලාත් තිබෙනවා, ගරු කථානායකතුමනි.

ඒ කියන්නේ, මේ process එක යනකල් ස්ථාන මාරු තාවකාලිකව නොකර ඉන්න කියලා, පාසල්වලට යොමු කර තිබෙන සංවර්ධන නිලධාරීන්ගේ ස්ථාන මාරු hold කරන්න කියලා අපි අදාළ බලධාරීන්ගෙන් ඉල්ලා තිබෙනවා. මොකද, මේ process එකේ ගිහිල්ලා තමයි අනිශයින්ම සංකීර්ණ මේ තත්ත්වය යටතේ අපට යම්කිසි නිරාකරණය කර ගැනීමකට එන්න පුළුවන් වන්නේ, ගරු කථානායකතුමනි. මේ process එකේ ගිහිල්ලාමයි අපට මේ ප්‍රශ්නය විසඳා ගන්න වෙන්නේ.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

පිළිතුර ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු අග්‍රාමාත්‍යතුමියනි.

ගරු කථානායකතුමනි, මේ ගැටලුව පිළිබඳව කථා කරද්දී, මා හිතන විධියට විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන් ඔක්කොම මේ සංවර්ධන නිලධාරීන්ව හම්බ වෙලා තිබෙනවා. මා දැන් ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමාගෙනුත් ඒ ගැන ඇහුවා.

ජනාධිපතිතුමා හම්බ වෙච්ච අවස්ථාවේදී ඒගොල්ලන්ට කියලා තිබෙනවා "අර ගුරුවරුන්ට දෙන timetable එකම අපි දෙන්නම්" කියලා. ඒ කියන්නේ ගරු අග්‍රාමාත්‍යතුමියනි, උදේ ගුරුවරුන් එන වෙලාවටම ඉස්කෝලෙට ඇවිල්ලා, ගුරුවරුන් ගෙදර යන වෙලාවටම ගෙදර යන්න අවස්ථාව සලසා දීම. DOsලා සාමාන්‍යයෙන් සවස 4.00 වනකල් වැඩ කරන්න ඕනෑ. මා හිතන විධියට, ඒ පොරොන්දුව ගැන තමයි ඔය "කාලසටහන" කියලා කියා තිබෙන්නේ. එතැන translation එකේ ගැටලුවක් තිබෙන්නේ. ඒක, එක කාරණයක්.

දෙවැනි කාරණය මෙයයි, ගරු අග්‍රාමාත්‍යතුමියනි. ඔබතුමිය දුන්නු පිළිතුර අනුව මම කථා කරන්නම්. මොකද, මම අනෙකුත් දිස්ත්‍රික්කවල තිබෙන පුරප්පාඩු පිළිබඳව දන්නේ නැහැ. ඔබතුමිය කිව්වා, උතුරු පළාතේ 1,885ක් ද, නැඟෙනහිර පළාතේ 2,267ක් ද වශයෙන් ගුරු පුරප්පාඩු තිබෙනවා කියලා. ගරු අග්‍රාමාත්‍යතුමියනි, මා දන්නා තරමින් මෙම පුරප්පාඩු 4,000කට ආසන්න ප්‍රමාණයෙන් විශාල ප්‍රමාණයක් specific විෂයයන්ට අදාළයි. ඉංග්‍රීසි, physics, science වාගේ G.C.E. (O/L)වලට සහ G.C.E. (A/L)වලට අදාළ අතිශය වැදගත් විෂයයන් පවා මේ කියන සංවර්ධන නිලධාරීන් තමයි පසුගිය අවුරුදු 6 ඇතුළත ඒ පාසල්වල ඉගැන්වූයේ.

එතකොට ගරු අග්‍රාමාත්‍යතුමියනි, ඔබතුමියලාගේ අලුත් වැඩසටහන යටතේ සෘජුවම ඒ විෂයන් උගන්වන අය හදිසියේ හරි නැති වුණොත් gap එකක් එනවා. A/Lවල physics, chemistry, biology, maths කියන විෂයන් මෙච්චර කල් උගන්වපු සංවර්ධන නිලධාරීන් ඉන්නවා. අනෙක් විෂයන් වැදගත් නැහැ කියලා මම කියන්නේ නැහැ; accounting වාගේ විෂයනුත් වැදගත්. ඔබතුමිය කිව්වා, ඒ සංවර්ධන නිලධාරීන්ගේ ස්ථාන මාරු දැනට hold කරන්න කියලා දන්වා තිබෙන බව.

ගරු අග්‍රාමාත්‍යතුමියනි, මේ ප්‍රශ්නයේ කාරණා 2ක් තිබෙනවා. පළමුවැනි කාරණය, දරුවන්ගේ අධ්‍යාපනය. දෙවැනි කාරණය, එම සංවර්ධන නිලධාරීන්ට සාධාරණයක් ඉෂ්ට කිරීම. ඔබතුමියලා කටයුතු කරන්න ඕනෑ 2022 ගැසට් එක අනුවයි කියන කාරණය මට පැහැදිලියි. හැබැයි, මේ කණ්ඩායමේ ඉන්න අයට සහ දරුවන්ට අසාධාරණයක් නොවන විධියේ ක්‍රමවේදයක් සොයා ගන්න පුළුවන් නම් ඒක තමයි ideal situation එක. නමුත් මම දන්නේ නැහැ, ඒක කොච්චර ප්‍රායෝගිකද කියලා. ඒ නිසා මම ඉල්ලා සිටිනවා, ඒ සඳහා ඔබතුමිය මැදිහත් වෙන්න කියලා.

බොහොම ස්තුතියි.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, අපි ඒක තමයි මේ කරන්න හදන්නේ. දරුවන්ට අසාධාරණයක් වෙන්නත් බැහැ. අපි ගුරුවරුන් අධ්‍යාපන පද්ධතියට බඳවා ගන්නේ රැකියාවක් දෙන්න විතරක් නොවෙයි, දරුවන්ට අධ්‍යාපනය ලබා දෙන්නයි. එතකොට ඒකේ ගුණාත්මකභාවය රැක ගන්න නම් නිසි ක්‍රමවේදය අනුව ඒ බඳවා ගැනීම් කරන්න ඕනෑ, පුහුණුවීම් කරන්න ඕනෑ. අධ්‍යාපනයේ ගුණාත්මකභාවය තහවුරු කරන්න නම් ගුරුවරයා කියන role එක අතිශයින්ම වැදගත්. ගරු කථානායකතුමනි, අපි ඉතිහාසය ගැන කථා කරලා තේරුමක් නැහැ. නමුත් විවිධ හේතු මත සංවර්ධන නිලධාරීනුත් මේ කටයුතු කරලා තිබෙනවා. අපි ඒක අගයනවා. ඒ ගොල්ලෝ විශේෂයෙන් දුෂ්කර පාසල්වලට ගිහිල්ලා අතිශය අමාරු වැඩක් ඒ වෙලාවේ කරගෙන ගියා. ඒ නිසා ගරු කථානායකතුමනි, ඒ ගොල්ලන්ටත් සාධාරණයක් වෙන්න ඕනෑ. අපි නඩු හතරක් පහක් එක්ක තමයි මේ settlement එකට ආවේ. එම නිසා මේ අවස්ථාවේ මේක මේ විධියට කරලා තමයි අපට ඊළඟ step එකට යන්න පුළුවන් වෙන්නේ.

ඒ වාගේම අමතක කරන්න එපා, මේ අවුරුදු ගණන තුළ එළියේ තවත් උපාධිධාරීන් ගණනාවක් ගුරු වෘත්තියට එන්න බලාපොරොත්තුවෙන් සිටියා කියන එක. ඒගොල්ලෝ පවා මේ ක්‍රියාවලිය තුළ හිර වෙලායි ඉන්නේ. ඒගොල්ලන්ටත් අවස්ථාවක් ලැබිය යුතුයි. එතකොට ඇත්තටම මෙතැන කණ්ඩායම් තුනක් ඉන්නවා. දරුවන් අපට ප්‍රමුඛයි. ඔවුන්ගේ අධ්‍යාපනයේ ගුණාත්මකභාවය තහවුරු කිරීම තමයි අපේ ප්‍රධාන අරමුණ. ඊට පස්සේ ඉන්නවා, මේ කියන සංවර්ධන නිලධාරීන්. ඒ වාගේම මේ කාලය තුළ උපාධි ලබාගෙන ගුරු වෘත්තියට එන්න බලාගෙන හිටපු කණ්ඩායමකුත් ඉන්නවා. අපි මේ කණ්ඩායම් තුනටම සාධාරණයක් ඉෂ්ට කරන්න ඕනෑ, ගරු කථානායකතුමනි. මෙය අතිශයින්ම සංකීර්ණ තත්ත්වයක්. ඒ සංකීර්ණ තත්ත්වය අපි ඉතාම සුපරික්ෂාකාරීව කළමනාකරණය කරමින්, දිනෙන් දින පුරප්පාඩු ගණන monitor කරමින් මේ ක්‍රියාවලිය through යන්න වෙනවා. අපට වෙනත් විකල්පයක් නැහැ. ඊට පස්සේ තමයි අපට තිබෙන අනෙක් පුරප්පාඩුත් පුරවන්න පුළුවන් වෙන්නේ.

ගරු කථානායකතුමනි, අපි මේ පුරප්පාඩු ලැයිස්තුව ගන්නේ පළාත්වලින්. ඒගොල්ලන් අපට දෙන දත්ත අනුව මෙතැන ජාතික පාසල්වල පුරප්පාඩුත් තිබෙනවා; පළාත් පාසල්වල පුරප්පාඩුත් තිබෙනවා. වෙන වෙනම විෂයයන් අනුවයි අපි ඒ දත්ත අරගෙන තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2026.09.23 දින ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සහ අමාත්‍යාංශ නිවේදනය. කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා.

මඩකලපුව දිස්ත්‍රික්කයේ තණබිම්වල බලහත්කාරයෙන් පදිංචි වීම සහ වගා කිරීම: කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගේ ප්‍රකාශය

மட்டக்களப்பு மாவட்டத்தில் மேய்ச்சல் நிலங்களில் அத்துமீறி குடியேறுதல் மற்றும் பயிரிடல்: கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரினது கூற்று

ENCROACHMENT AND CULTIVATION OF PASTURELANDS IN BATTICALOA DISTRICT: STATEMENT BY MINISTER OF AGRICULTURE, LIVESTOCK, LAND AND IRRIGATION

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා විසින් 2026.09.23 දින අසන ලද ප්‍රශ්නයට මම පළමුව පිළිතුරු ලබා දෙන්නම්.

[ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා]

මයිලත්තමඩු - මාදවනෙයි සහ මඩකලපුව දිස්ත්‍රික්කයේ තෘණ භූමි.

කිරාන් සහ චෙන්කලඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පිහිටි මයිලත්තමඩු - මාදවනෙයි සාම්ප්‍රදායික තෘණ භූමි, මඩකලපුවේ පශු සම්පත් ගොවීන් විසින් සියවස් ගණනාවක් තිස්සේ භාවිත කරනු ලබයි. විරෝධතා, නඩු කටයුතු සහ රජයේ නැවත නැවතත් ලබා දුන් සහතික කිරීම් තිබියදීත්, එම භූමි අනවසරයෙන් අත්පත් කර ගැනීම, වගා කටයුතු සහ විනාශ කිරීම් තවදුරටත් සිදු වෙමින් පවතී. පෝරතිවුපත්තු සහ පඩ්ඩිපලෙයි ප්‍රදේශවල තෘණ භූමි සම්බන්ධයෙන් ද මෙවැනිම ගැටලු පවතින අතර, දිවුලාන රක්ෂිතයට පිවිසීමේදී ගොවීන්ට විවිධ සීමාවන්ට ද මුහුණ දීමට සිදු වී ඇත.

එතුමා අසා තිබෙන පළමුවැනි ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි.

1. මයිලත්තමඩු - මාදවනෙයි, පෝරතිවුපත්තු සහ පඩ්ඩිපලෙයි යන ප්‍රදේශවල පිහිටි පාරම්පරික තෘණ භූමිවල නිශ්චිත ප්‍රමාණය සහ නෛතික තත්ත්වය කුමක්ද? ඉන් කොපමණ ප්‍රමාණයක් තවදුරටත් තෘණ භූමි ලෙස ඉතිරිව පවතීද, සහ කොපමණ ප්‍රමාණයක් අත්පත් කරගෙන, වගා කර හෝ වෙනත් කටයුතු සඳහා වෙන් කර තිබේද?

පිළිතුර:

මෙම ප්‍රදේශවල ඇති ඉඩම් ගවයන්ට තණ කැවීම සඳහා යොදා ගැනුණද, ඒවා තවමත් තෘණ භූමි ලෙස නීත්‍යානුකූලව ප්‍රකාශයට පත් කර නොමැති බව මඩකලපුව දිස්ත්‍රික් ලේකම් විසින් දන්වා ඇත.

ඉහත දක්වා ඇති ප්‍රදේශවල පාරම්පරික තෘණ භූමි පැවතීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය දැනුවත්ව නොමැති බව දන්වා ඇත.

මෙයින් කියැවෙන්නේ පාරම්පරික තෘණ භූමි කියලා දෙයක් නැහැ කියන එකයි. ගවයන්ට තණ කැවීම සඳහා එම ඉඩම්වලට යවපු එක ඇත්ත.

මයිලත්තමඩු - මාදවනෙයි, කිරාන්, චෙන්කලඩි, පෝරතිවුපත්තු හෝ පඩ්ඩිපලෙයි ප්‍රදේශවල හෝ නැඟෙනහිර පළාතේ වෙනත් ඕනෑම ස්ථානයක ගවයන්ට තණ කැවීම සඳහා වෙන් කර ඇති හෝ මායිම් කර ඇති කිසිදු තෘණ භූමියක් නැඟෙනහිර පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සතුව නොමැති බව පළාත් අධ්‍යක්ෂ විසින් දන්වා ඇත.

ඊළඟට, දෙවන ප්‍රශ්නය.

2. මයිලත්තමඩු - මාදවනෙයි සත්ව පාලන ගොවීන් සඳහා අක්කර 1,570ක් ලබා දෙන ලෙස ජනාධිපතිවරයා විසින් නියෝග කරන ලදී. එම නියෝගය මෙතෙක් සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කර නොමැත්තේ ඇයි? මෙම ප්‍රමාදය සඳහා වගකිව යුත්තේ කවුරුන්ද, සහ එය සැබවින්ම ක්‍රියාත්මක කරනු ලබන්නේ කිනම් නිශ්චිත දිනයකදීද?

පිළිතුර:

මෙම ප්‍රදේශය 1921 වසරේදී ඔමුණුගල රක්ෂිතය වශයෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ගැසට් පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත් කර ඇත. තවද, මෙම යෝජිත භූමිය මහවැලි අධිකාරිය මඟින් 1979.06.15 දිනැති ගැසට් පත්‍රයක් මඟින් විශේෂ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත. එබැවින් මේ සම්බන්ධව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලබා ගැනීම සඳහා යොමු කරන ලදුව මේ සම්බන්ධයෙන් එකඟතාව ලබා දිය නොහැකි බව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත දන්වා ඇත.

ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2026.05.20 දින පැවති විශේෂ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට සහ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් අක්කර 3,000ක භූමි ප්‍රමාණයක් ගවයන්ට තණ කැවීම සඳහා හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ පවතින අක්කර 1,570ක භූමි ප්‍රමාණයක් මුල් අදියර යටතේ තෘණ භූමි ලෙස ප්‍රකාශයට පත් කිරීමටත්, ඒ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට මහවැලි අධිකාරියට උපදෙස් ලබා දෙන ලද බව මඩකලපුව දිස්ත්‍රික් ලේකම් විසින් දන්වා ඇත.

ගරු ජනාධිපතිතුමාගේ නියෝගයට අනුව අක්කර 1,570ක් මයිලත්තමඩු - මාදවනෙයි පශු සම්පත් ගොවීන්ට වෙන් කර දෙන ලෙස දන්වා ඇතත්, මෙම කරුණ සම්බන්ධව වන සංරක්ෂණ පනතට අදාළ නීතිමය ගැටලුවක් පවතින බවත්, නඩු අංක 60010 සහ 567/2010 පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීන්දු ලබා දී ඇති බවත් පරිසර අමාත්‍යාංශයේ ලේකම් විසින් දන්වා ඇත.

1983 අංක 4 දරන තණබිම් (වෙන් කිරීම සහ සංවර්ධනය කිරීමේ) පනත යටතේ හෝ වෙනත් කිසියම් ලිඛිත නීතියක් යටතේ නැඟෙනහිර පළාත තුළ තෘණ බිම් ලෙස මෙතෙක් කිසිදු ඉඩමක් ප්‍රකාශයට පත් කර හෝ ගැසට් මඟින් ප්‍රසිද්ධ කර නොමැති බව නැඟෙනහිර පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ විසින් දන්වා ඇත.

එතුමාගේ තුන්වන ප්‍රශ්නය මෙකයි.

3. මෙම තෘණ භූමිවල වගා කිරීම සඳහා හෝ ඒවා අත්පත් කර ගැනීම සඳහා අවසර ලබා දුන්නේ කවුරුන්ද? වර්තමානයේ එහි පදිංචිව සිටින්නන්ගේ නම්, අත්පත් කරගෙන ඇති භූමි ප්‍රමාණය සහ ඔවුන් ඒ සඳහා ඉදිරිපත් කරන අවසර පත්‍ර හෝ වෙනත් නෛතික අධිකාර පිළිබඳ තොරතුරු රජය විසින් පාර්ලිමේන්තුවෙහි සභාගත කරන්නේද?

පිළිතුර:

පශු සම්පත් ගොවීන් විසින් තෘණ භූමි ලෙස දිගු කාලීනව භාවිත කළද, මෙම ප්‍රදේශ විධිමත් ලෙස මායිම් කර නොමැති බව මඩකලපුව දිස්ත්‍රික් ලේකම් විසින් දන්වා ඇත.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් කිසිදු පුද්ගලයෙකු සඳහා නීත්‍යානුකූල ඉඩම් ලබා දීමක් සිදු කර නොමැති බව දන්වා ඇත.

මෙම කාරණය සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබා ගැනීමට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව තීරණය කර ඇත. 2026 සැප්තැම්බර් 22වන දින පාර්ලිමේන්තුවේ පැවති සාකච්ඡාවට අනුව ගරු අමාත්‍ය සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා විසින් තීරණය කරනු ලැබුවද, මෙම කාරණය සම්බන්ධයෙන් අවසන් තීරණයක් ගැනීම සඳහා 2026 සැප්තැම්බර් 24 දින වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රධානියා සහ අදාළ අමාත්‍යාංශ දෙකෙහි ලේකම්වරුන්ගේ සහභාගිත්වයෙන් පාර්ලිමේන්තු පරිශ්‍රයේදී රැස්වීමක් පැවැත්වූ බව පරිසර අමාත්‍යාංශයේ ලේකම් විසින් දන්වා ඇත.

ඉහත සඳහන් අක්කර 1,570ක භූමි ප්‍රමාණය සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු වන බව නැඟෙනහිර පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ විසින් දන්වා එවා ඇත.

ඊළඟට, හතරවන ප්‍රශ්නය.

4. කෘෂිකාර්මික කමිටුවක් හෝ වෙනත් බලයලත් රැස්වීමක් මඟින් ගොවීන්ට තම ගවයින් දිවුලාන රක්ෂිතයට රැගෙන යන ලෙස උපදෙස් ලබා දී ඇති නමුත්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ඊට ඇතුළුවීමට ඉඩ නොදෙන අවස්ථාවකදී ගොවීන් විසින් සිදු කළ යුත්තේ කුමක්ද? අවසාන තීරණය ගැනීමේ බලය ඇත්තේ කිනම් බලධාරියාටද සහ ගවයින් ඇතුළු කිරීමට අවසර දෙමින් රජය විසින් නිශ්චිත නියෝග නිකුත් කරන්නේද?

පිළිතුර:

මෙම ඉඩම් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට සහ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් වුවද, වගා රැස්වීමේදී ගන්නා තීරණ මත පදනම්ව ගව හිමියන් සාම්ප්‍රදායිකව තම ගවයන් තණ කැවීම සඳහා මෙම ඉඩම් වෙත යොමු කරනු ලබන බව මඩකලපුව දිස්ත්‍රික් ලේකම් විසින් දන්වා ඇත.

ඉහත සඳහන් ආකාරයට ඉඩම් පැවරීම, සීමා නිර්ණය කිරීම, බලපත්‍ර නිකුත් කිරීම, අනවසරයෙන් අත්පත් කර ගැනීම්, වන සංරක්ෂණ සීමා කිරීම් සහ නීතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මතු වී ඇති ගැටලු, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කාර්යභාරයට හෝ නීතිමය විෂය පථයට අදාළ නොවන අතර, ඒවා එම දෙපාර්තමේන්තුවේ බල සීමාවට යටත් නොවන බව නැඟෙනහිර පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ විසින් දන්වා එවා ඇත.

එතුමාගේ පස්වන ප්‍රශ්නය මෙයයි.

5. කිරාන්, චෙන්කලඩි, පෝරතිවු පත්තු සහ පඬ්ඩිපලෙයි යන ප්‍රදේශවල පිහිටි තෘණ භූමිවලින් කොපමණ ප්‍රමාණයක් මහවැලි අධිකාරිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හෝ වෙනත් රාජ්‍ය ආයතන මඟින් අයිතිවාසිකම් කියනු ලබන්නේද හෝ සීමා කර තිබේද, සහ ඒ සඳහා ඇති නෛතික පදනම කුමක්ද?

පිළිතුර:

දැනට සත්ව පාලන ගොවීන් විසින් තෘණ භූමි ලෙස භාවිත කරනු ලබන ඉඩම්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු වන බව මඩකලපුව දිස්ත්‍රික් ලේකම් විසින් දන්වා එවා ඇත.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් කිසිදු සීමා කිරීමක් සිදු කර නොමැත.

ඊළඟට, හයවන ප්‍රශ්නය.

6. තෘණ භූමිවල වගා කටයුතු සිදු කරන බාහිර පුද්ගලයන්ට දේශපාලනික හෝ මූල්‍යමය සහාය ලැබෙන බවට ගොවීන් විසින් චෝදනා කරනු ලබයි. දේශපාලනඥයන්, බෞද්ධ භික්ෂූන් වහන්සේලා හෝ රාජ්‍ය නිලධාරීන්ගේ මැදිහත්වීම් ඇතුළුව, මෙම පිරිස් වෙත අරමුදල්, පහසුකම් හෝ ආරක්ෂාව සපයනු ලබන්නේ කවුරුන් විසින්ද යන්න පිළිබඳව රජය විසින් විමර්ශනයක් පවත්වනු ලබන්නේද?

පිළිතුර:

පෙර වර්ෂවල කන්නයක් සඳහා වගා අවසරය ගොවීන් වෙත ලබා දීම සිදු කර ඇති අතර, 2026/2027 මහ කන්නය සඳහා මෙතෙක් අවසර ලබා දී නොමැති බව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් දන්වා ඇත.

ඊළඟට, හත්වන ප්‍රශ්නය.

7. නීති විරෝධී ලෙස අත්පත් කර ගැනීම්, ගිනි තැබීම්, වගා කිරීම් මෙන්ම ගවයින් මරා දැමීම හෝ තුවාල කිරීම සම්බන්ධයෙන් ගෙන ඇති පියවර මොනවාද? ඒ සම්බන්ධයෙන් සිදුව ඇති අත්අඩංගුවට ගැනීම්, නඩු පැවරීම් සහ ඉවත් කිරීම් සංඛ්‍යාව කොපමණද?

පිළිතුර:

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ තීරණයට අනුව භෝග වගාකරුවන් සහ ගව හිමියන් අතර ගැටුම් ඇති වීම වැළැක්වීම සඳහා අධීක්ෂණ සහ නීතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු සිදු කරන ලෙස ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට සහ ශ්‍රී ලංකා පොලිසියට උපදෙස් ලබා දී ඇති බව මඩකලපුව දිස්ත්‍රික් ලේකම් විසින් දන්වා එවා ඇත.

අනවසර ඇතුළුවීම් සම්බන්ධව කරදියනාරු පොලිසියේ පැමිණිලි කිරීම් සිදු කර ඇති බව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් දන්වා ඇත.

අවසාන වශයෙන් තිබෙනවා, අටවන ප්‍රශ්නය.

8. නීති විරෝධී ලෙස පදිංචි වී සිටින්නන් ඉවත් කිරීමට, බලපෑමට ලක්වූ ඉඩම් නැවත යථා තත්ත්වයට පත් කිරීමට සහ මඩකලපුව සත්ත්ව පාලන ගොවීන් සඳහා ප්‍රමාණවත් තෘණ භූමි ස්ථිර වශයෙන් වෙන්කර සීමා නිර්ණය කර ගැසට් කිරීමට රජය විසින් නිශ්චිත කාල සීමාවක් ලබා දෙන්නේද?

පිළිතුර:

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් අවශ්‍ය පසු විපරම් ක්‍රියාමාර්ග දැනට ක්‍රියාත්මක කරමින් පවතී.

නීත්‍යානුකූල තෘණ භූමියක් ගැසට් කිරීමට පෙර ඊට අදාළ සියලු රාජ්‍ය ආයතනවල එකඟතා ලබා ගැනීම සිදු කළ යුතුව ඇති බැවින්ද, එම ආයතනවල නිර්දේශ ප්‍රකාරව ඉදිරි සංවර්ධන කටයුතු කළ යුතුව ඇති බැවින්ද, ඒ සඳහා නිශ්චිත දින වකවානු ලබා දිය නොහැකි බව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් දන්වා ඇත.

ගරු කථානායකතුමනි, පිළිතුරට අදාළ තොරතුරු සවිස්තරාත්මකව ඇමුණුම් මඟින් දක්වා ඇත. ඒ අනුව, ඇමුණුම් 01, 02, 03, 04 සහ 05 **සභාගත*** කරමි.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු කථානායකතුමනි, මම විශේෂයෙන්ම ලාල් කාන්ත ඇමතිතුමාට සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලයේ සියලුදෙනාට ස්තුතිවන්ත වෙනවා, ඊයේ මේ සභාවට එන්න මට අපහසුතාවක් තිබුණු නිසා අද දවසේ එම පිළිතුර ලබා දීමට එකඟ වීම පිළිබඳව. විශේෂයෙන්ම ගරු සභානායකතුමාත් මේ පිළිබඳව

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ඡාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

ඊයේ පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයක් කරලා තිබෙනවා මම දැක්කා. මයිලත්තමඩු ප්‍රදේශයේ කිරි ගොවීන්ගේ ගැටලුව පිළිබඳව පාර්ලිමේන්තුව තුළ වාදයක් හෝ සංවාදයක් ඇති කර ගත්තොත් අපි කථා කරන කොටස් ටික social mediaවලට අරගෙන හවස් වරුව වනකොට mediaවලින් පහර ගහනවා, එක්කෝ රාසමාණික්කම් මඩකලපුවෙන් සිංහලයා එළවන්න හදනවා, නැත්නම් ආණ්ඩුව මඩකලපුවෙන් සිංහලයා එළවන්න හදනවා කියලා. ඒක නිසා මේ සම්බන්ධව ප්‍රකාශ කරන්න ගිහින් ඒ කණ්ඩායමට තව මේකට ammunition දෙන්න මම කැමැති නැහැ. ගරු අමාත්‍යතුමනි, මේ ප්‍රශ්නය ඔබතුමා කිව්ව විධියට Ministry of Agriculture, Livestock, Land and Irrigation, the Department of Forest Conservation වාගේ අමාත්‍යාංශ පහ හයක් සහ පොලීසිය සම්බන්ධ කරගෙන සිදු කළ යුතු දෙයක්. අපි ඉලංගෙයි තමිළ් අරසු කච්චි පක්ෂය වශයෙන් ගරු ජනාධිපතිතුමාට ලියුමක් ලියලා වේලාවක් ඉල්ලා තිබෙනවා, මේ කාරණය පිළිබඳව එතුමාව හමු වෙලා කථා කරන්න.

ගරු කථානායකතුමනි, මම ගරු ලාල් කාන්ත ඇමතිතුමාට යෝජනා කරනවා, මේ පිළිබඳව solution එකකට මූලිකත්වය ගන්න කියලා. මොකද, ගරු ජනාධිපතිතුමා දුන්නු තීන්දුවක් ඉෂ්ට නොකිරීම තුළින් ඇති වෙලා තිබෙන මේ ගැටලුමය තත්ත්වය පිළිබඳවත්, නිලධාරින් ඒක කළේ නැත්තේ ඇයි කියාත් ඊයේ ගරු බිමල් රත්නායක ඇමතිතුමාත් සඳහන් කළා. මම යෝජනා කරනවා, පාර්ලිමේන්තුව තුළ මේ කාරණය ගැන වාද විවාද කරන්නේ නැතිව ඒ සියලු අමාත්‍යාංශ එකතු වෙලා සාකච්ඡාවක් කරන්න අපි අවස්ථාවක් උදා කර ගනිමු කියලා.

ගරු අමාත්‍යතුමනි, මේක මයිලත්තමඩුවට පමණක් තිබෙන ප්‍රශ්නයක් නොවෙයි, මඩකලපුවේත් තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක්. ගැසට් කළේ නැති වුණාට හැම අවුරුද්දේම කන්න රැස්වීමේදී කියනවා, මේ කිරි හරක් ටික අරගෙන යන්න කියලා. නමුත් ඒ මිනිස්සුන්ට ඒ කිරි හරක් ටික ගෙනියන්න තැනක් නැහැ. ආපහු ඒ කිරි හරක් ටික ගෙනාවොත් ලක්ෂ 2ක විතර කුඹුරු පාඩු වෙනවා. ගරු අමාත්‍යතුමනි, පොළොන්නරුවේ දිවුලාන කියන ප්‍රදේශයේ ගොවීන්ටත් අනෙක් දිස්ත්‍රික්කවල තිබෙන ඒ එකඟතාව යටතේම රක්ෂිතවලට කිරි හරක් යවන්න ඉඩ දීලා තිබෙනවා. පොලීසිය විෂයභාර ඇමතිතුමාත් මේ වෙලාවේ සභාවේ ඉන්නවා. අපි මේ පිළිබඳව මංගලගම පොලීසියේ OIC මහත්මයාව දැනුවත් කරලා තිබෙනවා. සමහර කණ්ඩායම් ගිහිල්ලා එතැන ඉන්න අයට කියනවා, හරක් ටික අයින් කරන්න, නැත්නම් රුපියල් 10,000ක් දෙන්න කියලා. කුමාර කියලා තරුණයෙක් පොලීසියත් එක්ක සම්බන්ධ වෙලා ඒ කටයුත්ත කරනවා. හැබැයි, පොලීසිය කියනවා, එහෙම නැහැ කියලා. මම යෝජනා කරන්නේ රැස්වීමක් ලැහැස්ති කළොත් අපට මේ සම්පූර්ණ ගැටලුව පිළිබඳව යම් විසඳුමක් සොයා ගන්න පුළුවන් වනවා කියන එකයි. මංගලගම පොලීසියේ පවතින මේ ගැටලුකාරී තත්ත්වය පිළිබඳව පොඩ්ඩක් හොයා බලන්න කියලා මම පොලීසිය භාර ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)

ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව සම්බන්ධයෙන් මම අවශ්‍ය කටයුතු කරන්නම්. වැඩිමනත් වශයෙන් මම මෙහි වර්තමාන තත්ත්වය පිළිබඳව හොයා බැලුවා. එහි සංකීර්ණ තත්ත්වයක් තිබෙන බව අපි කාටත් පැහැදිලියි. සමහරු කියනවා, සිංහල ගොවීන්ට ප්‍රශ්නයක් කියලා. සිංහල ගොවියෝ, දෙමළ හරක් කියලා තමයි සමහර අය ඒක අර්ථ දක්වන්නේ. ඒ අර්ථ දැක්වීමට අපි කිසිසේත් එකඟ වෙන්නේ නැහැ. අපට ඒගොල්ලන් පශු සම්පත් ගොවියෝ සහ වී වගා කරන ගොවියෝ; ඒ දෙගොල්ලන්ම ගොවියෝ. ඒක තමයි අපේ ප්‍රතිපත්තිය. නමුත් විවිධ කණ්ඩායම් මේකට ජාතිවාදී දෘෂ්ටියකින් විවිධ අර්ථ නිරූපණ කරමින් සිටිනවා.

දැනට තාවකාලිකව සැලකිය යුතු මට්ටමක උත්තරයක් අපි ලබා දීලා තිබෙනවා. ඇත්තටම තාවකාලික උත්තරයක් තමයි දැනට දෙන්න පුළුවන්කම තිබෙන්නේ. ජනාධිපතිතුමා ප්‍රතිපත්තිමය වශයෙන් අදහසක් කිව්වා. ඒක ආණ්ඩුව හැටියට, ජනාධිපතිතුමා හැටියට කියන්න ඕනෑ. නමුත්, ප්‍රතිපත්තිමය කාරණයක් නීත්‍යානුකූලභාවයට ගෙනෙන්න නිලධාරින්ට යම් කාලයක් ගත වෙනවා. මොකද, රටේ නීතියකුත් තිබෙනවා නේ. ජනාධිපතිතුමා ප්‍රතිපත්තිය ප්‍රකාශ කළේ. ආණ්ඩුවක් ප්‍රතිපත්තිය ප්‍රකාශ කරනවා. එතකොට නිලධාරින් ඒ ප්‍රතිපත්තිය මත පදනම් වෙලා ඒකට අනුව නීතිය සකස් කරන්න ඕනෑ. ඇත්තටම දැන් ඒ කටයුතු සිදු වෙමින් පවතිනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත්, මමත් සභාගී වෙලා, මඩකලපුව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපති සුනිල් හඳුන්නෙත්ති මැතිතුමාගේ මූලිකත්වයෙන්, ඒ සියලු නිලධාරින් කැඳවලා අපි පාර්ලිමේන්තුවේදීත් රැස්වීමක් පැවැත්වූවා නේ. ඒ සංකීර්ණතාව පිළිබඳව කථා කරලා අපි එතැනදී තීරණයක් ගත්තා, මේ මොහොතේදී දෙගොල්ලන්ටම තමන්ගේ කටයුතු කරගෙන යන්න ක්‍රමවේදයක් සකස් කරලා දෙන්න කියලා. ඒ කියන්නේ, ගවයන් සම්බන්ධව කටයුතු කරන ගොවීන්ටත්, වී වගා කරන ගොවීන්ටත් කියන දෙගොල්ලන්ටම තමන්ගේ කටයුතු කරගෙන යන්න ක්‍රමවේදයක් හදලා දෙන්න කියන එකයි. ඒක තමයි අපි දීපු තාවකාලික උත්තරය. ඒ අනුව පොලීසියේ SSP ලලිත් මහත්තයා ඒ ප්‍රදේශයට ගියා. එතුමා ඒ ප්‍රදේශයට ගියේ මහවැලි කලාපයේ ප්‍රධානියාත් එක්කයි. එහෙම ඒ ප්‍රදේශයට ගිහිල්ලා ඒ ප්‍රදේශයේ ගස් 34ක් ඇතින් ඇතින් mark කළා. ඒ ගස් 34 තමයි දැන් තාවකාලික මායිම. ඒක, එකක්.

ඒ වාගේම ඒගොල්ලන් නිරීක්ෂණය කළා, හරකුන් ඉන්න ස්ථාන 32ක්. එමෙන්ම, මයිලත්තමඩු පොලිස් මුරපොළේ නිලධාරින් ප්‍රමාණය 15 දක්වා වැඩි කළා, එතැන යම්කිසි ප්‍රශ්නයක් ඇති වෙන්න තිබෙන ඉඩ වැළැක්වීම සඳහා. ඒ වාගේම, මේ තත්ත්වය තුළ එතැනට පොලීසියේ CI මහත්මයෙකුත් අනුයුක්ත කළා. ඒවා අමතර වශයෙන් කරපු වැඩ. එතැන කොහොමත් අක්කර 6,000ක විතර විශාල භූමි ප්‍රමාණයක් තිබෙනවා. ඇත්තටම හරකුන්ට තණ කොළ කන්න යවන්නත් පුළුවන්. ඒ පිළිබඳව ප්‍රශ්නයක් නැහැ. නමුත්, මෙතැන විවිධ පාර්ශ්ව විසින් ජාතිවාදයක් අවුස්සන්න දරන උත්සාහයක් තිබෙනවා. ඒ නිසා තමයි මේ ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ. අම්පාර පැත්තෙන් ගොවීන් ඇවිල්ලා අක්කර 8ක වගා කරනවා. මේක තමයි අලුත්ම තත්ත්වය. අක්කර 8 වගා කරන භූමියක් තිබෙන්නේ. ඒක අපි හරි කියලා කියන්නේ නැහැ. කලින් මේ සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ගයකට ගියා නේ; ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. එතකොට වාර්තාවකුත් කැඳවා තිබෙනවා. එහෙම කාරණාත් තිබෙනවා. කිසිවක් අවසාන වශයෙන් ඉවර වෙලා නැහැ. නිලධාරින් ඒ සඳහා කටයුතු කරමින් ඉන්නවා. තාවකාලිකව මායිමක් දීලා දෙගොල්ලන්ටම කටයුතු කරගෙන යන්න දැනට ඉඩකඩ ලබා දීලා තිබෙනවා. මම හිතනවා, දැන් ඒක ප්‍රමාණවත්, තාවකාලික උත්තරයක් කියලා. දැන් මේක ටිකක් සමථයකට පත් වෙලා තිබෙන්නේ. මේ සම්බන්ධව ඔබතුමා කරපු යෝජනාව ගත්තොත්, පාර්ලිමේන්තුවේදී අපි මේ ගැන කථා කරනවාට වඩා වෙනම meeting එකක් අරගෙන කටයුතු කරමු කියන එකට මම එකඟතාව පළ කරනවා. ඒකට මම මැදිහත් වෙන්නම්. ඔබතුමාත්, මමත් ඒ ගැන නිතර කථාබහ කර ගනිමු.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශ නිවේදනය ඉදිරිපත් කරන්න.

"දිට්වා" සුළි කුණාටුවෙන් හානි වූ වාරි පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම සහ බහුකාර්ය වාරි ව්‍යාපෘතිවල වත්මන් තත්ත්වය: කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගේ ප්‍රකාශය

'தித்வா' சூறாவளியால் சேதமடைந்த நீர்ப்பாசன முறைமையைச் சீரமைத்தல் மற்றும் பலநோக்கு நீர்ப்பாசனத் திட்டங்களின் தற்போதைய நிலை: கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரினது கூற்று

RESTORATION OF IRRIGATION SYSTEMS DAMAGED BY "DITWAH" CYCLONE AND CURRENT STATUS OF MULTI-PURPOSE IRRIGATION PROJECTS: STATEMENT BY MINISTER OF AGRICULTURE, LIVESTOCK, LAND AND IRRIGATION

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
ගරු කථානායකතුමනි, මෙය ටිකක් දීර්ඝ ප්‍රකාශයක්. මම එයින් කොටසක් ඉදිරිපත් කර ඉතිරි කොටස සභාගත කරන්නම්.

ගරු කථානායකතුමනි, අප රජය රටේ වගකීම භාර ගැනීමෙන් පසුව කෘෂි කර්මාන්තය නඟාසිටුවීම, ගොවි ජනතාවගේ ජීවනෝපාය සහ රටේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා වාරිමාර්ග ක්ෂේත්‍රයේ සංවර්ධන කටයුතු කඩිනම් කර තිබෙනවා. පසුගිය කාලයේ මන්දගාමී වූ වාරිමාර්ග ව්‍යාපෘති මේ මොහොත වනවිට නැවත සක්‍රිය කරමින් පවතිනවා. 2025 වසරේදී ඇති වූ "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් රටේ ප්‍රදේශ රැසක වාරිමාර්ග පද්ධතිවලට දැඩි හානි සිදු වුණා.

රජය විසින් මේ වනවිටත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඍජු ප්‍රතිපාදන මෙන්ම ජාත්‍යන්තර මූල්‍ය ආයතනවල සහාය ඇතිව ද්විත්ව වැඩ පිළිවෙළක් හරහා මෙම හානි යථා තත්ත්වයට පත් කිරීමට පියවර ගෙන තිබෙනවා. අද මා මෙම ගරු සභාවට ඉදිරිපත් කරන්නේ එම ප්‍රතිසංස්කරණවල ප්‍රගතිය සහ අප අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ප්‍රධාන වාරිමාර්ග හා බහුකාර්ය ව්‍යාපෘතිවල වත්මන් තත්ත්වයයි.

ග්‍රාමීය වාරි පද්ධති ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය මඟින් තිරසාර ජල සම්පත් කළමනාකරණය ශක්තිමත් කිරීම "වාරි මඟිම - අපේ උරුමය" වැඩසටහනේ ප්‍රධාන අරමුණයි. එමඟින් කෘෂි කාර්මික ඵලදායිතාව ඉහළ නැංවීම, ග්‍රාමීය ජනතාවගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීම, දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දෙන වාරි පද්ධති සංවර්ධනය කිරීම සහ ආහාර සුරක්ෂිතතාව අපේක්ෂා කෙරෙනවා. 2026-2029 කාලය තුළ ක්‍රියාත්මක වන මෙම වැඩසටහනේ ඇස්තමේන්තුගත මුදල රුපියල් මිලියන 9,250කි. 2026 වසර සඳහා රුපියල් මිලියන 1,000ක් වෙන් කර ඇති අතර, 2026 සැප්තැම්බර් 30 දිනට මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 99.12ක් සහ භෞතික ප්‍රගතිය සියයට 30කි. සාමාන්‍යයෙන් මේ ප්‍රගතිය කවදත් අවුරුද්දේ අවසාන මාස දෙක තුනේ තමයි වේගයෙන් අවසන් වෙන්නේ. මුල් කාලයේ මේ වාගේ තත්ත්වයක් තමයි තිබෙන්නේ. 2027 අවුරුද්ද සඳහා රුපියල් මිලියන 2,500ක් ඇස්තමේන්තු කර තිබෙනවා. ප්‍රමුඛතා වාරි පද්ධති, වැව්, එල්ලංගා පද්ධති, ඇළ පද්ධති සහ අමුණු ප්‍රතිසංස්කරණය කිරීම, වාරි-කෘෂිකර්ම-ඉඩම්-මහවැලි-ජල සම්පත් අංශ අතර ආයතනික සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම, ජලය, භූමිය හා භෝග ඒකාබද්ධ කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම, ගොවි සංවිධාන කාන්තා හා තරුණ කණ්ඩායම් සහ පෞද්ගලික අංශයේ සහභාගිත්වයෙන් වටිනාකම් දාම සංවර්ධනය කිරීම සහ ප්‍රමාද වූ සංවර්ධන කටයුතු නැවත සක්‍රිය කිරීම සඳහා කෙටි කාලීන කුඩා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙහි ප්‍රතිලාභ අතර වේ.

1. "දිට්වා" සුළි කුණාටුව - ඉක්මන් ප්‍රතිචාරය සහ ප්‍රතිපාදන

"දිට්වා" ව්‍යසනයෙන් හානි වූ ඇළවේලි කඩිනමින් තාවකාලිකව ප්‍රතිසංස්කරණය කිරීමෙන්, එම මහ කන්නයේ වගාවන් සඳහා භූමි ප්‍රමාණයෙන් සියයට 95කට වැඩි කොටසකට වාරි ජලය ලබා දීමට අපට හැකි වුණා.

ගරු කථානායකතුමනි, ඒ වෙච්ච විනාශයට සාපේක්ෂව බොහෝ දෙනෙක් කල්පනා කළා, ඒ මාස් කන්නයේ කටයුතු කර ගන්න බැරි තත්ත්වයක් ඇති වෙයි කියලා. නමුත්, වගා භූමියෙන් සියයට 95ක් නැවත වගා කරන්න පුළුවන් තත්ත්වයට ඉක්මනින් පත් කළා. මම මේ වෙලාවේ ඒ පිළිබඳව ගොවීන්ට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම අදාළ රාජ්‍ය නිලධාරීන්ට සහ ආයතන පද්ධතිවලටත්, ඒ සම්බන්ධව ඉන්න අදාළ බලධාරීන්ටත් ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මොකද, ඔවුන් ඇත්තටම මාස් කන්නයේ බරපතළ ගැටලුවක් ඇති වෙන්න ඉඩ තැබුවේ නැහැ. අපට මුලින්ම ප්‍රශ්නයක් ආවා, බීජ වී පවා නැතිව යන තත්ත්වයක් ඇති වෙයිද කියලා. ඒ සියල්ලට උත්තර ලබා දෙමින් අපි බලාපොරොත්තු වූ ප්‍රමාණවත් අස්වැන්නක් ලබා ගන්න පුළුවන්කම ලැබුණා.

මේ අමාත්‍යාංශ නිවේදනය ටිකක් දිගයි. ඒ ඔක්කොම කියවන්න ගියොත් වැඩි කාලයක් ගත වෙයි. මෙහි සම්පූර්ණ විස්තරය තිබෙනවා, අපේ මැදිහත් වීම සම්බන්ධව. අපේ අමාත්‍යාංශය සහ අදාළ ආයතන ප්‍රශස්ත මැදිහත්වීමක් කරන බව සභාවට දැනුම් දෙන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමන්ලාට මේ පිළිබඳ සම්පූර්ණ විස්තර දැන ගැනීම සඳහා මා මේ නිවේදනයේ ඉතිරි කොටස **සභාගත*** කරනවා.

සභාමේසය මත තබන ලද අමාත්‍යාංශ නිවේදනයේ ඉතිරි කොටස:
**சபாபீடத்தில் வைக்கப்பட்ட அமைச்சு சம்பந்தப்பட்ட கூற்றின் எஞ்சிய பகுதி:*
**Rest of the Ministerial Statement tabled:*

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේද හානි වූ සියලු වාරි ඇළ මාර්ගවල හානි වූ ස්ථාන තාවකාලිකව පිළිසකර කර ජලය ලබා දෙන ලදී. දැන් කෙරෙමින් පවතින්නේ එම හානි ස්ථිරව ප්‍රතිසංස්කරණය කිරීමයි. ඒ සඳහා ප්‍රධාන මූල්‍ය ප්‍රභව තුනක් යොදාගෙන තිබෙනවා:

- **2026 අය වැය ප්‍රතිපාදන:** වාරිමාර්ග අංශයේ "දිට්වා" ප්‍රතිසංස්කරණ සඳහා රුපියල් මිලියන 6,806.20ක් වෙන් වී ඇත. එයින් රුපියල් මිලියන 6,000ක් වාරිමාර්ග දෙපාර්තමේන්තුවටත්, රුපියල් මිලියන 806.20ක් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියටත් අයත් වේ.
- **හදිසි අවස්ථා ප්‍රතිචාර සංරචකය (**CERC**):** ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP) මඟින් රුපියල් මිලියන 3,638ක් (ඇමෙරිකානු ඩොලර් මිලියන 12)ද, දේශගුණික බලපෑම් අවම කිරීමේ බහුඅදියර වැඩසටහන (CResMPA) මඟින් රුපියල් මිලියන 6,735ක් (ඇමෙරිකානු ඩොලර් මිලියන 22.45) ද වෙන් වී ඇත. මේ යටතේ ව්‍යාපෘති මාස 18ක් තුළ ක්‍රියාත්මක කර අවසන් කළ යුතුයි.

[ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා]

- **ආසියානු සංවර්ධන බැංකුවේ හදිසි ආධාර ණය (** ADB-EAL**):** රුපියල් මිලියන 7,384.2ක ප්‍රතිපාදනයක් ලැබී ඇති අතර ව්‍යාපෘති වසර 4ක් තුළ අවසන් කළ යුතුයි. ඊට අමතරව ජීවනෝපාය නහාසිටුවීම සඳහා රුපියල් මිලියන 4,950ක මුදලක් ආපදාවට ලක්වූවන් වෙත ලබා දීමට කටයුතු කර ඇත.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රතිසංස්කරණ

"දිවිවා" සුළිකුණාටුවෙන් හානියට පත් දිස්ත්‍රික්ක 17ක වැව් අමුණු ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘති 660ක් සඳහා 2026 වසරේ රුපියල් මිලියන 6,000ක ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. දිස්ත්‍රික්ක මට්ටමින් බලන විට, 2026 සැප්තැම්බර් අග වන විට රුපියල් මිලියන 1,489.46ක මුදලක වැඩ අවසන් කර ඇති අතර, 2027 වසර සඳහා තවත් ප්‍රතිපාදන ලබා දෙනු ඇත. විශාලතම ප්‍රතිපාදන හිමි ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති 98ක් සඳහා රුපියල් මිලියන 2,009.64ක් වෙන් කර ඇති අතර, එහි භෞතික ප්‍රගතිය සියයට 63කි. වැඩිම ව්‍යාපෘති ගණනක් ඇත්තේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ (143) වන අතර, බදුල්ල (89) ඊළඟට පවතී. සියලු දිස්ත්‍රික්කවල විස්තර ඇමුණුම Aහි දක්වා ඇත.

2026 ඔක්තෝබර් 16 දිනැති වාර්තාවලට අනුව, ප්‍රධාන වැඩ අයිතම 11ක් සඳහා ඇස්තමේන්තුගත මුළු වටිනාකම රුපියල් බිලියන 2.89ක් වන අතර, එයින් රුපියල් බිලියන 1.99ක් මේ වන විටත් නිදහස් කර තිබෙනවා. එහි වත්මන් ප්‍රගතිය මෙසේයි:

- **පොළොන්නරුව දිස්ත්‍රික්කය (ඇළහැර අමුණ):** මහවැලි G කලාපයේ අක්කර 17,000කට සහ මින්නේරිය, ගිරිතලේ, කවුඩුල්ල, කන්තලේ ජලාශවලට ජලය සපයන ඇළහැර අමුණේ බැම්ම ප්‍රතිසංස්කරණය සඳහා රුපියල් මිලියන 309.14ක් ඇස්තමේන්තු කර ඇති අතර, මිලියන 155ක් නිදහස් කර තිබෙනවා. භෞතික ප්‍රගතිය සියයට 50කි.
- **ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය (මාවිල්ආරු ව්‍යාපාරය):** මාවිල්ආරු අමුණේ දකුණු ඉවුරේ මීටර් 825ක් සහ වම් ඉවුරේ මීටර් 2,730ක් ප්‍රතිසංස්කරණය සඳහා රුපියල් මිලියන 1,176ක් ඇස්තමේන්තු කර, මිලියන 850ක් නිදහස් කර තිබෙනවා. දකුණු ඉවුරේ සියයට 70ක ද, වම් ඉවුරේ සියයට 60 සහ සියයට 65ක ප්‍රගතියක් පවතිනවා. මෙම වැඩ මැද වුවද 2026/2027 මහ කන්නයට ජලය නිකුත් කිරීමට අපට හැකි වුණා.
- **අනුරාධපුර දිස්ත්‍රික්කය (මාවතගම සහ මානන්කටිය වැව):** මාවතගම වැව බැම්ම ශක්තිමත් කිරීමට රුපියල් මිලියන 187.64ක ඇස්තමේන්තුවෙන් මිලියන 164.02ක් නිදහස් කර ඇති අතර ප්‍රගතිය සියයට 75කි. මානන්කටිය වැවේ නව සොරොව්ව සහ වැව් බැම්ම සඳහා රුපියල් මිලියන 245.51ක් ඇස්තමේන්තු කර, මිලියන 120ක් නිදහස් කර තිබෙනවා. එහි ප්‍රගතිය සියයට 55කි.
- **බදුල්ල දිස්ත්‍රික්කය (බදුලු ඔය සහ බත්මැඩිල්ල ව්‍යාපාර):** බදුලු ඔය ප්‍රධාන ඇළ සඳහා රුපියල් මිලියන 292.36ක ඇස්තමේන්තුවෙන් මිලියන 233.82ක් නිදහස් කර ඇති අතර ප්‍රගතිය සියයට 60කි. බත්මැඩිල්ල ව්‍යාපාරයේ රුපියල් මිලියන 102.14ක ඇස්තමේන්තුවෙන් මිලියන 76.42ක් නිදහස් කර ඇති අතර ප්‍රගතිය සියයට 70කි.
- **පුත්තලම දිස්ත්‍රික්කය (අන්දකට්ටුව වැව):** සෙංගලඔය ව්‍යාපාරයට අයත් මෙම වැවේ මීටර් 1,625ක බැම්ම ප්‍රතිසංස්කරණය සියයට 90ක් අවසන් කර වගාවට ජලය නිකුත් කර තිබෙනවා. ඇස්තමේන්තුව රුපියල් මිලියන 25.79ක් වන අතර මිලියන 20.40ක් නිදහස් කර ඇත.
- **නීලපොල මහවැලි ගංවතුර ආරක්ෂණ බැම්ම:** මීටර් 14,000ක කොටසක් ප්‍රතිසංස්කරණය සඳහා රුපියල් මිලියන 549.94ක් ඇස්තමේන්තු කර, මිලියන 375ක් නිදහස් කර තිබෙනවා. වත්මන් භෞතික ප්‍රගතිය සියයට 55කි.

3. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ "දිවිවා" ප්‍රතිසංස්කරණ

2026 සඳහා මහවැලි අධිකාරියට ලැබුණු අමතර ප්‍රතිපාදන රුපියල් මිලියන 806.20කි. හදුනාගත් ව්‍යාපෘති ගණන 55ක් වන අතර, එයින් 38ක වැඩ දැනටමත් ආරම්භ කර තිබෙනවා. කලාප අනුව ප්‍රගතිය මෙසේයි:

- **එච් කලාපය:** වැව් 30ක් අතරින් වැඩ 29ක් ආරම්භ කර ඇත.
- **සී කලාපය:** වැව් 19ක් අතරින් වැඩ 8ක් ආරම්භ කර ඇත.
- **ඩී කලාපය:** වැව් 2ක් වැඩ ආරම්භ කර ඇත.
- **ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම්:** රන්ටැඹේ මඩ සොරොව්ව ප්‍රවේශ මාර්ගය; බෝවතැන්න ස්පිල් ඇළ වම්පස බැම්ම ඉදිකිරීම සහ රන්දෙණිගල මඩ සොරොව්ව ප්‍රවේශ මාර්ගය යන කටයුතු සඳහා සැලසුම් සකස් කිරීම අවසන්ය. රන්ටැඹේ ලංසු ඇගයීම සිදුවෙමින් පවතින අතර, බෝවතැන්න ව්‍යාපෘතිය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව ඉදිරියේ පවතී. රන්දෙණිගල ලංසු පත්‍රිකා සකසා අවසන්ය.

4. හදිසි අවස්ථා ප්‍රතිචාර සංරචකය (CERC) යටතේ ප්‍රතිසංස්කරණ

4.1 ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP)

"දිවිවා" සුළිකුණාටුවෙන් විනාශ වූ යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය සඳහා ක්‍රියාත්මක කිරීමේ ආයතන 7ක් හරහා ව්‍යාපෘති 93ක් තෝරාගෙන ඇති අතර, ඒවායේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 3,600කි (ඇමුණුම C). වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, උතුරු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ නැගෙනහිර පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සතු ව්‍යාපෘති 42 අතරින් 16ක් ආරම්භ කර ඇති අතර එක් ව්‍යාපෘතියක් අවසන් කර ඇත. මහනුවර, නුවරඑළිය හා බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා සිදුවන ව්‍යාපෘති 51න් 19ක් ආරම්භ කර ඇති අතර, ඒවායින් 2ක් අවසන් කර ඇත.

4.2 දේශගුණික බලපෑම් අවම කිරීමේ බහුඅදියර වැඩසටහන (CResMPA)- සංරචකය 04

මෙමඟින් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අදාළ "දිවිවා" ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කෙරෙනවා.

- **ප්‍රතිපාදන:** මුළු ව්‍යාපෘති ප්‍රතිපාදන රුපියල් මිලියන 6,735ක් වන අතර 2026 වසර සඳහා රුපියල් මිලියන 4,650 ක් වෙන් කර ඇත. එයින් රුපියල් මිලියන 4,092ක් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ගෙවන ලද වගා හානි ප්‍රතිපූරණය සඳහා යොදාගෙන ඇත.
- **පැකේජ:** සිවිල් වැඩ පැකේජ 29ක් සහ යාන්ත්‍රික/භාණ්ඩ පැකේජ 5ක් ඇති අතර, කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇති පැකේජ සංඛ්‍යාව 27කි. ප්‍රදානය කළ කොන්ත්‍රාත්වල මුළු වටිනාකම රුපියල් මිලියන 1,493.68කි (ඇමුණුම D).
- **ප්‍රගතිය:** භෞතික ප්‍රගතිය සියයට 55ක් වන අතර, 2026 ඔක්තෝබර් 16 දින දක්වා රුපියල් මිලියන 537.33ක් වැය කර ඇත.
- **නිම කිරීමේ දිනය:** සැලසුම්ගත ව්‍යාපෘති අවසන් කිරීමේ දිනය 2026 දෙසැම්බර් 31 වේ.

4.3 ආසියානු සංවර්ධන බැංකුවේ හදිසි ආධාර ණය (ADB - EAL) වැඩසටහන

"දිවිවා" සුළිකුණාටුව හේතුවෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට සහ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් වාරිමාර්ග පද්ධති දිස්ත්‍රික්ක 22ක දැඩි හානිවලට ලක්ව තිබෙනවා. මෙම ව්‍යාපෘතිය, හානි වූ යටිතල පහසුකම් "Build Back Better" (BBB) මූලධර්මවලට අනුව යථා තත්ත්වයට පත් කිරීම සඳහා සකස් කර ඇති අතර, අප අමාත්‍යාංශයට අදාළ කොටස් දෙකක් පවතිනවා:

- **Output 2 (වාරිමාර්ග පුනරුත්ථාපනය):** උතුරු මැද සහ මධ්‍යම පළාත් කේන්ද්‍ර කරගනිමින්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ මහවැලි අධිකාරිය යටතේ වේලි ආරක්ෂණ සැලැස්ම ශක්තිමත් කිරීමට ඇමෙරිකානු ඩොලර් මිලියන 28.7ක් වෙන් කර ඇත. මෙය මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහනේ (MWSIP)- අදියර II ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) හරහා ක්‍රියාත්මක කිරීමට යෝජිතයි.
- **Output 3 (කෘෂිකාර්මික මුදල් මාරු කිරීම්):** ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ කෘෂිකාර්මික ජීවනෝපාය සහාය සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 15ක් වෙන් කර ඇත.

වාරිමාර්ග යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය සඳහා වෙන් කර ඇති සමස්ත ප්‍රතිපාදනය රුපියල් මිලියන 7,384.20කි. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ පාලනය වන ජලාශ හා වේලිවලට සිදු

වූ හානි ප්‍රතිසංස්කරණයට රුපියල් මිලියන 3,480ක් පමණ ද, වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ඇළ මාර්ග පුනරුත්ථාපනයට රුපියල් මිලියන 4,006ක් පමණ ද වැය වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. ව්‍යාපෘතියේ සමස්ත සම්බන්ධීකරණය ප්‍රවාහන අමාත්‍යාංශය විසින් සිදු කරන අතර, අප අමාත්‍යාංශය අදාළ කොටස් ක්‍රියාත්මක කරනවා. දැනට ඇස්තමේන්තු සකස් කිරීම් සිදුවෙමින් පවතී.

ඒ අනුව, පහත ප්‍රසම්පාදන පැකේජ හතර සඳහා අවශ්‍ය මූලික කටයුතු (යොමු කොන්දේසි (TOR), පිරිවැය ඇස්තමේන්තු සහ අනෙකුත් අදාළ ලේඛන සකස් කිරීම හා කම්ටු පත් කිරීම) සිදු කරමින් පවතිනවා:

- රන්දෙණිගල වේල්ලේ වලන නිරීක්ෂණය සඳහා භූමික මිනුම් නිරීක්ෂණ පද්ධතියක් ස්ථාපනය කිරීම - රුපියල් මිලියන 250
- කළුගඟ - මොරගහකන්ද ජල හැරවුම් ඇළ මාර්ගයේ (KMTC) විවෘත ඇළ කොටසේ කඩා වැටුණු බැවුම් ප්‍රදේශය ප්‍රතිසංස්කරණය කිරීම - රුපියල් මිලියන 300
- නාවිවවුව වාරිමාර්ග යෝජනා ක්‍රමය, තුරුවිල සහ පෝෂක ඇළ යෝජනා ක්‍රමය - රුපියල් මිලියන 55
- ඇළහැර, මින්නේරිය, යෝධ ඇළ (EMYE) පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම - රුපියල් මිලියන 150

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක සඳහා අනුමත නව කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු ද සිදුකරමින් පවතිනවා.

4.4 කුඩා වැව් ප්‍රතිසංස්කරණ - නකල්ස් ව්‍යාපෘතිය

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට හා පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවලට අයත් කුඩා වැව් ප්‍රතිසංස්කරණය කරන නකල්ස් ව්‍යාපෘතිය යටතේ මුළු ව්‍යාපෘති 211ක් පවතින අතර, ඉන් 16ක් අවසන් කර, 142ක් ක්‍රියාත්මක වෙමින් පවතින අතර 53ක වැඩ තවම ආරම්භ කර නොමැත. මෙයින් "දිවිවා" සුළි කුණාටුවෙන් බලපෑමට ලක් වූ ව්‍යාපෘති 141ක් වන අතර, 8ක් අවසන් කර, 95ක් ක්‍රියාත්මක වෙමින් පවතී.

5. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ "දිවිවා" ප්‍රතිසංස්කරණ

"දිවිවා" සුළිකුණාටුව හේතුවෙන් සුළු වාරි මාර්ග අංශයට දැඩි හානියක් සිදු විය. වැව් 1,599 ක්, අමුණු 1,686ක් සහ ඇල මාර්ග 4,042ක් ඇතුළුව වාරි මාර්ග 7,327කට හානි සිදු වූ අතර, ඇස්තමේන්තුගත මුළු හානිය රුපියල් මිලියන 18,691කි.

මේ වනවිට ව්‍යාපෘති 365ක ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර ඇති අතර, 2026 වර්ෂයේදී තවත් ව්‍යාපෘති 971ක ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරමින් පවතී. එම ව්‍යාපෘති ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ව්‍යාපෘති 112ක් ද, නකල්ස් ව්‍යාපෘතිය මඟින් ව්‍යාපෘති 52ක් ද, පළාත් වාරි මඟින් ව්‍යාපෘති 298ක් ද, SARP ව්‍යාපෘතිය මඟින් ව්‍යාපෘති 22ක් ද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ව්‍යාපෘති 105ක් ද, රාජ්‍ය නොවන සංවිධාන මඟින් ව්‍යාපෘති 77ක්ද සහ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන හා දේශගුණික ඔරොත්තු දීමේ ව්‍යාපෘතියේ හදිසි ප්‍රතිචාර සංරචකය (CERC) මඟින් ව්‍යාපෘති 305ක් ද ලෙස ක්‍රියාත්මක වේ.

ඉතිරි ව්‍යාපෘති 5,991 සඳහා රුපියල් මිලියන 12,476 ක් අවශ්‍ය වන අතර, ඉන් ව්‍යාපෘති 5,897ක් 2026/2027 වසරවලදී මහවැලි උපදේශන කාර්යංශය මඟින් ද (රු. මිලියන 12,125.5), ව්‍යාපෘති 94ක් 2027දී ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ද (රු. මිලියන 350.5) ප්‍රතිසංස්කරණය කිරීමට සැලසුම් කර ඇත.

6. ප්‍රධාන වාරිමාර්ග සහ බහුකාර්ය ව්‍යාපෘතිවල වත්මන් තත්ත්වය

දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දෙන සහ ආපදාවලින් හානි වූ යටිතල පහසුකම් පුනරුත්ථාපනය කිරීම සඳහා ක්‍රියාත්මක වන ප්‍රධාන ව්‍යාපෘති කිහිපයක තත්ත්වය දැන් මා ඉදිරිපත් කරන්නම්. ව්‍යාපෘතිවල සාරාංශගත මූල්‍ය හා භෞතික තොරතුරු ඇමුණුම B හි දක්වා ඇත.

6.1 මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (MWSIP)

මහවැලි ද්‍රෝණියේ අතිරික්ත ජලය, වාරි හා පානීය ජල ඌනතාවයෙන් පෙළෙන උතුරු මැද හා වයඹ පළාත්වලට හරවා, වාරි ජල පහසුකම් සහ පානීය ජලය සැපයීම තුළින් එම ප්‍රදේශවල ආර්ථිකය නහාසිටුවීම මෙහි අරමුණයි. ආසියානු සංවර්ධන බැංකුව සහ ශ්‍රී ලංකා රජය මෙයට දායක වන අතර, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුදල රුපියල් මිලියන 160,950ක් (ඇ. ඩොලර් මිලියන 535.5) වේ. පළමු අදියර 2015දී ආරම්භ කර 2025 ජූනි මාසයේදී අවසන් කළ අතර, දෙවන අදියර 2031 වර්ෂයේදී නිම කිරීමට අපේක්ෂිතයි. 2026 සඳහා ප්‍රතිපාදන රුපියල් මිලියන 22,300ක් වන අතර, මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 11,098ක් සහ භෞතික ප්‍රගතිය සියයට 49කි. 2027 සඳහා රුපියල් මිලියන 19,500ක් ඇස්තමේන්තු කර ඇත.

- **උතුරු මැද පළාත් මහ ඇළ ව්‍යාපෘතිය (NCPCP):** මෙහි සමස්ත දිග කිලෝමීටර් 240කට ආසන්න වන අතර, සැලසුම් රන්දෙනිගල සිට කළුගඟ - මොරගහකන්ද හරහා උතුරු පළාතේ වෙම්මඩුකුලම් දක්වා දිවෙනවා. දකුණු ආසියාවේ දීර්ඝතම වාරිමාර්ග උමග ලෙස පිළිගැනෙන කිලෝමීටර් 27.7ක උමග කැණීම සඳහා TBM යන්ත්‍ර දෙකක් භාවිතා කරන ලදී. මීගස්වැව ප්‍රදේශයෙන් දකුණු දිශාවටත්, කෝදුරුවාවෙන් උතුරු දිශාවටත් කැණීම් සිදු කළ එම යන්ත්‍ර දෙක 2026 ජූලි 15 වන දින එකිනෙක මුණගැසීමෙන් සමස්ත උමගේ කැණීම් අවසන් කරන ලදී. මෙය ශ්‍රී ලාංකීය වාරි ඉංජිනේරු ක්ෂේත්‍රයට සුවිශේෂී දිනයක් වන අතර, විසල් ජල හැරවුමේ ජයග්‍රාහී ඉලක්කයක් සපුරා ගැනීමකි. ප්‍රධාන උමගේ UEC-ICB-2A පැකේජය යටතේ කිලෝමීටර් 8ක කැණීම් අවසන් කර නිම කිරීමේ කටයුතු සිදුවෙමින් පවතින අතර, එහි කොන්ත්‍රාත්තුව අවසන් වන දිනය 2026 දෙසැම්බර් 10 වේ. අනෙකුත් පැකේජ (NCPCP-3,4,5) ප්‍රසම්පාදන අදියරේ පවතී.
- **මිණිපේ වම් ඉවුර ඇළ පුනරුත්ථාපන ව්‍යාපෘතිය:** මිණිපේ අමුණේ වේල්ලේ උස වැඩිකර, රාත්‍රී කාලයේ රන්ටැඹේ ජල විදුලි බලාගාරයෙන් පිටවන ජලය වැඩි ප්‍රමාණයක් රඳවා තබා, එම ජලය දිවා කාලයේ මිණිපේ වම් ඉවුරු ඇළට ක්‍රමවත්ව ලබා දීම මෙහි අරමුණයි. එමෙන්ම උස වැඩිකර ඉදිකරනු ලබන අමුණෙහි මැද නව මඩ සොරොව්වක් ඉදිකිරීම, දකුණු ඉවුරු ඇළට හදිසි පිටවාන් නිර්මිතයක් අලුතින් ඉදිකිරීම සහ ස්වයංක්‍රීය ජල මිනුම් උපකරණ හා කාලගුණ දත්ත වාර්තාකරණ ඒකක ස්ථාපිත කිරීම ද සිදු කෙරේ.
- **Output 2 (වාණිජ කෘෂිකර්ම සංවර්ධනය):** අනුරාධපුර සහ පොළොන්නරුව දිස්ත්‍රික්කවල හෙක්ටෙයාර 1,000ක ඉහළ වටිනාකමකින් යුත් බෝග ප්‍රදේශ සඳහා කෘෂිකාර්මික සහාය සේවා සැපයීමේ ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම (PIM) දැනටමත් සමාලෝචනය කර ඉදිරිපත් කර ඇත. මෙයට ADB,OPEC,IFAD සහ රජයේ සම - මූල්‍යකරණය ලබා ගැනීමට නියමිතයි.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් හෙක්ටෙයාර 74,000ක වගා බිම් පෝෂණය කිරීමටත්, මහා වාරි පද්ධති 12 ක් හා එල්ලංගා පද්ධති 130කට අයත් වැව් 1,505කට වාරි ජලය සැපයීමටත් හැකියාව ලැබෙනවා. වාර්ෂිකව ඝන මීටර් මිලියන 70ක පානීය ජලයක් සැපයෙන අතර, වයඹ මහ ඇළ ව්‍යාපෘතිය යටතේ කුඩා වැව් 350ක් සහ දේවහුව, මහ කිතුල, පාලුකඩවල, අබ කොළ වැව, අතරගල්ල, හක්වටුනා ඔය, මැඩියාව ආදී මහ වැව් 8ක් සඳහා ජලය සැපයීමට නියමිතයි. මිණිපේ වාරි ව්‍යාපාරය යටතේ පදිංචි ගොවි පවුල් 15,000කට වැඩි සංඛ්‍යාවකට ප්‍රතිලාභ හිමි වන අතර, වස්ගමුව ජාතික වනෝද්‍යානයේ කළුරැපිටිය කුඩා පොකුණට ජලය ලබා දී, වියළි කාලයේ වනසතුන් මුහුණපාන පානීය ජල හිඟයට පිළියම් ලැබීම ද තවත් ප්‍රතිලාභයකි.

6.2 ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP)

ලෝක බැංකුවේ සහ ශ්‍රී ලංකා රජයේ මූල්‍ය දායකත්වයෙන් ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුදල රුපියල් මිලියන 20,308.70කි. 2021 මැයි මාසයේ ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය 2026 ඔක්තෝබර් මාසයේ අවසන් කිරීමට නියමිතව තිබුණද, සංශෝධිත අවසන් දිනය 2027 ඔක්තෝබර් වේ. ජල පෝෂක සහ ජල සම්පත් සැලසුම්කරණය වැඩිදියුණු කිරීම, වාරි මාර්ග යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ "දිවිවා" සුළිකුණාටුවෙන් විනාශ වූ යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය මෙම ව්‍යාපෘතිය ඔස්සේ සිදු කෙරේ. ව්‍යාපෘතියේ සමස්ත මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 10,686.22ක් ද, සමස්ත භෞතික ප්‍රගතිය සියයට 88.1ක් ද වේ. 2026 වසරේ භෞතික ප්‍රගතිය සියයට 62.5ක් වන අතර, 2027 සඳහා රුපියල් මිලියන 5,010ක් ඇස්තමේන්තු කර ඇත.

[ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා]

2022 වසරේ ඇති වූ ආර්ථික අර්බුදය මත ගොවි ජනතාවගේ ආර්ථිකය යථාවත් කිරීම සඳහා, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, උතුරු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ නැගෙනහිර පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් ව්‍යාපෘති හඳුනාගෙන, දිවයිනේ දිස්ත්‍රික්ක 25ම ආවරණය වන පරිදි රුපියල් මිලියන 2,500කට ආසන්න මුදලක් වෙන් කර, කුඩා පරිමාණ වාරිමාර්ග ප්‍රතිසංස්කරණ වැඩසටහනක ව්‍යාපෘති 770ක් ගොවි සංවිධාන - CBO - හරහා සාර්ථකව ක්‍රියාත්මක කර තිබෙනවා. ඒ සඳහා රුපියල් මිලියන 2,300කට වැඩි මුදලක් ගොවි ජනතාව අතර මේ වන විටත් බෙදා දී අවසන්.

මීට අමතරව, මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වාරිමාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති 83ක් පවතින අතර, ඒවායේ මුළු පිරිවැය ඇස්තමේන්තුව රුපියල් මිලියන 12,304කි. එයින් ව්‍යාපෘති 25ක වැඩ අවසන් කර ඇති අතර, ඒවායේ වටිනාකම රුපියල් මිලියන 4,555කි (ඇමුණුම C).

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් වේලි 34ක අවදානම් මට්ටම අඩු කිරීම, හෙක්ටෙයාර 91,831ක වාරිමාර්ග භූමි ප්‍රමාණයකට වැඩිදියුණු කළ හෝ අලුතින්ම වාරි සේවා ලබා දීම, හෙක්ටෙයාර 35,000ක භූමි ප්‍රමාණයක භූමි සංරක්ෂණ පහසුකම් වඩා හොඳ තත්ත්වයට පත් කිරීම, ජාතික ජල සම්පත් ප්‍රතිපත්තියක් ශ්‍රී ලංකාවට හඳුන්වා දීම සහ දේශගුණ විපර්යාසවලට ඔරොත්තු දෙන යටිතල පහසුකම් ඔස්සේ පුද්ගලයන් 1,100,000කට ප්‍රතිලාභ ලබා දීම අපේක්ෂා කෙරේ.

6.3 දේශගුණික බලපෑම් අවම කිරීමේ බහුඅදියර වැඩසටහන (CResMPA) - අදියර I

ලෝක බැංකු IBRD මූල්‍ය ආධාර මත ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියේ පිරිවැය, අඹතලේ ලවණතා බාධකය II අදියර දක්වා කල් දැමීම නිසා ඇමෙරිකානු ඩොලර් මිලියන 76ක් (රුපියල් මිලියන 15,567ක්) දක්වා සංශෝධනය කර තිබෙනවා. ජල ආශ්‍රිත ආපදාවන්ගෙන් ඇතිවන බලපෑම අඩු කිරීම සහ කැළණි ගංගා ද්‍රෝණියේ ගංවතුර අවදානම අවම කිරීම සඳහා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ (NBRO) පූර්ව අනතුරු දැන්වීමේ හැකියාව වැඩිදියුණු කිරීම මෙහි අරමුණයි. 2021දී ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය 2026 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වීමට නියමිත වුවද, ඉතිරිව ඇති (spillover) ක්‍රියාකාරකම් 2027දී සම්පූර්ණ කෙරේ. 2026 ඔක්තෝබර් 5 දින සිට මෙහි සමස්ත තාක්ෂණික අධීක්ෂණය ජල සම්පත් සැලසුම් සහ කළමනාකරණ අංශය වෙත පවරා ඇත.

2026 සැප්තැම්බර් 30 දිනට ව්‍යාපෘතියේ සමස්ත මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 12,409.65ක් සහ භෞතික ප්‍රගතිය සියයට 83කි. මෙම ව්‍යාපෘතිය මඟින් සිදු කර ඇති ප්‍රධාන කාර්යයන් මෙසේයි:

- කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ක්ෂණික අනාවැකි (Nowcasting) සහ කාලගුණ අනාවැකි (Forecasting) සේවා නවීකරණය කිරීම සඳහා ජාත්‍යන්තර උපදේශක කණ්ඩායමක් යොදවා ඇත.
- ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා පූර්ව අනතුරු ඇඟවීම් බෙදාහැරීම හා සන්නිවේදනය වැඩිදියුණු කිරීමට තීරණ සහාය පද්ධතියක් (DSS) සංවර්ධනය කිරීම, ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන කාර්යාල ප්‍රතිසංස්කරණය සහ නව දිස්ත්‍රික් කාර්යාල ඉදිකිරීම සිදු කර ඇත.
- ගංවතුර අවම කිරීමේ ව්‍යුහාත්මක පියවරක් ලෙස අඹතලේ නව ලවණ බාධකයක් ඉදිකිරීම සඳහා සහ බහුකාර්ය ජලාශයක් ලෙස වී ඔය ජලාශය ඉදිකිරීම සඳහා සවිස්තරාත්මක සැලසුම් සකස් කර ඇත.
- දිස්ත්‍රික්ක 25ක ක්‍රියාත්මක කරන ලද වාරිමාර්ග පුනරුත්ථාපන පැකේජවලින් සෘජුව සහ වක්‍රව පුද්ගලයින් 612,500කට ප්‍රතිලාභ ලැබී ඇත.
- හානි වූ වාරි ඇළ මාර්ග, වාරිමාර්ග ව්‍යුහයන්, අමුණු සහ ඒවායේ යාන්ත්‍රික ගේට්ටු ප්‍රතිසංස්කරණයට දිස්ත්‍රික්ක 25ක් යටතේ රුපියල් මිලියන 8,000කට ආසන්න මුදලක් ආයෝජනය කර ඇති අතර, ගොවි ජනතාව 806,465කට ප්‍රතිලාභ සැලසී ඇත. එමඟින් වාරි ඇළ මාර්ග කිලෝමීටර් 160ක් පමණ වැඩිදියුණු කර ඇති අතර, ගංවතුර සහ නියඟයෙන් හෙක්ටෙයාර 120,039ක පමණ භූමි ප්‍රමාණයක් ආරක්ෂා කිරීමට හැකි වී ඇත.

මේ අතරම, සංරචකය 05 (වාරිමාර්ග ප්‍රතිසංස්කරණ - Repurposing) යටතේ මුල් ප්‍රතිපාදන ඇමෙරිකානු ඩොලර් මිලියන 17ක් (රුපියල් මිලියන 5,100) සහ අතිරේක ප්‍රතිපාදන ඩොලර් මිලියන 5ක් (රුපියල් මිලියන 1,500) වෙන් කර ඇත. මුළු පැකේජ 1,827ක් අතරින් 1,467ක් සඳහා ඇස්තමේන්තු ඉදිරිපත් කර ඇති අතර 1,361ක් සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇත. භෞතික ප්‍රගතිය සියයට 89ක් වන අතර, 2026 ඔක්තෝබර් 16 දින දක්වා රුපියල් මිලියන 4,174.79ක් වැය කර ඇත. මෙම සංරචකයද 2026 දෙසැම්බර් 31 වන දිනට අවසන් කිරීමට සැලසුම් කර ඇත.

"දිවිවා" සුළි කුණාටුවෙන් පසු ක්‍රියාවට නැංවූ හදිසි ප්‍රතිචාර සංරචකය (CERC) සහ යටිතල පහසුකම් පුනරුත්ථාපන කටයුතු (සංරචක 4 සහ 5) ජල සම්පත් සංවර්ධන අංශය විසින් අධීක්ෂණය කරනු ලබයි. 2026 දෙසැම්බර් මසින් පසු ඉතිරි වන වැඩ සඳහා 2027 වර්ෂයේදී රජයේ අරමුදල් සැපයීමට කැබිනට් අනුමැතිය ලැබී ඇති බව ද මෙම ගරු සභාවට දන්වා සිටිනවා.

6.4 නකල්ස් ව්‍යාපෘතිය (හරිත දේශගුණ අරමුදල)

හරිත දේශගුණ අරමුදලේ (Green Climate Fund) සහ ශ්‍රී ලංකා රජයේ මූල්‍ය දායකත්වයෙන් ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියේ අරමුණ, මෙරට ඉහළ සහ පහළ ග්‍රාමීය ප්‍රජාවන් තුළ දේශගුණික විපර්යාසයන්ට අනුවර්තනය වීමේ ධාරිතාවය වැඩි කර, යැපුම් ගොවීන්ට ඔවුන් සම්බන්ධ පරිසර පද්ධති සේවා ප්‍රවාහයන් ආරක්ෂා කිරීම ඇතුළුව ජීවනෝපායන් උත්පාදනය කිරීම සහ ආහාර සුරක්ෂිතතාව වැඩිදියුණු කිරීමයි. ඇස්තමේන්තුගත මුදල රුපියල් මිලියන 14,710.50ක් වන අතර, 2023 ජනවාරි මාසයේ ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය 2029දී නිම කිරීමට අපේක්ෂිතයි. 2026 සඳහා ප්‍රතිපාදන රුපියල් මිලියන 3,250 ක් වන අතර, 2026 වසරේ මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 951.40කි. 2026 සැප්තැම්බර් 30 දිනට ව්‍යාපෘතියේ සමස්ත මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 1,862.86ක් සහ සමස්ත භෞතික ප්‍රගතිය සියයට 37.5කි. 2027 සඳහා රුපියල් මිලියන 4,300ක් ඇස්තමේන්තු කර ඇත.

මෙමඟින් දේශගුණයට ඔරොත්තු දෙන, විවිධාංගීකරණය වූ ජීවනෝපාය විකල්ප අනුගමනය කිරීමෙන් දළ වශයෙන් මිලියන 1.34ක ජනතාවකට (කාන්තාවන් සියයට 51.4ක්) ප්‍රතිලාභ ලැබෙන අතර, කඳුකර හා පහතරට කෘෂි පරිසර පද්ධති සහ ස්වාභාවික පරිසර පද්ධති හෙක්ටෙයාර 672,518ක් ආරක්ෂා කර ශක්තිමත් කිරීමට අපේක්ෂා කෙරේ.

6.5 වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන අනෙකුත් ප්‍රධාන ව්‍යාපෘති

- **ඇල්ලේවැව ජලාශ ව්‍යාපෘතිය (රත්නපුර):** ඇස්තමේන්තුගත මුදල රුපියල් මිලියන 2,950ක් වන අතර, භෞතික ප්‍රගතිය සියයට 66.95කි. හුළංදාව හා පානාමුර වාරියෝජනා ක්‍රමවල පවතින ඉඩම් හෙක්ටෙයාර 456කට සහ නව ඉඩම් හෙක්ටෙයාර 1,416කට ප්‍රතිලාභ සැලසීමත්, කොළොන්න ජලසම්පාදන යෝජනා ක්‍රමයට දිනකට ඝන මීටර් 7,000ක් සැපයීමත් සිදු කෙරේ. 2027 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට අපේක්ෂිතයි.
- **පහළ මල්වතුඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය:** අනුරාධපුර, මන්නාරම, වවුනියා දිස්ත්‍රික්කවල පානීය, වාරිමාර්ග සහ පශු සම්පත් ජල අවශ්‍යතා සපුරා දීම, ගංවතුර පාලනය, ජල විදුලිය සැපයීම සහ ධීවර ක්ෂේත්‍ර සංවර්ධනය මෙහි අරමුණු වේ. ඇස්තමේන්තුගත මුදල රුපියල් මිලියන 47,180ක් වන අතර භෞතික ප්‍රගතිය සියයට 13.82කි. නව කුඹුරු හෙක්ටෙයාර 810කට සහ පවතින කුඹුරු හෙක්ටෙයාර 12,416කට වාරි ජල පහසුකම් සැපයීම, පානීය ජලය ඝන මීටර් මිලියන 21ක් ලබා දීම සහ ජල විදුලිය 4.68 GWh නිපදවීම ඒ අතර වේ. 2030 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට අපේක්ෂිතයි.

- **උමා ඔය පහළ නිමින සංවර්ධන ව්‍යාපෘතිය:** මොනරාගල සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය මඟින් පවුල් 5,700කට අධික ප්‍රමාණයකට සෘජු ප්‍රතිලාභ සැපයේ. ඇස්තමේන්තු ගත මුදල රුපියල් මිලියන 22,017ක් වන අතර, භෞතික ප්‍රගතිය සියයට 92.25කි. නව ඉඩම් හෙක්ටෙයාර 4,500කට සහ පවතින ඉඩම් හෙක්ටෙයාර 1,500කට ජල පහසුකම් සැපයීම, පානීය ජලය සහ මීටර් මිලියන 30ක් ලබා දීම, අලිකොට ආර භා කුඩා ඔය ජලාශ ඉදිකිරීම සහ කුඩා වැව් 54ක් වැඩිදියුණු කර පවත්නා වැව් 116කට ජලය සැපයීම මෙහි ඉටුකර ඇති කාර්යයන් වේ. 2027 ජූලි 31 වන විට අවසන් කිරීමට අපේක්ෂිතයි.

- **යාන්ඔය ජලාශ ව්‍යාපෘතිය:** අනුරාධපුර හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවල ජනතාවට නව වගා බිම් සඳහා වාරි පහසුකම්, පානීය හා විදුලි පහසුකම් ලබා දීම මෙහි අරමුණයි. ඇස්තමේන්තුගත මුදල රුපියල් මිලියන 48,355.3ක් වන අතර, භෞතික ප්‍රගතිය සියයට 99.6කි. ගොවි පවුල් 8,000කට පමණ ප්‍රතිලාභ ලැබී ඇති අතර, නව වගා බිම් හෙක්ටෙයාර 1,515ක් සහ පවත්නා වගා බිම් හෙක්ටෙයාර 7,185ක් සඳහා යල මහ දෙකන්නයේදී ජල පහසුකම් සැපයේ. 2027 දෙසැම්බර් 31 වන විට ව්‍යාපෘතිය අවසන් කිරීමට අපේක්ෂිතයි.

- **ඒරුවැව සිට මහකනදරාව දක්වා පෝෂිත ඇළ ඉදිකිරීම:** ඇස්තමේන්තුගත මුදල රුපියල් මිලියන 2,000ක් වන අතර, භෞතික ප්‍රගතිය සියයට 96.09කි. ඒරුවැව සහ මහකනදරා ජලාශවල ජල ධාරිතාව වැඩි කිරීමෙන් ගොවි පවුල් 5,237කට ප්‍රතිලාභ ලැබෙන අතර පවුල් 20,000කට පානීය ජල පහසුකම් සැපයේ. මුදුප්පුව හා මහානොච්චිකුළම වැව් වැඩිදියුණු කිරීම සහ පෝෂිත ඇළ මාර්ග ඉදිකිරීම ද මෙයට ඇතුළත්ය. 2026 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට අපේක්ෂිතයි.

- **කුඹුක්කන් ඔය ව්‍යාපෘතිය සහ හැඩ ඔය ව්‍යාපෘතිය ආරම්භ කිරීම:** මොනරාගල දිස්ත්‍රික්කයේ කුඹුක්කන් ඔය සහ හැඩ ඔය ව්‍යාපෘතිය ආරම්භ කිරීමට මූලික කටයුතු සිදු කරමින් පවතින අතර එහිදී මොනරාගල සහ අම්පාර දිස්ත්‍රික්කයන්හි ජනතාවට පානීය ජලය සහ වගා ඉඩම් ලබා දීමේ වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.

6.6 ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන සහ දේශගුණික ඔරොත්තු දීමේ ව්‍යාපෘතිය (IRDCRP)

දිස්ත්‍රික්ක 12ක ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය සඳහා IDA ණය ඩොලර් මිලියන 100ක් සහ රජයෙන් ඩොලර් මිලියන 3ක් වෙන් කර ඇත. මෙයින් ප්‍රධාන, මධ්‍යම සහ කුඩා වාරිමාර්ග පද්ධතිවල ජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ උප සංරචකය (ඩොලර් මිලියන 30ක්) ජල සම්පත් සංවර්ධන අංශය විසින් අධීක්ෂණය කරනු ලබයි.

6.7 නිල්වලා ගඟ සහ මුන්දෙනි ආරු ව්‍යාපෘතිය

- **නිල්වලා ලවණතා බාධකය සහ ගංවතුර අවම කිරීම:** ලවණතා බාධකය නිසා ඇති වූ ගැටලුවලට විසඳුම් සෙවීමේ උපදේශන කොන්ත්‍රාත්තුව (රුපියල් මිලියන 3.9) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL) සමඟ 2026 ජූලි 13 දින අත්සන් කරන ලදී. 2026 අයවැය මඟින් වෙන් කරන ලද රුපියල් මිලියන 1,000ක ප්‍රතිපාදන යටතේ නිල්වලා ගඟේ ගංවතුර අවම කිරීමේ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී.

- **මුන්දෙනි ආරු ගංගා ද්‍රෝණි සංවර්ධන ව්‍යාපෘතිය:** ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය (AFD) මෙම ව්‍යාපෘතිය ඔවුන්ගේ අනාගත මූල්‍ය ආධාර ලැයිස්තුවෙන් ඉවත් කර ඇති බව 2026දී දැනුම් දුන්නා. ඒ අනුව, විකල්ප මූල්‍ය පහසුකම් ලබාගැනීම සඳහා ලෝක බැංකුව සමඟ පළමු සාකච්ඡාව මේ වන විට පවත්වා තිබෙනවා. ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු 4වන වගන්තිය දක්වා ඉදිරියට ගෙන ගොස් ඇති අතර පාරිසරික අනුමැතිය (EIA) ලබාගෙන ඇත.

7. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ක්‍රියාත්මක වන වාරි ව්‍යාපෘති

- **කිවුල් ඔය සහ මාදුරු ඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘති:** මේ සඳහා ප්‍රාග්ධන ප්‍රතිපාදන රුපියල් මිලියන 3,500ක් වෙන් කර ඇති අතර, අදාළ කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

- **"වැවට සවියක්" වැඩසටහන:** මහවැලි කලාප ආශ්‍රිතව ඇති කුඩා වැව් 741 අතුරින් තෝරාගත් වැව් 38ක පුනරුත්ථාපන කටයුතු සිදු කෙරේ.

8. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ සුළු වාරිමාර්ග ව්‍යාපෘති 316ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රුපියල් මිලියන 976.86ක ප්‍රතිපාදන වෙන් කර ඇත.

ඉන් අත්හැර දමන ලද, ක්‍රියාකාරී සහ ආදර්ශ වැව් 96ක් ප්‍රතිසංස්කරණය සඳහා රුපියල් මිලියන 560.81ක්, අමුණු 63ක් ප්‍රතිසංස්කරණය සඳහා රුපියල් මිලියන 134.15ක් සහ ඇළ මාර්ග 157ක් ප්‍රතිසංස්කරණය සඳහා රුපියල් මිලියන 281.90ක් යොදවා ඇත. ඊට අමතරව, කෘෂි මාර්ග 130ක් ප්‍රතිසංස්කරණය සඳහා රුපියල් මිලියන 296.45ක් වෙන් කර ඇත.

මෙම ප්‍රතිසංස්කරණ මඟින් ගොවි ජනතාවගේ වාරි ජල පහසුකම් වැඩිදියුණු කිරීමටත්, ගොවි නිෂ්පාදන ප්‍රවාහනය පහසු කිරීමටත් අපේක්ෂා කරමු.

9. ඉදිරි ක්‍රියාමාර්ග

ගරු කථානායකතුමනි, ඉහත ප්‍රගතිය පවත්වා ගෙන යාමට සහ ඉතිරි කටයුතු කඩිනමින් නිම කිරීමට අප අමාත්‍යාංශය පහත පියවර ගන්නවා:

- CERC යටතේ ක්‍රියාත්මක "දිවිවා" ප්‍රතිසංස්කරණ 2026 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමටත්, ඉන් පසු ඉතිරි වන වැඩ සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇති පරිදි 2027දී රජයේ අරමුදල් යොදා සම්පූර්ණ කිරීමටත් කටයුතු කරනවා.

- "දිවිවා" ප්‍රතිසංස්කරණ සඳහා 2027 වසරේදී වාරිමාර්ග දෙපාර්තමේන්තුවට තවත් ප්‍රතිපාදන ලබා දෙනු ඇත.

- ADB හදිසි ආධාර ණය යටතේ ප්‍රසම්පාදන පැකේජ හතර සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමටත්, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකවලට නව කාර්ය මණ්ඩලය බඳවා ගැනීමටත් කටයුතු කරමින් සිටිනවා.

- උතුරු මැද පළාත් මහ ඇළ ව්‍යාපෘතියේ UEC-ICB-2A පැකේජය 2026 දෙසැම්බර් 10 වන විට නිම කිරීමටත්, NCPCP-3,4,5 පැකේජවල ප්‍රසම්පාදන කටයුතු අවසන් කිරීමටත් නියමිතයි. තවද Output 2 සඳහා ADB, OPEC, IFAD සහ රජයේ සම-මූල්‍යකරණය ලබා ගැනීමට කටයුතු කරනවා.

- ඒරුවැව - මහකනදරාව ව්‍යාපෘතිය 2026 දෙසැම්බර් 31 වන විටත්, උමා ඔය පහළ නිමින ව්‍යාපෘතිය 2027 ජූලි 31 වන විටත්, ඇල්ලේවැව සහ යාන් ඔය ව්‍යාපෘති 2027 දෙසැම්බර් 31 වන විටත් අවසන් කිරීමට අපේක්ෂිතයි.

මුන්දෙනි ආරු ව්‍යාපෘතිය සඳහා විකල්ප මූල්‍ය පහසුකම් ලෝක බැංකුව හරහා ලබා ගැනීමට සාකච්ඡා ඉදිරියට ගෙන යනවා.

- 2027 වර්ෂය සඳහා ප්‍රධාන ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු කර ඇති ප්‍රතිපාදන ඇමුණුම B හි දක්වා ඇත.

ගරු කථානායකතුමනි, ගොවි ජනතාවගේ ජීවනෝපාය සුරැකීමටත්, රටේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීමටත් අවශ්‍ය වාරි පද්ධති යථා තත්ත්වයට පත් කර ශක්තිමත් කිරීම අපගේ කැපවීමයි. මෙම ප්‍රකාශය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාටත්, ගරු සභාවටත් මාගේ ස්තූතිය පුද කරමි.

[ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා]

ඇමුණුම A – වාරිමාර්ග දෙපාර්තමේන්තුව: දිස්ත්‍රික්ක අනුව දිට්වා ප්‍රතිසංස්කරණ (2026 සැප්තැම්බර් දක්වා)

දිස්ත්‍රික්කය	ව්‍යාපෘති ගණන	2026 ප්‍රතිපාදන (රු. මිලියන)	2026 මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන)	භෞතික ප්‍රගතිය
අම්පාර	43	238.57	—	5%
අනුරාධපුර	143	841.83	119.61	21%
බදුල්ල	89	729.83	215.98	34%
මඩකලපුව	32	165.10	82.17	75%
රත්නපුර	1	2.00	1.44	30%
හම්බන්තොට	33	532.55	88.06	43%
මහනුවර	20	94.41	6.09	43%
කෑගල්ල	2	18.00	5.41	50%
මාතලේ	29	58.51	12.48	58%
නුවරඑළිය	25	98.75	15.68	21%
කුරුණෑගල	54	210.32	10.00	27%
මොණරාගල	15	29.36	0.03	67%
පොළොන්නරුව	20	335.30	71.94	22%
පුත්තලම	19	114.19	3.07	7%
ත්‍රිකුණාමලය	98	2,009.64	832.41	63%
මන්නාරම	30	194.50	25.10	24%
වවුනියාව	7	9.50	0.01	7%
එකතුව	660	5,682.36	1,489.46	

ඇමුණුම B – ප්‍රධාන ව්‍යාපෘති සාරාංශය (රු. මිලියන)

ව්‍යාපෘතිය	ඇස්තමේන්තුව	2026 ප්‍රතිපාදන	මූල්‍ය ප්‍රගතිය	භෞතික ප්‍රගතිය	2027 ඇස්තමේන්තුව	අවසන් කිරීමට අපේක්ෂිත දිනය
වාරිමඟිම අපේ උරුමය	9,250	1,000	99.12	30%	2,500	2029
MWSIP (අදියර II)	160,950	22,300	11,098	49%	19,500	2031
IWWRMP	20,308.70	—	1,526.49	62.5%	5,010	2027.10
CResMPA	15,567	9,050	2,735.87	64.5%	—	2026.12.31
නකල්ස් ව්‍යාපෘතිය	14,710.50	3,250	951.40	18.2%	4,300	2029
ඇල්ලේවැව ජලාශය	2,950	690	1,088.22	66.95%	900	2027.12.31
පහළ මල්වතුඔය	47,180	4,610	2,852.68	13.82%	5,000	2030.12.31
උමා ඔය පහළ නිම්නය	22,017	2,175	20,109.99	92.25%	750	2027.07.31
යාන්ඔය ජලාශය	48,355.3	1,700	44,513.32	99.6%	—	2026.12.31
ඒරුවැව – මහකනදරාව	2,000	500	145.28	96.09%	—	2026.12.31

ඇමුණුම C – IWWRMP

C.1 කුඩා පරිමාණ වාරිමාර්ග ප්‍රතිසංස්කරණ වැඩසටහන

ආයතනය	දිස්ත්‍රික්ක	ව්‍යාපෘති	පිරිවැය (රු.මි.)	අවසන්	අවසන් ව්‍යාපෘතිවල වටිනාකම් (රු.මි.)
වාරිමාර්ග දෙපාර්තමේන්තුව	12	24	4,000	8	1,150
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය	9	25	3,300	5	1,750
උතුරු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව	3	15	3,550	7	1,400
නැගෙනහිර පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව	3	15	1,200	4	225
ජල සම්පත් මණ්ඩලය	4	4	254	1	30
එකතුව	—	83	12,304	25	4,555

ඇමුණුම D – CResMPA සංරචකය 04: දිස්ත්‍රික්ක අනුව ප්‍රගතිය (රු. මිලියන)

දිස්ත්‍රික්කය	වෙන්කළ මුදල	පැකේජ	ඇස්කමේන්තුව	ප්‍රදානය කළ	ප්‍රදානය කළ මුදල	වියදම	භෞතික ප්‍රගතිය
අම්පාර	123.99	1	59.21	1	58.007	15.48	0%
අනුරාධපුර	569.09	4	552.89	4	547.818	278.62	72%
මඩකලපුව	99.30	1	83.30	1	67.851	11.44	65%
කොළඹ	50.10	5	13.66	5	12.751	3.81	77%
කළුතර	2.25	1	2.25	1	1.986	0.58	1%
හම්බන්තොට	490.00	2	330.97	2	281.455	89.58	50%
කුරුණෑගල	149.40	0	0.00	0	0.000	0.00	—
මන්නාරම	77.69	5	82.99	4	71.975	4.88	59%
වවුනියාව	161.17	2	216.52	1	63.365	9.20	20%
මොළුන්තරුව	225.00	2	85.43	2	95.632	25.47	8%
පුත්තලම	230.00	2	92.58	2	93.914	15.17	39%
ත්‍රිකුණාමලය	170.00	4	198.93	4	198.928	83.10	65%
එකතුව	2,347.98	29	1,718.72	27	1,493.680	537.33	55%

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟ අමාත්‍යාංශ නිවේදනය, ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න අමාත්‍යතුමා. 2026.09.25වැනි දින ගරු ඡාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා විසින් ස්ථාවර නියෝග 27 (2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම.

උතුරු සහ නැඟෙනහිර පළාත්වල පළාත් පාලන ආයතනයන්හි පවතින මූල්‍ය, යටිතල පහසුකම් සහ පරිපාලනමය ගැටලු: රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගේ ප්‍රකාශය

வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களிலுள்ள உள்ளூராட்சி மன்றங்களில் நிலவும் நிதி, உட்கட்டமைப்பு மற்றும் நிருவாகச் சிக்கல்கள்: பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரினது கூற்று

FINANCIAL, INFRASTRUCTURE AND ADMINISTRATIVE ISSUES OF LOCAL AUTHORITIES IN NORTHERN AND EASTERN PROVINCES: STATEMENT BY MINISTER OF PUBLIC ADMINISTRATION, PROVINCIAL COUNCILS AND LOCAL GOVERNMENT

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, 2026.09.25වැනි දින ගරු ඡාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට මා පිළිතුරු ලබා දෙනවා.

විශේෂයෙන්ම උතුර සහ නැඟෙනහිර පළාත් ප්‍රධාන ලේකම්වරුන් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු පදනම් කරගෙන තමයි මම මේ පිළිතුර ඉදිරිපත් කරන්නේ.

පළාත් පාලන ආයතන යනු කසළ එකතු කිරීම සහ මූලික සේවා සැපයීම සඳහාම පමණක් ඇති ආයතන නොවේ. මහනගර සභා -MC-, නගර සභා -UC- සහ ප්‍රාදේශීය සභා -PS- යනු නියාමන සහ අනු නීති -By-law- සම්පාදනය කිරීමේ වගකීම් සහිත, තේරී පත් වූ ප්‍රජාතන්ත්‍රවාදී ආයතන වේ. කෙසේ වෙතත්, ඒවායේ බලතල සහ ආදායම් මාර්ග ප්‍රමාණවත් ලෙස යාවත්කාලීන වී නොමැති අතර, බොහෝ සභාවන් බරපතළ මූල්‍ය හා යටිතල පහසුකම් සීමාවන්ට මුහුණ දෙයි.

ගරු මන්ත්‍රීතුමා ඒ අනුව තමයි පහත ප්‍රශ්න අසා තිබෙන්නේ.

1. උතුරු සහ නැඟෙනහිර පළාත්වල මහා නගර සභා (MC), නගර සභා (UC) සහ ප්‍රාදේශීය සභා කීයක් ක්‍රියාත්මක වේද? එම එක් එක් ආයතනය කුමන පක්ෂයක් විසින් පරිපාලනය කරනු ලබයිද?

පිළිතුර:

පළාත	මහනගර සභා	නගර සභා	ප්‍රාදේශීය සභා	මුළු ගණන
උතුර	2	4	28	34
නැඟෙනහිර	4	4	37	45

මහනගර සභා ආඥාපනත, නගර සභා ආඥාපනත, ප්‍රාදේශීය සභා පනත සහ පළාත් පාලන මැතිවරණ ඡන්ද විමසීම් ආඥාපනත් ආදියෙහි විධිවිධාන අනුව පළාත් පාලන ආයතන පරිපාලන කටයුතු සිදු කරනු ලබන අතර, ඒ අනුව පක්ෂ හෝ විපක්ෂ යනුවෙන් බෙදීම් සිදු කරමින් පවත්වාගෙන යාමට ප්‍රතිපාදන සලසා නොමැත. කෙසේ වුවත්, උතුරු හා නැඟෙනහිර පළාත්වල පළාත් පාලන ආයතනයන්හි නගරාධිපති, සභාපති අයත් දේශපාලන පක්ෂ පිළිබඳ තොරතුරු ඇමුණුම 01 යටතේ ඉදිරිපත් කරනවා.

2. සභා විසින් ස්වයං ආදායමින් මූල්‍යනය කර ගත යුතු වැටුප් ප්‍රතිශතය කුමක්ද? 2029 දක්වා යෝජිත වැඩි කිරීම් මොනවාද? මෙය (IMF) අවශ්‍යතාවක්ද?

පිළිතුර:

පළාත් සභා යටතේ ඇති පළාත් පාලන ආයතනවල සිටින නිලධාරීන්ගේ වැටුප් ගෙවීම සඳහා ජාතික අය වැයෙන්

[ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා]

ප්‍රතිපාදන වෙන් කරනු ලබන්නේ පළාත් සභා වෙත වන අතර මුදල් කොමිෂන් සභාව සෘජුවම ලබා දෙන නිර්දේශ මත පදනම්ව ආසන්න වශයෙන් එම නිර්දේශවලින් සියයට 85ක් පමණ ආවරණය කරමින් ජාතික අය වැය ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන සලසා දෙනු ලැබේ.

2024 වසරේ අයවැය යෝජනා අනුව, 2024 වසරේ මහ නගර සභාවල නිලධාරීන්ට වැටුප් ගෙවීම සඳහා සියයට 80ක ප්‍රතිපාදන පමණක් ලබා දීමටත්, එය තවදුරටත් 2025 වසරේදී සීමා කිරීමටත් අනුමත වූ අතර, පළාත් පාලන ආයතන වසර 5ක් තුළ ස්වයං මූල්‍යනය කිරීමේ අරමුණින් මෙම පියවර හඳුන්වා දී ඇත. ඒ අනුව ජාතික අය වැයෙන් මහා නගර සභාවල නිලධාරීන්ට වැටුප් ගෙවීම සඳහා ලබා දෙන මුදල 2024 වසරේ සියයට 20කින්ද, 2025 සහ 2026 වසරවලදී සියයට 40කින්ද සීමා කරන ලද අතර, 2025 සහ 2026 වසරවලදී නගර සභා සහ ප්‍රාදේශීය සභාවල නිලධාරීන්ට වැටුප් ගෙවීම සඳහා ලබා දෙන ප්‍රතිපාදන සියයට 20කින් සීමා කරමින් ලබා දී ඇත.

ඒ අනුව පළාත් සභා විසින් අදාළ ප්‍රතිපාදන සීමා කිරීම් සහිතව, පළාත් පාලන ආයතන වෙත නිදහස් කර ඇති අතර, ජාතික අය වැයෙන් 2026 වසරේදී මහා නගර සභාවල නිලධාරීන් සඳහා වැටුප් ගෙවීමට සීමා කර ඇති සියයට 40ක ප්‍රතිපාදන ප්‍රමාණය සහ නගර සභා සහ ප්‍රාදේශීය සභාවලට සීමා කර ඇති සියයට 20ක ප්‍රතිපාදන ප්‍රමාණය එකී පළාත් පාලන ආයතනවලින් දරාගත යුතු වේ.

තවද අමප/25/2076/816/089 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව, 2025 නොවැම්බර් 10 දින ගන්නා ලද තීරණය මත පදනම්ව, පළාත් පාලන ආයතන වෙත ලබා දෙන වැටුප් ප්‍රතිපූර්ණ ප්‍රදාන පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා පත් කරන ලද කමිටුව විසින් සකස් කරනු ලැබූ කමිටු වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අතර, ඒ සඳහා ලැබෙන තීරණය අනුව පළාත් පාලන ආයතනවලට ජාතික අයවැයෙන් ලබා දෙන ප්‍රතිපාදන ප්‍රතිශත ඉදිරියේදී සංශෝධනය වීමට නියමිත වේ. මෙම පියවර ජාත්‍යන්තර මූල්‍ය අරමුදල -IMF- යටතේ ඇති නිශ්චිත කොන්දේසි හෝ කැපවීම් නොවේ. ඒ අනුව ඉදිරියේදී මෙම ප්‍රතිශත සංශෝධනය වීමට නියමිතයි.

3. 2025 සහ 2026 වර්ෂවල එක් එක් පළාතට, උතුරු සහ නැඟෙනහිර එක් එක් දිස්ත්‍රික්කයට සහ එක් එක් පළාත් පාලන ආයතනයට මධ්‍යම සහ පළාත් සංවර්ධන වෙන් කිරීම්වලින් ලැබුණු මුදල සහ ප්‍රතිශතය කුමක්ද?

පිළිතුර:

2025 සහ 2026 වර්ෂවලදී උතුරු හා නැඟෙනහිර පළාත්වලට සංවර්ධන කටයුතු සඳහා මුදල් කොමිෂන් සභාව විසින් ප්‍රතිපාදන වෙන් කර ඇති ප්‍රමාණය සහ ප්‍රතිශතය පහත පරිදි වේ.

2025

පළාත	මුදල් නිදහස් කර ඇති ප්‍රමාණය රු.(මිලියන)	නිකුත් කිරීමේ ප්‍රතිශතය %
උතුරු පළාත	9155.00	12
නැඟෙනහිර පළාත	8720.23	11
එකතුව	17875.23	

2026

පළාත	මුදල් නිදහස් කර ඇති ප්‍රමාණය රු. (මිලියන)	නිකුත් කිරීමේ ප්‍රතිශතය %
උතුරු පළාත	10545.66	12
නැඟෙනහිර පළාත	10609.21	12
එකතුව	21154.89	

තවද, උතුරු හා නැඟෙනහිර පළාත්වලට අයත් දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට වෙන් වී ඇති ප්‍රතිපාදන ප්‍රමාණය ඇමුණුම 02 මඟින් ඉදිරිපත් කරනු ලැබේ. ඒ අනුව මුදල් කොමිෂන් සභාවේ නිර්දේශය අනුව, ජාතික අයවැයෙන් පළාත් සභා සඳහා වෙන් කරන ලද මුදලින් උතුරු හා නැඟෙනහිර පළාත්වල පළාත් පාලන ආයතනවලට ඇමුණුම 03 පරිදි මුදල් වෙන් කර ඇත. මීට අමතරව මධ්‍යම රජයේ අමාත්‍යාංශවලට වෙන් වී ඇති ප්‍රතිපාදන මඟින්ද ඇමුණුම 04හි දැක්වෙන පරිදි ප්‍රතිපාදන උතුරු පළාතේ පළාත් පාලන ආයතන වෙත ලබා දී ඇත.

4. වර්ෂ පහකටත් වැඩි කාලයක් මුළුල්ලේ එක් එක් සභාවට මූලාශ්‍ර වශයෙන් සහ වටිනාකම් වශයෙන් ලැබුණු වාහන සහ යන්ත්‍ර මොනවාද?

පිළිතුර:

පසුගිය වසර පහ තුළ උතුරු සහ නැඟෙනහිර පළාත් සඳහා ලබා දී ඇති වාහන සහ යන්ත්‍රෝපකරණ පිළිබඳ තොරතුරු ඇමුණුම 05 මඟින් ඉදිරිපත් කරමි. තවද, පළාත් පාලන ආයතන සඳහා උපයෝගිතා වාහන ලබා දීමට මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් 2026 වර්ෂයේදී ඉදිරි කටයුතු ආරම්භ කර ඇති අතර, එහි පළමු අදියර යටතේ මෝටර් ග්‍රේඩර් රථ සහ කම්පැක්ටර් රථ ලබා දීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඇත. ඉන් උතුරු සහ නැඟෙනහිර පළාත්වලට අවශ්‍යතාව අනුව වෙන් කිරීමට පියවර ගන්නවා.

5. 2025-2026 කාල පරිච්ඡේදය තුළදී එක් එක් සභාව විසින් වරිපනම් බදු, කුලී බලපත්‍ර ගාස්තු, අවසර පත්‍ර ගාස්තු සහ දඩ ලෙස කොපමණ මුදලක් තක්සේරු කරන ලද්දේ ද සහ රැස් කරනු ලැබුවේද, ඒවායින් කුමන ප්‍රතිශතයක් හිඟව පවතී ද සහ මහා පරිමාණයේ ගෙවීම් පැහැර හරින්නන් සඳහා පවතින රජයේ නීතිමය සහාය කුමක්ද?

පිළිතුර:

2025 සහ 2026 වර්ෂවලදී උතුරු සහ නැඟෙනහිර පළාත්වල පළාත් පාලන ආයතනවල වරිපනම් බදු, කුලී බලපත්‍ර ගාස්තු, අවසර පත්‍ර ගාස්තු සහ දඩ මුදල් ආදියෙහි තක්සේරු කරන ලද මුදල, එකතු කරන ලද මුදල හා අය වීමට ඇති හිඟ ප්‍රතිශතය ඇමුණුම 06 මඟින් ඉදිරිපත් කර ඇත.

පළාත් පාලන ආයතන ස්වාධීන ආයතන වන බැවින් අදාළ අණ පනත්වලින් ගෙවීම් පැහැර හරින්නන් සඳහා ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳ ආවරණය සැලසී ඇති අතර, රාජ්‍ය නීතිමය සහාය ලබා දීමට විධිවිධාන සැලසී නොමැත.

6. මහ නගර සභාවක්, නගර සභාවක් සහ ප්‍රාදේශීය සභාවක් විසින් පැනවිය හැකි වරිපනම් බදු, බලපත්‍ර ගාස්තු, අවසර පත්‍ර ගාස්තු, වීදි වෙළෙඳාම සහ වෙළෙඳ පොළ ගාස්තු, දඩ සහ වෙනත් අය කිරීම්වල උපරිම හා අවම සීමා මොනවාද සහ මෙම එක් එක් අය කිරීම් අවසන් වරට සංශෝධනය කරන ලද්දේ කවදාද? මෙම එක් එක් වර්ගයක් සඳහා

පවතින ඉහළම දඩය කුමක්ද සහ මෙම මුදල නවීකරණය කිරීමට සහ කලින් කලට යාවත්කාලීන කිරීමට යෝජනා කරන සංශෝධන මොනවාද?

පිළිතුර:

උතුරු පළාත් සභාව විසින් අනුමත කර ඇති අනුනීතිවලට අනුව පළාත් පාලන ආයතන මට්ටමින් එකී සභා විසින් ලබා දෙන සේවාවන්ට අය කරන ගාස්තු තීරණය කරනු ලබයි.

නැඟෙනහිර පළාතේ පළාත් පාලන ආයතන මට්ටමින් අය කරන උපරිම සහ අවම වරිපනම් ගාස්තු හා ඒවා අවසාන වරට සංශෝධනය යාවත්කාලීන කර ඇති වර්ෂය ඇමුණුම 07 මඟින් ඉදිරිපත් කරමි. තවද මහ නගර සභා, නගර සභා ආඥා පනත් හා ප්‍රාදේශීය සභා පනත අනුව නියම කර ඇති උපරිම හා අවම වෙළෙඳ බලපත්‍ර ගාස්තු පහත පරිදි වේ.

පළාත් පාලන ආයතනය	උපරිමය (රුපියල්)	අවමය (රුපියල්)
ප්‍රාදේශීය සභාව	1,000.00	500.00
නගර සභාව	1,000.00	500.00
මහ නගර සභාව	5,000.00	2,000.00

තවද, බලපත්‍ර ගාස්තු, සහතික කිරීමේ ගාස්තු හා දඩ අය කිරීම්වලට අදාළව මහා නගර සභා ආඥා පනත, නගර සභා ආඥාපනත සහ ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීමට අදාළ සංශෝධන පනත් කෙටුම්පත් ඉදිරියේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.

7. ගැසට් කරන ලද සීමාවන් අභිභවමින් සභා විසින් දේපළ තක්සේරු කිරීම්, වරිපනම් එකතු කිරීම් හෝ බලපත්‍ර නිකුත් කරයිද? එසේ නම් එය වළකන්නේ කෙසේද?

පිළිතුර:

නැත. උතුරු හා නැඟෙනහිර පළාත්වල පළාත් පාලන ආයතන විසින් ගැසට් කරන ලද බල ප්‍රදේශ සීමාවලින් ඔබ්බට එවැනි කිසිදු ක්‍රියාවක් සිදු නොකරයි.

8. මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා විසින් වසර දහයක් තුළ බලාත්මක කරන ලද හෝ යාවත්කාලීන කරන ලද අතුරු නීති ගණන කීයද සහ අනුමත කිරීම අවසන් නොකළ ගණන කීයද? තේරා පත් කර ගන්නා ලද පළාත් සභා නොමැතිව ආණ්ඩුකාරවරයාගේ කාර්යභාරය ද ඇතුළුව අතුරු නීති සම්පාදනය, අනුමත කිරීම සහ ගැසට් කිරීම් සඳහා වෙන් වෙන් වශයෙන් අදාළ වන ක්‍රියා පටිපාටි මොනවාද? ඒ සඳහා යෝජනා වන ප්‍රතිසංස්කරණ මොනවාද?

පිළිතුර:

පළාත	පසුගිය වසර දහය තුළ මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා මඟින් අනුමත කර ඇති හෝ යාවත්කාලීන කර ඇති අතුරු ව්‍යවස්ථා ගණන
උතුර	31
නැඟෙනහිර	173

නැඟෙනහිර පළාතේ පළාත් පාලන ආයතනවලට අදාළව අනුමැතිය ලබා දී නොමැති - pending - අනුනීති නොමැත.

උපනීති සම්පාදනය, අදාළ පටිපාටිය විධිමත් කර ගැනීම ඒ ඒ පළාත් පාලන ආයතන සහ පළාත් පාලන කොමසාරිස්/ සහකාර පළාත් පාලන කොමසාරිස් විසින් සිදු කළ යුතු අතර, ඒ අනුව එය සභාවෙන් සභාවට වෙනස් වේ.

තවද, අතුරු ව්‍යවස්ථා සම්පාදනය කිරීමේ පටිපාටි පිළිබඳව නව පනත් සංශෝධනය තුළ නව ප්‍රතිපාදන අන්තර්ගත කර නොමැත.

9. වසර පහක් මුළුල්ලේ උතුරු සහ නැඟෙනහිර එක් එක් පළාත් සභා වෙත LLDF විසින් මූල්‍යනය කරන ලද මුදල කොපමණද, ආදායම් උත්පාදනයෙන් සිදු කරන මූල්‍යනය ව්‍යාප්ත වෙයිද?

පිළිතුර:

දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් පසුගිය වසර 5 තුළ උතුරු හා නැඟෙනහිර පළාත්වල පළාත් පාලන ආයතනවල ව්‍යාපෘති සඳහා ණය ලබා දී ඇති ණය ප්‍රමාණය පිළිබඳ විස්තර ඇමුණුම 08 මඟින් ඉදිරිපත් කරමි.

තවද, උතුරු හා නැඟෙනහිරින් ණය ඉල්ලීම් ඉදිරිපත් වී ඉදිරි කටයුතු කරමින් පවතින ව්‍යාපෘති පිළිබඳ තොරතුරු ඇමුණුම 09 මඟින් ඉදිරිපත් කරමි.

ඇමුණුම් 01 සිට 09 දක්වා **සභාගත*** කරමි.

10. නගර සභා හෝ මහ නගර සභා ලෙස උත්ශ්‍රේණිගත කිරීමට යෝජනා වී ඇති ප්‍රදේශ මොනවාද සහ ඒවායේ තත්ත්වය කුමක්ද?

පිළිතුර:

නගර සභා, මහ නගර සභා බවට සංස්ථාපනය කිරීම සම්බන්ධව උතුර සහ නැඟෙනහිර පළාත්වලින් ඉදිරිපත්ව තිබූ සියලු යෝජනා සලකා බලා, ත්‍රිකුණාමලය සහ වවුනියාව නගර සභා, මහ නගර සභා බවට සංස්ථාපනය කර ඇත. කෙසේ වුවද, ප්‍රාදේශීය සභාවක් නගර සභාවක් බවට සංස්ථාපනයේදී විවිධ පාර්ශ්වවලින් විවිධ යෝජනා ඉදිරිපත්ව ඇතත් එහිදී නගර සභාවක් ලෙසට සංස්ථාපනය නොවී ඉතිරි වන කොටස තවදුරටත් ප්‍රාදේශීය සභාවක් ලෙස පවත්වා ගෙන යෑමේදී එම ආයතනවල මූල්‍ය ස්ථායිතාව පවත්වාගෙන යාමේ ගැටලුවලට මුහුණ පෑමට සිදු වන බැවින් එකී යෝජනා සම්බන්ධව තවදුරටත් අධ්‍යයනය කරමින් පවතී.

11. දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල නගරාධිපතිවරු, සභාපතිවරු, උප නගරාධිපති, උප සභාපති සභාගිත්වයෙන් පාලනය කරනු ලබන චක්‍රලේඛය කුමක්ද? ඔවුන් දෙදෙනාම ඊට ඇතුළත් කරනු ලබයිද?

පිළිතුර:

ස්වදේශ කටයුතු චක්‍රලේඛ 03/2025

එකී චක්‍රලේඛය අනුව, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවලට පළාත් පාලන ආයතන ප්‍රධානීන් සහ නියෝජ්‍ය ප්‍රධානීන් - නගරාධිපතිවරුන්, සභාපතිවරුන් සහ උපසභාපතිවරුන් - ස්ථිර සාමාජිකයන් වේ. තවද, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලට පළාත් පාලන ආයතනවල නගරාධිපති/ උප නගරාධිපති/ සභාපති/ උප සභාපති සහ නගරාධිපති/ සභාපති ධුරය හිමි කණ්ඩායමට අයත් නොවන සභාව නියෝජනය කරන නියෝජිතයන් දෙදෙනෙකු ඔවුන්ගේ එකඟතාව පරිදි සභාගී විය හැකිය.

12. පළාත් පාලන ආයතනයන්හි ව්‍යාපෘති හඳුනා ගැනීම සහ ප්‍රමුඛතාගත කිරීමට ප්‍රජාශක්ති ව්‍යූහයන්ට අවසර දෙනු ලබන නෛතික පදනම කුමක්ද? තේරා පත් කර ගන්නා ලද සභා මහ හැරීමට ලක් නොවන බවට සහතික විය හැකිද?

** පුස්තකාලයේ තබා ඇත.*

** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

[ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා]

පිළිතුර:

ජනාධිපති ලේකම්වරයාගේ අංක PS/DASA/Circular/07/2025 දරන 2025.08.22 දිනැති චක්‍රලේඛය හා එයට සංශෝධනයක් ලෙස නිකුත් කර ඇති 2026.04.22 දිනැති අංක PS/DASA/Circular/07/2025 (1) දරන චක්‍රලේඛය මඟින් ස්ථාපනය කර ඇති ප්‍රජා සංවර්ධන සභාවේ කාර්යභාරය වන්නේ ජනතාව මුහුණ දෙන ගැටලු සම්බන්ධයෙන් යෝජනා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම පමණක් වන අතර, ප්‍රජා සංවර්ධන සභාව වෙත කිසිදු ක්‍රියාත්මක කිරීමේ බලයක් පවරා නොමැත. ප්‍රජා සංවර්ධන සභාව මඟින් හඳුනා ගනු ලබන සෑම ව්‍යාපෘතියක්ම ක්‍රියාත්මක කිරීම ඒ ඒ අදාළ ආයතන මඟින් සිදු කරනු ලබන අතර, ඒ අනුව පළාත් පාලන ආයතන වෙත පැවරී ඇති බලතලවලට එමඟින් බලපෑමක් සිදු නොවේ.

13. ප්‍රතිසංස්කරණ මඟින් ව්‍යවස්ථාදායක, නියාමන, මූල්‍ය සහ පරිපාලන ස්වාධීනත්වය ශක්තිමත් කරනු ලබයිද?

පිළිතුර:

ඔව්. අනිවාර්යයෙන්ම.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු ඇමතිතුමනි, සවිස්තරාත්මක පිළිතුරක් ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ගරු කථානායකතුමනි, කාලය පිළිබඳව ගැටලුවක් තිබෙන නිසා, පැහැදිලි කරවා ගැනීම මම විනාඩියකින් පමණ අවසන් කරන්නම්.

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා සඳහන් කළා වාගේම පළාත් පාලන ආයතන කුණු අයින් කරන සේවාව පමණක් ලබා දෙන ආයතන බවට පත් නොවී තිබෙන්න නම් ඔබතුමා සඳහන් කළ මේ යම් යම් ගැටලු නිරාකරණය කර ගන්න අපට සිදු වෙනවා. මොකද, එහෙම නැත්නම් පළාත් පාලන ආයතන කුණු ඉවත් කරන ආයතන විතරක් බවට පත් වෙනවා. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, අය වැය විවාදය පැවැත්වෙන කාල සීමාවේදී ඔබතුමාට කාලය තිබෙනවා නම් ඔබතුමාගේ විෂයය සම්බන්ධයෙන් වූ විවාදයෙන් පසුව එක් එක් දිස්ත්‍රික්කවල සිටින ප්‍රාදේශීය සභාවල සභාපතිවරුන් සහ එම කණ්ඩායම් කොළඹට කැඳවා අපට සාකච්ඡාවක් ලබා දෙන්න කියලා. එහෙම කරන්න පුළුවන් නම්, එම ආයතනවල තිබෙන ගැටලු නිරාකරණය කර ගන්න අපට පුළුවන්. මොකද, ප්‍රාදේශීය සභා සහ නගර සභාවල අණ පනත් pass කිරීමේදී ගැටලු තිබෙනවා. ඔබතුමා දන්නවා පළාත් සභාවේ අනුමැතිය නැතිව මහ නගර සභාවක Act එකක් pass කරන්න බැරි බව. ප්‍රාදේශීය සභාවට අදාළව නම් Governorට පුළුවන්. මහ නගර සභාවේ එහෙම බැහැ. ඒ වාගේ විශාල ගැටලු රාශියක් තිබෙනවා. ප්‍රාදේශීය සභාවකින් රුපියල් 1,000ක, රුපියල් 500ක වාගේ පොඩි fine එකක් ගහලා ඒකෙන් ඒ ආයතනයට ලාභයක් සොයා ගන්නත් බැහැ. නිලධාරීන්ගේ පඩි ගෙවීවාට පසුව මාසය අන්තිමට සභාවෙන් කරන්න පුළුවන් සංවර්ධනයකුත් නැහැ. එම නිසා ගරු ඇමතිතුමනි, අපේ සභාවල කට්ටිය කොළඹට ගෙන්වා රැස්වීමක් පවත්වන්න කියා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මොකද, එහෙම නැත්නම් මේවා නිරාකරණය කර ගන්න බැහැ.

ගරු කථානායකතුමනි, අනික් කාරණය මේකයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, දැන් අවසන් කරන්න.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු ඇමතිතුමනි, සභා අතරේ එහෙම ගැටලුවක් නැහැ කියලා ඔබතුමා කිව්වා. හැබැයි, කාත්තන්කුඩි නගර සභාව සහ සභා අතර එහෙම ගැටලුවක් තිබෙනවා කියන කාරණයත් මම කියන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා, ඉතා කෙටියෙන් පිළිතුර දෙන්න. මොකද, කාලය ඉතාම වැදගත්. අනවශ්‍ය විධියට ගොඩක් වෙලාව ගන්නා බව පෙනෙනවා.

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු කථානායකතුමනි, එතුමා ඉල්ලපු ඒ සාකච්ඡාව සඳහා අවස්ථාව ලබා දෙන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී යෝජනා.

ගරු සභානායකතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, ඊට කලින් ඔබතුමාගේ අවධානය යොමු කරවිය යුතු කාරණයක් තිබෙනවා. අද ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්න පටන් ගත්තේ පෙර වරු 10.40ට පමණ. අද වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නවලින් ප්‍රශ්න 5කට වඩා පිළිතුරු දුන්නෙත් නැහැ. නමුත්, මෙහෙම කාලය ගත්තාම අපි කොහොමද පාර්ලිමේන්තුවේ කටයුතු කරගෙන යන්නේ? ඒ නිසා ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, කරුණාකර කාලය කළමනාකරණය ගැන ලේකම් මණ්ඩලයත් සමඟ කථා කරලා පක්ෂ නායකයන්ට විධිමත් ක්‍රමයක් දැනුම් දෙන්න කියලා. ප්‍රශ්න අහන්න මන්ත්‍රීවරුන්ට අවශ්‍යයි. ඒ වාගේම, ඇමතිවරුන්ටත් වැදගත් ලෙස උත්තර දෙන්න අවශ්‍යයි. මම ඒක පිළිගන්නවා. නමුත්, මේ ඔක්කෝම accommodate කරන්න ඕනෑ. කාලය කළමනාකරණය නොකර මේ සියල්ල කරන්න බැහැ නේ. එහෙම නැතුව කොහොමද පාර්ලිමේන්තුවේ කටයුතු කරගෙන යන්නේ?

ගරු ඇමතිතුමන්ලාටත් මම මතක් කරන්න ඕනෑ, ප්‍රශ්නය කියවීම අවශ්‍ය නැති බව. පිළිතුර ලබා දීමයි වැදගත් වන්නේ. ප්‍රශ්න 13ක් කියවන කොට එතැනටත් විනාඩි 3ක් විතර යනවා නේ, ගරු ඇමතිතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කාලය කළමනාකරණය පිළිබඳව බරපතළ ගැටලු සහගත තත්ත්වයක් තිබෙනවා, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න ඇසීමේදී සහ පිළිතුරු ලබා දීමේදී.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඕකෙන් වෙන්නේ, ගරු මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකම් නැති වීම විතරයි. මට ප්‍රශ්නයක් නැහැ, ඔය කටයුතු හවස 3.00 විතර වන කල් ගියත්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි මේ සම්බන්ධයෙන් එකඟතාවට පත් වුණු පරිදි වැඩ කටයුතු කරමු කියලා මම සියලුදෙනාගෙන් ඉල්ලා සිටිනවා.

අපි ඊළඟ කටයුතුවලට යමු, ගරු සභානායකතුමා.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු කථානායකතුමනි, මම ඉල්ලා සිටිනවා, ඇමතිතුමා දුන් පිළිතුරයි, අපේ ප්‍රශ්නයයි සඳහා ගත වූ කාලය සංසන්දනය කරලා බලන්න කියලා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මේ සම්බන්ධව එතුමාට පෞද්ගලිකව ප්‍රශ්නයක් නැහැ නේ, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමනි, ඔබතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ වූ ප්‍රශ්නයට විනාඩි 5යි ගත්තේ. මෙතැන ප්‍රශ්නය මතු වෙලා තිබෙන්නේ, පිළිතුර ලබා දීමයි, ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නවලට වෙනත් දිනවලදී පිළිතුරු ලබා දීමේදියි. එහිදී කාලය පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මේක පොදු ප්‍රශ්නයක්, එක ඇමතිවරයෙකුගේ හෝ මන්ත්‍රීවරයෙකුගේ ප්‍රශ්නයක් නොවෙයි. ඉස්සර නම්, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න දිනපතා අරගෙන නැහැ. දැන් දිනපතා ගන්නවා. එතකොට අපි ඊට ගැළපෙන්න කාලය කළමනාකරණය කරගන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී යෝජනා, ගරු සභානායකතුමා.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මමගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, 2026 නොවැම්බර් 12 බ්‍රහස්පතින්දා පාර්ලිමේන්තුව රැස්වන දිනයක් විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුවේ කටයුතු
பாராளுமன்ற அலுவல்
BUSINESS OF THE PARLIAMENT

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මේ සියල්ලම අය වැය සම්බන්ධව Parliamentary Business Committee එකේදී සම්මත කරපු යෝජනා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(4)හි විධිවිධාන ප්‍රකාරව, 2026 නොවැම්බර් 13 සිකුරාදා, 14 සෙනසුරාදා, 16 සඳුදා, 17 අඟහරුවාදා, 18 බදාදා, 19 බ්‍රහස්පතින්දා සහ 20 සිකුරාදා 'විසර්ජන' පනත් කෙටුම්පත (2027) සලකා බැලීම සඳහා වෙන් කළ දිනයන් විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

II

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2)හි විධිවිධාන ප්‍රකාරව 2026 නොවැම්බර් 14 සෙනසුරාදා සහ 16 සඳුදා සිට 19 බ්‍රහස්පතින්දා දක්වා 'විසර්ජන' පනත් කෙටුම්පත (2027) සලකා බැලීම සඳහා වෙන් කළ දිනයන්හි රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද සහ අ.භා. 1.00 සිට අ.භා. 6.30 දක්වා ද විය යුතු ය. අ.භා. 6.00ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) සහ (6) ඡේදවල විධිවිධාන ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 6.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

III

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2)හි විධිවිධාන ප්‍රකාරව 'විසර්ජන' පනත් කෙටුම්පත (2027) සලකා බැලීම සඳහා වෙන් කළ 2026 නොවැම්බර් 13 සිකුරාදා රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද සහ අ.භා. 1.30 සිට අ.භා. 6.30 දක්වා ද විය යුතු

[ගරු බිමල් රත්නායක මහතා]

ය. අ.භා. 6.00 ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) සහ (6) ඡේදවල විධිවිධාන ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 6.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

IV

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2)හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, 'විසර්ජන' පනත් කෙටුම්පත (2027) සලකා බැලීම සඳහා වෙන් කළ 2026 නොවැම්බර් 20 සිකුරාදා රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.30 සිට අ.භා. 6.00 දක්වා ද විය යුතු ය. අ.භා. 6.00ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, ජලභීතිකා රෝගය තුරන් කිරීමේ සහ සුනඛයන් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත දෙවන වර කියවීම සඳහා ඉදිරිපත් කිරීම.

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න ඇමතිතුමා. You have 13 minutes. Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා, ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, "ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.

අතන්පිරකු, මාණ්පුමිකු සභානායකර් අවර්කළ් අක්කිරාසනත් තිණින්රු අකලවේ, මාණ්පුමිකු සඤ්ජීව රණසිංහර අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. SPEAKER left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.

ජලභීතිකා රෝගය තුරන් කිරීමේ සහ සුනඛයන් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත
விசர்நாய்க்கடி நோயை ஒழித்தல் மற்றும் நாய்களைப் பதிவுசெய்தல் சட்டமூலம்
ELIMINATION OF RABIES AND REGISTRATION OF DOGS BILL

දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

[පූ.භා. 11.53]

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

අද දවසේ අපි විවාදයට ගන්නේ කාලීන වශයෙන් ඉතාම වැදගත් පනත් කෙටුම්පතක්. ජලභීතිකා රෝගය තුරන් කිරීමේ සහ සුනඛයන් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත නමින් තමයි අපි මෙය හඳුන්වන්නේ. මේ පනත් කෙටුම්පතේ විශේෂයෙන් ක්ෂේත්‍ර 6ක් පිළිබඳව අපි අවධානය යොමු කරනවා. ඒ අනුව, සුනඛයන් එන්නත් කිරීම, සුනඛ ගහනය පාලනය කිරීම සහ සුනඛයන් වාණිජ අරමුණු සඳහා අභිජනනය කිරීම නියාමනය කිරීම මඟින් ශ්‍රී ලංකාව තුළ ජලභීතිකා රෝගය තුරන් කිරීම සඳහාත්, සුනඛයන් ලියාපදිංචි කිරීම සඳහාත්, ජලභීතිකා රෝගය තුරන් කිරීමේ ජාතික උපදේශක කමිටුව සහ ජලභීතිකා රෝගය තුරන් කිරීමේ ප්‍රාදේශීය උපදේශක කමිටු පිහිටුවීම සඳහාත්, ජලභීතිකා රෝගය පිළිබඳ ආඥාපනත සහ බල්ලන් ලියාපදිංචි කිරීමේ ආඥාපනත ඉවත් කිරීම සඳහාත් තමයි අපි මේ තුළින් කටයුතු කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ජලභීතිකා රෝගය තුරන් කිරීමේ වුවමනාව වර්තමානය වන විට බරපතළ කාරණයක් හැටියට තිබෙනවා. 2025 වර්ෂයේදී ජලභීතිකා රෝගයෙන් පුද්ගලයින් 14දෙනෙක් මරණයට පත් වෙලා තිබෙනවා. 2025 වර්ෂයේදී පමණක් ජලභීතිකාව නැත්නම් සුනඛ සපා කෑම් නිසා ප්‍රතිකාර කිරීම සඳහාත්, එන්නත් කටයුතු සඳහාත් වැය කර ඇති මුදල රුපියල් මිලියන 655.82ක් වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැනදී විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ, 70 දශකයේ නැත්නම් 80 දශකයේ මුල මේ මරණ සංඛ්‍යාව 300 ඉක්මවා තිබුණු බව. නමුත්, මේ වන විට අපට මේ මරණ සංඛ්‍යාව 20කට - 25කට ආසන්න ප්‍රමාණයකට අඩු කර ගැනීමට හැකි වෙලා තිබෙනවා. අපේ සෞඛ්‍ය අමාත්‍යාංශය, ඒ වාගේම විවිධ ආයතන, ඒ වාගේම අපේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් ඇතුළු කණ්ඩායම් රාශියක් තමන්ගේ දායකත්වය මේ සඳහා ලබා දීලා තිබෙනවා. ඒ නිසා තමයි මේ මරණ සංඛ්‍යාව 300 ඉක්ම වූ සීමාවක සිට 25ක වාගේ සීමාවකට ගන්න අපට පුළුවන් වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ සඳහා දායක වුණු ඒ සියලු කණ්ඩායම්වලට ස්තුතිය පළ කරන්නත් මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

විශේෂයෙන්ම මේ වනකොට අපි දන්නවා, සුනඛයන් එන්නත් කිරීමේ ක්‍රියාවලියේදී යම් යම් ගැටලු පැන නැඟිලා තිබෙන බව. අපට වීදි සුනඛයන් හෝ ගෘහස්ථ සුනඛයන් එන්නත් කිරීමට ප්‍රමාණවත් තරම් අවස්ථාව ලැබෙනවාද කියන ප්‍රශ්නය අප ඉදිරියේ තිබෙනවා. ඒ නිසා මේ කටයුතු විධිමත් කිරීමේදී සතුන් ඇති කරන, විශේෂයෙන් සුනඛයන් ඇති කරන පුද්ගලයින්ට වාගේම පළාත් පාලන ආයතනවලටත් විශාල වගකීමක් පැවරෙනවා. ඒ පැවරෙන වගකීම හරියටම නිශ්චිත කිරීම තමයි මේ පනතේ එක අරමුණක් වන්නේ.

ඒ අනුව මෙහි පළමු කොටස හැටියට තිබෙන්නේ ජලභීතිකා රෝගයට එරෙහිව එන්නත් කිරීම සහ සුනඛයන් ලියාපදිංචි කිරීම. සුනඛයන් ලියාපදිංචි කිරීමේදී මුල්ම වගකීම පැවරෙන්නේ අදාළ බල ප්‍රදේශයේ පළාත් පාලන ආයතනවලට. තමන්ගේ බල ප්‍රදේශය තුළ සිටින සුනඛයන් වාර්ෂිකව එන්නත් කරලා තිබෙනවාද සහ සුනඛයන් සම්බන්ධ වෙනත් කටයුතු පිළිබඳ වගකීම පළාත් පාලන ආයතනවලට නිශ්චිතව භිමිවනවා. ඒ වාගේම තමයි වයස සති හයකට වැඩි සුනඛයෙකුගේ අයිතිකරු විසින් ඒ සුනඛයාට අදාළව ජලභීතිකා එන්නත ලබා දීම සහ අනෙකුත් කටයුතු සිදු කිරීමේ වගකීම මේ පනත මඟින් අවධාරණය කරලා තිබෙනවා. ඒ වාගේම සුනඛයන් එන්නත් කිරීමේ වගකීම සම්බන්ධව යම් යම් මතභේද තවමත් පවතින නිසා අපි කල්පනා කළා, අද දවසේ මේ විවාදය පවත්වා, අද දවසේ ගරු මන්ත්‍රීතුමන්ලා විසින් ඉදිරිපත් කරන අදහසුත් සැලකිල්ලට ගනිමින් සහ මේ ක්ෂේත්‍රයට සම්බන්ධ විවිධ වෙනත් පාර්ශ්ව විසින් ඉදිරිපත් කරන අදහසුත් සමාලෝචනය කරගෙන මේ පනත් කෙටුම්පත සම්මත කර ගැනීම වෙනත් දිනයක සිදු කිරීමට. ඒ නිසා අද දවසේ සිදු කෙරෙන්නේ විවාදය පමණයි.

එතකොට මේ ගෙන එන නව පනත අනුව පළාත් පාලන ආයතනයක වාගේම ඒ සතුන් ඇති කරන කණ්ඩායම්වලට, නිවැසියන්ට පැවරෙන වගකීම් අවධාරණය කරලා තිබෙනවා. ඒ අවධාරණය කිරීමේදී සුනඛයන් ලියාපදිංචි කිරීමේ සහතිකයක් අවශ්‍ය වනවා. ඒ ලියාපදිංචි කිරීමේ සහතිකය සම්බන්ධයෙනුත් නැති බිල්ලෙක් මවාපාන්න සමහර කණ්ඩායම් කටයුතු කර තිබුණු බව අපි දැක්කා, බලු බද්දක් අය කරන්න යනවා කියලා. මෙහි තිබෙන්නේ ඇත්තටම එහෙම අවශ්‍යතාවක් නොවෙයි. අපි දන්නවා, 1848දී ටොරින්ටන් ආණ්ඩුකාරවරයා බලු බද්දක් පැනෙව්වේ ජලභීතිකා රෝගය තුරන් කිරීමේ අරමුණෙන් නොවෙයි, ආණ්ඩුවට ආදායම් උපයා ගැනීමේ අරමුණෙන් කියන එක. ඒ අවස්ථාවේදී බලු බද්ද විතරක් නොවෙයි, තව බදු රාශියක් එක්ක එකතු වෙලායි ඒ බද්ද ආවේ. ඒ නිසා ටොරින්ටන්ගේ බලු බද්දට කිසිසේත්ම මෙක සමාන වන්නේ නැහැ කියන එක ඒ පිළිබඳව අදහස් දක්වා තිබුණු පාර්ශ්වවලට මම කියන්න කැමැතියි.

මේ පනතෙන් සුනඛයන් එන්නත්කරණය පිළිබඳ වගකීම පවරනවා වාගේම සුනඛ ගහනය පාලනය කිරීමේ ක්‍රියාවලියකුත් සිද්ධ වනවා. සුනඛ ගහනය පාලනය කිරීමේ ක්‍රියාවලියේදී පළාත් පාලන ආයතනවලට වාගේම තවත් ආයතන කිහිපයකටම ඒ වගකීම පැවරෙනවා. විශේෂයෙන්ම සුනඛයන් වන්ධ්‍යාකරණය හෝ පුම්ංගහරණය කිරීමේදී පශු වෛද්‍යවරුන් සහ ඒ හා අත්දැකීම් තිබෙන තවත් පාර්ශ්ව සම්බන්ධ කරගැනීමේ අවශ්‍යතාවක් තිබෙනවා. ඒ නිසා මේ පනත් කෙටුම්පතට යම් සංශෝධන ටිකක් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව තිබෙනවා. වන්ධ්‍යාකරණය හෝ පුම්ංගහරණය කළ සතුන් ඒ සඳහා නැවත අල්ලා ගැනීම සිදු නොකිරීම සඳහා ඔවුන් හඳුනා ගැනීමට යම් සලකුණු සටහන් කිරීමේ අවශ්‍යතාවක් තිබෙනවා. එයත් මේ පනත මඟින් අපි සාකච්ඡා කරනවා. එහිදී රජය මඟින් යම් වැඩ කොටසක් කරනවා වාගේම ලංකාව ඇතුළේ තිබෙන විවිධ ස්වේච්ඡා සංවිධානත් දැනටත් මේ කාර්යයේ නිරත වනවා. ඉතින් ඒ සියලුදෙනාගේම දායකත්වය ලබාගෙන මේ කටයුත්ත කිරීම මඟින් අපි අපේක්ෂා කරන්නේ, 2030 වනකොට ලංකාවෙන් ජලභීතිකා රෝගය මුළුමනින්ම තුරන් කිරීමටයි. ඒ සඳහා අවශ්‍ය විධිමත් වැඩ පිළිවෙළක් තමයි මේ පනත මඟින් අපි ඉදිරිපත් කරන්නේ.

මේ පනතේ III වන කොටස හැටියට දක්වා තිබෙන්නේ, අභිජනන මධ්‍යස්ථාන විධිමත් කිරීමයි. අපි බොහෝ අවස්ථාවල දකිනවා, ප්‍රමිතියකින් හෝ කිසිදු විද්‍යාත්මක ක්‍රමවේදයකින් තොරව සුනඛයන් බෝ කිරීමේ මධ්‍යස්ථාන පවත්වාගෙන යන ආකාරය. නමුත්, මේ සුනඛයන් බෝ කිරීමේ මධ්‍යස්ථාන නියාමනය කිරීමේ අවශ්‍යතාවක් තිබෙනවා. සමහර තැන්වල ඒ සතුන් සඳහා අවශ්‍ය ඉඩකඩ නැහැ. ඔවුන්ට අවශ්‍ය වාතාශ්‍රය ලැබෙන්නේ නැහැ. අපි දැකලා තිබෙනවා, තද අව්වේ, මහ වැස්සේ ඒ සතුන් රඳවා තබාගන්නා ආකාරය. ඒ නිසා මේ සතුන්ට කරුණාවෙන් සැලකීමේ අවශ්‍යතාවක් සුනඛයන් අභිජනනය කිරීමේ මධ්‍යස්ථානවල භිමිකරුවන්ට තිබෙනවා. ඒ අවශ්‍යතාව නියාමනය කිරීමේ වැඩ පිළිවෙළක් අපි මේ පනත මඟින් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒකට යම් බලපත්‍රයක් ලබාගන්න අවශ්‍යයි. ඒ බලපත්‍රයට නිශ්චිත කාලයක් තිබෙනවා. ඒ අදාළ කාලය ඉක්ම ගියාට පස්සේ නැවත ඒ බලපත්‍රය අලුත් කිරීමට නම් ඒ ඒ පළාත් පාලන ආයතන මඟින් පනවන ලද ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කළ යුතු වනවා.

මම කලින් කියපු විධියට සතුන් එන්නත් කිරීම, ගහන පාලනය වාගේම අවිධිමත් ලෙස අභිජනනය කිරීම නියාමනය කරමින්, අභිජනනය විධිමත් කිරීමේ වැඩ පිළිවෙළකුත් මේ පනත මඟින් අපි ඉදිරිපත් කර තිබෙනවා. විශේෂයෙන්ම අභිජනන මධ්‍යස්ථාන නියාමනය කිරීමෙන් සතුන්ට ප්‍රමාණවත් ආහාර, ජලය වාගේම නිදාගැනීමට අවශ්‍ය ඉඩකඩ සහ ව්‍යායාම කිරීමේ පහසුකම් ද සැලසෙනවා. සමහර තැන්වල ඒ සතුන්ට අවශ්‍ය ඉඩකඩ ඇත්තේම නැහැ. ඒ වාගේම ඔවුන්ට අවශ්‍ය වාතාශ්‍රය, උෂ්ණත්වය, පශු වෛද්‍ය රැකවරණය යන මේ සියල්ල ද ලබා දිය යුතු වනවා. ඒ කටයුතු නියාමනය කරමින් සුනඛයන් අභිජනනය කිරීම විධිමත් කිරීමට මේ පනත මඟින් අපි අපේක්ෂා කරනවා.

ඒ වාගේම මේ පනත ගෙන ඒමේ අපේ මූලිකම අරමුණ වන ජලභීතිකා රෝගය ව්‍යාප්ත වීම පාලනය කිරීම සඳහා පළාත් පාලන ආයතන විසින් ඉටු කළ යුතු කාර්යභාරය පිළිබඳව මේ පනතෙන් විශේෂයෙන් අවධානය යොමුකොට තිබෙනවා. මෙහිදී පළාත් පාලන ආයතනවලට දැවැන්ත වගකීමක් පැවරෙනවා, ජලභීතිකා රෝගය ලංකාවෙන් තුරන් කිරීම සඳහා. අපි බොහෝ අවස්ථාවල ජලභීතිකා රෝගය නිසා සිදුවන මරණ පිළිබඳව කථා කළත්, අපට වාර්තා නොවන සපා කෑම් විශාල ප්‍රමාණයක් සිදුව තිබෙනවා. ඒ වාගේම වීදි සුනඛයන් නිසා සිදු වන රිය අනතුරු සංඛ්‍යාව පිළිබඳව අපට නිවැරදි තොරතුරු නැති තරම්. නමුත් සැලකිය යුතු රිය අනතුරු ප්‍රමාණයකට හේතුව හැටියට අපි දකින්නේ මේ වීදි සුනඛයන්ගේ ගහනයයි. ඒ නිසා ඒ සතුන් ගහනය පාලනය කිරීමට වාගේම ජලභීතිකා රෝගය වැළැක්වීමට අවශ්‍ය දැවැන්ත වැඩ පිළිවෙළක් මේ පනත ඇතුළේ අපි ඉදිරිපත් කරලා තිබෙනවා.

කලින් කිව්වා වාගේම ජලභීතිකා රෝගය ආසාදනය වී ඇති බව විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතින අවස්ථාවක 12වන වගන්තිය යටතේ අදාළ නිලධාරීන්ගේ සහයෝගය ලබාගෙන අවශ්‍ය පියවර ගැනීමට ඉඩ කඩ තිබෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශය, අපේ පළාත් පාලන අමාත්‍යාංශය සහ තවත් විවිධ පාර්ශ්ව සම්බන්ධ කරගෙන ඒ සියලුදෙනාගේ දායකත්වයෙන් අපට මේ කාර්යය කරගැනීම අවශ්‍ය වනවා. විශේෂයෙන් පුද්ගලයින්ට ජලභීතිකා රෝගය වැලදුණු අවස්ථාවලදී අපේ සෞඛ්‍ය

[ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා]

අමාත්‍යාංශය මඟින් ලබා දෙන දායකත්වය ඉතා විශාලයි. එතුමන්ලාට තමයි මෙහි මූලික වගකීම පැවරෙන්නේ. හැබැයි, සුනඛ ගහනය පාලනය කිරීමට සහ එන්නත් කිරීමේ ක්‍රියාවලියට පළාත් පාලන ආයතනවලට වැඩි වගකීමක් පැවරෙන බව තමයි අපට පෙනෙන්න තිබෙන්නේ. ඒ නිසා සෞඛ්‍ය අමාත්‍යාංශයත්, පළාත් පාලන ආයතනත් එකට එකතු වෙලා වාගේම තවත් කණ්ඩායම් ද එකතු කරගෙන මේ කටයුත්ත කළ යුතු වනවා.

ඊළඟට මේකේ වැදගත්ම තවත් කාරණයක් තිබෙනවා. ජලභීතිකා රෝගය තුරන් කිරීමේ ජාතික උපදේශක කමිටුව පිහිටුවීමට මේ පනත මඟින් අපි කටයුතු කරනවා. ජලභීතිකා රෝගය තුරන් කිරීමේ ජාතික උපදේශක කමිටුව මඟින් අවශ්‍ය තීන්දු-තීරණ අරගෙන 2030 වර්ෂය වනකොට ජලභීතිකා රෝගය ලංකාවෙන් තුරන් කිරීමේ මෙහෙයුම සඳහා නායකත්වය ලබා දීම කෙරෙනවා. ඒ වාගේම ප්‍රාදේශීය කමිටුත් මේ මඟින්ම පිහිටුවීමට අපි යෝජනා කරලා තිබෙනවා. ප්‍රාදේශීය වශයෙන් පැන නඟින ගැටලු නිරාකරණය කිරීම සඳහා, ඒ ප්‍රාදේශීය කමිටුවලට වගකීම පැවරෙනවා.

මේ පිළිබඳව දීර්ඝ වශයෙන් කථා කරන්න වෙලාව නැති නිසා, දීර්ඝ කාලයක් තිස්සේ ජලභීතිකා රෝගය තුරන් කිරීම සඳහා කටයුතු කරපු සෞඛ්‍ය අමාත්‍යාංශය, වෛද්‍යවරුන් ඇතුළු ඒ සියලු කණ්ඩායම්වලටත්, ඒ වාගේම මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්, පශු වෛද්‍යවරුන් ඇතුළු ඒ සියලු කණ්ඩායම්වලටත් නැවතත් ස්තුතිය, ගෞරවය පළ කරන ගමන්, අප සියලුදෙනාගේම සාමූහික වගකීමක් සේ සලකා මේ රටෙන් ජලභීතිකා රෝගය තුරන් කිරීම සඳහා කටයුතු කරමු කියන ආරාධනාව කරමින් මා නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි අටක කාලයක් ලැබෙනවා.

[අ.භා. 12.07]

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජලභීතිකා රෝගය කියන්නේ ඉතාම භයානක රෝගී තත්ත්වයක් බව අපි දන්නවා. Rabies is 100 per cent fatal once symptoms appear. මොකක්ද මේ කියන්නේ? රෝග ලක්ෂණ මතු වුණාට පස්සේ රෝගියා මරණයට පත්වීම සියයට 100ක් ස්ථිරයි කියන කාරණය. නමුත් මේ රෝගී තත්ත්වය සහ මේ මරණ සියයට 100ක් වළක්වා ගන්න අපට පුළුවන්; it is 100 per cent preventable. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම තත්ත්වයක් තිබියදී පසුගිය වසරේ මේ රෝගී තත්ත්වය නිසා අපේ රටේ අභිංසක ජනතාව අතරින් 20කට ආසන්න පිරිසක් මරණයට පත් වෙලා තිබෙනවා. වර්තමානයේ එවැනි තත්ත්වයක් දක්නට තිබෙන නිසා එක පැත්තකින් සත්වයන් ආරක්ෂා කිරීමත්, අනෙක් පැත්තෙන් අපේ රටේ පුරවැසියන් ආරක්ෂා කිරීමත් පිළිබඳව අපි සාකච්ඡා කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ පිළිබඳව කථා කරනකොට විශේෂයෙන් අපට පැන නඟින ප්‍රධාන කාරණයක් තිබෙනවා. මේ පනත් කෙටුම්පතට අනුව vaccination අනිවාර්යය - compulsory - කර තිබෙනවා. නමුත් ගරු ඇමතිතුමනි, මේ රටේ අපට දිනෙන් දින අහන්න ලැබෙන තත්ත්වයක් තමයි vaccine shortage එක; ඒ කියන්නේ vaccinesවල තිබෙන හිඟතාව. 2022 වසරේදීත්, 2023 වසරේදීත් අපට ඒ සම්බන්ධව අහන්න ලැබුණා. ඒ විතරක් නොවෙයි, මේ එන්නත්වල - vaccinesවල - තිබෙන quality එක, quantity එක සහ storage එක පිළිබඳව, ඒ කියන්නේ ඒ අවශ්‍ය කරන cold chain storage එක maintain වෙනවාද කියන එක පිළිබඳවත් අපට ප්‍රශ්න කරන්න සිදු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අවධානය යොමු කළ යුතු තවත් කාරණයක් තිබෙනවා. අපි මේ පනත් කෙටුම්පත තුළ ජලභීතිකා රෝගය තුරන් කිරීම ගැන එක පැත්තකින් කථා කරනවා. අනෙක් පැත්තෙන් සුනඛයන් ලියාපදිංචි කිරීම ගැනත් කථා කරනවා. අපි මතක් කර දෙන්න කැමැතියි, සුනඛයන් ලියාපදිංචි කිරීමෙන් පමණක් මෙම රෝගය තුරන් කිරීමට අපහසු බව. මොකද, ජලභීතිකාව කියන රෝගය අනෙකුත් සත්වයන්ගෙන් බෝවීමේ ප්‍රවණතාවකුත් තිබෙනවා. විශේෂයෙන්ම පූසන්ගෙන්, livestock ක්ෂේත්‍රයේ සතුන්ගෙන් වාගේම wild animalsලාගෙන් වුණත් ඒ රෝගය බෝ වෙන්න පුළුවන්. ඒ පිළිබඳවත් රජයේ අවධානය යොමු කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මෙම පනත් කෙටුම්පතේ Clause 4 තුළ කියැවෙන කාරණය කෙරෙහිත් අවධානය යොමු කරන්න ඕනෑ. විශේෂයෙන්ම මෙතෙක් කල් MOHලා, PHIලා කරගෙන ගිය වැඩ පිළිවෙළ ගත්තොත්, මෙම වගන්තිය යටතේ කියැවෙන වැඩ පිළිවෙළට ඒ අයත් එකතු කර ගන්නවාද කියන එක ඉතාම වැදගත් කියා මම විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙකුත් සතුන්ගෙන් පවා මෙම රෝගය බෝ වෙන්න පුළුවන් බව අපි සඳහන් කළා. Peradeniya Teaching Hospital එකෙන් කර තිබෙන පරීක්ෂණවලදී හඳුනා ගෙන තිබෙන්නේ මොකක්ද? "Unvaccinated domestic dogs and cats cause 54 per cent and 20 per cent of exposures respectively. Cats account for 28 per cent of exposure to children under 12 years. " මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට මේ තුළින් පැහැදිලිව පෙනෙන්න තිබෙන්නේ සතුන් ලියාපදිංචි කිරීමේදී ගෙවල්වල ඉන්න පූසන් ඇතුළු අනෙකුත් සත්වයන් ගැනත් අවධානය යොමු කරන්නට අවශ්‍යයි කියන කාරණයයි. මොකද, වෛද්‍ය විද්‍යාත්මකව ගත්තත්, හපා කෑමෙන් පමණක් නොවෙයි, විශේෂයෙන්ම පූසන් වාගේ සතුන් විසින් සීරීමෙන් පවා ඉතාම භයානක මෙම රෝගය බෝ වීමේ ප්‍රවණතාවක් තිබෙන බව අපි දන්නවා, ගරු ඇමතිතුමනි. මොකද, rabies කියන්නේ අමුතුම රෝගී තත්ත්වයක්. මම කලින් කිව්වා වාගේ symptoms ආවට පසුව ප්‍රතිකාර කළත් එවැනි රෝගියෙකු සුව කරන්න බැරි තත්ත්වයකට පත් වෙනවා. එතකොට එවැනි රෝගියෙකු මොන තරම් අසරණභාවයට පත් වෙලා, මොන තරම් දුක් විඳලා, කොයි තරම් පීඩාවකට පත් වෙලා මරණයට පත් වෙනවාද කියන එක පිළිබඳව අපි නැවත නැවතත් ආවර්ජනය කරන්න අවශ්‍ය වන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, MRI එකේ reports ගත්තාම අපට පෙනී යනවා, 1999 වසරේ සිට 2010 වසර දක්වා වූ කාලය තුළ සියයට 85ක් සුනඛයන්ගෙන් සහ මම කලින් කිව්වා වාගේ සියයට 7.9ක් පූසන් ඇතුළු අනෙකුත් සතුන්ගෙන් rabies positive වෙලා තිබෙන බව. එයින් උෂ්ට්‍ර පළාත තුළ සියයට 22ක් විශේෂයෙන්ම පූසන්ගෙන් ඇති වුණු rabies positive තත්ත්වයන් වාර්තා වෙලා තිබෙනවා. ඒ නිසා මේ කාරණාවලටත් අපි රජයේ අවධානය යොමු කරවනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාවේදී මා දෙවැනි කාරණය විධියට සඳහන් කළේ මෙම රෝගයෙන් ජනතාව ආරක්ෂා කර ගැනීමට ලබා දෙන එන්නත් සම්බන්ධවයි. ඒ අනුව මා සඳහන් කරන්න කැමැතියි, සතුන්ගේ හපා කෑම් හෝ සීරීම් හේතුකොට ගෙන 2022 වසරේදී 168,000කට ආසන්න ප්‍රමාණයකට post-exposure prophylaxis දීලා තිබෙන බව. 2026 මැයි මාසයේදී GMOA එකේ Spokesman කියා තිබෙනවා, MOHවල විශේෂයෙන්ම prophylaxis සඳහා දෙන එන්නත්වල හිඟතාවක් තිබෙනවා කියලා. ඒ වාගේම immunoglobulin injection එකේ availability තිබෙන්නේ ඉස්පිරිතාල 72කට ආසන්න ප්‍රමාණයක බවත් ඔහු කියා තිබෙනවා. එම නිසා ඒ පිළිබඳවත් රජයේ අවධානය යොමු වෙන්න ඕනෑය කියන කාරණය අපි මතක් කර දෙනවා. මොකද, prevention is better than cure. එක පැත්තකින් මේ සතුන්ට අවශ්‍ය කරන එන්නත් ලබා දීමත්, ඒ වාගේම මේ සතුන්ගෙන් පුද්ගලයෙකුට යම් හානියක් සිදු වුණොත් ඊට අවශ්‍ය කරන prophylaxis ලබා දීමත් ඉතා වැදගත් කියලා අපි කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ලබා දී තිබෙන අවසාන මිනිත්තු දෙකක කාලය තුළ මම තවත් කාරණයක් මතක් කර දෙන්න කැමැතියි. විහාරමහාදේවී උද්‍යානයේ තිබෙන ගෞරවනීය බුදු හාමුදුරුවන්ගේ පිළිමය ඉදිරිපිට ක්‍රියාත්මක කරන ඒ සත්‍යාග්‍රහය මේ වනවිට පොලීසිය මැදිහත් වෙලා යම් ආකාරයකින් නතර කරන්න කටයුතු කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි, එහිදී විශේෂයෙන්ම කාන්තාවකට ඒ අධිකරණ නියෝගය අනිසි ලෙස ලබා දෙන්න කටයුතු කළා කියන කථාව දිගින් දිගටම අපි මාධ්‍ය ඔස්සේ දැක්කා. ඒක ප්‍රජාතන්ත්‍ර විරෝධී කියන එකත් මම මතක් කර දෙනවා.

ඒ වාගේම අපට මතකයි, තායිලන්තයේ නියෝජ්‍ය අග්‍රාමාත්‍යතුමිය මේ රටට ආපු අවස්ථාවේදී සිදු වූ සිද්ධිය. තායිලන්තය කියන්නේ අපට ඉතාම වැදගත් රටක්. විශේෂයෙන්ම මේ රටේ ගෞරවනීය දළදා වහන්සේ වැඩම කරවන්න අවශ්‍ය කරන අලි ඇතුන් ලබා දීම සඳහාත් ඒ රජය මැදිහත් වෙලා තිබෙනවා. එවැනි තත්ත්වයක් යටතේ එතුමිය අපේ රටට පැමිණි අවස්ථාවේදී විශේෂයෙන්ම එතුමියට ආරක්ෂාව ලබා නොදීම, බෞද්ධ කටයුතු කොමසාරිස්තුමා ඒ අවස්ථාවට සහභාගී නොවීම, ඒ වාගේම ආණ්ඩුකාරතුමා ඒ අවස්ථාවට සහභාගී නොවීම,-

ගරු විජිත හේරත් මහතා (විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා)
(மாண்புமிகு விஜித ஹேரத் - வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர்)
(The Hon. Vijitha Herath - Minister of Foreign Affairs, Foreign Employment and Tourism)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මගේ වේලාව ගන්න එපා, ඇමතිතුමා.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු මන්ත්‍රීතුමනි, ඉතා පැහැදිලිව මම කියන්න ඕනෑ, ඒක රාජ්‍ය උත්සවයක් නොවෙයි කියන එක. රාජ්‍ය උත්සවයකට තමයි රජයේ නිලධාරීන් සහභාගි වෙන්නේ. ඒ නිසා මේක අනිවාර්යය එකකුත් නොවෙයි. කැමැති රාජ්‍ය නිලධාරීන්ට සම්බන්ධ වෙන්න පුළුවන්, අකැමති නම් සම්බන්ධ වෙන්නේ නැතුව ඉන්නත් පුළුවන්. රාජ්‍ය නිල උත්සවයක් වුණොත් තමයි රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගිත්වය අනිවාර්යය වෙන්නේ.

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මම විදේශ කටයුතු ඇමතිතුමා එක්ක පැටලෙන්න යන්නේ නැහැ. නමුත්, ඒ තොරතුරු සියල්ලක්ම මගේ ළඟ තිබෙනවා. මේ පිළිබඳව ප්‍රාදේශීය ලේකම්වරයා දිසාපතිතුමාට ලියපු ලිපිය, දිසාපතිතුමා බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමාට ලියපු ලිපිය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයෙන් ඒ පිළිබඳව කටයුතු නොකිරීම පිළිබඳව තොරතුරු ඇතුළත් ලේඛන සියල්ලක්ම මම ළඟ තිබෙනවා. ජනාධිපති කාර්යාලයෙන් ලියපු ලියුම් ටිකත් තිබෙනවා. එම තොරතුරු ඇතුළත් ලේඛන සියල්ල මම **සභාගත*** කරනවා.

විශේෂයෙන්ම මේ නියෝජ්‍ය අගමැතිවරිය පැමිණීමේදී එතුමියට අවශ්‍ය කරන ආරක්ෂාවවත් ලබා දෙන්න කටයුතු කරලා නැහැ. මම කියන්නේ මේකයි. අපේ රටට ඉතා වටිනා වූඩා මාණික්‍යයක් ඇතුළු බෞද්ධ ජනතාවට අවශ්‍ය කරන දේවල් ලබා දෙන රජයකට අවශ්‍ය කරන පහසුකම් අපට රටක් හැටියට ලබා දීමට නොහැකි වීම පිළිබඳව අපි කනගාටු වෙන්න ඕනෑ කියන කාරණයත් මම මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) හංසක විජේමුණි නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.16]

ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Hansaka Wijemuni - Deputy Minister of Health)
අද දවසේ අපි කථා කරන්නේ ජලභීතිකා රෝගය තුරන් කිරීමේ සහ සුනඛයන් ලියාපදිංචි කිරීමේ පනත - Elimination of Rabies and Registration of Dogs Act එක - සම්බන්ධවයි. ජලභීතිකා රෝගයේ තිබෙන ප්‍රධාන ලක්ෂණයක් තමයි, එය හැදුණාට පස්සේ, ඒ කියන්නේ ඒකේ රෝග ලක්ෂණ පහළ වුණාට පස්සේ අපට රෝගීන්ට ලබා දෙන්න ප්‍රතිකාරයක් නැහැ කියන එක.

---
* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
කලින් ඇමතිතුමාගෙන් ඇහුවාද point of Order එක මොකක්ද කියලා?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඊයේ කල් තැබීමේ විවාදය තිබුණා. එතැනදී අදාළ පැහැදිලි කිරීම කළා. ඒ නිසා ඒකට අදාළව එතුමාට ඒක පැහැදිලි කිරීමේ අවස්ථාව තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමා කථා කරන්න.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
නැහැ, නැහැ. ඒක හොඳයි. ඒ වාගේ අපිටත් අවස්ථාව දෙන්න ඕනෑ කියලා මම කියන්නේ. ඒක හොඳයි. එහෙම කථා කරන්න දෙන්න ඕනෑ. ඒ වාගේ අපිටත් අවස්ථාව දෙන්න ඕනෑ කියලා මම කියන්නේ.

ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)
කරුණාකරලා මට කථා කරන්න අවස්ථාව ලබා දෙන්න. මම කියන්නේ අවශ්‍ය ප්‍රතිකාර තිබෙනවා නම් ඒවා ගෙවල්වලින් එනකොට අරගෙන එන්න ඕනෑ කියන එකයි. මොකද, අපට කථා කරන්න අවශ්‍යයි. අපි හැමදාම කථා කරන්නේ නැහැ නේ. ඉඳලා හිටලා කථා කරනකොට ඒ වෙලාව ලබා දෙන්න. *[බාධා කිරීමක්]* අපි දන්නවා, ජලභීතිකාව කියන්නේ හොඳ කරන්න බැරි රෝගයක් බව. ඒක නිසා අපට ප්‍රධාන වගකීම හැටියට තිබෙන්නේ ඒ රෝගය වළක්වන එකයි. අපි ඒ රෝගය ගත්තාම,- *[බාධා කිරීමක්]*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව නිශ්ශබ්ද වෙන්න.

ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)
සමහර රෝගවලට බෙහෙත් තිබෙනවා. ප්‍රශ්නය තිබෙන්නේ ඒ බෙහෙත් පාවිච්චි කරන්නේ නැතුව මෙතැනට එන එකයි.

ජලභීතිකා රෝගය බෝ වෙන්නේ ඇත්තටම ක්ෂීරපායීන්ගෙන්. නමුත්, ඒ අතරේ විශේෂයෙන්ම බල්ලන්ගෙන් සහ පූසන්ගෙන් මේ රෝගය බෝ වෙනවා කියලා තමයි ලංකාවේ report වෙලා තිබෙන්නේ. ඒ වුණාට අපි දන්නවා, ඒ අතර වනගත සතුන්ගෙනුත් ජලභීතිකා රෝගය සෑදීමේ යම් ක්‍රියාකාරිත්වයක් තිබෙන්න පුළුවන් බව. අපි ඒ පිළිබඳවත් අවධානය යොමු කරනවා. ජලභීතිකා රෝගය සම්බන්ධයෙන් ගත්තාම, අවුරුදු ගණනාවක් තිස්සේ අපි ඒ සම්බන්ධයෙන් යම්කිසි ප්‍රගතියක් ලබා ගෙන තිබෙනවා. - *[බාධා කිරීමක්]*

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)
නමුත් අපේ අරමුණ තමයි, 2030 වනවිට ඒ කියන්නේ තව අවුරුදු තුනක් ඇතුළත ජලභීතිකා රෝගය ලංකාවෙන් තුරන් කිරීම. ඒ කියන්නේ බින්දුව බවට පත් කිරීම. අපේ කලාපයේ රටවල් බොහොමයක් එම ඉලක්කය වෙත ළඟාවෙලා තිබෙනවා. විශේෂයෙන්ම ලංකාව දූපතක් විධියට ඒ target එකට එන්න පුළුවන්. ලෝකයේ බොහෝ දූපත් රාජ්‍යයන් මේ target එකට ඇවිල්ලා තිබෙනවා.*[බාධා කිරීමක්]*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, point of Order එකක් ඉදිරිපත් කිරීමට මෙතැන කිසි අවස්ථාවක් ඇති වුණේ නැහැ. ඒ නිසා ඔබතුමාට කිසිදු point of Order එකක් තිබෙන්නට විධියක් නැහැ.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා කථා කරන්න. *[බාධා කිරීමක්]* ඔබතුමාට point of Order එකක් ඉදිරිපත් කරන්න මෙතැන අවස්ථාවක් නිර්මාණය වුණේ නැහැ. ගරු නියෝජ්‍ය ඇමතිතුමා කථා කරන්න.

ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)
අපේ අරමුණ තමයි, 2030 වෙනකොට අපේ රට ජලභීතිකා රෝගයෙන් බිංදුවේ තත්ත්වයට පත් කිරීම. ඒ කියන්නේ, ජලභීතිකා රෝගය මේ රටෙන් සම්පූර්ණයෙන්ම තුරන් කිරීම. ඉතින්, ඒ සඳහා වූ ක්‍රියාදාමයක තමයි අපි මේ යෙදෙන්නේ. අපි දන්නවා, ජලභීතිකා රෝගය තුරන් කිරීම සම්බන්ධ සියලු වගකීම් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් තමයි මේතාක් දුරට අරගෙන ආවේ.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝග 79 ප්‍රකාවර මම මේ මූලාසනයේ සිට ඔබට පළමු අවවාදය කළේ. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා කථා කරන්න.

ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)
මෙතැනදී අපේ අරමුණ තමයි, මෙතෙක් කාලයක් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් තනිවම කරගෙන ආපු කාර්ය භාරය වඩාත් සංවිධානාත්මකව සහ වඩාත් සංවිධිතව මේ රටේ ක්‍රියාත්මක කිරීම.

ජලභීතිකා රෝගය ගත්තාම, අපි මෙතැනදී ජලභීතිකා රෝගයේ ප්‍රධාන ආකාර දෙකක් පිළිබඳව කථා කරනවා. එකක් තමයි, "human rabies" කියන එක. ඒ කියන්නේ, මිනිසුන්ට වැළඳෙන ජලභීතිකා රෝගය. ඒ වාගේම, "animal rabies" කියන්නේ, සතුන්ට වැළඳෙන ජලභීතිකා රෝගය. Animal rabies කියන එක සම්බන්ධ සම්පූර්ණ වගකීම තිබෙන්නේ පශු සම්පත් සම්බන්ධයෙන් ක්‍රියා කරන ආයතන පද්ධතියට. ඒ වාගේම human rabies සම්බන්ධ වගකීම සෞඛ්‍ය අමාත්‍යාංශයට තිබෙනවා. නමුත්, සෞඛ්‍ය අමාත්‍යාංශය විධියට අපි මේ තාක්කල් මේ දෙකම කරගෙන ආවා. ඉතින්, වඩාත් සංවිධානාත්මකව ඉදිරියට මුහුණ දීමට තමයි අපි මේ පනතෙන් බලාපොරොත්තු වෙන්නේ. ඒ වාගේම මෙම පනත මඟින් මෙතක් කල් තිබුණු පනත් දෙකක කාර්යයන් එක පනතකට ගෙනැල්ලා තිබෙනවා. එම නිසා වඩා හොඳ සමායෝජනයක් සහිතව අපට මේ කාර්යය ඉදිරියට කරගෙන යෑමේ අවස්ථාව තිබෙනවා.

අපි මෙහිදී ප්‍රධාන වශයෙන්ම අවධානය යොමු කරන්නේ, සුනඛයින් එන්නත්කරණය හා සම්බන්ධවයි. ඒ කියන්නේ, ඔවුන්ට එන්නත් ලබා දීලා, ඔවුන් අතර මෙම රෝගය බෝවීම වැළැක්වීම සහ ඔවුන්ගෙන් මිනිසුන්ට රෝගය බෝවීම වැළැක්වීම. ඒ සඳහා සාමාන්‍ය වශයෙන් අපි සුනඛයින්ගෙන් සියයට 70ක් එන්නත්කරණයට භාජනය කළ යුතු වෙනවා. ඇත්තටම අපේ රටෙන් මේ රෝගය ඉවත් කරන්න නම්, අවම වශයෙන් අපි අවුරුදු තුනක්වත් ඇතුළත සියයට 100ක ප්‍රතිශතයකින් සුනඛයන් එන්නත් කිරීම කළ යුතු වෙනවා. නමුත්, අවාසනාවකට වගේ අපි තවම ඉන්නේ සියයට 55ක් වැනි සීමාවක. ඉතින්, මේ තත්ත්වය මීට වඩා ඉදිරියට අරගෙන යන්න නම්, අපි හිතනවා මේ සියලු පාර්ශ්වවල,-

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ point of Order එක මොකක්ද, ගරු මන්ත්‍රීතුමා?

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ස්ථාවර නියෝග 91. (ඌ), එහෙම නැත්නම් 91(h), 92(2) (ආ). මම කියවන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පොඩ්ඩක් අහගන්නකෝ. Standing Order 91(h) states, I quote:

> "No Member shall make any imputation of improper motives against another Member, or make reference to personal affairs of another Member;"

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එතැන point of Order එකක් නැහැ, ගරු මන්ත්‍රීතුමා. ගරු නියෝජ්‍ය ඇමතිතුමා කථා කරන්න.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එයාට ඉන්ජෙක්ෂන් එකක් ගහලා ගන්න ඕනෑ. *[බාධා කිරීමක්]* ජලභීතිකා රෝගයට බෙහෙතක් විදලා ගමු.

ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)
උදේට බෙහෙත් බීලා එන්න ඕනෑ කියන එක සාමාන්‍ය දෙයක්. ඒ නිසා උදේට බෙහෙත් බීලා එන්න ඕනෑ.

ඉතින්, අපේ අරමුණ තමයි, මෙම ජලභීතිකා රෝගය ලංකාවෙන් තුරන් කිරීම. එම නිසා සියයට 70ක අවම target එකකට සහ අපේ උපරිම target එක වන සියයට 100 දක්වා අපි යා යුතුව තිබෙනවා. ඒක තමයි අපට තිබෙන ලොකුම අභියෝගය. අපි දන්නවා, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් මෙතෙක් කරගෙන ආපු සමහර කාර්යයන් පළාත් පාලන ආයතනවලට සහ පශු වෛද්‍ය ක්ෂේත්‍රයට භාර ගන්න සිද්ධ වෙනවා. මේ කාර්යය smooth විධියට, එහෙම නැත්නම් සුමට විධියට කර ගැනීමේ වුවමනාවක් අපට තිබෙනවා. ඒ නිසා මේ පනත ක්‍රියාත්මක කිරීමේදී අදාළ වගකීම් හුවමාරුව සිදු කර ගැනීම සඳහා අපට යම් සංක්‍රාන්ති කාලයක් - යම් transitional period එකක් - අවශ්‍ය වෙනවා. ඒක තමයි අපට මෙතැන තිබෙන ලොකුම කාර්ය භාරය. ඒක නිසා මේක හුදු පනතකින් විතරක් කරන්න පුළුවන් දෙයක් නොවෙයි. ඒක නිසා පනතෙන් එහාට ගිහිල්ලා සෞඛ්‍ය අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය, ඒ වාගේම පළාත් පාලන අමාත්‍යාංශය සහ මේ හා සබැඳි අනෙකුත් ආයතන එකතු වුණු පොදු ක්‍රියාදාමයකට යන්න අපට සිද්ධ වෙනවා. ඒක තමයි මෙතැන තිබෙන ලොකුම වැඩේ. මෙතැනදී නොයෙකුත් පාර්ශ්වයන්ට හිතෙන්න පුළුවන්, අපි මෙච්චර කාලයක් කරගෙන ආපු වැඩේ අනෙක් අය කොහොම කරයිද කියලා. නමුත්, එහෙම එකක් නැහැ. අපිට මේ සඳහා ලෝකයේ ඕනෑ තරම් උදාහරණ තිබෙනවා. ඒක නිසා animal rabies සම්බන්ධ සෑහෙන වගකීමක් පශු වෛද්‍යවරුන්ට පැවරෙනවා. අපට දැන් පශු වෛද්‍ය සේවාව ලංකාවේ වඩාත් ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවක් තිබෙනවා. එය ශක්තිමත් කිරීම කොහොම කරගන්න පුළුවන්ද කියන එක තමයි අපි බලන්න ඕනෑ. අපි හිතනවා, දැනට තිබෙන ඔවුන්ගේ ශක්තිය මතත් ඔවුන්ට සෑහෙන දෙයක් මේ තුළින් කරන්න පුළුවන් කියලා. නමුත්, සෞඛ්‍ය අමාත්‍යාංශය විධියට අපි මේ වැඩේ අත්හරින්නේ නැහැ. අපි ඒ පශු සම්පත් අංශයට අවශ්‍ය මහ පෙන්වීම සහ ඔවුන්ට අවශ්‍ය උදව් දිගටම ලබා දෙනවා.

අවසාන වශයෙන් අපි හැමෝගේම අරමුණ තමයි මේ ජලභීතිකාව රෝගය ලංකාවෙන් තුරන් කරන එක. අපි දැනටත් සෑහෙන මුදලක් මේකට වියදම් කරනවා. අපි පසුගිය අවුරුදු කිහිපය දෙස බැලුවාම සාමාන්‍යයෙන් vaccines ගන්න විතරක් සහ අනෙකුත් බෙහෙත්වලට විතරක් රුපියල් මිලියන 900ක විතර මුදලක් වියදම් කරලා තිබෙනවා. ඒ වාගේම, සුනඛ ගහනය පාලනයට සහ මේ පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා රුපියල් මිලියන 200ක මුදලක් වියදම් කර තිබෙනවා. ඒ වාගේම, අපේ මානව සම්පත් සහ අනෙකුත් ක්ෂේත්‍ර සඳහා කරපු වියදම් දෙස බැලුවාම, ඇත්තටම රුපියල් බිලියන දෙකකට -රුපියල් මිලියන 2,000කට- ආසන්න ප්‍රමාණයක් සෑම වසරකම අපි වියදම් කරනවා.

නමුත්, අවාසනාවකට වාගේ අපේ රටේ තවමත් මරණ සෑහෙන ප්‍රමාණයක් සිද්ධ වෙනවා. ඒ මරණ ප්‍රමාණය ගත්තාම, මේ අවුරුද්දේත් පළාත් පහකින් මරණ වාර්තා වෙලා තිබෙනවා. පළාත් පහකින් මරණ වාර්තා වෙලා තිබෙනවා කියන්නේ, මේ virus එක අපේ රටේ සෑහෙන්න දුරට ව්‍යාප්ත වෙලා තිබෙනවා කියන එකයි. ඒ නිසා මේක ලොකු අභියෝගයක්. මේකේදී අපි පක්ෂ විපක්ෂ භේදයකින් තොරව, අමාත්‍යාංශ භේදයකින් තොරව ශක්තිමත්ව මේ සඳහා මුහුණ දිය යුතු වෙනවා. අපේ කලාපයේ තිබෙන භූතානය වාගේ රටවල් ජලභීතිකාව තුරන් කිරීම කියන ඉලක්කයට ඇවිල්ලා තිබෙනවා. අපි දූපත් රාජ්‍යයක් නිසා අපිට

[ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා]

විශේෂයෙන්ම මේ ඉලක්කයට එන්න ලොකු හැකියාවක් තිබෙනවා; ලොකු potential එකක් තිබෙනවා. අපි ඒක අත්පත් කරගත යුතුවම තිබෙනවා.

ඒ වාගේම, අපි human rabies පැත්තෙන් ගත්තාම යම්කිසි කෙනෙක් බල්ලෙකුගේ සපා කෑමකට ලක් වුවහොත්, සැක සහිත නම් ඒ සම්බන්ධයෙන් අපේ උපදෙස් පත්‍රිකාවක් තිබෙනවා. අපි ඒකට සම්බන්ධ guidelines මේ ළඟදී අලුත් කළා. ඒ guidelinesවල අපි පැහැදිලිව දක්වා තිබෙනවා, මොන මොන අවස්ථාවලදී, මොන මොන බෙහෙත් ද විදින්න ඕනෑ කියලා. ඒ නිසා අපට හැකියාව තිබෙනවා, ඒ අවශ්‍ය ප්‍රතිකාර ලබා දෙන්න. අපේ ඒ ප්‍රතිකාරවල ලොකු පමාවක් වුණේ නැහැ. අපි පසුගිය කාලයේ දිගටම human rabies සඳහා අවශ්‍ය vaccines සහ අවශ්‍ය අනෙකුත් ප්‍රතිකාර ක්‍රම සහ බෙහෙත් රෝහල්වලට ලබා දීලා තිබෙනවා. ඒ වාගේම, සෞඛ්‍ය අමාත්‍යාංශය විධියට අපි cold chain එක ගැන සෑහෙන සැලකිලිමත් වෙනවා. අපි කිසිම වෙලාවක තත්ත්වයෙන් බාල එන්නත් ලංකාවට ගෙනැල්ලා නැහැ. ඒ නිසා බොරු සමාජගත කිරීමෙන් වළකින්න ඕනෑ. මොකද, කිසිම වෙලාවක vaccinesවල එවැනි failures ඇවිල්ලා නැහැ. ඒ වාගේම, cold chain එක හරියටම maintain කරනවා. ඒ maintain කිරීම සඳහා වූ දර්ශක තිබෙනවා. ඒ දර්ශක මත තමයි අපි ඒක කරන්නේ. ඒ නිසා විශේෂයෙන්ම සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ශීතදාමය - cold chain එක - ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කිසිම සැකයක් ඇති කරගත යුතු නැහැ. අපිට තිබෙන අභියෝගය තමයි, අපේ අමාත්‍යාංශයෙන් මේක පිටතට යනකොට මේ තිබිච්ච quality එක ඒ විධියටම පවත්වාගෙන යෑම සඳහා වූ සහයෝගය අනෙක් අයට ලබාදීම. ඒක තමයි අපිට තිබෙන අභියෝගය. අපි ඒ කාරණය ඉටු කරන්න සූදානම්.

අපිට මේ කාරණයේදී බොහෝ පාර්ශ්වවල උදව් වුවමනා කරනවා. එකක් තමයි, තමන්ගේ සුනඛයන් ඇතුළු සුරතල් සතුන් වඩාත් වගකීමක් සහිතව ඇති කිරීම සම්බන්ධයෙන් අපේ රටේ මහ ජනතාවටත් වගකීමක් තිබෙනවා. ඒ වාගේම, පළාත් පාලන ආයතනවලටත් මේ සම්බන්ධයෙන් වගකීමක් තිබෙනවා, තමන්ගේ පළාතේ සිටින ගෘහ ආශ්‍රිත සුනඛයන් ලියාපදිංචි කිරීම සහ ඒ ගහන පාලනය කිරීම සම්බන්ධව. ඒ වාගේම, පශු සම්පත් අමාත්‍යාංශයේත් වගකීමක් තිබෙනවා, මේ ක්‍රියාවලියට බද්ධ වෙලා, මේ අලුත් අභියෝගය භාරගෙන ඔවුන්ගේ කොටස ඉටු කිරීම සම්බන්ධයෙන්. මෙතෙක් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් දායකත්වයක් ලබා දුන් නමුත්, ඔවුන් විසින් කළ යුතු කොටස ඉටු කිරීම සම්බන්ධයෙන් ඔවුන්ටත් වගකීමක් තිබෙනවා. ඒ වාගේම, සෞඛ්‍ය අමාත්‍යාංශය පැත්තෙනුත් වගකීමක් තිබෙනවා. ඒ වාගේම, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය පැත්තෙනුත් වගකීමක් තිබෙනවා. අපි සියලුදෙනා එකතු වෙලා මේ කර්යය ජය ගනිමු කියන පණිවිඩය අපි ලබා දෙනවා. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උறුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Order, please! දිවා ආහාර විවේකය සඳහා ගරු සභාවේ කටයුතු පස්වරු 1.00 දක්වා අත්හිටවනු ලැබේ.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කථානායකතුමාගේ [ගරු (වෛද්‍ය) රිස්වී සාලි මහතා] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

අතන්පඩි, අමර්වු පි.ප. 1.00 මණිවරෙ ඉඩෙනිරුත්තප්පට්ටු මීණ්ඩුම් තොඩංගිර්රු. පිරතිච් චභානායකර් අවර්කළ් [මාණ්පුමිකු (වෛද්‍යර්) රිස්වි සාලි] තලෛමෛ වකිත්තාර්කළ්.

Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] in the Chair.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. (Dr.) Pathmanathan Sathiyalingam. You have seven minutes.

[පි.ප. 1.00]

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
Hon. Deputy Speaker, இன்றைய தினம் இந்தச் சபையில் நடைபெறுகின்ற விசர்நாய்க்கடி நோயை ஒழித்தல் மற்றும் நாய்களைப் பதிவுசெய்தல் சட்டமூலம் தொடர்பான விவாதத்தில் கலந்துகொண்டு பேசுவதையிட்டு மகிழ்ச்சியடைகின்றேன்.

நீர்வெறுப்பு நோய் - rabies - என்பது, பொதுவானதொரு சுகாதாரப் பிரச்சினையாகும். பொது சுகாதாரப் பிரச்சினையொன்றை இலகுவாகக் கையாள வேண்டுமென்றால், அதன் நோக்கங்கள் சரியாக இருக்க வேண்டும். மனித உயிர்களைக் காப்பாற்றுதல், சம்பந்தப்பட்ட விலங்குகளின் நலன்களைக் கவனித்துக்கொள்ளல், அரசாங்கத்தின் பொறுப்புக்கூறலை உறுதிப்படுத்தல் ஆகிய மூன்று விடயங்களும் இந்தப் பொது சுகாதாரப் பிரச்சினையைக் கையாள்வதில் மிகவும் முக்கியமானவை.

நீர் வெறுப்பு நோய்க்குப் பயன்படுத்தப்பட்டு இருக்கும் சொல்லாடல் பற்றி சொல்ல வேண்டும். இன்றைய ஒழுங்குப் பத்திரத்தில் 'விசர்நாய்க்கடி' என்ற சொல்தான் பாவிக்கப்பட்டு இருக்கின்றது. இப்போது இதற்கு மிகவும் பொருத்தமான சொல்லாக 'நீர் வெறுப்பு நோய்' என்பதே பொதுவாகப் பாவிக்கப்படுகின்றது. இது தொடர்பாக விடயத்துக்குப் பொறுப்பான அமைச்சர் அவர்கள் கவனமெடுக்க வேண்டுமென இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக்கொள்கின்றேன். Rabies - நீர் வெறுப்பு நோய் தொற்று ஏற்பட்டால், இறப்பு ஏற்படுவது நிச்சயம் என்பது உங்கள் எல்லோருக்கும் தெரியும். ஏன் நாங்கள் இந்த நோய் தொடர்பில் கவனமெடுக்க வேண்டுமெனில், இது - preventable disease - தடுக்கக்கூடிய ஒரு நோயாகும் . இந்த நோயைத் தடுப்பதற்குப் பல வேலைத் திட்டங்களை முன்னெடுக்க வேண்டும். அந்த வேலைத் திட்டங்களை எப்படி சிறப்பாக முன்னெடுப்பது என்பது பற்றி பேசுவது, அது பற்றி ஆலோசிப்பதுதான் இன்றைய விவாதத்தின் முக்கிய நோக்கமாக இருக்கின்றது.

1970ஆம் ஆண்டு இலங்கையில் நீர் வெறுப்பு நோயால் - rabies - கிட்டத்தட்ட 300 பேர் இறந்துள்ளதாக புள்ளிவிபரம் சொல்கின்றது. அதாவது, ஒரு வருடத்தில் கிட்டத்தட்ட 300 பேர் இறந்திருக்கிறார்கள். கடந்த ஐந்து வருடங்களை எடுத்துப் பார்த்தீர்கள் என்றால், 2021ஆம் ஆண்டு 25 உயிரிழப்புகளும், 2022ஆம் ஆண்டு 28 உயிரிழப்புகளும், 2023ஆம் ஆண்டு 16 உயிரிழப்புகளும், 2024ஆம் ஆண்டு 20 உயிரிழப்புகளும், 2025ஆம் ஆண்டு 14 உயிரிழப்புகளும் ஏற்பட்டு இருக்கின்றன. 2025ஆம் ஆண்டு இறந்தவர்களின் எண்ணிக்கை 14ஆகக் குறைந்திருக்கிறது என்று நாங்கள் சந்தோசப்பட முடியாது. ஏனென்றால், 2023ஆம் ஆண்டு 16ஆக இருந்த உயிரிழப்புகள், 2024ஆம் ஆண்டில் 20ஆக உயர்வடைந்து இருக்கின்றது. இலங்கையில் விசர்நாய்க்கடி அல்லது நீர் வெறுப்பு நோய் கட்டுப்பாடு தொடர்பில் கூடுதல் கவனமெடுக்க வேண்டும் என்பதை இந்தப் புள்ளிவிபரம் காட்டுகின்றது.

2025ஆம் ஆண்டில், நாய் கடித்த பிற்பாடு post-exposure therapyஆக கொடுக்கப்படும் நீர் வெறுப்பு நோய்க்கான vaccine 168,000 பேருக்கு ஏற்றப்பட்டு இருப்பதாக புள்ளிவிபரம் சொல்கின்றது. அதே ஆண்டில் 1.6 மில்லியன் - 16 இலட்சம் - நாய்களுக்கு vaccination செய்யப்பட்டு இருக்கின்றது. அப்படி இருந்தும்கூட, 2025ஆம் ஆண்டு கிட்டத்தட்ட 346 பதிவு செய்யப்பட்ட விலங்கு இறப்புகள் rabies நோயால் ஏற்பட்டு இருக்கின்றன. அதாவது, 1.6 மில்லியன் நாய்களுக்கு vaccination செய்யப்பட்டாலும்கூட, கணிசமான எண்ணிக்கை யான விலங்கு இறப்புகள் இடம்பெற்றிருக்கின்றன. இது பதிவு செய்யப்பட்ட விலங்கு இறப்புகள் மாத்திரம்தான். Vaccination coverage அல்லது vaccination செய்யப்படுகின்ற நாய்களின் எண்ணிக்கை போதாது என்பதுதான் இதன் அர்த்தமாகும். 2025ஆம் ஆண்டு இலங்கையில் வீட்டு நாய்கள், தெரு நாய்கள் என மொத்தமாக 55 சதவீதமான நாய்களுக்குத்தான் தடுப்பூசி ஏற்றப்பட்டுள்ளதாக புள்ளிவிபரம் சொல்கின்றது.

பொதுவாக எந்தவொரு தொற்று நோயையும் vaccine ஊடாகக் கட்டுப்படுத்துவதாக இருந்தால், vaccination coverageஆனது minimum 70 சதவீதத்துக்கும் மேல் இருக்க வேண்டும் என்பதுதான் standard. அதாவது, 70 சதவீதத்துக்கும் மேல் vaccination coverage இருக்க வேண்டும். எனவே, 55 சதவீதத்திலிருந்து 70 சதவீதத்துக்கும் மேல் இந்த vaccination coverageஐ dog populationஇல் ஏற்படுத்துவதற்கு நாங்கள் என்ன செய்ய வேண்டும் என்பது சம்பந்தமாகத்தான் இங்கு முக்கியமாகப் பார்க்க வேண்டும்.

இப்போது சுகாதார அமைச்சு இதற்குரிய விடயங்களைச் செய்தாலும், இந்தப் புதிய சட்டத்தின் ஊடாக இரண்டு முக்கியமான அரச நிறுவனங்களுக்கு இந்தப் பொறுப்பு கொடுக்கப்படுகின்றது. அதில் மிகவும் முக்கியமானது, Department of Animal Production and Health. இந்தத் திணைக்களத்தின் இப்போதைய statusஐப் பார்த்தீர் களென்றால், அங்கு ஆளணிப் பற்றாக்குறை, வாகனப் பற்றாக்குறை, ஏனைய வளப் பற்றாக்குறை என்பன மிக மோசமாக இருக்கின்றன. அதேபோல், உள்ளூராட்சி அதிகாரசபைகளுக்கும் பாரிய பொறுப்புகள் கொடுக்கப்பட்டு இருக்கின்றன. குறிப்பாக, இந்த vaccinationஐ organize பண்ணுதல், register பண்ணுதல் போன்ற வேலைகள் கொடுக்கப்பட்டு இருக்கின்றன. அவற்றிலும் பாரிய வளப் பற்றாக்குறை இருக்கின்றது. இது multi-sectoral approachமூலம் எல்லோரும் சேர்ந்து செய்யவேண்டிய முக்கியமானதொரு விடயமாக இருக்கின்றது.

2026ஆம் ஆண்டு rabies free certificateஐ எடுத்ததன் ஊடாக தென்கிழக்கு ஆசியாவில் இருக்கின்ற சிறிய நாடான பூட்டான் rabiesஐ முற்றுமுழுதாக eliminate பண்ணிய ஒரு நாடாகக் காணப்படுகின்றது. எங்களுடைய நாட்டிலும் இப்படியான உதாரணங்களைச் சொல்லலாம். குறிப்பாக, polio eradication செய்யப்பட்டு இருக்கின்றது. அதுமாத்திரமன்றி, மலேரியாவும் எங்களுடைய நாட்டில் இல்லை. இதில் முக்கியமான விஷயம் என்னவென்றால், எல்லோரும் சேர்ந்து இதனைச் செய்ய வேண்டும் என்பதுதான்.

யுத்த காலத்தில் யுத்தப் பிரதேசங்களில்கூட போலியோ வுக்கு எதிராக National Immunization Day - NID அனுஷ்டிக்கப்படும். இது Hon. (Dr.) Nihal Abeysinghe அவர்களுக்குத் தெரியும். யுத்த காலத்தில்கூட, இலங்கையின் ஏனைய பிரதேசங்களுக்கு நிகராக அல்லது அவற்றையும்விடக் கூடிய vaccination coverageஐ ஏற்படுத்திக் காட்டிய மாகாணம் எங்களுடைய வட மாகாணம்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
எனக்கு ஒரு நிமிடம் தாருங்கள்!

அந்த நேரத்தில் விடுதலைப் புலிகள் உட்பட எல்லா அமைப்புகளும் அரச சார்பற்ற நிறுவனங்களும் அதற்கு ஒத்துழைத்ததோடு, அரச ஊழியர்களும் அதற்கு ஒத்துழைப்பு நல்கினார்கள். இப்படியாக பல தரப்பட்டவர்களும் சேர்ந்து எடுத்த நடவடிக்கை காரணமாகத்தான் அங்கு மிகவும் உயர்ந்த vaccination coverageஐ ஏற்படுத்தக்கூடியதாக இருந்தது. மிகவும் வரவேற்கத்தக்க இந்தச் சட்டமூலத்தை நிறைவேற்றி நடைமுறைக்குக் கொண்டுவர வேண்டுமாக இருந்தால், இதை multi- sectoral approachமூலம் செய்து முடிக்க வேண்டும். ஒரு திணைக்களத்துக்கு மாத்திரம் பொறுப்புக் கொடுத்துவிட்டு இருக்க முடியாது. இதற்கு எங்களுடைய ஆதரவு எப்பொழுதும் இருக்குமெனச் சொல்லி, வாய்ப்புக்கு நன்றி கூறி விடை பெறுகின்றேன்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Sarath Kumara. You have nine minutes.

[අ.භා. 1.08]

ගරු නීතිඥ සරත් කුමාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி சரத் குமார)
(The Hon. Sarath Kumara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජලභීතිකා රෝගය තුරන් කිරීමේ සහ සුනඛයන් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත අද දින මෙම ගරු පාර්ලිමේන්තුවේදී විවාද කරනවා. මේක ඉතාම කාලෝචිත පියවරක්. මන්ද, විද්‍යාවේ හා තාක්ෂණයේ නිම් වළලු පුළුල් කරමින් ඉදිරියට යන ලෝකයක් තුළ අද වනවිටත් WHO දත්ත අපට කියන්නේ, වාර්ෂිකව 59,000කගේ ජීවිත ජලභීතිකා රෝගය නිසා අහිමි වන බවයි. එහෙනම් අපට මේ තිබෙන තත්ත්වය සම්බන්ධයෙන් කිසිසේත්ම සෑහීමකට පත් වෙන්න බැහැ. ඒ නිසා අපි මේ සම්බන්ධයෙන් රටක් හැටියටත්, ගෝලීය වශයෙනුත් යම් පියවරක් ගත යුතුයි කියා මම විශ්වාස කරනවා. ඒ වාගේම වාර්ෂිකව 59,000කගේ ජීවිත ජලභීතිකා රෝගය නිසා අහිමි වනකොට එහි ආසියානු හා අප්‍රිකානු කලාපීය රටවල නියෝජනය සියයට 95යි. මේක ඉතාම කනගාටුදායක තත්ත්වයක්. ජීවිත අහිමි වන 59,000න්, 35,000ක්ම නියෝජනය කරන්නේ ආසියානු_රටවල්. ඒ කියන්නේ අපේ රටවල්. මේ සමස්ත මරණ ප්‍රමාණයෙන් සියයට 68ක ප්‍රමාණයක් ආසියානු කලාපය නියෝජනය වෙනවා. මේක ඉතාම කනගාටුදායක තත්ත්වයක්. ඒ නිසා අපි හිතනවා, රටක් හැටියට අප ඉස්සරහ තිබෙන මේ අභියෝගය ජයග්‍රහණය කරන්න ඕනෑ කියලා. මෙය රටක් හැටියටත්, කලාපයක් හැටියටත් අපි ඉස්සරහ තිබෙන අභියෝගයක් කියා අප හිතනවා.

ඒ වාගේම අපට ආසන්නයෙන්ම තිබෙන රට වන ඉන්දියාව ජලභීතිකා රෝගය නිසා ආසියානු කලාපයේ සිටු වන මරණවලින් සියයට 60කට දායක වෙනවා. ඒ කියන්නේ, ඉන්දියාවේ තත්ත්වයත් එච්චර හොඳ නැහැ කියන එකයි. නමුත් චීනය මේ අභියෝගය සෑහෙන දුරකට ජයග්‍රහණය කර තිබෙනවා. චීනය

[ගරු නීතිඥ සරත් කුමාර මහතා]

2023 අවුරුද්ද වනකොට ජලභීතිකා රෝගය නිසා සිදු වන මරණ සංඛ්‍යාව 122 දක්වා අඩු කරගෙන තිබෙනවා. බංග්ලාදේශයේ මරණ 56යි. ඇෆ්ඝනිස්තානයේ මරණ 641යි. අපේ රටේ 2025 අවුරුද්ද වනකොට මේ ජලභීතිකා රෝගය නිසා සිදු වන මරණ සංඛ්‍යාව 14යි. රටක් හැටියට 2025 අවුරුද්ද වනකොට මේ ජලභීතිකා රෝගය නිසා සිදු වන මරණ ප්‍රමාණය ගත්තාම, මරණ 14ක ප්‍රමාණයේ අපි රැඳිලා ඉන්නවා. ඒ නිසායි මම මේක ඉතාම කාලෝචිත පියවරක් කියලා කිව්වේ. රටක් හැටියට අප ඉස්සරහ තිබෙන මේ මාරාන්තික ජලභීතිකා රෝගය තුරන් කිරීමේ අභියෝගය ජයග්‍රහණය කරන්න ඕනෑ කියන අධිෂ්ඨානශීලී පියවර තමයි මේ පනත් කෙටුම්පත හරහා අද අරගෙන ඇවිල්ලා තිබෙන්නේ.

ඒ වාගේම තවත් කනගාටුදායක කාරණාවක් පිළිබඳව මම කියන්න ඕනෑ. ලෝක සෞඛ්‍ය සංවිධානයේ දත්තවලට අනුව ජලභීතිකා රෝගය නිසා ලෝකය පුරා මිය යන පිරිසෙන් සියයට 40ක්ම නියෝජනය කරන්නේ අවුරුදු 15ට වඩා අඩු දරුවන්. හොඳම දේ දරුවන්ට දෙන්න වෑයම් කරන ලෝකය තුළ මේක බේදජනක තත්ත්වයක් කියා අපි හිතනවා. මෙහි වගකීම වඩාත් හොඳින් මේ රජය අවබෝධ කරගෙන තිබෙන නිසා තමයි මේ පනත් කෙටුම්පත අද පාර්ලිමේන්තුවට විවාද කිරීම සඳහා ගෙනැවිත් තිබෙන්නේ.

ඒ වාගේම ජලභීතිකා රෝගයට හේතු වන rabies virus එක ක්ෂීරපායී සත්වයින්ගෙන් ව්‍යාප්ත වෙනවා කියලා අපි දන්නවා. නමුත් අපට ප්‍රධානතම තර්ජනය ඇති වෙලා තිබෙන්නේ සුනඛයන්ගෙන්. ලෝකයේ ජලභීතිකා රෝගයෙන් මිය ගිහිල්ලා තිබෙන ප්‍රමාණය පිළිබඳව සලකා බැලුවොත්, සියයට 99ක්ම සුනඛයන්ගේ සපාකෑම් නිසා ජලභීතිකා රෝගය වැළඳිලා තමයි මිය ගිහිල්ලා තිබෙන්නේ.

මම පසුගිය වර්ෂ කිහිපය තුළ ජලභීතිකා රෝගය නිසා අපේ රටේ මරණයට පත් වුණු අය පිළිබඳව සංඛ්‍යා දත්ත කිහිපයක් ඉදිරිපත් කරන්න කැමැතියි. 2021 අවුරුද්දේ 31ක්, 2022 අවුරුද්දේ 28ක් සහ 2024 අවුරුද්දේ 20ක් මේ නිසා මිය ගිහිල්ලා තිබෙනවා. එය 2025 අවුරුද්දේදී 14 දක්වා අඩුකර ගන්න අපට පුළුවන්කම ලැබී තිබෙනවා. හැබැයි, කනගාටුදායක තත්ත්වය වන්නේ 2026 අවුරුද්දේ මේ වෙනකොට ජලභීතිකා රෝගය නිසා මරණ 14ක් අපේ රටේ වාර්තා වෙලා තිබීමයි. ඒ නිසා අපි අවුරුදු 125ක විතර අතීතයක ඉඳලා පැවත ගෙන එන ආඥාපනත් දෙකක් එකට එකතු කරලා අලුත් පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ගෙනැල්ලා තිබෙනවා. ඒ අනුව ජලභීතිකා රෝගය පිළිබඳ ආඥාපනතත්, බල්ලන් ලියාපදිංචි කිරීමේ ආඥාපනතත් ඒකාබද්ධ කරලා නව පනත් කෙටුම්පතක් හැටියට ජලභීතිකා රෝගය තුරන් කිරීමේ සහ සුනඛයන් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත මේ වනකොට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා.

ඒ වාගේම මෙම පනත් කෙටුම්පත මඟින් අපි ඉටු කරගන්න බලාපොරොත්තු වන අරමුණු මොනවාද කියලා මම කෙටියෙන් සඳහන් කරන්න කැමැතියි. වීදිවල සැරිසරන සුනඛයන් තමයි බොහෝ ප්‍රමාණයක් අපට දැකගන්න පුළුවන්කම ලැබෙන්නේ. ඒ, ඇයි? සුනඛයන් පිළිබඳව වගකීම් දරන පුද්ගලයෙක් හෝ ආයතනයක් නැති නිසා තමයි එහෙම තත්ත්වයක් ඇති වෙලා තිබෙන්නේ. ඒ නිසා සුනඛයන් එන්නත් කිරීම අනිවාර්යය කිරීමේ පියවරක් මේ පනත් කෙටුම්පත හරහා අපි ගෙනැල්ලා තිබෙනවා. ඒ වාගේම සුනඛයන් ලියාපදිංචි කිරීම, සුනඛ ගහනය පාලනය කිරීම සඳහාත් අපි කටයුතු කරනවා. එමෙන්ම වාණිජ අරමුණු වෙනුවෙන් සුනඛයන් අභිජනනය කරන මධ්‍යස්ථාන තිබෙන බව අපි දන්නවා. ඒවා මුදල් ඉපැයීමේ පරමාර්ථයට අනුව පවත්වාගෙන යනු ලබන ආයතන. එවැනි ආයතන නියාමනය කරන්නත් අපි මේ පනත් කෙටුම්පත හරහා පියවර අරගෙන තිබෙනවා.

ඒ වාගේම තමයි, ජලභීතිකා රෝගය තුරන් කිරීමේ ජාතික උපදේශක කමිටුව පිහිටුවීම. මේක ඉතාම වැදගත් දෙයක්. ඒ වාගේම මේ දක්වා පාර්ලිමේන්තුව තුළදී සාකච්ඡා වුණු කරුණුවල අපි දැකපු දෙයක් තිබෙනවා. සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය කියන මේ සියලු ආයතන අපේ රටේ ජලභීතිකා රෝගය මර්දනය කිරීම සඳහා යම් යම් පියවර ගන්නවා. මෙතැනින් එහාටත් අපි මේ සියලු ආයතන එකිනෙක සම්බන්ධ කර ගනිමින් යන සාමූහික වැඩ පිළිවෙළක් තමයි බලාපොරොත්තු වන්නේ. විශේෂයෙන් අද පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබුණාට අපි අනෙකුත් දෙපාර්තමේන්තු, ආයතනවල නිලධාරීන් සම්බන්ධ කර ගනිමින් සාමූහික ප්‍රයත්නයක් තුළින් ඉදිරියටත් ජයග්‍රහණ අත්පත් කර ගන්න බලාපොරොත්තු වනවා. ඒ නිසා ජලභීතිකා රෝගය පිළිබඳ ආඥාපනත සහ බල්ලන් ලියාපදිංචි කිරීමේ ආඥාපනතත් යන දෙකම ඒකාබද්ධ කරමින් සකස් කරන ලද මෙම පනත් කෙටුම්පත පිළිබඳව අද අපි පාර්ලිමේන්තුවේදී විවාද කරනවා.

විශේෂයෙන්ම මේ පනත් කෙටුම්පත ඇතුළේ කොටස් කිහිපයක් ඔස්සේ අපි අනුගමනය කරන්න බලාපොරොත්තු වන පියවර ඉදිරිපත් කර තිබෙනවා. I වන කොටස යටතේ තිබෙන 2වන වගන්තියේ සිට 9වන වගන්තිය දක්වා ජලභීතිකා රෝගයට එරෙහි එන්නත් කිරීම සහ සුනඛයන් ලියාපදිංචි කිරීම පිළිබඳ විධිවිධාන තමයි අපි ඉදිරිපත් කර තිබෙන්නේ. එතැනදී අපි බලාපොරොත්තු වනවා, වාර්ෂිකව එන්නත් සිදු කිරීම සහ ලියාපදිංචිය සිදු කරන්න. මේකේ වගකීම අපි භාර දෙන්නේ පළාත් පාලන ආයතනවලට. ඒ වාගේම තමයි වයස සති හය ඉක්මවන හැම සුනඛ හිමිකරුවෙකුම සුනඛයා එන්නත් කරවාගෙන පළාත් පාලන ආයතනය මඟින් ලියාපදිංචි කිරීමේ සහතිකය ලබා ගත යුතුයි. මේ සියලු කටයුතු පශු වෛද්‍යවරයෙකුගේ අධීක්ෂණය යටතේ තමයි සිදු වෙන්න ඕනෑ.

ඊළඟට, සුනඛයන් ලියාපදිංචි කිරීමේ ලේඛනයක් අපි නඩත්තු කරන්න ඕනෑ. ඒ වාගේම හැම සුනඛයෙකු සඳහාම ලියාපදිංචි අංකයක් ලබා දිය යුතුයි. ඒ වාගේම එන්නත් සහතිකය ලබා නොගත් විට ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙනුත් අපි මේ පනත් කෙටුම්පත තුළ ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාගේම අයාලේ යන සුනඛයන් එන්නත් කිරීමේ වගකීම පළාත් පාලන ආයතනයට සෘජුව පැවරෙන බව මේ අවස්ථාවේදී මම විශේෂයෙන්ම සඳහන් කරන්න කැමැතියි.

ඊළඟට, පනත් කෙටුම්පතෙහි II වන කොටසට අවධානය යොමු කළොත්, එම කොටසෙහි සුනඛ ගහනය පාලනය කිරීම පිළිබඳ විධිවිධාන ඉදිරිපත් කර තිබෙනවා. 10වන වගන්තියේ තමයි ඒ පිළිබඳ ප්‍රතිපාදන දක්වන්නේ. අයාලේ යන සුනඛ ගහනය පාලනය කිරීම සඳහා වන්ධ්‍යාකරණය සහ පුම්ගහරණය සිදු කරන්න අපි බලාපොරොත්තු වනවා. ඒ වාගේම ශල්‍යකර්මවලට භාජනය කරපු සුනඛයන් රැකබලා ගන්නත්, පශු වෛද්‍යවරුන්ගේ අධීක්ෂණය යටතේ මේ කාර්යය සිදු වෙන්නත්, වාර්තා පවත්වාගෙන යන්නත්, රාජ්‍ය හෝ රාජ්‍ය නොවන සංවිධානවල සහයෝගය මේ වෙනුවෙන් ලබා ගන්නත් අපි බලාපොරොත්තු වනවා.

ඊළඟට, පනත් කෙටුම්පතෙහි IIIවන කොටස යටතේ තිබෙන 11වන වගන්තියේ සිට 14වන වගන්තිය දක්වා අපි අවධානය යොමු කරන්නේ සුනඛ අභිජනන මධ්‍යස්ථාන නියාමනය සම්බන්ධයෙන්. අපි දන්නවා, සුනඛ අභිජනන මධ්‍යස්ථාන වාණිජ පරමාර්ථවලින් පවත්වාගෙන යන බව. හැබැයි, ඒවා නියාමනයට ලක් වෙන්නේ නැහැ. ඒ නිසා මේක ඒවා නියාමනය කරන්න පුළුවන් අවස්ථාවක් හැටියට අපි හිතනවා. එවැනි මධ්‍යස්ථාන සඳහා පළාත් පාලන ආයතනය මඟින් වාර්ෂික බලපත්‍ර ලබා දෙනවා. ඒ වාගේම බලපත්‍ර ලබා දෙන්න පෙර පූර්ව පරීක්ෂාවකට ලක් කරනවා. ඒ වාගේම තමයි, ඒ ස්ථානවලට අදාළව නිලධාරීන්ගේ ප්‍රවේශය සඳහා අපි නීති සම්පාදනය කර තිබෙනවා, මේ පනත් කෙටුම්පත හරහා. අභිජනන මධ්‍යස්ථානවලට අදාළ කොන්දේසිත් අපි ඉදිරිපත් කර තිබෙනවා.

ඒ වාගේම 11වන වගන්තිය කඩ කළොත්, එය කඩ කරන අයට විරුද්ධව දඬුවම් ලබා දෙන්නේ කොහොමද කියන එක සම්බන්ධවත් අපි පනත් කෙටුම්පතෙහි සඳහන් කර තිබෙනවා. බලපත්‍ර ලබා ගැනීම සම්බන්ධ ක්‍රියාවලියක් අපි මේ පනත් කෙටුම්පත තුළ යෝජනා කරනවා.

ඒ වාගේම IV වන කොටසෙහි සඳහන් 15වන වගන්තියේ සිට 16වන වගන්තිය දක්වා වන වගන්ති සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න මම කැමැතියි. ජලභීතිකා රෝගය ව්‍යාප්ත වීම පාලනය කිරීම සම්බන්ධ විධිවිධාන තමයි අපි මේ කොටසෙන් ඉදිරිපත් කරන්නේ. අවදානම් ප්‍රදේශ හඳුනා ගන්නේ කොහොමද? විපක්ෂයේ මන්ත්‍රීවරුන් මොහොතකට ඉස්සෙල්ලා කිව්වා, වෙනත් සතුන් හරහාත් ජලභීතිකාව ව්‍යාප්ත වෙන්න පුළුවන්, බෝ වෙන්න පුළුවන්, ඒක පාලනය කරන්නේ කොහොමද කියලා. ඒ සම්බන්ධ පැහැදිලි ප්‍රතිපාදන අපි මේ පනත් කෙටුම්පත තුළ ඉදිරිපත් කර තිබෙනවා. ඒ නිසා ජලභීතිකා රෝගය පාලනය කරගන්න ඉතාම වැදගත් සහ කාලෝචිත පනත් කෙටුම්පතක් හැටියට මම මෙය හඳුන්වන්න කැමැතියි.

අවසාන වශයෙන් මේ කාරණයත් මම කියන්න කැමැතියි. මේ පනත් කෙටුම්පතහි V සහ VI වන කොටස් වෙන් කර තිබෙන්නේ ජලභීතිකා රෝගය තුරන් කිරීමේ ජාතික උපදේශක කමිටුවක් සහ ඊට සමගාමීව ප්‍රාදේශීය උපදේශක කමිටු පත් කිරීම සඳහායි. පනත් කෙටුම්පතෙහි 17වන වගන්තියෙහි සිට 21වන වගන්තිය දක්වා මේ සම්බන්ධ ප්‍රතිපාදන සඳහන්ව තිබෙනවා.

ඒ නිසා මම හිතන්නේ මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කිසිවෙකුත් බියට පත් විය යුතු නැහැ. තවදුරටත් සංශෝධන ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව පවතින්නේ නම් ඒ සඳහාත් ඉඩකඩ විවෘතව පවතින බව මේ අවස්ථාවේදී මම ඉතා පැහැදිලිව සඳහන් කරන්න කැමැතියි. මේ පනත් කෙටුම්පතට තවදුරටත් එකතු කළ යුතු යෝජනා සහ අදහස් සම්බන්ධයෙන් ඔබ සියලුදෙනාට ඉදිරියේදී විවෘතව අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලැබෙන බව සඳහන් කරමින්, අද මේ ගරු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන ජලභීතිකා රෝගය තුරන් කිරීමේ සහ සුනඛයන් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත සම්මත කර ගැනීම සඳහා ඔබ සියලුදෙනාගේ සහයෝගයත් අපේක්ෂා කරමින් මම කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 11ක්ම ලැබෙනවා.

[අ.භා. 1.18]

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

විශේෂයෙන්ම අද පාර්ලිමේන්තුවේ විවාද කරන ජලභීතිකා රෝගය තුරන් කිරීමේ සහ සුනඛයන් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත සම්මත කර ගැනීම ඉතාම කාලෝචිත අවශ්‍යතාවක් හැටියටයි අපි දකින්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි දන්නවා, ඈත ගම්වල ජීවත් වන අහිංසක මිනිස්සු සමහර වෙලාවට බල්ලෙක් හපා කාලා ඉස්පිරිතාලයට අරන් ගියාට පස්සේ මිය යන බව. අපි ඒවා අහලා තිබෙනවා, අනන්ත අප්‍රමාණව. ඒ තත්ත්වයන් වැළැක්වීම වෙනුවෙන් මේ වාගේ අණ පනත් ගෙනැල්ලා නීතිය ක්‍රියාත්මක කිරීම ඉතා හොඳයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ එක්කම මේ වෙලාවේ තව කාරණයක් මතක් කරන්න ඕනෑ. මේ වනකොට අයිතිකාරයෝ නැති සුනඛයන් විශාල සංඛ්‍යාවක් මේ රටේ ජීවත් වනවා. අයිතිකාරයෝ ඉන්නවා නම් බොහෝ වෙලාවට ඒ සුනඛයන්ව එන්නත් කරලා බලාගන්නවා. නමුත් අයිතිකාරයෝ නැතුවත් සුනඛයන් ඉන්නවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ සුනඛයන් ගැන විශේෂයෙන් බලන්න ඕනෑ. අපි රජයට යෝජනා කරනවා, මෙවාත් ඉදිරියේ මේ පනත් කෙටුම්පතට කරන සංශෝධනවලට ඇතුළත් කරන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය ආයතන පිහිටි පරිශ්‍රවලත් සුනඛයෝ විශාල වශයෙන් ඉන්නවා. එතකොට ඒ සතුන්ගේ වගකීම කවුද භාර ගන්නේ? අපි ශ්‍රී ලංකා වරාය අධිකාරිය උදාහරණයකට ගනිමු. ඒක වැරැද්දක් නොවෙයි. යුද්ධය තිබෙන කාලයේ මුර පොළවල - checkpointsවල - මොකද කළේ? ඒ තැන්වල සුනඛයන්ව හදන්න ගත්තා. මොකද, එල්ටීටීඊ එකෙන් එනවා නම් බුරන්න ඉඩ හැරලා ඒ ප්‍රශ්නය විසඳාගන්න. නමුත් දැන් ඒ සුනඛයන් බෝ වෙලා. මොකද, වරාය ආශ්‍රිතව වැඩි වශයෙන් කෑම තිබෙනවා. කෑම දාලා සුනඛයන් බෝ වෙලා දැන් සුනඛයන් විශාල සංඛ්‍යාවක් ඒ ආශ්‍රිතව ඉන්නවා. ඒ, ජනතාව නිතර එන යන තැනක්. ධීවර වරායන් ගත්තාමත් එහෙමයි. පළාත් පාලන ආයතනවලත් එහෙමයි. ඒ ස්ථාන ආශ්‍රිතවත් සුනඛයන් ඉන්න හැටි බලන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සුනඛයන් එන්නත් කරලා ජලභීතිකා රෝගයෙන් අපේ රටේ ජනතාව ආරක්ෂා කිරීමට ආණ්ඩුව ගන්න මේ පියවර සම්බන්ධයෙන් අපේ ගෞරවය ආණ්ඩුවට පිරිනමනවා, ඒක කළ යුතු දෙයක් නිසා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ දවසේ මහ වරුසාවක් ඇද හැලුණා. ඒ වරුසාව ඇද හැලෙන වෙලාවේත්, ඊට පෙර දවස් ගණනාවක් තිස්සේත් යම් පිරිසක් විහාරමහාදේවී උද්‍යානයේ ගලගොඩ අත්තේ ඥානසාර හාමුදුරුවෝ වෙනුවෙන් සත්‍යාග්‍රහයක නිරත වෙලා ඉන්නවා. ඒ සත්‍යාග්‍රහයට නොයෙක් විධියේ බලපෑම් කළා. කොළඹ මහනගර සභාව ඒකේ තිබෙන වැසිකිළි-කැසිකිළි වහලා වතුර ටික දෙන්නේ නැතුව නොයෙකුත් විධියේ දේවල් කළා. ඊයේ දවස වනකොට ඒ තත්ත්වය තවත් එන්න එන්නම වැඩි වුණා. ඊයේ දවසේ ඒ සම්බන්ධයෙන් අධිකරණ නියෝගයක් දුන්නා. ඒක නගර සභාව ගිහිල්ලා අධිකරණයෙන් ගත්ත නියෝගයක්. ඒ අධිකරණ නියෝගය ගෙනැල්ලා මොකද කළේ? අද හොඳ පොලිස් නිලධාරිනුත් ඉන්නවා. හොඳ පොලිස් නිලධාරීන් ඉන්න අතරේ ආණ්ඩුව වෙනුවෙන් කඩේ යන්න හදන පොලිස් නිලධාරිනුත් ඉන්නවා. ඒක වැරදියි. අධිකරණ නියෝගයක් ගෙනාවාම ඒක භාර දෙන්න ඕනෑ නේ. ඒක

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

ගෙනැල්ලා මෙන්න අධිකරණ නියෝගය කියලා එතැන ඉන්න අයගේ අතට භාර දෙන්න ඕනෑ. මේ අවස්ථාවේදී අධිකරණ නියෝගය භාර දීලා තිබෙන්නේ කාන්තාවකට. ඒක කොහේ හරි අස්සේ ගහන්න ගියාම හරියනවාද? ඒක හරියන්නේ නැහැ. ඒක අධිකරණයටත් කරන අපහාසයක්. අත් දෙකට භාර දෙන්න තිබෙන අධිකරණ නියෝගය ඇඟ ඇතුළේ තිබෙන අවයව අස්සේ ගහන්න ගිහිල්ලා හරියනවාද? ඒක සුදුසු නැහැ. ඒක අධිකරණයට කරන අපහාසයක් හැටියටයි දකින්නේ. මේ සත්‍යාග්‍රහයෙන් කාටවත් පාඩුවක් නැහැ නේ, කාටවත් හානියක් නැහැ නේ? ඒ හානියක් නැති තත්ත්වය තුළ තමයි අද මේ වැරැද්ද කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ කාරණයත් ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. මොකද, ඔබතුමා බොහොම බුද්ධිමත්ව කටයුතු කරන නියෝජ්‍ය කථානායකවරයෙක්. අපි ඒ ගැන බොහොම ගෞරවයෙන් කථා කරනවා. රජය පැත්තෙන් ඔබතුමාගේ අවධානයට මා මේ කාරණය යොමු කරනවා. මේ ගැන විශේෂ අවධානයක් යොමු කරන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගලගොඩ අත්තේ ඥානසාර හාමුදුරුවන් සම්බන්ධයෙන් අධිකරණය නියෝගයක් ලබා දෙන්නේ 2018දී. 2018දී තමයි උන්වහන්සේව අවුරුදු 6කට සිරගත කරන්නේ. ඒ අනුව 2018දී උන්වහන්සේ හිරේ යනවා. හිරේ ඉන්නකොට කිසිම රජයකින්, කිසිම ජනාධිපතිවරයෙකුගෙන් උන්වහන්සේ සමාව ඉල්ලුවේ නැහැ. හැබැයි, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා උන්වහන්සේට ජනාධිපති සමාව දෙනවා. සමාව ඉල්ලුවේ නැහැ, ගලගොඩ අත්තේ ඥානසාර හාමුදුරුවෝ. නමුත් උන්වහන්සේට සමාව දුන්නා. සමාව දුන්නාම උන්වහන්සේ එළියට ආවා. ඉන් අනතුරුව නැවතත් පැමිණිලි පාර්ශ්වය ඒ ක්‍රමය වැරදියි කියලා උසාවි ගිහිල්ලා, ආපසු මේ ප්‍රශ්නය මතු වෙලා, උන්වහන්සේ නැවත සිරගත වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෛත්‍රීපාල සිරිසේන, භයවන විධායක ජනාධිපතිතුමා විසින් 2026 ඔක්තෝබර් මස 19වන දින නිකුත් කර තිබෙන මේ ප්‍රවෘත්ති නිවේදනය මා **සභාගත*** කරනවා.

මේ ප්‍රවෘත්ති නිවේදනයේ කොටසක් මම කියවන්නම්. එහි මෙසේ සඳහන් වනවා:

> "... ඉහත නඩු දෙකම පූජ්‍ය ගලගොඩ අත්තේ ඥානසාර හිමියන්ට සමාව දීම සඳහා අධිකරණ හා බන්ධනාගාර අමාත්‍යාංශයට යවා අනුමැතිය ගත යුතු බව මාගේ ජනාධිපති කාර්යාලයේ සේවය කළ නීති අංශය හාර අතිරේක ජ්‍යෙෂ්ඨ ලේකම්වරිය මා වෙත දන්වා සිටියද, අදාළ එම ඉල්ලීම අධිකරණ හා බන්ධනාගාර අමාත්‍යාංශයට යවා නැත. ඒ අනුව ඉහත කී අමාත්‍යාංශයේ අනුමැතිය නොමැතිව මාගේ අත්සන පමණක් ලබාගෙන ඇත. එය මා නොමහ යැවීමකි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් හිතන්න, මෛත්‍රීපාල සිරිසේන හිටපු ජනාධිපතිතුමා එදා ගලගොඩ අත්තේ ඥානසාර හාමුදුරුවන්ට සමාව නොදුන්නා නම්, මේ වනකොට ඥානසාර හාමුදුරුවෝ එළියේ නේද? ඇයි, උන්වහන්සේ එහෙම එළියේ ඉන්නේ? 2018දී සිර දඬුවම දුන්නේ අවුරුදු 6කටයි. 2019, 2020, 2021, 2022, 2023, 2024; භයම ඉන්න ඕනෑත් නැහැ; සමා කාලයක් එනවා. එහෙමනම්, 2024-2025 වනකොට ඥානසාර හාමුදුරුවෝ එළියට ඇවිල්ලා. හරි නේද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? ඥානසාර හාමුදුරුවෝ කාගෙන්වත් සමාව ඉල්ලුවේත් නැත්නම්, ජනාධිපති ගිහිල්ලා සමාව දීලා නම්, මෙන්න මේ වැරැද්ද වෙලා තිබෙනවා කියලා ඒ ජනාධිපතිම දැන් ලියුමක් ලියනවා නම්, වැරැද්ද වෙලා තිබෙන්නේ ලේකම්වරියකගෙන් නම්, ජනාධිපති ලේකම් කාර්යාලයෙන් නම්, ජනාධිපතිත් ඒක කියනවා නම්, එතකොට දැන් ඥානසාර හාමුදුරුවෝ හිරේ ඉන්න එක හරිද? ඥානසාර හාමුදුරුවෝ දැන් ඉන්න ඕනෑ එළියේ.

අද මුළු රටේම බෞද්ධයෝ අඬනවා. මහා සංඝ රත්නය අඬනවා. මහා සංඝ රත්නය මහ වැසි නොතකා විහාරමහාදේවී උද්‍යානයේ සත්‍යාග්‍රහයක නිරතවනවා විතරක් නොවෙයි, නුවර ඉඳලා කොළඹට පා ගමනින් වැඩියා. ඒ නිසා කරුණාකරලා මේක නිවැරදි කරන්න. මේක නිවැරදි කරන්න රජයට පුළුවන්. වැරැද්ද වෙලා තිබෙන්නේ, අධිකරණ හා බන්ධනාගාර අමාත්‍යාංශයට ලියුම යවපු නැති එක නම්, ඒක නිවැරදි කරන්න අවශ්‍ය ප්‍රතිපාදන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙනවා. මේක එසේ මෙසේ කරන්න පුළුවන් දෙයක් නොවෙයි. මේකේ වැරැද්දක් වෙලා තිබෙනවා. උන්වහන්සේට වැරැද්දට දඬුවම දුන්නා නම් හරි. එහෙනම් දඬුවම විඳලා දැන් උන්වහන්සේ එළියට ඇවිල්ලා නේ. උන්වහන්සේ දැන් ආපහු සැරයක් සිර ගෙදරට යනවා නේ. උන්වහන්සේ සමාව ඉල්ලා නැත්නම්, මේ වැරැද්ද නිවැරදි කරන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේක එච්චර සුබවාදී දෙයක් නොවෙයි. මොකද, ඒක ඒ ආකාරයට සිද්ධ නොවෙන්න නොවෙන්න, තමුන්නාන්සේලාගේ ආණ්ඩුවට මොකද වෙන්නේ?

අපි දන්නවා, එදා ජනතාව අපේ ආණ්ඩුව ප්‍රතික්ෂේප කළා. ඒක අපි පිළිගන්න ඕනෑ. ජනතාව අප ප්‍රතික්ෂේප කළා. මොකක්ද හේතුව? එදා ජනතාව තෙල් පෝලිම්වල හිටියා; ගෑස් පෝලිම්වල හිටියා; බෙහෙත් පෝලිම්වල හිටියා; කන්න නැතුව හිටියා. ඒවා ඇත්ත. මම හිටපු ඇමතිවරයෙක්, ඒ ආණ්ඩුවේ හිටපු කෙනෙක් හැටියට කියනවා, ඒක වැරදියි කියලා. ඒ වැරැද්දට ජනතාව කොහොමද උත්තර දුන්නේ? ක්‍රමක්‍රමයෙන්, ක්‍රමක්‍රමයෙන් අපෙන් ඈත් වුණා. ඈත් වෙලා මොකක්ද කළේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? අරගළයක් දක්වා ගියා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු මැරුවා. ගෙවල් ගිනි තැබුවා, විනාශ කළා.

හැබැයි, ඒ දේවල් කරලා ඉවර වෙලා ජනතාව තමන්ගේ පීඩනය කොහෙන්ද පිට කළේ? ගිය ජනාධිපතිවරණයේදීත් වැඩි ඡන්ද ප්‍රමාණයක් ලබා දීලා ඔබට ජනාධිපතිවරයෙක් හදලා දුන්නා, පාර්ලිමේන්තු මැතිවරණයේදීත් ඔබට තුනෙන් දෙකක බලයක් දුන්නා. දැන් මොකක්ද වෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? දැන් අවුරුදු දෙක ඉවරයි, ඔබේ ආණ්ඩුවට. අවුරුදු දෙක ඉවර වනකොට අර අපට වෙව්ව වැඩේම කැරකි කැරකි ඔබට එනවා. මොකක්ද ඒ? තරහ වෙන ප්‍රමාණය වැඩි වෙනවා. ඔබ දාලා යන ප්‍රමාණය වැඩි වෙනවා. දැන් ගත්තොත් කවුද දාලා යන්නේ? දැන් තමුන්නාන්සේලා තරහ කරගෙන තිබෙන්නේ කවුද? මේ රටේ මහා සංඝ රත්නය. ඉතිහාසයේ රජවරුන්වත් මහා සංඝ රත්නය එක්ක තරහ වෙලා, රණ්ඩු වෙලා නැහැ. සංඝ රත්නයට එදා ඇහුම්කන් දුන්නා; අනුශාසනා ලබා ගත්තා. අද මහා සංඝ රත්නය තරහයි. මහා සංඝ රත්නය තරහයි නම්, සිංහල බෞද්ධයා කොහොමත් තරහයි. ජනතාව මාලිමාවට ගෙඩියට ඡන්දය දුන්නේ. දැන් තරහයි. මහා සංඝ රත්නයත් තරහයි. ඊළඟට තරහ කවුද? නීතිඥවරු. මේ රටේ උගත් නීතිඥවරු, නීතිඥ සංගමය තරහ වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ විතරක් නොවෙයි, ගොවියෝ තරහ වෙලා. අද වනකොට ගොවියෝ පාරට ඇවිල්ලා කෑ ගහනවා. ධීවරයෝ තරහ වෙලා, රාජ්‍ය සේවකයෝ තරහ වෙලා, ත්‍රිරෝද රථ හිමියෝ තරහ වෙලා. මාලිමා ආණ්ඩුව හදන්න ලොකු සේවයක් කළ ඒ අය තරහ කර ගැනීම එච්චර සුබවාදී නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක සුබවාදී නැහැ.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ඒක සුබවාදී නැති බව තේරුම් ගන්න ආණ්ඩුවට ඕනෑ නම් ඒක උරගා බලන්න. අපට ජනප්‍රියභාවය තිබෙනවාද, ජනතාව ඡන්දය දෙනවාද, අපේ ජනප්‍රියභාවය හොඳින් තිබෙනවාද කියලා ආණ්ඩුවට බලා ගන්න ඕනෑ නම් අවුරුදු ගණනාවකින් තියලා නැති පළාත් සභා ඡන්දය තියන්න කියලා අපි යෝජනා කරනවා. එතකොට බලා ගන්න පුළුවන්, ආණ්ඩුවට ජනතා ප්‍රසාදය තිබෙනවාද නැද්ද කියන එක. රැස්වීමකට 5,000ක් - 6,000ක් ගෙනෙන එක නොවෙයි ජනතා මතය. ඒක කරන්න පුළුවන්. අපි ඔය ඔක්කෝම කරපු අය. මම පාර්ලිමේන්තුවේ අවුරුදු 30ක් තිස්සේ ඉන්නවා. අපි ඔය ඔක්කෝම කළා. ආණ්ඩුව ගැනත් දන්නවා, විපක්ෂය ගැනත් දන්නවා. ඔය දෙකේම ඉඳලා අවුරුදු 30ක අත්දැකීම් එක්කයි මම මේ කථා කරන්නේ. ජනතාව යාළු වෙනවා වාගේම තමයි තරහත් වෙනවා. යාළු කර ගන්න ටිකක් ලෙහෙසියි. තරහ වුණාම ආපසු යාළු කර ගන්න ලෙහෙසි නැහැ. දාලා යන්නේ නිකම් නොවෙයි හෝල්සේල් එකේ. එහෙමයි ජනතාව. ජනතාව අපි දිහා බලාගෙන ඉන්නවා. සමහර වෙලාවට බලය තිබෙනකොට අපි ළඟ ඉන්න අය කියන්නේ, හරි, හරි, මල් පිපෙනවා, ගෙඩි හැදෙනවා, රටම ලස්සනයි, විල්ලුද පලස් තිබෙනවාය කියායි. එහෙම වෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ නිසා මම බොහොම පැහැදිලිව කියනවා, රජයක් හැටියට ගෙනාපු මේ පනත් කෙටුම්පත හොඳ වැඩක් කියලා. නමුත් මේ රටේ ආණ්ඩුව කෙරෙහි තිබෙන අප්‍රසාදය වැඩි වන බව පෙනී යනවා කියන එකත් මම මතක් කරනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Mrs.) Hiruni Wijesinghe. You have eight minutes.

[අ.භා. 1.30]

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹிருணி விஜேசிங்ஹ)
(The Hon. (Mrs.) Hiruni Wijesinghe, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ කථා කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට මම බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. අද දවසේ විවාදයට ගන්නා පනත් කෙටුම්පත ගැන කථා කිරීමට කලින් මම පොඩි පැහැදිලි කිරීමක් කරන්නට කැමැතියි.

ජනාධිපති පොදු සමාව කියන්නේ එසේ මෙසේ දෙයක් නොවෙයි. ඒක දීර්ඝ ක්‍රියාවලියක්. ඒ සඳහා කළ යුතු දේවල් තිබෙනවා. නිසි පිළිවෙළට ඒ ක්‍රියාවලිය අනුව කටයුතු කරන්නේ නම් ජනාධිපති පොදු සමාව ලබා ගැනීමට හැකියාව තිබෙනවා. ඒ ක්‍රියාවලිය අනුව කටයුතු නොකළ අවස්ථා කිහිපයක්ම අපේ ඉතිහාසයේ තිබෙනවා. පාස්කු ප්‍රහාරයේ නඩුව උදාහරණයකට ගන්න කෝ. එහිදී පවා මෛත්‍රීපාල සිරිසේන හිටපු ජනාධිපතිතුමා ඒ සිදුවීම වෙන කෙනෙකුගේ ඇහේ ගැසීමක් තමයි සිද්ධ කළේ. යම්කිසි ක්‍රියාවලියක්, රටේ යම්කිසි ගැටලුවක් පැන නැඟුණාම ඒක කාගේ හරි නිලධාරියෙකු මත පටවලා තමන් අත පිහ දා ගන්න පුරුද්දක් එතුමාට තිබෙනවා. දැන් පොදු සමාව සම්බන්ධයෙන් නිලධාරිනියෙකුගේ අඩුපාඩුවක් කියලා තමන් අත පිහ දා ගන්න තමයි එතුමාගේ බලාපොරොත්තුව. නමුත් එතුමාටත් වගකීමක් තිබුණා, ඒ ක්‍රියාවලිය නිසි ලෙස සිදු වෙලාද තිබෙන්නේ කියලා සොයා බලන්න. එසේ වුණා නම් මෙවැනි ප්‍රශ්නයක් අද දවසේ ඇති වෙන්නේ නැහැ.

මිනිසාගේ පරම මිතුරා, පරම ආරක්ෂකයා, සුරතලා, හිතවතා වන සුනඛයන් සම්බන්ධයෙන් අදාළ වන ජලභීතිකා රෝගය තුරන් කිරීමේ සහ සුනඛයන් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත පිළිබඳව තමයි අද දවසේ පාර්ලිමේන්තුවේදී විවාද කරන්නේ. ඒක සුවිශේෂී පනත් කෙටුම්පතක්. මේ පනත් කෙටුම්පත ගෙන ඒමට ප්‍රථමයෙන් human rabies සහ animal rabies සම්බන්ධයෙන් සම්පූර්ණයෙන්ම වගකීම් ටික දැරුවේ, ක්‍රියාමාර්ග ගත්තේ, එන්නත්කරණ කටයුතු සිදු කළේ සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ. නමුත් මේ පනත් කෙටුම්පත හරහා ඒ සියලු වගකීම් පළාත් පාලන ආයතනවලට සහ පශු වෛද්‍ය නිලධාරියා ඇතුළු ඔහුගේ කාර්ය මණ්ඩලයට පැවරෙනවා.

මේ පනත් කෙටුම්පතේ ප්‍රතිපාදන යටතේ 2වන වගන්තියේ සිට 9වන වගන්තිය දක්වා සුනඛයන් ලියාපදිංචිය සහ වාර්ෂික එන්නත්කරණය පිළිබඳව විධිවිධාන සලස්වා තිබෙනවා. එහි 2වන වගන්තියෙන් සෑම සුනඛයෙකුම වාර්ෂිකව ජලභීතිකාවට එරෙහිව එන්නත්කරණය සිදු කර පළාත් පාලන ආයතනවල ලියාපදිංචි කළ යුතු වෙනවා. ඒ වාගේම වයස සති 6කට වැඩි සුනඛයන්ව ඔවුන්ගේ හිමිකරු හෝ භාරකරු ලියාපදිංචි කිරීම සිදු කළ යුතු වෙනවා. එන්නත්කරණ කටයුතු පශු වෛද්‍ය නිලධාරීවරයා හෝ ඔහුගේ අධීක්ෂණය යටතේ අදාළ වෙනත් නිලධාරීන් මඟින් සිදු කිරීමේ හැකියාව තිබෙනවා. මේ ඔස්සේ වසරක් ඇතුළත තමන්ගේ නිවසේ ඉන්න සුරතලුන් ටික ලියාපදිංචි කර ගැනීම සිද්ධ කරන්න ඕනෑ.

හැබැයි, සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ එන්නත්කරණ කටයුතු ක්‍රියාත්මක කරද්දී ප්‍රායෝගිකව අපි අභියෝගයකට මුහුණ දීලා තිබෙනවා. ගමට ගිහිල්ලා අහවල් දවසේ මෙන්න මේ ස්ථානයට එන්නත්කරණ කටයුතු සඳහා එනවා, තමන්ගේ සුනඛයා අරගෙන ඇවිත් එන්නත්කරණය කරගෙන යන්න කියලා නිවේදනයක් නිකුත් කළත්, ගම්වල ඉන්න ජනතාව තමන්ගේ නිවසේ ඉන්න සුනඛයාව ඒ ආකාරයෙන්ම එන්නත්කරණ කටයුතු සඳහා රැගෙන එන්නේ නැහැ. අන්න, ඒ නිසා තමයි මේ වසර වනවිටත් සියයට 54කට වාගේ ආසන්න ප්‍රමාණයකට පමණක් එන්නත්කරණ කටයුතු සිදු කරන්න හැකියාව ලැබී තිබෙන්නේ. මොකද, ගමට ගිහින් කිව්වාට ඒ සියලු සතුන් අරගෙන ජනතාව එන්නේ නැහැ.

එවැනි තත්ත්වයන් යටතේ ජලභීතිකා රෝගය පාලනය කරන්නේ කොහොමද? මේ පනත් කෙටුම්පත යටතේ ඒකට provision එකක් තිබෙනවා. මගේ නිවසේ සිටින සතාව එන්නත්කරණය කර ගන්නවා. හැබැයි, අසල්වාසී නිවසක සිටින සතුන්ව එන්නත්කරණ කටයුතුවලට යොමු කරන්නේ නැහැ. එවැනි අවස්ථාවකදී අදාළ පළාත් පාලන ආයතනයට දැනුම්දීමක් කරලා එහෙම නැත්නම් පළාත් පාලන ආයතනය විසින් යම්කිසි විමසීමක් කරගෙන යද්දී එම සතාට අදාළව එන්නත්කරණය පිළිබඳ සහතිකය ඉදිරිපත් කිරීමට ඒ නිවැසියන් අපොහොසත් වුණොත් දඩයක් හිමි වෙනවා. හැබැයි, ඊට පෙර දවස් 14ක සාධාරණ කාලයක් ලැබෙනවා. ඊටත් අමතරව විශේෂ හේතු තිබෙනවා නම් තවත් දවස් 14ක කාලයක් ලැබෙනවා. පැරණි පනත යටතේ රුපියල් 20ක් තමයි ලියාපදිංචි නොකළොත් දඩය වශයෙන් ගෙවන්න තිබුණේ. හැබැයි, නව පනත අනුව රුපියල් 2,000ක දඩයක් ගෙවා තමයි ලියාපදිංචි කිරීම සිද්ධ කරන්න වෙන්නේ.

අයාලේ යන සතුන් ඉන්නවා නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ අයාලේ යන සතුන් සම්බන්ධයෙන් සම්පූර්ණ වගකීම ප්‍රාදේශීය සභාව දැරිය යුතුයි. එන්නත්කරණ කටයුතුද, වන්ධ්‍යාකරණ කටයුතුද කියන සියල්ල පළාත් පාලන ආයතනවලින් සිද්ධ කරන්න ඕනෑ. ඒ වාගේම, මේ සුරතල් සතුන් ත්‍යාග වශයෙන් දීමෙන්, විකිණීමෙන් හෝ වෙනත් කෙනෙකුට හුවමාරු කිරීමේදී අදාළ වර්ෂයට මූලිකව ලියාපදිංචි කිරීම් කර නැත්නම් ලියාපදිංචි කිරීම නැවත සිද්ධ කරන්න ඕනෑ. ලියාපදිංචි කරලා නම් එහෙම ගැටලුවක් නැහැ.

[ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය]

මෙහිදී මම මේ කාරණය පිළිබඳවත් විශේෂයෙන් කියන්න කැමැතියි. අප විසින් මේ පනත් සංශෝධනය කරන්නේ ඇයි? මොකද, 2030 අවුරුද්ද වෙද්දී අපි මේ රටින් ජලභීතිකා රෝගය දුරලන්න ඕනෑ කියලා එක ඉලක්කයක ඉන්නවා. ලෝකයත් එම ඉලක්කයේ ඉන්නවා. මේ වෙද්දී භූතානය, චිලී, මෙක්සිකෝව, ජපානය වාගේ රටවල් රාශියක් ජලභීතිකා රෝගය තුරන් කරපු රටවල් බවට පත් වෙලා තිබෙනවා. ලොව පුරා සිදු වී තිබෙන මිනිස් ජලභීතිකා මරණවලින් ආසන්න වශයෙන් සියයට 36ක් සිදු වී තිබෙන්නේ අසල්වාසී ඉන්දියාවේ. ලංකාවේ තිබෙන දත්ත එක්ක බැලුවාම ජලභීතිකා රෝගයෙන් සිදු වූ මරණවලින් වැඩිම ප්‍රමාණයක් වාර්තා වන්නේ මා නියෝජනය කරන පුත්තලම දිස්ත්‍රික්කයේ. එයිනුත් කල්පිටිය ප්‍රදේශයේ තමයි වැඩිම මරණ සංඛ්‍යාවක් වාර්තා වෙලා තිබෙන්නේ. ඉතින්, එම දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරුන් හැටියට අපි මේ පිළිබඳව බොහෝ අවස්ථාවලදී දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලදී අවධානය යොමු කර කටයුතු කරනවා.

මෙහි සුවිශේෂී කාරණයක් හැටියට මා මෙම කාරණය දකිනවා. මෙම පනත් කෙටුම්පතේ IIIවන කොටස යටතේ 11 සිට 14 දක්වා වගන්තිවල දක්වා තිබෙනවා, අභිජනන මධ්‍යස්ථාන විධිමත්ව පවත්වාගෙන යෑමට අදාළ වන ප්‍රතිපාදන පිළිබඳව. මොකද, වර්තමානයේ ව්‍යාපාරයක් හැටියට සුරතල් සුනඛ පැටවුන් අළෙවි කිරීම සිදු කරනවා. එවැනි අභිජනන මධ්‍යස්ථාන පවත්වාගෙන යනවා. මේ දක්වා ඔවුන්ට අදාළ guidelines තිබුණේ නැහැ. ඉතින්, මේ පනත් කෙටුම්පතේ 11 සිට 14 දක්වා ඒ සඳහා වන ප්‍රතිපාදන නිකුත් කර තිබෙනවා. ඒ සතුන්ට සුදුසු වාතාශ්‍රය, ප්‍රමාණවත් ආහාර පාන ඇතුළු අවශ්‍ය කරන සියලු පහසුකම් ලබා දීම අදාළ මධ්‍යස්ථානය භාර අය විසින් සිද්ධ කරන්න ඕනෑ. රෝග පැතිරීම පාලනය කිරීම සිද්ධ කරන්න ඕනෑ. එහෙම නොකළොත් රුපියල් 10,000ක දඩ මුදලක් ගෙවීමට හෝ මාස 2කට නොඅඩු කාලයකට රක්ෂිත බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඬුවම් දෙකම එකවිට විඳීමට ඔවුන්ට සිද්ධ වෙනවා.

ඊට අමතරව අපි දන්නවා, දවසකට සුනඛයන් සපා කෑම 2,000කට ආසන්න ප්‍රමාණයක් වාර්තා වන බව. එවැනි තත්ත්වයන් තුළ මහජනතාවට විශේෂ වගකීමක් තිබෙනවා, එන්නත්කරණ කටයුතු සිදු කර තමන්ගේ සුනඛයන් ආරක්ෂා කර ගැනීමට. යම්කිසි අවස්ථාවක තමන් භාරයේ සිටින සුනඛයෙක් ජලභීතිකා රෝගයෙන් පෙළෙමින් අයාලේ යන විට හසු වුවහොත් ඒ සතාගේ අයිතිකරුවන් - භාරකරුවන් - සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කරන්න පුළුවන්, මහෙස්ත්‍රාත් අධිකරණයේ. ඒ වාගේම, තමන්ගේ සුනඛයාට ජලභීතිකා රෝගය වැළඳී ඇති බව දැන-දැනත් එම සුනඛයා තමන්ගේ නිවසේ තබාගෙන අදාළ පළාත් පාලන ආයතනයට දැනුම් දෙන්නේ නැත්නම් ඒ අවස්ථාවේදීත් නීතිය ක්‍රියාත්මක කිරීමට මහෙස්ත්‍රාත් අධිකරණයට බලය තිබෙනවා. ඊට අමතරව, යම්කිසි ප්‍රදේශයක අයාලේ යන සුනඛයෙකුට ජලභීතිකා රෝගය වැළඳී තිබෙනවා නම් ඒ අවස්ථාවේදී ක්‍රියාත්මක වෙන්න ඕනෑ, පළාත් පාලන ආයතනයයි. ඒ අවස්ථාවේදී පළාත් පාලන ආයතනය ක්‍රියාත්මක වුණේ නැත්නම් පළාත් පාලන ආයතනයට එරෙහිව ද මහෙස්ත්‍රාත් අධිකරණයේදී නීතිය ක්‍රියාත්මක කරන්න පුළුවන්. ඔය කියපු කාරණා ත්‍රිත්වයටම රුපියල් 10,000ක දඩය අදාළ වෙනවා.

මෙම පනත් කෙටුම්පත අද දවසේදී සම්මත කිරීමක් සිදු නොවන නිසා මම විශේෂයෙන්ම යෝජනාවක් කරන්න කැමතියි. සුනඛ අභිජනන මධ්‍යස්ථාන පිළිබඳව දක්වලා තිබෙන ඒ Clause එක හා සමගාමීව සුනඛයින් රැඳවුම් මධ්‍යස්ථාන සම්බන්ධයෙන් ප්‍රතිපාදන මෙහි ඇතුළත් වෙන්නේ නැහැ. අපේ ලංකාවාසීන් විදේශගත වීමේදී එහෙම නැත්නම් විනෝද චාරිකා යද්දී, වන්දනා ගමන් යද්දී තමන්ගේ ගෙදර ඉන්න සුනඛයාව සුනඛ රැඳුම් මධ්‍යස්ථානවල නවත්වලායි යන්නේ. ඒ මධ්‍යස්ථානවලට අදාළ වන නීති ප්‍රතිපාදන මේ පනත් කෙටුම්පතට එකතු කරන්නේ නම් වඩාත් වටිනා බව මා යෝජනා කරමින්, මට කාලය ලබා දීම සම්බන්ධව ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Leader of the Opposition. You have an allocation of 12 minutes.

[අ.භා. 1.39]

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ජලභීතිකා මර්දන ව්‍යාපාරය සහ එය ක්‍රියාත්මක කිරීමේ වැඩ පිළිවෙළ පිළිබඳව සාකච්ඡාව වෙන මේ මොහොතේ ආරම්භයේදීම මා විශේෂයෙන් කාරණයක් සඳහන් කරන්නට කැමතියි. මේ පනත් කෙටුම්පතේ බොහෝ කරුණු කාරණා පිළිබඳව එකඟ වන්නට පුළුවන්කම තිබුණත්, විශේෂයෙන්ම මම අවධානය යොමු කරනවා, එහි හතරවෙනි වගන්තියට. ඒ වගන්තිය හරහා ජලභීතිකා රෝග නිවාරණ ක්ෂේත්‍රයේ යම්කිසි සාධනීය වෙනසක් ඇති කරන්නට බලාපොරොත්තු වනවා. ඇත්ත වශයෙන්ම මහජන සෞඛ්‍ය වෛද්‍ය අංශය යටතේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක කාර්යාල කේන්ද්‍ර කරගෙන, වසංගත රෝග නිවාරණ අංශය යටතේ ඒ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය මුල් කරගෙන ක්‍රියාත්මක වුණු වැඩසටහන -ඒ කියන්නේ ජලභීතිකා රෝග නිවාරණ ක්ෂේත්‍රයේ එන්නත් ක්ෂේත්‍ර සහකාර නිලධාරින් සම්බන්ධ කරගෙන ක්‍රියාත්මක වුණු වැඩසටහන- සහමුලින්ම පශු වෛද්‍ය ඒකකය හරහා ක්‍රියාත්මක කිරීමේ වෙනස තුළ යම් යම් ගැටලුකාරී තත්ත්වයක් නිර්මාණය විය හැකියි. 2018 වසරේ රාජිත සේනාරත්න අමාත්‍යවරයාගේ කාල වකවානුව තුළ මේ ආකාරයේම වෙනස් කිරීමක් ක්‍රියාත්මක වීම තුළ ජලභීතිකා මර්දන ව්‍යාපාරයේ යම්කිසි පලුදු වීමක් සිද්ධ වුණා. මෙන්න මේ කාරණාව පිළිබඳව වැඩිදුරටත් සොයා බලා පශු වෛද්‍ය ක්ෂේත්‍රයත් ඒ වාගේම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි ක්ෂේත්‍රයත් ඒ දෙකේම සම්බන්ධකම තුළ පශු එන්නත් ක්ෂේත්‍ර සහකාර නිලධාරින්ගේත් ප්‍රයෝජනය ලබාගෙන, PHIsලාගෙත් ප්‍රයෝජනය ලබාගෙන, වඩාත් ප්‍රශස්ත, ප්‍රබුද්ධ වැඩ පිළිවෙළකට අවතීර්ණ වීම ඉතාම වැදගත් කියන එක මම මේ අවස්ථාවේ පෙන්වා දෙන්න කැමතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මොහොතේ ජාතික වැදගත්කමකින් යුත් කරුණු කිහිපයකුත් ඉදිරිපත් කරන්නට මා අදහස් කරනවා. විශේෂයෙන් අපි දුටුවා, විහාර මහා දේවි උද්‍යානයේ ඉතාම සාමකාමී, වගකිවයුතු ආකාරයට ගෞරවනීය ස්වාමීන්ද්‍රයන් වහන්සේලා ප්‍රමුඛ අපේ රටේ සිවිල් පුරවැසියන් යම්කිසි උද්ඝෝෂණයක නිරත වී සිටිනවා. ඒක ඇත්ත වශයෙන්ම ගෞරවනීය මහා සංඝ රත්නයේත් ඒ සඳහා සහභාගි වුණු අපේ රටේ සිවිල් පුරවැසියන්ගේත් මූලික අයිතිවාසිකමක්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වන පරිච්ඡේදය තුළ එය ඉතාම පැහැදිලිව සඳහන් වෙලා තිබෙනවා. තමන් විශ්වාස කරන අදහසක් තුළ, මතයක් තුළ උද්ඝෝෂණය කිරීමේ, එකට එකතු වෙලා සාමකාමීව ප්‍රජාතන්ත්‍රවාදීව කටයුතු කිරීමේ ඒ අයිතිය තිබෙනවා. විශේෂයෙන්ම ඒ අයිතිය පිළිබඳව රජයේ පාර්ශ්වය නොදන්නවා

නම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වන පරිච්ඡේදය යටතේ තිබෙන 14වන ව්‍යවස්ථාව බලන්න. ඒ 14වන ව්‍යවස්ථාව යටතේ තිබෙනවා, සාමකාමීව රැස්වීමේ නිදහස, භාෂණයේ නිදහස, අදහස් ඉදිරිපත් කිරීමේ නිදහස. දැන් සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? වර්තමාන රජය උසාවි නියෝගයක් අරගෙන විහාරමහාදේවී උද්‍යානයේ සිට නිදහසේ අදහස් ඉදිරිපත් කරපු ගෞරවනීය මහා සංඝ රත්නය ප්‍රමුඛ සිවිල් ප්‍රජාව එතැනින් ඉවත් කරන්නට කටයුතු කරලා තිබෙනවා පමණක් නොවෙයි, ඒ උසාවි නියෝග භාර දීමේ ක්‍රියාවලිය සමහර නිලධාරීන් ඉතාම අශීලාචාර ආකාරයට සිදුකර තිබෙනවා. කාන්තාවන්ගේ වස්ත්‍රය තුළට ඒ උසාවි නියෝග ඇතුළු කිරීම මම හිතන්නේ ඉතාම වැරදි ක්‍රියාවක්; ලජ්ජා සහගත ක්‍රියාවක්. උසාවි නියෝගයක් භාර දෙන ක්‍රමවේදයක් තිබෙනවා. එක අතකින්, අර රැස් වුණු මහා සංඝ රත්නය ප්‍රමුඛ ඒ සිවිල් පුරවැසියන්ට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ තිබෙන තමන්ගේ මූලික අයිතියක් වන භාෂණයේ නිදහස, රැස්වීමේ නිදහස, අදහස් ඉදිරිපත් කිරීමේ නිදහස එක පැත්තකින් වළක්වලා, එය වළක්වාලන උසාවි නියෝග අශිෂ්ට, අශීලාචාර, ඉතාම පහත් ක්‍රමවේදයක් තුළ ලබා දෙන්නට යාම; කාන්තාවන්ගේ වස්ත්‍රය ඇතුළට උසාවි නියෝග ඔබන ඒ වැරදි ක්‍රියාව, ඒ අශීලාචාර ක්‍රියාව ක්‍රියාත්මක කිරීම අප මේ අවස්ථාවේ තරයේ හෙළා දකිනවා. ඒ නිසා විශේෂයෙන්ම මා මේ අවස්ථාවේදී කියන්න කැමතියි, භාෂණයේ නිදහස ආරක්ෂා කරන්නට, ශක්තිමත් කරන්නට රජය කටයුතු කරන්නට ඕනෑය කියන එක. ඔබට ජනවරමක් ලැබුණේ අන්න ඒ දේ කරන්න.

ඒ වාගේම අද වන විට රජය අදහස් කරනවා, ප්‍රධාන පනත් කෙටුම්පත් දෙකක් ක්‍රියාත්මක කරන්න. රජය විසින් ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත - PST Bill - සහ සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පත ගැසට් කරලා, ඉදිරිපත් කරලා තිබෙනවා. මොකක්ද, මේකෙන් වෙන්නේ? විධායකයට අසීමිත බලතල ලැබෙනවා. අත්අඩංගුවට ගැනීම, රඳවා ගැනීම, සෝදිසි කිරීම සම්බන්ධයෙන් විධායකයට අධික බලතල ලැබෙනවා පමණක් නොවෙයි, පුද්ගල නිදහස තීරණාත්මක වන අවස්ථාවලදී අධිකරණයේ අධීක්ෂණයත් අද සීමා කරලා තිබෙනවා.

මේක අපි බලන්න ඕනෑ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතත් ආශ්‍රිතවයි. විශේෂයෙන්ම දශක හතරකට වැඩි කාලයක් දේශපාලන විරුද්ධවාදීන්, ක්‍රියාකාරීන්, මාධ්‍යවේදීන් මර්දනය කරන්න ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ක්‍රියාත්මක කළා. හොඳම උදාහරණය තමයි නීතිඥ හිජාස් හිස්බුල්ලා මැතිතුමාගේ සිදුවීම. එතුමාව 2020 අප්‍රේල් 14 වෙනිදා අත්අඩංගුවට අරගෙන මාස 22ක් දින 662ක් රඳවා තබා ගත්තා. අවසානයේ අභියාචනාධිකරණය තීන්දු කළා නීතිය අවභාවිත වෙලා තිබෙනවා කියන කාරණය.

දැන් මේ අලුතෙන් අණපනත් ගෙනෙන්නේ කොහොමද? කාරක සභා වාර්තාවෙන් බැහැර වෙලා කටයුතු කර තිබෙනවා. ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත සමාලෝචනය කරපු කාරක සභාවේ අනුමත කෙටුම්පත සහ ගැසට් කළ කෙටුම්පත අතර සැලකිය යුතු පරස්පරතාවක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒ කියන්නේ, ඒ කණ්ඩායම විසින් ඉදිරිපත් කරපු යෝජනා ගැසට් කරනවා කියලා, අවසානයේ ඒ කණ්ඩායමේ - කාරක සභාවේ- සාමාජිකයන්ගේ ඇස්වලට වැලි ගහලා තමන්ට ඕනෑ දේ ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වාගේම ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත මඟින් අනර්ථකාමී වෙනස්කම් ඇති වෙනවා. මහෙස්ත්‍රාත්වරයාගේ අභිමතානුසාරී බලය සීමා කරනවා. අනිවාර්ය රිමාන්ඩ් කරවීම, මහාධිකරණයෙන් පමණක් ඇප ලබා ගැනීම, මුල් මාස දෙකෙන් පසු රඳවා ගැනීම් දීර්ඝ කිරීම, ඒවාට මහෙස්ත්‍රාත් අනුමැතිය අවශ්‍ය නොවීම යනාදී මේ කරුණු තුළින් ඇත්තවශයෙන්ම මානව අයිතිවාසිකම් උල්ලංඝනය වෙනවා. ඒ වාගේම සංවිධාන තහනම් කිරීම් සහ ඒ ආකාරව බලතල පුළුල් වීම, "නිශ්චිත පුද්ගලයා" කියන ඒ නිර්වචනය, ජනාධිපතිවරයා වෙත කේන්ද්‍රගත වී තිබෙන බලතල ඉහළ යෑම, පළාත් සභා සාමාජිකයන් ද ඇතුළත් කිරීමේ ක්‍රමවේදය කියන මේ සෑම ආකාරයකින්ම ප්‍රජාතන්ත්‍රවාදය කෙලෙසෙනවා; ප්‍රජාතන්ත්‍රවාදය කප්පාදු වෙනවා.

ඊළඟට, රජය වෙත කරන ඉල්ලීම් සහ අධිකරණ ක්‍රියාමාර්ග ගැන කිව යුතුයි. ඇත්ත වශයෙන්ම අධිකරණ ඇමතිවරයා වෙත ලිඛිතව දන්වා කිසිදු පිළිතුරක් නොලැබුණු අවස්ථාවේ තමයි ශ්‍රී ලංකා නීතිඥ සංගමය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 (1) ව්‍යවස්ථාව යටතේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමේ පෙත්සම් ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පතත් අතිශය පුළුල් පරාසයක් දක්වා ව්‍යාප්ත වනවා. කර්තෘ හිමිකම්, වෙළෙඳ ලකුණු, සුරා බදු, වන සංරක්ෂණ, සූදු බලපත්‍ර යනාදි ක්ෂේත්‍ර පිළිබඳව තිබෙන වැරැදි ඊට ඇතුළත් වනවා. වැරැදි 'වැරැදි' හැටියට අපි දකිනවා. එකේ කිසිම ගැටලුවක් නැහැ. නමුත්, දරුණු අපරාධ ගණයට මේවා ඇතුළත් කිරීම තුළ අප බලන්න ඕනෑ මානව අයිතිවාසිකම්වලට මොකක්ද සිද්ධ වෙන්නේ කියලා. අවසරයකින් තොරව ගීත ගායනා කරන ආධුනික සංගීත කණ්ඩායම් වැනි පාර්ශ්ව පවා සංවිධානාත්මක අපරාධකරුවන් බවට පත් කිරීමේ හැකියාව තිබෙනවා. ඇඳුම් පැලඳුම් විලාසය, පව්ව කෙටීම, දිගු කොණ්ඩය, විවිධ ඕතුරන් ඇසුරු කිරීම කියන කාරණා මත පදනම්ව තරුණයන් සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක සාමාජිකයන් ලෙස ඇතුළත් කිරීමේ බරපතළ, භයංකාර තත්ත්වයක් තිබෙනවා. ඒ වාගේම සාක්ෂි නීති වෙනස් කිරීම තුළ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය උල්ලංඝනය වනවා; ඒවා පලුදු වනවා.

ඒ නිසා මෙන්න මේ කාරණා පිළිබඳව අවධානය යොමු කරලා රජය ක්‍රියාත්මක කරන්න හදන ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත -PST Bill- සහ සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පත -POCB- මේ තිබෙන ආකාරයෙන් ක්‍රියාත්මක නොකොට ඒවා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට -international standards- අනුව ක්‍රියාත්මක කිරීම වැදගත්. ඇත්ත වශයෙන්ම අපේ රටට ජාතික ආරක්ෂාව පිළිබඳ පනතක් අවශ්‍ය බව අපි විශ්වාස කරනවා. මොකද, ජාතික ආරක්ෂාව ඉතාම වැදගත්. ඒ වාගේම ත්‍රස්තවාදය වැළැක්වීමත් ඉතාම වැදගත්. නමුත්, මේවා ජාත්‍යන්තර සම්මුතීන් තුළ සහ එකඟතා තුළ, ජාත්‍යන්තර ප්‍රඥප්ති තුළ, ඒ වාගේම පිළිගන්නා වූ ක්‍රමවේද තුළ ක්‍රියාත්මක කිරීම අතිශයින් වැදගත් කියන කාරණයත් මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න කැමැතියි. අද රැකියා විරහිත උපාධිධාරීන් 80,000ක් ඉන්නවා. 80,000ක්! ඊට අමතරව, ගුරු ක්ෂේත්‍රයේ තවමත් නිශ්චිත ස්ථාවරයක් නොමැතිව ගුරු සංවර්ධන නිලධාරීන් 16,000ක් ඉන්නවා. මේ රටේ රැකියා විරහිත උපාධිධාරීන් 80,000 මේ රජය බිහි කරන්නට සුවිශාල කර්තව්‍යයක් ඉෂ්ට සිද්ධ කළා. ඔබතුමන්ලා දිස්ත්‍රික්ක මට්ටමින් ගිහිල්ලා රැකියා විරහිත උපාධිධාරී සංගම් පිහිටෙව්වා. ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා එම කාරණාව දන්නවා. එදා රැකියා විරහිත උපාධිධාරීන්ට රස්සා දෙන්න පොරොන්දු වුණා; රජයේ රැකියා ලබා දෙනවා කිව්වා. දිස්ත්‍රික්ක මට්ටමින් ගිහිල්ලා ඒ සංගම්වල සාමාජිකයන්ට, සාමාජිකාවන්ට කිව්වා, "ජනතා විමුක්ති පෙරමුණේ ආණ්ඩුව බිහි කරන්න, අනුර කුමාර දිසානායක මැතිතුමා ජනාධිපති කරන්න, පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකේ බලය ලබා ගන්න සහයෝගය දෙන්න. අපි ඔබගේ රැකියා අයිතිය ලබා දෙනවා" කියලා. අද ඒ පොරොන්දුව කඩ කරලා. අද ඒ පොරොන්දුව උල්ලංඝනය

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

කරලා. මම රජයට කියනවා, රැකියා විරහිත උපාධිධාරීන් 80,000 එක්ක ඔබ ඇති කර ගත්තු සමාජ ගිවිසුම කරුණාකර ක්‍රියාත්මක කරන්න කියලා. ඒ අයට බොරු කරන්න එපා. ඒ අයව රවට්ටන්න එපා; අන්දවන්න එපා. ඒ අභිංසක තරුණ පරපුර මං මුළා කරන්න එපා. කොරෝනා සමයේ, රට බංකොලොත් වුණු සමයේ, පාස්කු ඉරු දින ප්‍රහාරය සිදු වුණු සමයේ වසර ගණනාවක් මුළුල්ලේ ගුරු හිඟය පියවන්නට සහයෝගය ලබා දුන්නේ ගුරු සංවර්ධන නිලධාරීන්. ඒ 16,000ට තමන්ගේ අයිතිය අහිමි වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Leader of the Opposition, you have utilized the time allotted to you.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තවත් තත්පර කිහිපයක් ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

මේ මොහොතේ මා ඉදිරියේ ආණ්ඩුව පැත්තේ ඉන්නවා, ගරු ලාල් කාන්ත ඇමතිතුමා. ගරු ඇමතිතුමනි, ගුරු සංවර්ධන නිලධාරීන් ඔබතුමාව හමුවන රූපරාමු අපි දැකලා තිබෙනවා. ඔබතුමා පොරොන්දු වෙනවා, ඒ අය ගුරු සේවයට අන්තර්ග්‍රහණය කරනවා කියලා. නමුත්, ඒ දේ ඉෂ්ට සිද්ධ වෙන්නේ නැහැ. එතැන සිදු වුණේ, රැවටීම. ඒක ඉතාම පැහැදිලියි. මට ඇහුණා අද ගරු අග්‍රාමාත්‍යතුමිය කියනවා, "පසුගිය කාලයේ දේවල්වලින් වැඩක් නැහැ, ඉතිහාසයෙන් වැඩක් නැහැ, අපි දැන් අලුත් විධියකට යන්නේ" කියලා. ඉතින්, ඡන්දය ඉල්ලන වෙලාවේත් ඔබට ඕක කියන්න තිබුණා නේ. 80,000ක් වූ රැකියා විරහිත උපාධිධාරීන්ට රැකියා ලබා දෙනවා, ගුරු සංවර්ධන නිලධාරීන් 16,000ම ගුරු සේවයට අන්තර් ග්‍රහණය කරනවා කියන පොරොන්දු එදා ලබා දුන්නේ ඇයි? එදා ඉතිහාසයක් ගැන කථා කළේ නැහැ. එදා නිශ්චිත පොරොන්දුවක් දුන්නා, ගුරු සංවර්ධන නිලධාරීන් 16,000ම ගුරු සේවයට අන්තර් ග්‍රහණය කරනවා, රැකියා විරහිත උපාධිධාරීන්ට රැකියා අනිවාර්යයෙන් ලබා දෙනවා කියලා. නමුත්, අද ඒක බොරුවක් බවට පත් වෙලා. ඒ නිසා ජනාධිපතිතුමාගෙන් සහ රජයෙන් මම ඉල්ලීමක් කරනවා. සහකම්පනයක් ඇති කර ගන්න. සංවේදී වෙන්න. මේ අපේ නිදහස් අධ්‍යාපනයේ දරුවෝ; නිදහස් අධ්‍යාපනයේ උපාධිධාරීන්; රටේ ඉන්න උගතුන්; බුද්ධිමතුන්. මේ අයගේ රැකියා අයිතිය මානව අයිතියක්; මූලික අයිතියක්. ඒ මානව අයිතිය, මූලික අයිතිය ක්‍රියාත්මක කරන්නට රජය කටයුතු කළ යුතුයි කියා මම යෝජනා කරනවා. ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Ashoka Gunasena. You have nine minutes.

[අ.භා.1.55]

ගරු අශෝක ගුණසේන මහතා
(மாண்புமிகு அசோக குணசேன)
(The Hon. Ashoka Gunasena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ මාතෘකාව ලෙස, ජලභීතිකාව රෝගය තුරන් කිරීමේ සහ සුනඛයන් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත සම්බන්ධයෙනුයි අපට කථා කරන්න තිබෙන්නේ. මේ සම්බන්ධයෙන් කථා කරන කොට කිව යුතුයි, ජලභීතිකා රෝගය කියන්නේ එක පැත්තකින් සෞඛ්‍ය තර්ජනයක් වාගේම අපේ රටේ සමාජයීය සහ ආර්ථිකමය ප්‍රශ්න ගණනාවක් නිර්මාණය කරන කාරණයක් බව. ඒ හා සම්බන්ධව තමයි අපේ මේ විවාදය අද පවත්වන්න ඕනෑ.

අපේ රටේ ජනතාවගේ විශේෂ අවධානයක් යොමු වෙච්චි ප්‍රශ්නයක් තමයි, ජලභීතිකා රෝගය. ඒකට ප්‍රධානම හේතුව මේකයි. ජලභීතිකා රෝගය වැලඳුණු කෙනෙක් බේරෙන්නේ නැහැ; අනිවාර්යයෙන්ම මිය යනවා. ඒක අපේ රටේ ජනතාව විශාල ප්‍රමාණයක් දන්නවා වාගේම නොදන්නා අයත් විශාල ප්‍රමාණයක් ඉන්නවා. ඒ නිසා මෙම රෝගය හැදෙන්න කලින් වළක්වා ගැනීමේ වගකීමක් සමාජයක් හැටියට අපට තිබෙනවා. ඒ වාගේම සුරතල් සතුන් ලෙස ඇති කරන බල්ලා, පූසා වාගේ සතුන්ගේ සිට අවට පරිසරයේ ඉන්න තවත් සතුන් විශාල පිරිසකගෙන් මේ රෝගය බෝ වීමේ හැකියාවක් තිබෙනවා. ඒ නිසා මෙම රෝගය වළක්වා ගැනීමට කටයුතු කිරීම, ජනතාවට විශේෂ කාරණයක්.

අපේ රටේ ජනගහනය මිලියන 23ක් ඉන්නවා. ඒ වාගේම සුනඛ ගහනය මිලියන 2.7ක් ඉන්නවා. ඒ කියන්නේ ආසන්න වශයෙන් ගත්තොත්, අපේ රටේ එක මනුස්සයෙකුට එක සුනඛයෙක් වාගේ ඉන්නවා. ඒක නිසා ඒ පැත්තෙනුත් මෙම රෝගය ව්‍යාප්ත වීමේ ලොකු අනතුරක් තිබෙනවා. අපි දන්නවා සුනඛයින්ගේ සපා කෑම නිසා ජලභීතිකා රෝගය වැඩි වශයෙන් වැලඳෙන බව.

ජලභීතිකා රෝගය වළක්වා ගැනීම සඳහා 1885දී ලුවී පාස්වර් විසින් එන්නතක් හොයා ගෙන ආසන්න වශයෙන් දැනට ශතවර්ෂ එකහමාරක විතර කාලයක් ගෙවී ගිහින් තිබෙනවා. හැබැයි, මේ කාලය ඇතුළත විද්‍යාවෙන් අත්පත් කරගත් ඒ ජයග්‍රහණවලින් මේ රෝගය තුරන් කරන්න අපේ රට සමත් වෙලා නැහැ. මෙතෙක් කාලයක් පැවතිච්චි ආණ්ඩු, පැවතිච්චි රජයන් කිසිවක් එයට සමත් වෙලා නැහැ. නමුත් අපේ ආණ්ඩුව දැන් ඒ කාර්යභාරයට අත ගහලා තිබෙනවා. ඒක විශේෂ වැදගත්කමක් තිබෙන කාර්යභාරයක්. මෙච්චර කාලයක්, මේ රෝගය වැලඳිලා මිය ගිය ජනතාවගේ නෑදෑ හිත මිතුරන් ඇතුළුව ඒකෙන් වේදනාවට පත් වෙච්ච අයට වාගේම අපේ සමාජය තුළ මේ රෝගය සම්බන්ධයෙන් යම් බයක් තිබෙනවා. ඒ බයට පත් වෙච්ච ජනතාවට අස්වැසිල්ලක් ලැබෙන පණිවිඩයක්, ඒ වාගේම ක්‍රියාමාර්ග ගණනාවක් ගන්න තමයි අපි මේ සූදානම් වෙලා ඉන්නේ. මේ ජයග්‍රහණය අපේ සමාජයට ලබා දීමේ වගකීම ආණ්ඩුවක් හැටියට අපි ගත යුතුව තිබුණා. දැන් අපි ඒ වගකීම අරගෙන එය ක්‍රියාත්මක කරන්න සූදානම් වෙලා ඉන්නවා. ඒකේදී අපේ ඉලක්කයක් තියෙනවා, 2030 වර්ෂය වෙනකොට අපේ රටේ ජලභීතිකා මරණ ශූන්‍ය කිරීමට. ජලභීතිකා රෝගයෙන් සිදුවන මරණ එකක්වත් නැති රටක් බවට අපි අපේ රට පත් කර ගන්න හදනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙය සංඛ්‍යාත්මක වශයෙන් ගත්තොත්, 2020දී අපේ රටේ මරණ 31ක්, 2021 දී මරණ 25ක්, 2022දී මරණ 28ක්, 2023දී මරණ 16ක්, 2024දී මරණ 20ක්, 2025දී මරණ 14ක් විධියට ක්‍රමානුකූල අඩුවීමක් තිබෙනවා. නමුත් අපේ ඉලක්කය තියෙන්නේ වර්ෂ 2030 වෙනකොට - එතැනින් පස්සේ අපේ රට - ජලභීතිකා රෝගයෙන් මිනිස්සු මැරෙන්නේ නැති රටක් බවට අපේ රට පත් කරන එකයි.

ඇත්තටම මෙහි කාර්යභාරය තියෙන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයට පමණක් නොවෙයි. සෞඛ්‍ය අමාත්‍යාංශයට පමණක් මේ කාර්යය භාර දෙනවාට වඩා රජයක් හැටියට අපි හැම වේලාවේම විශ්වාස කරන්නේ, හැම වේලාවේම සමාජයට දෙන

පණිවිඩය තමයි සාමූහිකත්වය තුළ අපි මේ ප්‍රශ්න විසඳා ගත යුතුව තියෙනවා කියන එක. ඒ නිසා මේ ප්‍රශ්නයේදී මේක සෞඛ්‍ය අංශයට පමණක් භාර නොදී අනෙකුත් රාජ්‍ය ආයතන, සත්ව සෞඛ්‍ය සේවා මධ්‍යස්ථාන හා මහජනතාව එකට සම්බන්ධ කර ගත්ත වැඩසටහනක් හරහා තමයි අපි මේ ක්‍රියාමාර්ගය එහෙම නැත්නම් අපේ රටින් ජලභීතිකාව තුරන් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන්න හදන්නේ. ඒකට අදාළ පනත් කෙටුම්පතක් තමයි අපි අද දවසේ මේ සම්මත කර ගන්න හදන්නේ.

එහිදී විශේෂයෙන්ම තවත් මතු කරන්න ඕනෑ කාරණයක් හැටියට තියෙනවා, මේ විසින් ඇති කරන සමාජීය ප්‍රශ්න ගණනාවකුත් තියෙන බව. ඒ තමයි සමාජය ඇතුළේ මානසිකව ඇති වන බිය. අපි දන්නවා, අපේ ගමක කොතැන හරි ජලභීතිකා රෝගය පැතිර යනවා කියලා ආරංචි වෙච්ච ගමන් ගමේ ඉන්න ජනතාව ඇතුළේ විශාල බියක් පැතිරෙනවා. ඒ බිය විසින් ඒ ගොල්ලෝ එක පැත්තකින් සත්ව හිංසනයට පෙලඹෙනවා; තව පැත්තකින් තමන් අවට ඉන්න සත්තු ගැන බියක් ඇති කර ගන්නවා වාගේම ඒ සතුන් විනාශ කරන්න පෙලඹෙනවා. එය සමාජීය ප්‍රශ්නයක් වාගේම මානසික බියක් ඇති කරනවා. ඒ බිය නැති කිරීම මේ පනත ගෙන ඒම හරහා සිද්ධ වෙනවා. මේ පනත ක්‍රියාත්මක වෙන්න පටන් ගත්තාට පස්සේ, එහෙම නැත්නම් අපේ රටින් ජලභීතිකාව තුරන් වෙනකොට මේ බිය සමාජය තුළින් නැතිව යනවා. ඒ වාගේම ළමයින් ආරක්ෂා කර ගැනීම ගැන බියක් ඇති වෙනවා. ඒකත් එක්ක සත්ව හිංසනයට යනකොට සත්ව හිංසනයට විරුද්ධ සංවිධාන හා මහජනතාව අතර ගැටුම්කාරී තත්ත්වයන් ඇති වෙන්නත් පුළුවන්. ඒ වාගේ සමාජීය ප්‍රශ්න විශාල ප්‍රමාණයක් මේ හරහා ඇති වෙනවා. ඉතින් මේ පනත තුළින් ඒවා වළක්වා ගන්න අපට පුළුවන් වෙනවා.

ඒ වාගේම අපි දන්නවා, රිය අනතුරුවලින් අපේ රටේ ජීවිත විශාල ප්‍රමාණයක් අපට නැති වෙලා තිබෙනවා; නැති වෙමින් තියෙනවා කියන එක. රිය අනතුරු ගත්තාම, මෝටර් බයිසිකල්, පාපැදි වාගේම වෙනත් වාහන පවා පාරවල්වල වෙසෙන අයාලේ යන සුනඛයින් හරහා අනතුරට ලක්වීම වැඩි වශයෙන් දක්නට තිබෙනවා. මෝටර් සයිකල් අනතුරු ගත්තොත්, ඒ වැඩි ප්‍රමාණයක් සිද්ධ වෙලා තියෙන්නේ අයාලේ යන සුනඛයින් හේතුවෙන්. ඒ නිසා ඒක වළක්වා ගැනීමටත් අවශ්‍ය කරන ප්‍රතිපාදන මේ පනත හරහා අපි සමාජයට ලබා දෙනවා. ඒවා ක්‍රියාත්මක කරන්න පටන් ගන්නවා.

ඊට අමතරව, සෞඛ්‍ය ගැටලු හැටියට ගත්තොත්, මේ සම්බන්ධයෙන් අපේ සමාජය තුළ තියෙන සෞඛ්‍ය ගැටලු ප්‍රමාණයක් තියෙනවා. එකක් තමයි, සතෙක් සපා කෑ වේලාවක ගන්න ඕනෑ නිවැරදි ක්‍රියාමාර්ග අනුගමනය කරන්න ඒ ගොල්ලන්ට හොඳ අදහසක් නැහැ. එක පැත්තකින් තෙල් බෙහෙත් ගාන ඒවා, එහෙම නැත්නම් මිථ්‍යා විශ්වාස මත පදනම්ව විද්‍යාව ගැන නොසලකා කටයුතු කිරීම විසින් සෞඛ්‍ය ගැටලුවක් නිර්මාණය වෙලා තියෙනවා. ඉතින් ඒ පිළිබඳ අවබෝධයකුත් මේවා හරහා ලබා දෙන්න අපට අවස්ථාවක් හම්බ වෙනවා. ඒ වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සුරතල් සතුන් ඇති කරන ගෙවල් තියෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි දෙකක කාලයක් ඉතිරිව තිබෙනවා.

ගරු අශෝක ගුණසේන මහතා
(மாண்புமிகு அசோக குணசேன)
(The Hon. Ashoka Gunasena)
ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

නමුත් අපි දන්නවා, ඒ සමහර ගෙවල්වල සතුන් පුංචි කාලයේ සුරතල් සතුන් හැටියට ඇති කරන්න අරගෙන ටික කාලයක් යනකොට, ඒ සතා ලොකු වෙනකොට අතහැර දානවා. ඒක නිසා ඒවාට අදාළ කරන නීතිත්, එහෙම නැත්නම් ඒ සතා මුදා හරිනකොට ඒ මුදා හැරීමේ වගකීම භාර ගන්න, එහෙම නැත්නම් මුදා හරින සතා සමාජයට කරදරයක් නොවන තත්ත්වයකට පත් කරන්න අදාළ කරන නීතිත් මෙහි ක්‍රියාත්මක වීම නිසා මේ පනත ඉතාම වැදගත් වෙනවා.

ඒ වාගේම යම් යම් මිථ්‍යා විශ්වාසයන් තිබෙනවා. මම ඉස්සෙල්ලා කිව්වා වාගේ සමහර අය හිතනවා, මන්ත්‍ර ගුරුකම්වලින් ප්‍රතිකාර කරන්න. සතෙක් සපා කාලා ජලභීතිකාව හැදුණොත් එහෙම නැත්නම් සතා සපා කෑවාට පස්සේ එයට මන්ත්‍ර, ගුරුකම්වලින් ප්‍රතිකාර කරන්න හිතනවා. විෂ වෛද්‍යවරු කියලා පිරිසක් සමහර ගම්වල ඉන්නවා. ඒගොල්ලන් ළඟට ගියාට පස්සේ ඔක්කොම හරියි කියලා මිථ්‍යා විශ්වාසයක් තිබෙනවා. අවසාන වශයෙන් ගත්තොත්, විද්‍යාව වෙනුවට මිථ්‍යාව විශ්වාස කරන සමාජය නැවත විද්‍යාව කරා ගෙන ඒමත් අපි මේ කාරණය හරහා ඉෂ්ට කරමින් ඉන්නවා.

අවසාන වශයෙන් මම තව කාරණයක් කියන්න ඕනෑ. දැන් මේ ජලභීතිකා රෝගය තුරන් කිරීම සම්බන්ධයෙන් වන පනත් කෙටුම්පත ගැන කථා කරන මේ වෙලාවේ විපක්ෂ නායකතුමා කථා කළා, රැකියා විරහිතභාවය ගැන. අවසාන වශයෙන් ඒ ගැනත් පොඩ්ඩක් කියන්න ඕනෑ කියලා මට හිතෙනවා. අපේ රටේ පසුගිය වර්ෂ ගණනාව අධ්‍යයන කළොත්, රජයේ රැකියාවලට බඳවා ගැනීම නවත්වා තිබුණේ කවුද? මෙය, විපක්ෂ නායකතුමා විශේෂයෙන්ම අවධානය යොමු කරන්න ඕනෑ කාරණයක්. ඒගොල්ලන් හිටපු ආණ්ඩුවලින් තමයි රජයේ රැකියාවලට බඳවා ගැනීම නවත්වා තිබුණේ. හැබැයි, දැන් මේ ආණ්ඩුවෙන් රජයේ රැකියාවලට බඳවා ගැනීම ආරම්භ කරලායි තිබෙන්නේ. මේ ආණ්ඩුව විසින් මේ වර්ෂයේදී ලක්ෂයකට වැඩි පිරිසක් රැකියාවලට බඳවා ගන්න කටයුතු කර තිබෙනවා. එහෙම අවස්ථාවක එතුමන්ලා මේ කථා කරන්නේ දේශපාලනය ගැන. විපක්ෂ නායකතුමා විශ්වාස කරනවා, එහෙම කථා කිරීම හරහා රැකියා විරහිත තරුණයින්ගේ අවධානය තමන්ට දිනාගන්න ලැබේවි; රැකියා ලැබෙන වෙලාවට තමන්ගේ කථාව හින්දා රැකියා ලැබුණා කියලා ඔවුන් හිතාවි කියලා. පසුගිය ආණ්ඩු රජයේ රැකියාවලට බඳවා ගැනීම නවත්වලායි තිබුණේ. ඒ ආණ්ඩු කරපු ඒ වැරැද්ද අපි නිවැරදි කරමිනුයි තිබෙන්නේ. ඒ වැරැද්ද නැවත නොවෙන්න අපේ රජය කටයුතු කරනවා කියලා මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. D.V. Chanaka. You have seven minutes.

[අ.භා. 2.05]

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මම ස්තුතිවන්ත වෙනවා.

ජලභීතිකාව රෝගය තුරන් කිරීම සඳහා ගෙන එන මේ පනත ජලභීතිකාව තුරන් කිරීම සඳහාම පාවිච්චි කරයි කියලා අපි විශ්වාස කරනවා. ඒ වාගේම හැම දේටම බදු ගහනවා වාගේ බලු පැටවුන් ටිකත් register කරලා ඒකටත් බද්දක් ගහන්නේ නැති

[ගරු ඩී.වී. චානක මහතා]

වෙයි, මේ පනත පාවිච්චි කරලා බලු පැටවුන් register කළේ නැහැ කියලා රෑ 12.00ට ගෙවල්වලට පනින ක්‍රමවේදයක් හදා ගන්නේ නැති වෙයි කියලාත් අපි විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ඔබතුමන්ලාට පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් තිබෙනවා. ඔබතුමන්ලා කියනවා, භාණ්ඩාගාරය පිරිලා තිබෙනවා කියලා. හැබැයි ඔය මොන දේ තිබෙනවා කිව්වත්, අද රටේ ගෑස් නැහැ. යුද්ධය හේතුවෙන් ගෙනා QR code එක මාස 7ක් වෙනවා අයින් කරගන්න බැරි වෙලා තිබෙනවා. දැන් කරන්ට කපන්නත් පටන් ගෙන තිබෙනවා. අද ආර්ථික වර්ධන වේගය සියයට 4.2කට අඩුවෙලා තිබෙනවා. ඔබතුමන්ලා ගනිද්දී සියයට 5.3යි. ඊළඟට උද්ධමනය පැත්තෙන් බැලුවොත්, අවධමනයක් තිබුණේ. ඍණ අගයක තිබුණේ. ඍණ සියයට 2ක ලෙස තිබුණේ. අද ඒක 10කින් වැඩි වෙලා, සියයට 8 දක්වා ගිහිල්ලා තිබෙනවා. අද තෙල් මිල තිබුණාට වඩා රුපියල් 100කින් වැඩි වෙලා තිබෙනවා. පිටි මිල වැඩි වෙලා තිබෙනවා. අද ඉස්පිරිතාලෙකට බෙහෙත් ගන්න ගියාම බෙහෙත් ටික නැහැ. ඉස්සර තිබ්බේ රජයේ රෝහල්. දැන් තිබෙන්නේ semi-government hospitals. අද රෝහල්වලට ගියාම නොමිලේ හම්බ වෙන්නේ වෛද්‍යවරයා සහ කාර්ය මණ්ඩලය විතරයි. බෙහෙත් ටික අරගෙන තමයි රෝහලට යන්න ඕනෑ. අද open-heart surgery එකක් කරන්න ගියොත් වෛද්‍යතුමා list එක ලියලා දෙනවා. රුපියල් 120,000ක් අරගෙන තමයි රජයේ රෝහලට යන්න ඕනෑ. එහෙමනම් ඒක කොහොමද රජයේ රෝහලක් වෙන්නේ? දැන් තිබෙන්නේ semi-government රෝහල්! දැන් government රෝහල් නැහැ. රෝහල් ඔක්කොම semi-government වෙලා තිබෙනවා. මම දැක්කා ඇමතිතුමා ඇවිල්ලාත් යනවා.

දැන් බාල ගල්අහුරු සම්බන්ධ වාර්තාව පාර්ලිමේන්තුවට හම්බ වෙලා තිබෙනවා. සිදු වෙලා තිබෙන පාඩුව රුපියල් බිලියන දහඅටහමාරක්. මේ, විදුලිබල අමාත්‍යාංශයට වෙච්ච පාඩුව විතරයි. රජයට වෙච්ච පාඩුව රුපියල් බිලියන 50යි. රුපියල් බිලියන දහඅටහමාරෙන් රුපියල් බිලියන 16යි hold කරගෙන තිබෙන්නේ. එතකොට අර ඉතිරි සල්ලි දෙන්නේ කවුද? අමාත්‍යවරයා දෙනවාද; ජනාධිපතිතුමා දෙනවාද; ආණ්ඩුව දෙනවාද? කියනවා, අපි ජනතාවගෙන් ගන්නේ නැහැ කියලා. බලශක්ති නියෝජ්‍ය ඇමතිතුමා දැන් මේ සභාවේ ඉන්නවා. නියෝජ්‍ය ඇමතිතුමාගෙනුත් මම අහන්න කැමැතියි ඉතිරි සල්ලි ගන්නේ කොහොමද කියලා. රුපියල් බිලියන 16යි නම් hold කරලා තිබෙන්නේ, report එකේ රුපියල් බිලියන දහඅටහමාරක් කියලා සඳහන් වෙනවා නම්, ඉතිරි ටික දෙන්නේ කොහෙන්ද? කියනවා, අපි දෙන්නේ නැහැ කියලා. හැබැයි බදු මුදලින් දෙනවා. එතකොට බදු ගෙවන්නේ කවුද? බදු ගෙවන්නේ අහිංසක ජනතාව. ජනතාව තමයි ඒක ගෙවන්නේ. ඒ වාගේම තමයි ජනාධිපති ලේකම්වරයා කන්ටේනර් පන්නලා අහුවෙනවා. අනෙක් පැත්තෙන් පොලිස්පතිවරයා උසාවිය නොමහ යවලා - රවට්ටලා - අහුවෙනවා.

අනෙක් පැත්තෙන් කථානායකතුමා. එතුමාට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙන් රුපියල් කෝටි තුනක් සම්බන්ධයෙන් චෝදනා එල්ල වෙලා තිබෙනවා. එතුමාට විරුද්ධව පරීක්ෂණයක් යනවා. හැබැයි, කියන්නේ දූෂණය, වංචාව නවත්වනවා කියලායි. හැම අතින්ම අසාර්ථක වනකොට එක පැත්තකින් රණ විරුවන් දඩයම් කරනවා. තවත් පැත්තකින් ශාසනයට එල්ල කරන ප්‍රහාර එන්න එන්න වැඩිවනවා. තවත් පැත්තකින් රාජපක්ෂවරුන් අල්ලා ගන්නවා. ඒක තමයි ඔබතුමන්ලාගේ එකම වැඩේ.

දැන් නාමල් රාජපක්ෂ මැතිතුමා සිරගත කරලා තිබෙනවා, කිසිම සාක්ෂියක් නැතිව. ලංකාවේ ඕනෑම පුද්ගලයෙකුට ක්‍රියාත්මක වන නීතිය තමයි, නඩුවක් දැම්මාම ඒ නඩුවේ පරීක්ෂණ කටයුතු අවසන් නම් ඇප ලබා දීම. හැබැයි, නාමල් රාජපක්ෂට ඒ නීතිය ක්‍රියාත්මක වන්නේ නැහැ. මොකද, දූෂණ විරෝධී පනතේ සඳහන් වෙලා තිබෙනවා, විශේෂ කරුණු ගැන. සාමාන්‍යයෙන් විශේෂ කරුණු තිබෙන්නේ ඇප දෙන්න. ඒ අනුව විශේෂ කරුණු ඉදිරිපත් කරන්න ඕනෑ, ඇප ලබා දෙන්න. හැබැයි අද විශේෂ කරුණු ඉදිරිපත් කරනවා, ඇප ලබා නොදෙන්න. ඉතිහාසයේ කවදාවත් මෙහෙම වෙලා නැහැ. නාමල් රාජපක්ෂ මැතිතුමා ඉතිහාසගත වන්නේ, පරීක්ෂණ ඉවර වෙලා තිබියදීත් ඇප නොලැබෙන පළමුවැනි පුද්ගලයා හැටියටයි. එතකොට කොහේද යුක්තියක් තිබෙන්නේ? දැන් අධිකරණය තුළින් යුක්තියක් ලැබෙන්නේ නැත්නම් කොහේද යුක්තියක් තිබෙන්නේ? රටේ ජනතාවට තිබුණු එකම දෙය තමයි අධිකරණය පිළිබඳව තිබුණු විශ්වාසය. අපි අදටත් විශ්වාස කරනවා, අධිකරණය ස්වාධීනයි කියලා. හැබැයි අපි බලාපොරොත්තු වනවා, රටේ ජනතාව අධිකරණය දිහා හොඳට ඇස් අරගෙන බලාගෙන ඉඳිවි කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක පැත්තකින් අපි දැක්කා, ඥානසාර හාමුදුරුවන්ගේ සිවුර ගැලෙව්වා. අනෙක් පැත්තෙන් ජනාධිපති සමාව ඉල්ලා අපේ නායක හාමුදුරුවෝ ඇතුළු ස්වාමීන් වහන්සේලා නුවර ඉඳන් කොළඹට වැඩම කළා. උන්වහන්සේලා නුවර ඉඳන් කොළඹට ඇවිත් දැන් Viharamahadevi Park එකේ ඉන්නවා, ඒ ඉල්ලීම වෙනුවෙන්. එතැන බණ කියන්න තිබුණු පොඩි බෆල් එකත් පොලීසියෙන් ඇවිල්ලා උස්සාගෙන යනවා, මේවාට අනුමැතිය නැහැ කියලා. අපි බැලුවා, රටේ එහෙම නීතියක් තිබෙනවාද කියලා. හැබැයි, ඒ නීතිය ක්‍රියාත්මක වන්නේ නැහැ, මාලිමාවට.

දැන් මා ළඟ වීඩියෝ තිබෙනවා. මෙතැන එහා පැත්තේ ඉන්න අම්බිකා මන්ත්‍රීතුමිය බෆල් අතින් අරගෙන බදුල්ලේ පාර දිගේ ඉස්සරහින් එනවා, "අනුර කුමාර දිසානායක මහත්තයාට ජය වේවා" කිය කියා. එතකොට බෆල් එක පාවිච්චි කරන්න පුළුවන්ද? ඊට පසුව මම එවැනිම සිද්ධියක් දැක්කා, තංගල්ලේදී. තංගල්ලේත් වාහනයක් යනවා, ස්පීකර් දාගෙන. ඒවාට නීතියක් නැද්ද? හාමුදුරුවන්ට බණ කියන්න බෆල් එක පාවිච්චි කරන්න බැහැ. හැබැයි, ආණ්ඩුවේ ඇමතිවරුන්ට බෆල් ගෙනියන්නත් පුළුවන්, loudspeaker ගෙනියන්නත් පුළුවන්, "අනුර කුමාර දිසානායක මහත්තයාට ජයවේවා" කියන්න. ඒවාට බලපත්‍ර ඕනෑත් නැහැ. මේකේ කොහේද යුක්තියක් තිබෙන්නේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම දැක්කා, ආණ්ඩුව වස් කවියකටත් බය වෙලා තිබෙනවා. දැන් ආණ්ඩුව වස් කවියකට බය වෙලා. මොකක්ද මේ වස් කවියේ කියන්නේ? වීවරයට නිගා කරන, එහෙම නැත්නම් බොරුවෙන් රජ වෙච්ච කෙනාට තමයි මේ වස් කවිය ලියලා තිබෙන්නේ. හැබැයි, දැන් ආණ්ඩුවේ අය press conference එකක් තියලා කියනවා, ජනාධිපතිතුමාටයි මේ මරණ තර්ජන කරන්නේ කියලා. දැන් අපට තිබෙන ප්‍රශ්නය මේකයි. එතකොට ජනාධිපතිතුමා වීවරයට නිගා කරනවා කියලා පිළිගන්නවාද? එතකොට ජනාධිපතිතුමා පිළිගන්නවාද, එතුමා බොරු කියලා රජ වුණේ කියලා. අද ලංකාවේ පොලීසිය දාලා මේ ගැන පරීක්ෂණ කරනවා. අද CID එක, CCD එක, ලංකාවේ පොලීසිය දාලා වස් කවිය ලිව්ව කෙනා ගැන සොයනවා. මොකක්ද මේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? අද රටේ නීතියක් නැහැ. අද රටේ සම්පූර්ණයෙන් ක්‍රියාත්මක වන්නේ ආණ්ඩුවට අවශ්‍ය දේ. අද පන්සලේ හාමුදුරුවන්ට බණ කියන්න බැහැ, loudspeaker එකට පර්මිට් එකක් නැහැ කියලා උස්සාගෙන යනවා; බෆල් එක උස්සාගෙන යනවා. අද ඥානසාර හාමුදුරුවන්ට යුක්තිය ඉටු වෙන්න ඕනෑ. මේ, හොරකම් කරලාද, මිනී මරලාද, කුඩු ගෙනැල්ලාද? ඥානසාර හාමුදුරුවන්ට තිබෙන චෝදනාව මොකක්ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. D.V. Chanaka, your time is up.

ගරු ඩී.වී.චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව තත්පර 10ක් දෙන්න.

ජනාධිපතිතුමා ගිය අවුරුද්දේ විතරක් 300කට ජනාධිපති සමාව දීලා තිබෙනවා. විවිධ චෝදනාවලට අවුරුදු 20, 30 හිරේ ගිය 300කට ජනාධිපති සමාව දෙන්න පුළුවන් නම්, මේ කිසිම චෝදනාවක් නැති හාමුදුරුවන්ට ජනාධිපති සමාව දෙන්න බැරි ඇයි? අද හාමුදුරුවන්ට Viharamahadevi Park එකට ගිහින් අඩුම ගණනේ බණක් කියන්න නිදහසක් නැති රටක්ද මේ නිර්මාණය කරලා තිබෙන්නේ කියලා අපි ජනාධිපතිතුමාගෙන් අහන්න කැමැතියි.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Athula Welandagoda. You have nine minutes, Hon. Member.

[අ.භා. 2.12]

ගරු අතුල වෙළඳගොඩ මහතා
(மாண்புமிகு அதுல வெலந்தகொட)
(The Hon. Athula Welandagoda)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය සහ කෘෂිකර්ම අමාත්‍යාංශය එකට එකතු වෙලා සුනඛයන් එන්නත් කිරීම, සුනඛ ගහනය පාලනය කිරීම සහ සුනඛයන් වාණිජ අරමුණු සඳහා අභිජනනය කිරීම නියාමනය කිරීම, ජලභීතිකා රෝගය තුරන් කිරීම, සුනඛයන් ලියාපදිංචි කිරීම ඇතුළුව ඊට සම්බන්ධ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා වූ ජලභීතිකා රෝගය තුරන් කිරීමේ සහ සුනඛයන් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත පිළිබඳව අද අපි සාකච්ඡා කරනවා.

මේ වැදගත් මාතෘකාවට අපි ප්‍රවිෂ්ට වෙලා ඉන්න වෙලාවේ, අද කථා කරපු මන්ත්‍රීවරුන් මේ සඳහා තම තමන්ගේ යෝජනා හා අදහස් එකතු කරන වෙලාවේ විශේෂයෙන්ම මම කියන්න ඕනෑ, බිම් මට්ටම දක්වා මේ පනතෙහි තිබෙන ජාතික වැදගත්කම පිළිබඳව. අපි දන්නවා, අවුරුදු 100කට වැඩි කාලයකට පෙර පනවපු ආඥාපනත් ක්‍රියාත්මක කරමින් ආපු ගමන අලුත් වෙන්න ඕනෑ, වෙනස් වෙන්න ඕනෑ කියන එක. ඒ අලුත්වීම සහ වෙනස්වීම වෙනුවෙන් කරන යෝජනා පිළිබඳව කථා කරන්න තමයි අපි අද මේ පාර්ලිමේන්තුවේදී රැස් වන්නේ. හැබැයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතාම කනගාටුයි කියන්න, ඒ වාගේ වෙලාවක මේ විපක්ෂය ඒ වෙනුවෙන් තමන්ගේ අදහස් හා යෝජනා ඉදිරිපත් කරනවා වෙනුවට, උදේ කාලයේ මේ පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට අනුව අවස්ථාව ලබා ගැනීමේදීත්, දවස පුරා කටයුතු කිරීමේදීත් ඔවුන් අනුගමනය කරන ක්‍රියාමාර්ගය පිළිබඳව, සියලුදෙනාම එකම විධියකට තොල් මතුරමින් කටයුතු කරන විධිය පිළිබඳව. අපි දැක්කා, ඊයේත්, පෙරේදාත් ඔවුන් ඉදිරිපත් කරපු කරුණුවලට මෙතැන සාකච්ඡාවේදී උත්තර දුන් ආකාරය. නැවත නැවතත් එකම දේ විවිධ මාතෘකා ඔස්සේ කථා කරද්දි ජනතාව නියෝජනය කරන විපක්ෂයක්ද මේ තිබෙන්නේ කියලා අපට හිතෙනවා. මේ ජනතාවාදී පාර්ලිමේන්තුවේ කාර්යභාරය පැහැර හැරපු, අතහැරපු විපක්ෂයක් මේ වාගේ මාතෘකාවකටවත් අදහස් එකතු කරන්නේ නැත්නම් එවැනි විපක්ෂයකින් අපි බලාපොරොත්තු වන්නේ කුමන වර්ගයේ සහයෝගයක්ද? කුමන වර්ගයේ විපක්ෂයේ කාර්යභාරයක්ද?

මම ඒක මතක් කළේ මෙන්න මේ නිසායි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. දැනුත් අපි දැක්කා, මේ මන්ත්‍රීවරුන් සියලුදෙනාම භය වෙලා ඉන්න ආකාරය. ඇත්තටම ඔවුන් ආපු කාර්යභාරය අමතක වෙලා, අද මේ වස් කවි ගැන කථා කරනවා. මේ සමාජ දේහයේ තිබෙන අර්බුදය පිළිබඳව අපි හරියට කථා බහ කරගෙන ජනතාවාදී පාලනයකට, ඒ සඳහා වෙච්ච තැනකට තමන්ගේ අදහස ඉදිරිපත් කරනවා වෙනුවට මේ වටිනා කාලයේදී පවා අපි දකින්නේ, ඒ කාර්යභාරය පැහැර හැරීමක් තමයි. ඒ ගැන අපට හරිම කනගාටුයි. ඒ නිසා ඒවාට උත්තර නොදුන්නත්, වග කිව යුතු ආණ්ඩු පක්ෂයක් විධියට අපි කාලයක් තිස්සේ තේරුම් ගත්තා, ජලභීතිකා රෝගය මුළු ලෝකයෙන්ම තුරන් කිරීම වෙනුවෙන් කටයුතු කළ යුතුයි කියලා. මේ සඳහා එන්නත් නිෂ්පාදනය කරලා දැනට අවුරුදු 100කට වැඩියි. ඒ වාගේම ඒකෙන් මහජනතාවට ඉස්සරහට ලැබෙන ප්‍රයෝජනය කුමක්ද? විවිධ වැඩසටහන් හරහා ආපු ඒ ගමනේදී අපේ රට යම් කිසි ප්‍රගතියක් අත්පත් කරගෙන තිබෙනවා. අපි වර්තමාන රජය විධියට 2030 වර්ෂය වනකොට මෙම රෝගය මුළුමනින්ම අපේ රටෙන් තුරන් කිරීම සඳහා වෙච්ච වැඩ පිළිවෙළකට ඇවිත් තිබෙනවා. ඒ සඳහා ඉදිරිපත් වෙච්ච අදහස් හා යෝජනා මතින් යම් යම් සංශෝධන සහිතව අලුත් පනත් කෙටුම්පතක් සම්මත කර ගැනීමට අපි බලාපොරොත්තු වනවා. අපි දන්නවා, අවුරුදු දොළොස් දහසකට වැඩි කාලයක් මිනිසාගේ ළඟම ආරක්ෂකයා, මිතුරා පිළිබඳව. ඒ සතාගේ කාර්යභාරය අපි මේ වනකොට දන්නවා. එතැනින් එහාට ගිහිල්ලා, සුනඛයින් ඇති කිරීම අද වන විට ව්‍යාපාරයක් බවට පත් වෙලා තිබෙනවා. සමහර අයගේ ජීවනෝපාය බවටත් එය පත් වෙලා තිබෙනවා. එතැනට ආපු ගමනේදී ඇත්තටම මේ නීති රීති සංශෝධනය වෙන්න ඕනෑ, අලුතින් එකතු වෙන්නට ඕනෑ. ඒ සඳහා වන ආනුෂංගික කාරණා ගැන අවධානය යොමු කරන්න ඕනෑ. මේ පනතින් කරන්නේ ඒකයි.

අපි දන්නවා, අපේ රටේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල - MOH offices - හරහා, ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍යතුමන්ලා සහ ඒ කාර්ය මණ්ඩල විශේෂ කාර්යභාරයක් මේ වෙනුවෙන් ඉෂ්ට කළ බව. ඒ ඉෂ්ට කිරීමේ ප්‍රතිඵලයක් විධියට දිස්ත්‍රික්ක පහකට විතරක් මරණ ඉතාම අඩු සංඛ්‍යාවකට, මරණ 25කට වඩා අඩු තැනකට මේ ප්‍රශ්නය ඇවිත් තිබෙනවා. එවැනි තත්ත්වයකදීත් අපි ඉතා කම්පාවට පත් වනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මොකද, එක මරණයක්වත් සිදු නොවිය යුතු මට්ටමකට අපට මේක නිවාරණය කර ගන්න, වළක්වා ගන්න පුළුවන්. ඒ සඳහා තමයි අපේ මේ උත්සාහය. අපි මේ ගන්නා උත්සාහයේදී ජලභීතිකා රෝගය තුරන් කිරීම වාගේම අනෙකුත් කාරණා ගැනත් හිතන්න ඕනෑ. ඒ කියන්නේ, අපි මේ පනත සකස් කර ගැනීමේදී තවත් බොහෝ දේවල් රටක්, සමාජයක් විධියට දකින්න ඕනෑ. ඒ එකක් තමයි, මේ සුරතල් සතුන්ගේ දායකත්වය ක්‍රමානුකූලව සමාජ ප්‍රශ්නයක් බවට පත් වීම. අපි දන්නවා, දියුණු වර්ගයේ, එහෙම නැත්නම් මිල අධික සුනඛයින් අභිජනන මධ්‍යස්ථාන හරහා මිලදී ගැනීමේදී කිසි ප්‍රශ්නයක් නැති බව. එවැනි සතුන් ගෘහස්ථ මට්ටමින් ඇති කරනවා. එතකොට අප සමඟ පරම්පරාවෙන්, එහෙම නැත්නම් කාලයක් තිස්සේ ගෘහ ආශ්‍රිතව සිටි සුනඛයින් මේ වනකොට එතැනින් එළියට ගිහිල්ලා තිබෙනවා. ඒ අනුව ඒ සතුන් බොහොමයක් මේ වන විට අයිතිකරුවන් නොමැතිව, නිදැල්ලේ

[ගරු අතුල වෙළඳගොඩ මහතා]

හැසිරෙනවා. එම සතුන් දැන් පොදු ස්ථානවලට, එහෙම නැත්නම් මහා මාර්ගවලට වැටී අසරණභාවයට පත්වෙලා ඉන්නවා. ඒ නිසා එය දැන් සමාජ ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. මේ සතුන් අවුරුදු 12,000ක පමණ කාලයක් තිස්සේ මිනිසා ආශ්‍රිතවයි ජීවත් වන්නේ. නැවත කැලෑවට යන්න බැරි වුණු සතුන්, විශේෂයෙන්ම පූසා සහ බල්ලා කියන සුරතල් සතුන් මිනිසුන් ආශ්‍රිතව තමයි රැකෙන්නේ. මිනිස් වාසය ආශ්‍රිතවයි එම සතුන්ගේ ජීවිත පවතින්නේ. එම සතුන්ට අවශ්‍ය රැකවරණය අප මතයි රඳා පවතින්නේ. ඒ සතුන්ට අනෙක් සතුන්ට වාගේ හැරිලා යන්න බැහැ. ඒ නිසා මේ සතුන්ගේ වගකීම සම්බන්ධව සමාජයක් ලෙස අපි මීට වඩා වැඩි මානුෂිකත්වයකින් බැලිය යුතුයි කියා අපි හිතනවා. ඒ නිසා තරගකාරී සමාජයක, යම් යම් වටිනාකම් හුවමාරු කරන සමාජයක ජීවත් වන අපි පොදු කාරණාවලින් ටිකක් බැහැර වෙලා මීට වඩා ඒ සම්බන්ධවත් සිතිය යුතුයි. එම නිසා අපි වේගයෙන් ගමන් කළ දිශාවෙන් නැවත පොඩ්ඩක් සහකම්පනය සහිත තත්ත්වයකට පැමිණිය යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ලස්සන රටක්" කියන තේමාව ගත්තොත්, අපි ආර්ථික දත්තවලින් රට කොච්චර පොහොසත් කළත් රටක් ලස්සන වෙන්න නම් අපේ ආකල්ප, සිතුම්-පැතුම්, අපේ චර්යා ධර්ම සහ අනෙකුත් සියලු කරුණු අපි එක තැනකට ගෙනෙන්නට ඕනෑ. එතැනදි අපි හිතනවා, සතුන්ට දක්වන කරුණාව, සතුන්ට දක්වන සැලකිල්ල මත අපි ඉන්නා තැන පිළිබඳව ලෝකය බලනවා කියලා. මෙහිදී අපට නැවත හැරී බලන්න අවශ්‍ය තව කාරණා ගොඩක් තිබෙනවා. ඒ අනුව විශේෂයෙන්ම මේ පනත් කෙටුම්පතට මේ කරුණු එකතු කර ගැනීමේදී අපි හිතනවා, සත්ව අවිහිංසාව, නැත්නම් ඒ සතුන්ට ආදරය, සැලකිල්ල දැක්වීම සම්බන්ධ පණිවුඩය සමාජයට ගමන් කරවීමත් කළ යුතුයි කියලා. ඒ නිසා අප තුළ තිබෙන විශේෂතා පමණක් මත නොවෙයි, දැන් නිදැල්ලේ සිටින මේ සතුන්ට අවශ්‍ය රැකවරණය නැවත ලබා දෙන මධ්‍යස්ථාන සකස් කර එම සතුන් රැක බලා ගැනීමට අවශ්‍ය කටයුතු සම්බන්ධව අපි ආකල්පමය වශයෙන් හිතා බලා, එම කාරණා මීට වඩා සැලකිල්ලට ලක් කරන්නට ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සතුන් ගැන කථා කරන විවිධ සංවිධාන තුළ මේ වන විට විශාල කැලඹීමක් ඇති වෙලා තිබෙනවා. මේ සම්බන්ධව ඔවුන් ඉදිරිපත් කරන විවිධ විධියේ ප්‍රකාශ අපි දකිනවා. අපි හිතනවා, මේ පිළිබඳවත් අවධානය යොමු කරන්නට ඕනෑ කියලා. නමුත් ඔවුන් කියන විධියේ දෙයක් අපි දකින්නේ නැහැ, විශාල මානෘකා යටතේ මේ සියල්ලක්ම එක තැනකට ගන්නවා හැර.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නැවතත් අද දවසේ මානෘකාවට ආවොත්, මම සඳහන් කරන්න කැමැතියි, ගම්බිම්වල වුණත් ජලභීතිකා රෝගය නිසා මරණ සිදු වන බව. මේ වන විට රජය රුපියල් මිලියන 2,000කට වැඩි මුදලක් වාර්ෂිකව දරනවා, රෝහල් ගාස්තු, බෙහෙත්, ප්‍රතිකාර සහ මීට අදාළ අනෙකුත් ව්‍යාපෘති සඳහා. අද රිය අනතුරු, මෝටර් බයිසිකල් අනතුරු වාගේම විවිධ වාහනවල ගැටීමෙන් සිදුවන අනතුරුවලින් මිනිස් ජීවිත කියක් නැති වෙනවාද, කොතරම් පිරිසක් එක්තැන් වෙනවාද? ඒ වාගේම ජලභීතිකා රෝගය නිසා සතුන් මිය යනවා වාගේම මිනිස් ජීවිතත් කොච්චර ප්‍රමාණයක් අවදානමට ලක් වෙනවාද කියාත් අපි සොයා බැලිය යුතුයි. අපි හිතනවා, මේ සියලු කාරණා එක තැනකට ගෙනැල්ලා ජලභීතිකා රෝගය තුරන් කිරීම වාගේම සතුන් එන්නත් කිරීම, සතුන් රැකබලා ගැනීම, අභිජනන මධ්‍යස්ථාන, සතුන් නඩත්තු කිරීමේ මධ්‍යස්ථාන යනාදී මේ සියලු කාරණා වාගේම සමාජයෙන් මෙම රෝගය නිවාරණය කිරීම සම්බන්ධවත් අපි අවධානය යොමු කළ යුතුයි කියලා. එහිදී අපි ඉතා අවිහිංසාවාදීව මේ මානෘකාව දිහා බලන්න අවශ්‍යයි. ඒ අනුව මේ පනත් කෙටුම්පත අනාගතය දිහා බලා සකස් කිරීම සඳහා ආනුෂංගික කාරණාත් එකතු කර අපි මෙම පනත් කෙටුම්පත යෝජනා මාලාවකින් පෝෂණය කර ගත යුතු වනවා. ඒ අනුව සම්මත වීමෙන් පසුව ශක්තිමත්ව, ප්‍රයෝජනවත්ව ක්‍රියාත්මක කරනු ලබන මෙම පනත සම්බන්ධව අදහස් දැක්වීමට මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Amirthanathan Adaikkalanathan. You have seven minutes.

Order, please! Will an Hon. Member propose the Hon. Chanaka Madugoda to the Chair?

ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) நிஹால் அபேசிங்ஹ)
(The Hon. (Dr.) Nihal Abeysinghe)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු චානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. CHANAKA MADUGODA took the Chair.

[ப.ப. 2.22]

ගරු අමිර්තනාදන් අඩෙක්කලනාදන් මහතා
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)

நன்றி! கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற விவாதமானது, விசர்நாய்க்கடி நோயை ஒழித்தல் மற்றும் நாய்களைப் பதிவுசெய்தல் சட்டமூலம் தொடர்பானது. உண்மையிலே இது நல்லதொரு விடயமாகும். இதனை நாங்கள் வரவேற்றாக வேண்டும். ஏனென்றால், இன்றைக்குத் தெருநாய்களின் எண்ணிக்கை அதிகரித்து இருக்கின்றது. அதனைக் கட்டுப் படுத்த வேண்டும் என்பதில் எனக்கு ஆட்சேபனையில்லை.

எங்களுடைய தேசத்தைப் பொறுத்தமட்டில், மிருகங் களுக்கு இருக்கின்ற முக்கியத்துவம் - அது நாயாக இருக்கலாம் அல்லது யானையாக இருக்கலாம் - மனிதர்களுக்கு இல்லை.

10 பேரைத் தாக்கினால்தான் யானையைக்கூட சுட்டுக்கொல்ல முடியுமென வர்த்தமானி அறிவித்தல் இருப்பதாகச் சொல்கிறார்கள். மனித உயிர்களுக்கு கடந்த கால அரசாங்கத்தில் எந்தவோர் உத்தரவாதமும் வழங்கப்படவில்லை. இப்பொழுதும் அது உறுதிப்படுத்தப்படாமலே இருக்கின்றது. நான் எதைக் கூற வருகிறேன் என்றால், செம்மணி மனிதப் புதைகுழி சம்பந்தமாகத்தான். தொல்லியல் நிபுணர் ராஜ் சோமதேவவின் செம்மணி மனிதப் புதைகுழி சம்பந்தமான அறிக்கையானது, உண்மைக்குப் புறம்பான ஓர் அறிக்கையாகவே இருக்கின்றது. மண்ணைப் பரிசோதனை செய்கின்ற துறையில் வல்லமை பெற்றவர்தான் ராஜ் சோமதேவ அவர்கள். அங்கு படுகொலை செய்யப்பட்டு புதைக்கப்பட்டுள்ள சிறுவர்கள் உட்பட பெரியவர்களின் உடல் எச்சங்களை விஞ்ஞான ரீதியான பகுப்பாய்வுக்கு உட்படுத்தி என்ன நடந்திருக்கிறது என்பதைப் பார்க்க வேண்டுமே ஒழிய, இவருடைய அறிக்கையை வைத்துக்கொண்டு எந்தவொரு முடிவுக்கும் நாங்கள் வர முடியாது என்பதை இந்த உரிய சபையில் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, போர்க்காலத்தில் பல இடங்களில் இராணுவ சோதனைச் சாவடிகள் நிறுவப்பட்டு இருந்ததை எல்லோரும் அறிவார்கள். ஒருவர் அவற்றைத் தாண்டி வெளியே வந்தால்தான், அவர் உயிரோடு இருப்பதாக அந்தக் காலத்தில் கருதப்பட்டது. போர்க்காலத்தில் இவ்வாறான பல சம்பவங்களை நாங்கள் கண்கூடாகக் கண்டிருக்கிறோம். உதாரணத்துக்கு ஒரு சம்பவத்தைச் சொல்கின்றேன். யாழ்ப்பாணத்திலிருந்து வன்னிக்கு எங்களுடைய மக்கள் புலம்பெயர்ந்து சென்று, பின்னர் அங்கிருந்து திரும்பவும் யாழ்ப்பாணத்துக்கு வருகின்ற வழியில் கல்முனை என்ற இடத்தில் இராணுவ சோதனைச் சாவடியொன்று இருந்தது. வருகின்ற மக்களை அங்கு பரிசோதனை செய்து அனுப்புவதுதான் வழக்கம். ஒரு நாளில் ஒருவர் - இரண்டு பேர் வரமாட்டார்கள்; 10 - 25 பேர் என குழாமாகத்தான் வருவார்கள். அவ்வாறு வருகின்ற சமயத்தில், அவர்கள் எல்லோரையும் 10 நாட்களுக்கு மேல் மறித்து வைத்து விசாரணை செய்வதை வழக்கமாகக்கொண்டு இருந்ததாக நான் அறிந்திருக்கிறேன். இவ்வாறு ஒரேயடியாகச் சோதனை செய்வதற்காக 10 பேர் மறிக்கப்படும்போது, அவர்களில் ஒருவர் - இரண்டு பேர் சந்தேகத்துக்கிடமானவர்களெனக் கண்டுபிடிக்கப்பட்டால், மற்றைய 8 பேரையும் வெளியே அனுப்புவது ஆபத்தானதொரு விடயமென இராணுவம் கருதும்.

ஏனென்றால், 10 பேரில் 8 பேர் வெளியில் போனால், 2 பேரை மறித்து வைத்திருக்கிறார்கள் என்று சொல்லி மனித உரிமைகள் ஆணைக்குழு உட்பட பல இடங்களில் முறைப்பாடு செய்வார்கள். இதனால் சந்தேகத்துக்கிடமானவர்கள் கண்டுபிடிக்கப்பட்டால், சென்ற 10 பேரையும் வெளியில் விடாத ஒரு சூழ்நிலை அன்றைய காலகட்டத்தில் இருந்தது. இவ்வாறு சோதனைச் சாவடியில் தடுத்துவைக்கப்பட்ட பலர் படுகொலை செய்யப்பட்டு, செம்மணியில் புதைக்கப்பட்டு இருக்கலாமென நான் சந்தேகப்படுகின்றேன் என்பதை இங்கே பதிவுசெய்ய விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, செம்மணி மனிதப் புதைகுழி என்பது எங்களுடைய தமிழினம் படுகொலை செய்யப்பட்டதற்கான ஆதாரமாக இருக்கின்றது. அதனால் அதனைப் பாதுகாக்க வேண்டும், உண்மையைக் கண்டறிய வேண்டும் என்பதில் எங்களுடைய மக்கள் கரிசனையோடு இருகின்றார்கள். இந்த மனிதப் புதைகுழியில் குழந்தைகள், சிறுவர்கள், பெரியோர்கள் எனப் பலர் புதைக்கப்பட்டிருக்கிறார்கள்.

ஒரு பொம்மையைக் கைகளால் அணைத்தபடி இருக்கும் ஒரு குழந்தையின் எலும்புக்கூடு கண்டெடுக்கப்பட்டு இருக்கின்றது. அதுமாத்திரமன்றி, சூட்டுக் காயங்களோடு கூடிய ஓரிரண்டு உடல் எச்சங்களும் கண்டெடுக்கப்பட்டு இருக்கின்றன. மேலும், அங்கு விலங்குகளின் எலும்புக் கூடுகளும் இருப்பதாகச் சொல்லப்படுகின்றது. அப்படி இருக்கின்ற சூழ்நிலையில், ராஜ் சோமதேவ அவர்களின் இந்த அறிக்கையை உண்மைக்குப் புறம்பான ஓர் அறிக்கையாகவே நாங்கள் பார்க்கவேண்டி இருக்கின்றது. போர்க் குற்றங்கள் தொடர்பில் சர்வதேச விசாரணை செய்யப்பட வேண்டுமென நாங்கள் அடிக்கடி இந்த அரசாங்கத்தை வலியுறுத்தி வருகின்றோம். உள்ளூர் விசாரணை செய்யப்பட்டு உண்மை மறைக்கப்படுகின்ற விடயத்துக்கு இந்தச் செம்மணி மனிதப் புதைகுழி தொடர்பான அறிக்கையை நாங்கள் உதாரணத்துக்குச் சொல்ல முடியும். அதனால்தான் நாங்கள் சொல்கின்றோம், எங்களுடைய இனத்தின்மீது மேற்கொள்ளப்பட்ட மனித உரிமை மீறல்கள் அத்தனையும் சர்வதேச விசாரணைக்கு உட்படுத்தப்பட வேண்டும் என்று. எங்களுடைய இனத்தின்மீது மனித உரிமை மீறல்களை மேற்கொண்டு, எமது மக்களை அழிக்க நினைத்தவர்கள் தண்டிக்கப்பட வேண்டும். இவ்விடயம் தொடர்பில் தாங்கள் உள்ளக விசாரணை செய்வதாக அரசாங்கம் சொல்வது உண்மையிலேயே ஏற்புடையதாக இருக்காது. அதற்கு உதாரணமாக, நாங்கள் செம்மணி மனிதப் புதைகுழி சம்பந்தமான இந்த அறிக்கையைச் சொல்ல முடியும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த அறிக்கையை வைத்து அரசாங்கம் செம்மணி புதைகுழி விவகாரம் தொடர்பில் இறுதி முடிவுக்கு வரக்கூடாது என்பது என்னுடைய கருத்தாகும். எனவே, இது தொடர்பில் விஞ்ஞான ரீதியான பகுப்பாய்வொன்றைச் செய்து, என்ன நடந்திருக்கிறது என்பதை ஆராய்ந்து, சர்வதேச விசாரணை மேற்கொள்வதற்கான வாய்ப்பை இந்த அரசாங்கம் உண்டுபண்ண வேண்டுமென்ற கோரிக்கையை முன்வைத்து, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி. வணக்கம்!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.30]

ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා
(மாண்புமிகு (வைத்தியர்) செல்லத்தம்பி திலகநாதன்)
(The Hon. (Dr.) Sellaththamby Thilaganathan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, விசர்நாய்க்கடி நோயை ஒழித்தல் மற்றும் நாய்களைப் பதிவுசெய்தல் சட்டமூலம் சம்பந்தமான இன்றைய விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன். நான் ஒரு கால்நடை வைத்தியர் என்ற ரீதியில் சொல்கின்றேன், இந்தச் சட்டமூலமானது இலங்கைக்குத் தேவையான, அத்தியாவசியமான ஒன்றாகக் காணப்படுகின்றது.

1893ஆம் ஆண்டு உருவாக்கப்பட்ட (476ஆம் அத்தியாயமான) விசர்நாய்க்கடி நோய்க் கட்டளைச் சட்டமும், 1901ஆம் ஆண்டு உருவாக்கப்பட்ட (477ஆம் அத்தியாயமான) நாய்களைப் பதிவுசெய்தல் கட்டளைச் சட்டமும் இன்றைய இந்த சட்டமூலத்தின்மூலம் இல்லாதொழிக்கப்படுகின்றன.

[ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා]

கிட்டத்தட்ட 130 வருடங்களுக்கும் முற்பட்ட பழைய சட்டங்களை நீக்கி, தற்போதைய விஞ்ஞான வளர்ச்சிக்கு ஏற்ப புதிய சட்டங்களைக் கொண்டுவர வேண்டிய தேவைப்பாடு எங்களுக்குக் காணப்படுகின்றது. இதன் அடிப்படையில், எமது அரசாங்கம் இவ்வாறான புதியதொரு சட்டமூலத்தைக் கொண்டுவருவது வரவேற்கத்தக்கது.

> "இதனை இதனால் இவன்முடிக்கும் என்றுஆய்ந்து, அதனை அவன் கண் விடல்."

என்று ஒரு குறள் இருக்கின்றது. எனினும், இதுவரை காலமும் விசர்நாய் தடுப்பூசியானது, கால்நடை வைத்தியர்கள் அல்லாதவர்களாலே செலுத்தப்பட்டு வந்தது. இவ்வாறு செலுத்துவதானது பொருத்தமற்றது என்றே நான் எண்ணுகின்றேன்.

இலங்கையில் 1947ஆம் ஆண்டு காலப்பகுதியில் கால்நடை வைத்தியர்கள் கொழும்பு பல்கலைக்கழகத்தின் மருத்துவ பீடத்திலே கல்வி கற்றார்கள். அதன் பின்னர், 1954ஆம் ஆண்டு பேராதனைப் பல்கலைக்கழகத்தின் மருத்துவ பீடத்தில் கல்வி கற்றார்கள். அதன் பின்னர், 1973ஆம் ஆண்டு பேராதனைப் பல்கலைக்கழகத்தில் கால்நடை வைத்தியர்களுக்கென கல்லூரியொன்று உருவாக்கப்பட்டது. அதன் பின்னர், 1980ஆம் ஆண்டு அது தனியானதொரு பீடமாக உருவாக்கப்பட்டது. இலங்கையில் கால்நடைத் துறையை அபிவிருத்தி செய்வதற்குத் தரமான கால்நடை வைத்தியர்களை உருவாக்குவதற்காகத் தனியான பீடமொன்று உருவாக்கப் பட்ட பின்னரும், நாய்களுக்குச் சிகிச்சையளிப்பதற்கு கால்நடை வைத்தியர்கள் அல்லாதவர்களைப் பயன்படுத்தி யிருப்பது என்பது மனவேதனைக்குரிய விடயமாகும்.

நான் ஒரு கால்நடை வைத்தியர் என்ற வகையிலும், கிட்டத்தட்ட 20 வருடங்கள் இத்துறை சார்ந்த தொழிலில் ஈடுபட்டவன் என்ற வகையிலும், ஒரு விடயத்தைக் குறிப்பிட விரும்புகின்றேன். நாய்களைச் செல்லப்பிராணிகளாக வளர்க்கின்றவர்கள் அவற்றுக்கு கால்நடை வைத்தியர்கள்தான் சிகிச்சையளிக்க வேண்டுமென விரும்புகின்றார்கள். ஒரு நாய்க்கு தடுப்பூசி ஏற்றுவதென்றால், அந்த நாயின் ஆரோக்கிய நிலை பற்றி தெரிந்திருக்க வேண்டும். கால்நடை வைத்தியர் அல்லாத ஒருவர் நாய்க்குத் தடுப்பூசி வழங்கும்போது, அது தொடர்பான அனுபவமோ, அறிவோ அவருக்கு இருப்ப தில்லை. ஏற்கனவே நோய்வாய்ப்பட்டு இருக்கின்ற ஒரு நாய்க்கு இவ்வாறு தடுப்பூசி ஏற்றினால், அதன் நோய் எதிர்ப்புத் தன்மை வீழ்ச்சியடைந்து, rabiesக்கான நோய் எதிர்ப்புத் தன்மை உருவாகாத நிலை ஏற்படும். இதனால் எங்களால் வழங்கப்படுகின்ற vaccine கட்டாயம் பலனளிக்காது. இதன் காரணமாகவோ என்னவோ தெரிய வில்லை, நூறுக்கும் மேற்பட்ட நாடுகளில் விசர்நாய்க்கடி நோய்த் தடுப்பூசி ஏற்றும் நடவடிக்கையானது கால்நடை வைத்தியர்களாலே மேற்கொள்ளப்படுகின்றது. ஆனால், இலங்கையில் இதுவரை காலமும் இந்தத் தடுப்பூசி ஏற்றல் நடவடிக்கையானது கால்நடை வைத்தியர்கள் அல்லாத ஏனைய சுகாதார ஊழியர்கள் ஊடாகவே மேற்கொள்ளப் பட்டது என்பதை நான் இந்தத் தருணத்தில் குறிப்பிட விரும்புகின்றேன்.

எமது நாடு வளர்ச்சிப் பாதையில் செல்ல வேண்டும் என்பதற்காக நாங்கள் பல்வேறு பொருட்களை ஏற்றுமதி செய்கின்றோம். கடந்த காலத்தில் இலங்கைக்கு வெளிநாடு களிலிருந்து நல்ல இன நாய்கள் இறக்குமதி செய்யப்பட்டன. எமது நாட்டிலிருந்து நல்ல இன நாய்களை வெளிநாடுகளுக்கு ஏற்றுமதி செய்வதென்றால், கட்டாயம் அவற்றுக்கு தடுப்பூசி ஏற்றப்பட்டிருக்க வேண்டும். அதுவும் கால்நடை வைத்தியர் களால் மட்டும் ஏற்றப்பட்டிருக்க வேண்டும். அவ்வாறு இருந்தால்தான் அந்த நாய்களை வெளிநாடுகளுக்கு ஏற்றுமதி செய்ய முடியும் என்பதை நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். கால்நடை வைத்தியர் அல்லாதவர்கள் தடுப்பூசி ஏற்றியிருந்தால், சில நாடுகளில் அந்த நாய்களை அழிப்பதற்குக்கூட சட்டங்கள் காணப்படுகின்றன. அந்த வகையில், இன்றைய தினம் கொண்டுவரப்பட்டு இருக்கின்ற இந்தச் சட்டமூலமானது சிறந்ததொரு சட்டமூலமாகும். எதிர்காலத்தில் எமது நாட்டில் கால்நடைத்துறை சிறந்ததொரு துறையாக மாறுவதற்கு இந்தச் சட்டமூலம் வழிவகுக்குமென நான் நினைக்கின்றேன்.

நான் நினைக்கின்றேன், கிட்டத்தட்ட 2.5 பில்லியன் ரூபாய் இந்த விசர்நாய்க்கடி நோயை கட்டுப்படுத்துவதற்காகப் பயன்படுத்தப்பட்டு வருகின்றது என்று. குறிப்பாக, 2025ஆம் ஆண்டு 800 மில்லியன் ரூபாய், நாய் கடித்த பிறகு மனிதர்களுக்கு முதலாவதாக ஏற்றப்படுகின்ற pre-exposure vaccineக்காகவும் antiserum ஏற்றுவதற்காகவும் செலவழிக்கப் பட்டுள்ளது. 800 மில்லியன் ரூபாய் என்பது பாரியதொரு தொகையாகும். எதிர்வரும் காலத்தில் நாங்கள் கால்நடை வைத்தியத்தை சிறந்த முறையில் பயன்படுத்தி இந்த நோயைக் கட்டுப்படுத்தினால், இந்த நாட்டிலிருந்து இதனை இல்லாதொழிப்பதற்கான சாத்தியக்கூறு காணப்படும்.

கால்நடைத் துறையில் பல்வேறுபட்ட குறைபாடுகள் காணப்படத்தான் செய்கின்றன. எமது அரசாங்கம் அவற்றைப் படிப்படியாக நிவர்த்தி செய்து வருகின்றது. விசேடமாக, பல்கலைக்கழகத்தில் கால்நடை மருத்துவ பீடத்துக்குத் தெரிவாகின்ற மாணவர்களின் எண்ணிக்கையை அதிகரித்தும், தனியார் கால்நடை வைத்தியர்களுடைய உதவியைக் கோரியும் தடுப்பூசி ஏற்றும் திட்டத்தை மேற்கொள்வதன்மூலம் இந்த நாட்டிலிருந்து விசர்நாய்க்கடி நோயை இல்லாதொழிக்க முடியும். இலங்கையில் rabies நோயானது, 97 சதவீதம் நாய்கள்மூலமே பரவுகின்றது. மிகுதி 3 சதவீதம்தான் பூனைகள் மற்றும் ஏனைய விலங்குகள்மூலம் பரவுகின்றது. ஏற்கனவே குறிப்பிட்டிருந்தார்கள், இந்தச் சட்டத்தின்கீழ் பூனைகளைப் பதிவுசெய்வதில்லை என்று. பூனைகள் குறிப்பிட்டதோர் இடத்தில் தொடர்ந்து இருப்பதில்லை. அவை பல்வேறு இடங்களுக்குச் சென்று வருவதால், அவற்றை இந்தச் சட்டத்தின்கீழ் பதிவுசெய்வது என்பது சிரமமாகக் காணப்படுகின்றது.

ஏற்கனவே எதிர்க்கட்சித் தலைவர் அவர்கள் தெரிவித்திருந்தார், 2018ஆம் ஆண்டு கால்நடை வைத்தியர் களிடம் இந்தப் பணி கையளிக்கப்பட்டிருந்தும் செயற்படுத்தப் படவில்லை என்று. அதற்குப் பல்வேறு காரணங்களை நாங்கள் கூறலாம். எழுமாறாக செய்ய முடியவில்லை என்று கூறுவது உண்மையிலே தவறானது. என்ன காரணத்துக்காக அப்பணி நடைபெறவில்லை என்பதை ஆராய்ந்து, அதற்குரிய தீர்வுகளைப் பெற்றுக்கொடுப்பது எமது கடமையாக இருக்கின்றது. கடந்த காலத்தில் அவர்கள் ஆட்சியில் இருந்தபோது, அவ்வாறான தவறைச் செய்திருக்கிறார்கள். ஆனால், எமது அரசாங்கம் ஒருபோதும் மற்றவர்களை வைத்து இந்தப் பணியைச் செய்யாது. ஏற்கெனவே கால்நடை வைத்தியர் அல்லாதவர்கள் தடுப்பூசி ஏற்றிய நாய்களை சந்தேகத்தின் பேரில் அதன் உரிமையாளர்கள் கொண்டுவந்து, மீண்டும் அவற்றுக்குத் தடுப்பூசி செலுத்துமாறு கோரியிருக் கிறார்கள் என்பதை நான் கால்நடை வைத்தியர் என்ற

முறையில் இங்கு குறிப்பிடுகின்றேன். எனவே, செல்லப் பிராணிகளுக்கு கால்நடை வைத்தியர்கள் மூலமே தடுப்பூசியைச் செலுத்த வேண்டும்.

இன்றைய தினம் கொண்டுவரப்பட்டுள்ள சட்டமூலத்தில் வளர்ப்பு நாய்களைப் பதிவு செய்ய வேண்டியது கட்டாயமாக் கப்பட்டுள்ளது. இதன்மூலம் எமது நாட்டில் கட்டாக்காலி நாய்களைக் குறைக்க முடியும். அதுமாத்திரமல்ல, மிருகவதை செய்கின்றவர்களைத் தண்டிக்கக்கூடிய வாய்ப்பும் கிடைக் கின்றது. பல இடங்களில் நாய்கள் குட்டி போட்டவுடன் அவற்றை வீதிகளில் விட்டுச் சென்றுவிடுகிறார்கள். இந்தச் சட்டத்தின்மூலம் அவ்வாறானவர்களைத் தண்டிப்பதற்கு வாய்ப்பு இருக்கின்றது. அதாவது, அவர்களுக்கு 10,000 ரூபாய் தண்டப்பணமும் 3 மாதங்கள் சிறைத்தண்டனையும் வழங்க முடியும். செல்லப்பிராணிகளை அன்பாகப் பராமரிக்கின்றவர் களுக்கும் ஜீவகாருண்யம் உள்ளவர்களுக்கும் இந்தச் சட்டம் சிறந்ததொன்றாக விளங்குமென நான் இந்தச் சந்தர்ப்பத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன். இந்தச் சட்டத்தைச் சிறந்த முறையில் பயன்படுத்தி, கால்நடைத்துறைக்கு மாத்திரமல்ல, செல்லப்பிராணிகளுக்கும் நல்லதோர் எதிர்காலத்தைப் பெற்றுக்கொடுக்க முடியும். யாழ்ப்பாணத்தில் நான்கு நபர் களுக்கு ஒரு செல்லப்பிராணியாக நாய் காணப்படுகின்றது. செல்லப்பிராணிகள் உளவியல் ரீதியாக மனிதர்களுக்குப் பல வழிகளில் உதவுகின்றன. எனவே, செல்லப்பிராணிகளுக்கு கால்நடை வைத்தியர்கள் ஊடாகச் சிகிச்சையளிக்க வேண்டு மென இந்தத் தருணத்தில் கூறி, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.40]

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සාකච්ඡා වන විෂයයට සෘජුව අදාළ නොවුණත්, සමස්තයක් ලෙස ගත් කල සමාජයේ පවතින සාමාන්‍ය ආතතිය හෝ අසහනය කියා හඳුන්වන්න පුළුවන් general tension එක වැඩි වෙමින් පවතින බව අපට නිරීක්ෂණය වෙනවා.

පසුගිය දවස්වල සිදු වුණු, අපේ මහාර්ඝ ජාතික සම්පතක් වූ කාවන්තිස්ස ඇතාගේ මියයෑමත් එක්ක, පසුගිය සති කිහිපය තුළ සමාජ මාධ්‍ය ඇතුළු මාධ්‍යවල පළ වූ දේවල් නිරීක්ෂණය කළ ආකාරය අනුව අපට පෙනෙනවා, මේ රටේ තාරුණ්‍යය ඒ පිළිබඳව දැඩි කම්පනයකට පත් වෙලා සිටින බව. සමහර තැන්වල දන්සැල් පවා පවත්වමින්, නගර ආශ්‍රිතව, ගම් දනව් ආශ්‍රිතව ඔවුන් තමන්ගේ ශෝකය ප්‍රකාශ කරන ආකාරය මම දැක්කා. මේ තමයි සංවේදී ශ්‍රී ලාංකිකයාගේ හැසිරීම, සංවේදී ශ්‍රී ලාංකික තාරුණ්‍යයේ හැසිරීම. අපි මෙය හඳුනාගත යුතුයි.

ඒ වාගේම, අපේ ස්වාමීන් වහන්සේලා, ඉල්ලීම් කිහිපයක් අරබයා පා ගමනින් කොළඹට ඇවිල්ලා, උද්ඝෝෂණයක් කළා. ඥානසාර ස්වාමීන් වහන්සේ සිරගත කිරීම සම්බන්ධයෙන්, උන්වහන්සේගේ චීවරය ඉවත් කිරීම සම්බන්ධයෙන් අදහස් දක්වමින්, උන්වහන්සේට ලැබුණු ජනාධිපති පොදු සමාවේ තිබුණු පරිපාලන දුෂ්කරතා මඟ හැර නැවත සමාව ලබා දිය යුතුයි කියන මතයේ සිටිමින් එම ස්වාමීන් වහන්සේලා ජනාධිපති මන්දිරය ඉස්සරහට ගිහිල්ලා එතැනදී තමන්ගේ සටන් ක්‍රියාවලියේ නිදහසේ නියුක්ත වනකොටම ඒකට විරුද්ධව අධිකරණ නියෝගයක් ලැබුණා. ඊට පසුව ඒ විරෝධතාකරුවන් - ඒ ස්වාමීන් වහන්සේලා - ගියා, විහාර මහා දේවි උද්‍යානයට. උන්වහන්සේලා බොහොම අහිංසක විධියට ඒ කටයුත්ත කරගෙන යන අතරේ තවත් අධිකරණ නියෝගයක් මඟින් දැන් ඒ කටයුත්ත නවත්වා තිබෙනවා.

මෙතුමන්ලාත් එක්ක යහ පාලන ආණ්ඩුව කාලයේ හරි හරියට කටයුතු කළ උලපනේ සුමංගල ස්වාමීන් වහන්සේට අද ගෘන්ඩිපාස්වල අධ්‍යාපන කාර්යාලය ඉදිරියෙන්වත් යන්න බැහැ. මොකද, මම දැක්කා කොළඹ තිබෙන බොහෝ තැන් - පදික වේදිකාවල නම් පවා - එම නියෝගයට යටත් කරලා තිබෙනවා. උන්වහන්සේ අධ්‍යාපනවේදියෙකු වන නමුත්, උන්වහන්සේට ඒ අධ්‍යාපන කාර්යාලයටවත් යන්න බැහැ. මේ ක්‍රියාවෙන් වෙන්නේ ජනතාවට තමන්ගේ විරෝධය ප්‍රකාශ කිරීමට තිබෙන අවස්ථාව දැඩි ලෙස අවහිරයට පාත්‍ර කරන එකයි. ඊට අමතරව, ජනතා අප්‍රසාදය හා අසහනය පිට කරන්නට තිබෙන අවස්ථා සියල්ල ඒකාධිපති ස්වරූපයකින් සංකෝචනය කිරීම නිසා මේ සමාජය තුළ ඊටත් වැඩි අසහනයක් වර්ධනය වෙමින් තිබෙන බව නිරීක්ෂණය වෙනවා. සාමාන්‍යයෙන් මේ වාගේ විශාල බලයක් ලැබුණාම ඉතිහාසය පුරාම සිද්ධ වෙලා තිබෙන්නේ, තමන්ගේ කටයුතු ඒ බලයට අනුරූපව, ඒ ප්‍රමාණයටම ඒකාධිපති වන එකයි. මා ඒකයි කියන්නේ, දැනට ලංකා ඉතිහාසයේ වඩාත්ම ඒකාධිපති වෙමින් සියලුම ආයතන මෙහෙයවමින් ඉන්නේ ඔබතුමන්ලායි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට අමතර විනාඩි 3ක කාලයකුත් ලැබෙනවා.

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ පාර්ලිමේන්තු කාල සීමාව තුළ මගේ කථාවකට වැඩිපුර කාලයක් මේ ලැබුණාමයි. කොහොම වුණත් බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ පවතින තත්ත්වය තුළ අපට නිරීක්ෂණය වනවා, ජනතාවගේ සැබෑ හැඟීම් සම්බන්ධයෙන් මේ රජය - මේ ආණ්ඩුව - දැන් නිර්වින්දනය වෙලා වාගේ ඉන්න බවක්. එයට හේතුව මට තේරෙනවා. විශාල බලයක් තිබෙන ආණ්ඩුවකට නොලැබෙන ප්‍රධානම වරප්‍රසාදය තමයි මහ පොළොවෙන් එන සැබෑ තොරතුරු. මොකද, බලය තිබෙන කොට කවුරුවත් ඇවිල්ලා සැබෑ තොරතුරු ලබා දෙන්නේ නැහැ. ඒ ආණ්ඩුවට බලය පාවිච්චි කරලා රැස්වීම් තියන්න පුළුවන්; බලය පාවිච්චි කළාම බස්වලට සෙනඟ නංවා ගන්න පුළුවන්; බලය පාවිච්චි කරලා තමන්ගේ හයිය හත්තිය පෙන්වන්න පුළුවන්. ඉතින් ජනතාවත් ඒකටම අනුගත වෙලා ඔබතුමන්ලාට ලණු දෙනවා වෙන්න පුළුවන්; ඔබතුමන්ලාට ඇත්ත නොකියනවා වෙන්න පුළුවන්. හැබැයි, දැන් වෙලා තිබෙන්නේ මොකක්ද? ඔබතුමන්ලාට සහයෝගය දෙන ස්වාමීන් වහන්සේලා කිහිපනමක් ඉන්න පුළුවන්. නමුත්, සමස්තයක් හැටියට මේ රටේ මහා සංඝ රත්නය විශාල විරෝධයකින් කටයුතු කරනවා. උන්වහන්සේලා දකින්නේ උන්වහන්සේලා වෙත සහ අපේ බුදු දහම වෙත දැඩි පීඩනයක් එල්ල කරන බවකුයි. එම නිසා ඔබතුමන්ලා මේක තේරුම් ගත්තොත් හොඳයි. තේරුම් නොගත්තොත් බොහොම කනගාටුයි.

[ගරු දිලිත් ජයවීර මහතා]

ඊළඟට, මේ සභාවේදී ඊයේත් සාකච්ඡා වුණා, ලංකාවේ දැන් මත්කුඩු වැඩි ප්‍රමාණවලින් අල්ලනවා කියලා. මත්කුඩු වැඩියෙන් ඇල්ලුවා කියලා, වැඩියෙන් කුඩු අල්ලපු ප්‍රමාණයට ලංකාවේ මත්ද්‍රව්‍ය ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. මේ තාරුණ්‍යයට අපේක්ෂා නැත්තම්, ඔවුන් අපේක්ෂා භංගත්වයට පත් වෙලා නම්, තමන්ගේ අවශ්‍යතාවට සරිලන ධනයක් ඔවුන්ට ලබා ගන්නට බැරි නම්, ඔවුන්ට උදෑසන අවදි වුණාම විශේෂ අපේක්ෂාවක් නැත්නම්, ඔවුන් සරල චින්දනයන්ට පෙළඹෙනවා. ඒවායෙන් එකක් තමයි මත්ද්‍රව්‍ය භාවිතය. ආණ්ඩු පක්ෂයේ අපේ මිත්‍ර ගරු මන්ත්‍රීවරුනි. මම මේක වගකීමෙන් කියන්නේ. ලංකාවේ කුඩු ප්‍රශ්නය ඔඩු දුවලා තිබෙනවා; බරපතළ විධියට ඔඩු දුවලා තිබෙනවා. දැන් ඒක පාසල් මට්ටමට ගිහිල්ලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් නිශ්චිතව අධ්‍යයනයක් කරන්න, මහ පොළොවේ අධ්‍යයනයක් කරන්න. මත්කුඩු ඇල්ලීමෙන්ම කුඩු නවත්වන්න හදනවා නම්, එය සාර්ථක වන්නේ නැහැ. මොකද, ඒක ලෝකයේ කිසිම රටක් කරපු නැති දෙයක්. ලෝකයේ කිසිම රටක් එහෙම කරලා නැහැ. කරන්න තිබෙන්නේ ප්‍රශ්නයේ මූල බීජය හොයාගෙන ඊට විසඳුම් සපයන එකයි.

විශේෂයෙන්ම තාරුණ්‍යයේ අසහනය වැඩි වන්නේ ඔවුන්ට විකල්ප චින්දන අවස්ථා නොතිබීම නිසායි; ඒ වාගේම ඔවුන්ට විකල්ප විනෝදාස්වාදයක් නොතිබීම නිසායි. ඒ හේතුවෙන් ඔවුන් මේ තත්ත්වයට පෙළඹෙන බව අප පිළිගත යුතු කාරණයක්.

ඇත්ත වශයෙන්ම කිව්වොත්, රටක මත්ද්‍රව්‍ය භාවිතය හා සමානව සාපේක්ෂයි, රටක ආර්ථික තත්ත්වය. ඒ රටේ ආර්ථික තත්ත්වය තුළ ධනය නිර්මාණය නොවන හැම විටකම, රට වැසියන්ගේ අපේක්ෂා අහිමි වන හැම අවස්ථාවකදීම ඔවුන් මේ කියන කෙටි මාර්ග සොයා ගන්නවා. මත්ද්‍රව්‍ය භාවිතය නවත්වන්න කියලා කොතරම් කිව්වත්, කොතරම් දැන්වීම් දැම්මත්, ඔබ කොතරම් දේවල් පැවසුවත් යථාර්ථය එයයි.

මේ ප්‍රශ්න මෙහෙම සාකච්ඡා කරන්න අප ඔබව උනන්දු කරවන්නේ මේ රටට ආදරය කරන, මේ මව්බිමට ආදරය කරන පුරවැසියන් හැටියටයි. එසේ නැතිව, හුදු විරුද්ධ පක්ෂ දේශපාලනඥයන් හැටියට නොවෙයි. අප ඔබේ අවධානය යොමු කරන්න හදන්නේ මේ රටේ, මේ මහ පොළොවේ යථාර්ථය කෙරෙහියි. අපේ රටේ මිනිසුන්ගේ මේ සැබෑ සංවේදී තත්ත්වය සම්බන්ධයෙන් ඔබ අසංවේදී වෙනවා නම්, එයට පිළිතුරු ලැබෙන්නේත් ඒ වේගයෙන්ම බව අප මතක තියා ගන්න ඕනෑ. අපි ඉතිහාසයෙන් පාඩම් ඉගෙන ගන්න ඕනෑ. ආණ්ඩුකරණයේදී ඒකාධිපතිභාවය භාවිත කරලා කවමදාවත් ජයග්‍රහණයක් ලබා ගෙන නොමැති බව අපි තේරුම් ගන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, PTA එක වෙනුවට දැන් අලුත් පනත් කෙටුම්පතක් ගේන්න හදනවා. ඒ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අපට දැනෙන කාරණය මොකක්ද? ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතින් ඔබ්බට ගිය පනත් කෙටුම්පතක් මඟින් ඔබ මේ රටේ අහිංසකම අහිංසක මනුස්සයා ඇතුළු සාමාන්‍ය ජනතාවගේ කථා කිරීමේ නිදහස - භාෂණයේ නිදහස - සහ මූලික මිනිස් අයිතිවාසිකම් සියල්ල වෙනදා කළාටත් වැඩියෙන්, එක විට ඩැහැ ගන්නා ආකාරයක් අපට පෙනෙනවා. ඉතින් මෙයින් සිදු වන්නේ අසහනය මත අසහනය ඇති වනවා මිස විසඳුම් ලැබීම නොවෙයි. අපි ඔබගේ හතුරා හඳුනනවා. ඔබ දන්නවා, ඔබට හතුරෙකු ඉන්නවා කියලා. කවුද ඒ හතුරා? ඒ, ජීවන බර නමැති හතුරායි. මේ සියලු ප්‍රශ්න පිටුපස වඩාත්ම හොල්මන් කරන ඒ මහා විශාල සතුරා හඳුනා ගන්න. අද ජනතාව අධික ජීවන බර නිසා අන්තිම අඩියට මිරිකිලා ඉන්නේ. එය මේ රටේ සියලු මිනිසුන්ට බලපානවා. නමුත් මිනිස්සු කර කියා ගන්න දෙයක් නොමැතිව ඉන්නවා. ඔබ, දත්ත ගෙනැල්ලා ඉදිරිපත් කරනවා. ඒකට කියන්නේ, fiscal consolidation කියලා; "අපි මූල්‍යමය ස්ථාවරත්වයක් ගෙනාවා" කියලා දත්ත ගෙනැල්ලා දෙනවා. නමුත් ඒ දත්ත සහ ඇත්ත අතර තිබෙන යථාර්ථය හඳුනා ගන්න නම්, ඔබ යන්න ඕනෑ ඇත්ත මිනිසුන් අතරට. ඔබව දීර්ඝ කාලයක් හඳා වඩා ගත්තු කාඩර්වරුන් ළඟට ගිහිල්ලා ඔබට ඇත්ත හොයා ගන්න බැහැ. මොකද, ඔවුන් ඔබ වෙනුවෙන් වහල්භාවයෙන්ම කටයුතු කිරීමට හැමදාම පුරුදු වෙලා ඉන්නවා. ඒ නිසා ඔවුන් කියන තොරතුරු ගන්න එපා. ගිහිල්ලා බලන්න, ජනතාවගේ මුදල් පසුම්බියට ඇත්තටම මොකක්ද වෙලා තිබෙන්නේ කියලා; ජනතාව අද ජීවත් වෙන්නේ කොහොමද කියලා. ඒක හරිම සරලව තේරුම් ගන්න පුළුවන්. තමන්ගේ ආදායම වැඩි වෙලා නැත්නම්, තමන්ගේ වියදම තුන්හතර ගුණයකින් වැඩි වෙලා නම් ඇති වන අර්බුදය තේරුම් ගන්න ආයෙත් විශේෂ ගණිත සමීකරණ, ප්‍රමේයයන් අවශ්‍ය නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි. කථාව අවසන් කරන්න.

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මට තව සුළු වේලාවක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේක අපේ ආයාචනයක්. මේ රටේ අහිසංක මිනිසුන් වෙනුවෙන්, මේ රටේ තාරුණ්‍යය වෙනුවෙන්, මේ රටේ භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් අප මේ කරන්නේ ආයාචනයක්. මේවාට සරල විසඳුම් තිබෙනවා. අපේ නායක හාමුදුරුවන් වහන්සේට ජනාධිපති පොදු සමාව දීමෙන් ඔබට කිසිම හානියක් වෙන්නේ නැහැ; නීතියට පටහැනිව කටයුතු කිරීමක් සිදු වන්නේත් නැහැ. මේවා පොඩි දේවල්.

අපේ කාවන්තිස්ස ඇතා මිය ගියාට පස්සේ අපේ තාරුණ්‍යය අපේක්ෂා භංගත්වයට පත් වෙලා සිටිනවා, ඉතිරි වෙලා ඉන්න ඇතුන්ට මොකක්ද වෙන්නේ කියා සිතමින්. පොලීසිය තුවක්කුවක් එක්ක කොහේහරි ඉන්න මනුස්සයෙකු අරගෙන ගිහිල්ලා රිමාන්ඩ් කළාට ඒ තරුණයන්ට බලාපොරොත්තුවක් ඇති වෙන්නේ නැහැ, තමන් ආදරය කරන අලි ඇතුන් පරපුර රැකෙයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මේ ප්‍රශ්නයට සැබෑ උත්තරයක් දෙන්න කියා ඉල්ලා සිටිමින්, අද මෙහි පැමිණ සිටින මොනරාගල බකිනිගහවෙල මුස්ලිම් මධ්‍ය මහා විද්‍යාලයේ දරුවන්ටත් ආචාර කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිශාන්ත පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.51]

ගරු නිශාන්ත පෙරේරා මහතා
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා, ජලභීතිකා රෝගය තුරන් කිරීමේ සහ සුනඛයන් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම ගැන. ඒ ගැන කථා කරන්න මත්තෙන් කිව යුතු දෙයක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජලභීතිකා රෝගය උත්සන්න වුණාට පස්සේ, එම රෝගයේ උච්චතම අවස්ථාව තමයි පිස්සු හැදෙනවා කියන එක. විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් සම්බන්ධවත් මට පෙනෙන දෙයක් තිබෙනවා. හම්බන්තොට පැත්තෙන් ආපු මන්ත්‍රීවරයා කථා කරපු වෙලාවේත් මට හිතුණා, ඒ රෝගය වැළඳිලාවත්ද කියලා. මොකද, එතුමා මාතෘකාවට අදාළව කථා කළේම නැහැ. ජලභීතිකා රෝගය තුරන් කිරීමේ සහ සුනඛයන් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත ගැන නොවෙයි එතුමා කථා කළේ. දැනුත් පක්ෂයක නායකයෙක් කථා කළා. හැබැයි, මේ පනත් කෙටුම්පත ගැන එකම වචනයක්වත් කථා කළේ නැහැ. ඒ නිසා මට හිතෙනවා, රෝගය උත්සන්න වෙලාද මේ ඇවිල්ලා ඉන්නේ කියලා. එහෙම තමයි වෙලා තිබෙන්නේ. හම්බන්තොට පැත්තෙන් ආපු මන්ත්‍රීවරයා කථා කළේ, රාජපක්ෂ පවුල ගැන. ඕනෑම කෙනෙක් - කිරි දරුවෙකු වුණත් - දන්නවා, මහජන නියෝජිතයන් විධියට ෆුට් බයිසිකලයෙන් ආපු මිනිස්සු හෙලිකොප්ටර් ගන්න කොට, කොළඹ 7න් ගෙවල් ගන්න කොට මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. බුදු රජාණන් වහන්සේ දේශනා කර තිබෙනවා, හේතුඵලවාදය. හේතුව හොයලා ඒ වෙනුවෙන් දැන් නීතිය ක්‍රියාත්මක කරන කොට කට්ටියට රිදිලා තිබෙනවා. නීතිගරුක රටක් හදන කොට, යුක්තිගරුක රටක් හදනකොට, සාධාරණ රටක් හදනකොට කට්ටියට රිදිලා තිබෙනවා. මොකද, ජලභීතිකා රෝගය තුරන් කිරීමේ සහ සුනඛයන් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත ගැන කථා කරන මේ වෙලාවේ වෙන වෙන දේවල් ගැන තමයි ඒ අය කථා කරන්නේ. නමුත්, මේ රටේ ජනතාව දැන් නොමඟ යවන්න බැහැ. නොමඟ ගිය මිනිස්සු නම් දැන් සුමඟට ඇවිල්ලා ඉන්නවා. ජනතාව නොමඟ යවපු මිනිසුන් සම්බන්ධයෙන් දැන් අවශ්‍ය කටයුතු ටික සිද්ධ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජලභීතිකා රෝගය සම්බන්ධයෙන් තිබෙන ආඥා පනත සංශෝධනය වෙන්න ඕනෑ. අපේ ආණ්ඩුව විශේෂයෙන් නීති රීති, අණ පනත් සම්මත කරනවා. එමඟින් මේ රට ඇත්තටම නියම ගමනකට තල්ලු කරනවා; නියම පිල්ලට දමනවා.

සුනඛ ගහනය කියන ප්‍රශ්නය ගත්තොත්, සුනඛ ගහනය වේගයෙන් වැඩි වෙලා තිබෙනවා. සුනඛ ගහනය වේගයෙන් වැඩි වීම අපේ රටේ බරපතළ සමාජ ප්‍රශ්නයක් විධියටත් වර්ධනය වෙලා තිබෙනවා; එය අපේ රටේ සංස්කෘතියට දැවැන්ත බලපෑමක් ඇති කර තිබෙනවා; ඒ වාගේම පරිසරයට දැවැන්ත බලපෑමක් ඇති කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා, දකුණු පළාතේ වෙරළ තීරය සංචාරක කලාපයක් බව. එම සංචාරක කලාපයේ සංචාරකයන්ට මොනම විධියකටවත් ඉන්න බැහැ, මේ සුනඛ ගහනය නිසා. සම්බන්ධීකරණ කමිටුවලදී එන ප්‍රධාන ප්‍රශ්නය තමයි, සුනඛ ගහනය අවම කරන්නේ කොහොමද, ඒවා පාලනය කරන්නේ කොහොමද, ඒවා නියාමනය කරන්නේ කොහොමද කියන එක. පාරකට බහින්න බැහැ. මුළු රටේම එහෙමයි. අද මෙය බරපතළ ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා; පාරේ යන්න බැරි මට්ටමකට, ඒ වාගේම පූජනීය ස්ථානයකට යන්න බැරි තත්ත්වයකට, වෙනත් පොදු ස්ථානයකට යන්න බැරි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. විපක්ෂයේ මන්ත්‍රීවරුත් ඒ ගැන කිව්වා. විශේෂයෙන් ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමාත් ඒ ගැන කිව්වා. එසේ අදහස් දැක්වීම සම්බන්ධයෙන් අපි ඇත්තටම එතුමන්ලාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. පූජනීය ස්ථාන, රෝහල් ඇතුළු පොදු ස්ථානවලට, ඒ සෑම තැනකටම අද යන්න බැහැ. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය අනිවාර්යයෙන්ම නියාමනය වෙන්න ඕනෑ. සුනඛ ගහනය උග්‍ර වීමෙන් වර්ධනය වන ජලභීතිකා රෝගි තත්ත්වය මර්දනයට රටක් විධියට අපට දැවැන්ත - අතිවිශාල - ජාතික ධනයක් වැය වනවා. අපි ජාතික ධනයෙන් සාමාන්‍යයෙන් රුපියල් බිලියන 2ක් - රුපියල් මිලියන 2,000ක් - විතර ඒ සඳහා වියදම් කරනවා. ඒ නිසා මෙක දැවැන්ත ප්‍රශ්නයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ සුනඛ ගහනය නිසාම මාර්ග අනතුරු සිදු වනවා. විශේෂයෙන් යතුරු පැදිවලට පාරේ යන්නම බැහැ. කොළඹ නගරය ගත්තත්, ප්‍රධාන නගරයක් ගත්තත්, පූජනීය ස්ථානයක් ගත්තත්, පොදු ස්ථානයක් ගත්තත්, මේ හැම තැනකම සුනඛ ගහනය වැඩි වෙලා තිබෙනවා. ඒකත් එක්ක මතු වෙච්ච ගැටලුවක් තමයි, රිය අනතුරු සිදු වීම. රිය අනතුරු නිසා පුද්ගලයන් සදාකාලිකවම ආබාධිත වන තත්ත්වයට පත් වෙනවා. එක පැත්තකින්, සුනඛයන් සපා කෑම නිසා ප්‍රශ්න ඇති වෙනවා. තව පැත්තකින්, සුනඛයන් ඇහේ හැපිලා අනතුරු සිදු වෙලා සදාකාලිකවම රෝගාතුර වන, ආබාධිත වන තත්ත්වයට පත් වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තත්ත්වය හමුවේයි ගරු අමාත්‍යතුමා ප්‍රමුඛ වර්තමාන ආණ්ඩුව මේ පනත් කෙටුම්පත ගෙනැල්ලා තිබෙන්නේ. අද මේ පනත් කෙටුම්පත ගැන සාකච්ඡා කරලා, සෞඛ්‍ය අමාත්‍යාංශයත්, පළාත් පාලන අමාත්‍යාංශයත්, අනෙකුත් ආයතනත් මේ සම්බන්ධයෙන් පුළුල් අවබෝධයකට එනවා. ඊට පස්සේ මේ ගරු සභාවේ ඉදිරිපත් කළ යෝජනා හා අදහස් අරගෙන ඒවාත් බලලා තමයි මේ පනත් කෙටුම්පත ඉදිරියේදී සම්මත කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර අවස්ථාවල මේ සම්බන්ධයෙන් බිල්ලෝ මවන්නත් හදනවා. වර්තමාන ආණ්ඩුව විධියට අපි නීතිගරුක, යුක්තිගරුක, සාධාරණ රටක් හදනවා වාගේම ඇළ දොළ, ගඟකොළ, සතා සිව්පාවාට ආදරය කරන ආණ්ඩුවක්. මේක ජනතාවගේ ආණ්ඩුවක්. ජනතාවගේ ආණ්ඩුවක් වන නිසාම අපි මෙවැනි නීති සම්මත කරනවා. අපේ වුවමනාව, මේ ආණ්ඩුවේ වුවමනාව වෙලා තිබෙන්නේ ම්ලේච්ඡත්වයට යමින් තිබිච්ච මේ රට මනුෂ්‍යත්වයේ දිශාවට හැරවීමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අදාළ සියලු ආයතන ජලභීතිකා රෝගය මැඩලීමට මැදිහත් වෙනවා. කලින් මෙහි මූලික කටයුත්ත කළේ සෞඛ්‍ය අමාත්‍යාංශයයි. ඊට පසුව පශු වෛද්‍ය කාර්යාල, පළාත් පාලන ආයතන සම්බන්ධීකරණය කරලා, මධ්‍යගත කරලා මේ සම්බන්ධයෙන් මේ ගරු සභාවේ ගරු ඇමතිවරුන්ගේ, මන්ත්‍රීවරුන්ගේ යෝජනා සහ අදහස් ද අරගෙන ඉදිරියේදී පනත් කෙටුම්පතක් විධියට සංශෝධන සහිතව මෙය සම්මත කර ගන්න තමයි මේ කටයුතු කරන්නේ.

මේ තිබෙන තත්ත්වය නියාමනය කරලා වර්ෂ 2030 වනකොට අපේ රට ජලභීතිකා රෝගය නැති රටක් බවට පත් කරන්න පළාත් පාලන ආයතනවලටත් මේ පනත් කෙටුම්පත මඟින් සැලකිය යුතු බලයක් පැවරෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සඳහා තමයි අද මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා තිබෙන්නේ. මම විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා මේ පනත් කෙටුම්පත ගෙනැවිත් තිබෙන මේ වෙලාවේ, අපේ රටට

[ගරු නිශාන්ත පෙරේරා මහතා]

විතරක් නොව, ලෝකයටත් - දේශීයව සහ ජාත්‍යන්තරවත් - දැවැන්ත ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙන සුනඛ ගහනය, එහෙම නැත්නම් ජලභීතිකා තත්ත්වය වර්ෂ 2030 වනකොට අපේ රටින් තුරන් කිරීම සඳහා නීති අණ පනත් සම්මත කිරීමට කටයුතු කරන මේ වෙලාවේ අදහස් ප්‍රකාශ කරන්න මට අවස්ථාව ලබා දීම පිළිබඳව. එසේ ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[පි.ප. 3.00]

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(මාණ්පුමිකු இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
නන්දි, කෞරව තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළේ, இன்று விசர்நாய்க்கடி நோயை ஒழித்தல் மற்றும் நாய்களைப் பதிவுசெய்தல் சட்டமூலம் மீதான விவாதம் நடைபெற்றுக் கொண்டு இருந்தாலும், எனக்கு ஒதுக்கப்பட்ட இந்த நேரத்திலே நான් பிரතිනිතිත්වුවප්පටුත්තුකින්ර තිරුකෝණමලෛ මාවට්ටත්තිලේ කාණප්පටුකින්ර කාණි සම්පන්තමාන චිල විටයංකළෛ ඉන්ත උයිය සපෛයිලේ කූරලාමෙන නිනෛක්කින්රේන්. තොටර්ච්චියාක ඉන්තක් කාණි සම්පන්තමාන විටයංකළ් ඉන්තප් පාරාළුමන්රත්තිලේ පේසප්පටුකින්රන. අතිලුම් කිළක්කු මාකාණම්, කුරිප්පාක තිරුකෝණමලෛ මාවට්ටත්තිලේ මුස්ලිම් මක්කළ් වාළුකින්ර පිරතේසංකළිලේ තොටර්ච්චියාක ඒතාවතු පිරච්චිනෛ ඒර්පටත්තාන් සෙය්කින්රතු. නල්ලිණක්කම්, ඔට්රුමෛ, ඉක්කියම් එන්රු පේසුකින්ර ඉන්ත අරසාංකම්, ඉතර්කාන තීර්වෛක් කාණ වේණ්ටුම් එන්පතු එංකළතු එතිර්පාර්ප්පාකක් කාණප්පටු කින්රතු. අන්ත අටිප්පටෛයිලේ, තිරුකෝණමලෛ මාවට්ටත්තිලේ කාණප්පටුකින්ර මූතූර් පිරතේස චෙයලාළර් පිරිවුක්කු උට්පට්ට තෝප්පූර්, ඉක්පාල්නකර්, උල්ලෛක්කුළම් පකුති කළිලේ තර්පෝතු ඒර්පට්ටුළ්ළ එල්ලෛ නිර්ණය පිරච්චිනෛ සම්පන්තමාක ඉන්තච් සපෛයිලේ චිල විටයංකළෛ කූරලාමෙන නිනෛක්කින්රේන්.

අන්ත අටිප්පටෛයිලේ ඉක්පාල්නකර් කිරාම උත්තියෝකත්තර් පිරිවු මර්රුම් නල්ලූර් කිරාම උත්තියෝකත්තර් පිරිවු එන්පවර්රින් එල්ලෛකළුක්කුට්පට්ට උල්ලෛක්කුළම් පකුතියිල් එල්ලෛ නිර්ණයප් පිරච්චිනෛ කාණප්පටුකින්රතු. කුරිප්පාක, උල්ලෛක්කුළම් එන්රු චොල්ලප්පටුකින්ර ඉන්තප් පකුතියිලේ 624 ඒක්කරුක්කුම් අතිකමාන විවසාය නිලංකළිල් තමිළ්, මුස්ලිම් විවසායිකළ් නීණ්ටකාලමාක නෙර්පයිර්ච් චෙය්කෛයෛ මේර්කොණ්ටු වරුකින්රාර්කළ්. ඉක්කාණියෛ නීණ්ටකාලමාකප් පයන්පටුත්තියතර්කාන ආවණංකළ් තම්මිටම් ඉරුප්පතාක අන්ත විවසායිකළ් කුරිප්පිටුකිරාර්කළ්. ඉන්ත නිලෛයිලේ, ඉක්පාල්නකර් කිරාම උත්තියෝකත්තර් මර්රුම් නල්ලූර් කිරාම උත්තියෝකත්තර් පකුතිකළුක්කු ඉටෛයිලාන එල්ලෛ නිර්ණයම් එන්පතු අන්ත විවසායිකළ් මත්තියිලේ අච්චත්තෛ ඒර්පටුත්තියුළ්ළතු. අත්තුටන් අතිකාරිකළ් අන්ත ඉටත්තෛ අළවිටුකින්ර නටවටික්කෛකළෛ මේර්කොළ්කින්රාර්කළ්. ඉන්ත විටයත්තිල් එමක්කු සන්තේකම් ඒර්පටුකින්රතු. එන්ත අටිප්පටෛයිලේ අතු මේර්කොළ්ළප්පටුකින්රතු? එන්රු නාංකළ් කේට්කින්රෝම්.

ඒර්කනවේ අව්විවසායිකළ් තංකළුක්කුක් කාණි වේණ්ටුමෙනක් කෝරික්කෛ විටුත්තිරුන්තාර්කළ්. අන්ත වකෛයිල්, පළංකුටිකළ් එන්ර අටිප්පටෛයිලේ අංකිරුක්කින්ර 34 පේරුක්කු තලා 2 ඒක්කර් වීතම් 68 ඒක්කර් විවසාය නිලම් වළංකුවතර්කාන තීර්මානම් එට්ටප්පට්ටු ඉරුක්කින්රතු. ඉන්තක් කාණිකළ් විවසායත්තුක්කුප් පොරුත්තමානවෛ අල්ල එන්රු කූරප්පට්ටු, මාර්රුක්කාණිකළ් තරුවතාකක් කූරිත්තාන් එල්ලෛ නිර්ණයත්තෛ අන්ත ඉටත්තිලේ මුන්නෙටුක්කින්රාර්කළ්. ඉතනාල් අංකිරුක්කින්ර මක්කළ් අච්චත්තිලේ ඉරුක්කිරාර්කළ්. තාම් ඉව්වළවු කාලමුම් විවසායත්තෛ මේර්කොණ්ට අන්ත ඉටම් ඉල්ලාමල් පෝකප්පෝකින්රතා එන්ර ඕර් එණ්ණප්පාට්ටිලේ අවර්කළ් ඉරුන්තු කොණ්ටු ඉරුක්කිරාර්කළ්.

නාම් මුත්තුනකර් පිරතේස කාණිප් පිරච්චිනෛයෛප් පාර්ත්තිරුක්කිරෝම්. අතේපෝල, කටන්ත පාරාළුමන්ර අමර්වින්පෝතු නාන් සුට්ටික්කාට්ටිය මොරවෙව මර්රුම් රොට්ටුව පකුතියිලුම් කාණිප් පිරච්චිනෛ කාණප්පටුකින්රතු. ඉව්වාරාන කාණිප් පිරච්චිනෛකළ් ඉන්රු තිරුකෝණමලෛ මාවට්ටත්තිල් තොටර්ච්චියාකක් කාණප්පටුකින්රන. තයවුචෙය්තු, අරසාංකම් ඉතිල් විසේට කවනම් චෙලුත්ත වේණ්ටුම්. අතිකාරිකළ් තන්නිච්චෛයාකච් චෙයර්පටු කින්රාර්කළ්; එංකළතු කට්ටළෛකළෛ මීර්රි අවර්කළ් චිල නටවටික්කෛකළෛ එටුක්කින්රාර්කළ් එන්රු නීංකළ් කුර්රච්චාට්ටුකළෛක් කූටුතලාකච් චොල්ලික්කොණ්ටු ඉරුක්කින්රීර්කළ්. ආකෛයාල්, අරසාංකම් ඉතර්කාන තීර්වෛ වළංක වේණ්ටුම් එන්පතු එංකළුටෛය එතිර්පාර්ප්පාකක් කාණප්පටුකින්රතු.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලයට අමතරව තවත් විනාඩි දෙකක කාලයක් ලැබෙනවා.

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(මාණ්පුමිකු இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
බොහොම ස්තුතියි.

මිකවුම් කෂ්ටත්තුක්කු මත්තියිල් අන්ත ඉටත්තිල් ඉව්වළවු කාලමුම් විවසායම් චෙය්තුවරුකින්ර තමිළ්, මුස්ලිම් විවසායිකළ්, තංකළතු වාළ්වාතාරක් කාණිකළ් පරිපෝය්විටුමෝ එන්ර අච්චත්තිල් ඉන්රු උළ්ළනර්. ඉව්විටයම් සම්පන්තමාක අතිකාරිකළුක්කුම් අංකිරුක්කින්ර අරසියල් පිරතිනිතිකළ් මර්රුම් සමූක අමෛප්පුක්කළින් උරුප්පිනර්කළුක්කුම් ඉටෛයිල් පේච්සුවාර්ත්තෛකළ් නටාත්තප් පටුවතිල්ලෛ. ඉතනාල් අවර්කළුක්කු මත්තියිල් මනස්තාපංකළුම් තවරාන පුරිතල්කළුම් ඒර්පටුකින්රන. ඉරණ්টු නාට්කළුක්කු මුන්නර් අතිකාරිකළ් කාණිකළෛ අළවිට මුර්පට්ටපෝතු අංකු අමෛතියින්මෛ ඒර්පට්ටතු. ආකෛයාල්, ඉවර්රෛක් කරුත්තිර්කොණ්ටු, ඉතර්කානතොරු තීර්වෛ වළංක නටවටික්කෛ එටුක්ක වේණ්ටුම් එන්රු නාංකළ් අරසාංකත්තිටම් කෝරික්කෛ මුන්වෛක්කින්රෝම්.

ඉප්පොළුතු අන්ත ඉටත්තිල් එල්ලෛ නිර්ණය නටවටික්කෛ තර්කාලිකමාක ඉටෛනිරුත්තප්පට්ටු ඉරුක්කින්රතු. ඉරුන්තාලුම්, චිල විටයංකළෛ නාංකළ් කූරුකින්රෝම්. අන්ත විටයංකළෛ නීංකළ් මුන්නෙටුක්ක වේණ්ටුම් එන්පතේ එංකළුටෛය එතිර්පාර්ප්පාකක් කාණප්පටුකින්රතු. කුරිප්පාක, කාණි උරිමෛ තොටර්පාන ආවණංකළ් මර්රුම් ඒර්කෙනවේ

எடுக்கப்பட்ட தீர்மானங்கள் முழுமையாக மீளாய்வு செய்யப் பட வேண்டும். முறையான விசாரணை நிறைவடையும்வரை, சர்ச்சைக்குரிய காணிகள் தொடர்பான இறுதி நடவடிக்கைகளை இடைநிறுத்த வேண்டும் என்ற வேண்டுகோளையும் நாங்கள் இந்த இடத்திலே முன்வைக்கின்றோம். தமிழ் மற்றும் முஸ்லிம் விவசாயிகளுடன் சம்பந்தப்பட்ட மக்கள் பிரதிநிதிகள், உள்ளூர் பிரதிநிதிகள் மற்றும் சமூக அமைப்புகளின் உறுப்பினர்கள் அந்தப் பிரதேசங் களில் இருக்கின்றார்கள். இதற்கு ஒரு தீர்வைப் பெறுவதற்கு அவர்களுடன் பேச்சுவார்த்தைகளையும் கலந்துரையாடல் களையும் முன்னெடுத்து, அவர்களுடைய ஆலோசனைகளைப் பெற வேண்டும் என்று இந்த இடத்திலே கேட்டுக் கொள்கின்றேன்.

இந்த விவகாரம் தொடர்பாக மாவட்டச் செயலாளர் மற்றும் பிரதேச செயலாளர் மட்டத்தில் அவசர கூட்டமொன்றை நடாத்தி, இது தொடர்பான முறையான அறிக்கையைப் பெற வேண்டும். என்ன நடைபெற்றிருக்கின்றது, யாரிடம் நியாயம் இருக்கின்றது, எவ்வாறு இந்த நடவடிக்கைகள் முன்னெடுக்கப் படுகின்றன போன்ற விடயங்களை இவர்களோடு கலந்தா லோசித்து நீங்கள் தீர்வை எடுக்க வேண்டும். எந்தவொரு சமூகத்தினுடைய உரிமைகளும் பாதிக்கப் படக்கூடாது என்பது எங்களுடைய எதிர்பார்ப்பாகக் காணப்படுகின்றது. அதே வேளையில், நீண்டகாலமாக விவசாயத்தைச் செய்து வாழ்வாதாரத்தைப் பேணிவரும் இந்த மக்களுக்கு அநீதி இழைக்கப்படாமல், அவர்களுக்கான நீதியை நீங்கள் பெற்றுத்தர வேண்டும் என்பதையும் இந்த உயரிய சபையிலே நான் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

கடந்த பாராளுமன்ற அமர்வில் நான் இது குறித்துப் பேசினேன். மொறவெவ பிரதேச செயலாளர் பிரிவுக்குட்பட்ட பகுதிகளிலும் எமது முஸ்லிம் விவசாயிகள் சேனைப் பயிர்ச்செய்கையில் ஈடுபட்டு வருகின்றார்கள். சுமார் 30 வருடங்களாக விவசாய நடவடிக்கைகளில் ஈடுபட்டுவரும் அவ்விவசாயிகளின் செயற்பாடுகளை இடைநிறுத்துகின்ற அல்லது அங்கு எல்லையிடுகின்ற நடவடிக்கைளை Department of Forest அதிகாரிகள் தொடர்ச்சியாக முன்னெடுத்து வருகின்றார்கள். ஆகவே, அதிகாரிகள் தங்களுடைய இஷ்டத் துக்குச் செயற்படுகின்றார்களா? அல்லது அரசாங்கத்தின் மறைமுகமான agendaஇன்மூலம் அவர்கள் செயற்படு கின்றார்களா? என்று நாங்கள் கேட்கின்றோம். எனவே, திருகோணமலை மாவட்டத்தில் காணப்படுகின்ற காணி சம்பந்தமான பிரச்சினைகளுக்கு உடனடியான தீர்வை வழங்குவதற்கு அரசாங்கம் முன்வர வேண்டும் என்று இந்த இடத்திலே நான் தயவாகக் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அண்மையிலே அக்குறணையில் இடம்பெற்ற கொடூர விபத்து தொடர்பாக தற்பொழுது எல்லோராலும் பேசப்பட்டு வருகின்றது. NPP ஆதரவாளரான வைத்தியர் ஒருவர் சமூக வலைத்தளத்தில் மிக மோசமான இன வெறுப்புப் பதிவொன்றை மேற்கொண்டிருந்தார். இதை நாம் உண்மையில் வன்மையாகக் கண்டிக்கின்றோம். மனிதாபிமானமிக்க பெரும்பான்மைச் சமூகத்தினரும் ஊடகங்கள்மூலம் இதற்கு கடும் எதிர்ப்பைத் தெரிவித்திருந்தார்கள். அவர்கள் அப்படி எதிர்ப்புத் தெரிவித்திருப்பது உண்மையில் வரவேற்கத்தக்க ஒரு விடயமாகும். இந்த விடயம் குறித்து வினவியபோது, " முறைப்பாடு அளித்தால் விசாரிக்கலாம்" என்பதைப் போன்ற ஒரு கருத்தை அரசாங்கத்தின் பக்கத்திலிருந்து நாங்கள் பார்த்தோம். இவ்வாறான கருத்துகளை social mediaஇல் பதிவிடுவதென்பது சமூகங்களுக்கு இடையில் பிரிவினையை உண்டாக்கும்.

இந்த நாட்டில் மீண்டும் பிரச்சினையை ஏற்படுத்துகின்ற, இனவாதத்தைத் தூண்டுகின்ற இவ்வாறானவர்களுக்கு எதிராக யாராவது முறைப்பாடு செய்தால்தான் இந்த அரசாங்கம் நடவடிக்கைகளை முன்னெடுக்குமா? அல்லது இனவாதத்தைத் தூண்டி இந்த நாட்டில் குழப்பநிலையை ஏற்படுத்தும் வகையில் இவ்வாறான கருத்துகளைப் பதிவிடுகின்றவர்கள் தொடர்பாக அரசாங்கம் நேரடியாகவே முன்வந்து நடவடிக்கைகளை முன்னெடுக்குமா? என நாங்கள் கேட்கின்றோம். அந்த அடிப்படையில், அரசாங்கம் உடனடி யாகத் தானாக முன்வந்து அவருக்கு எதிராக சட்ட நடவடிக்கையை முன்னெடுக்க வேண்டும் என்பதை இந்த இடத்தில் நான் கேட்டுக்கொள்கின்றேன்.

கடந்த வாரம் அக்குறணையில் ஏற்பட்ட வெள்ளப்பெருக்கு சம்பந்தமாகவும் சில விடயங்கள் இங்கு பேசப்பட்டன. உண்மையில், எங்களுடைய முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்கள் தங்களுக்குள்ளே புலம்பிக்கொள்கின்ற ஒரு நிலைப்பாடு காணப்படுகின்றது. முன்னைய அரசாங்கத்தைக் குறைசொல்வது, சபையில் இல்லாத பாராளுமன்ற உறுப்பினர்களைக் குறைசொல்வது போன்ற விடயங்களையும் நாங்கள் பார்க்கின்றோம். அவை நடந்து முடிந்துவிட்டன. ஆகையால், அங்கு பாதிக்கப்பட்டிருக்கின்ற மக்களுக்கான நிவாரணங்களை வழங்கும் விடயத்தை விரைவுபடுத்த வேண்டும் என்பதை நாங்கள் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றோம். அங்கு தொடர்ச்சியாக 30க்கும் மேற்பட்ட தடவை வெள்ளப்பெருக்கு ஏற்பட்டிருக்கின்றது என்று நான் நினைக்கின்றேன். ஆனாலும், அதற்குச் சரியான தீர்வு இன்னும் எட்டப்படவில்லை. ஆகையால், அதற்கான தீர்வு எட்டப்படும்வரை, வெள்ளத்தினால் பாதிக்கப்பட்ட அந்த மக்களுக்கு உடனடியாக நிவாரணங்களை வழங்குவதற்கான நடவடிக்கைகளை அரசாங்கம் எடுக்க வேண்டும்.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි. දැන් කථාව අවසන් කරන්න.

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
මම ඉක්මනින් අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

அண்மையில் சர்ச்சைக்குரிய விடயமாகப் பேசப்பட்ட சமயத் தலைவர்களுடைய ஆடை விவகாரத்தில் அரசாங்கம் காட்டிய அவசரமும் அக்கறையும் உண்மையில் பாராட்டக் கூடிய ஒரு விடயமாகும். அது தவறு அல்ல; உண்மையிலேயே செய்யப்பட வேண்டிய ஒரு விடயமாகும். அதேபோன்று கல்முனை வடக்கு ஆதார வைத்தியசாலையில் மூன்று மாதங்களுக்கு முன்னர் எழுந்த சிறுபான்மை முஸ்லிம் பெண் ஊழியர்களின் 'ஹிஜாப்' விவகாரத்திற்குத் தீர்வுகாண அரசாங்கம் முன்வரவில்லை என்பது உண்மையில் கவலைக் குரியதொரு விடயமாகக் காணப்படுகின்றது. சிறுபான்மை மக்களுடைய விடயங்களில் அரசாங்கம் பாரபட்சமாகச் செயற்படுகின்றது என்பதற்கு இது ஓர் உதாரணமாகக் காணப்படுகின்றது. ஆகையால், இந்த விடயத்திற்கும் மிக

[ගරු ඉම්රාන් මහරූෆ් මහතා]

විරෛවිල් තීර්වොන්ෆෙ වැලැන්ග වේණ්ඩුම්. ඉන්ත විඩයම් සම්පන්තමාග මුළුමෙයාන විපරම් අඩංගිය ඔර් අරික්කෛ එන්නිඩම් කාණප්පඩුගින්රතු. අතනෛ හන්සාට් පතිවුක්කාගච් ***සමර්ප්පික්කින්රේන්** එන්පතෛ ඉන්ත උයරිය සපෛයිල් කූරි, එනතු උරෛයෛ මුඩිත්තුක් කොළ්කින්රේන්. නන්රි!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් ගිහාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.10]

ගරු අජිත් ගිහාන් මහතා
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වනකොට විශේෂ වූ අණපනත් බොහොමයක් මේ ගරු සභාවේදී සම්මත කරමින් අපි රට ඉදිරියට ගෙන යමින් තිබෙනවා. අද දිනයේදීත් ඒ ආකාරයෙන්ම ජලභීතිකා රෝගය තුරන් කිරීමේ සහ සුනඛයන් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කරමින් මේ සාකච්ඡාව ඉදිරියට යනවා.

අපි දන්නවා, (476 වන අධිකාරය වූ) ජලභීතිකා රෝගය පිළිබඳ ආඥාපනත සහ (477 වන අධිකාරය වූ) සුනඛයන් ලියාපදිංචි කිරීමේ ආඥාපනත ඒකාබද්ධ කර, සුනඛ ගහනය පාලනය කිරීම, සුනඛයන් සඳහා ජලභීතිකා එන්නත ලබා දීම විධිමත් කිරීම සහ අනිවාර්යය කිරීම, සුනඛයන් ලියාපදිංචි කිරීම නීතිමය වශයෙන් ශක්තිමත් කිරීම යන කාර්යයන් සඳහා වග කිවයුතු ආයතනවල බලතල, වගකීම් පැහැදිලි කිරීම සහ එකී වගකීම් ක්‍රියාත්මක කිරීමේ යන්ත්‍රණයක් ස්ථාපිත කිරීම යන කාර්යයන් අරමුණු කර ගනිමින් තමයි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා තිබෙන්නේ කියන එක. ඇත්තටම මේ සුනඛයන් සම්බන්ධව සමාජයීය වශයෙන් ගැටලු බොහොමයක් තිබෙනවා,

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පළමුවැනි ගැටලුව මේකයි. සුනඛයන් නිසා ජනතාව අපහසුතාවට පත්වීම් බොහොමයක් අපට දවස ගාණේ වාර්තා වෙනවා. ඒ වාගේම අපේ රටේ සුනඛ ගහනය මිලියන 2.7ක් කියලා දැනට වාර්තා වෙලා තිබෙනවා. ඒ වාගේම සුනඛයන් සපා කෑම නිසා 168,000කට ආසන්න සංඛ්‍යාවක් සඳහා ජලභීතිකා රෝග නිවාරණ සහ පසු ප්‍රතිකාර කටයුතු සිදුකර තිබෙනවා. ඒ වාගේම සුනඛයන් මිලියන 1.6කට එන්නත් ලබා දී තිබෙනවා. ඒ නිසා ඇත්තටම මේ සුනඛයන් සම්බන්ධව වැඩ පිළිවෙළක් අවශ්‍යයි. පනතක් මඟින් ඒ කටයුතු සිද්ධ කරන්න තමයි අපි මේ සූදානම් වෙලා තිබෙන්නේ. අපි අහලා තිබෙනවා, සමහර වෙලාවට පාරක යද්දී, වාහනයක යද්දී බල්ලෙක් පැනලා accident වුණාය කියලා සමහර අය කියනවා. ඊට පස්සේ ඔවුන් අතපය damage වෙලා, රෝගී වෙලා, අසරණ වෙනවා. ඒ වාගේම සුනඛයන් ගෙනැල්ලා පාසල් ළඟ දමනවා. ඊට පස්සේ එතැන ප්‍රශ්න ඇති වෙනවා. ඒ වාගේම සුනඛයන් ගෙනැල්ලා පන්සල් ළඟ දමනවා. විධිමත් ක්‍රමවේදයක් නැතුව සුනඛයන් හැදීම සහ වගකීමක් නැතුව ඒ සතුන් සමාජයට මුදා හැරීම තුළ විශාල ගැටලුවක් මතු වෙලා තිබෙනවා. ඉතින්, ඒ තත්ත්වය නියාමනය කරන්න ඕනෑ. ඒ නියාමනය කිරීමට අදාළව තමයි අපි මේ පනත් කෙටුම්පත ගෙනැල්ලා තිබෙන්නේ. ඊට අදාළව පනත් කෙටුම්පතේ I වන කොටසෙන් කාරණා 9ක් යටතේ නියාමනය කරන්න අවශ්‍ය කටයුතු සලස්වා තිබෙනවා. II වන කොටසෙනුත් එසේමයි; සුනඛ ගහනය පාලනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සලස්වා තිබෙනවා. ඒ වාගේම දඩ පැනවීම සම්බන්ධවත් තිබෙනවා. සමහර අය හිතන්න පුළුවන්, මේ සුනඛ බද්දක් - බලු බද්දක් - ගෙනෙන්න හදනවාය කියලා. එහෙම නොවෙයි. නියාමනය කිරීම සඳහා තමයි කටයුතු සලස්වා තිබෙන්නේ. ඒ තුළ යම් විධියකට නීතිය කඩ කෙරෙනවා නම් ඊට අදාළව දඩ පැනවීමක් කරලා තිබෙනවා. ඒ විධියට සුනඛයන් එන්නත් කිරීම, ගහනය පාලනය කිරීම තුළින් මේ කටයුතු විධිමත් කරලා, මේ ව්‍යසනයෙන් ප්‍රජාව නිදහස් කර ගැනීම සඳහා තමයි අපි මේ පනත ගෙන එන්න සැලසුම් කරලා තිබෙන්නේ. ඒ අනුව මේ පනත් කෙටුම්පත සම්මත කරගෙන, මේ ගැටලුව තවදුරටත් අපේ සමාජයට, මේ රටට ඉතිරි නොකර, 2030 වනවිට ජලභීතිකා රෝගය තුරන් කිරීම, zero කිරීම තමයි අපේ අරමුණ. ඒ වාගේම මෙය ප්‍රාදේශීය වශයෙන් ඊට අදාළ කමිටු හදලා, ජාතික වශයෙන්, ප්‍රාදේශීය වශයෙන් උපදේශක කමිටු හදලා, ඒ කටයුතු නියාමනය කිරීම සඳහාත් ඉදිරිපත් කළ පනත් කෙටුම්පතක් බවත් මම කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජලභීතිකා රෝගය තුරන් කිරීම සඳහා අපි මේ සභාවට ඉදිරිපත් කරපු මේ පනත් කෙටුම්පත සම්බන්ධව විපක්ෂය පැත්තෙන් සාධනීය අදහස් ප්‍රකාශ වුණු බවක් අපි දැක්කේ නැහැ. මට පෙර කථා කළ සියලු මන්ත්‍රීවරු කථා කළේ මොකක් ගැනද? ජලභීතිකා එන්නත ගැනවත්, ඒ නියාමන කටයුතු ගැනවත් නොවෙයි එතුමන්ලා කථා කළේ. එතුමන්ලා කථා කළේ රාජපක්ෂලාව සිරගත කරන එක සහ විහාරමහාදේවී උද්‍යානයේ ස්වාමීන් වහන්සේලා රැඳී සිටින එක ගැනයි. මේ විවාදයේදී මීට මොහොතකට පෙර දිලිත් ජයවීර මන්ත්‍රීතුමා අදහස් ඉදිරිපත් කළා. එතුමා කියනවා, මේ ආණ්ඩුව ඒකාධිපති තැනකට යමින් තිබෙනවා, මේක මර්දනය කරන්න නීති ගෙනෙනවාය කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වර්තමාන ආණ්ඩුව මැතිවරණ තුනකට මුහුණ දුන්නාය කියන එක ඔබතුමා දන්නවා. හැබැයි, අපි කාටද පහරදීමක් කරලා තිබෙන්නේ? කාගෙද ප්‍රජාතන්ත්‍රවාදය නැති කරලා තිබෙන්නේ? කාගෙද නිදහස නැති කරලා තිබෙන්නේ? ඉතා සාධාරණව, ජයග්‍රහණයෙන් පසුවත් රනිඤ්ඤා කරලක්වත් පත්තු කරන්නේ නැතුව අපි මේ රටට ආදර්ශ ලබා දීලා තිබෙනවා. එහෙම දේශපාලනයක් අපි ඉදිරියට ගෙනියනවා. හැබැයි, මේගොල්ලන් මේ කියන්නේ මොකක්ද? මේගොල්ලන්ගේ විලාපයක් තිබෙන බව අපි දන්නවා. ඉතිහාසය පුරා ප්‍රජාතන්ත්‍රවාදය නැති කළේ කොහොමද කියලා අපි දන්නවා. ධීවරයාට ඉන්ධන සහනාධාරය දෙන්න කියද්දි වෙඩි තියපු ඉතිහාසයක් තිබෙනවා. ඔන්න, ප්‍රජාතන්ත්‍රවාදය අහිමි කරපු තැන්. රතුපස්වල ජනතාව ජලය ඉල්ලද්දි වෙඩි තියපු ඉතිහාසයක් තිබෙනවා. ඔන්න, ප්‍රජාතන්ත්‍රවාදය නැති කරපු තැන්. ඒ වාගේම තමයි, රැස්වීම් කරද්දි ජූලම්පිටියේ අමරෙලා දාලා ඒවාට පහර දීලා, වෙඩි තියපු ඉතිහාසයක් තිබෙනවා. ඒවා තමයි ප්‍රජාතන්ත්‍රවාදය නැති කරපු තැන්, නිදහස නැති කරපු තැන්.

අද භාෂණයේ නිදහස නැති කරලාලු. මොන විධියටද භාෂණයේ නිදහස නැති කරලා තිබෙන්නේ? නිදහස තිබෙනවා. ප්‍රජාතන්ත්‍රවාදය තිබෙනවා. ඕනෑම කෙනෙකුට රටේම නිදහසේ සැරිසරන්න ජාතික සමගිය ඇති කරලා තිබෙනවා. තමන්ට අවශ්‍ය කටයුතු කරගන්න නිදහස ඇති කරලා තිබෙනවා. එහෙම තියෙද්දි මේ මන්ත්‍රීවරුන්ගේ හැසිරීම ගැන අපිට තවත් සැකයක් පවතිනවා. මොකද,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකත්‍රප්පට්ටුළ්ළතු.]
[Expunged on the order of the Chair.]

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

කියන ප්‍රශ්නය මතු වෙලා තිබෙනවා. මන්ත්‍රීතුමෙක් කිව්වා, ජලභීතිකා රෝගය උත්සන්න වුණාම තමයි ඔය තත්ත්වයට පත් වෙන්නේ කියලා. මොකද, විපක්ෂයේ මන්ත්‍රීවරු ඉදිරිපත් කරන මේ චෝදනා සාධාරණ වෙන්නේ නැහැ.

මේ තිබෙන්නේ රාජපක්ෂවරු දඩයම් කිරීමය කියලා ඩී.වී. වානක මන්ත්‍රීතුමා කියනවා මම අහගෙන හිටියා. ගෑස් නැහැ, විදුලිය නැහැ, බෙහෙත් නැහැ කියලා අඳෝනාවක් තිබෙනවා. ඒගොල්ලන් බංකොලොත් කරලා භාර දුන්නු රට වසර දෙකක් යද්දි යම් මට්ටමකට ස්ථාවර කරන්න පුළුවන් තැනකට අපි ගෙනැල්ලා තිබෙනවා. වසර දෙකක් තුළ මේ තත්ත්වයට ගෙනැල්ලා තිබෙන්නේ බංකොලොත් කරපු රටක්.

ඒ වාගේම තමයි, රාජපක්ෂවරු මේ ආර්ථිකය ඝාතනය කළා කියලා ඇමෙරිකාවේ අධිකරණයේදී සහ ශ්‍රී ලංකාවේ අධිකරණයේදීත් කියා තිබෙනවා. එහෙම චෝදනා තිබෙනවා. ඒ චෝදනා තිබෙන පුද්ගලයෝ ටික මෙතැනට ඇවිල්ලා අපිට පාට් දානවා, බලා ගන්න, දුවන්න වෙයි කියලා. ඒගොල්ලන් අද මේ පාර්ලිමේන්තුවට එන්නේත් බන්ධනාගාර බස්වල. V8වල ආපු අය අද එන්නේ බන්ධනාගාර බස් එකෙන්. ඉදිරියේදී තව දෙන්නා, තුන්දෙනා එහෙම එනවා. ඒගොල්ලන් එතැනට පත් වෙලා තිබෙනවා. ආර්ථිකය ඝාතනය කරපු, මේ රට කඩා වට්ටපු, සමාජයක්ම විනාශ කරපු අය තමයි අපට චෝදනා කරන්නේ. ඩී.වී. වානකලා අපට චෝදනා කරනවා ප්‍රජාතන්ත්‍රවාදය නැති කළා, රාජපක්ෂවරු දඩයම් කරනවා කියලා. කිසිම දඩයමක් නැහැ, නිදහස තිබෙනවා, ප්‍රජාතන්ත්‍රවාදය තිබෙනවා. හැබැයි, ඒ නිදහස සහ ප්‍රජාතන්ත්‍රවාදය අයුතු ලෙස පාවිච්චි කරනවා නම් එයට අදාළ නීති තිබෙනවා, ඒ නීති රීති අනුව කටයුතු කරනවා. එයට අදාළව කටයුතු කිරීම රජයක, ආණ්ඩුවක වගකීමක්. ඒ කටයුතුවලට බලපෑම් කරන්න කාටවත් අයිතියක් නැහැ, ඒක රටක වගකීමක්.

අපි ඔවුන්ට කියනවා වසර දෙකක් යද්දී අපි මේ රට සැලසුම් කරලා, ස්ථාවර කරලා තිබෙනවා කියන එක. ලෝකයේ බරපතළ අර්බුදයක් තිබෙනවා, බලශක්ති ක්ෂේත්‍රයේ අර්බුදයක් තිබෙනවා. හැබැයි, මේ රටේ ජනතාවට බිය වෙන්න දෙයක් නැහැ. මොකද, ජනතාව පීඩාවට පත් කරන්න අපි සූදානම් නැහැ. තවමත් අපි ඔවුන්ට ඒ අවස්ථා ටික ලබා දීලා තිබෙනවා, ඉන්ධන ටික ලැබෙනවා, ගෑස් ටික ලැබෙනවා, ඒ වාගේම විදුලිය ලැබෙනවා, බෙහෙත් ටික ලැබෙනවා, පොහොර ටික ලැබෙනවා. දැන් ලස්සනට යන රටක්, මේක. ඒවා වළක්වන්නට, ජනතාව උසිගන්වන්නට, සමාජ මාධ්‍ය පාවිච්චි කරමින් ආණ්ඩුවට බලපෑම් කරන්නට හදනවා නම් ඒක මේ රටට කරන ද්‍රෝහීකමක්.

අපි විපක්ෂයට කියනවා, මේ කාරණයත්. මේ රටට තිබෙන එකම ප්‍රශ්නය තමයි හොඳ විපක්ෂයක් නැතිකම. ආණ්ඩුවට බලපෑමක් කරන්නට, වැරදි ගමනක් යනවා නම් කියලා දෙන්න විපක්ෂයක් නැහැ.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

එක එක්කෙනා හිතූ මතයේ සාධාරණ නැති දේවල් ඔහේ කියවන විපක්ෂයක් බවට පත් වෙලා තිබෙනවා. අපේ ගමන අපි සැලසුම්සහගතව යනවා. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය තිබෙනවා, ආර්ථිකය සැලසුම් කරලා තිබෙනවා, ආර්ථිකය ස්ථාවර කරලා තිබෙනවා, මිනිස්සුන්ට නිදහසේ ජීවත් වෙන්න ක්‍රමය හදලා තිබෙනවා. අපේ සැලසුමත් එක්ක ඉදිරි වසර දෙක තුන ඇතුළත ජනතාවට තව තවත් සහන දෙමින්, ආර්ථිකය ශක්තිමත් කරමින් ඉස්සරහට යන්න අපි බලාපොරොත්තු වෙනවා; ඒ සියලුම දේට අපි වග කියනවා. අද දින ජලභීතිකා රෝගය සම්බන්ධයෙන් ගෙන එන ලද පනත් කෙටුම්පත සම්මත කරගෙන ඒ හරහා ශක්තිමත්ව ඉදිරියට යනවා කියන කාරණයත් මම මතක් කරනවා. *[බාධා කිරීමක්]*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝග 91 "h" යටතේයි මම මේ රීති ප්‍රශ්නය නහන්නේ. එතුමන්ලා දිගින් දිගටම මේ සභාවේ නැති පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නම් කියනවා. පුළුවන් නම්, කොන්ද පණ තිබෙනවා නම් ඩී.වී. වානක හරි නාමල් රාජපක්ෂ හරි ඉන්න වෙලාවක කථා කරන්නකෝ. ලජ්ජයි නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අදාළ චෝදනා එල්ල වුණු මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුවේ ඉන්නවා නම් එතුමාට පුළුවන් පෙනී සිටින්න. ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමනි, ඔබතුමාට ඒ කාරණය වෙනුවෙන් පෙනී සිටින්න බැහැ. *[බාධා කිරීමක්]*

ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.21]

ගරු ජේ.සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජලභීතිකාව ගැන කථා කරද්දී මට පෙර කථා කරපු මන්ත්‍රීතුමා කිව්වා විපක්ෂය කථා කළේ වෙන දේවල් කියලා. එතුමාගේ කථාව අරගෙන බැලුවාම සම්පූර්ණයෙන්ම එතුමා කථා කළේ මොනවාද කියා පෙනෙනවා. ජලභීතිකාව හැදිලාද දන්නේ නැහැ ආණ්ඩු පක්ෂයට. මොකද, එතුමා කථා කළේ සම්පූර්ණයෙන්ම භීතියට පත් වෙලා. ආණ්ඩු පක්ෂයේ ඉඳගෙන විපක්ෂයට චෝදනා කරනවා විෂයයට අදාළව කථා කරන්නේ නැහැ කියලා. නමුත් එතුමා කථා කළේ විෂයයට අදාළ දේවල් නොවෙයි. ඒ නිසා දැන් ජලභීතිකාව හැදිලා තිබෙන්නේ ආණ්ඩුවටයි කියන එක පැහැදිලිවම පේනවා.

ජලභීතිකාව සම්බන්ධයෙන් කථා කිරීමේදී පළාත් පාලන ආයතන, - නගර සභා, ප්‍රාදේශීය සභා - සියල්ල එකතු කරගෙන මේ සඳහා විසඳුමක් දෙන්න ඕනෑ කියන තැන අපි ඉන්නවා, ඒකේ කිසි ගැටලුවක් නැහැ, ඒ සඳහා අපි සහාය දෙන්න ඕනෑ. මොකද, ජලභීතිකාවෙන් රටට ජීවිත විශාල සංඛ්‍යාවක් අහිමි වෙලා තිබෙනවා. මම සංඛ්‍යාලේඛන කියන්න යන්නේ නැහැ උදේ ඉඳන් ගොඩක් දෙනෙක් ඒවා ගැන කථා කළ නිසා. හැබැයි, පැහැදිලිවම කියන්න ඕනෑ, මේ තත්ත්වය තුළ නගර සභා, ප්‍රාදේශීය සභා කියන පළාත් පාලන ආයතනවලට විශාල වගකීමක් පැවරෙනවා කියන එක. මොකද, ඒවා හරහා තමයි මේ ක්‍රියාදාමය කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ජලභීතිකාව කියන්නේ රෝගයක්. විශේෂයෙන් සුනඛයන් හරහා හැදෙන රෝගයක්.

අද රෝහල්වල ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ රටේ ජනතාවට ප්‍රශ්න ගණනාවක් ඇවිල්ලා තිබෙනවා. ඒවා පැත්තක තියලා මේ රජය ගෙනෙන

[ගරු ජේ.සී. අලවතුවල මහතා]

අණ පනත් දිහා බලන්න. අපේ අනුර කුමාර දිසානායක වර්තමාන ජනාධිපතිතුමා ඇතුළු කණ්ඩායම විපක්ෂයේ ඉන්න කාලයේ දීර්ඝ වශයෙන් කථා කළ මාතෘකා තිබෙනවා. විශේෂයෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ගැන දීර්ඝ වශයෙන් කථා කළා, ඒක අහෝසි කරන්න ඕනෑ කිව්වා. දැන් අද මොකක්ද කරලා තිබෙන්නේ? අද ආණ්ඩුවට කොච්චර බියට පත් වෙලාද කියා පෙනෙනවා. ගොඩක් දෙනෙක් විපක්ෂයට ජලභීතිකාව කියලා කිව්වාට ආණ්ඩුවටයි ජලභීතිකාව හැදිලා තිබෙන්නේ; ඒකයි මම කියන්නේ.

ආණ්ඩුව කොච්චර බියට පත් වෙලාද කියනවා නම්, අද නොයෙකුත් පනත් ගේනවා රටේ ජනතාවගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරන. අද මහෙස්ත්‍රාත් අධිකරණයට තිබෙන බලතල පොලිස් නිලධාරියෙකුට දෙන තැනට ආණ්ඩුව ගිහිල්ලා තිබෙනවා. ඉතින්, මොකක්ද මේ කරන්න හදන්නේ? ජනතාවගේ අයිතිය, එහෙම නැත්නම් ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් මර්දනය කරන්න අද තමුන්නාන්සේලාට පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ධුර 158ක් තිබෙනවා කියලා ඒක පාවිච්චි කරන්න ලැහැස්ති වෙනවා. අද තමුන්නාන්සේලාට මෙතැන මන්ත්‍රී ධුර 158ක් තිබුණාට එළියේ තමුන්නාන්සේලා ඉන්නේ කොතැනද කියලා බලාගන්න පුළුවන්.. ඒක පළාත් පාලන මැතිවරණයේ ඉඳන්ම පහළට ගිය හැටි අපි දැක්කා.

දැන් සමුපකාර ඡන්ද පවත්වනවා. තමුන්නාන්සේලා කියයි, "සමුපකාර ඡන්දය මොකක්ද?" කියලා. තමුන්නාන්සේලා බලයට එනකොට තිබුණු, දැනට අවුරුදු 3කට කලින් තමුන්නාන්සේලා බලය පිහිටවපු සමුපකාරවල දැන් ඡන්දය පවත්වනවා. ඒ අවුරුදු 3කට කලින් පැවැත්වූ ඡන්ද තමුන්නාන්සේලා ජයග්‍රහණය කළා. හැබැයි, අද මොකක්ද වෙන්නේ? පවත්වන හැම සමුපකාර ඡන්දයක්ම තමුන්නාන්සේලා පරදිනවා. ඉතින්, මේක තමයි signal එක. මේ තත්ත්වය තුළ, මේ මර්දනය කරලා මෙතැනින් එහාට තමුන්නාන්සේලාට ගමනක් තිබෙනවා කියලා විශ්වාස කරන්න එපා. මොකද, අද රට තුළ අවාසනාවන්ත තත්ත්වයක් ඇතිවෙලා තිබෙනවා.

ඉතිහාසයේ කවදාවත්, මේ වාගේ වර්ෂාපතනයක් තිබෙනකොට විදුලිය කැපුවේ නැහැ. ඊයේ, පෙරේදා, අද දිගටම පැය කීපයක් විදුලිය කැපුවා. පැයක් කිව්වාට පැයට වැඩියි. සමහර ප්‍රදේශවල සෑහෙන වෙලාවක් විදුලිය කප්පාදු කරලා තිබුණා. මේකට ප්‍රධාන හේතුව මොකක්ද කියලා මාස හයක ඉඳලා අපි කිව්වා. විපක්ෂයේ මන්ත්‍රී කණ්ඩායමක් නොරොච්චෝලෙට ගියා බලන්න. ඒ ගිය වෙලාවේ අපි දැක්කා, බාල ගල් අඟුරු ගෙනැල්ලා ඒ යන්ත්‍ර සූත්‍ර ඔක්කෝම ඉතාම අවාසනාවන්ත විධියට කැඩෙනවා කියලා. එදාම ඒ ඉංජිනේරු මහත්වරු ඒක කිව්වා. ඒක තමයි ඇති වුණු තත්ත්වය. ඉතින්, දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? එක පැත්තකින් මිලියන 18,000ක පාඩුවක් සිදුවෙලා තිබෙනවා, විදුලිබල මණ්ඩලයට. ඒක පාර්ලිමේන්තු වාර්තාවකින් පෙන්වලා තිබෙනවා. ඒ පාඩුවට අමතරව අද වෙනත් අමාත්‍යාංශවලටත් ඒක බලපා තිබෙනවා. ඉන්ධනවලින් විදුලිය ගන්න අද කොච්චර වියදමක් දරලා තිබෙනවාද? ඒවා ගණනය කරලා තිබෙනවාද? එහෙම නම්, තවත් කෝටි ගාණක පාඩුවක් ඇති වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, අද විදුලි කප්පාදුවකටත් ගිහිල්ලා තිබෙනවා. තමුන්නාන්සේලා කියනවා, අපි අවුරුදු දෙකක් තුළ බංකොලොත්භාවයෙන් මිදුණා කියලා. තමුන්නාන්සේලා බලය ගන්නකොට කොහේවත් විදුලිය කැපුවේ නැහැ. රනිල් වික්‍රමසිංහ තමුන්නාන්සේලාට රට බාර දෙනකොට ඉන්ධන මිල කීයද? අද මිල කීයද? අද ඉන්ධන මිල ඒ වාගේ දෙගුණයක් වෙලා තිබෙනවා. ගෑස් පෝලිම් තිබුණාද, තමුන්නාන්සේලා බලය ගන්නකොට? නමුත්, ඊයේ, පෙරේදා දිගටම ගෑස් පෝලිම් තිබුණා. ඒ නිසා අද මම තමුන්නාන්සේලාට කියනවා, දිගටම බොරුවෙන් බලය අරගෙන යන්න බැහැ කියලා.

අද අපි දැක්කා, තමුන්නාන්සේලා වස් කවියකට බය වෙලා තිබෙනවා. මොකටද, ආණ්ඩුව වස් කවියකට බය වෙන්නේ? ඒ වස් කවියේ මොනවා හෝ ලියලා තිබෙනවා නම්, ඒවා ලියලා තිබෙන්නේ වැරදිකරුවන්ට. එහෙම නම් තමුන්නාන්සේලා පිළිගන්නවා, ඒ වස් කවියේ තිබෙන දේවල් තමුන්නාන්සේලාට අදාළයි කියලා. ඒ නිසා තමයි ඒකට බයවෙලා තිබෙන්නේ. එම නිසා අපි කියනවා ආණ්ඩුවට, මේ රටේ ජනතාව රවටිටන්න, බොරුව, වංචාව තවදුරටත් ඉස්සරහට අරගෙන යන්නේ නැතුව සැබෑ ප්‍රශ්නවලට විසඳුම් ලබා දීලා මේ රටේ ගොවියාට, කම්කරුවාට, රාජ්‍ය සේවකයාට සහන ලබා දෙන්න කියලා. ඒ වාගේම, අද මේ රටේ ජීවත් වෙන්න අමාරුවෙන් ඉන්නවා, විශාල පිරිසක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්. දැන් කථාව අවසන් කරන්න.

ගරු ජේ.සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
මට තව පොඩි වේලාවක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද දුප්පත්කම වැඩිවෙලා කියලා ලෝක බැංකුව කියනවා. තුන්වේල කන්න බැරි විශාල පිරිසක් ඉන්නවා. මෙන්න මේ අය ජීවත් කරවන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න. ඒ විතරක් නොවෙයි, පසුගිය වසරේ අය වැයෙන් වෙන් කරපු ප්‍රතිපාදන ටිකවත් අද තමුන්නාන්සේලාට වියදම් කරන්න බැරුව තිබෙනවා. "දිවිවා" සුළි කුණාටුව ඇවිල්ලා මේ වෙනකොට මාස 6කට වැඩියි. ඒ හේතුවෙන් නිවාස අහිමි වුණු, දේපළ අහිමි වුණු මේ රටේ ජනතාව සඳහා වෙන් කරපු මුදල්වලින් සියයට 20ක ප්‍රගතියක් නැහැ. එම නිසා, මෙන්න මේවා ක්‍රියාත්මක කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළක් සකස් කරන්න. එහෙම නැතුව ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් අයින් කරලා මර්දනයෙන් තමුන්නාන්සේලා දිගටම මේ රට පාලනය කරන්න බලාපොරොත්තු වෙනවා නම් ඉදිරියට මේ රටේ විශාල ගැටලුවක් මතු වෙනවා කියන කාරණය මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නාමල් කරුණාරත්න නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.27]

ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජලභීතිකා රෝගය තුරන් කිරීමේ සහ සුනඛයන් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත විවාදයට ගන්නා මේ මොහොතේ අපි කියන්න ඕනෑ, ඇත්තටම ජලභීතිකා රෝගය කියන එක අපේ රටේ පවතින ලොකු ප්‍රශ්නයක්, විශාල ගැටලුවක් බව. මේ වෙනකල් අපේ රටේ

ජනතාව මෙම රෝගයෙන් ලෙඩවෙලා මියැදෙනවා. ඒ වාගේම, සතුන්ටත් මෙම රෝගය හැදෙනවා. ඒ සතුන් පවා අනතුරට පත්වෙනවා. මේක වැඩියෙන්ම ව්‍යාප්ත වෙන්නේ සුනඛයාගෙන්. ඒ කියන්නේ, මේ ලෙඩේ සියයට 95ක් විතරම බෝ වන්නේ සුනඛයන්ගෙන්. ඒ පරිසරය ඇතුළේ තමයි අපි මේ කාරණය විග්‍රහ කර ගන්න ඕනෑ.

දළ වශයෙන් ගත්තොත්, අපේ රටේ සුනඛයන් ලක්ෂ 32කට ආසන්න ප්‍රමාණයක් ඉන්නවා. ජනගහනයත් එක්ක ගත්තොත්, සාමාන්‍යයෙන් පුරවැසියන් 7කට එක සුනඛයෙකු වන පරිදි අපේ රටේ සුනඛ ගහනය වැඩි වී තිබෙනවා. ඒ තත්ත්වයත් එක්ක විශේෂයෙන්ම වර්ෂ 2030 වනකොට යම්කිසි ඉලක්කයකට යෑමේ අරමුණින් ජලභීතිකා රෝගය මර්දනය කිරීමට අදාළ වැඩ පිළිවෙළක් අපි මේ වනකොට දියත් කර තිබෙනවා. ඒ අනුව පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය කියන අමාත්‍යාංශ තුනම ඒකාබද්ධව තමයි මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන්නේ.

සතුන් පිළිබඳව කථා කරන කොට මම මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. මේ පනත් කෙටුම්පතේ විශේෂයෙන්ම "පශු සම්පත් සඳහා ඇති කරන සත්ත්වයා" යන්න මෙසේ නිර්වචනය කර තිබෙනවා:

> " 'පශු සම්පත් සඳහා ඇති කරන සත්ත්වයා' යන්නෙන්, ආහාර සඳහා හෝ ආහාර නිෂ්පාදනය කිරීම සඳහා ඇති කරන ගවයා, (මී හරකා සහ කුළු හරකා), බැටළුවා, ඌරා, එළුවා සහ අශ්වයා ඇතුළු යම් ගෘහාශ්‍රිත හෝ හීලෑ කළ ක්ෂීරපායි සතකු අදහස් වේ;"

මෙහිදී ප්‍රශ්නයක් මතු වුණා, මෙයට පූසා ඇතුළත් වෙලා නැහැ කියලා. මේ සංශෝධනය යටතේ බළලා - පූසා කියන සතාත් මේකට ඇතුළත් වෙනවා. ඒ අනුව මේ කියන සත්ව කාණ්ඩ සියල්ල මේකට ඇතුළත් වනවා.

ඇත්තටම පශු වෛද්‍යවරයා තමයි මෙහිදී මූලිකයා බවට පත් වෙන්නේ. ඒක මේ පනත් කෙටුම්පතෙන් පිළිගෙන තිබෙනවා. ඔන්න ඔය කියන තත්ත්වය තුළ මේ රෝගය පිටු දැකීම සඳහා මේ කියන සතුන් එන්නත් කිරීම, මේ සතුන්ගේ ගහනය පාලනය කිරීම සහ මේ සතුන් පිළිබඳව අප යම්කිසි අදහසක් හදා ගැනීම කරගත යුතුව තිබෙනවා. ඇත්තටම ඒ අනුව තමයි අද මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව හමුවට එන්නේ.

විශේෂයෙන්ම මාධ්‍යවල මේ සම්බන්ධව වැරැදි මත ප්‍රචාරය වෙනවා, බලු බද්දක් ගහනවා කියලා. එහෙම කිසිදු බදු ගැහීමක් නැහැ. මේ කියන සතුන් ලියාපදිංචි කරන්න ඕනෑ. දැනුත් ඒ ලියාපදිංචි කිරීම කරනවා. ඒකට යම්කිසි ගාස්තුවකුත් අය කරනවා. මෙහි සඳහන් ආකාරයට මේ සතුන් විධිමත් විධියට ලියාපදිංචි කිරීමක් කරන්න ඕනෑ. එසේ ලියාපදිංචි කළාට පස්සේ ඒ සතුන් හඳුනා ගැනීම සඳහා tag එකක් ලැබෙනවා; කර පටියක් ලැබෙනවා; ඊළඟට ඒ සතා වෙනුවෙන් වෙනම පොතක් ලැබෙනවා, ඒ සතාගේ අයිතිකාරයාට. අන්න ඒ දේවල් වෙනුවෙන් යම්කිසි අය කිරීමක්, ලියාපදිංචි ගාස්තුවක් අය කරනවා. ඒ මිස ඒක බද්දක් නොවෙයි. හැබැයි, මෙන්න මේ කියන කාරණයට අදාළව නම් දඩයක් ගහනවා. සමහරු මේ සතුන් අරගෙන ගිහින් පන්සල්වල දානවා, පල්ලිවල දානවා, දුම්රිය පොළවල දානවා, Bus Standsවල දානවා. සතුන් අරගෙන ගිහින් අන්න ඒ තැන්වල අත් හැරලා එනවා. අන්න එවැනි අය හසු වුණොත් ඒ අයට අනිවාර්යයෙන්ම දඩයක් වදිනවා. සතුන් එසේ අත් හැර දමා ඒමෙන් ඇත්තටම ඒ සතුනුත් අනාරක්ෂිත වෙනවා. ඒ වාගේම, ඒ සතුන් පිළිබඳ කිසිදු නියාමනයක් නැතිව යනවා. ඒ හින්දා දඩාවතේ යන සතුන් ප්‍රමාණය වැඩි වෙනවා. ඒ සියල්ල නියාමනය කිරීම සඳහා තමයි මේ පනත් කෙටුම්පත තුළ යම් යම් රෙගුලාසි ඇතුළත් කරලා තිබෙන්නේ. ඒ අනුව මේ පරිසරය තුළ සිටින ඒ හැම සතෙක්ම එන්නත් කිරීම තුළින් මිනිසුන්ට ජලභීතිකාව කියන ලෙඩේ බෝ වන එක වළක්වා ගන්නා අතරේ, ඒ සතුන්ටත් මේ ලෙඩේ බෝ වන එක වළක්වා ගන්න හැකි වනවා. ලෙඩේ හැදෙන්න කලින් ඒ සතා එන්නත් කර තිබුණා නම් ඒ සතාට මේ ලෙඩේ හැදෙන්නේ නැහැ. මොකද, එන්නත් කරපු සතෙකුගේ කෙළ මිනිසුන්ගේ ශරීරය තුළට ඇතුළු වුණා කියලා මිනිසුන්ට ඒ ලෙඩේ හැදෙන්නේ නැහැ. එහෙම නම් ඔන්න ඔය කියන තත්ත්වය හමුවේ සතා සහ මිනිසා කියන දෙදෙනාම ආරක්ෂා කරන වැඩ පිළිවෙළක් තමයි මේ පනත් කෙටුම්පත තුළ යෝජනා කර තිබෙන්නේ.

ඊළඟ කාරණය මෙකයි. අයාලේ යන සුනඛයෝ අද විශාල ප්‍රමාණයක් ඉන්නවා. සුනඛයා හෙවත් බල්ලා කියන සතා මිනිසාත් එක්ක ඉතාම සමීප සබඳතාවක් තිබෙන සතෙක්. මිනිස් ඉතිහාසයත් එක්ක ගත්තාම සුනඛයාටත් ලොකු ඉතිහාසයක් තිබෙනවා. විජයාගමනයේදී විජය ඇතුළු පිරිස සමඟ සුනඛයෙකුත් පැමිණ තිබෙනවා. ඉතිහාසය පුරාවටම මිනිසා සුනඛයා තම කටයුතුවලට පාවිච්චි කර තිබෙනවා. ඉතිහාසයේ දඩයමේ ගිය මිනිස්සු එම කටයුතු සඳහා සුනඛයා පාවිච්චි කළා. මිනිසුන්ගේ දුකට, සැපට, හැම දේකටම ළඟින්ම ඉන්න මිතුරෙකු බවට සුනඛයා පත් වුණා; තමන්ගේ ආරක්ෂකයෙකු බවට සුනඛයා පත් වුණා. එහෙම නම් මේ කියන පරිසරය ඇතුළේ සුනඛයා කියන සතාට තමයි අනෙකුත් සතුන් අතරේ විශේෂත්වයක් දක්වන්නේ, වැඩි අවධානයක් යොමු වෙන්නේ. ආරක්ෂක අංශත් සුනඛයා පාවිච්චි කරනවා, යම් යම් තොරතුරු ලබා ගැනීම සඳහා. ඒ අනුව සුනඛයා කියන්නේ ඉතාම වැදගත් සතෙක්. සුනඛයා කොච්චර වැදගත් සතෙකු වුණත්, සුනඛයා මිනිසාගේ ළඟම හිතෙෂී සතෙකු වුණත් ඒ සතා හරහා ජලභීතිකා රෝගය බෝ වෙලා, ඒ හේතුවෙන් මිනිස්සුත් මැරිලා, ඒ සතාත් මැරෙනවා නම්, ඒ ව්‍යසනයෙන් මේ දෙගොල්ලන්ම ගලවා ගන්න ඕනෑකම තිබෙනවා. අන්න ඒ කාරණා පිළිබඳව මේ මඟින් අවධානය යොමු වෙලා තිබෙනවා.

සුනඛයන් ලියාපදිංචි කිරීම සහ එන්නත් කිරීම මඟින් සුනඛ ගහනය යම් ප්‍රමාණයකට පාලනය කරන්න පුළුවන්. අපි ජනගහනය පාලනය කරනවා නේ. ඒ වාගේම සතුනුත් පාලනය කරනවා. ලියාපදිංචි කිරීම මඟින් මේ සත්ව ගහනයේ පාලනයක් ඇත්තටම සිදු වෙනවා. ඔන්න ඔය කියන තත්ත්වය තුළ ඉදිරියේදී මේ කියන සතුන්ගේ පැටවුන් බෝ වීම සම්බන්ධයෙන් ඒ සතුන්ගේ අයිතිකාරයන් සැලකිලිමත් වෙනවා. මොකද, බෝ වන ඒ හැම පැටවෙකුම ලියාපදිංචි කරන්න ඕනෑ; ඒ වාගේම ඒ සතුන් එන්නත් කරන්නත් ඕනෑ.

අද අපේ රටේ සුනඛ ගහනය වැඩියි. අපේ රටේ ලක්ෂ 32කට ආසන්න සුනඛ ගහනයක් ඉන්නවා කියන්නේ, ඇත්තටම ඒ ප්‍රමාණය වැඩියි. අද වීදි සුනඛයෝ විශාල ප්‍රමාණයක් ඉන්නවා. ඒක ලොකු ගැටලුවක්. එවැනි සතුන් බෝ වීම පාලනය වීමකුත් මේ පනත් කෙටුම්පත සම්මත කර ක්‍රියාත්මක කිරීම හරහා සිදු වෙනවා. වීදි සුනඛයන්ගේ ගහනය අඩු වීමටත් මෙය බලපානවා. ඒ සතුන් එන්නත් කිරීම පමණක් නොවෙයි, ඒ සතුන් ලියාපදිංචි කිරීම, ඒ සතුන්ට අනන්‍යතාවක් ලබා දීම, ඒ සතුන් වෙනුවෙන් වෙනම පොතක් නිර්මාණය කිරීම ද සිදු වෙනවා. ඒ වාගේම ඒ සතාට අවශ්‍ය රැකවරණය, ආරක්ෂාව ආදි හැම දෙයක්ම මේ තුළ සැලසෙනවා; සතුන් අනවශ්‍ය විධියට බෝ වීම වැළැක්වීමත් සිදු වෙනවා. ඔන්න ඔය තත්ත්වයන් හමුවේ තමයි මේ පනත් කෙටුම්පත සාකච්ඡාවට ගන්න ඕනෑකම තිබුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තවත් විනාඩි 2ක කාලයක් තිබෙන්නේ.

ගරු නාමල් කරුණාරත්න මහතා
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
හොඳමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ අනුව, මෙම පනත් කෙටුම්පත ඉතාම වැදගත් එකක් විධියට අපි සලකනවා. විශේෂයෙන්ම මේ වෙලාවේ උත්තර දෙන්න ඕනෑකම තිබෙනවා, තවත් කාරණා කිහිපයකට. මීට පෙර කථා කළ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයා මීට පරිබාහිරව ඉදිරිපත් කළා ඉතාම සාවද්‍ය, ද්වේෂසහගත ප්‍රකාශයක්. අකුරණදී සිදු වුණු රිය අනතුර සම්බන්ධයෙන් කිසියම් පුද්ගලයෙකු සමාජ මාධ්‍යවල දාලා තිබුණු ප්‍රකාශයක් NPP එකේ ප්‍රකාශයක් විධියට එතුමා හුවා දැක්වූවා. සමාජ මාධ්‍යවල එක එක්කෙනා එක එක දේවල් දානවා තමයි. නමුත්, අර වාගේ ඉතාම බාල දේවල් පාර්ලිමේන්තුවේ මේ ගරු සභාවක ඉදිරිපත් කිරීම පිළිබඳව අපි කනගාටු වෙනවා. අපි ඒගොල්ලන්ට මේ කාරණය කියන්න කැමැතියි. ඒගොල්ලන්ගේම නායකයන් තමයි - සජබ මහ ලේකම්, කිරිඇල්ල හිටපු ඇමතිතුමා ආදි අය තමයි - මහා නායක හාමුදුරුවන් වහන්සේලා ළඟට ගිහිල්ලා, උන්වහන්සේලා ඉදිරියේ ජාතිවාදය අවුස්සන ප්‍රකාශ සිදු කළේ. ඒගොල්ලන් තමයි මේ ජාතිවාදය වපුරන්නේ. මනෝ ගනේසන් මන්ත්‍රීතුමා ඇතුළු කණ්ඩායම් ඒවාට විරෝධය පළ කළා. ඒගොල්ලන්ගේ ආණ්ඩු පැවැති පසු ගිය කාලවල තමයි පල්ලිවලට ගිනි තැබුවේ; කුරානය ඇතුළු පොත් පත්වලට ගිනි තැබුවේ; ඒ විධියට ජාතිවාදය ඇවිස්සුවේ. නමුත් වර්තමාන ආණ්ඩුව යටතේ ඒ ජාතිවාදී හිස එසවීම්වලට කිසිම ඉඩකඩක් ලබා දීලාත් නැහැ; ලබා දෙන්නේත් නැහැ. ඒ නිසා අසත්‍ය ප්‍රකාශ මේ සභාවේ කරන්න එපා කියලා, ඒ මන්ත්‍රීවරයාට අපි කියන්න කැමැතියි.

ඒ මන්ත්‍රීවරයා තවත් කාරණයක් කිව්වා. ඒ තමයි, නල්ලූර් සහ ඉක්බාල් නගර් ඉඩම් ගැටලුව. අපි ඒ ඉඩම් ගැටලුව නිරාකරණය කරනවා. ඒක නිරාකරණය කරන්න බාධා කරන්නේත් ඔබතුමන්ලාගේම ප්‍රාදේශීය සභාවේ සභාපති. ඒකත් මතක තියාගන්න. ඒ සභාපතිට කියන්න, මට බාධා කරන්න එපා කියලා.

ඒ වාගේම, මෙහිදී විශේෂයෙන් මතු කරන්න ඕනෑකම තිබෙනවා-

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, කාලය අවසානයි. දැන් කථාව අවසන් කරන්න.

ගරු නාමල් කරුණාරත්න මහතා
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
මම ඉක්මනින් අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු ගරු මන්ත්‍රීතුමනි.

මම මේ කාරණයත් කියන්න ඕනෑ. තවත් විවිධ මන්ත්‍රීවරු මෙහිදී අදහස් ඉදිරිපත් කළා; කරුණු ඉදිරිපත් කළා. ඩී.වී. චානක මන්ත්‍රීවරයා සඳහන් කළා, නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා කිසිම සාක්ෂියක් නැතිව ඇතුළේ ඉන්නවා කියලා. අඩුම ගණනේ නාමල් මන්ත්‍රීතුමාවත් මෙතැනට ඇවිල්ලා එහෙම කියන්නේ නැහැ නේ. එතුමා ඊයේත් කථාවක් කළා නේ. එතුමාවත් එහෙම කියන්නේ නැහැ නේ. එතුමාවත් කියන්නේ නැහැ නේ, "මම ඇතුළේ ඉන්නේ බොරු සාක්ෂි මත" කියලා. ඕනෑ නම් එතුමාට පාර්ලිමේන්තුවේ වරප්‍රසාදවලට මුවා වෙලා මෙතැනදී එහෙම කියන්න පුළුවන් නේ. එතුමාවත් නොකියන කථාවක් ඒක. එතුමා දන්නවා තමන් එහෙම ඉන්නේ මොන තත්ත්වයන් යටතේද කියලා. ඒ නිසා කරුණු දන්නේ නැති තොත්ත බබාලා වාගේ මේ ගරු සභාවේ අවශ්‍ය අවශ්‍ය විධියට කරුණු ගෙනහැර දක්වන්න එපා කියන කාරණය මතක් කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමාට ගිහිල්ලා කරුණාකරලා ස්ථාවර නියෝග කියවන්න කියන්න. Standing Order No. 91(f). It states, I quote:

> "No Member shall refer in any motion or debate, to any matter which is under adjudication..."

නාමල් මන්ත්‍රීතුමා මේවා කියවලා තමයි එන්නේ. මේ Deputy ඇමතිලාත් දන්නේ නැහැ, පවතින නඩු ගැන කථා කරන්න බැහැ කියන එක. එතුමා එහෙම කොන්ද පණ නැති මිනිහෙක් නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, චෝදනාවක් එල්ල වුණා නම් ඒ අදාළ ගරු මන්ත්‍රීතුමාට සභා ගර්භයට ඇවිල්ලා ඒ සඳහා පිළිතුරු දෙන්න පුළුවන්. ඒ නිසා ඔබතුමාට ඒ අවස්ථාව දෙන්න අපහසුයි.

මීළඟට, ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.40]

ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நாடாளுமன்றத்தில் முன்வைக்கப்பட்டுள்ள விசர்நாய்க்கடி நோயை ஒழித்தல் மற்றும் நாய்களைப் பதிவுசெய்தல் சட்ட மூலத்தின் இரண்டாம் வாசிப்பு மீதான விவாதத்தில் கலந்து கொண்டு எனது கருத்துக்களை எடுத்துரைக்க விழைகின்றேன்.

விசர்நாய்க்கடி நோய் ஒழிப்பு மற்றும் நாய்கள் பதிவு தொடர்பான இலங்கையின் இன்றைய சட்டக் கட்டமைப் பானது, காலனித்துவக் காலத்தைச் சேர்ந்ததாகும். 1893ஆம் ஆண்டின் விசர்நாய்க்கடி நோய்க் கட்டளைச் சட்டமும், 1901ஆம் ஆண்டின் நாய்கள் பதிவுசெய்தல் கட்டளைச் சட்டமும் கடந்த நூற்றாண்டில் உருவாக்கப்பட்டவையாகும். அவை காலங்கடந்த பொதுச் சுகாதார அணுகுமுறைகளைக் கொண்டுள்ளதோடு, இக்காலத்துக்குப் பொருந்தாத மிகக்

குறைந்த தண்டத்தொகையையும் கொண்டுள்ளன. மேலும், விலங்குகளைத் தன்னிச்சையாகக் கொல்லும் முறைகளையும் அவை அனுமதிக்கின்றன.

இன்றுகூட, நாட்டின் உள்ளூராட்சி மன்றங்களும் பொதுச் சுகாதார அதிகாரிகளும் ஒரு நூற்றாண்டு பழமையான சட்டங்களைக்கொண்டு விலங்கின நோய் அபாயங்களை நிருவகிப்பர் என்று எதிர்பார்ப்பது ஏற்றுக்கொள்ள முடியாததாகும். நாம் பேசும் இந்தச் சட்டமூலமானது, சிதறிக் கிடக்கும் பழைய சட்டங்களை ஒரே சட்டத்தின்கீழ் ஒருங்கிணைக்கிறது; ஆண்டுதோறும் கட்டாயத் தடுப்பூசி மற்றும் பதிவை வலியுறுத்துகிறது; வணிக அடிப்படையிலான நாய் வளர்ப்பை முறைப்படுத்துகிறது. மேலும், தன்னிச்சையாக விலங்குகளைக் கொல்வதற்கு மாற்றாக, மாந்தநேயம்மிக்க "பிடித்து கருத்தடை செய்து விடுவித்தல்" முறையை அறிமுகப்படுத்துகிறது. இந்த நடவடிக்கைகள் இலங்கையை புதிய பொதுச் சுகாதார நடைமுறைகளோடு இணைக்கின்றன. 2025ஆம் ஆண்டில் மட்டும் இலங்கையில் 14 பேர் விசர்நாய்க்கடியால் உயிரிழந்துள்ளனர். இந்தச் சீர்திருத்தம் எவ்வளவு இன்றியமையாதது என்பதை மேற்படி தடுக்கத்தக்க மனித உயிரிழப்புகள் உணர்த்துகின்றன.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்தச் சட்டத்தின் பின்னணியிலுள்ள நோக்கங்கள் பாராட்டுக்குரியவை என்றாலும், இரண்டாம் வாசிப்பு மீதான விவாதத்தின்பொழுது இதன் நடைமுறை உண்மைகளை நாம் முழுமையாக ஆராய வேண்டும். இதிலுள்ள மிக முதன்மையான அறைகூவலாக இருப்பது நான்காம் பிரிவைச் சுற்றியுள்ள தொழில்முறை விவாதமாகும். விசர்நாய்க்கடி தடுப்பூசியை ஒரு பதிவுசெய்யப்பட்ட கால்நடை மருத்துவர் அல்லது அவரது நேரடி மேற்பார்வையின்கீழ் மட்டுமே செலுத்த வேண்டுமென இப்பிரிவு கட்டளையிடுகிறது.

இலங்கை கால்நடை மருத்துவச் சங்கம், மாகாண கால்நடை மருத்துவச் சங்கம் ஆகியன முன்வைக்கும் தொழில்நுட்ப நியாயங்களை நாங்கள் மதிக்கிறோம். கால்நடை மருத்துவர்கள் சிறப்பு உயிரியல் நிபுணத்துவம் பெற்றவர்கள் என்பதில் மாற்றுக் கருத்துக்கு இடமில்லை. அதேநேரத்தில், அரச மருத்துவ அதிகாரிகள் சங்கம் மற்றும் பொதுச் சுகாதாரப் பணியாளர்கள் எழுப்பும் நடைமுறைசார் எச்சரிக்கைகளையும் நாம் செவிமடுக்க வேண்டும். இலங்கையில் முழுநேர அரச கால்நடை மருத்துவர்களுக்குப் பற்றாக்குறை நிலவுகிறது. அவர்களில் பெரும்பாலானோர் கால்நடை வளர்ப்பு மற்றும் பண்ணை விலங்குத்துறைகளை நிருவகிப்பதிலேயே கவனம் செலுத்துகின்றனர். பல பதிற்றாண்டுகளாக நாட்டின் விசர்நாய்க்கடி ஒழிப்பு முயற்சிகள், 362 மருத்துவ அதிகாரி பிரிவுகளில் சுகாதார மருத்துவ அதிகாரிகள் மற்றும் பொதுச் சுகாதார ஆய்வாளர்களின் வழிகாட்டுதலின்கீழ் செயற்படும் பொதுச் சுகாதார தடுப்பூசிப் பணியாளர்களை நம்பியே இருந்து வந்துள்ளன. இந்தச் சட்ட முன்மொழிவின் நான்காம் பிரிவு எந்த மாற்றமும் இல்லாமல் சட்டமாக்கப்பட்டால், அது ஒரு பெரிய நிருவாக முடக்கத்தை ஏற்படுத்தக்கூடும். கால்நடை மருத்துவர்கள் அருகில் இல்லாத காரணத்தால் சுகாதார மருத்துவ அலுவலகங்கள் சமூக மட்டத்தில் தடுப்பூசி முகாம்களை நடத்த முடியாத நிலை ஏற்படும்.

2017-2018ஆம் ஆண்டுகளில் விசர்நாய்க்கடி நோய் கட்டுப்பாட்டுப் பணிகள் கால்நடை திணைக்களத்துக்கு மாற்றப்பட்டபொழுது ஏற்பட்ட விளைவை நாம் எண்ணிப் பார்க்க வேண்டும். அந்த மாற்றத்தின்பொழுது, நாய்களுக்குத் தடுப்பூசி செலுத்தும் தேசிய அளவிலான பாதுகாப்பானது, 60 சதவீதத்திலிருந்து ஆறு சதவீதமாகக் குறைந்தது. இதனால் பொதுச் சுகாதார நெருக்கடியைத் தவிர்க்கும் பொருட்டு அரசாங்கம் மீண்டும் சுகாதார அமைச்சிடமே அந்தப் பொறுப்பை ஒப்படைக்க வேண்டியதாயிற்று. அந்தத் தவறை நாம் மீண்டும் செய்ய முடியாது.

விசர்நாய்க்கடி நோய் பரவுவதைத் தடுக்க வேண்டுமெனில், நாய்களின் தொகையில் குறைந்தபட்சம் 70 சதவீதத்துக்கு தொடர்ச்சியாக தடுப்பூசி செலுத்துவதை உறுதிசெய்ய வேண்டுமென உலக சுகாதார அமைப்பு வலியுறுத்துகிறது. நாம் 55 சதவீத மட்டத்திலேயே உள்ளோம். ஆகவே, குழுநிலையின்பொழுது இதனோடு தொடர்புடைய அமைச்சர் அவர்கள் இதற்கான நடைமுறைச்சாத்தியமான தீர்வை முன்வைக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். அறுவைச் சிகிச்சை மூலமான கருத்தடை, வணிக அடிப் படையிலான இனப்பெருக்கம் மற்றும் மருத்துவப் பராமரிப்புக்கு கால்நடை மருத்துவர்களின் நேரடி மேற்பார்வை தொடரட்டும். அதேசமயம், வழக்கமான சமூக மட்டத்திலான தடுப்பூசி முகாம்களை சுகாதார மருத்துவ அதிகாரிகளின் மேற்பார்வையின்கீழ் பயிற்சிபெற்ற பொதுச் சுகாதாரப் பணியாளர்கள் தொடர்ந்து நடத்துவதற்கு வழிவகை செய்யும் வகையில், சட்டமூலத்தின் நான்காம் பிரிவில் திருத்தம் கொண்டுவர வேண்டும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நாட்டின் உள்ளூராட்சி மன்றங்கள்மீது சுமத்தப்படும் நிதிச் சுமையையும் நாம் இவ்விடத்தில் கவனத்திற்கொள்ள வேண்டும். இந்தச் சட்டமூலமானது மாநகராட்சி மன்றங்கள், நகர சபைகள், பிரதேச சபைகள் ஆகியவற்றுக்கு கருத்தடை திட்டங்களை நிருவகித்தல், விலங்குப் பராமரிப்பு நிலையங்களை நடத்துதல், வணிக வளர்ப்பாளர்களுக்கு உரிமம் வழங்குதல், ஐந்தாண்டுகளுக்கு ஒருமுறை நாய் கணக்கெடுப்பு நடத்துதல் முதலிய கடமைகளை வழங்குகின்றன. இருப்பினும், இந்தக் கடமைகளைச் செய்வதற்குத் தேவையான நிதி ஒதுக்கீடு எதையும் இந்தச் சட்டமூலம் வழங்கவில்லை. உள்ளூராட்சி மன்றங்களுக்குப் போதுமான நிதி உதவி வழங்காமல் இந்தச் சட்டக் கடமைகளை அவற்றின்மீது திணிப்பது நிதி ஆதாரமற்ற நிலையை ஏற்படுத்திவிடும். இதன் காரணமாக பிரதேச சபைகளால் கருத்தடை மற்றும் தடுப்பூசித் திட்டங்களை முறையாகப் பராமரிக்க முடியாமல் போய்விடும். எனவே, நாடு முழுவதும் சீரான செயலாக்கத்தை உறுதிசெய்ய வேண்டுமாயின், உள்ளூராட்சி மன்றங்களின் உட்கட்டமைப்பு மற்றும் தடுப்பூசி வழங்கலுக்கு ஆதரவளிக்கவென தனியானதொரு தேசிய விசர்நாய்க்கடி ஒழிப்பு நிதியத்தை நாடாளுமன்றம் உருவாக்க வேண்டும்.

குறைந்த வருமானம் பெறும் குடும்பங்கள்மீது ஏற்படும் சமூக - பொருளாதாரத் தாக்கத்தையும் நாம் மதிப்பீடு செய்ய வேண்டும். இந்தச் சட்டமூலத்தில், உரிய காலத்தில் நாய்களைப் பதிவுசெய்யத் தவறினால் 2,000 ரூபாய் தாமத தண்டப் பணம் விதிக்கப்படுமென குறிப்பிடப்பட்டுள்ளது. கிராமப்புற சமூகங்களில் ஏழை, எளிய மக்கள் வீடுகளுக்குக் காவலாக இருக்கும் வளர்ப்பு நாய்களைப் பராமரித்து வருகின்றனர். பதிவுச் செயன்முறை செலவு மிக்கதாகவோ அல்லது அணுக முடியாததாகவோ இருந்தால், தண்டப் பணத்தைத் தவிர்ப்பதற்காக மக்கள் தங்கள் நாய்களை வீதிகளில் கைவிட்டுவிடுவர். விலங்குகளைக் கைவிடுவது இந்தச் சட்டத்தின்கீழ் குற்றமாக்கப்பட்டு இருந்தாலும், குறைந்த வருமானம் பெறும் குடும்பங்களுக்கு அணுகக்கூடிய வகையில் இலவசப் பதிவு மற்றும் தடுப்பூசி மையங்களை

[ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා]

ඒ්පටුත්තාමල් අවර්කළෛත් තණ්ටිප්පතු තෙරුනාය්කළින් එණ්ණික්කෛයෛ මේලුම් අතිකරිත්තවේ සෙය්යුම්. එනවේ, සට්ටම් නටෛමුරෛක්කු වරුම්පොළුතු මුතල් ආරු මාත කාලත්තුක්කු තණ්ටත්තිලිරුන්තු විලක්කළිත්ක වේණ්ටුම්. මේලුම්, කුරෛන්ත වරුමානම් පෙරුම් කුටුම්පංකළුක්කු තොටක්කප් පතිවුක් කට්ටණංකළිලිරුන්තු විලක්කළිත්කවුම් වේණ්ටුම්. ඉරුතියාක, 22ආම් පිරිවින් කීළුල්ල සෙයලාත්ක අතිකාරංකළෛප් පොරුත්තවරෛ, අතිකාරිකළුක්කු වළාකඞ් කළුක්කුච් සෙල්ලුම් අතිකාරම්, වාකනංකළෛ නිරුත්ති ආය්වු සෙය්යුම් අතිකාරම්, උයිරියල් මාතිරිකළෛච් සේකරිත්කුම් අතිකාරම්, සොත්තුක්කළෛක් කෛප්පට්රුම් අතිකාරම් ආකිය අනෛත්තුම් තෙළිවාන වළිකාට්ටුතල්කළින්කීළ් මේට් කොළ්ළප්පට වේණ්ටුම්.

කෞරව තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළේ, විසර්නාය්ක්කටි නෝයෛ ඔළිත්තල් මට්රුම් නාය්කළෛප් පතිවුසෙය්තල් සට්ටමූලමානතු ඉන්රියමෛයාත ඔරු සට්ටමූලමාකුම්. ඉතු කාලත්තුක්කු ඔව්වාත කාලනිත්තුවච් සට්ටඞ්කළෛ මාට්රි, මනිත නේයමික්ක තෙරුනාය්කළ් මේලාණ්මෛයෛ අරිමුකප්පටුත්ති, විසර්නාය්ක්කටි නෝයෛ ඔළිප්පතර්කාන කට්ටමෛප්පුච් සූළලෛ වළඞ්කුකින්රතු. ඉරුප්පිනුම්, ඉන්තච් සට්ට ඉලක්කුකළ් වෙට්රිකරමාක එට්ටප්පටුවතෛ උරුතිසෙය්ය, කුළුනිලෛයින්පොළුතු නාටාළුමන්රම් ඉතන් විතිකළෛච් සෙම්මෛප්පටුත්ත වේණ්ටුම්. නටෛමුරෛච් චාත්තියමාන පොතුච් සුකාතාර මාතිරියින්මූලම් 4ආම් පිරිවිලුළ්ළ මුරණ්පාටුකළෛත් තීර්ත්තු, උළ්ළූරාට්චි මන්රඞ්කළුක්කුත් තේවෛයාන නිති ආතරවෛ උරුතිසෙය්ය වේණ්ටුම්.

කෞරව තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළේ, ඉන්ත ඉලක්කෝටුකූටිය තිරුත්තඞ්කළෛක් කොණ්ටුවරුවතන්මූලම් ඉලඞ්කෛයින් පොතුච් සුකාතාරත්තෛයුම් විලඞ්කු නලනෛයුම් පාතුකාක්කක්කූටිය සිරන්තතොරු සට්ටත්තෛ ඉන්ත නාටාළුමන්රත්තාල් ඉයර්ර මුටියුමෙනක් කූරි, එනතු උරෛයෛ නිරෛවුසෙය්කින්රේන්. නන්රි!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.47]

ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා
(මාණ්පුමිකු (වෛත්තියර්) නිහාල් අපේසිංහ)
(The Hon. (Dr.) Nihal Abeysinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජලභීතිකා රෝගය තුරන් කිරීමේ සහ සුනඛයන් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත මේ මෑතකදී ඉදිරිපත් කළ ඉතාම වටිනා පනත් කෙටුම්පතක් කියලා මම හිතනවා. ඒ වුණාට විපක්ෂයේ මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවාවෙලා සමාජ මාධ්‍යවල තිබෙන තොරතුරු මෙතැනට ඇවිල්ලා නැවත නැවත කියමින් ඉන්නවා. එහෙම බැලුවාම මෙතැන දැන් වැදගත් මාතෘකාවක් පිළිබඳව වැදගත් සාකච්ඡාවක් ඇත්තටම කෙරෙන්නේම නැහැ. ඒ මදිවට වැරදි තොරතුරුත් ඉදිරිපත් කරනවා. දැන් විපක්ෂයේ මන්ත්‍රීතුමෙක් කරුණු ඉදිරිපත් කළා, අපේ රටේ දුප්පත්කම වැඩි වෙලා කියලා. නමුත්, ඔක්තෝබර් 6වැනි දා ලෝක බැංකුව ඉදිරිපත් කරපු වාර්තාවක තිබෙනවා, "Sri Lanka poverty to fall to 15.8 per cent in 2026" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු චානක මාදුගොඩ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.

අතන්පිරකු, මාණ්පුමිකු චානක මාදුකොට අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, කුළුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ් [මාණ්පුමිකු (තිරුමති) හේමාලි වීරසේකර] තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. CHANAKA MADUGODA left the Chair and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair

ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා
(මාණ්පුමිකු (වෛත්තියර්) නිහාල් අපේසිංහ)
(The Hon. (Dr.) Nihal Abeysinghe)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට කාලය ලබා දෙන්න.

ඇත්තටම මම කිව්වේ, මේ අය දුප්පත්කම - poverty - ගැන වැරදි තොරතුරු ඉදිරිපත් කිරීම පිළිබඳවයි. ලෝක බැංකුව මේ වන විට කියනවා, අපේ රටේ දුප්පත්කම අඩු වෙමින් තිබෙනවා කියලා. ඒ නිසා විපක්ෂ මන්ත්‍රීවරුන් ඒ සම්බන්ධව තිබෙන තොරතුරු පිළිබඳව හොඳට අධ්‍යයනය කරලා විවාදයට එන්න. එතකොට තමයි අපටත් මේ සංවාදයට සම්බන්ධ වන්න උත්තේජනයක් ලැබෙන්නේ. නැත්නම් හැමදාම එකම දේ කිය කියා ඉන්න කොට අපට අහගෙන ඉන්න එකත් එපා වෙනවා.

අද අපි කථා කරන්නේ ජලභීතිකා රෝගය තුරන් කිරීම පිළිබඳව. ජලභීතිකා රෝගය කියන්නේ, zoonotic disease එකක් - ඒ කියන්නේ, සතුන්ගෙන් මිනිසාට වැලඳෙන රෝගයක්. අපේ රටේ සෞඛ්‍ය පද්ධතිය තුළ දැනුම් දිය යුතු රෝගයක්. මේ රෝගය මාරාන්තිකයි, හැබැයි වැළැක්විය හැකියි. බොහෝ විට සතුන් අතර තමයි මේ රෝගය පැතිරෙන්නේ. අහම්බෙන් තමයි, මනුෂ්‍යයෙකු මේ රෝගයට ගොදුරු වන්නේ. ජලභීතිකා රෝගය වැලඳුණු සතෙකුගේ සපා කෑමකට ගොදුරු වෙලා, ඒ සතාගේ බෙටය මනුෂ්‍යයෙකුගේ ශරීරයට ඇතුළු වුණොත් තමයි, ජලභීතිකා රෝගය ඒ කෙනාට වැලඳෙන්නේ. මේකෙන් වෙන්නේ මොකක්ද? රෝගය වැලඳුණු සතාගේ muscular spasm එකක් එනවා. ඒක ස්නායු පද්ධතියට තමයි බලපාන්නේ. ඒ නිසා වතුර බොන්න බැරි වනවා. එතකොට ජලභීතිකාවෙන්, පිස්සු වාගේ හැසිරෙනවා. ඒක පොදු දෙයක්, මනුෂ්‍යයෙකුට වුණත් මේ රෝගය වැලඳුණොත්.

මේ වැදගත් මාතෘකාවේදී මම කියන්න කැමැතියි, අපට ජලභීතිකා රෝගය තුරන් කළ හැකි බව. මේක දිවයිනක්. එතකොට අපි මේ සඳහා උපාය මාර්ග කිහිපයක් පාවිච්චි කරනවා. ප්‍රධානම එක තමයි, සුනඛයින් එන්නත් කිරීම. සුනඛයින් සියයට 70කට වඩා එන්නත් කර ගත්තොත්, ජලභීතිකා රෝගය තුරන් කළ හැකියි කියලා ලෝක සෞඛ්‍ය සංවිධානය සාමාන්‍යයෙන් ගණනය කරලා තිබෙනවා. ඒ වාගේම මේ එන්නත් කිරීම් routine විධියට, ඒ කියන්නේ එදිනෙදා කරන එන්නත් කිරීම්වලට අමතරව vaccination campaign එකක් හැටියටත් අපි මේක කරන්න ඕනෑ. එතකොට තමයි ප්‍රජාවට තමන්ගේ සුනඛයින්ව එන්නත් කර ගැනීමේ හැකියාව ලැබෙන්නේ. ඒ විධියට තමයි සාමාන්‍යයෙන් මේ එන්නත්වල ආවරණය - coverage එක - වැඩි කර ගන්නේ. ඒ වාගේම මෙතිදී ඉතාම වැදගත්, මේ එන්නත් කිරීම් පිළිබඳව වාර්තා තබා ගැනීම. මේ පනත මඟින් ඒක පළාත් පාලන ආයතනවලට පවරා තිබෙනවා.

ඊළඟ වැදගත් කරුණ තමයි, සුනඛයකු සපා කෑම නිසා යම් පුද්ගලයෙකු රෝහලකට ගෙන ගියාම, ඒ සුනඛයා ජලභීතිකා රෝගය තිබෙන සුනඛයෙක් කියලා සැක කළොත්, අපි ඒ සපා කෑමට ලක් වූ පුද්ගලයාට post-exposure treatment එක ලබා දෙනවා. ඒ කියන්නේ, එක්කෝ අපි රෝහලේදී එන්නතක් ලබා දෙනවා, එහෙම නැත්නම් immunoglobulin දෙනවා. එතකොට ජලභීතිකා රෝගය වැලඳීමකින් තොරව, එම පුද්ගලයා ඉන් වළක්වා ගැනීමේ අවස්ථාව තිබෙනවා. ඒ වාගේම සුනඛයා සපා කන ලද ස්ථානය, එහෙම නැත්නම් සූරපු ස්ථානය හොඳට සබන් යොදා සේදීමෙන් රෝගය සෑහෙනදුරට වළක්වා ගන්න අපට පුළුවන් වනවා. ඒ වාගේම ගලාගෙන යන වතුරෙන් එම තුවාලය සේදුවොත් ඇත්තටම ජලභීතිකා රෝගය වැලඳෙන්න තිබෙන ඉඩ සෑහෙනදුරට අඩු කර ගන්න අපට පුළුවන් වනවා. ඒ වාගේම රෝහලේදී ඒ පිළිබඳව assess කරනවා; එන්නත් කරනවා; immunoglobulin දෙනවා. අපේ ආණ්ඩුව මේ වනකොට ඉතාම හොඳින් රෝහල්වලට ඒ සඳහා අවශ්‍ය එන්නත් සහ අනෙකුත් සැරහුම් හා immunoglobulin සපයමින් සිටිනවා.

ඊළඟ වැදගත් කරුණ තමයි, මේ සම්බන්ධව මහජනතාව දැනුවත් කිරීම. මේ ගැන පාසල් ළමුන් දැනුවත් කළ යුතුයි. සුනඛයකු සපා කෑ අවස්ථාවකදී ඒ ගැන ඉක්මනින්ම වාර්තා කළ යුතුයි කියලා වැඩිහිටියන් ඇතුළු සමාජය දැනුවත් කළ යුතුයි. ඒ කාර්යය මේ වනකොට විවිධ ආයතන මඟින් සිදු කරනවා. සාමාන්‍යයෙන් සතෙක් සපා කෑවාම මීට පෙර කරපු වැරදි පිළිබඳව ජනතාව දැනුවත් කිරීමත් මෙහිදී ඉතාම වැදගත් වනවා.

ජලභීතිකා රෝගය තුරන් කිරීමට ඊළඟට ඉතාම වැදගත් කාරණය තමයි, සුනඛ ගහනය පාලනය කිරීම. මෙහිදී වැදගත්ම කාර්යය තමයි, responsible ownership එක. ඒ කියන්නේ, වගකීමක් සහිතව සතුන් ඇති කිරීමට ඒ සතුන් ඇති කරන අය යොමු කිරීම. අපි ඒක තමයි මෙම පනතින් කරන්නේ, සතුන් ලියාපදිංචි කිරීම හරහා. ඊළඟට, දඬාවතේ යන සුනඛයන් පැහිරීම වැළැක්වීමත් මෙහිදී අපට ඉතාම වැදගත් වනවා. මෙම ලියාපදිංචිය හරහා අපට ඒකටත් අවස්ථාව ලැබෙනවා. ඒ වාගේම සුනඛයන් මානුෂීය ලෙස රැකබලා ගැනීම සහ සමහර සුනඛයන්ගේ ගහනය අඩු කර ගැනීම වඳ සැත්කම් මඟින් අපට කරන්න පුළුවන් වනවා. ඒකත් අපි promote කළ යුතුයි. එවිට දඬාවතේ යන සුනඛයන් අවම කර ගැනීමෙන් ජලභීතිකා රෝගය පාලනය කර ගන්න අපට පුළුවන් වනවා.

ඒ වාගේම තවත් වැදගත් කාරණයක් තමයි, ආවේක්ෂණය. ඒ කියන්නේ, තොරතුරු පද්ධතියක් සකස් කර ගැනීම. දැනටමත් තිබෙන නීතිය අනුව, සුනඛයෙක් සපා කෑවොත්, එහෙම නැත්නම් ජලභීතිකා රෝගය වැලඳී ඇති බවට සැක කරන සුනඛයෙක් සපා කෑවොත්, ඒ පිළිබඳව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිට වාර්තා කළ යුතුයි. එවිට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි සහ එම කාර්ය මණ්ඩලය ඒක investigate කරනවා. ඊළඟට, රසායනාගාර වාර්තා ලබා ගන්න සැලැස්වෙනවා. ඊළඟට, එම සුනඛයා විසින් සපා කෑ තවත් expose වුණු අය ඉන්නවා නම් ඒ අය ගැනත් සොයා බලනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමනි, මෙම පනත් කෙටුම්පත අද දින අපි සම්මත කරන්නේ නැති නිසා මා කැමැතියි, තවත් සංශෝධන කිහිපයක් ඉදිරිපත් කරන්න. පනත් කෙටුම්පතේ 12(1) වගන්තිය යටතේ තිබෙනවා, "...වෙනත් යම් තැනැත්තකුට..." කියලා. ඒ කියන්නේ, පශු වෛද්‍යවරයෙකුට හැරෙන්න වෙනත් තැනැත්තකුට යම් අභිජනන මධ්‍යස්ථානයක පරිශ්‍රයක් පරීක්ෂා කිරීම සඳහා අවසර දෙන්න පුළුවන් කියලා. මා යෝජනා කරනවා, එම තැනැත්තා පශු වෛද්‍යවරයාගේ නියෝජිතයෙක් වුණොත් හොඳයි කියලා.

ඊළඟට 15(1) වගන්තියේ කියනවා, ජලභීතිකා රෝගය පවතින හෝ ජලභීතිකා රෝග අවදානමක් පවතින ප්‍රදේශ මොනවාද යන්න පළාත් පාලන ආයතනය විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතුය කියලා. සාමාන්‍යයෙන් රෝග වැළැක්වීමේදී ඒ වාගේ දෙයක් කරන්නේ මහජන සෞඛ්‍ය වෛද්‍යවරයාගේ උපදෙස් සහිතවයි. අපි ඒ පිළිබඳව සඳහනක් කළා නම් මේ කාර්යය සම්පූර්ණ වනවා. මොකද, අපට මහජන සෞඛ්‍ය වෛද්‍යවරයා, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා සහ මහජන සෞඛ්‍ය කාර්ය මණ්ඩලය, පශු වෛද්‍ය කාර්ය මණ්ඩලය සහ පළාත් පාලන ආයතනය කියන ඒ සියල්ලම වැදගත් වනවා, ජලභීතිකා රෝගය තුරන් කරන්න.

සෑම අවුරුදු 5කට වරක් සුනඛ සංගණනයක් කරන්න බලාපොරොත්තු වීමත් ඉතා වැදගත් දෙයක්. මම හිතනවා, ඒක හොඳයි කියලා. මොකද, මෙච්චර කල් අපි සුනඛයන් එන්නත් කළා. හැබැයි, එන්නත් කළේ එන්නත් ලබා දෙන වෙලාවට ගෙන එන සුනඛයන්ව. නමුත් අපට දැනගන්න ක්‍රමයක් තිබුණේ නැහැ, සුනඛ ගහනය කොතෙක් ද කියලා. දැන් මේ ලියාපදිංචි කිරීම හරහා අපට ඒ තොරතුරු ලැබෙනවා.

මේ පනත් කෙටුම්පතේ 20(1)(අ) අනු වගන්තියේ (iv) යටතේ තිබෙනවා, "අදාළ පළාත් පාලන ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා" කියලා. එහිදී අපට කියන්න පුළුවන්, "ඔහු හෝ ඔහුගේ නියෝජිතයෙකු" කියලා. එතකොට කාර්ය මණ්ඩලයටත් ඒ සඳහා සහභාගි වීමේ අවස්ථාව ලැබෙනවා. ඒ වාගේම 22(ඇ) යටතේත් තිබෙනවා, "සෞඛ්‍ය වෛද්‍ය නිලධරයකු" කියලා. ඒකට "ඔහු හෝ ඔහුගේ නියෝජිතයෙකු" කියලා කිව්වොත් ඒක සම්පූර්ණ වනවා. ඒ වාගේම 27 වගන්තියේ තිබෙනවා, සෑම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයෙක්ම සුනඛයන් සපා කෑමේ සිද්ධීන්ට අදාළ විස්තර පශු වෛද්‍යවරයාට සැපයිය යුතුයි කියලා. මීට අමතරව රෝහලෙන් වාර්තාවක්, notification එකක් ද පශු වෛද්‍යවරයාට එනවා. මම යෝජනා කරනවා, එය පනත් කෙටුම්පතට ඇතුළත් කරන්න කියලා. මොකද, ඒක තවදුරටත් ක්‍රියාත්මක විය යුතුයි. ජලභීතිකා රෝගය තිබෙන සුනඛයෙක් සපා කෑවා කියලා වාර්තා වනවා නම්, -දැනටමත් ඒක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිට වාර්තා වනවා- එහිදී අපට ඒ ආකාරයෙන්ම කටයුතු කරන්න පුළුවන්.

ඒ වාගේම මේ සම්බන්ධව මට තවත් කරුණක් කියන්න තිබෙනවා. ඒකෙදි විශේෂයෙන්ම වැදගත් වන්නේ පශු වෛද්‍යවරයාට සහ එම කාර්ය මණ්ඩලයට මේ සතුන් එන්නත් කිරීම පැවරීම යෝග්‍යයි කියන එකයි. ඒ වාගේම පළාත් පාලන ආයතන භාර සභාපති හෝ නගරාධිපති විසින් සුනඛයන් ලියාපදිංචිය පිළිබඳ වගකීම භාර ගන්න එකත් ඉතාම වැදගත් දෙයක්. ඒ වාගේම මේ කණ්ඩායම් තුනම -මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා සහ මහජන සෞඛ්‍ය පරීක්ෂක ඇතුළු කාර්ය මණ්ඩලයත්, පශු වෛද්‍යවරයා ඇතුළු එම කාර්ය මණ්ඩලයත්, පළාත් පාලන ආයතනවල ප්‍රධානීන්- මේ පිළිබඳව සාමූහිකව මැදිහත් වනවා නම් මේ කාර්යය පහසුවෙන් කරගන්න අපට හැකි වනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු බිමල් රත්නායක අමාත්‍යතුමා, ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.57]

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)

(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)

(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ජලභීතිකා රෝගය තුරන් කිරීමේ සහ සුනඛයන් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පතට අදාළව ගත්තොත්, මම මීට අවුරුදු කිහිපයකට කලින් ඇඹිලිපිටිය ප්‍රදේශයේ මා මිත්‍ර ළමා රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයෙක් මුණ ගැසීමට ගිය අවස්ථාවක දී අසන්නට ලැබුණු සිද්ධියක් මතක් වුණා. ඊට කලින් දිනයේ දී අවුරුදු 11ක් පමණ දරුවෙක් ජලභීතිකා රෝගයෙන් මිය ගිහිල්ලා තිබෙනවා. ජලභීතිකා රෝගය වාගේ ඉතා පැරණි, සුවකළ හැකි රෝගයකින් අපේ දරු පැටව් තවමත් මිය යනවා. මේ ගැලරියේත් ඉතාම ලස්සන දුලා පුතාලා බොහොමයක් ඉන්න වෙලාවකයි මට මේක කියන්න ලැබෙන්නේ. ඇත්තටම එය මේ රටේ නොවිය යුත්තක්. අපි හිතනවා, මේ සම්බන්ධව නව නීති රීති සකස් කරන එක හොඳයි කියලා. ඒ වාගේම අපේ විශේෂඥ වෛද්‍ය නිහාල් අබේසිංහ මන්ත්‍රීතුමා ඇතුළු අය මහන්සි වෙලා මේ සම්බන්ධව කටයුතු කරනවා. මම හිතන්නේ rabiesවලට අදාළ කරන injections හැම hospital එකකම දෙන්නේ නැහැ. මම දන්නේ නැහැ, විද්‍යානුකූලව ඒවායේ තත්ත්වය එහෙමද කියලා. නමුත්, ඒවා සුලබ කරන්න පුළුවන් නම් හොඳයි කියන ඉල්ලීම තමයි මට කරන්න තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මා ඔබතුමියගේ අවසර ඇතිව මේ දේවල් කියන්න කැමැතියි. මෙතැන මීට කලින් මතු කරන්න උත්සාහ කළා, අකුරණ accident එක සම්බන්ධව. ඒ ගැන මන්ත්‍රීවරයෙක් ඉතාම පහත් විධියට ජාතිවාදී පදනමෙන් කථා කළා. මම මේ සම්බන්ධව අකුරණ පොලීසියේ ස්ථානාධිපතිතුමා සමඟත් කථා කළා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔබතුමියත් දන්නවා, මම ඊයේ හෝ පෙරේදා අකුරණ accident එක සම්බන්ධව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් සකස් කරපු මුල් වාර්තාව හැන්සාඩ්ගත කළ බව. එලෙස හැන්සාඩ්ගත කළ මුල් වාර්තාවේ ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ අනතුර සිදු වෙච්ච විධිය සම්බන්ධ මූලික කරුණු ටික තිබෙනවා. නමුත් තව කරුණු පරීක්ෂා කරන්න ඕනෑ. දැන් මෙතැනදී මතු කළේ මොකක්ද? දේශපාලන පක්ෂයක් කියලා කිව්වේ; සිංහල කියන කථාවක් කිව්වා වාගේ තමයි මට මතක. වෛද්‍යවරයෙක්, තව අය මැරුණා නම් හොඳයි වාගේ කථාවක් කිව්වා කියලා තමයි තිබෙන්නේ. අපි කියන්න කැමැතියි, ලංකාවේ සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව දෙවියනේ කියලා ආණ්ඩුවක් හදාගෙන තිබෙනවාය කියන එක. ජාතිවාදය නැහැ. විශේෂයෙන් නුවර සහ අකුරණ පැත්තේ මිනිස්සු අවුරුදු සිය ගණනක් සිංහල, දෙමළ, මුස්ලිම් කියන සියලුම ජාතීන් එක්ක එකට එකතු වෙලා, දළදා වහන්සේටත් ගරුත්වය ලබා දෙමින් ඉතා හොඳින් ජීවත් වුණා. දැන් මේ රිය අනතුරෙන් මිය ගිහිල්ලා තිබෙන්නේ කවුද? එලෙස මිය ගිහිල්ලා තිබෙන්නේ අපේ රටේ එකම ලේ තිබෙන මිනිස්සු. නමුත් දැන් මෙතැන ජාතිවාදය අදිනවා. ඒ නිසා මම කැමැති නැහැ, මේ කාරණය ගැන කියන්න. බංකොලොත් වෙලා, නට්ටං වෙලා, තල්ලු වෙලා ඉන්න වෙලාවේදී දැන් මොකක් හරි හොල්මනක් ඇද ගන්න ඕනෑ.

අකුරණ අනතුරෙන් මිය ගිය අය කවුද? ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ අනතුරින් පස්දෙනෙක් මැරුණා. මම මේ ගැන කියන්න හිතුවේ නැහැ. නමුත් මේ වැඩ තුච්ඡයි. ඒ අනතුරින් මිය ගිය අයගේ ජාතිය වශයෙන් ගත්තොත්, සිංහල - පිරිමි දෙදෙනායි, ගැහැනු එක්කෙනායි; දෙමළ - ගැහැනු එක්කෙනායි; මුස්ලිම් - පිරිමි එක්කෙනායි. ඒ අනුව මේ අනතුරින් වැඩිපුර මැරිලා තිබෙන්නේ කවුද?

ඊළඟට, අනතුරෙන් තුවාල ලැබූ පිරිස පස්දෙනායි. සිංහල - ගැහැනු දෙදෙනායි; දෙමළ - පිරිමි එක්කෙනායි, ගැහැනු එක්කෙනායි; අවුරුදු 5ක කුඩා මුස්ලිම් දරුවෙක්. එතකොට ඒ අනතුරින් වැඩිපුර තුවාල වෙලා තිබෙන්නේ කවුද? මුස්ලිම් ජනතාව නොවෙයි, මුස්ලිම් නොවන දෙමළ සහ සිංහල අය.

දැන් අකුරණ රෝහලේ සිටින වෛද්‍යවරු කවුද? අකුරණ රෝහලේ staff එක කවුද? සිංහල, දෙමළ, මුස්ලිම් වෛද්‍යවරු කවුරුත් එතැන වැඩ කරනවා. මේ අනතුරෙන් වැඩිපුර තුවාල ලැබූ අය පාර clear කරන්න කලින් මහනුවර ජාතික රෝහලට transfer කළා. ඒ අවස්ථාවේදී මම පිට රට හිටියේ. මම පිට රට සිටියදීත් මේ අනතුර ගැන ඇහුවා. එතකොට මහනුවර ජාතික රෝහලේ ඉන්නේ කවුද? අපි දොස්තරලාගේ සිංහල, දෙමළ, මුස්ලිම් කියන ජාතිකත්වය බලනවාද? මොන තුච්ඡ දේශපාලනයක්ද මේ? මේ වැදගත් වෛද්‍යවරුන්ට, නිලධාරීන්ට, රියදුරන්ට, පොලීසියේ මහත්වරුන්ට - තමන්ට දේශපාලනය කරන්න වෙන පාරක් හොයා ගන්න.

ඒ නිසා මම ඇත්තටම ඔබතුමිය ඇතුළු ගරු කථානායකතුමාගෙන් ඉල්ලනවා, මේ පාර්ලිමේන්තුවේදීත් අමු ජාතිවාදී කථා කරන්න ඉඩ දෙන්න එපා කියලා. අපි හිතමු කෝ, කවුරු හරි කෙනෙක් ජාතිවාදී කථාවක් කොහේදී හරි කිව්වා කියලා. ඒක මෙතැන loudspeakers දාලා කියන්න ඕනෑද? ඒක social media post එකක් නම් අපට ඒක බේරා ගන්න බැරිද? අපි දැක්කා නේ, එක social media post එකකින් අපේ අනෝජන් කියන ශ්‍රී ලාංකිකයා මරන්න නියම වුණු බව. ඒ නිසා කරුණාකරලා මම ඉල්ලා සිටින්නේ මේකයි. අපි මේවාට පොඩ්ඩක්වත් භය නැහැ. අපි මේ රටේ ජනතාවට කියන්නේ මේ කරුණු පිළිබඳව සොයා බලන්න කියන එකයි. අනාථ වෙච්ච, ඡන්ද නැති වෙලා පව වෙච්ච, හොරකම් කරලා දැන් හොරකම් කරන්න බැරිව අනාථ වෙලා ඉන්න දේශපාළුවෝ ටිකක් ඉන්නවා. ඒ දේශපාළුවෝ අද අවසාන පිදුරු ගහේ - ජාතිවාදයේ - එල්ලිලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම මේ කියන්න යන කාරණයත් ප්‍රවාහනයට සම්බන්ධ නිසා මම විනාඩි දෙකකින් ඒ ගැනත් කියා මගේ කථාව අවසන් කරන්න කැමතියි. විදේශගත ශ්‍රී ලාංකික පුරවැසියන්ට හා පුරවැසි නොවන තැනැත්තන්ට රියදුරු බලපත්‍ර ලබා ගැනීම ගැනත් මම කියන්න කැමැතියි, ඒ සම්බන්ධයෙන් යම්කිසි සාකච්ඡාවක් මේ වනකොට ඇති වෙමින් තිබෙන නිසා. මම ඉතාම කෙටියෙන් ඒ ගැන කියන්නම්. විදේශයක සිට ශ්‍රී ලාංකික පුරවැසියන්ට හා පුරවැසි නොවන තැනැත්තන්ට රියදුරු බලපත්‍ර ලබා ගැනීම සම්බන්ධයෙන් අදාළ වන නීතිමය ප්‍රතිපාදන ඇතුළත් ලේඛනය ඔබතුමියගේ අවසර ඇතිව මම **සභාගත*** කරනවා.

** පුස්තකාලයේ තබා ඇත.*

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

දෙවැනි කාරණය මේකයි. ලංකාවේ පුරවැසියෙක් විදේශගත වෙලා ඒ රටේ driving licence එක ගන්නකොට ලංකාවේ driving licence එක එතැනට භාර දීලා තිබෙනවා නම්, ඒ අයට ඒ ලේඛන ඉදිරිපත් කරලා සාමාන්‍ය ශ්‍රී ලාංකික පුරවැසියෙකුට වාගේ මෙහේ driving licence එකක් ගන්න පුළුවන්. ඒ වාගේම කවුරු හරි විදේශගත ශ්‍රී ලාංකික පුරවැසියෙකුගේ ශ්‍රී ලාංකික driving licence එක නැති වෙලා නම්, ඒ පුද්ගලයාට සාමාන්‍යයෙන් අපේ driving licence එක නැති වුණාම වාගේ එය නැති වෙච්ච විධියට පැමිණිල්ලක් ඉදිරිපත් කරලා driving licence එක හදා ගන්න පුළුවන්.

ඒ නිසා කෙටියෙන් ගත්තොත්, තමන් ශ්‍රී ලාංකික පුරවැසියෙක් නම්, තමන්ට driving licence එකක් තිබෙනවා නම්, ඒක පින්ලන්තයේ හරි කුවේට්වල හරි කොහේ හරි භාර දීලා - surrender කරල නම් - තිබෙන්නේ ඒ පුද්ගලයාට පුළුවන්, ඒ ලේඛන ඉදිරිපත් කරලා සාමාන්‍ය ශ්‍රී ලාංකිකයෙකුට වාගේ driving licence එකක් අරගෙන වැඩ කර ගන්න. ඒ නිසා මම විශේෂයෙන්ම කියන්න කැමැතියි, අමුතුවෙන් මුදල් ගෙවීමින් ඒ දේවල් කරන්න ඕනෑ නැහැ කියන එක. ශ්‍රී ලාංකික පුරවැසියන්ට තමන්ගේ driving licence එකෙන් නීත්‍යානුකූලව වාහන පදවන්න පුළුවන් කියන කාරණයත් අවසාන වශයෙන් කියමින්, වේලාව ලබා දුන්නාට ඔබතුමියටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නීතිඥ හබීබ් රිෆාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් ලැබෙනවා.

[ප.ව. 4.04]

ගරු නීතිඥ හබීබ් රිෆාන් මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි හපීප් රිපාන්)
(The Hon. Habeeb Rifan, Attorney-at-Law)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் இந்த உயரிய சபையில் முஸ்லிம் சமூகத்தில் பெரும் அதிர்வலையையும் மனவேதனையையும் ஏற்படுத்தி யுள்ள மிகவும் உணர்வுபூர்வமான ஒரு விடயத்தை முன்வைக்க விரும்புகின்றேன்.

ஏறாவூர் ஆதார வைத்தியசாலையில் வைத்திய அத்தியட்சக ராகக் கடமையாற்றுகின்ற வைத்தியர் வருண சம்பத் பண்டார என்பவர், சமூக வலைத்தளமான Facebook ஊடாக, முஸ்லிம் சமூகத்தின் மத மற்றும் கலாசார விழுமியங்களை அவமதிக்கும் வகையிலும், சமூகங்களுக்கிடையே இன, மத நல்லிணக் கத்தைப் பாதிக்கக்கூடிய வகையிலும், பள்ளிவாசல்கள், முஸ்லிம் பெண்களின் மத அடையாளங்கள், ஆடைகள் தொடர்பாக அவமதிக்கும் வகையிலுமான கருத்துக்களை வெளியிட்டுள்ளார். குறித்த வைத்தியர் தன்னுடைய முகநூலில், "நான் இதைத் தினமும் அனுபவிக்கின்றேன். கிராமத்தில் 37 அல்லது அதற்கு நெருக்கமான எண்ணிக்கையில் பள்ளிவாசல்கள் உள்ளன. எல்லோரும் ஒரு நாளைக்கு 5 தடவைகள் கத்துகிறார்கள். பெண்கள் தலைமுடி ஒன்றுகூட வெளியே தெரியாதவாறு மூடியிருக்க வேண்டும். இன்னும் சிலர் தலை முதல் கால் வரை கறுப்பு ஆடையணிந்து இருக்கிறார்கள். இது என்ன மதம்? என்ன சுதந்திரம்? என்று சிந்தித்துப் பார்க்க முடியவில்லை" என்று முஸ்லிம் சமூகத்தைத் தாக்கும் விதமாக மிக மோசமான பதிவொன்றை இட்டுள்ளார். குறித்த பதிவின் ஊடாக ஒட்டுமொத்த ஏறாவூர் மக்களின் மத உணர்வு நசுக்கப்பட்டுள்ளது. இது இலங்கை வாழ் முஸ்லிம் சமூகத்தின் மத்தியில் பெரும் குழப்பத்தை ஏற்படுத்தியுள்ளது. மேலும், ஒரு சமூகத்தின் புனிதமான வழிபாட்டு நடைமுறை, பெண்களின் மத அடையாளம், அவர்கள் பின்பற்றும் ஆடைப் பழக்கவழக்கங்கள் இழிவுபடுத்தப்பட்டுள்ளன.

எமது இலங்கை நாட்டின் அரசியலமைப்பின் உறுப்புரை களான 10, 12 (2), 14 (1) (உ) என்பன ஒருவர் தான் விரும்பிய மதத்தை அல்லது நம்பிக்கையைக் கொண்டிருப்பதையும், வழிபடுதலையும் அனுசரித்தலையும், போதித்தலையும் விரும்பிய கலாசாரத்தைப் பின்பற்றுதலையும் உறுதிப்படுத்தியுள்ளதுடன், அடிப்படை உரிமைகளாகவும் தந்துள்ளன. இதன் அடிப்படையில்தான் இலங்கையில் வாழ்கின்ற முஸ்லிம்கள் அனைவரும் தங்களது மத சுதந்திரத்தை அனுபவிக்கிறார்கள். இவ்வாறு இருக்கையில், மேற்படி கருத்தை வெறுமனே சமூக வலைத்தள கருத்தாகக் கருத முடியாது. இது குறித்த அரச அதிகாரியால் திட்டமிட்டுச் செய்யப்பட்ட ஒரு குற்றமாகும். இதற்கு எதிராக உரிய சட்ட நடவடிக்கைகள் எடுக்கப்பட வேண்டுமென இலங்கை வாழ் முஸ்லிம் சமூகம் சார்பாக இந்தச் சபையில் கேட்டுக் கொள்கின்றேன். குறித்த விடயமானது, தண்டனைச் சட்டக் கோவையின் பிரிவு 191A, 192Bஇன் பிரகாரமும், 2007ஆம் ஆண்டின் 56ஆம் இலக்க, சிவில் மற்றும் அரசியல் உரிமைகள் தொடர்பான சர்வதேச உடன்படிக்கை சட்டத்தின் பிரிவு 3(1) இன் பிரகாரமும், 2024ஆம் ஆண்டின் 9ஆம் இலக்க, நிகழ்நிலைக் காப்புச் சட்டத்தின் - Online Safety Act - பிரிவு 16இன் பிரகாரமும் தண்டனைக்குரிய குற்றமாகும். எனவே, இது தொடர்பாக கௌரவ சுகாதார அமைச்சர் அவர்கள் உடனடியாக நடவடிக்கை எடுக்க வேண்டுமென இந்த உயரிய சபையில் வேண்டிக்கொள்கின்றேன்.

இந்த நாட்டில் இன, மத வேறுபாடின்றி அனைத்து மக்களும் சமமாக நடத்தப்பட வேண்டுமென மாண்புமிகு சனாதிபதி அவர்களும் அமைச்சர்களும் கூறி வருகின்றார்கள். தற்போது இந்தச் சபையில் பேசிய சபை முதல்வர் அவர்களும் இதனைத் தெரிவித்தார். ஆனால், நடைமுறையில் அனைவரினதும் உரிமைகள் சமமாக பாதுகாக்கப் படுகின்றதா? என்ற கேள்வி முஸ்லிம் சமூகத்தின் மத்தியில் எழுந்துள்ளது. உதாரணத்துக்கு, கல்முனை வடக்கு ஆதார வைத்தியசாலையில் சுகுணன் என்ற வைத்தியர் முஸ்லிம் பெண் சுகாதார ஊழியர்கள் தங்களது கலாசார ஆடையை அணிந்து பணியாற்றுவதைத் தடுத்தார். இதுவரை அதற்கு திருப்திகரமான எந்தவொரு தீர்வும் எட்டப்படவில்லை. ஆனால், நீதிமன்றத்தால் குற்றவாளியென தீர்ப்பளிக்கப்பட்டு, சிறைத்தண்டனை விதிக்கப்பட்டு சிறைச்சாலையில் இருக்கின்ற பௌத்த மதகுருவான ஞானசார தேரரின் உடை சம்பந்தமாக உடனடியாகவே தீர்மானத்தை எடுப்பதற்கு அரசு கரிசனை காட்டிக்கொண்டு இருக்கின்றது. இந்த அரசாங்கம் முஸ்லிம்களை ஒரு பார்வையிலும், ஏனைய மதத்தினரை இன்னொரு பார்வையிலும் பார்ப்பதை நாங்கள் கண்கூடாகக் காண்கின்றோம்.

கல்முனை வைத்தியசாலை விவகாரம் தொடர்பில் இலங்கை மனித உரிமைகள் ஆணைக்குழுவால் வழங்கப்பட்ட அறிவுறுத்தல்கள் இன்னும் நடைமுறைப்படுத்தப்படவில்லை. குறித்த பிரச்சினைக்கு இன்னும் தீர்வு கிடைக்கவில்லை. மேலும், பாராளுமன்றத்தில் அங்கம்வகிக்கின்ற எங்களது கட்சி உட்பட ஆறு தமிழ் பேசும் கட்சிகளின் தலைவர்களும் இணைந்து சுகாதார அமைச்சருக்குக் கடிதமொன்றையும் அனுப்பியுள்ளனர்.

[ගරු නීතිඥ හබීබ් රිෆාන් මහතා]

இன்று இந்தச் சபையில் கௌரவ இம்ரான் மஹ்ரூப் அவர்கள் இதுபோன்ற இன்னுமொரு சம்பவம் பற்றி பேசியிருந்தார். அதாவது, அண்மையில் அக்குறணையில் நடந்த விபத்தின்போது, வைத்தியர் துஷார குலதுங்க என்பவர், "அக்குறணை என்றால் முஸ்லிம்கள்தானே! செத்துப் போனாலும் பரவாயில்லை!" என்று கூறியிருந்தார். இந்த நாட்டில் முஸ்லிம்களுக்கு தமது கலாசார ஆடை அணிவது தொடர்பில் தொடர்ச்சியாக பிரச்சினை இருந்து வருகின்றது. கடந்த காலத்தில் இவ்வாறானதொரு சம்பவம் திருகோண மலையிலுள்ள ஸ்ரீ சண்முகா இந்துக் கல்லூரியில் நடைபெற்றது. அதேபோன்று, அம்பாறை, மட்டக்களப்பு மாவட்டங்களிலுள்ள வங்கிகளிலும் நடைபெற்றது. எனவே, இவற்றுக்குரிய தீர்வை இந்த அரசாங்கம் உடனடியாகப் பெற்றுத்தர வேண்டும்.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

ගරු නීතිඥ හබීබ් රිෆාන් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹபீப் றிபான்)
(The Hon. Habeeb Rifan, Attorney-at-Law)
මට තව විනාඩියක් ලබා දෙන්න.

இன்னுமொரு விடயத்தைக் கூறி எனது உரையை முடிக்கிறேன். முஸ்லிம் சமூகத்தைத் திட்டமிட்டு பழிவாங்கும் நோக்கத்தோடு குழுவொன்று செயற்படுகின்றதா என்ற சந்தேகம் எழுந்துள்ளது. அண்மையில் இளைஞர் ஒருவர் முஸ்லிம் பெயரைப் பயன்படுத்தி, தலதா மாளிகை உட்பட பௌத்த புனித தலங்களை தாக்குவோமென முகநூலில் பதிவொன்றை இட்டிருந்தார். கடந்த கால அரசாங்கம் போன்று இந்த அரசாங்கமும் செயற்படுகின்றதா என்ற கேள்வி எங்களுக்கு எழுகின்றது. எனவே, முஸ்லிம்களாகிய எங்களது உரிமைகளையும் எங்களது முஸ்லிம் பெண்களின் ஆடை தொடர்பான உரிமைகளையும் உரிய முறையில் பேணிப் பாதுகாக்குமாறு அரசாங்கத்தைக் கேட்டு, விடை பெறுகின்றேன். நன்றி.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ලාල් ප්‍රේමනාත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.11]

ගරු ලාල් ප්‍රේමනාත් මහතා
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම ස්තුතිවන්ත වෙනවා මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන්. ජලභීතිකා රෝගය තුරන් කිරීමේ සහ සුනඛයන් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කරන මේ වෙලාවේ මම නිකමට බැලුවා, විපක්ෂයේ හැසිරීම ගැන. මෙවැනි වැදගත් පනත් කෙටුම්පතක් ගැන කථා කරන වෙලාවේ ඒ සඳහා අවශ්‍ය කරුණු ඉදිරිපත් කරමින්, එය පෝෂණය කරමින් අභිංසක සතුන් සහ ජනතාව ආරක්ෂා කරගැනීම සඳහා අපි ගන්නා වූ මේ ප්‍රයත්නයට අවශ්‍ය ප්‍රමාණයෙන් සහ අවශ්‍ය ගුණයෙන් සහාය ලබා නොදෙන නිසා මම නිකමට Google ගිහිල්ලා බැලුවා, "ආණ්ඩු භීතිකාව" කියන්නේ මොකක්ද කියලා. ජලභීතිකාව කියනකොට මට මතක් වුණේ ඒක. Google එකේ සඳහන් වෙනවා, - "Government phobia" කියලායි තිබෙන්නේ - "Government phobia" යනු රාජ්‍ය ආයතන හෝ රජයේ නීතිමය පාලනය සහ නියාමනය කෙරෙහි දැඩි බියක්, සැකයක් හෝ අසාමාන්‍ය විරෝධයක් දැක්වීමේ මනෝභාවය හෝ දේශපාලන මතවාදයයි කියලා. ඒක තව විග්‍රහ කර තිබෙනවා, "මෙය සරල දේශපාලන විවේචනයකට වඩා ඔබ්බට ගිය රජයේ ඕනෑම මැදිහත්වීමක් පුද්ගල නිදහසට හෝ අයිතිවාසිකම්වලට තර්ජනයක් ලෙස දකින තත්ත්වයකි" කියලා.

මේ phobia එකේ ප්‍රධාන ලක්ෂණ කිහිපයක් සඳහන් කරලා තිබෙනවා. ඒ තමයි, අධික ලෙස රජය සැක කිරීම, රජය විසින් ක්‍රියාත්මක කරන ඕනෑම ප්‍රතිපත්තියක්, බදු ක්‍රමයක් හෝ නීතිමය නියාමනයක් ජනතාව පාලනය කිරීමට හෝ පීඩාවට පත් කිරීමට ගත් උත්සාහයක් ලෙස අර්ථකථනය දැක්වීම, රාජ්‍ය අංශයේ කාර්යභාරය ප්‍රතික්ෂේප කිරීම, සෞඛ්‍ය, අධ්‍යාපනය, ප්‍රවාහනය හෝ ආර්ථික කටයුතු සඳහා රජය සෘජුව සම්බන්ධ වීම අනවශ්‍ය මැදිහත්වීමක් ලෙස දැකීම, සියල්ල සම්පූර්ණයෙන්ම තමන්ගේ වුවමනාවට හැසිරෙන්න ඕනෑ කියලා හිතෙන, නිදහස් වෙළෙඳපොළක් ගැන හිතන, ඒකට පැවරිය යුතු යැයි කියලා තදින් විශ්වාස කිරීම. තවත් ලක්ෂණයක් තිබෙනවා, ego කියලා. පුද්ගල ස්වෛරීභාවය මුල්තැන තැබීම, රජයේ නීති සහ පාලන තන්ත්‍රය තමාගේ පෞද්ගලික නිදහසට බාධාවක් ලෙස සලකා ඇතැම් අවස්ථාවලදී නීතිවලට අවනතවීමට ඇති අකැමැත්ත ප්‍රකාශ කිරීම යනුවෙන් ලක්ෂණ කිහිපයක් හඳුන්වා තිබෙනවා. ජලභීතිකා රෝගය මේ රටෙන් තුරන් කිරීම සඳහා රජය විසින් ගෙන එනු ලබන මේ උත්සාහය පැත්තකට දමලා, - ජලභීතිකාව සුව කිරීම පිළිබඳ වුවමනාව පැත්තකට දමලා - විපක්ෂය අද මේ විධියට හැසිරෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දින මේ ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පත පිළිබඳව මේ වෙනකොට කථා කරපු විපක්ෂයේ යම් මන්ත්‍රීවරු ප්‍රමාණයක් - වෙනත් කතන්දර කියමින් සිටි විපක්ෂයේ අය වුණත් - වාගේම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු ද මෙය සිදු කළ යුතුයි කියන ස්ථාවරයේ ඉන්නවා. ඒකට හේතුව මෙයයි. අපි කවුරුත් පිළිගන්නවා, ඉතාම පැරණි නීතිවලට අනුව තමයි මේ කටයුත්ත සිදුවෙමින් තිබෙන්නේ කියන එක. ඒ නිසා මේක වෙනස් කරන්න ඕනෑ කියන මතයේ අපි කවුරුත් ඉන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ජලභීතිකාව කියන්නේ, සියයට සියයක්ම මාරාන්තික රෝගයක්. වැලඳුණොත් හොඳ කරන්න බැහැ කියලා අපි කවුරුත් දන්නවා. ඒ වගේම මෙය සියයට සියයක්ම පිටුදකින්න පුළුවන්, වළක්වන්න පුළුවන් රෝගයක්. ඒ නිසා අපි ආණ්ඩුවක් හැටියට, රටේ පුරවැසියන් හැටියට ලොකු වුවමනාවකින් මේ දේ කරන්න ඕනෑ. ලෝකයේ මේක ජයගත්ත රටවල් තිබෙනවා. දූපත් රාජ්‍යයන් විශාල ප්‍රමාණයක් මේක ජය අරගෙන තිබෙනවා. දූපත් නොවුණ රාජ්‍යයක් පවා තමන්ගේ රට තුළ ජලභීතිකාව සම්පූර්ණයෙන් තුරන් කරලා තිබෙනවා. භූතානය වාගේ රටවල් එහෙම කරලා තිබෙනවා. පසුගිය කාලයේ අපට ජලභීතිකා මරණ වාර්තා වුණා. 2022දී මරණ 18ක්, 2023දී මරණ 16ක්, 2024දී මරණ 20ක්, 2025දී මරණ 14ක් වශයෙන් අවාසනාවන්ත ලෙස අපේ රටේ මිනිස් ජීවිත ප්‍රමාණයක් විනාශ වෙලා තිබෙනවා. ඒ මරණයන් ඉතාම අවාසනාවන්තයි. අවසන් මොහොත දක්වා පියවි සිහියෙන් ඉඳලා ඉතාම වේදනාකාරී මරණයක් හිමි වෙන රෝගයක්, ඒක. ඒ නිසා මෙවැනි වැදගත් පනතක් කෙසේ හෝ සාර්ථක කර ගැනීම සඳහා අපි වුවමනාවෙන් දැඩි ප්‍රයත්නයක යෙදෙන්න ඕනෑ කියලායි මා විශ්වාස කරන්නේ.

මේ තත්ත්වයට පත් වෙච්ච අයකුගේ පවුලේ අය ඉතාම අසරණභාවයට පත් වෙනවා. තමන්ගේ ඥාතියා අහිමි වෙනවා විතරක් නොවෙයි, ඒ එක්කම සමාජය තුළින් ඔවුන්ට ලැබෙන පිටුදැකීම දීර්ඝ කාලයක් විඳින්න සිද්ධ වෙලා තිබෙනවා. අපි දන්නවා, මෙතෙක් කල් ක්‍රියාත්මක වුණේ 1893 අංක 7 දරන ජලභීතිකා රෝගය පිළිබඳ ආඥා පනත සහ 1901 අංක 25 දරන සුනඛයන් ලියාපදිංචි කිරීමේ ආඥා පනත බව. වික්ටෝරියා රැජිනගේ කාලයේ වාගේ ඉඳලා ආපු, අවුරුදු 120කට වඩා පැරණි නීති රීතිවලින් අද මේ දියුණු සෞඛ්‍ය සේවයක් තිබෙන, මහජන සෞඛ්‍ය පිළිබඳව වැඩි අධ්‍යයනයක් තිබෙන ලෝකයක අපට ගමන් කරන්න බැහැ. ඒ නිසා අපේ වගකීමක් වෙනවා, මේවා යථා පරිදි කාලයට අනුව වෙනස් කිරීම.

මේ පැරණි පනත් දෙක ඒකාබද්ධ කරමින්, 2012දී ගත්ත ප්‍රතිපත්තිමය තීරණද පදනම් කරගනිමින්, සෞඛ්‍යය, කෘෂිකර්මය සහ පළාත් පාලන යන අමාත්‍යාංශ එකාබද්ධව මේ අභියෝගය ජයගන්න පුළුවන් විධියේ ප්‍රගතිශීලි පනතක් තමයි අපි මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේ පනත් කෙටුම්පතේ තිබෙන විශේෂත්වය තමයි ජලභීතිකාව පාලනය කිරීම. රෝහලට එන රෝගීන්ට ප්‍රතිකාර කිරීම විතරක් නොවෙයි, එහි සත්ව මූලාශ්‍ර ඇතුළු සියල්ල නිසි කළමනාකරණයකට යටත් කිරීමත් මේ පනත මඟින් සිදු වෙනවා. මේ පනත මඟින් සියලුම හිමිකම් සහිත සුනඛයන් ලියාපදිංචි කිරීමට, ඔවුන් අනන්‍ය ලෙස හඳුනා ගැනීමට ක්‍රමවේදයක් මින් පසු ස්ථාපිත කරගන්නට අපට පුළුවන්කම ලැබෙනවා. ඒ වාගේම සුනඛ ලියාපදිංචිය, ජලභීතිකා එන්නත්කරණය අතර අනිවාර්ය සම්බන්ධතාවක් මේ තුළින් ගොඩ නැඟෙනවා. ඒ වාගේම වගකීම් සහිත සුනඛ හිමිකාරිත්වයක් ඇති කරන අතරම, සතුන් මහ මහ අතහැර දැමීම වැළැක්වීම සඳහාත් නීතිමය පදනමක් ඇති වෙනවා. අපි දන්නවා, මේ වීදි සුනඛයන් කියන්නේ අහසින් කඩා පාත්වෙච්ච සතුන් නොවෙයි කියලා. යම් කිසි අයෙක් - පුරවැසියෙක් - පාරට ගෙනැත් දාපු සතුන් තමයි බොහෝ වෙලාවට මාර්ගවල ඉන්නේ. දැවැන්ත රිය අනතුරු සිදුකරමින්, මරණ සිදුකරමින් පාරේ සැරිසරන; වීදි සතුන් ආවේ එහෙමයි.

ඒ වාගේම අයාලේ යන සුනඛයන් පාලනය කිරීමේදී එය මානුෂික වෙන්නත් ඕනෑ; විද්‍යාත්මක වෙන්නත් ඕනෑ. එවැනි සංවේදී ක්‍රමවේදයක් හඳුන්වා දෙන්න ඕනෑ. ඉතිහාසයේ අපි දැක්කා, මෙවැනි රෝගී සතෙක් දැක්කාම පොල්ලක් අරගෙන එළවාගෙන ගිහිල්ලා මරලා දමන ආකාරය. නූතන සමාජයට ගැළපෙන්නේ නැති මරණයක් තමයි ඔවුන්ට හිමි කරලා දුන්නේ. ඒවායින් මිදීම සඳහා වන කටයුතු ටිකක් අපි මේකෙන් ඇති කරන්න කල්පනා කරලා තිබෙනවා. ඒ වාගේම සුනඛ ලියාපදිංචි දත්ත පද්ධතියක් මධ්‍යම රජය, පළාත් පාලන ආයතන, සෞඛ්‍ය සහ පශු වෛද්‍ය අංශ අතර ස්ථාපිත කිරීමත් මෙයින් සිදු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)\
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු ලාල් ප්‍රේමනාත් මහතා
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)
මම අවසන් කරනවා.

මේ සියල්ල ගැන සලකා බැලීමේදී මෙය ඉතාම ඓතිහාසික පනතක් බවට පත් වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මේ රට තුදුරු අනාගතයේදී ලෝකයේ බොහෝ රටවල් අත්පත් කරගත්ත ජයග්‍රහණයක් වන ජලභීතිකාව සම්පූර්ණයෙන්ම තුරන් කරපු රාජ්‍යයක් බවට පත් කිරීම අපේ අභිලාෂය වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.20]

ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා (විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) கிரிஷாந்த அபேசேன - விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சர்)
(The Hon. (Prof.) Chrishantha Abeysena - Minister of Science and Technology)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දින විවාද කරන ජලභීතිකා රෝගය තුරන් කිරීමේ සහ සුනඛයන් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත පිළිබඳ කථා කරන්න පෙර මම යම් කරුණක් සඳහන් කරන්න කැමතියි. අපේ ආණ්ඩුව කිසිම ජාතියකට, ආගමකට අකටයුතුකම් කරන ආණ්ඩුවක් නොවෙයි. හැම ජාතියකම අන්තවාදීන් ඉන්න පුළුවන්. හැබැයි, ඒක උලුප්පලා අරගෙන, මේ රටේ ජාතිවාදය පතුරුවනවා නම් ඒක එච්චර හොඳ දෙයක් නොවෙයි; ඒක හොඳ දේශපාලනයක් නොවෙයි. අද මේ පාර්ලිමේන්තු ගැලරියේ පාසල් දරුවන් ගොඩක් හිටියා. ඇතැම් මන්ත්‍රීවරුන් මෙහිදී කරපු ප්‍රකාශවලින් වෙන්නේ ජාතිවාදය, ආගම්වාදය පැතිරවීම විතරයි. ප්‍රශ්න තිබෙනවා නම් ඒවා විසඳාගන්න පුළුවන්.

සිංහල අය ආණ්ඩුවට කියනවා 'සිංහලයින්ට සලකන්නේ නැහැ' කියලා; දෙමළ අය කියනවා 'දෙමළ අයට සලකන්නේ නැහැ' කියලා; මුස්ලිම් අය කියනවා 'මුස්ලිම් අයට සලකන්නේ නැහැ' කියලා. හැමෝටම එක විධියට සලකන මේ වාගේ ආණ්ඩුවක් මීට ඉස්සෙල්ලා ඇවිල්ලා තිබෙනවාද? අපි හැමෝටම එක විධියට සලකනවා. නමුත්, තවත් කාලයක් යනවා සංහිඳියාව ඇති වෙන්න. මොකද, කාලයක් තිස්සේ අප ළඟ තිබුණු වැරැදි වැටහීම් ටික ටික තමයි නැති වෙන්නේ. මම ඒ බව විශේෂයෙන් මතක් කරනවා. අපේ ආණ්ඩුව ජාතිවාදය වපුරන ආණ්ඩුවක් නොවෙයි. අප හදන රටත් ජාතිවාදීන්ගේ, ආගම්වාදීන්ගේ, කිසිම ආගමක, කිසිම ජාතියක අන්තවාදීන්ගේ අවශ්‍යතා ඉටු කරන රටක් නොවෙයි.

අප අද කථා කරන ජලභීතිකා රෝගය තුරන් කිරීමේ සහ සුනඛයන් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත ගත්තොත්, අපි දන්නවා ජලභීතිකා රෝගය පාලනයට සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ වෙනම ආයතනයක් තිබෙන බව. ඒ වාගේම අපි දන්නවා, ඩෙංගු පාලනයට වෙනම ආයතනයක් තිබෙන බව. මැලේරියාව, ෆයිලේරියාව, ක්ෂය රෝගය ආදිය සඳහාත් එවැනි ආයතන system එකක් උඩ ඉඳලා පහළ මට්ටම දක්වාම තිබෙනවා. ජලභීතිකා රෝගය සම්බන්ධවත් එවැන්නක් තිබෙනවා. ඒ system එකෙන් තමයි, අපේ රටේ ජලභීතිකා රෝගය මේ තරම් දුරට හෝ පාලනයකට ඇවිල්ලා තිබෙන්නේ. ඒ නිසා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඒ ඒ අංශවලටත් මම මගේ ප්‍රණාමය පුද කරනවා.

සෞඛ්‍ය අමාත්‍යාංශය කරන්නේ ලෙඩේට බෙහෙත් දීම විතරක් නොවෙයි. එතැනින් එහාට, රෝග වැළැක්වීමත් - prevention - සිදු කරනවා. නමුත්, රෝග වැළැක්වීම medical sector එකේ අයට විතරක් කරන්න බැහැ. ඒකට අනෙකුත් අමාත්‍යාංශවල සහයෝගය, එකඟතාව අවශ්‍යයි. එහෙම තමයි හැම රෝග පාලනයක්ම සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් කළේ. ඒක තවදුරටත් ශක්තිමත් කිරීමක් තමයි, අප මේ පනත් කෙටුම්පත

[ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා]

මහින් ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ වාගේම මම කියන්න ඕනෑ, ජලභීතිකාව වැලඳීම නිසා අවුරුද්දකට අපේ රටේ 20-30 අතර පිරිසක් මැරෙන බව. ඒ හැම මරණයක්ම වළක්වා ගත හැකි මරණ - preventable deaths. ඒවා වයසට ගිහිල්ලා සිද්ධ වන මරණ නොවෙයි. ජලභීතිකා රෝගයෙන් පොඩි ළමයි බොහෝ පිරිසක් මැරිලා තිබෙනවා; කාන්තාවෝ මැරිලා තිබෙනවා; හැම ජාතියකම අය මැරිලා තිබෙනවා. ඒ මරණවලට වග කිව යුත්තේ කවුද? මා අහන්නේ ඒකයි.

සතෙකු මැරුණොත් සමහර අය දැන් picket කරනවා; සමහර අය අමාත්‍යාංශය ඉස්සරහා බෝඩ් අල්ලා ගෙන ඉන්නවා. ඒක හොඳයි. මොකද, සතුනුත් ජීවත් වෙන්න ඕනෑ. හැම සතෙක්ම ජීවත් වෙන්න ඕනෑ. හැබැයි, මනුෂ්‍යයන්ට මොකද වෙන්නේ? වෙනදා සතෙකු මැරුණා කියලා picket කරනවා අපි කවදාවත් දැකලා නැහැ. මේවාත් දේශපාලනීකරණය කරලායි තිබෙන්නේ. සතාගෙනුත් දේශපාලනය කරන්නයි යන්නේ. මොකද, සමහර අයට එල්ලෙන්න තැනක් නැහැ. සතෙකු මැරුණත් ඒක වෙනත් විධියකට අර්ථ දක්වනවා. අපේ රටේ තිබෙනවා, උපසංස්කෘති. සමහර අය කියන්න පුළුවන්, "සතාත් එකයි, මිනිහාත් එකයි" කියලා. තවත් උපසංස්කෘතියක කියනවා, "මිනිහා තමයි උසස්, සතුනුත් ඉන්න ඕනෑ" කියලා. ඒවා උපසංස්කෘති. හැබැයි, ඒ හැමෝම ජීවත් වෙන්න ඕනෑ. අපි ඒ උපසංස්කෘතිවලට ගරු කරනවා. නමුත්, ඒවා මත දේශපාලනය කරනවා නම්, ඒක ඒ තරම් හොඳ දෙයක් නොවෙයි.

අපේ රටේ වන ජීවීන් ඉන්නවා; සුරතල් සතුන් ඉන්නවා. ඒ විධියට සතුන් වර්ග දෙකක් ඉන්නවා. අපි හැමෝටම වගකීමක් තිබෙනවා, ඒ හැම කෙනෙකුටම ජීවත් වීමේ අයිතිය ලබා දෙන්න. සත්ව අයිතිවාසිකම් තිබෙනවා. මානව අයිතිවාසිකම් ද තිබෙනවා. මගේ පෞද්ගලික අදහස නම්, මානව අයිතිවාසිකම් ඉහළින් තිබෙනවා කියන එකයි.

Rabies ගැන කථා කරද්දී කිව යුතු කාරණා කීපයක් තිබෙනවා. බල්ලෙකු හපා කෑවොත් අප සෞඛ්‍ය පැත්තෙන් කරන්නේ, ඒ අයට බෙහෙත් දෙන එක. අපි ඒ අයට vaccines දෙනවා, post-exposure treatments කරනවා. බල්ලෙක් යම් කෙනෙකු සපා කෑවොත් අපි ඒ දේවල් කරනවා. හැබැයි, රෝග ලක්ෂණ ආවොත් අනිවාර්යයෙන්ම ඒ කෙනා මැරෙනවා. එහෙම තමයි වෙන්නේ. ඒ, එක පැත්තක්. අනෙක් පැත්තෙන්, අපට මේ මරණ සංඛ්‍යාව අඩු කරන්න වෙන්නේ බල්ලන්ගේ සපා කෑම අඩු කිරීමෙනුයි. මා හිතන විධියට, අපේ රටේ බල්ලන්ගේ ගහනය ලක්ෂ දෙකක් පමණ වනවා. එහෙම නම්, එය පාලනය කළ යුතුයි. රජය අවුරුද්දකට රුපියල් බිලියන 5ක් පමණ අපේ රටේ ජලභීතිකා රෝගය පාලනය කිරීම සඳහා වියදම් කරනවා. සාමාන්‍යයෙන් ඒක තමයි ප්‍රමාණය. ඒ හැම ශතයක්ම අපට අඩු කර ගන්න පුළුවන්, ජලභීතිකා රෝගය හැදෙන්න හේතු වන සුනඛ ගහනය හරියට පාලනය කළොත්. ඒක තමයි කියන්නේ disease එකක් control කරනවා කියලා. ඒ, තව පැත්තක්.

එන්නත්කරණය ගත්තොත්, මේ වන විට අපේ target එක සුනඛ ගහනයෙන් සියයට 70ක් තමයි. අපි දැනටත් සියයට 60ක target එකකට ගිහින් තිබෙනවා.

ලංකාවේ බල්ලන් සපා කෑමෙන් දවසකට රෝගීන් 1,000ක් විතර රෝහල්වල admit වෙනවා. ඒ අයට බෙහෙත් කරන්න වෙනවා. එතකොට ඒවාට වියදම් යනවා. Hospital එකේ නැවතිලා ඉන්න ඒ අයට සිදු වෙනවා. ඒ වාගේම, බල්ලන් සපා කෑමට ලක් වෙච්ච පුද්ගලයාට ඒක ආර්ථික වශයෙනුත් ප්‍රශ්නයක් වෙනවා. මොකද, ප්‍රතිකාර සඳහා එහාට මෙහාට යන්න වෙනවා. එය මානසිකවත් බලපානවා. ඒ ඔක්කෝම අපහසුතා විඳින්න වෙනවා. මේ හේතු නිසා තමයි බල්ලන්ගේ ප්‍රමාණය - සුනඛ ගහනය - පාලනය කරගත යුත්තේ.

අපි දන්නවා, අපේ රටේ හැම තැනම වාගේ බල්ලන්, පූසන් ඉන්න බව. ඒ, අපේ සුරතල් සතුන් තමයි. නමුත් අපි ඒ සතුන්ට සලකනවාද කියන ප්‍රශ්නය මම අහනවා. මොකද, අපි ඒ සුරතල් සතුන්ට හරියට සැලකුවා නම් මෙවැනි රෝග පාලනය කර ගන්න පුළුවන් වෙනවා. සමහරු සත්ව අයිතිවාසිකම් ගැන කථා කරනවා. සත්ව අයිතිවාසිකම් ගැන කථා කරනවා නම් අපි ඒ සතුන්ට හරියාකාරව සලකන්න ඕනෑ. අපේ ගෙදර බල්ලෙක් ඉන්නවා නම්, ඒ බල්ලා පාරට දමන්න අපට බැහැ. ඒ බල්ලාට මලපහ කරන්න ඕනෑ වුණාම සමහරු ඒ සතුන් පාරට අරගෙන යනවා. ඒ වාගේම, අපේ ගෙවල්වල පූසන් ද ඉන්නවා. හැබැයි, ජලභීතිකාව හැදෙන්නේ සියයට 99ක්ම බල්ලන්ගෙන්. පූසන්ගෙනුත් හැදෙනවා. මේක පූසන්ටත් සම්බන්ධයි. ඒක තමයි අප කියන්නේ, මේකට නියාමනයක් අවශ්‍යයි කියලා. ගෙදර ඉන්න ඒ හැම සතෙක්ම register කරන්න ඕනෑ. ඒ වගකීම තිබෙන්නේ ඒ සතුන් අයිති කෙනාටම තමයි. ගෙදරක බලු පැටවුන් හෝ පූස් පැටවුන් හෝ ඉන්නවා නම් එහි වගකීමත් ඒ ගෙදර අයිතිකරුම ගන්න ඕනෑ. ඒ වගකීම නොගෙන සමහරු ඒ සතුන් පල්ලිවලට ගිහින් දමනවා, පන්සල්වලට ගිහින් දමනවා. ඒවා අකුසල කර්ම. සත්ව අයිතිවාසිකම් අහිමි කිරීමක්, සතුන් එහෙම පාරට දමන එක. ඒ හැමෝම තමන්ගේ සුරතල් සතුන් තමන් විසින්ම ඇති දැඩි කර ගැනීමේ වගකීම භාර ගන්න ඕනෑ. එහෙම නොකරන නිසා මොකක්ද වෙලා තිබෙන්නේ? රෝහලකට යන්න බැහැ. රෝහල්වල ලෙඩුන් පිරිලා. මට ඒ experience එක තිබෙනවා. මම රෝහල්වල වැඩ කරපු කාලයේ නම් සමහර විට ඇඳන් යටත් ලෙඩුවු හිටියා. ඒ ලෙඩුන් මැද්දෙන් පැන පැන යනවා බල්ලන්, පූසන්. එතකොට ඒ වාගේ තැන්වලින් rabies විතරක් නොවෙයි, තව තව ලෙඩ රෝග -infections - ඇති වෙනවා. ඉස්කෝලවලත් හැම තැනකම බල්ලන් ඉන්නවා. ඒ සත්තු පුද්ගලයන් හපා කනවා. මේක සමාජයට කරදරයක් වෙලා. දියුණු රටවල නම් මේ විධියට කිසිම පිළිවෙළක් නැතුව බල්ලන් නිකම් එළියට දමන්නේ නැහැ.

අද සමහරු සත්ව අයිතිවාසිකම් ගැන කථා කරනවා. සමහරු පාරේ ඉන්න සතුන්ටත් කෑම දෙනවා. සතුන්ට කෑම දෙන එක හොඳයි. හැබැයි, එසේ කෑම දීමෙන් ඒ සතුන්ගේ ගහනය තවත් වැඩිවීමක් නේ වෙන්නේ. සත්ව අයිතිවාසිකම් ගැන කථා කරන, ඒ වෙනුවෙන් වැඩ කරන NGOs වලටත් මම හරි කැමැතියි. නමුත් ඒගොල්ලන් කථා කරන එකම විතරක් නොවෙයි කළ යුත්තේ. අයාලේ යන; පාරවල් අයිනේ ඉන්න බල්ලන්, පූසන් වෙනම තැනකට අරගෙන ගිහින් හදා වඩා ගන්න ඕනෑ. මොකද, මේක හරි කරදරයක් වෙලායි තිබෙන්නේ. මේ තත්ත්වය නිසා rabies හැදෙනවා විතරක් නොවෙයි, පරිසරයත් දූෂණය වෙනවා.

අපි දන්නවා, ගෙයක් හදද්දී, වැසිකිළිය සහ ළිඳ අතර පරතරයක් තිබෙන්න ඕනෑ බව. එහෙම නීතියක් තිබෙනවා. නමුත් බල්ලන් හදන අය ඒවා සලකන්නේ නැහැ. පරිසරය අපවිත්‍ර කරනවා. සාමාන්‍යයෙන් ජලභීතිකා රෝගයෙන් වසරකට 20-30 අතර පිරිසක් මිය යන බව මම කලිනුත් කිව්වා. එසේ මිය යාමට හේතුව වන්නේ බල්ලන් ගැන, පූසන් ගැන අපේ ජනතාවට හොඳ අවබෝධයක් නැතිකමයි.

අනවබෝධය නිසා ඒගොල්ලන් වැරදි වැඩ කරනවා. තමන්ගේ ගෙදර ඇති කරන බල්ලා, පූසා පාරට දමනවා. එහෙම නැත්නම් පන්සලට හෝ පල්ලියට ගෙනිහිල්ලා දමනවා. පන්සල්වලට, පල්ලිවලට බල්ලෝ ගෙනිහිල්ලා දැමීම කළ යුතු නැහැ. මොකද, පන්සල සහ පල්ලිය පිරිසිදු තැන් වෙන්න ඕනෑ. යුරෝපීය රටවල් අරගෙන බැලුවොත්, ඒ රටවල්වල rabies නැහැ.

ඒ රටවල පාරවල්වල බල්ලෝ, පූසෝ නැහැ. ඒ රටවල පිළිවෙළක් තිබෙනවා. මේ ලස්සන රට හදන්න නම් අපිත් එතැනට යන්න ඕනෑ. අන්න එතැනට යාම සඳහා තමයි අවුරුදු ගණනකට පස්සේ අපි මේ වාගේ පනත් අලුතෙන් හදුන්වා දීලා මේ කටයුතු කරන්නේ.

ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.31]

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

"පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මක කරගෙන යන අතරේ ඔක්කොම සුනඛයන්ට - බල්ලන්ට - vaccines ගහනවා කියලා අද පනත් කෙටුම්පතක් ගෙනැල්ලා තිබෙනවා. "බල්ලා" කියන්නේ වැරදි වචනයක් නොවෙයි නේද? මට ඒ වචනය පාවිච්චි කරන්න පුළුවන් නේද? ඒ වැඩේ හොඳයි. මම අවුරුදු 10ක් විතර hospitalsවල වැඩ කරලා තිබෙනවා. ඒ නිසා ARV, ARS ගැන මට පැය භාගයක් වුණත් කථා කරන්න පුළුවන්. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, හැබැයි ARV, ARS ගැන මට දැන් කථා කරන්න ඕනෑ නැහැ. මොකද, මම අවුරුදු 10ක් ඒක කරලා තිබෙනවා. අවුරුදු 10ක් theatresවල වැඩ කරලා තිබෙනවා. එහෙම වැඩ කරපු අපිට නේ කියන්නේ, "පිස්සෝ" කියලා. එම නිසා ඒ පිස්සු විධියටම කථා කරන එක හොඳයි කියලා මම හිතුවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ රට ගැන මම ඊයේ කථා කරපු විධියට දෙමළ මිනිස්සු බණිනවා. මේ රට සිංහල බෞද්ධ රටක්ද කියලා අහලා ඒ දෙමළ මිනිස්සු මට බණිනවා. එතකොට මම හිතුවා, ඒ අය මට බණින්නේ මම කථා කරනකොට වැරදීමක් වෙලා වෙන්න ඇති කියලා.

ඊට පස්සේ ඊයේ මම දැක්කා,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

සමහරු Viharamahadevi Park එකට ගිහිල්ලා, උසාවි නියෝගය එතැන හිටපු ගැහැනු ළමයාගේ cleavage එකට දාලා තිබෙනවා. මම දන්න තරමින් සාමාන්‍යයෙන් උසාවි නියෝගය දෙන්නේ අතට. හැබැයි, දාලා තිබෙන්නේ cleavage එකට. මම දන්නේ නැහැ, ඒකට සිංහලෙන් කියන්නේ මොකක්ද කියලා.

දැන් පොලීසියේ සමහර ජෙප්පෝ ඉන්නවා නේ. පොලීසියේ සියයට 99ක්ම ඉන්නේ හොඳ අය. මම මේ කාරණයත් කියන්නම්. මම මෙහේ ඉඳලා උතුරට යනකොට හැමදාම මගේ වාහනය පොලීසියෙන් නවත්වනවා. හැබැයි, වාහනය නැවැත්තුවාම ඒ අය මට කියන්නේ, "ඩොක්ටර්, අපට ඔබතුමාත් එක්ක විනාඩි දෙකක් කථා කරන්න පුළුවන්ද? අපේ ගැනත් කථා කරන්නකෝ පාර්ලිමේන්තුවේදී" කියායි. පොලීසිය ඒ මට්ටමට වැටිලා තිබෙනවා. හැබැයි, මම පොලීසියට අත දික් කරන්නේ නැහැ. පොලීසිය මට නඩුව දාලා තිබෙනවා. නඩුව දාපු පොලීසියේ සමහර අය මට කියලා තිබෙනවා, "මචං, අපි මොකක්ද කරන්නේ? නඩුව දමන්න කියලා මේගොල්ලන් අපට බල කරනවා" කියලා.

හැබැයි, ප්‍රශ්නේ තිබෙන්නේ, vaccine එක ගහගන්න බැරි වුණු සුනඛ ජෙප්පෙක් ඊයේ ගිහිල්ලා, Viharamahadevi Park එකේ හිටපු ගැහැනු ළමයාගේ cleavage එක ඇතුළට උසාවි නියෝගය දාලා තිබෙන එකයි. මම දන්නේ නැහැ, උසාවි නියෝගය ඒ විධියට දෙන්න පුළුවන්ද කියලා. එහෙම කැත වැඩ කරන ජෙප්පෝ ටික මේ පනතෙන් බේරෙනවා කියන එක ගැන මට සතුටුයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මේ පනත ගෙනාපු එක ගැන මම ඇත්තටම සතුටු වෙනවා. ඔක්කෝටම කලින්

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

පුළුවන් නම් මේගොල්ලන් theatre එකට අරගෙන ගිහිල්ලා,- *[බාධා කිරීමක්]* මොකක්ද, ඔබතුමිය කියන්න හදන්නේ?

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ සභාව තුළ සභ්‍යත්වයක් ඇතිව කථා කරන්න.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

කෝ, subject එක? මාර subject එක. සුනඛයෝ - බල්ලෝ - ගැන කථා කරන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඇයි, රිදෙනවාද? සුනඛයෝ - බල්ලෝ - ගැන කථා කරන්නේ. ජෙප්පෝ ටික ගැන කථා කරන්නේ. Subject එක ජෙප්පෝ. Vaccine එක එන්නේ නැද්ද? මම කියන ඒවා අහගෙන ඉන්න බැරි නම් headset එක දමාගෙන සිංදු අහන්න. ඕනෑ නම් නැඟිටලා යන්න. මේකයි වෙලා තිබෙන්නේ. දෙමළ ජාතිකයෙක්, හින්දු ආගම අදහන කෙනෙක් වෙලා මම කියන්නේ, මේගොල්ලන් අහිංසක ස්වාමීන් වහන්සේලාගේ සිවුරුවලට අත දානවා කියන එකයි. මේගොල්ලන්ට ඕනෑ වෙලා තිබුණේ මෝදිත් එක්ක ගිවිසුම් අත්සන් කරලා, මෝදිගේ හින්දු පොරක්ව ගෙනැල්ලා වඩාගෙන පින්තූර ගන්න. හැබැයි, මෙතුමන්ලා ගිහිල්ලා අවුරුදු 2,500ක ඉතිහාසයක් තිබෙන ස්වාමීන් වහන්සේලාගේ සිවුරුවලට අත දමනවා. ඒ ගැන මම දුක් වෙනවා. මම මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා හැමදාම කියන්නේ ප්‍රභාකරන් මගේ දෙයියෝ කියලා. එහෙම කියන්නේ, මම මගේ මිනිස්සු පාවා දෙන්නේ නැහැ කියන එක මේ රටේ සිංහල මිනිස්සු දැනගන්න ඕනෑ නිසායි. හැබැයි, පා ගමනින් ආපු අර ස්වාමීන් වහන්සේලාට එතැන ඉන්න දෙන්න එපා කියලා ඔබතුමන්ලා ගිහිල්ලා උසාවි නියෝගයක් ගන්නවා. මෙතැන ඉන්න බැහැ කියලා උසාවි නියෝගයක් ගන්නවා. ඊට පස්සේ කොතැනට ගිහිල්ලාද මේක ඉවර වෙන්නේ? හැබැයි, සිංහල ජනතාව එක දෙයක් මතක තියා ගන්න ඕනෑ. මේගොල්ලන් හෙට මාව මරන්න පුළුවන්, නැත්නම් සති දෙකකින් මරන්න පුළුවන්, එහෙම නැත්නම් මම පාර්ලිමේන්තුවෙන් ඉවත් වුණාට පස්සේ මරන්න පුළුවන්.

මම කලිනුත් කිව්වා, මේ ගල් අහුරු ප්‍රශ්නය වාගේ වැඩ කරන්න එපා කියලා. මතකයිද? මම සිංහල දන්නේ නැති හින්දා ඒක කියන්න කැමති නැහැ. මේගොල්ලන්ට කියන්න, මේ ගල්

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා]

අඟුරු ප්‍රශ්නය වාගේ වැඩ කරන්න එපා කියලා. මම පාර්ලිමේන්තුවෙන් ඉවත් වුණාට පස්සේ මට නඩුවක් දාලා ඇතුළට දමන්න පුළුවන්. හැබැයි, බෞද්ධාගම follow කරන සිංහල ජනතාවට දවසක මේක තේරෙනවා. බලන්න,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

මේගොල්ලන්ද අපේ රට පුනරුදයක් කරා අරගෙන යන්නේ? මේක වෙලා තිබුණේ පොල්ගහවෙල.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

මම නම දන්නේ නැති පොරක් ඇවිල්ලා කියනවා, විපක්ෂයේ ඉන්න ඔක්කෝම හොරු, විපක්ෂයේ ඉන්න ඔක්කෝම හොරු, විපක්ෂයේ ඉන්න ඔක්කෝම හොරු කියලා. හැබැයි, මේගොල්ලන් ආණ්ඩුව පිහිටුවලා දැන් අවුරුදු දෙකක් වෙනවා. මේගොල්ලන් කරන්නේ මොකක්ද? ගහන්නේ විපක්ෂයට. නිකම් ඉන්න. එක්කෝ, සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමාට බණිනවා. නැත්නම් නාමල් රාජපක්ෂට බණිනවා. එහෙමත් නැත්නම් ඩී.වී. වානකට බණිනවා. මිනිස්සුන්ට ඒ විධියට බැණ-බැණ, බැණ-බැණ රජය කරන්න බැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. පොඩ්ඩක් ඔළුව තිබෙන්න ඕනෑ. මම නම් සතුටු වෙනවා, අද දවසේ මේ පනත විවාදයට ගෙනාවාට. අද පනත ගැන නේ කථා කරන්න කිව්වේ. මේ පනත අද දවසේදී ගෙනාපු එකට මම සතුටු වෙනවා. ඇත්තටම

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

අල්ලලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම මේ සම්බන්ධයෙන් පාඩම් කරලා තිබෙනවා, doctor කෙනෙක් විධියට වැඩ කරලාත් තිබෙනවා. සයිඩ් 12කට නොවෙයි, හැම පැත්තටම ARS ගහන්න ඕනෑ. හැම පැත්තටම ARS ගහන්න ඕනෑ. අර පොඩි මිනිහෙක් ඉන්නේ. පොඩි මිනිහාටත් ගහන්න ඕනෑ. පොඩි මිනිහා කියලා කිව්වාම රිදෙනවාද? නැහැ නේ. මට ලැබී තිබෙන වෙලාවෙන් තවම විනාඩි 5යි තත්පර 7ක් තමයි කථා කරලා තිබෙන්නේ. මම මේ වේලාව බලාගෙන ඉන්නවා. මට ඔබතුමිය විශ්වාස නැති නිසා තමයි මම වේලාව බලාගෙන කථා කරන්නේ. භය වෙන්න එපා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අයුතු ආරෝපිත චෝදනා කරන ආකාරයෙන් කථා කරන්න එපා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
හා, හා, ඕනෑ එකක් කියා ගන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මේ ආකාරයට කටයුතු කළොත් Standing Orders අනුව මට සිද්ධ වෙනවා, ඔබතුමා සභාවෙන් එළියට යවන්න.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඔබතුමියට රිදෙනවා තමයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මට ඔබතුමා එළියට යවන්න සිද්ධ වෙනවා. මේ දවස් ටිකේම ඔබතුමා විනය විරෝධී විධියට තමයි හැසිරුණේ.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මගේ වෙලාවේදී නේ ඔයා කථා කර කර ඉන්නේ. රිදෙනවා තමයි. රිදෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඒ නිසා කරුණාකරලා විනයානුකූලව, ආචාර ධර්මවලට අනුව ඔබතුමාගේ කථාව කරන්න.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මතක තියා ගන්න, මගේ වෙලාවේදී ඔයා මට උපදෙස් දෙන්න එන්න එපා. ඔය පුටුවට ගරුත්වය තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමා මූලාසනයට ගරු කරන්න පුරුදු වෙන්න, කරුණාකරලා මන්ත්‍රීවරයෙකු විධියට.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
සිංහල බෞද්ධයන්ට මේක තමයි පාඩම. මතක තියා ගන්න, මේක තමයි හොඳම පාඩම. මේ වාගේ දේවල්වලින් දෙමළ මිනිස්සු කවදාවත් චූන් වෙන්නේ නැහැ. මේ බල්ලෝ ටිකට vaccine ගැහුවා කියලා අපි කවදාවත් මේකෙන් චූන් වෙන්නේ නැහැ. ඒක මතක තියා ගන්න. මෝදි එක්ක ගිවිසුම් අත්සන් කරලා, මෝදිව බදාගෙන ඉන්නවා.

මිහින්තලාවේ හාමුදුරුවන්ගේ ආරාධනාවකට අනුව තායිලන්තයේ නියෝජ්‍ය අගමැතිතුමිය අපේ රටට ආපු වෙලාවේ ඔබතුමන්ලා කොච්චර ලොකු ජරා වැඩක් කළාද? ඔයගොල්ලන් තායිලන්තයේ Deputy Prime Ministerට කිසිම ආරක්ෂාවක් දීලා නැහැ. ඒ වාගේ, සත පහකටවත් වැඩක් නැති සමහර මිනිස්සු ඉන්නවා. ඒ අය තමන්ගේ නමවත් දන්නේ නැහැ. තමන් දන්නේ නැහැ, තමන්ගේ නම. හැබැයි, ඒ වාගේ අය ඇවිල්ලා එක්කෝ මෙයාට බණිනවා, නැත්නම් අරයාට බණිනවා, නැත්නම් මෙයාට බණිනවා, එහෙම නැත්නම් සජිත් ප්‍රේමදාසට බණිනවා, නැත්නම් අපිට උපදෙස් දෙන්න එනවා. අපි මේ ARV, ARS ගැන අවුරුදු 15ක්, 20ක් කථා කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි ඉතිරිව තිබෙන්නේ.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
දැන් මම විනාඩි 6යි තත්පර 39යි කථා කරලා තිබෙන්නේ. මට තව විනාඩියකුත් තත්පර 20ක කාලයක් තිබෙනවා. කැත වැඩ කරන්න එපා. මම වේලාව බලාගෙනයි ඉන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි ඉතිරිව තිබෙන්නේ. ඊට පස්සේ කථාව අවසන් කරන්න.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම කථා කරන්න පටන් අරගෙන තවම විනාඩි 6යි තත්පර 49යි ගත වෙලා තිබෙන්නේ. එච්චර බොරු කියනවාද? ජෙප්පොන්ට බොරු කියන එක අමුතු දෙයක් නොවෙයි නේ. ජෙප්පොන්ට බොරු කියන එක අමුතු දෙයක් නොවෙයි. මම වේලාව බලාගෙනයි කථා කරන්නේ. ඔන්න, දැන් තමයි හරියටම විනාඩි 7ක් වෙලා තිබෙන්නේ. හැබැයි, දැන් ජෙප්පොන්ට මොකක්ද වෙලා තිබෙන්නේ? ජෙප්පොන්ට වෙලා තිබෙන්නේ දැන් මේක අහගෙන ඉන්න බැරිකමයි. මෙතැන ඉඳන් නොවෙයි, අතැන ඉඳගෙනවත් අහගෙන ඉන්න බැහැ. ඒ තරමට රිදෙනවා.

හැබැයි, මම ආයෙමත් මේ පනත ගැන කියන්නම්. මම මේ පනත පිළිබඳව විවාද කිරීම ගැන සතුටු වෙනවා. මුලින්ම

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ගහන්න ඕනෑ ARS එක. ඔබතුමිය දන්නේ නැහැ නේ, ARS කියන්නේ මොකක්ද කියලා. අපි දන්නවා. අපි මේකෙන් තමයි ඉපදුණේ; මේ මෙඩිසින් එකෙන්; අපි අවුරුදු 15ක්, 20ක් doctor වෙලා ඉඳලා තමයි මේකෙන් එළියට ආවේ.

හැබැයි, මේකත් මතක තියා ගන්න. ඔය නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා නේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

කියලා. මම මේකත් කියන්නද? දැන් කාගෙන් හරි මේ නියෝජ්‍ය ඇමතිතුමාගේ නම අහලා කියන්නකෝ දන්නවාද බලන්න. හැබැයි මතක තියා ගන්න, ඔයාලාට තිබෙන්නේ තව පොඩි කාලයයි කියන එක. තව පොඩි කාලයයි තිබෙන්නේ. ඒ නිසා ඉවසීමෙන් ඉන්න. ඔය පුටුවට ආයෙත් කවදාවත් එන්න වෙන්නේ නැහැ. තව පොඩි කාලයයි ඕක කරන්න වෙන්නේ. හැබැයි මතක තියා ගන්න, සිංහල ජනතාවට මේක වදිනවා කියන එක. අන්න ඒක මතක තියා ගන්න. හැබැයි, දෙමළ ජාතිකයෙක් වාගේම හින්දු භක්තිකයෙක් වෙලාත් මම කියනවා, ඔබතුමන්ලා මේ ගලවන්නේ සිවුරු නොවෙයි, සිංහල ජනතාවගේ ආගමයි කියන එක. ඒක මතක තියා ගන්න. ඔබතුමන්ලාට ඇහැරෙනකොට අපිත් ඉන්නවා නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
සමහර වෙලාවට අපිවත් මරලා දාන්න පුළුවන්. අපිත් බලාගෙන ඉන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.39]

ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා
(மாண்புமிகு (வைத்தியர்) ஜகத் குணவர்தன)
(The Hon. (Dr.) Jagath Gunawardana)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ජලභීතිකා රෝගය තුරන් කිරීමේ සහ සුනඛයන් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත විවාදයට ගන්නා අද දිනයේදී ඒ සම්බන්ධයෙන් කථා කරන්නට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. මෙය ඉතා වැදගත් පනත් කෙටුම්පතක් ලෙස මම දකිනවා. නමුත්, විපක්ෂය මේ සඳහා අඩු තරමින් සාධනීය විවේචනයක්වත් ඉදිරිපත් කළේ නැහැ. ඔවුන් පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවා වෙලා ඉතා වැරදි ප්‍රචාර සිදු කරමින්, ඒ වාගේම ඉතාම ජාතිවාදී ප්‍රකාශ සිදු කරමින් මේ විවාදය කඩාකප්පල් කරන්න තැත් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දවසේ අපි විවාදයට භාජන කර තිබෙන්නේ ඉතා වැදගත්, කාලීන මාතෘකාවක්. මේ ගැන අපට කථා කරන්න සිද්ධ වෙන්නේ මේ රටේ සුනඛ ගහනය වැඩිවන නිසායි. ඒක, සමාජයීය ප්‍රශ්නයක්, පාරිසරික ප්‍රශ්නයක්, සෞඛ්‍යමය ප්‍රශ්නයක්, ආර්ථිකයට සම්බන්ධ ප්‍රශ්නයක්. අපි මේ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරලා මේ තත්ත්වය පාලනය කරන්න ඕනෑ. සුනඛ ගහනය වැඩිවීම තුළින් ඇති වන ප්‍රශ්නවලට අපි විසඳුම් සොයන්න ඕනෑ. සුනඛ ගහනය වැඩිවීම නිසා සංචාරක ව්‍යාපාරයටත් විශාල ප්‍රශ්නයක් මතුවෙලා තිබෙනවා. ඒ වාගේම පරිසරය අපවිත්‍ර වීමත් විශාල වශයෙන් සිද්ධ වෙලා තිබෙනවා. මේ නිසා ආර්ථිකයෙන් විශාල පංගුවක් ජලභීතිකා රෝගය මර්දනය කිරීම සඳහා වැය කරන්න අපට සිද්ධ වෙලා තිබෙනවා.

අපි බලාපොරොත්තු වනවා, 2030 වර්ෂය වනකොට ජලභීතිකා රෝගය මේ රටෙන් තුරන් කිරීමට. ඒ සඳහා අපි ඉතා ඵලදායී වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරන්න ඕනෑ. මේ පනත බලාත්මක කිරීම තුළින් ඒ දෙය සිද්ධ වෙයි කියලා අපි බලාපොරොත්තු වනවා. ලෝකයේ වසරකට 59,000කට වැඩි පිරිසක් ජලභීතිකා රෝගයෙන් මරණයට පත් වනවා. හැම විනාඩි 9කටම ලෝකයේ එක් පුද්ගලයෙක් මරණයට පත්වනවා, ජලභීතිකා රෝගය නිසා. එහිදී වැඩිපුරම මරණයට පත්වන්නේ ළමයින්. මිනිස්සුන්ට ජලභීතිකා රෝගය සියයට 99ක්ම වැලදෙන්නේ සුනඛයන් මාර්ගයෙන්. ඒ වාගේම ක්ෂීරපායින් සතුන් නිසාත් මේ රෝගී තත්ත්වය ඇතිවන්න පුළුවන්. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රමුඛතම කාර්යය තමයි, ජලභීතිකා රෝගය පාලනය කිරීම.

[ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා]

අපි දැනට මේ රටේ ජලභීතිකා රෝගයෙන් මරණයට පත් වන ප්‍රමාණය පහළ මට්ටමකට ගෙනැල්ලා තිබෙනවා. 1970දී සහ 1980දී වසරකට මිනිස්සු 300ක් පමණ ජලභීතිකා රෝගය නිසා මරණයට පත්වුණා. හැබැයි, මේ වනකොට ජලභීතිකා රෝගයෙන් මිය යන සංඛ්‍යාව 20ක්, 30ක් දක්වා අඩුකර ගන්න අපට හැකියාව ලැබී තිබෙනවා. 2020දී 31දෙනෙකු මරණයට පත්වෙලා තිබෙනවා, 2021දී 25ක්, 2022දී 28ක්, 2023දී 16ක්, 2024දී 20ක් සහ 2025දී 14ක් විධියට මේ රෝගයෙන් මිය යන සංඛ්‍යාව අඩු කර ගන්න අපට හැකියාව ලැබී තිබෙනවා.

ජලභීතිකාව නිසා මීට වසර 20කට, 30කට කලින් සිදුවුණු වසරකට 300ක් පමණ වූ මරණ සංඛ්‍යාව අඩුකර ගැනීමට දායක වුණු සෞඛ්‍ය අමාත්‍යාංශය ඇතුළු සියලුම ආයතනවල කාර්ය මණ්ඩලවලට අපගේ ප්‍රණාමය හිමි විය යුතුයි. ඒ අනුව මීට වසර 20කට විතර ඉස්සෙල්ලා 300ක් විතර වුණු මරණ සංඛ්‍යාව මේ වන විට අඩු කරගන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. අපේ මට්ටමේ හිටපු තායිලන්තය මේ වන විට ජලභීතිකාව නිසා සිදුවන මරණ සංඛ්‍යාව 1කට, 2කට අඩු කරගෙන තිබෙනවා. භූතානය කියන්නේ අපටත් වඩා සංවර්ධිතභාවයෙන් අඩු රටක්. නමුත් ඒ රටට ජලභීතිකා රෝගයෙන් මිය යන ප්‍රමාණය zero කරගන්න හැකියාව ලැබී තිබෙනවා, ඒ රටවල තිබෙන සෞඛ්‍ය ප්‍රතිපත්ති ඉතා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම නිසා. ලතින් ඇමෙරිකානු රටවල තිබෙන්නේත් ඒ තත්ත්වයමයි.

ජලභීතිකා රෝගය පාලනය කිරීමට එක පැත්තකින් සත්ව ගහනය පාලනය කරන්න ඕනෑ. අනෙක් පැත්තෙන් එන්නත්කරණය නිවැරදිව සිදු කරන්නත් ඕනෑ. මේ දෙකම ඉතා ඵලදායී ලෙස සිදු වුණොත් තමයි ජලභීතිකා රෝගය පාලනය කිරීමේ ක්‍රියාවලියෙන් අපට ඵලදායී ප්‍රයෝජන ලබා ගන්න හැකියාව ලැබෙන්නේ. 2030 වසර වනකොට මේ රටෙන් ජලභීතිකා රෝගය තුරන් කරන්න අපි බලාපොරොත්තු වනවා. ඒකට සියලුදෙනාගේම සහයෝගය අවශ්‍ය වනවා. ඒ පිළිබඳව ජනතාවත් විශේෂ අවධානයක් යොමු කරන්න ඕනෑ. ඔවුන් මෙහිදී වගකීමෙන් යුතුව කටයුතු කරන්න ඕනෑ. මේක දේශපාලන අධිකාරියට විතරක් තනියම කරන්න පුළුවන් දෙයක් නොවෙයි. ඒ වාගේම රාජ්‍ය නිලධාරීන්ට විතරක් තනියම කරන්න පුළුවන් දෙයකුත් නොවෙයි. සියලුදෙනාම ඒක රාශි වෙලා මේ තත්ත්වය වෙනස් කරගන්න අවශ්‍යයි.

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා, සුනඛයන්ගේ සපා කෑම්වලට ලක්වන රෝගීන්ට ප්‍රතිකාර කිරීමට. ඒ අනුව 2025දී රුපියල් මිලියන 280ක් වියදම් කරලා තිබෙනවා, පසු නිරාවරණ ප්‍රතිකාර කිරීම සඳහා. සතුන් එන්නත් කිරීම සඳහා රුපියල් මිලියන 180ක්ද, සතුන් වන්ධ්‍යාකරණය සඳහා රුපියල් මිලියන 200ක ප්‍රමාණයක් ද අපි වියදම් කර තිබෙනවා. ඒ අනුව මේ සඳහා අපි විශාල මුදලක් වියදම් කරලා තිබෙනවා. අපට ඒ මුදලෙන් සෑහෙන කොටසක් ඉතිරි කරගන්න හැකියාව ලැබෙනවා, මේ තත්ත්වය පාලනය කිරීම තුළින්. මේ සත්ව ගහනය පාලනය කිරීම තුළින්, ඒ වාගේම එන්නත්කරණය නිසි පරිදි සිදු කිරීම තුළින් අපට ඒ තත්ත්වයට ළඟා වීමේ හැකියාව ලැබෙනවා. මම ඉස්සෙල්ලා කිව්වා වාගේ මේ සඳහා ජනතාවගේ සහභාගිත්වය ඉතාම වැදගත් වනවා. මේ සම්බන්ධයෙන් ඔවුන් වගකීමෙන් යුතුව කටයුතු කළ යුතුයි. තමන් ඇති කරන සුනඛයන් හෝ වෙනත් සුරතල් සතුන් ඉතා හොඳින් රැක බලා ගැනීම මෙහිදී වැදගත් වනවා. එසේ කළොත් විතරයි මේ කටයුත්ත සාර්ථක කරගන්න පුළුවන් වන්නේ. ඒ සඳහා සියලුදෙනාගේම සහයෝගය අවශ්‍යයි. ඒ සහයෝගය අවශ්‍ය වනවා, 2030 වසර වෙද්දි මේ රට ජලභීතිකාවෙන් තොර රටක් බවට පත්කර ගැනීමට නම්. ඒ සඳහා සියලුදෙනාගේම සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු රියාස් ෆාරුක් මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.47]

ගරු රියාස් ෆාරුක් මහතා
(மாண்புமிகு ரியாஸ் பாருக்)
(The Hon. Riyas Farook)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ජලභීතිකා රෝගය තුරන් කිරීමේ සහ සුනඛයන් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කථා කරන මේ වෙලාවේ මම මුලින්ම සඳහන් කළ යුතු කාරණයක් තිබෙනවා. මෙතැනදි විපක්ෂයේ මන්ත්‍රීවරුන් කිහිපදෙනෙකු පසුගිය දිනක අකුරණ සිද්ධ වුණු accident එක ගැන කථා කළා. ඒකෙදි doctor කෙනෙක් ජාතිවාදය පැත්තට කථා කළා කියලාත් අදහසක් තිබෙනවා. ඒක social mediaවල, Facebook එකේ පළ වුණා. ඇත්තටම ඒ accident එක වුණේ අකුරණ. මගේ ගෙදර ඉඳලා මීටර් 500ක් විතර දුර ප්‍රමාණයක් ඇතුළත තමයි මේ accident එක වුණේ. මම විනාඩි 5කින් විතර එතැනට ගියා. ඒ කටයුතු ටික අන්තිම වෙනකල් - ජීවිත ටික බේරාගෙන, මිය ගිය අය hospital එකට අරගෙන යනකල් - මම එතැන හිටියා. ඇත්තටම ඒ තැන මීට කලින් කිහිප සැරයක්ම මේ වාගේ accidents සිදු වෙලා තිබෙනවා. එදාත් ලොකු cement bowser එකක්, මම හිතන විධියට ටොන් 30ක් විතර බර ලොරියක් brake නැතිව ඇවිල්ලා වාහන කිහිපයක ගැටිලා තමයි මේ අනතුර සිදු වුණේ.

එම අනතුර සිදු වුණාට පසුව එතැනදි කවුරුවත් සිංහල ද, දෙමළ ද, මුස්ලිම් ද කියලා බැලුවේ නැහැ. එතැනට ලොකු crowd එකක් ආවා. එතැනට තරුණ කොල්ලෝ ටිකක් ආවා. පොලීසිය සහ අනෙක් අය එන්න කලින් ඒගොල්ලන් ඉක්මනටම අනතුරට ලක් වූ ඒ ජීවිත බේරාගන්න තමයි ලැහැස්ති වුණේ. එතැනට අවශ්‍ය වුණා, forklift, crane, backhoe වාගේ යන්ත්‍ර. ඒ යන්ත්‍ර විනාඩි පහක්, දහයක් ඇතුළට එතැනට ගෙනාවා. ඊට පසුව ඔක්කෝම බේරලා hospital එකට යවලා, වාහන ටිකත් අයින් කර දීලා ඒ සියලු කටයුතු අවසන් කළා. ඊට පස්සේ, එහිදී මැරුණු අයගේ මළ ගෙවල්වලටත් ගියා. දැන් ඒ මරණත් වළ දාලා ඉවරයි. නමුත් තවම ඒක ජාතිවාදය පැත්තට ගන්න හදනවා. Social media ගත්තාම, Facebook ගත්තාම ඕනෑ තරම් තිබෙනවා නේ, ජාතිවාදී කථා. හැබැයි, අකුරණට ගංවතුර ආවා නම්, නැත්නම් Muslim area එකක මේ වාගේ accident එකක් වුණා නම් විපක්ෂයේ මුස්ලිම් මන්ත්‍රීවරුන් ඔක්කෝම ඒ ගැන තමයි කථා කරන්නේ. ඒවා ගැන කථා කරන්න ඕනෑ තමයි. දැන් මේක නතර කරන්න ඕනෑ නේ. ඒ සිද්ධිය ගැන Facebook එකේත් පළ වුණා නම් ඒක එතැනින් නතර කරන්න ඕනෑ. නමුත් ඒක දිගින් දිගටම වර්ධනය කරන්නයි බලන්නේ. අකුරණ මිනිස්සු කවුරු හරි දැන් මේක ගැන ලොකුවට කථා කරනවාද? බිමල් රත්නායක ඇමතිතුමාත් මේ ගැන පැහැදිලි කරලා කිව්වා. ඒ වාහනය පදවාගෙන ආවේ සිංහල තරුණ කොල්ලෙක්. ඉස්සෙල්ලාම ඔහුව තමයි බේරලා යැව්වේ. කිසිම හානියක් නැතුව ඔහුව බේරලා පොලීසියට යැව්වා. ඊට පස්සේ අනෙක් වැඩ ටික කළා. මේ වාගේ

සිද්ධි ගැන ඕනෑ තරම් Facebook එකේ පළ වෙනවා නේ. අපි ඒක නතර කරන්න ඕනෑ. ඒ සංස්කෘතිය නතර කරන්න නේ, අපි බලයට ඇවිල්ලා තිබෙන්නේ. මුස්ලිම් අයට, මුස්ලිම් ගමකට මොනවා හරි වුණා නම් මුස්ලිම් ඔක්කෝමලා ඒ ගැන කථා කරනවා. සිංහල අයට මොනවා හරි වුණා නම් සිංහල අය ඔක්කෝම ඒ ගැන කථා කරනවා. මේ කාරණය ජාතිවාදය පැත්තට හරවන්න එපා කියලායි අපි කියන්නේ.

උංකළ එල්ලොරුක්ගුම් තෙරියුම්, කටන්ත 19ආම් තිකති අක්කුරණෙයිල් නටන්ත වීති විපත්තිල් - road accidentඉල් - කායප්පට්ටවර්කළ් මර්රුම් ඉරන්තවර්කළිල් මුස්ලිම්කළ්, සිංකළවර්කළ්, තමිළර්කළ් එන මූන්රු ඉනත්තවර්කළුම් අටංකුකින්රනර්. ඉන්තච් චම්පවමානතු, එන්නුටෙය වීට්ටිලිරුන්තු 500 මීර්රරුක්කුළ්තාන් නටන්තතු. නාන් 5-10 නිමිටංකළුක්කුළ් අන්ත ඉටත්තුක්කුප් පෝය්විට්ටේන්. අන්ත accident නටන්ත නේරම් අන්තප් පෙරිය වාකනත්තෙ ඔට්ටි වන්තව driver සිංකළ ඉළෙඤර් ඔරුවර්. නාංකළ් මුතලිල් අවරෙප් පාතුකාප්පාක පොලිසුක්කු අනුප්පි වෙත්තෝම්. අතන්පිරකු, උයිරිමුන්තවර්කළෙයුම් කායප්පට්ටවර්කළෙයුම් පාතුකාප්පාක මීට්ටු, hospitalක්කු අනුප්පුම් වේලෙයෙ අන්ත ඌරෙච් චේර්න්ත ඉළෙඤර්කළ් මිකවුම් කවනමාකච් චෙය්තාර්කළ්. අන්ත ඉටත්තිල් නිරෙය machineries තේවෙප්පට්ටතු. Forklift, crane, backhoe මාතිරියාන ඉයන්තිරංකළෙ 10 නිමිටංකළුක්කුළ් අන්ත ඉටත්තුක්කුක් කොන්ටුවන්තු, පාතික්කප්පට්ට එල්ලොරෙයුම් පාතුකාප්පාක අනුප්පුම් වරෙ නාන් අන්ත ඉටත්තිල් ඉරුන්තේන්. අතිල් එන්තවිතප් පිරච්චිනෙයුම් එර්පටවිල්ලෙ. අංකුළ්ළ ඉළෙඤර්කළ් මිකවුම් කෂ්ටප්පට්ටු වේලෙ චෙය්තාර්කළ්. අන්ත නේරත්තිල් පාතික්කප්පට්ටවර්කළෙ hospitalක්කුක් කොන්ටුචෙල්වතර්කු නිරෙය වාකනංකළ් තේවෙප්පට්ටන. අවර්රෙයුම් කොන්ටුවන්තු පාතික්කප් පට්ටවර්කළෙප් පාතුකාප්පාක hospitalක්කු අනුප්පි වෙත්තාර්කළ්.

අන්ත විපත්තිල් ඉරන්තවර්කළෙත් තකනම් චෙය්කින්ර වේලෙයෙයුම් චෙය්තු මුටිත්තුවිට්ටාර්කළ්. ඉරුන්තාලුම්, ඉන්ත විටයත්තෙ වෙත්තු social mediaඉල් doctor ඔරුවර් ඉනවාත රීතියාන කරුත්තොන්රෙත් තෙරිවිත්තතර්කාක තොටර්න්තු ඉනවාතත්තෙක් කතෙත්තුක්කොන්ටු ඉරුක්කිරාර්කළ්. ඉතනෙ උටනටියාක නිරුත්ත වේන්ටුම්. අන්ත ඌර් මක්කළ් එල්ලොරුම් ඔන්රුචේර්න්තු, එන්තවිතප් පිරච්චිනෙයුම් එන්තවිතත් තොටර්පිලාමල් අන්ත වේලෙකළෙච් චෙය්තු මුටිත්තාර්කළ්. එනවේ, ඉන්ත විටයත්තෙත් තොටර්න්තු පේසි, ඉනවාතප් පිරච්චිනෙයාක වළර්ක්ක වේන්ටාමෙනක් කේට්ටු විටෙ පෙරුකින්රේන්. නන්රි!

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුළුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
අද දින විවාදයේ වැඩ කටයුතු අවසන් වන තෙක් කාලය දීර්ඝ කර ගැනීමට සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(මාණ්පුමිකු උරුප්පිනර්කළ්)
(Hon. Members)
Aye.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුළුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)
(මාණ්පුමිකු (පේරාසිරියර්) ඒ.එච්.එම්.එච්. අපයරත්න - පොදු නිරුවාක, මාකාණ සපෙකළ් මර්රුම් උළ්ළූරාට්චි අමෙච්චර්)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
වින්නා විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටතු.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.

අතන්පිරකු, මාණ්පුමිකු කුළුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු සඤ්ජීව රණසිංහ අවර්කළ් තලෙමෙ වකිත්තාර්කළ්.

Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.

[අ.භා. 4.53]

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි තයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් අද දින විවාදයට ගැනෙන ජලභීතිකා රෝගය තුරන් කිරීමේ සහ සුනඛයන් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අපේ කමිටුවේදීත් සාකච්ඡා කළා. අපේ නිහාල් අබේසිංහ මැතිතුමාත් එම කමිටුවේ ඉන්නවා. මොකද, එතුමා මේ සම්බන්ධයෙන් විශාල දැනුමක් තිබෙන කෙනෙක්. මෙහිදී සුනඛයන් එන්නත් කිරීම පශු වෛද්‍යවරයෙකුගේ හෝ පශු වෛද්‍යවරයෙකුගේ අධීක්ෂණය යටතේ සිදු කරනු ලැබිය යුතුයි කියලා සඳහන්ව තිබුණු වගන්තිය සම්බන්ධයෙන් මම යෝජනාවකුත් විශේෂ කරුණක් විධියට ඉදිරිපත් කළා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාටත් මතක ඇති, අපේ කමිටුවේදීත් මම මේ ගැන කථා කරපු බව. මෙතැනදී ලංකාව පුරාම තිබුණු සාමාන්‍ය ක්‍රමවේදය අනුව අපේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු තමයි ඇත්තටම ඒ කටයුත්ත කළේ. මොකද, පශු වෛද්‍යවරු හැම තැනකම හොයා ගන්න බැහැ. පළාත් පාලන ආයතන හැම එකකටම පශු වෛද්‍යවරයෙක් හොයා ගන්න බැරි තත්ත්වයක් තමයි තිබෙන්නේ. අපිට පශු වෛද්‍යවරුන්ගේ විශාල අඩුපාඩුවක් තිබෙනවා. ඒ නිසා ඒ අය කරගෙන ගිය ක්‍රියාදාමයත් ඉදිරියට කරගෙන යන්න අවස්ථාව දෙන්න කියලා අපි කිව්වා. මොකද, මෙතැනදී විශාල අර්බුදයක් තිබෙනවා, මේ කටයුතු කරපු ඒ අයට යම්කිසි විධියක හිරවීමක් සිදු වෙලා තිබෙනවාද කියලා. නමුත් එතුමාත් ඒ වෙලාවේදී යම්කිසි විධියකට ඒ සම්බන්ධයෙන් අදහසක් දැක්වුවා.

මෙම පනත් කෙටුම්පතෙහි 4 (2) වගන්තියේ සඳහන් වෙනවා, එන්නත් කිරීමේ සහතිකය නිකුත් කිරීම පිළිබඳව. නමුත් මම හිතන විධියට, මේ සම්බන්ධව අවශ්‍ය කරන ක්‍රියාදාමයත් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී අර්බුද ගණනාවක් මතු වෙයි. මොකද, පළාත් පාලන ආයතන සියල්ලටම පශු වෛද්‍යවරයෙක්

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

ලබා දෙන්න අපිට හැකියාවක් නැහැ. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලවල පශු වෛද්‍යවරු ඉන්න පුළුවන්. නමුත් එතැනත් ඒ අය ඉන්න එක ඉතාම දුර්ලභයි. මොකද, ඒ අවශ්‍ය කරන ප්‍රමාණය නැති නිසා.

අපේ හිටපු ඇමතිතුමෙකුත් මේ ගැන කථා කරනවා මම දැක්කා. අපේ ලංකාව තුළ සාමාන්‍යයෙන් ගෙවල්වල සහ ඊට පිටස්තරව ලක්ෂ 60ක විතර සුනඛයන් ප්‍රමාණයක් ඉන්නවා. දැන් පළාත් පාලන ආයතනවලින් රුපියල් 2,000 ගණනේ අරගෙන මේ හැම සුනඛයෙක්ම ලියාපදිංචි කරනවා. මේ අවුරුද්දේ පමණක් සුනඛයන් වෙනුවෙන් රුපියල් බිලියන 12ක් - රුපියල් කෝටි 1,200ක් - මේ ආණ්ඩුවට බදු ගෙවනවා. "ගමේ ගෙදරකට සෙනෙහ පපා සිටි බලු කුක්කාට මොන බදු ද අනේ - තනේ තිබෙන කිරි ටිකටත් බද්දක් ගෙවන්න වේවිද නුදුරු දිනේ" කියලා අපි ඒ කාලයේ කිව්වා මට මතකයි. ඒක තමයි මේ ආණ්ඩුව දැන් ක්‍රියාත්මක කරන්නේ.

අද හැම ගෙදරකම ඉන්න සුනඛයෙක්ම පළාත් පාලන ආයතනයකට අරගෙන ගිහිල්ලා රුපියල් 2,000ක් දීලා ලියාපදිංචි කරන්න ඕනෑ. දැන් මේ ආණ්ඩුව මේ රටේ සුනඛයන්ගෙන් විතරක් බදු ගහලා රුපියල් බිලියන 12ක් - රුපියල් කෝටි 1,200ක් - ගන්නවා, මේ පනත ක්‍රියාත්මක කිරීමත් එක්ක. මම හිතන විධියට, මේ ආණ්ඩුවට ඕනෑ කරලා තිබෙන්නේ මුදල් එකතු කිරීමයි, පුළුවන් තරම් පනත් ගෙනැල්ලා ලංකාවේ අපිව හිර කිරීමයි. අද මේ අය දවස ගණනේ පනත් විශාල සංඛ්‍යාවක් ගෙනෙනවා. සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පත ගෙනෙනවා. අපරාධ නඩු විධාන සංග්‍රහයේ තිබෙන ඒවා සියල්ලම ඒක ඇතුළේ තිබෙනවා. ඊළඟට, ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත, දූෂණ විරෝධී පනත ගෙනෙනවා. ලංකාවේ අපරාධ නඩු විධාන සංග්‍රහයේ තිබුණු කොටස් ඔක්කෝම දැන් මේ පනත්වලත් තිබෙනවා. මුලදී පැය 24ක් ලෙස සැකකරුවෙකු රඳවා තබා ගැනීමට තිබුණු එක පැය 48කට වැඩි කළා, එක පනතකින්. දැන් එය පැය 72ක් දක්වා වැඩි කරනවා, සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පත යටතේ. අපි කියන්න කැමැතියි, අද වනකොට මේ සියලු කාරණා බැලුවාම පොලීසියයි, උසාවියයි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවයි තමයි මේ රට පාලනය කරන්නේ කියන එක. මොකද, ඒගොල්ලන් අල්ලනවා. ඒ අල්ලන අය පොලීසිය විසින් අත්අඩංගුවට ගැනීම කරනවා. ඇප දෙන්න මහෙස්ත්‍රාත්තුමාට බලයක් නැති කරලා තිබෙනවා. ඒ වාගේම අත්අඩංගුවට ගන්නා සැකකරුවෙක් රඳවා ගැනීමේ කාලය පැය 48 නොවෙයි, පැය 72යි. සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත ගෙනාවාට පස්සේ පැය 72 නොවෙයි, අවුරුද්දක් යනකල් ඕනෑ කෙනෙක් තියා ගන්න අමාත්‍යාංශ ලේකම්ට පුළුවන්.

පව්ව ගහන එක ගැන කථා කළාම, "නැහැ, පව්ව ගැහුවාට ප්‍රශ්නයක් නැහැ" කියලා එදා අධිකරණ ඇමතිතුමා කියනවා මම අහගෙන හිටියා. හැබැයි, මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. පව්වය ගහපු මනුස්සයාව අල්ලාගෙන ගිහිල්ලා, ඊට පස්සේ ඒ මනුස්සයාගේ පව්වයත් එක්ක තවත් සංවිධානාත්මක අපරාධ කල්ලියකට ඔහු ඕනෑද නැද්ද කියලා හොයා ගන්න පරීක්ෂණ කරන්න අවුරුද්දක් තියා ගන්න පුළුවන්. දැන් මේකේත් ඉන්නවා, පව්ව ගහපු කට්ටිය ඕනෑ තරම්. අපේ අලුත් පරම්පරාවේ, Gen Z එකේ ඕනෑ තරම් පව්ව ගහපු තරුණ තරුණියන් ඉන්නවා. බැරි වෙලාවත් රතු තරුවක පව්වයක් ගහලා හිටියොත් මොකද වෙන්නේ? ඒ අය අපරාධ කොට්ඨාසයකට අයිති කට්ටිය කියලා අනාගතයේදී තීන්දුවක් ගෙනාවොත්, තරුව ගහපු කට්ටිය ඔක්කෝම අරගෙන ගිහිල්ලා ඇතුළට දමන්න ඕනෑ. මම හිතන්නේ මේක තමයි,- *[බාධා කිරීමක්]* ඉන්න, "රතු තරුව" කිව්වාම කලබල වෙන්න එපා. ඒ නිසා මම මේ කාරණයත් කියන්න කැමැතියි. *[බාධා කිරීමක්]* කලබල වෙන්න එපා, ඉන්න පොඩ්ඩක්. තමුන්නාන්සේලාට දැන් ඕනෑ, අපේ මිනිස්සු ඔක්කෝම හිරකාරයෝ බවට පත් කරන්නයි. Sri Lanka is going to be an open prison. අද ලංකාව විවෘත හිර කූඩුවක් බවට පත් කරන්න තමයි මේ කටයුතු කරගෙන යන්නේ. ඇයි, ඒ?

මම විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා, ගම්පහ මහෙස්ත්‍රාත් බන්දුල ගුණරත්න මැතිතුමාට. පොලිස්පතිතුමා දීලා තිබෙනවා, target එකක්. Targets දීලා, අද පොලීසියට කියලා තිබෙනවා, මෙච්චර ගණනක් අල්ලන්න, මෙච්චර ගණනක් අපට ගෙනෙන්න, දවසකට මෙච්චර ගණනක මුදලක් ඕනෑ කියලා. එහෙම කරලා දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? එක පුද්ගලයාටම නඩු දැම්මා, අයිස් මිලිග්‍රෑම් 130ටයි, හෙරොයින් මිලිග්‍රෑම් 500ටයි. එකම දවසේ, එකම කාරණයට නඩු දෙකක් දැම්මා. වෙලාවට මහෙස්ත්‍රාත්තුමා ඒක හොයා ගත්තා. ඒ නිසා අන්තිමට ඇප දීලා කථා කරලා එකකට දඩ ගහලා ඉවර වුණාට පස්සේ තව එකකට ඒ පුද්ගලයා ගෙනාවා. ඊට පස්සේ ඇහුවා, දැන් මොකද වෙලා තිබෙන්නේ කියලා. අන්තිමට ඒකට මහෙස්ත්‍රාත්තුමා තීන්දුවක් දුන්නා, මාස පහක් කියලා. පොලිස්පතිතුමාට කිව්වා, මේ විධියට අසාධාරණ ආකාරයට මිනිස්සු අත්අඩංගුවට ගන්න එපා, මුළු ලංකාවටම බලපාන පරිදි චක්‍රලේඛයක් ගහන්න කියලා. හැබැයි, මොකක්ද කළේ? මාස පහක් යනකල් පොලිස්පති ඒ සම්බන්ධව ක්‍රියාමාර්ගයක් ගත්තේ නැතුව ඉඳලා පළාත භාර නියෝජ්‍ය පොලිස්පතිට දැනුම් දුන්නා, ඒ පළාතට විතරක් බලපාන විධියට කටයුතු කරන්න කියලා. මහෙස්ත්‍රාත්තුමා වෙන මොකක්ද කරන්නේ?

දැන් අපි ඊළඟට බලමු, ඒකට එන අපරාධ නීතිය කොහොමද වැඩ කරන්නේ කියලා; ඒගොල්ලන්ට කොහොමද, මේගොල්ලන්ට කොහොමද කියලා අපි බලමු. 1833 කෝල්බෘක් -කැමරන් ප්‍රතිසංස්කරණවලින් තමයි මේ නිදහස පිළිබඳව යම්කිසි හරි ඉඩක් අපට ලැබුණේ, පුද්ගලයෙක් අත්අඩංගුවට ගන්නා ක්‍රමවේදය සම්බන්ධයෙන්. තමුන්නාන්සේලා ගෙනැල්ලා තිබෙන මේ පනත් හැම එකකින්ම පුද්ගලයෙක් කිසිම සාක්ෂියකින් තොරව අත්අඩංගුවට ගන්න පුළුවන් තැනට දැන් තල්ලු වෙලා තිබෙන්නේ. 1818 කියන ක්ෂණික දුරකථන අංකය තිබෙනවා. ඒ දුරකථන අංකයට කථා කරලා මේ පුද්ගලයා සම්බන්ධව අපට ප්‍රශ්නයක් තිබෙනවා කියලා පොලීසියට කිව්වාම, පොලීසියෙන් ඇවිල්ලා කටඋත්තර ගන්නවා, සැක නම් අරගෙන ඇතුළට දමනවා. ඒකයි මම කිව්වේ, Sri Lanka is going to be an open prison කියලා. අපේ රට සම්පූර්ණයෙන්ම විවෘත බන්ධනාගාරයක් බවට පත් කරන්නයි තමුන්නාන්සේලා මේ හදන්නේ.

ඒ වාගේම ඊයේ පෙරේදා මම SriLankan Airlines එක ගැන කථා කළා. ඊට පස්සේ ඒගොල්ලන් නිවේදනයක් නිකුත් කරලා තිබෙනවා, ඒක fake news එකක් කියලා. ඒකට අවශ්‍ය සියලු කරුණු ටික මම අද ඔප්පු කරන්න කැමැතියි. 2025 ඔක්තෝබර් වනවිට SriLankan Airlines එකේ තාක්ෂණ අංශයේ ප්‍රධානියා Darktrace/ EMAIL ආරක්ෂණ පද්ධතිය නවත්වන්න කියලා නියෝගයක් දෙනවා. ඒක ඉතාම සංකීර්ණ email පද්ධතියක්. හැබැයි, මොකද වෙන්නේ? 2026 ජනවාරි 21වැනි දා වනකොට මේ Darktrace/ EMAIL system එක සම්පූර්ණයෙන්ම නතර වෙනවා. එතකොට ශ්‍රීලන්කන් ගුවන් සේවයේ තොරතුරු තාක්ෂණ අංශයේ ප්‍රධානියා විධියට ශ්‍රීලන්කන් ගුවන් සේවයට email ආරක්ෂණ පද්ධතියක් අවශ්‍ය නැහැ කියලා ඔහු තීන්දුවක් ගන්නවා. ඊට පස්සේ මොකද වෙන්නේ? ඊට පස්සේ අපි සියලුදෙනාම දැනගන්නවා, 2026 මාර්තු මාසයේදී email එකක් විධියට ආපු හැකර් ප්‍රහාරයකින් AED ලක්ෂ 890ක් - මේ රටේ

මුදල් රුපියල් කෝටි 89ක් - අපට නැතුව යනවා, ඒ email එක ආරක්ෂා කිරීමේ ක්‍රියාදාමය නැති වීම නිසා කියලා. ඒ වාගේම පළමුවැනි වටයේ email ආරක්ෂණ පද්ධතිය නැති කරනවා. ඊළඟට, හැකර්වරුන්ට අවස්ථාව ලැබෙනවා, ඒක ඇතුළට එන්න. ඒ වාගේම සිවිල් ගුවන් සේවා අධිකාරියට දැනුම් දෙන්නේත් නැහැ.

පළමුවැනි හැකර් ප්‍රහාරය වුණේ 2025 ජූනි 29වැනි දා. ඊට පස්සේ 2026 මැයි 15වැනි දා සහ ජූනි 12වැනි දා තවත් හැකර් ප්‍රහාර දෙකක් සිද්ධ වුණා. ඒ අනුව, email පද්ධතිය hijack කරලා, DASI ගුවන් යානා අමතර කොටස් සපයන කොම්පැනියක් ඇතුළට ගිහිල්ලා ඔවුන් ප්‍රහාරයක් එල්ල කරනවා. ඒ වාගේම Flydubai එකටත් වෙනම එකක් යවනවා. මා ළඟ තිබෙන ඒ සම්බන්ධ වාර්තා දෙක මම **සභාගත*** කරනවා.

එක දවසක් තමයි, 2026 මැයි 15වෙනි දා. 6.55ට ඇවිල්ලා තිබෙන්නේ. මේකේ බොහොම පැහැදිලිව ඔවුන් කියනවා මේ සම්බන්ධව වහාම පියවර ගන්න කියලා. ඊළඟට අනෙක් පැත්තෙන් 2026 ජූනි 29වෙනි දා BlackNet කියලා තවත් හැකර් කණ්ඩායමක් server monitoring tool එකක් hack කරලා dark web එකේ සමාගමේ තොරතුරු, Bitcoinවලින් US Dollars 50,000 ගන්න කියලා එකක් එවනවා. මේ විධියට ඒක සම්පූර්ණයෙන් විනාශයකට පත් වෙනවා. Flydubai එක Business Email Compromise එකට ගිහිල්ලා කියනවා මේවා නැවැත්වුවේ නැත්නම් ඔවුන් එක්ක business නවත්වනවා කියලා.

ඊට පස්සේ මොකක්ද කරන්නේ? 2025 ඔක්තෝබර් මාසයේ හදිසියේ තීරණයක් ගන්නවා අක්‍රිය වෙලා තිබුණු Darktrace/ EMAIL පද්ධතිය නැවත දාන්න. ඒ ක්‍රියාදාමය තුළ Microsoft licences අලුත් කරන්න අප්‍රේල් මාසයේ කැබිනට් අනුමැතිය ගන්නවා. ඒ විධියට හරි හදිසියෙන් ආපහු Microsoft licences අරගන්න වැඩ පිළිවෙළක් සකස් කරනවා. හදිසි මිලදී ගැනීමක් විධියට තමයි ඒක ක්‍රියාත්මක කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට තව විනාඩියක් දෙන්න. අද මේ ආණ්ඩුවේ අය භය වෙලා තිබෙනවා වස් කවිවලට.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි කීයක් තිබෙනවාද, විනාඩි දෙකක්ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නැහැ, කාලය අවසානයි.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට තත්පර කිහිපයක් දෙන්න.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
කාලය දීර්ඝ කළා නේ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔව්, කාලය දීර්ඝ කළා නේ.

අද ආණ්ඩුව වස් කවියට භය වෙලා ඉන්නේ. අද ආණ්ඩුව කියනවා වස් කවිය ලියපු එක්කෙනා අත්අඩංගුවට ගන්න, වස් කවිය කියපු එක්කෙනා අත්අඩංගුවට ගන්න කියලා. මේ රටේ යාගහෝම, වස් කවි, හූනියම් වාගේ දේවල් ඉතිහාසයේ ඉඳලා තිබුණා. ඒවා අපේ රටේ තිබුණු පාරම්පරික දේවල්. තමුන්නාන්සේලාට සිවුර හොඳත් නැහැ, තමුන්නාන්සේලාට ශාසනය හොඳත් නැහැ. තමුන්නාන්සේලාට වුවමනා වෙලා තිබෙන්නේ වෙනත් රටවල ආගම්වල කට්ටිය ලංකාවට ගෙනැල්ලා ඒගොල්ලන්ට ආරක්ෂාව දීලා අරගෙන යන්න. නමුත් මිහින්තලයේ ආගමික කටයුත්ත සඳහා තායිලන්තයේ නියෝජ්‍ය අගමැතිතුමිය ලංකාවට ආවාම ඒකට අවශ්‍ය කරන වාතාවරණය සකස් වෙන්නේ නැහැ.

පසුගිය දවසක කියපු ඒ වස් කවිය මම කියන්නම්.

" යක්ෂ රාජ වජිරපාණි මහ දෙවිදේ අසාපන්
සිරි සම්බුදු සසුනට කළ නස්පැත්තිය බලාපන්
චීවරයට නිහා දෙවන පරයන් බිම හෙළාපන්
බොරුවෙන් රජ වූ එකාට නැති වෙන්නම තළාපන් "

මේ ශාසනය විනාශ කළ අයයි කලබල වෙන්නේ, රට විනාශ කළ අයයි කලබල වෙන්නේ.

බොහොම ස්තුතියි මට කාලය ලබා දුන්නාට, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මන්ත්‍රීතුමා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා යද්දි පරිස්සමට යන්න; මොනවා හරි වෙයි.

[අ.භා. 5.05]

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජලභීතිකා රෝගය තුරන් කිරීම සම්බන්ධයෙන් වන පනත් කෙටුම්පත සාකච්ඡාවට ගන්නා මේ වෙලාවේ කවියකුත් අහලා කථාව පටන් ගන්න පුළුවන් වුණා. කාලයක් තිස්සේ ලංකාවේ තිබුණු ජලභීතිකා රෝගය තුරන් කිරීම සිදු වුණේ අවුරුදු 100කට වැඩි පනත් සහ රෙගුලාසිවලින්. ඒකට පිළිතුරක් විධියට තමයි මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙන එන්නේ, සකස් වෙන්නේ. මේ පනත් කෙටුම්පත ගැන අද විශාල සාකච්ඡාවක් ගියා, මමත් ඒකට දායක වෙනවා.

ජලභීතිකා රෝගයට අපට තේරෙන භාෂාවෙන් කියන්නේ පිස්සු බලු රෝගය කියලා, සාමාන්‍යයෙන් මිනිස්සු දන්නේ පිස්සු

[ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා]

බලු රෝගය කිව්වොත් තමයි. පිස්සු බලු රෝගය බල්ලන්ගෙන් සහ වෙනත් සතුන්ගෙන් මිනිසුන්ටත් බෝ වෙනවා. ඒක ස්නායු පද්ධතියට බලපාන වයිරස් රෝගයක්. ස්නායු පද්ධතියට බලපාලා ඒක උත්සන්න වුණාට පස්සේ තමන් තමන්ගේ පාලනයෙන් ගිලිහිලා අසාමාන්‍ය හැසිරීම් පෙන්නුම් කරනවා. සතුනුත් එහෙමයි, මිනිස්සුත් එහෙමයි. හපා කනවා, කෑ ගහනවා, කලින් කළේ නැති අමුතු ජාතියේ වැඩ කියනවා, කෑ ගගහා දුවනවා; එහෙම බොහෝ දේවල් වෙනවා. මේ පනත් කෙටුම්පතේ විවාදය වෙලාවේ එහෙම හැසිරීම් ටිකකුත් අපි දැක ගත්තා, මේ ගත වුණු පැය කිහිපය තුළ. පිස්සු බලු රෝගය ගැන කථා කරන වෙලාවේ ඒ ආකාරයේ හැසිරීම් ටිකකුත් මේ පාර්ලිමේන්තුවේ පෙන්වපු සමහරු හිටියා. *[බාධා කිරීමක්]* ඔය, ඕක තමයි මම කිව්වේ.

අද දවසේ මේ සභාවේ සාකච්ඡාවට ලක් වුණා භාෂණයේ නිදහස ගැන. උදේ වරුවේ විපක්ෂ නායකතුමා- *[බාධා කිරීමක්]* මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පිස්සු බල්ලොත් එක්ක මේ වැඩේ කරන්න බැහැ, ඔබතුමා මේක බේරලා දෙන්න. *[බාධා කිරීම්]* භාෂණයේ නිදහස ගැන උදේ සාකච්ඡාවක් ඇති වුණා. විපක්ෂ නායකතුමා විරෝධතාවලට උසාවි නියෝග ගෙන ඒම ගැන විරෝධයක් දැක්වූවා. විහාරමහා දේවි උද්‍යානයේ හෝ වෙනත් ඕනෑම තැනක පවත්වන විරෝධතාවක් සම්බන්ධව පොලීසිය විසින් මහෙස්ත්‍රාත්වරයාට කරුණු දැක්වීමෙන් අනතුරුව තමයි උසාවි නියෝගයක් ලබා ගන්නේ. උසාවි නියෝගයට විරුද්ධ නම්, ඒක ගැළපෙන්නේ නැත්නම් ඊළඟ උසාවියට යන්න ඕනෑ. ඉහළ උසාවියට යන්න පුළුවන්. ගිහිල්ලා කථා කරන්න ඕනෑ. එහෙම නැතුව මෙතැනට ඇවිල්ලා අපිට කිව්වා කියලා, මට හරි ඔබතුමාට හරි බැහැ නේ උසාවි නියෝග වෙනස් කරන්න. ඒ වාගේම ඩී.වී. වානක මන්ත්‍රීතුමාත් එතුමාගේ කථාවේදී කිව්වා, අධිකරණයේ විශ්වාසය අහිමි වෙලා, නාමල් රාජපක්ෂට ඇප හම්බ වුණේ නැහැ, විමර්ශන ඉවර වෙලාත් ඇප හම්බ වෙන්නේ නැතුව තිබෙනවා කියලා මොකක්දෝ ඇඩියාවක් මෙතැනට ඇවිල්ලා කළා. නාමල් රාජපක්ෂට ඇප දෙන්න අපට බැහැ නේ. ඔබතුමාටත් බැහැ, මටත් බැහැ. මහෙස්ත්‍රාත් අධිකරණයෙන් ඇප හම්බ වුණේ නැත්නම් ඊළඟට යන්න ඕනෑ මහාධිකරණයට. ඊට පස්සේ තවත් අධිකරණ තිබෙනවා යන්න. ඒවාට ගිහිල්ලා ඒ විධියට කථා කරලා කරුණු දක්වන්නේ නැතුව මෙතැනට ඇවිල්ලා කෙදිරි ගෑවා, ඇඬුවා කියලා ඇප හම්බ වෙන්නේ නැහැ. ඒ වාගේම එතුමා කිව්වා, කිසිම සාක්ෂියක් නැතුව අල්ලලා තිබෙන්නේ, නාමල් රාජපක්ෂ ඉතිහාසගත වෙන්නේ පරීක්ෂණ ඉවර වෙලා තිබියදීත් ඇප නොලැබෙන කෙනෙක් විධියටයි කියලා. නාමල් හරි ආස ඇති, එහෙම ඉතිහාසගත වෙන්න, මේ විධියේ තැනකින්. නාමල් ඉතිහාසගත වෙන්නේ කොහොමද කියලා තවම ඔබතුමා දන්නේත් නැහැ, අපි දන්නේත් නැහැ. වුට්ටක් බලාගෙන ඉඳිමු, ඊළඟ මාස කිහිපයේ කොහොම ඉතිහාසගත වෙයිද කියලා. සමහරවිට අපට හිතාගන්නත් බැරි විධියට ඉතිහාසගත වෙන්නත් පුළුවන්. දැන් මේ පුවත් පත්, මාධ්‍ය වාර්තා දැක්කාම අපට එහෙම තමයි පෙනෙන්නේ. ඒ නිසා, එච්චරම ආසාවක් තිබුණාට ඒ විධියටම කරන්න අමාරුයි.

ඒ වාගේම තමයි මේ විරෝධතා කථාව. මම ඒත් හිතුවා, අන්තිමට යන්තම් වෙලාව ඉල්ලාගෙන ආයෙත් "ටක්" ගාලා කිව්වේ නැත්තේ ඇයි කියලා. දැන් හැමෝටම සෙල්ලම් කරන්න කාඩ් එකක් හම්බ වෙලා තිබෙනවා නේ. ආස කාඩ් එකක් හම්බ වෙලා තිබෙනවා. ඒ කියන්නේ, හැම දාම ජාතිවාදය, ආගම්වාදය අවුස්සලා, පොඩ්ඩක් ලේ කුපිත කරලා, එහෙම දේශපාලනය කරලා පුරුදු වෙලා, පහුගිය අවුරුදු දෙකේ ටිකක් අමාරුවෙන් හිටපු කට්ටියක් ඉන්නවා කියලා අපි දන්නවා. හැබැයි, දැන් පක්ෂ භේදයකින් තොරව මේ හැමෝටම පොඩි චූන් එකක් ගිහින් තිබෙනවා. හැමෝගේම ප්‍රකාශවල ඒක අඩු වැඩි වශයෙන් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මගේ අතේ තිබෙනවා පසුගිය සතියේ නිකුත් කරපු මාධ්‍ය නිවේදන 4ක්. ඒ, විපක්ෂ නායකතුමාගේ මාධ්‍ය නිවේදන දෙකක් සහ එක්සත් ජාතික පක්ෂයේ මාධ්‍ය නිවේදන දෙකක්. එම මාධ්‍ය නිවේදන 4ම මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

ඔබට මතක නම්, මීට සති දෙකකට කලින් මේ පාර්ලිමේන්තුවේ තිබුණු විවාදය මොකක්ද? "ජනාධිපතිතුමා අධිකරණයට උඩින් යන්න හදනවා, ඒ නිසා තමයි විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙන්නේ" කියලා මෙතැන මැරෙන්න හැදුවා. දැන් ඒගොල්ලෝම අහනවා, ජනාධිපතිතුමාට පොඩ්ඩක් අධිකරණයට උඩින් යන්න බැරිද වාගේ කථාවක්. එහෙම යන්න බැහැ. ජනාධිපතිතුමා පැහැදිලිව කිව්වා, මේ රටේ නීතිය, නඩු තීන්දු සම්බන්ධයෙන් එතුමා සහ මේ පක්ෂය කටයුතු කරන්නේ කොහොමද කියලා. සති දෙකකට, මාසයකට කලින් නීතියට උඩින් යනවා කියලා අඬන්නයි, දැන් උඩින් යන්නේ නැහැ නේ කියලා අඬන්නයි, මේක මොකක් කියලාද හිතාගෙන ඉන්නේ? මේ රටේ අධිකරණවලින් නඩු අහලා ලබා දුන් තීන්දු තිබෙනවා, ඒවායේ එහෙම තමයි තිබෙන්නේ. ඒවා ඉහළ අධිකරණවලින්, නැත්නම් අදාළ විධියට ඒවා විසඳගන්න ඕනෑ. එහෙම නැතුව ඉතිහාසයේ සිටි ජනාධිපතිවරු හෝ ඉතිහාසයේ තිබුණු ආණ්ඩු කරපු වැඩ කරන්න නොවෙයි නේ අපි ඇවිල්ලා ඉන්නේ. එහෙම නම් අපි එන්න අවශ්‍ය නැහැ. එම නිසා ඒ දේවල් අපෙන් බලාපොරොත්තු වෙන්න එපා.

එහෙම තිබියදී මේ එන්නේ මොකාටද කියලා තේරේද්දී, සජිත් ප්‍රේමදාස මහත්මයා එක් මාධ්‍ය නිවේදනයක් නිකුත් කරලා තිබෙනවා ඔක්තෝබර් 15වැනි දා, භික්ෂූන් වහන්සේලා කිහිපදෙනෙක් ජනාධිපති ලේකම් කාර්යාලය ඉස්සරහට ආපු දවසේ. මේ නිවේදනයෙන් කියන්නේ, නුවර සිට කොළඹට පාගමනින් භික්ෂූන් වහන්සේලා ඇවිල්ලා ඉන්නවා, උන්වහන්සේලා රැගෙන ආ බුද්ධ ප්‍රතිමා වහන්සේනමකට ආවරණය සැපයීමට සකස් කළ තාවකාලික අට්ටාලය අයින් කරන්න එපා කියලායි. මොනවාද මේ කියන්නේ? ජනාධිපති ලේකම් කාර්යාලයට එන්නේ බුද්ධ ප්‍රතිමාවක් තියන්නද? එහෙම නොවෙයි, මොකක්ද මේ කරන්නේ, මොකක්ද මේ කරන්න හදන්නේ කියලා තේරෙන්න එපායැ. තවත් දවසකට පස්සේ, පිරිත් දේශනා කරමින් සිටි භික්ෂූන් වහන්සේලාට ප්‍රහාරයක් එල්ල කළා කියලා මාධ්‍ය නිවේදනයක් නිකුත් කර තිබෙනවා. ඒකත් අමු බොරුවක්. විපක්ෂ නායක විධියටමයි මේ මාධ්‍ය නිවේදන නිකුත් කරන්නේ. මම ඒක කලින් දැක්කේ නැහැ. පක්ෂය විධියට නොවෙයි, විපක්ෂ නායක විධියටයි ඒ මාධ්‍ය නිවේදනය නිකුත් කරන්නේ. සමහරවිට මෙතුමන්ලා ඒකට කැමති නැද්ද දන්නේ නැහැ. එතුමා තනියම ඒ මාධ්‍ය නිවේදන නිකුත් කරනවාද දන්නේ නැහැ, පක්ෂයම ලජ්ජා වන නිසා.

අනෙක් පැත්තෙන්, එක්සත් ජාතික පක්ෂය රනිල් වික්‍රමසිංහ එක්ක - ලොකු නායකයා ඒගොල්ලන්ගේ - බොරු කියනවා. දැන් ඒ ප්‍රශ්නය විසඳලා තිබෙන්නේ. ජනාධිපතිතුමා මහානායක හාමුදුරුවොත් එක්ක කථා කරලා, අදාළ ක්‍රමවේදයට අනුව ඒක විසඳලා, ඒ නීතියට සංශෝධන එකතු කිරීම් ඉදිරිපත් කරලා

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

තිබෙන්නේ. එහෙම තිබියදීත් බන්ධනාගාර පනතේ නිත්‍ය නියෝග 550වන වගන්තිය කියලා බොරු කියලා මාධ්‍ය නිවේදයක් නිකුත් කළා. 550වන වගන්තියේ සඳහන් කර තිබෙන්නේ මේකයි කියලා බොරු කියලා තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයෙන් ඉදිරිපත් කරලා තිබෙන මාධ්‍ය නිවේදනයේ, 550වන වගන්තියේ ඇඳුම සම්බන්ධයෙන් දක්වා තිබෙනවාය කියන කාරණය අමු බොරුවක්. එහෙම කරලා, මේ රජය බුද්ධාගමට විරුද්ධව කටයුතු කරනවා කියලා කියනවා.

අදත් එක්සත් ජාතික පක්ෂයෙන් මාධ්‍ය නිවේදනයක් නිකුත් කර තිබෙනවා. එහි අවසානයේ තිබෙන්නේත්, මාලිමා ආණ්ඩුවට මේ රටේ බුද්ධාගම නැති කිරීමට දැඩි අවශ්‍යතාවයක් තිබෙනවා කියලා. මොනවාද මේ කියන්නේ? මොකක් හෝ අමු බොරුවක් කියලා, ආයෙත් ජාතිවාදය අවුස්සලා, ආයෙත් ආගම්වාදය අවුස්සලා, තමන්ට පුරුදු මොකක් හරි දෙයක් කරන්න මේ උත්සාහ කරනවා. බොරුවෙන්, ජාතිවාදයෙන්, ආගම්වාදයෙන් මතු වෙන්නයි මේ හදන්නේ. ඒකට අපි ඉඩ දෙන්නෙත් නැහැ, ඒකට අපි යට වෙන්නෙත් නැහැ, ඒකට අපි කලබල වෙන්නෙත් නැහැ කියන එකත් කියන්න ඕනෑ.

මට විනාඩියක කාලයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද තවත් සාකච්ඡාවක් ඇති වෙලා තිබුණා, ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත සහ සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පත ගැන. සජිත් ප්‍රේමදාස මහත්මයාම අද උදේ කිව්වා, දශක 4ක් තිස්සේ විරුද්ධවාදීන් මර්දනයට යොදා ගත්තේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත කියලා කථාවක්. ඒක ඇත්ත. ඒ පනත යොදා ගත්තා, අපේ පක්ෂය ඒවාට අහුවුණා. ඒක ඇත්ත. හැබැයි, ඒ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කරලා තමයි මේ අලුත් පනත් කෙටුම්පත ගෙනෙන්නේ. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ඒ කියපු විධියේ නරක එකක් හින්දා තමයි මැතිවරණ පොරොන්දුවකට අනුව ඒක අහෝසි කරලා යම් හෙයකින් යළිත් ඇති විය හැකි ජාතික සහ ජාත්‍යන්තර ත්‍රස්තවාදය ඉලක්ක කරගෙන, ඒක විශේෂිත කරලා, ඒකට කොටු කරලා පනත් කෙටුම්පතක් ගෙන එන්නේ. කලින් පනතෙන් ඕනෑම කෙනෙකු ඇතුළට දාන්න පුළුවන්. පසුගිය අවුරුදු පහ හයේ එහෙම ඇතුළට දාපු කට්ටිය කවුද කියලා බලන්න. ඒ ගැන විපක්ෂ නායකතුමාම කිව්වා. හිජාස් හිස්බුල්ලාත් ඇතුළට දැම්මා; තවත් කට්ටිය දැම්මා. එහෙම කරන්න බැරි වෙන්න අදාළ සංශෝධන සහිතව තමයි අලුත් පනත් කෙටුම්පත ගෙන එන්නේ. ඔබතුමන්ලාත් ඒක දන්නවා. අධිකරණ ඇමතිතුමා ඒ ගැන පැහැදිලි කළා. එහෙම පැහැදිලි කරලා තිබියදීත් විවිධ දේවල් කියනවා.

අනෙක් පැත්තෙන්, සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පත අරගෙන බලමු. මේ රටේ සංවිධානාත්මක අපරාධ සම්බන්ධයෙන් වෙනම නීතියක් තිබුණේ නැහැ. හැබැයි, එවැන්නක් ඕනෑ නැද්ද? මේ කථා කරන සමහරු ටැටූ ගැනයි, කොණ්ඩ ගැනයි පව කිව්වා. ඒවා අමු බොරු නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තවත් විනාඩියක කාලයක් ලබා දෙන්න.

එහෙම පව කියන, බොරු කියන මන්ත්‍රීවරුන් ඉන්නවා. අධිකරණ ඇමතිතුමා නැවත නැවතත් පැහැදිලි කළා, මොකක්ද ඒ ටැටූ කථාව කියලා. එහෙම කියලා තිබියදීත් ඒ අය විවිධ දේවල් කියනවා. මේ රටේ හැම ගමකම සංවිධානාත්මක අපරාධ, මත්ද්‍රව්‍ය, අවි ආයුධ නිසා විනාශ වෙච්ච ජීවිත කොච්චරක් නම් තිබෙනවාද? ඒ පැත්ත ගැන කථා කරන්නේ නැතිව, දැන් දැන් ජේන, දැන් දැන් හසු වන සංවිධානාත්මක අපරාධ කථා ඔක්කෝම තිබියදී මේගොල්ලෝ ඒකට විරුද්ධ වෙනවා; ඒ ගැන වැරදි, විකෘති අදහසක් හදනවා. විශේෂයෙන්ම සංවිධානාත්මක අපරාධ සම්බන්ධව නීතියක් තිබුණේ නැහැ. එවැනි නීතියක් තිබුණේ නැති හින්දා තමයි ඔබතුමන්ලාගේ පක්ෂයේ අර කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජිකයාට පුළුවන් වුණේ, DO ගහලා රඳවාගෙන හිටපු සංවිධානාත්මක අපරාධ කල්ලි නායකයෙකු රිමාන්ඩ් බන්ධනාගාරගත කරන්නම් කියලා හිටපු අධිකරණ ඇමතිගේ පුතාත් එක්ක ගිහිල්ලා කප්පම් ගන්න. සංවිධානාත්මක අපරාධ කල්ලි නායකයන්ගේ තොරතුරු ඔවුන් අතේම තිබියදී ඒ අපරාධකරුවන් ආයුධ පෙන්වන්නය කියා අරගෙන ගිහින් මරා දමලා කථාව ඉවර කරන්න පුළුවන් වුණේ ඒ නිසායි. ඒක විධිමත් විධියට කරන්න ඕනෑ නැද්ද? මේ රටේ සංවිධානාත්මක අපරාධ නායකයන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම විධිමත්ව කරන්න ඕනෑ නැද්ද? ආයෙත් ආයුධ පෙන්වන්න ගෙන යන එකයි, කප්පම් ගන්න එකයිද කරගෙන යන්න ඕනෑ? අපි එහෙම කරන්න දෙන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක ශිෂ්ට සම්පන්න වෙන්න ඕනෑ. මේ සඳහා නීතියක් හදන්නත් ඕනෑ; හදන නීතිය ශිෂ්ටසම්පන්න විධියට හදන්නත් ඕනෑ. ඒ අරමුණින් තමයි මේ කියපු පනත් කෙටුම්පත් දෙක ගෙන එන්නේ. සුපුරුදු පරිදි ඒවා නැවත වතාවක් කලින් පනතට කොටු කරලා කැත කථා හදන්න එපා කියලා අපි බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු පී. රුවන් සෙනරත් නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.14]

ගරු පී. රුවන් සෙනරත් මහතා (පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பீ. ருவன் சென‌ரத் - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சிப் பிரதி அமைச்சர்)
(The Hon. P. Ruwan Senarath - Deputy Minister of Provincial Councils and Local Government)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉතා වැදගත් පනත් කෙටුම්පතක් ගැනයි විවාද කරන්නේ. ඒ, ජලභීතිකා රෝගය තුරන් කිරීමේ සහ සුනඛයන් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පතයි. අද විවාදයට භාජන කරන මේ පනත් කෙටුම්පත කාලීනව ඉතා වැදගත් පනත් කෙටුම්පතක් විධියට අපට සලකන්න පුළුවන්කම තිබෙනවා. විශේෂයෙන් අපි මේ පනත් කෙටුම්පත ගැන මේ විධියට විවාද කරද්දී කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශයත්, කෘෂිකර්ම, පශු සම්පත් අමාත්‍යාංශයත්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයත්, විවිධ සිවිල් සංවිධානත් කියන මේ සියල්ල එකට එකතු වෙලා මේ පිළිබඳව අදහස් යෝජනා ඒක රාශි කරලා තමයි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේ පනත් කෙටුම්පත පිළිබඳව අද විවාද කරනවා වාගේම, අද දවසේ එය විවාදයට විතරක් සීමා වෙනවා. ඉදිරි දවසකදී මෙය සම්මත කර ගැනීමට පුළුවන්. මොකද, මේ පනත් කෙටුම්පතේ තිබෙන

[ගරු පී. රුවන් සෙනරත් මහතා]

වැදගත්කම නිසාම තවදුරටත් කරන්න අවශ්‍ය සංශෝධන තිබෙනවා නම් ඒ සංශෝධනත් එකතු කරලා මේ පනත් කෙටුම්පත සම්මත කරන්න අපට පුළුවන්.

අද අප සූදානම් වෙලා ආවේ ජලභීතිකා රෝගය තුරන් කිරීමේ සහ සුනඛයන් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත පිළිබඳව විවාද කරන්නයි. අප ආවේ ජලභීතිකා රෝගය ගැන කථා කරන්න වුණත් විපක්ෂයට වෙනත් භීතිකාවක් වැලඳිලා මෙතැන වෙන මොනවාද දේවල් ටිකක් කථා කරමින් ඉන්නවා. ප්‍රශ්නය ඒකයි. අපට තේරෙන්නේ නැහැ, ඒ අයට මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් මේ පනත් කෙටුම්පතේ තිබෙන කාරණා ගැනද කථා කරන්නේ කියන ප්‍රශ්නයත් මතු වෙනවා. මොකද, මීට කලින් කථා කරපු විපක්ෂයේ මන්ත්‍රීතුමා මේ පනත් කෙටුම්පත අතේ තියාගෙන සාවද්‍ය පරාවර්තනයක් සිදු කරන්න ගත්තා. බොරුවටත් වඩා භයානකයි සාවද්‍ය පරාවර්තනය. එතුමා කිව්වා, මේ පනත තුළින් බල්ලන් වෙනුවෙන් බද්දක් අය කරන්න මේ ආණ්ඩුව ලැහැස්ති වෙනවා කියලා. මා ළඟ තිබෙනවා මේ පනත් කෙටුම්පත. රටේ ජනතාව එතුමාගේ බොරුව සහ සාවද්‍ය පරාවර්තනය පිළිබඳව දැන ගන්න ඕනෑ. ඒ නිසා මම සූදානම් ඒ ගැන කියන්න. විශේෂයෙන් ගත්තොත්, මේ පනත් කෙටුම්පතේ තුන්වන පිටුවේ, 7වන වගන්තිය යටතේ බොහොම පැහැදිලිව කරුණු සඳහන්ව තිබෙනවා. මේ අනුව යම් සතෙකු ලියාපදිංචි කර නැත්නම් ඒ ලියාපදිංචි නොකළ සතාගේ අයිතිකරුට අවස්ථා 2ක් දෙනවා; දින 14ක් ඇතුළත සුනඛයා ලියාපදිංචි කිරීමට දැනුවත් කරනවා; ඒ කාලය තුළත් එය නොකළොත් තවත් දින 14ක් දෙනවා; ඒ දින 28 ඇතුළේ ඒක සිදු වුණේ නැත්නම් ඒ පුද්ගලයාගෙන් දඩයක් අය කර ගන්නවා. මෙතැනදී කියැවුණා, බද්දක් අය කර ගන්නවා කියලා. අපි දන්නේ නැහැ, දඩය සහ බද්ද කියන දෙකම එකක්ද කියලා. විපක්ෂයට අනුව නම් ඒ දෙක එකක් වෙන්න ඇති. හැබැයි, මේ පනත් කෙටුම්පතෙහි බොහොම පැහැදිලිව සඳහන් වෙනවා, එවැනි දඩයක් අය කර ගන්න බලය තිබෙනවා කියලා. ඒ දඩය අය වන එක වළක්වා ගන්න ඕනෑම කෙනෙකුට පුළුවන්කම තිබෙනවා, සුරතල් සතෙකු ඇති කරනවා නම්, ඒ සතා අදාළ කාල සීමාවේදී ලියාපදිංචි කරවාගෙන. ඒ සතා ලියාපදිංචි කරවා ගන්නවා නම් ඒ දඩය ඔහුට පැනවෙන්නේ නැහැ. හැබැයි, ඒක බද්දක්ද? බද්දක් නම් අනිවාර්යයෙන්ම, නිශ්චිතව ගෙවන්න ඕනෑ. එහෙම නම්, විපක්ෂයේ මෙතුමන්ලා මොකක්ද මේ කරන්න හදන්නේ? මේ කරන්න හදන්නේ සමාජය තුළ ඉතා වැරදි දෙයක්, බොරුවක් කීම සහ සාවද්‍ය පරාවර්තනයක් ඇති කිරීමයි. මේ මොහොතේ විපක්ෂයේ කල්ලියක් ඒ කටයුත්ත සිදු කරනවා. ඔවුන් කථා කරන්නේ මේ පනත් කෙටුම්පතේ තිබෙන දේවල්ද, එහෙම නැත්නම් තමන්ගේ හිතට එන දේවල්ද කියන එක අපට ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඒ මන්ත්‍රීතුමන්ලාට කියන්න ඕනෑ, බල්ලන්ට බදු ගහලා සල්ලි අය කර ගන්න තරම් අපේ ආණ්ඩුවට අහේනියක් නැති බව. ඒ පිළිබඳවත් විශේෂයෙන් මතක් කරන්න ඕනෑ.

ජලභීතිකාව ගැන කථා කරන කොට, විපක්ෂයට වැලඳිච්ච භීතිකාව මොකක්ද කියන එක රටම බොහොම පැහැදිලිව දන්නවා. ඒ නිසා ජලභීතිකාවට දෙන vaccine එක දීලා විපක්ෂයට හැදිච්ච භීතිකාව සමනය කරන්න පුළුවන් වෙයිද කියා වෙනම බලන්න වෙනවා. ඒකට අදාළ කරන පරීක්ෂණ සහ ප්‍රතිකාර වෙනම කරන්න වෙනවා. ඒ නිසා ඒ පිළිබඳව වෙනම විවාදයක් පවත්වන්න වෙයි. අද උදේ ඉඳලා හවස් වනකල් විපක්ෂයේ මන්ත්‍රීවරු ජලභීතිකා රෝගය තුරන් කිරීමේ සහ සුනඛයන් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත සම්බන්ධව කථා කරනවා වෙනුවට තමන්ට හිතෙන, තමන්ට වැලඳිච්ච භීතිකාව පිළිබඳව ඔහේ කියවන්න පටන් ගෙන තිබෙනවා. ඒ නිසා ඒ පිළිබඳවත් විශේෂයෙන්ම අවධාරණය කරන්න ඕනෑ. මේ පනත් කෙටුම්පත ඉතා වැදගත් පනත් කෙටුම්පතක්. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු මේ පිළිබඳව ඉතා හොඳින් අධ්‍යයනය කරලා, අවශ්‍ය කරුණු කාරණා පැහැදිලි කළා. මේක කාලීන අවශ්‍යතාවක්.

මීට පෙර ජලභීතිකා රෝගය මර්දනය පිළිබඳව 1893 අංක 7 දරන ආඥාපනත තිබුණා. ඒ වාගේම සුනඛයන් ලියාපදිංචි කිරීමට අදාළව 1901 අංක 25 දරන ආඥාපනත තිබුණා. මේ පැරණි ආඥාපනත් දෙක අහෝසි කරලා, ඒවායේ කරුණුත් එකතු කරලා, අලුත් කරුණු සහ නවීන තත්ත්වයන්ට ගැළපෙන විධියට තමයි මේ පනත් කෙටුම්පත සකස් කරලා තිබෙන්නේ. විශේෂයෙන්ම ලෝකය වේගයෙන් වෙනස් වෙමින් තිබෙනවා; අලුත් තත්ත්වයන් නිර්මාණය වෙමින් තිබෙනවා. ඒ නිසා ඒ සියලු තත්ත්වයන්ට ගැළපෙන ආකාරයට ලෝක සෞඛ්‍ය සංවිධානයේ දර්ශක අනුව සියල්ල සැලසුම් කරලා, ඒ සියලු කණ්ඩායම් ඒකරාශි කරලා තමයි අප මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ විවාද කිරීම සඳහා ගෙනැල්ලා තිබෙන්නේ.

මේ පනත් කෙටුම්පතේ විශේෂත්වයක් තිබෙනවා. මීට කලින් අවිධිමත්ව තිබුණු දෙයක් මේ පනත් කෙටුම්පත මඟින් ඉතා හොඳින් විධිමත් කරලා, වග කිව යුත්තන් කවුද කියන එක මෙහි ඉතා හොඳින් පැහැදිලි කරලා තිබෙනවා. විශේෂයෙන් ගත්තොත්, සෞඛ්‍ය අමාත්‍යාංශයට ඒ සම්බන්ධයෙන් වගකීමක් තිබෙනවා. ඒ වාගේම පශු සම්පත් අමාත්‍යාංශයටත් වගකීමක් තිබෙනවා. ඒ වාගේම රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයට මේකේ සුවිශාල වගකීමක් තිබෙනවා. ඒ නිසා මේ අමාත්‍යාංශ තුනම එකට එකතු වෙලා, ඒ වාගේම පරිසර සංවිධාන, සිවිල් සංවිධාන සහ අනෙකුත් විවිධ කණ්ඩායම් ඒකරාශි කරගෙන, මුළු මහත් ප්‍රජාවම ඒකරාශි වෙලා තමයි ඇත්තටම මේ ප්‍රශ්නයට ස්ථිරසාර විසඳුමක් සොයා ගත යුතුව තිබෙන්නේ. එම නිසා සෞඛ්‍ය අමාත්‍යාංශයට විතරක් ඒ වගකීම පවරන්න අපට හැකියාවක් නැහැ. පශු සම්පත් අමාත්‍යාංශයට විතරක් ඒ වගකීම පවරන්න හැකියාවක් නැහැ. පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයට, ප්‍රාදේශීය සභාවලට, නගර සභාවලට හෝ මහා නගර සභාවලට විතරක් ඒ වගකීම පවරන්න හැකියාවක් නැහැ. අපේ රටේ පසුගිය කාල සීමාව තුළ ජලභීතිකා රෝගය වැලඳිච්ච සතුන් විසින් සපා කෑම නිසා මරණ ඇති වුණා වාගේම අයලේ යන සතුන් හේතුවෙන්, මහා පාරේ ඉන්න සුනඛයන් හේතුවෙන් ඇති වෙච්ච රිය අනතුරු නිසාත් සෞඛ්‍ය අමාත්‍යාංශයට මහජන ධනය විශාල ප්‍රමාණයක් දරන්න සිදු වෙලා තිබෙනවා, ඒ ප්‍රතිකාර ඇතුළු සියලු දේට.

මේ පනත් කෙටුම්පත සකස් කරලා තිබෙන්නේ මෙකී ගැටලුව සඳහා ස්ථිරසාර විසඳුමක් බලාපොරොත්තුවෙන්. අපි බලාපොරොත්තු වෙනවා, වර්ෂ 2030 වනකොට ජලභීතිකා රෝගය වැලඳිලා මිය යන සංඛ්‍යාව බින්දුව - zero - කර ගන්න. ඒ වාගේම, අපේ රට තුළින් ජලභීතිකා රෝගය තුරන් කර ගැනීමට අවශ්‍ය මූලික මැදිහත්වීම වර්ෂ 2030 වනකොට ක්‍රියාත්මක කරන්න තමයි සැලසුම් කරමින් තිබෙන්නේ. ඒ නිසා මේ පනත් කෙටුම්පත තුළින් ජලභීතිකා රෝගය තුරන් කිරීමේ ජාතික උපදේශක කමිටුව පිහිටුවන්න පුළුවන්කම තිබෙනවා. ඒ සඳහා මේ පනත් කෙටුම්පතින් අවස්ථාව ලබා දීලා තිබෙනවා. ඒ වාගේම ඒ උපදේශන කමිටුවට සුවිශාල කාර්යභාරයක් පැවරෙනවා. නිල බලයෙන් පත් වන සාමාජිකයන් එම ජාතික උපදේශන කමිටුවේ ඉන්නවා. ඒ උපදේශන කමිටුවට අවශ්‍ය නම්, අවශ්‍යතාව මත තිරණ අරගෙන පළාත් මට්ටමේ කමිටුවක් වාගේම දිස්ත්‍රික් මට්ටමේ කමිටුවක් පිහිටුවන්නත් පුළුවන්කම තිබෙනවා. ඒ වාගේම ජලභීතිකා රෝගය තුරන් කිරීමේ ප්‍රාදේශීය උපදේශක කමිටු පිහිටුවන්නත් පුළුවන්කම තිබෙනවා. මේ පනත් කෙටුම්පතට අනුව අදාළ පළාත් පාලන ආයතනයේ සභාපතිවරයාට එම කමිටුවේ සභාපතිවරයා ලෙස, එහි නිසි බලධාරියා ලෙස කටයුතු කිරීමට බලය පවරා තිබෙනවා. ඒ නිසා අපි විශ්වාස කරනවා, ඉතා හොඳ සංවිධිත සැලැස්මක් සහිතව අප

මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙනවා කියලා. මේ පනත ක්‍රියාත්මක කරද්දී මෙයට රෙගුලාසි එකතු කරන්න පුළුවන්කම තිබෙනවා.

විශේෂයෙන් ගත්තොත්, අභිජනන මධ්‍යස්ථාන විධිමත් කිරීම ඉතා වැදගත්. ඒ අභිජනන මධ්‍යස්ථාන ඉතා අවිධිමත් විධියට අපේ රටේ පවත්වාගෙන යමින් තිබෙනවා. ඒ නිසා මේවා විධිමත් කරන්න ඕනෑ. ඒ සඳහා අවශ්‍ය කරන වගන්ති පනත් කෙටුම්පතට එකතු කරලා තිබෙනවා. ඒ පිළිබඳවත් අපි මතක් කරන්න ඕනෑ. ඒ සඳහා කොන්දේසි ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ කොන්දේසි කඩ කරනවා නම් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කරන නීතිමය ක්‍රියාමාර්ග ගන්න පුළුවන්. මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයකින් දඩ මුදලක් නියම කරන්න පුළුවන්කම හෝ දඬුවම් නියම කරන්න පුළුවන් අවස්ථා මේකෙන් හදලා තිබෙනවා. මෙවැනි සැලැස්මක් මේ ජලභීතිකා රෝගය තුරන් කිරීමේ සහ සුනඛයන් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත තුළ ඉතා පැහැදිලිව සකස් කරලා තිබෙනවා.

විශේෂයෙන් ගත්තොත් කොටස් හතක් ඇතුළේ වගන්ති 2 සිට 34 දක්වා වන හැම වගන්තියකම, ඒ වාගේම උප වගන්ති ඇතුළේ ඉතා පැහැදිලිව මේ සමස්ත ක්‍රියාවලියම ආවරණය වන විධියට මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වාගේම 35 වගන්තිය තුළින් ආනුෂංගික කාරණා සියල්ල පැහැදිලි කර තිබෙනවා, මේ පනත් කෙටුම්පත ඇතුළේ කොහොමද මේක ක්‍රියාත්මක වෙන්නේ කියලා. ඒ වාගේම වැරදි කරන අයට දඬුවම් පමුණුවන ආකාරයත් මේ පනත් කෙටුම්පත තුළ ඉදිරිපත් කර තිබෙනවා. මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ නඩු විභාගයකින් ඔවුන්ට දඬුවම් පැමිණවීම හෝ එහෙම නැත්නම් මහෙස්ත්‍රාත්වරයා නියම කරනු ලබන රුපියල් දස දහසක දඩ මුදලකට යටත් කරන්න පුළුවන්කම මේ පනත් කෙටුම්පත ඇතුළේ තිබෙනවා. එවැනි වගන්ති ගණනාවක් සහිතව මෙය ඉදිරිපත් කර තිබෙනවා.

අපි විශ්වාස කරනවා, මේ මොහොතේ ඉතා වැදගත්, කාලීන මාතෘකාවක් වන, අපේ රටේ මුළු මහත් සමාජයටම විශාල බලපෑමක් තිබෙන මේ ප්‍රශ්නයට අදාළව මේ ඉදිරිපත් කරපු පනත් කෙටුම්පත ඉතා වැදගත් පනත් කෙටුම්පතක්ය කියා. එමෙන්ම මේ ක්‍රියාවලිය ඇතුළේ ඉතා හොඳ සංවිධිත සැලැස්මක් සහිතව මේ කටයුතු සිදු කරන්න පුළුවන්කම තිබෙනවා. ඒ නිසා ජලභීතිකා රෝගය රටින් තුරන් කිරීමේ ජාතික වැඩසටහන ක්‍රියාත්මක කරන්න සියලු දෙනාගේම සහයෝගය අපි බලාපොරොත්තු වනවා. 2030 වෙනකොට ජලභීතිකා රෝගය හේතුවෙන් අපේ රටේ මරණ සිදු නොවෙන්න අපි මේ පනත, මේ වගන්ති ක්‍රියාත්මක කරන්නත් සැලසුම් කර තිබෙනවා. බොහොම ස්තුතියි, හැමෝටම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, ජලභීතිකා රෝගය තුරන් කිරීමේ සහ සුනඛයන් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදය කල් තැබීම, ගරු අමාත්‍යතුමා.

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත දෙවන වර කියවීම පිළිබඳ විවාදය ඉදිරි දිනයකදී තවදුරටත් පැවැත්වීම පිණිස කල් තැබිය යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ඊට අනුකූලව විවාදය කල් තබන ලදී.
அதன்படி விவாதம் ஒத்திவைக்கப்பட்டது.
The Debate stood adjourned accordingly.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු නිශාන්ත පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

බෙන්තර, කරන්දෙණිය සහ ඇල්පිටිය නව සංචාරක කලාප ලෙස සංවර්ධනය කිරීම
பெந்தர, கரந்தெனிய மற்றும் எல்பிட்டிய பிரதேசங்களை புதிய சுற்றுலா வலயங்களாக அபிவிருத்தி செய்தல்
DEVELOPMENT OF BENTHARA, KARANDENIYA AND ELPITIYA AS NEW TOURIST ZONES

[අ.භා. 5.26]

ගරු නිශාන්ත පෙරේරා මහතා
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ඉතා වේගවත් වර්ධනයක් අත්පත් කර ගනිමින් ඇති මේ වකවානුව තුළ ඊට ගැළපෙන ආකාරයට "බෙන්තර" නම් වූ ලොව ආකර්ෂණීය වූ වෙරළ කලාපයත්, ලොව අති විශිෂ්ට කුරුඳු නිෂ්පාදනය කරන කරන්දෙණිය ප්‍රදේශයත්, තේ නිෂ්පාදනයෙන් ප්‍රමුඛ කලාපයක් වන ඇල්පිටිය ප්‍රදේශයත්, ආශ්‍රිත කලාපය නව සංචාරක අත්දැකීම් ලබා දෙන කලාපයන් ලෙස සංවර්ධනය කර, ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථික හා සමාජමය සංවර්ධනය ලබා දෙන කලාපයන් ලෙස පරිවර්තනය කිරීමට අවශ්‍ය පියවර ගැනීමට මෙම ගරු සභාවට යෝජනා කරමි".

බෙන්තර සහ ඇල්පිටිය, කරන්දෙණිය කියන්නේ ලෝකය මවිත වන පාරිසරික, සංස්කෘතික ස්ථාන ඇති ඒ වාගේම නිෂ්පාදන කර්මාන්ත බහුල සංචාරක කලාපයක්. මේකට ඉතිහාසයක් තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. 17 වන සියවසේ, පෘතුගීසීන් විසින් බෙන්තර ගඟ ආශ්‍රිතව කොටුවක් නිර්මාණය කරලා තිබෙනවා. එම කොටුව ප්‍රසිද්ධ වෙන්නේ "පරංගි කොටුව" කියන නමින්. 17වන සියවසේ පෘතුගීසි යුගයේ තමයි එම කටයුත්ත සිද්ධ වෙලා තිබෙන්නේ. ඊට පස්සේ ලන්දේසි ආක්‍රමණයත් එක්ක එය විවේකාගාරයක් - rest house එකක් - බවට පරිවර්තනය වෙනවා. ඊට පස්සේ 19 වන සියවසේ බ්‍රිතාන්‍ය පාලනයත් එක්ක එය තවත් වැඩිදියුණු වෙනවා.

[ගරු නිශාන්ත පෙරේරා මහතා]

ලංකාවට නිදහස ලැබීමෙන් පසුව 1960 දශකයේ සිට 1966 දක්වා කාලයේ ලංකාවේ සංචාරක මණ්ඩලය මඟින් එය තවත් විධිමත් කර තිබෙනවා. 1969දී තමයි බෙන්තොට ජාතික සංචාරක නිකේතනය ප්‍රථමයෙන්ම පටන් ගත්තේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ අනුව සංචාරක කර්මාන්තයට බෙන්තර ප්‍රදේශය ඓතිහාසික වටිනාකමක් එකතු කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකයේ ප්‍රකට ගෘහ නිර්මාණ ශිල්පියා වන ජෙෆ්රි බාවා මහතාගේ -මෙම පාර්ලිමේන්තු ගොඩනැඟිල්ල නිර්මාණය කර තිබෙන්නෙත් එතුමායි- පර්යේෂණාගාරයක් බඳු වෙච්ච අක්කර 25කින් යුත් ලුණුගඟ උද්‍යානය ඒ ප්‍රදේශයේ පිහිටා තිබෙනවා. ඒ වාගේම බෙන්තර ප්‍රදේශයේ සුන්දර වෙරළ තීරයක් ද තිබෙනවා. බෙන්තර නගරය අභ්‍යන්තරයට යනකොට බෙන්තර ගඟ ආශ්‍රිතව, ඉතා වටිනා සංස්කෘතික උරුමයන් තිබෙන රජමහා විහාර පහක් තිබෙනවා. බෙන්තර වනවාස රජමහා විහාරය, බෙන්තර ගලපාත රජමහා විහාරය ඇතුළු රජමහා විහාර පහක් තිබෙන, ඒ වාගේම සංචාරකයන් මවිත කරන සුන්දර පරිසරයක් තිබෙනවා. එහි සාමාන්‍යයෙන් අක්කර 1500කට අධික සංචාරක මණ්ඩලයට අයිති භූමි ප්‍රදේශයකුත් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තිබෙන්නේ තව විනාඩි දෙකක කාලයක් පමණයි.

ගරු නිශාන්ත පෙරේරා මහතා
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම කරන්දෙණිය ප්‍රදේශය ගැනත් කියන්න ඕනෑ. ලෝකයේ කුරුඳු වර්ග දෙකයි තිබෙන්නේ. ඒ තමයි, සත්‍ය කුරුඳු සහ කැසියා කුරුඳු. ලෝකයේ හොඳම කුරුඳු තිබෙන්නේ ලංකාවේ කරන්දෙණිය ප්‍රදේශයේ. අපි 2025 වර්ෂයේදී කුරුඳුවලින් රුපියල් කෝටි 8,000ක වාගේ ආදායමක් රටට ලබා දීලා තිබෙනවා. ඒ වාගේම 2026 වර්ෂයේ මේ වනකොට රුපියල් කෝටි 6,000ක මුදලක් අපි කුරුඳුවලින් රටට ලබා දීලා තිබෙනවා. කුරුඳුවල අගය එකතු කිරීමේ නිෂ්පාදන කිහිපයක්ම තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකය අපව හඳුනා ගන්න උපකාරී වූ තව භෝගයක් තමයි කුරුඳු. කුරුඳු ගත්තාම, ලෝකයේ කුරුඳු වර්ග දෙකයි තිබෙන්නේ. ඒ, සත්‍ය කුරුඳු සහ කැසියා කුරුඳු. ලෝකයේ සත්‍ය කුරුඳු තිබෙන්නේ ලංකාවේ. සත්‍ය කුරුඳුවල බිම කරන්දෙණිය. ඇත්තටම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වනකොට හරි නම් කරන්දෙණිය cinnamon city එක බවට පත් වෙන්න ඕනෑ. කරන්දෙණිය ප්‍රදේශයේ කුරුඳු කර්මාන්තයේ නියැලී ඉන්න කර්මාන්තකරුවන් කිහිපදෙනෙක් ඉන්නවා. විශේෂයෙන්ම කිව්වොත්, Kumara Cinnamon Exporters (Pvt.) Limited, Knuckles Valley Plantations (Pvt.) Limited, SDS Spices (Pvt.) Limited හා New Lanka Cinnamon (Pvt.) Limited කියන ආයතන කුරුඳුවල අගය එකතු කිරීමේ නිෂ්පාදනවලින් සංචාරකයන් මවිත වන විධියට, සංචාරකයන් ආකර්ෂණය කර ගන්නා විධියට අද ඒ පළාත පත් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද කුරුඳු විවිධ ආකාරයෙන් අපනයනය කරනවා. කුරුඳු පානයක් විධියට, ඒ වාගේම සුවඳ විලවුන් විධියට, පවුඩර් විධියට හා ඖෂධ විධියට අපනයනය කරනවා. ලෝකයේ රටවල් විශාල ප්‍රමාණයක් අපේ මේ නිෂ්පාදන ගන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එම නිසා මම ගරු සභාවට යෝජනා කරන්නේ, ලෝකයේ වෙනත් කිසිදු රටක නැති මේ දේවල් ගැන අපි වැඩි අවධානය යොමු කරන්න ඕනෑය කියන එකයි.

ඒ වාගේම අපේ ඇල්පිටිය ප්‍රදේශය ගැනත් කියන්න ඕනෑ. ලෝකයේ ප්‍රසිද්ධ කළු තේ - black tea - හැදෙන්නේ ඇල්පිටිය ප්‍රදේශයේ. මට මතකයි, සිදත් වෙත්තමුනි කියන ක්‍රීඩකයා ලෝඩ්ස් ක්‍රිකට් ක්‍රීඩාංගණයේදී ලකුණු 190ක් ලබා ගන්නකොට කිව්වේ, "තේ තිබෙන රටේ ක්‍රීඩකයා" කියලායි. අපේ රටට තිබුණු brand එක තමයි, “Ceylon Tea”. සිදත් වෙත්තමුනි ක්‍රීඩකයා ලකුණු 190 ලබා ගන්නකොට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔහුව නම් කළේ එහෙමයි. ලෝකය අපව හඳුනාගත්තේ එහෙමයි. අපේ රටේ brand එක වුණේ තේ - tea.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මේ කලාපය ගත්තොත් තේ විතරක් නොවෙයි, තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්ගේ ජීවිතය හා සම්බන්ධ ගල් ලෙන, ඒ වාගේම කළුදිය පොකුණ, අඩාහැලෙන දියඇල්ල ආදී දියඇලි සහිත මනරම් පරිසරයක් තිබෙන කලාපයක්. ඒ වාගේම තේ වගාව සහිත මේ භූමියේ අභ්‍යන්තරයට යනකොට බෙන්තර, ඇල්පිටිය, කරන්දෙණිය කියන මේ කලාපය ලෝකයේ වෙනත් කිසිදු රටක නැති දේවල් තිබෙන සංචාරක කලාපයක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එවර්ග්‍රීන් සමූහ ව්‍යාපාරය, ඒ වාගේම අතුකෝරළ සමූහ ව්‍යාපාරය අද අපේ රටට ඩොලර් ගෙනෙන ව්‍යාපාර බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මම ගරු සභාවට යෝජනා කර සිටින්නේ, ඓතිහාසික වටිනාකමක් තිබෙන ලෝකයේ වෙනත් කිසිදු රටක නැති මෙවැනි භූමියක් සංවර්ධනය කළ යුතු බවයි.

විශේෂයෙන්ම වර්තමානයේ මැදපෙරදිග පවතින යුද්ධමය තත්ත්වයත් එක්ක අද වන විට සංචාරකයින් බහුලව අපේ රටට ආකර්ෂණය වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා බෙන්තර, ඇල්පිටිය, කරන්දෙණිය මූලික කර ගත් මේ කලාපය, සංචාරකයින් ආකර්ෂණය වන සංචාරක කලාපයක් විධියට සංවර්ධනය කරන්න කියන ඉල්ලීම තමයි මා මෙම යෝජනාවෙන් කරන්නේ.

ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කර අදහස් දැක්වීම, ගරු හසාරා ලියනගේ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.34]

ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹசாரா லியனகே)
(The Hon. (Mrs.) Hasara Liyanage, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී ගරු නිශාන්ත පෙරේරා මන්ත්‍රීතුමා ගෙනා යෝජනාව ස්ථිර කරමින් අදහස් දැක්වීමට අවස්ථාවක් ලබා දීම සම්බන්ධව ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

විශේෂයෙන්ම අද වන විට අපි දන්නවා, බෙන්තර මුහුදු තීරය ලෝකයේ ඉතා ප්‍රකට, සංචාරක ආකර්ෂණය දිනාගත් මුහුදු තීරයක් බවට පත්වෙලා තිබෙන බව. නමුත් ප්‍රායෝගිකව ගත්තාම

අපි දන්නවා, Bentota water sports සහ එම ප්‍රදේශයේ ආකර්ෂණීය මුහුදු තීරයේ සුන්දරත්වය විඳලා, බොහෝ විට වැලිගම සහ හිරිකැටිය ප්‍රදේශවලට ගමන් කිරීම තමයි සාමාන්‍යයෙන් සංචාරකයින්ගේ tour package එකක include වෙලා තිබෙන්නේ කියලා. හැබැයි, ලෝකයේ සංචාරකයින් විධියට ගමන් කරන මේ නව පරම්පරාව, experience tourism, එහෙම නැත්නම් tourism කියන එක අත්විඳින්න විශාල නැඹුරුතාවක් දක්වනවා. ඒ වාගේම තමයි, අද වන විට activity-based tourismවලට ලෝකයේ දැඩි ජනප්‍රියත්වයක් හිමි වෙමින් පවතිනවා. එවන් අවස්ථාවකදී මේ coastal belt එකෙන් එහාට, මේ සංචාරක කර්මාන්තයේ සැබෑ ප්‍රතිලාභ ජනතාවට ලබා දෙන්නේ කෙසේද යන්න පිළිබඳව අපට අවධානය යොමු කරන්න මේක ඉතාම හොඳ යෝජනාවක් වනවා.

විශේෂයෙන් ගත්තොත් කෘෂි කර්මාන්තය පදනම් කරගෙන අපට ecotourism එහෙම නැත්නම් agritourismවලට යන්නත්, ඒ වාගේම අපේ රටේ තිබෙන විශිෂ්ට ආහාර සංස්කෘතිය පදනම් කරගෙන culinary tourismවලට යන්නත් අපට පුළුවන්කම තිබෙනවා. ඒ වාගේම සංස්කෘතික වශයෙන් - culturally - ගත්තොත්, "බෙන්තර සම්ප්‍රදාය" කියලා අද දවසේදී වියැකෙමින් පවතින සම්ප්‍රදායකුත් අපට තිබෙනවා.

ඒ වාගේම කරන්දෙණිය සහ ඇල්පිටිය ප්‍රදේශ මූලික කරගෙන භෝග වගාවන් විධියට කුරුඳු සහ තේ වගාවත් අපට දකින්න පුළුවන්. මේ හරහා විවිධ අතුරු නිෂ්පාදන - byproducts - කිරීමේ හැකියාවකුත් තිබෙන නිසා, මා අර කලින් සඳහන් කළ experience tourism එහෙම නැත්නම් activity-based tourism සඳහා හොඳ විභවයක් පවතින tour package එකක් අපට මේ ප්‍රදේශ තුන ඉලක්ක කරගෙන නිර්මාණය කිරීමේ හැකියාවක් පවතිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තමයි අපි මෙහිදී අවධානය යොමුකරන්න ඕනෑ, අපේ වත්මන් රජයේ සංචාරක ප්‍රතිපත්තියේ එක් මූලධර්මයක් වන community-based tourism කියන එක පිළිබඳව. ඒ කියන්නේ, ග්‍රාමීය දිළිඳුකම තුරන් කිරීම සඳහා ගමේ සිටින ජනතාව අපේ ආර්ථිකයට දායක කර ගන්නේ කොහොමද කියන එක. එතැනදී විශේෂයෙන්ම මම අවධානය යොමු කරනවා, women-led tourismවලට මේක හොඳ අවස්ථාවක් කියලා. අපි දන්නවා, අපේ රටේ ශ්‍රම බලකායට එකතු වන කාන්තාවන් ගත්තොත් සියයට 36ක වාගේ පරාසයක තමයි හැමදාම වාගේ තිබෙන්නේ කියලා. ඉතින් මම හිතනවා, ග්‍රාමීය වශයෙන් කාන්තාවන් ආර්ථිකයට දායක කර ගන්නත් මේක හොඳ අවස්ථාවක් කියලා. ඒ වාගේම SME tourism sector එකේ small and medium entrepreneursලා මේකට දායක කර ගන්නත් මේ තුළින් අපට අවස්ථාවක් ලැබෙනවා.

ඒ වාගේම මම හිතනවා, මෙහිදී අපට මූලික කරුණු 4ක් ඉලක්ක කරගෙන තමයි මේ සැලැස්මට යන්න වෙන්නේ කියලා. එහිදී විශේෂයෙන්ම අපට ඒකාබද්ධ සැලැස්මක් අවශ්‍ය වනවා. දකුණු පළාත කේන්ද්‍ර කර ගනිමින් රුහුණු සංචාරක කාර්යාංශය, ඒ වාගේම SLTDA එක සහ මධ්‍යම ආණ්ඩුවේ අපේ අමාත්‍යාංශය සම්බන්ධ කර ගත් ඒකාබද්ධ යන්ත්‍රණයක් මෙහිදී අවශ්‍ය වනවා. මම කලින් කිව්වා වාගේ community-based tourism සඳහා ඒ ප්‍රජාව දායක කර ගැනීමට අපට සැලැස්මක් තිබෙන්න ඕනෑ. ඒකට හොඳ විභවයක් තිබෙන තැනක් කියා මා හිතනවා, බෙන්තොට ජන කලා කේන්ද්‍රය. අද වන විට ඌන උපයෝජිත ගොඩනැඟිල්ලක් විධියට තමයි එය තිබෙන්නේ. ඉතින් මේ පිළිබඳව අපි ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලදී සහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවලදී ගොඩක් කථා කරලා තිබෙනවා. ඉතින් මම හිතනවා, ජාතික ශිල්ප සභාව වාගේ විවිධ ආයතන, විවිධ දෙපාර්තමේන්තු හරහා මේ සම්බන්ධව ජනතාවට පුහුණුව ලබා දෙන්නටත් අපට ජන කලා කේන්ද්‍රය පාවිච්චි කරන්න හැකියාව තිබෙනවා කියා. ඉතින් ඒ නිසා මේ සියලු කරුණු ඒකාබද්ධ කර ගනිමින් අවසානයේදී අපට හොඳ marketing strategy එකකටත් යන්න පුළුවන් නම් මා හිතනවා, ගරු අමාත්‍යතුමාගේ සහ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ අවධානයත් මේ සඳහා යොමු වනවා නම්, අලුත් tourism concept එකක්, අලුත් tourism package එකක් අපට බෙන්තර, ඒ වාගේම කරන්දෙණිය සහ ඇල්පිටිය මූලික කර ගනිමින් ගොඩනැඟීමේ හැකියාවක් තිබෙනවා කියලා.

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.38]

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම කලෝචිත වැදගත් යෝජනාවක් මා නියෝජනය කරන ප්‍රදේශයේම ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීතුමා වන නිශාන්ත පෙරේරා මැතිතුමා අද සභාවට ගෙනැත් තිබෙනවා. ඊට අනුමැතිය දෙමින්, ඊට සහයෝගය පළ කිරීමක් හැටියට ප්‍රදේශයේ කෙනෙකු හැටියට මෙම යෝජනාව පිළිබඳව වචන දෙක තුනක් කථා කරන්න මා බලාපොරොත්තු වනවා.

එතුමා සඳහන් කළ පරිදි 1960 දශකය ලංකාවේ වර්තමානයේ තිබෙන මේ සංචාරක ව්‍යාපාරය ආරම්භ කරපු කාලයයි. ලංකාවේ පළමුවෙන්ම සංචාරක ව්‍යාපාරය ආරම්භ කළේ බෙන්තර පුරවරයේයි. එදා නිවාඩු නිකේතනයක් හැටියට තිබුණු බෙන්තර නිවාඩු නිකේතනය පසුව හෝටලයක් බවට පත් කළා. ඩඩ්ලි සේනානායක අගමැතිතුමාගේ රජය යටතේ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා රාජ්‍ය ඇමතිවරයා හැටියටයි ඒක ආරම්භ කළේ. අදත් ඒ සිහිවටන ඵලක එහි දකින්න තිබෙනවා. මට මතක් වනවා, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා මේක පටන් ගත්තාම ඒ කාලයේ දේශපාලන වශයෙන් ප්‍රබල විරෝධතා ආ බව. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරපු ඒ ප්‍රදේශයේ හිටපු මන්ත්‍රීතුමා කිව්වා, අපි බලයට ආවාම මේ හෝටල් රෝහල් බවට පත් කරනවා කියලා. බලයට ආ පසු එතුමාගෙන් ඒ ගැන ඇහුවාම කිව්වා, ආර්ථිකයට වැලඳිව්ව රෝගයට ප්‍රතිකාර කරන තැන් බවට අපි ඒවා පත් කරනවා කියලා. ඉතින් අද වනකොට අපි කවුරුත් - ආණ්ඩු පක්ෂයත්, විපක්ෂයත්- පිළිඅරගෙන තිබෙනවා, සංචාරක ව්‍යාපාරයේ ඇති වටිනාකම.

මම මතක් කරන්න කැමැතියි, බෙන්තර ආකර්ෂණීය වෙරළ තීරයක් තිබෙන බව. නමුත් හෝටලයයි, වෙරළයි අතර ප්‍රදේශයේ විතරයි සංචාරකයින්ට ගැවසෙන්න හැකියාව තිබුණේ. 2001දී ආණ්ඩුවක් පිහිටෙව්වාම අපි කල්පනා කළා, මේ වෙනුවෙන් අලුත් ව්‍යාපෘතියක් බෙන්තරට හඳුන්වා දෙන්න. රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාගේ උපදෙස් පරිදි එදා අපි ආරම්භ කළා, දෙද්දුව සංචාරක ව්‍යාපෘතිය. ගොල්ෆ් පිට්ටනියක්, racecourse එකක්, observation tower එකක් සහ විවිධ ජල ක්‍රීඩා එහි අඩංගු කරන්න තමයි කටයුතු කළේ. පාර්ලිමේන්තුවේදී මම මීට මාස දෙකකට පමණ ඉස්සෙල්ලා අග්‍රාමාත්‍යතුමියගෙන් මේ සම්බන්ධව ප්‍රශ්නයක් ඇහුවා. ඒකට එතුමිය හොඳට පිළිතුරු දුන්නා. මා ළඟ ඒ

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

හැන්සාඩ් වාර්තාව තිබෙනවා. එතුමිය කිව්වා, ඒ ව්‍යාපෘතිය බොහොම හොඳ එකක් හැටියට පිළිගන්නවා කියලා. දැන් ඒක ඉස්සරහට ගෙනියන්න investorsලා හොයමින් සිටිනවා කියන එකත්, මේක හොඳ ව්‍යාපෘතියක් කියන එකත් එතුමියගේ පිළිතුරේ සඳහන් කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියන්න කැමැතියි, ඒ වාගේම එතුමිය දීපු උත්තරයේත් තිබෙනවා, මේ ව්‍යාපෘතිය සඳහා හෙක්ටෙයාර 694.54ක පමණ භූමි ප්‍රමාණයක් දැනටම අත්පත් කරගෙන තිබෙනවා; ඒ වාගේම බෙන්තර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් අත්පත් කර ගැනීමේ කටයුතු 2005දී විතර ආරම්භ කරලා 2017 වසර අවසානය වන විට ඒ අදාළ ඉඩම් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට පවරා තිබෙනවා කියලා. ඒ වාගේම අගමැතිනියගේ උත්තරයේම තිබෙනවා, වන්දි ලැබූ ඉඩම් හිමියන්ගේ සංඛ්‍යාව 1,068ක් කියලා; ගෙවා ඇති වන්දි මුදල රුපියල් 147,328,312.68කි කියලා. ඉතින්, මම මේ කාරණය කිව්වේ මේ ව්‍යාපෘතිය ආරම්භ කරන්න අවශ්‍ය කරන යම් යම් සංශෝධන තිබෙනවා නම් ඒ සංශෝධනත් කරලා, තමුන්නාන්සේලා මේක දියුණු කළොත් ඒ ප්‍රදේශයේ යටිතල පහසුකම් වැඩි වන නිසායි. මොකද, පක්ෂ, පාට භේදවලින් තොරව මේක ඒ පළාතට ඉතාම ගැළපෙන ව්‍යාපෘතියක් කියලා මම හිතනවා. ඒ වාගේම වතුර බෝතලය ගන්නකොටත් ගණන් අහන සුද්දන් නොවෙයි අපි ඉලක්ක කරන්න ඕනෑ. ලෝකයේ ප්‍රධානම පෙළේ සංචාරකයනුයි අපි ආකර්ෂණය කරගන්න ඕනෑ. වැඩියෙන් වියදම් කරන, වැඩි ඩොලර් ප්‍රමාණයක් දවසකට වැය කරන, වැඩි කාලයක් ඒ ප්‍රදේශයේ ගැවසෙන්න පුළුවන් සංචාරකයින් ආකර්ෂණය කරගන්න මේ ව්‍යාපෘතිය ඉදිරියට ගෙනිච්චොත් ඔබතුමාගේ යෝජනාවටම තවත් සුදුසු වෙයි කියලා මම හිතනවා. ඒ ගැන කියන්න මම ඊට වඩා කාලය ගන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

අනෙක් පැත්තෙන් එතුමා යෝජනා කරනවා, කරන්දෙණිය ප්‍රදේශයට සංචාරක ව්‍යාපාරයේ ගැළපීමක් කරන්න කියලා. මොකද, ලංකාවේ හොඳම කුරුඳු නිෂ්පාදනය කරන ප්‍රදේශයක් තමයි කරන්දෙණිය කියන්නේ. මට මතක් වුණා, රනිල් වික්‍රමසිංහ මැතිතුමා ජනාධිපතිවරයා හැටියට - මුදල් ඇමතිවරයා හැටියට - අය වැය ගෙනෙද්දී කරන්දෙණියට විශේෂත්වයක් ලබා දීලා, ඒ ප්‍රදේශයේ කුරුඳු දෙපාර්තමේන්තුවක් ආරම්භ කළ බව. ඇත්තවශයෙන්ම ලංකාවේ වැඩියෙන්ම කුරුඳු වගා කරන දිස්ත්‍රික්කය තමයි ගාල්ල දිස්ත්‍රික්කය. ගරු මන්ත්‍රීතුමා දන්නවා, කරන්දෙණිය, උෆරගහ, මීටියාගොඩ, බටපොළ, අම්බලන්ගොඩ, බලපිටිය සහ ඇල්පිටිය කියන ප්‍රදේශ කුරුඳු වගාවට ඉතාම ප්‍රචලිත ප්‍රදේශ බව. ඒ ප්‍රදේශවල සංචාරක ව්‍යාපාරයට වටිනාකමක් එකතු කරනවා වාගේම ඒවායේ කුරුඳු තළන පුද්ගලයින්ගේ හිඟයකුත් තිබෙනවා. ඒ පිළිබඳවත් අවධානය යොමු කළොත් සුදුසුයි කියලා මම හිතනවා. ඒ කාරණයත් මම අනුමත කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunathilleka)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම තේ කර්මාන්තයට බොහොම ප්‍රසිද්ධ දිස්ත්‍රික්කයක් තමයි අපේ දිස්ත්‍රික්කය. මම කුඩා තේ වතු අධිකාරියේ සභාපතිවරයා හැටියට කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා මම ඒ ගැන දන්නවා. ලංකාවේ කුඩා තේ වතු හිමියන් වැඩියෙන්ම හිටපු දිස්ත්‍රික්ක දෙක තුනෙන් එකක් තමයි ගාල්ල කියන්නේ. ඒ ප්‍රදේශවල අද වනකොට තේ කර්මාන්තය ඉතාම හොඳට ප්‍රචලිත වෙලා තිබෙනවා. මුළු දිස්ත්‍රික්කයම ගත්තත් එහෙමයි. විශේෂයෙන් ඇල්පිටිය ගැන තමයි මම කියන්නේ. ඇල්පිටියේ තේ කර්මාන්තය බොහොම හොඳට තිබෙනවා. ඒ වාගේම එය කෙත් වතු, රබර් වතු, කුරුඳු වතුවලින් ගහන, ස්වභාව සෞන්දර්යයෙන් බොහොම අනූන ප්‍රදේශයක්. ඒ වාගේම සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න ගැළපෙන ප්‍රදේශයක්. ලස්සන දිය ඇලි තැනින් තැන පිහිටා තිබෙනවා. වනවාස සංඝ මූලස්ථානය පිහිටා තිබෙනවා, ඇල්පිටිය කලාපයේ. ඒ වාගේම විහාරස්ථාන තිබෙනවා.

දක්ෂිණ අධිවේගී මාර්ගය පාවිච්චි කරලා ඕනෑම සංචාරකයෙකුට අද වනකොට ඒ ප්‍රදේශවලට ළඟා වෙන්නත් පහසුකම් තිබෙනවා. බෙන්තරට වුණත් එහෙමයි, ඇල්පිටියටත් එහෙමයි, කරන්දෙණියටත් එහෙමයි. ඒ නිසා ඒකත් ඉතාම වටිනා යෝජනාවක් හැටියට ප්‍රකාශ කරමින්, පක්ෂ, පාට භේදයෙන් තොරව පළාතේ දියුණුව ගැන හිතනවා නම් අපි කවුරුත් පුළුවන් හැම ශක්තියක්ම යොදවලා මේ යෝජනාව ඉදිරියට ගෙනියන්න ක්‍රියා කළ යුතුයි කියන එකත් සිහිපත් කරමින්, මටත් වවන දෙක තුනක් හරි කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාටත් ස්තුති කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.45]

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(මාණ්පුමිකු (වෛද්‍යර්) ඉරාමනාදන් අර්ච්චුනා)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද නිශාන්ත පෙරේරා මන්ත්‍රීතුමා විසින් ගෙනාපු බෙන්තොට සහ කරන්දෙණිය ප්‍රදේශවල tourism develop කරන්න ඕනෑ කියන Adjournment Motion එක සම්බන්ධයෙන් කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. ඒ වාගේම මම විශ්වාස කරනවා, මේක හොඳ යෝජනාවක් කියලා. මට සමහර දේවල් දෙමළ භාෂාවෙනුයි කියන්න තිබෙන්නේ. Tourism ගැන කථා කරනකොට සමහර දේවල් දෙමළ භාෂාවෙන් කියන්නයි ඕනෑ. ඒ නිසා මම දෙමළ භාෂාවෙන් කථා කරන්න බලාපොරොත්තු වෙනවා.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, வடக்கைப் பொறுத்தவரை, யாழ்ப்பாணத்திலுள்ள நல்லூர் முருகன் கோயில் உட்பட KKS இலிருந்து பலாலி வரைக்குமான பிரதேசம் சுற்றுலாத்துறைக்கு முக்கியமான இடங்களாகக் காணப்படுகின்றன. இந்த இடங்களை சுற்றுலாத்துறை சார்ந்து அபிவிருத்தி செய்ய வேண்டும் என்பது எல்லோரும் எதிர்பார்க்கின்ற ஒரு விடயமாகும். ஆனால், கடந்த 2 வருடங்களில் NPP அரசாங்கம் இதுவரை வடக்கில் எந்தவொரு சுற்றுலாத்தலத்தையும் அபிவிருத்தி செய்ததாக நான் கேள்விப்படவில்லை. வடக்கைப் பொறுத்தவரை, காரைநகர் சிவன் கோயிலாக இருக்கட்டும், நல்லூர் முருகன் கோயிலாக இருக்கட்டும், KKSஆக இருக்கட்டும், தீவகப் பகுதியாக இருக்கட்டும், இவை அனைத்துமே சுற்றுலாத்தலங்களாக அபிவிருத்தி செய்யக் கூடிய இடங்களாகும். ஆனால், இன்றுவரை NPP அரசாங்கம்

இந்த இடங்களை சுற்றுலாத்தலங்களாக அபிவிருத்தி செய்யவில்லை. எனினும், தெற்கில் கரந்தெனிய, பெந்தோட்டை பிரதேசங்களை சுற்றுலா வலயங்களாக அபிவிருத்தி செய்யுமாறு கொண்டுவரப்படுகின்ற ஒத்திவைப்புப் பிரேரணையை நாங்கள் ஆமோதிக்கின்றோம்.

இவர்கள் வடக்கு மாகாணம் தொடர்பில் சொல்கின்ற மிகப் பெரிய பொய் என்னவென்றால், "நாங்கள் வடக்கிலும் சுற்றுலாத்துறையை அபிவிருத்தி செய்கிறோம்" என்பதுதான். இதற்கு ஓர் உதாரணம்தான், கடைசியாக நடைபெற்ற DCC meetingஇல், Cabinet அமைச்சரான கௌரவ ராமலிங்கம் சந்திரசேகர் அவர்கள் கொண்டுவந்த Greater Jaffna Development Planஇலுள்ள யாழ்ப்பாணக் கோட்டை சம்பந்தமான சுற்றுலா அபிவிருத்தி. யாழ்ப்பாண கோட்டையையும் அதனுடன் தொடர்புடைய குருநகர் பகுதியையும் World Bankஇன் 300 மில்லியன் ரூபாய் நிதியுதவிமூலம் அபிவிருத்தி செய்வதாகக் கூறுகிறார்கள். பிரச்சினை என்னவென்றால், வடக்கு மாகாணத்தில் அபிவிருத்தி செய்யப் படவேண்டிய சுற்றுலாத்தலங்கள் பல இருக்கத்தக்கதாக இதனை முன்மொழிந்து இருப்பதுதான். முக்கியமாக நாங்கள் பலாலி விமான நிலையத்தை அபிவிருத்தி செய்வோமாக இருந்தால், அதை அண்டிய சுற்றுலாத்தலங்கள் மேலும் அபிவிருத்தியடையும். உதாரணத்துக்கு, புலம்பெயர் நாடுகளில் 12 இலட்சம் தமிழ் மக்கள் இருக்கிறார்கள். அந்த மக்கள் நேரடியாக -

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, යෝජනාවට අදාළව අදහස් දැක්වීමට කටයුතු කරන්න. ඒක තමයි ක්‍රමවේදය.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Tourism ගැනයි කථා කරන්නේ. මම හිතන්නේ අපේ Secretary-General හරියටම අහගෙන ඉන්න නැතිව ඇති. Tourism ගැනයි කථා කරන්නේ. උතුරේ තිබෙන tourism ගැන මම කථා කරනවා.

நாடு என்ற ரீதியில் நீங்கள் வடக்கையும் பார்க்க வேண்டும். 300 மில்லியன் பெறுமதியுடைய World Bankஇன் இந்த projectஐ இவர்கள் எல்லோரும் எதிர்த்தபோது, நான் Jaffna DCC meetingஇல் சொன்னேன், "இல்லை! இது நல்ல விடயம். இதை நாங்கள் செய்ய வேண்டும்" என்று. இவர்கள் வடக்கு மாகாணத்தின் சுற்றுலா அபிவிருத்திக்காக நியமித்திருப்பது, பேராதனை பல்கலைக்கழகத்தின் Professor ஒருவரைத்தான். வடக்கிலுள்ள சுற்றுலாத்தலங்களை அபிவிருத்தி செய்யப் போவதாகச் சொல்லி, பேராதனை பல்கலைக்கழகத்தின் Professor ஒருவருக்கு திடீரென appointment ஒன்றை வழங்கி இருக்கிறார்கள். அவர் யார் என்று பார்த்தீர்கள் என்றால், 'மண்டையன் குழு' என்று சொல்லப்படுகின்ற ஒட்டுக்குழுவின் தலைவராக இருந்த சுரேஷ் பிரேமச்சந்திரனின் தம்பி. வடக்கு மாகாணத்தில் இதுவரை எந்தவொரு சுற்றுலாத்தலமும் அபிவிருத்தி செய்யப்படவில்லை.

முக்கியமாக, வடக்கில் வாழ்கின்ற மக்கள் பலாலி காணியை விடுவிக்கச் சொல்லி கேட்டுக்கொண்டு இருக்கி றார்கள். கௌரவ பிமல் ரத்நாயக்க அவர்களுக்கு பலாலி விமான நிலையத்தை அபிவிருத்தி செய்ய வேண்டும் என்ற எந்த நோக்கமும் இல்லை. ஆனால், இவர்கள் வடக்கில் சுற்றுலா அபிவிருத்தி என்று பொய் சொல்லிக்கொண்டு இருக்கிறார்கள். கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கடைசியாக நடைபெற்ற DCC meetingஇற்கு அதன் தலைவரான ராமலிங்கம் சந்திரசேகர் அவர்கள் சமுகமளித்திருக்கவில்லை; ஆளுநரும் சமுகமளித் திருக்கவில்லை. சுற்றுலா அபிவிருத்திக்கென வந்த அந்த நபர் -

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අවස්ථාව ඔබතුමා අවහාවිත කරන බවයි අපට පෙනී යන්නේ. ඒ නිසා මාතෘකාවට අදාළව ඔබතුමා අදහස් දක්වන්න.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
நன்றி!

Tilko Jaffna City Hotelஇல் ஒரு பெண்ணோடு சுற்றுலா அபிவிருத்தி செய்துகொண்டு இருந்ததை நான் பார்த்தேன். நீங்கள் வடக்கில் சுற்றுலா அபிவிருத்தியைச் செய்ய வேண்டுமாக இருந்தால், அதற்கு நல்லதொரு நபரைத் தெரிவு செய்ய வேண்டியது முக்கியமானது. வடக்கு மக்கள் உங்களை நம்பி கிட்டத்தட்ட 86,000 வாக்குகளைக் கொடுத்திருக் கிறார்கள்.

நீங்கள் வடக்கில் இதுவரை செய்திருக்கின்ற அபிவிருத்தி களில், அங்கிருக்கின்ற ஒரு சுற்றுலாத்தலத்தையாவது அபிவிருத்தி செய்திருக்கின்றீர்களா என்றால், இல்லை! ஆனால், தெற்கிலும் கிழக்கிலும் சுற்றுலாத்தலங்களை அபிவிருத்தி செய்ய வேண்டுமென Adjournment Motion கொண்டுவருகின்றீர்கள். கௌரவ பிரதி அமைச்சர் அவர்களே, சிங்கள மக்கள் வாழுகின்ற கரந்தெனிய, பெந்தோட்டை போன்ற பிரதேசங்களை சுற்றுலாத்துறை சார்ந்து அபிவிருத்தி செய்வதை நாங்கள் வரவேற்கின்றோம். அதேமாதிரி, வடக்கையும் கிழக்கையும் அபிவிருத்தி செய்ய வேண்டும். கிழக்கில் பார்த்தீர்கள் என்றால், திருகோணமலை இருக்கின்றது. அதேபோல், புத்தளத்தில் சுற்றுலாத்துறையை அபிவிருத்தி செய்யக்கூடிய எவ்வளவோ இடங்கள் இருக்கின்றன.

உங்களுடைய சனாதிபதி அவர்கள் சொல்லியிருக்கிறார், வடக்குக்கு சிங்கள மக்கள் வருவது இனவாதத்தைப் பரப்புவதற்காக என்று. சிங்கள மக்களை நாங்கள் இனவாதிகளாகப் பார்க்கவில்லை. அவர்கள் வடக்குக்கு வந்து எங்களுடன் உறவாடுவதை நாங்கள் சாதாரணமாகத்தான் பார்க்கின்றோம். என்னைப் பொறுத்தளவில், ஒரு பாராளுமன்ற உறுப்பினராக சிங்கள மக்களை இனவாதி களாகப் பார்க்கவேண்டிய தேவை இல்லை. உங்களுடைய அரசாங்கம் வடக்கில் சுற்றுலாத்துறையை அபிவிருத்தி செய்கின்றதா என்றால், இல்லை! வடக்கில் பலாலி விமான நிலையம் அதேமாதிரியே இருக்கின்றது; காங்கேசன்துறை துறைமுகமும் அதேமாதிரியே இருக்கின்றது. எந்தவோர் அபிவிருத்தியும் இல்லாமல் இருக்கின்றன. மன்னாரும் அதேமாதிரி மோசமாகவே இருக்கின்றது. மன்னாரிலிருந்து தூத்துக்குடிக்கு படகுச் சேவையொன்றை ஒழுங்காக நடத்துவதன்மூலம் இந்திய சுற்றுலாப் பயணிகளை இலங்கைக்கு அழைத்து வரலாம். அதன்மூலம் இலங்கையில் சுற்றுலா அபிவிருத்தியை மேற்கொள்ளலாம்.

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා]

"இனவாதம் இல்லை! இனவாதம் இல்லை!" என்று சொல்லிக்கொண்டு இருக்கின்ற NPP அரசாங்கத்தினர், இந்த அபிவிருத்திகளுக்காக இந்த முறை Budgetஇலாவது நிதி ஒதுக்குவார்கள் என்றால், இல்லை! உதாரணத்துக்கு, "வடக்கில் international cricket stadium கட்டப்போகிறோம்; அதன்மூலம் சுற்றுலாத்துறையை அபிவிருத்தி செய்யப் போகின்றோம்" என்று சொன்னார்கள். அங்கு international cricket stadium கட்டப்பட்டால் வெள்ளைக்காரர்கள் அங்கு வந்து விளையாடுவார்கள். அதனால் எங்களுடைய பிரதேசத்திலும் சுற்றுலா அபிவிருத்தி நடக்குமென நாங்கள் நினைத்தோம். ஆனால், இன்றைக்கு என்ன நடந்திருக் கின்றது? வடக்கில் எந்தவோர் அபிவிருத்தியையும் செய்யாத நீங்கள், எஞ்சியிருக்கும் மூன்று ஆண்டுகளில் ஏதாவது செய்வீர்கள் என்று நினைக்கும் அளவுக்கு நான் முட்டாளும் இல்லை; பைத்தியக்காரனும் இல்லை!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඉවර කරනවා.

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, நான் ஒரு விடயத்தை உங்களிடம் மிகவும் கண்ணியமாகச் சொல்கின்றேன். வடக்கின் சுற்றுலா அபிவிருத்தி தொடர்பிலும் நீங்கள் முக்கிய கவனமெடுக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

நான் இந்த 7 நிமிடங்களும் சுற்றுலா பற்றித்தான் கதைத்தேன். பாவம்! நான் கதைக்கின்ற தமிழ்கூட உங்களுக்குத் தெரியாது என்று நினைக்கும்பொழுது கவலையாக இருக்கின்றது. Sir, நீங்கள் interpretationஐயாவது கேட்டு அறிந்திருக்கலாம். நீங்கள் என்னுடைய உரையைக் குழப்பு கின்றீர்கள். குழப்புவது மட்டும்தான் ஐயா உங்களுடைய தொழில்! என்னுடைய நேரத்தில் தரப்பட்ட topicக்குள் சுற்றுலா அபிவிருத்தி தொடர்பாகத்தான் கதைத்தேன். தயவுசெய்து, ஹன்சாட் அறிக்கையை எடுத்துப் பாருங்கள்! இனியாவது அந்தக் கதிரையில் இருந்துகொண்டு பாராளுமன்ற உறுப்பினர் களுடைய பேச்சைக் குழப்ப வேண்டாம். நன்றி!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, පිළිතුරු කථාව ගරු රුවන් රණසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.53]

ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා (සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ - சுற்றுலாப் பிரதி அமைச்சர்)
(The Hon. (Prof.) Ruwan Ranasinghe - Deputy Minister of Tourism)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මුලින්ම අපේ ගාල්ල දිස්ත්‍රික්කයේ ගරු නිශාන්ත පෙරේරා මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා, ඉතාම කාලෝචිත සහ වැදගත් යෝජනාවක් සභාව කල් තබන අවස්ථාවේ මේ සභාව හමුවට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන්. ඒ වාගේම පක්ෂ විපක්ෂ භේදයකින් තොරව ඒ යෝජනාව ස්ථිර කළ අපේ ගරු හසාරා ලියනගේ මන්ත්‍රීතුමිය, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා ඉතාම නිර්ලෝභීව මේ වැදගත් යෝජනාවට අදහස් පළ කළා. At the same time, I was also observing that one Member was trying to mislead this House using the time allotted to him to participate in the Debate on this Adjournment Motion.

Sir, I would like to mention a few points. I was in Jaffna a couple of months back. There are nine projects going on right now invested by our Ministry and before Christmas, I will be going there to open five of them. We have invested Rs. 250 million this year on tourism-related development projects in the North. Also, at the beginning of last year, Mr. Ajay Banga, the President of the World Bank Group, was in Sri Lanka, and the Hon. Minister and myself had a meeting with him on tourism-related development funding assistance from the World Bank. He promised to fund about US Dollars 300 million for tourism-related development projects in the country. Out of that, US Dollars 100 million would be for the North, another US Dollars 100 million would be for the North and the East and the other US Dollars 100 million would be for the other areas. I think our Minister also clarified that we are a Government which is not focusing on or working towards racism. Our Government had been empowered by the people in the far North, the far East, the West and the South. So, we are serving the entire nation and all the communities. We are not stuck in the cells of racism. I need to make that point very clear. අපේ ගරු මන්ත්‍රීතුමා බොහොම හොඳ යෝජනාවක් ගෙනා වෙලාවේ ඒක misuse කිරීම පිළිබඳව මා කනගාටු වෙනවා.

කොහොම වුණත් ගරු ගයන්ත මන්ත්‍රීතුමාත් සඳහන් කළා වාගේ මීට මසකට විතර පෙර අපි මෙතැන සාකච්ඡා කළා, දෙද්දුව පිළිබඳව. අපි පොදුවේ ගත්තොත්, අපේ මන්ත්‍රීතුමා සඳහන් කළා වාගේ 1969දි අපේ රටේ පළමුවැනිම resort region එක ලෙස තමයි බෙන්තොට සංවර්ධනය කෙරුණේ. අපි මේ වෙනකොට මේ ව්‍යාපෘතිය ඉතාම සාර්ථකව වසර 57ක කාලයක් ක්‍රියාත්මක කරමින් ඉන්නවා. ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ අපේ රටේ සංචාරක කර්මාන්තය ආරම්භ වුණේම වෙරළ ආශ්‍රිත කලාපය කේන්ද්‍ර කරගෙන තමයි. එය බෙන්තොට ඉතාම හොඳින් ක්‍රියාත්මක වෙනවා. මන්ත්‍රීතුමා කිව්වා, හෝටල් රෝහල් කරනවා කියලා. ඉතාම ගුණාත්මක ඉහළ මට්ටමේ ආයුර්වේද රෝහල් පවා මේ කලාපය තුළ පවතිනවා. අපි දන්නවා, wellness tourism සඳහා හොඳ destination එකක් විධියට ශ්‍රී ලංකාව හඳුනාගෙන තිබෙනවා කියලා. මේක ක්‍රියාත්මක වෙන අතරතුර අපි දැන් ප්‍රවර්ධන ව්‍යාපෘතියක් ආරම්භ කරලා තිබෙනවා, ශ්‍රී ලංකාවේ high-value tourism attract කරගන්න.

ඒ අතරේ අපි තවත් සංචාරක කලාප හඳුනා ගනිමින්, ඒවා සංවර්ධනය කරමින් ඉන්නවා. අපේ රජයට සංචාරක කර්මාන්තය සම්බන්ධව තිබෙන දැක්ම තමයි තිරසර සහ සහභාගීත්ව සංචාරක ආර්ථිකයක් කියන එක. මුහුදු වෙරළ කේන්ද්‍ර කරගෙන තිබුණු සංචාරක කර්මාන්තය රට ඇතුළට ගේන්න, ප්‍රජාවට ඒ අවස්ථා උදා කරන්න, ඒ වාගේම අර කියපු පරිසර පද්ධති, අපේ වටිනාකම්, උරුම සංචාරක කර්මාන්තයට ක්‍රියාකාරීව යොදා ගන්න අවශ්‍ය මැදිහත්වීම සහ ව්‍යාපෘති අපි ක්‍රියාත්මක කරමින් ඉන්නවා. අපි "Southern Mist Triangle" කියලා ව්‍යාපෘතියක් ආරම්භ කළා, ඔය Sinharaja rainforest එකේ පහළ ගාල්ල, මාතර, රත්නපුර කියන දිස්ත්‍රික්ක කේන්ද්‍ර කරගනිමින්. අපි දැන්

මේ ව්‍යාපෘතිය ඉතාම සාර්ථකව ඉදිරියට කරමින් ඉන්නවා. ඒ වාගේම අපේ මන්ත්‍රීතුමා දැන් ගෙනාව යෝජනාවත් ඉතාම හොඳ යෝජනාවක් කියලා මම හිතනවා. හොඳ අවස්ථාවක් තිබෙනවා.

අපි කුරුඳු ගැන කථා කළා. මම යම් සිදුවීමක් දැක්කා, ඒක හුඟක් අය දකින්න ඇති. කුරුඳු ක්‍රියාවලිය කරන කාන්තාවන් ඉතාම හොඳින් සංචාරක කරමාන්තයේ නිරත වෙමින් ඉන්නවා. ඒක හොඳ උදාහරණයක්. ගරු මන්ත්‍රීතුමියත් කථා කළා, women empowerment ගැන. ඉතින්, මේකෙන් හොඳ අවස්ථා අපට උදා කරන්න පුළුවන්. ඒ වෙනුවෙන් සංචාරක සංවර්ධන අධිකාරිය විධියට අපට මැදිහත් වෙන්න පුළුවන්. රුහුණු සංචාරක කාර්යාංශය, ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හෝ සම්බන්ධීකරණ කමිටුව එහෙම නැත්නම් ඊට අනුබද්ධිත සංචාරක අනුකමිටුව යන අය මැදිහත් වෙලා අපට මේ යෝජනාව ව්‍යාපෘති වාර්තාවක් විධියට දෙනවා නම්, ඒක ඉදිරියට ගෙනයන්න පුළුවන්. එහෙම නැත්නම් අපේ අධිකාරිය මැදිහත් වෙලාත් ඒක කරන්න පුළුවන්. අපි දැන් වැඩ කරමින් ඉන්නවා, Cinnamon Trails සම්බන්ධව. අපි දන්නවා, upcountry Pekoe Trail එක තිබෙනවා කියලා. ඒ වාගේම අපිට මේ ප්‍රදේශවලට Cinnamon Trails ඇති කරන්න පුළුවන්. මොකද, trail tourism හොඳ trend එකක්. ඒකට අවශ්‍ය මැදිහත්වීම අපි කරනවා. ඒ වාගේම ආසියානු සංවර්ධන බැංකුව, ලෝක බැංකුව සහ ශ්‍රී ලංකා රජයේ අරමුදල් යොදා ගනිමින් අපි ඒ සඳහා ආයෝජන කරමින් ඉන්නවා. ගරු මන්ත්‍රීතුමාත් සඳහාත් කළා වාගේ විශේෂයෙන්ම infrastructure facilities කියන එක සංචාරක කර්මාන්තය කරන්න හරිම වැදගත්. ඒ අනුව අපේ ගුවන් තොටුපළේ ඉඳලා නගර වෙත මගීන් ප්‍රවාහනයට flying cars, එහෙම නැත්නම් drones බොහොම ඉක්මනින් අපට launch කරන්න පුළුවන් වෙයි. සංචාරක කර්මාන්තය ඉලක්ක කරගෙන තමයි, මේ සංවර්ධන ව්‍යාපෘති අපි දියත් කරන්නේ. දෙද්දුව ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අපි විශේෂයෙන් ආපු ආයතනයක් එක්ක සාකච්ඡා කරමින් ඉන්නවා. ඒක දැවැන්ත ව්‍යාපෘතියක්. මේවා අපි ඉදිරියට මෙහෙයවමින් ඉන්නවා. ඒ නිසා මම කියන්න අවශ්‍යයි, මේක ඉතාමත් හොඳ යෝජනාවක් බව. අපි අමාත්‍යාංශය විධියට ඒ කටයුත්තට සම්පූර්ණ සහයෝගය දෙන්න මැදිහත් වෙනවා.

ඒ අතරේ ජාතිවාදය පෙන්වමින් ඉතාමත් බොළඳ, බාල දේශපාලනය කරන අයට අපි පැහැදිලිව කියන්න අවශ්‍යයි, අපි රජයක් විධියට ඉතාම හොඳින් මේ අවුරුදු දෙකේ මේ ආර්ථිකය කළමනාකරණය කරලා සංවර්ධන මාවතට ගෙනැල්ලා තිබෙනවා කියන එක. ලබන අවුරුද්දේ සංවර්ධන අරමුදල් විධියට රුපියල් ට්‍රිලියන දෙකක් ඉතිහාසයේ පළමුවැනි වතාවට යොදවන්න අපි දැන් කටයුතු කරමින් ඉන්නවා. මේ සියලු දේවල් අපේ රටේ ආර්ථිකයේ සංවර්ධනය සහ ප්‍රජාවගේ ආර්ථික බලගැන්වීම වෙනුවෙන් සිදු කරන්න, අපි රජයක් විධියට මැදිහත් වෙනවා, කටයුතු කරනවා, ඒ වාගේම මේ වාගේ ව්‍යාපෘති ඉදිරියට ගෙනයනවා කියන එක සඳහන් කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. ස්තූතියි.

එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවීමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.59ට, 2026 නොවැම්බර් 03වන අඟහරුවාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.

අප්පොழුது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால், மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

இதன்படி, பி.ப. 5.59க்கு, பாராளுமன்றம் 2026 நவம்பர் 03, செவ்வாய்க்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.

It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.

Parliament adjourned accordingly at 5.59 p.m. until 9.30 a.m. on Tuesday, 03rd November, 2026.

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
WRITTEN ANSWERS TO QUESTIONS

ශ්‍රම වාසනා අරමුදල: විසුරුවා හැර ඈවර කිරීම
சிரம வாசனா நிதியம்: கலைத்தலும் கலைத்தற் செயன்முறையும்
SHRAMA VASANA FUND: DISSOLUTION AND LIQUIDATION

2390/2026

1. ගරු තුරෙරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල් පනත යටතේ පිහිටුවා ඇති ශ්‍රම වාසනා අරමුදල 2026.06.30 දිනය වනවිට විසුරුවා හැර ඈවර කිරීමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම අරමුදල විසුරුවා හැරීමට හේතු සහ රජයට අයත් වාණිජමය නොවන ආයතන පිළිබඳ සමාලෝචන කමිටුව විසින් මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද නිර්දේශ කවරේද;

(iii) අරමුදල විසුරුවා ඈවර කිරීම සඳහා පත් කර ඇති ඈවරකරුගේ හෝ ඈවරකරුවන්ගේ නම්, තනතුරු සහ ඔවුන්ට පැවරී ඇති වගකීම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) අරමුදල ඈවර කිරීමේ වත්මන් ප්‍රගතිය, ඒ සඳහා සකස් කර ඇති ක්‍රියාකාරී සැලැස්ම සහ එම කටයුතු අවසන් කිරීමට අපේක්ෂිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 1998ஆம் ஆண்டின் 12ஆம் இலக்க, சிரம வாசனா நிதிய சட்டத்தின்கீழ் தாபிக்கப்பட்டுள்ள சிரம வாசனா நிதியத்தை 2026.06.30ஆம் திகதியளவில் கலைத்து, மூடுவதற்கு அமைச் சரவை அங்கீகாரம் வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அந்நிதியத்தைக் கலைப்பதற்கான காரணங்கள் மற்றும் அரசாங்கத்துக்குச் சொந்த மான வர்த்தக நோக்கமற்ற நிறுவனங்கள் தொடர்பான மீளாய்வுக் குழுவால் இதற்காக முன்வைக்கப்பட்ட பரிந்துரைகள் யாவை என்பதையும்;

(iii) நிதியத்தை கலைத்து மூடிவிடுவதற்காக நியமிக் கப்பட்ட கலைப்பாளர் அல்லது கலைப்பாளர் களின் பெயர்கள், பதவிகள் மற்றும் அவர்களுக்கு ஒப்படைக்கப்பட்டுள்ள பொறுப்புகள் வெவ் வேறாக யாவை என்பதையும்;

[ගරු තුරෙරාසා රවිකරන් මහතා]

(iv) நிதியத்தை கலைத்து முடிக்கும் விடயத்தின் தற் போதைய முன்னேற்றம், அதற்காகத் தயாரிக்கப் பட்டுள்ள செயற்பாட்டுத் திட்டம் மற்றும் அப்பணிகளை நிறைவுசெய்வதற்கு எதிர்பார்க் கப்படும் திகதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Labour:

(a) Will he inform this House -

(i) whether, as at 30.06.2026, the Cabinet of Ministers has granted approval to dissolve and liquidate the Shrama Vasana Fund established under the Shrama Vasana Fund Act, No. 12 of 1998;

(ii) if so, the reasons for dissolving the said Fund and the recommendations made in this regard by the Committee for the Review of Government-owned Non-Commercial Institutions;

(iii) the names and designations of the liquidator or liquidators appointed to dissolve and liquidate the said Fund and the responsibilities assigned to each of them, separately; and

(iv) the current progress of the liquidation of the said Fund, the Action Plan prepared for this purpose and the expected date of completion of the said activities?

(b) If not, why?

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

(අ) (i) ඔව්.

(ii) රජයට අයත් වාණිජමය නොවන ආයතන පිළිබඳ සමාලෝචන කමිටුව විසින්,

- ආයතනය පිහිටුවීමේදී නිර්ණය කළ අරමුණින් අපගමනය වීම
- ආයතනවල කාර්යභාරය වර්තමාන සංදර්භය හා නොගැළපීම හෝ වෙනත් ආයතනවල විෂය පථයට ඇතුළත්ව තිබීම
- ආයතනවල කාර්යසාධනය ඉතා දුර්වල මට්ටමක පැවතීම හා ආයතනික ශක්තිය ද දුර්වල තත්ත්වයේ පැවතීම
- ආයතනය සතු වත්කම් ඌන උපයෝජනය

ආදී හේතු අතරින් එකක් හෝ කිහිපයක් ඇවර කළ යුතු ආයතන නිර්දේශ කිරීම සඳහා පදනම් කර ගෙන ඇත. එම කමිටුව මඟින් ශ්‍රම වාසනා අරමුදල තවදුරටත් පවත්වා ගෙන යෑමේ අවශ්‍යතාවක් නිරීක්ෂණය නොවන බැවින්, දැනට එහි සේවාවන්ගෙන් අගතියක් නොවන පරිදි ආයතනය ඇවර කිරීම නිර්දේශ කර ඇත.

(iii) **අරමුදල විසුරුවා ඇවර කිරීම සඳහා පත් කර ඇති ඇවරකරුගේ හෝ ඇවරකරුවන්ගේ නම් හා තනතුරු**

එස්.එස්.එස්. නන්දනී මිය, ප්‍රධාන ගණකාධිකාරි (සභාපති) - කම්කරු අමාත්‍යාංශය

ඩබ්ලිව්.පී.ඒ.ජී. විජේසූරිය මිය, නීති නිලධාරිනි (සාමාජික) - කම්කරු අමාත්‍යාංශය

ඒ.එම්.එස්. චන්ද්‍රිකා මෙය, කම්කරු කොමසාරිස් (සාමාජික) - කම්කරු දෙපාර්තමේන්තුව

පැවරී ඇති වගකීම්

- ශ්‍රම වාසනා අරමුදලේ කාර්ය මණ්ඩලය සම්බන්ධව ගත යුතු පියවර පිළිබඳ නිර්දේශ ලබා දීම.
- අරමුදලේ වත්කම් සම්බන්ධව ගත යුතු පියවර ගැනීම, වගකීම් හා බැරකම් පියවීම, ගිණුම් සකස් කිරීම, මුදල් හා බැංකු ගිණුම් සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- ශ්‍රම වාසනා අරමුදල මඟින් ක්‍රියාත්මක කළ කම්කරු අමාත්‍යාංශය මඟින් තවදුරටත් ක්‍රියාත්මක කළ යුතු කාර්යයන් හඳුනා ගැනීම හා එම කාර්යයන් අමාත්‍යාංශ මඟින් ඉටු කිරීමට අදාළව ඉදිරි කටයුතු සිදු කළ යුතු ආකාරය නිර්දේශ කිරීම.
- ඇවරකරණ ක්‍රියාවලියෙන් පසු අවසන් වාර්තාව ඉදිරිපත් කිරීම.

මෙම කමිටුව ඇවරකරණයට අදාළ කටයුතු ඉටු කිරීමට සාමූහිකව වගකීම් දරන අතර, එම නිලධාරීන් රාජ්‍ය සේවයේ විවිධ ක්ෂේත්‍රවලට අයත් දීර්ඝ කාලීන අත් දැකීම් ඇති නිලධාරීන්ගෙන් සමන්විත වේ.

(iv) අරමුදල 2026.09.30 දින වන විට ඇවර කර ඇති අතර, 2026.10.31 දිනට පෙර අවසන් වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.

(ආ) පැන නොනඟී.

(அ) (i) ஆம்.

(ii) அரசாங்கத்துக்குச் சொந்தமான வர்த்தக நோக்கமற்ற நிறுவனங்கள் தொடர்பான மீளாய்வுக் குழுவால்

- நிறுவனம் தாபிக்கப்படும்போது நிர்ணயிக் கப்பட்ட நோக்கத்திலிருந்து விலகுதல்
- நிறுவனங்களின் வகிபாகம் தற்காலச் சூழலுடன் பொருந்தாமையாக இருத்தல் அல்லது பிற நிறுவனங்களின் விடயதானத் துக்குள் உள்ளடக்கப்பட்டு இருத்தல்
- நிறுவனங்களின் செயற்பாடு மிகவும் பலவீனமான மட்டத்தில் இருப்பதோடு, நிறுவன வலிமையும் பலவீனமான நிலையில் இருத்தல்
- நிறுவனம் உடைமையாகக் கொண்ட சொத்துக்கள் போதியளவில் பயன்படுத்தப் படாமை

போன்ற காரணங்களில் ஒன்று அல்லது பல வற்றை, கலைக்கப்பட வேண்டிய நிறுவனங் களை பரிந்துரைப்பதற்காக அடிப்படையாகக் கொண்டுள்ளனர். அக்குழுவால் சிரம வாசனா நிதியத்தை தொடர்ந்தும் கொண்டுநடத்துவதற் கான தேவை அவதானிக்கப்படவில்லை என்ப தால், தற்போது அதன் சேவைகளுக்குப் பங்கம் ஏற்படாதவாறு நிறுவனத்தை கலைப்பதற்குப் பரிந்துரைக்கப்பட்டுள்ளது.

(iii) திருமதி எஸ். எஸ். எஸ். நந்தனி, பிரதான கணக்காளர் (தலைவர்) - தொழில் அமைச்சு
திருமதி டபிள்யு. பி.ஏ.பி. விஜேசூரிய, சட்ட உத்தியோகத்தர் (உறுப்பினர்) - தொழில் அமைச்சு
செல்வி ஏ. எம். எஸ். சந்திரிகா, தொழில் ஆணையாளர் (உறுப்பினர்) - தொழில் திணைக்களம்

வழங்கப்பட்டுள்ள பொறுப்புகள்:

- சிரம வாசனா நிதியத்தின் ஊழியர்கள் தொடர்பாக எடுக்கப்பட வேண்டிய நடவடிக்கைகள் குறித்து பரிந்துரைகளை வழங்குதல்.
- நிதியத்தின் சொத்துக்கள் தொடர்பாக எடுக்கப்பட வேண்டிய நடவடிக்கைகளை எடுத்தல், பொறுப்புகள் மற்றும் கடன்களைத் தீர்த்தல், கணக்குகளைத் தயாரித்தல், பணம் மற்றும் வங்கிக் கணக்குகள் தொடர்பாக செயற்படுதல்.
- சிரம வாசனா நிதியத்தினால் செயற்படுத்தப் பட்ட, தொழில் அமைச்சினால் தொடர்ந்தும் செயற்படுத்தப்பட வேண்டிய பணிகளை இனங்காணல் மற்றும் அத்தகு பணிகளை அமைச்சின் ஊடாக நிறைவேற்றுவதற்குரிய மேலதிக செயற்பாடுகளை மேற்கொள்ள வேண்டிய விதம் குறித்துப் பரிந்துரை செய்தல்.
- மூடிவிடும் செயற்பாட்டுக்குப் பின்னர் இறுதி அறிக்கையைச் சமர்ப்பித்தல்.

இக்குழு மூடிவிடும் தொடர்பான செயற் பாடுகளை நிறைவேற்றுவதற்கு கூட்டாகப் பொறுப்புக்கூறுவதோடு, அவ்வுத்தியோகத் தர்கள் அரச சேவையின் பல்வேறு துறைகளைச் சேர்ந்த நீண்டகால அனுபவங்களைக் கொண்ட உத்தியோகத் தர்களைக் கொண்டு அமைக்கப் பட்டுள்ளது.

(iv) நிதியமானது 2026.09.30ஆம் திகதியளவில் கலைக்கப்பட்டுள்ளதோடு, 2026.10.31ஆம் திகதிக்கு முன்னர் இறுதி அறிக்கை அமைச் சரவைக்குச் சமர்ப்பிக்கப்படவுள்ளது.

(ஆ) எழவில்லை.

(a) (i) Yes.

(ii) The Review Committee on Non-commercial State-owned Enterprises has based its recommendations for the liquidation of institutions on one or more of the following reasons:

- Deviating from the objectives specified at the establishment of the institution;
- Incompatibility of the institution's role with the present context, or its inclusion within the scope of other institutions;
- Extremely poor performance of the institution and the presence of weak organizational capacity; and
- Underutilization of assets belonging to the institution.

Since the said Committee has not observed any necessity to further maintain the Shrama Vasana Fund, it has recommended the liquidation of the institution without causing prejudice to its current services.

(iii)
- Mrs.S.S.S. Nandani, Chief Accountant, Ministry of Labour - Chairperson
- Mrs. W.P.A.G. Wijesuriya, Legal Officer, Ministry of Labour - Member
- Mrs.A.M.S. Chandrika, Commissioner of Labour, Department of Labour - Member

Responsibilities Assigned:

- Submitting recommendations regarding the measures to be taken with respect to the staff of the Shrama Vasana Fund;
- Taking necessary action regarding the assets of the Fund, settling liabilities and obligations, preparing accounts, and dealing with cash and bank accounts;
- Identifying the functions previously implemented by the Shrama Vasana Fund which ought to be continued by the Ministry of Labour, and recommending the manner in which future activities relating to the performance of such functions by the Ministry should be carried out; and
- Submitting the final report upon completion of the liquidation process.

The said Committee bears collective responsibility for executing the duties relating to the liquidation, and the officers thereof comprise personnel possessing extensive experience across various fields in the Public Service.

(iv) The Fund has been liquidated as of 30.09.2026, and the final report is scheduled to be submitted to the Cabinet of Ministers prior to 31.10.2026.

(b) Does not arise.

ඇවර කිරීමට නියමිත ශ්‍රම වාසනා අරමුදල: වත්කම් සහ බැරකම්

கலைக்கப்படவுள்ள சிரம வாசனா நிதியம்: சொத்துக்களும் பொறுப்புகளும்

SHRAMA VASANA FUND TO BE LIQUIDATED: ASSETS AND LIABILITIES

2391/2026

2. ගරු තුරෙරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 'ශ්‍රම වාසනා අරමුදල' ඇවර කරන දිනය වන විට එහි බැංකු ගිණුම්, ස්ථාවර තැන්පතු, චංචල හා නිශ්චල දේපළ, ලැබිය යුතු මුදල් සහ ගෙවිය යුතු බැරකම්වල වටිනාකම, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අරමුදල ඇවර කිරීමෙන් අනතුරුව ඉතිරි වන මුදල් හා දේපළ පවරා දෙනු ලබන අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව හෝ ආයතනය කවරේද;

(iii) එලෙස පවරා දෙනු ලබන මුදල් හා දේපළ කම්කරු සුබසාධන කටයුතු සඳහා පමණක් භාවිත කිරීම සහතික කිරීම පිණිස ගනු ලබන නීතිමය සහ මූල්‍යමය ක්‍රියාමාර්ග කවරේද;

(iv) අරමුදලේ අවසන් ගිණුම් සහ ඇවරකරුගේ වාර්තාව විගණකාධිපතිවරයාගේ විගණනයට යොමු කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 'சிரம வாசனா நிதியம்' கலைக்கப்படும் திகதியளவில் அதன் வங்கிக் கணக்குகள், நிலையான வைப்புகள், அசையும் மற்றும் அசையாச் சொத்துகள், கிடைக்க வேண்டிய தொகை மற்றும் செலுத்த வேண்டிய பொறுப்பு களின் பெறுமதி வெவ்வேறாக யாது என்பதையும்;

(ii) நிதியம் கலைக்கப்பட்ட பின்னர் மீதமாகும் தொகையும் சொத்துகளும் கைமாற்றப்படுகின்ற அமைச்சு, திணைக்களம் அல்லது நிறுவனம் யாது என்பதையும்;

(iii) அவ்வாறு கைமாற்றப்படுகின்ற தொகைகளும் சொத்துகளும் தொழிலாளர் நலன்புரி நடவடிக்கைகளுக்கு மட்டும் பயன்படுத்தப்படும் என்பதை உறுதிசெய்வதற்காக எடுக்கப்படும் சட்ட மற்றும் நிதிசார் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iv) நிதியத்தின் இறுதிக் கணக்குகளும் கலைப் பாளரின் அறிக்கையும் கணக்காய்வாளர் தலைமையதிபதிக்கு ஆற்றுப்படுத்தப்பட்டு பாராளுமன்றத்தில் சமர்ப்பிக்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Labour:

(a) Will he inform this House -

(i) separately, the value of bank accounts, fixed deposits, movable and immovable properties, receivables and outstanding liabilities of the Shrama Vasana Fund, as at the date of its liquidation;

(ii) the Ministry, department or institution to which the remaining funds and properties will be transferred following the liquidation of the Fund;

(iii) the legal and financial measures that will be taken to ensure that the funds and properties so transferred are used solely for worker welfare activities; and

(iv) whether the final accounts of the Fund and the report of the liquidator will be submitted to the Auditor-General for audit and subsequently, presented to Parliament?

(b) If not, why?

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

(අ) (i) ශ්‍රම වාසනා අරමුදල ඇවර කරන දිනය වන 2026.09.30වන විට බැංකු ගිණුම්

බැංකුව	ගිණුම් අංකය	මුදල (රුපියල්)
මහජන බැංකුව - ජංගම ගිණුම	119100103693128	1,529,349.49
ලංකා බැංකුව - ජංගම ගිණුම	92953771	25,000.00
මහජන බැංකුව - ජංගම ගිණුම (විදුසුත් හරපත් කාඩ්පත වෙනුවෙන්)	119100293693128	10,000.00

ස්ථාවර තැන්පතුවල වටිනාකම	රු.මි. 100
චංචල හා නිශ්චල දේපළ	රු.මි. 7.3
ජාතික ලොතරැයි මණ්ඩලයෙන් ඒකාබද්ධ අරමුදලට	රු.මි. 531
බැර කර ඇති ශ්‍රම වාසනා අරමුදල නමින් ඇති ශේෂය බැරකම්	රු.මි. 6.5

(ii) ඉතිරි මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට කටයුතු කෙරේ. දේපළ කම්කරු අමාත්‍යාංශය හා අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන වන කම්කරු දෙපාර්තමේන්තුව, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය වෙත ඉල්ලීම් හා අවශ්‍යතාව මත බෙදා දී ඇත. (දේපළ බෙදා දී ඇති වාර්තාව ඉංග්‍රීසි පිළිතුරේ **ඇමුණුම*** මඟින් දැක්වේ.)

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

(iii) ශ්‍රම වාසනා අරමුදල මඟින් ඉටු කරනු ලැබූ වෙනත් රාජ්‍ය ආයතන විසින් ඉටු නොකරන ලද සේවාවන් කම්කරු අමාත්‍යාංශය හරහා ඉදිරියේදී ඉටු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. ඒ සඳහා අවශ්‍ය වන මුදල් කම්කරු අමාත්‍යාංශය වෙත නව වැය ශීර්ෂයක් යටතේ ඒකාබද්ධ අරමුදලෙන් ලබා ගැනීමට නියමිතය.

දේපළ කම්කරු අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන සඳහා ලබා දී ඇති බැවින් කම්කරු සුබසාධන කටයුතුවලට පමණක් භාවිත වේ.

(iv) අරමුදලේ අවසන් ගිණුම් සමඟ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කෙරේ.

(ආ) පැන නොනඟී.

(அ) (i) சிரம வாசனா நிதியம் கலைக்கப்பட்ட நாளான 2026.09.30ஆம் திகதியன்று வங்கிக் கணக்குகள்

வங்கி	கணக்கு இலக்கம்	தொகை (ரூ.)
மக்கள் வங்கி - நடப்புக் கணக்கு	119100103693128	1,529,349.49
இலங்கை வங்கி - நடப்புக் கணக்கு	92953771	25,000.00
மக்கள் வங்கி - நடப்புக் கணக்கு (மின்னணு பற்று அட்டைக்காக)	119100293693128	10,000.00

நிலையான வைப்பீடுகளின் பெறுமதி: ரூ. மி.100

அசையும் மற்றும் அசையாச் சொத்துகள்: ரூ. மி. 7.3

தேசிய லொத்தர் சபையிலிருந்து ஒருங்கிணைந்த நிதியத்திற்கு வரவு வைக்கப்பட்டுள்ள சிரம வாசனா நிதியம் என்ற பெயரிலான மீதி ரூ. மி. 531

பொறுப்புகள்: ரூ. மி. 6.5

(ii) மீதித்தொகை திரட்டு நிதியத்திற்கு வரவு வைக்க நடவடிக்கை எடுக்கப்படுகின்றது. சொத்துக்கள் தொழில் அமைச்சு மற்றும் அமைச்சின் கீழுள்ள நிறுவனங்களான தொழில் திணைக்களம், தேசிய தொழில் கற்கைகள் நிறுவகம், தேசிய தொழில் சார் பாதுகாப்பு மற்றும் சுகாதார நிறுவகம் என்பவற்றுக்கு வேண்டுகோள்கள் மற்றும் தேவைகளின் அடிப்படையில் பகிர்ந்தளிக்கப்பட்டுள்ளன. (சொத்துகள் பகிர்ந்தளிக்கப்பட்டுள்ள அறிக்கை ***இணைப்பில்*** காட்டப்பட்டுள்ளது.) (ஆங்கில இணைப்பைப் பார்க்கவும்.)

(iii) சிரம வாசனா நிதியத்தினால் நிறைவேற்றப் பட்ட, ஏனைய அரசாங்க நிறுவனங்களினால் நிறைவேற்றப்படாத சேவைகளைத் தொழில் அமைச்சு ஊடாக எதிர்காலத்தில் நிறைவேற்று வதற்குத் தேவையான நடவடிக்கைகள் மேற் கொள்ளப்பட்டுள்ளன. அதற்காகத் தேவையான தொகை தொழில் அமைச்சுக்கு புதிய செலவுத் தலைப்பின்கீழ் திரட்டு நிதியத்திலிருந்து பெற்றுக்கொள்ளப்படவுள்ளது. சொத்துக்கள் தொழில் அமைச்சுக்கும் அதன் கீழுள்ள நிறுவனங்களுக்கும் வழங்கப்பட்டுள்ள மையால் தொழிலாளர் நலன்புரி நடவடிக்கை களுக்கு மட்டும் பயன்படுத்தப்படும்.

(iv) நிதியத்தின் இறுதிக் கணக்குகளுடன் பாராளு மன்றத்திற்குச் சமர்ப்பிக்க நடவடிக்கை எடுக்கப்படுகின்றது.

(ஆ) எழவில்லை.

(a) (i) Bank accounts as at 30.09.2026, being the date of liquidation of the Shrama Vasana Fund:

Bank	Account Number	Amount (Rs.)
People's Bank - Current Account	119100103693128	1,529,349.49
Bank of Ceylon - Current Account	92953771	25,000.00
People's Bank - Current Account (For Electronic Debit Card)	119100293693128	10,000.00

Value of fixed deposits Rs. 100m

Movable and Immovable Property Rs. 7.3m

Liabilities: Balance in the name of the "Shrama Vasana Fund" created to the Consolidated Fund by the National Lotteries Board Rs. 531m

Rs. 6.5m

(ii) Action is being taken to transfer the remaining funds to the Consolidated Fund. Properties have been distributed to the Ministry of Labour and its affiliated institutions, namely, the Department of Labour, the National Institute of Labour Studies and the National Institute of Occupational Safety and Health, based on their requests and requirements. The report on the distribution of properties is provided in Annex*.

(iii) Necessary arrangements have been made for the Ministry of Labour to carry out, in the future, the services previously performed by the Shrama Vasana Fund which were not provided by other State institutions. The funds required for this purpose are scheduled to be obtained from the Consolidated Fund under a new Head of Expenditure allocated to the Ministry of Labour.

As the properties have been allocated to the Ministry of Labour and the institutions falling thereunder, they will be utilized exclusively for labour welfare activities.

(iv) Action will be taken to present it to Parliament along with the final accounts of the Fund.

(b) Does not arise.

---

* *පුස්තකාලයේ තබා ඇත.*

* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

* *Placed in the Library.*

* *පුස්තකාලයේ තබා ඇත.*

* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

* *Placed in the Library.*

ඇවර කිරීමට නියමිත ශ්‍රම වාසනා අරමුදල: මූල්‍ය ආධාර සඳහා ඉල්ලුම් කර ඇති ඉතිරි අයදුම්පත්

கலைக்கப்படவிருக்கும் சிரம வாசனா நிதியம்:
நிலுவையிலுள்ள நிதி உதவிக்கான விண்ணப்பங்கள்
SHRAMA VASANA FUND AWAITING LIQUIDATION: PENDING APPLICATIONS FOR FINANCIAL ASSISTANCE

2392/2026

3. ගරු තුරෛරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 'ශ්‍රම වාසනා අරමුදල' විසුරුවා හරින ලද දිනය වන විට වෛද්‍ය ආධාර, නීති ආධාර, ශිෂ්‍යත්ව, මරණාධාර, ආපදා සහන, වෘත්තීය පුහුණුව හා අනෙකුත් ආධාර සඳහා ඉතිරිව තිබූ අයදුම් පත් සංඛ්‍යාව, ආධාර වර්ගය සහ දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම අයදුම්පත් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ වගකීම පවරා දෙන ආයතනය කවරේද;

(iii) මේ වන විටත් අයදුම් කර ඇති පුද්ගලයන්ගේ අයදුම් දිනය සහ ප්‍රමුඛතා අනුපිළිවෙළ ආරක්ෂා කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) 2021 සිට 2026 දක්වා කාලය තුළ -

(i) අරමුදල සඳහා ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව;

(ii) ඒ අතරින් අනුමත කළ, ප්‍රතික්ෂේප කළ හා ගෙවීමට ඉතිරිව ඇති අයදුම්පත් සංඛ්‍යාව;

(iii) ප්‍රතිලාභීන්ට ලබා දී ඇති මුළු මූල්‍ය ආධාර ප්‍රමාණය;

වර්ෂය, දිස්ත්‍රික්කය සහ ආධාර වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) ඉහත කාල සීමාව තුළ උතුරු, නැගෙනහිර සහ මධ්‍යම පළාත්වලින් ලැබුණු අයදුම්පත් සහ ප්‍රදානය කළ ප්‍රතිලාභ සංඛ්‍යාව, ජාතික මට්ටමින් ලැබුණු හා ප්‍රදානය කළ මුළු සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස කොපමණද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) "சிரம வாசனா நிதியம்" கலைக்கப்பட்ட திகதி யளவில் மருத்துவ உதவிகள், சட்ட உதவிகள், புலமைப் பரிசில்கள், மரண நன்கொடைகள், அனர்த்த நிவாரணங்கள், தொழிற்பயிற்சி மற்றும் ஏனைய உதவிகளுக்காக எஞ்சியிருந்த விண்ணப் பப்படிவங்களின் எண்ணிக்கை, உதவியின் வகை மாவட்ட வாரியாக வெவ்வேறாக யாதென்பதையும்;

(ii) மேற்படி விண்ணப்பப்படிவங்கள் தொடர்பில் செயலாற்றும் பொறுப்பு ஒப்படைக்கப்படுகின்ற நிறுவனம் யாதென்பதையும்;

(iii) ஏற்கனவே, விண்ணப்பித்துள்ள நபர்கள் விண்ணப்பித்த திகதியும், முன்னுரிமை ஒழுங்கு வரிசையும் பாதுகாக்கப்படுகின்றதா என்ப தையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) 2021 தொடக்கம் 2026 வரையான காலப்பகுதியினுள் -

(i) நிதியத்திற்குக் கிடைக்கப்பெற்ற விண்ணப்பப் படிவங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) அவற்றில் அங்கீகரிக்கப்பட்ட, நிராகரிக்கப்பட்ட மற்றும் கொடுப்பனவை மேற்கொள்வதற்காக எஞ்சியுள்ள விண்ணப்பப்படிவங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) பயனாளிகளுக்கு வழங்கப்பட்டுள்ள மொத்த நிதியுதவியின் அளவு யாதென்பதையும்;

வருடம், மாவட்டம், உதவியின் வகை ஆகியவற்றின் அடிப்படையில் வெவ்வேறாக அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) மேற்படி காலப்பகுதியினுள் வடக்கு, கிழக்கு மற்றும் மத்திய மாகாணங்களிலிருந்து கிடைக்கப்பெற்ற விண்ணப்பப்படிவங்கள், வழங்கப்பட்ட நன்மைகளின் எண்ணிக்கை ஆகியவை தேசிய மட்டத்தில் கிடைக்கப்பெற்ற மற்றும் வழங்கப்பட்ட மொத்த எண்ணிக்கையின் சதவீதமாக யாதென்பதையும்;

அவர் மேலும் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Labour:

(a) Will he inform this House -
(i) the number of pending applications for medical assistance, legal aid, scholarships, death benefits, disaster relief, vocational training and other aid, as of the date on which the Shrama Vasana Fund was dissolved, categorized separately by the type of assistance and district;
(ii) the institution to which the responsibility of processing these applications is assigned; and
(iii) whether the application date and order of priority of those who had already applied will be maintained?

(b) Will he also inform this House, separately by year, district and type of assistance for the period from 2021 to 2026 -
(i) the number of applications received by the Fund;
(ii) the number of applications approved, rejected and pending disbursement; and
(iii) the total amount of financial assistance granted to beneficiaries?

(c) Will he further inform this House of the number of applications received from the Northern, Eastern and Central Provinces during the above-mentioned period and the benefits granted for them, as a percentage of the total number received and granted at the national level?

(d) If not, why?

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

(අ) (i) 2026.09.30 දින වන විට ඉතිරි අයදුම්පත් ප්‍රමාණය

නීති ආඥාර	
දිස්ත්‍රික්කය	**අයදුම්පත් සංඛ්‍යාව**
මහනුවර	27
බදුල්ල	5
නුවරඑළිය	13
කෑගල්ල	1
පුත්තලම	1
කළුතර	5
ගම්පහ	4
කොළඹ	11
කුරුණෑගල	2
ගාල්ල	4
රත්නපුර	2
අම්පාර	1
මාතලේ	1
මාතර	2
හම්බන්තොට	12
එකතුව	**91**

ශිෂ්‍යත්ව ආඥාර	
දිස්ත්‍රික්කය	**අයදුම්පත් සංඛ්‍යාව**
මහනුවර	02
නුවරඑළිය	03
පුත්තලම	03
කොළඹ	02
ගාල්ල	04
හම්බන්තොට	07
යාපනය	01
එකතුව	**22**

(ii) කම්කරු අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ප්‍රතිපත්ති සම්පාදන හා විදේශ සබඳතා) යටතට පවරා ඇත.

(iii) ඔව්.

(ආ) (i) 2021 සිට 2026 දක්වා අරමුදල සඳහා අයදුම් පත් 34,750ක් ලැබී ඇත.

ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව							
වර්ෂය	**2021**	**2022**	**2023**	**2024**	**2025**	**2026**	**එකතුව**
නීති ආඥාර	31	61	51	10	11	18	**182**
ශිෂ්‍යත්ව ආඥාර	56	130	80	55	70	43	**434**
වෛද්‍ය ආඥාර	07	07	14	03	34	-	**65**
ආපදා සහන අධ්‍යාපන ආඥාර	-	2,000	2,200	739	-	-	**4,939**
සනීපාරක්ෂක වැඩසටහන	147	-	-	-	-	-	**147**
වෙනත් අධ්‍යාපන ආඥාර	-	-	-	28,983	-	-	**28,983**
එකතුව	**241**	**2,198**	**2,345**	**29,790**	**115**	**61**	**34,750**

- වෙනත් අධ්‍යාපන ආඥාර දිස්ත්‍රික්ක අනුව ලබා දී ඇති ආකාරය **ඇමුණුම I*** මඟින් දක්වා ඇත.

(ii)

වර්ෂය	**2021**	**2022**	**2023**	**2024**	**2025**	**2026**
නීති ආඥාර						
අනුමත කළ සංඛ්‍යාව	24	38	46	03	22	02
ප්‍රතික්ෂේප කළ/වසා දමන ලද සංඛ්‍යාව	05	12	11	01	37	03
ඉතිරි සංඛ්‍යාව	40	51	45	51	03	16
ශිෂ්‍යත්ව ආඥාර						
අනුමත කළ සංඛ්‍යාව	49	83	78	38	40	11
ප්‍රතික්ෂේප කළ/වසා දමන ලද සංඛ්‍යාව	04	37	21	10	24	08
ඉතිරි සංඛ්‍යාව	20	30	11	18	24	22
වෛද්‍ය ආඥාර						
අනුමත කළ සංඛ්‍යාව	04	06	14	03	31	-
ප්‍රතික්ෂේප කළ/වසා දමන ලද සංඛ්‍යාව	03	01	-	-	03	-
ආපදා සහන අධ්‍යාපන ආඥාර						
අනුමත කළ සංඛ්‍යාව	-	2,000	2,200	739	-	-
සනීපාරක්ෂක වැඩසටහන						
අනුමත කළ සංඛ්‍යාව	147	-	-	-	-	-
වෙනත් අධ්‍යාපන ආඥාර						
අනුමත කළ සංඛ්‍යාව	-	-	-	28,983	-	-

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

(iii)

වර්ෂය	ලබා දී ඇති මූල්‍ය ආධාර ප්‍රමාණය (රුපියල් මිලියන)
2021	14.4
2022	18.23
2023	20.08
2024	75.42
2025	6.35
2026	3

- වර්ෂය, දිස්ත්‍රික්කය සහ ආධාර වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් **ඇමුණුම II*** මඟින් දක්වා ඇත.

(ඇ)

පළාත	ලද අයදුම්පත් ප්‍රමාණය
උතුරු පළාත	4,877
නැඟෙනහිර පළාත	3,511
මධ්‍යම පළාත	3,736
එකතුව	**12,124**

මෙම කාලය තුළ ප්‍රදානය කළ මුළු මූල්‍යාධාර ප්‍රමාණය 34,750ක් වේ. උතුරු, නැඟෙනහිර සහ මධ්‍යම පළාත් සඳහා ප්‍රදානය කළ මූල්‍යාධාර මුළු මූල්‍යාධාර ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස සියයට 35ක් වේ.

(ඈ) පැන නොනඟී.

(අ) (i) 2026.09.30ආම් දිනයින්පසු නිලුවෙයිලුල්ල විණ්ණප්පංකළින් එණ්ණික්කෙ

சட்ட உதவி	
மாவட்டம்	**விண்ணப்பங்களின் எண்ணிக்கை**
கண்டி	27
பதுளை	5
நுவரெலியா	13
கேகாலை	1
புத்தளம்	1
களுத்துறை	5
கம்பஹா	4
கொழும்பு	11
குருநாகல்	2
காலி	4
இரத்தினபுரி	2
அம்பாறை	1
மாத்தளை	1
மாத்தறை	2
ஹம்பாந்தோட்டை	12
மொத்தம்	**91**

(ii) தொழில் அமைச்சின் மேலதிகச் செயலாளர் (கொள்கை வகுத்தல் மற்றும் வெளிநாட்டு உறவுகள்) அவர்களின்கீழ் ஒப்படைக்கப் பட்டுள்ளது.

(iii) ஆம்.

(ஆ) (i) 2021ஆம் ஆண்டு முதல் 2026ஆம் ஆண்டு வரை நிதியத்திற்கு 34,750 விண்ணப்பங்கள் கிடைக்கப்பெற்றுள்ளன.

கிடைக்கப்பெற்ற விண்ணப்பங்களின் எண்ணிக்கை							
ஆண்டு	**2021**	**2022**	**2023**	**2024**	**2025**	**2026**	மொத்தம்
சட்ட உதவி	31	61	51	10	11	18	**182**
புலமைப்பரிசில் உதவி	56	130	80	55	70	43	**434**
மருத்துவ உதவி	07	07	14	03	34	-	**65**
அனர்த்த நிவாரணக் கல்வி உதவி	-	2,000	2,200	739	-	-	**4,939**
துப்புரவு நிகழ்ச்சித்திட்டம்	147	-	-	-	-	-	**147**
ஏனைய கல்வி உதவிகள்	-	-	-	28,983	-	-	**28,983**
மொத்தம்	**241**	**2,198**	**2,345**	**29,790**	**115**	**61**	**34,750**

- ஏனைய கல்வி உதவிகள் மாவட்ட ரீதியாக வழங்கப் பட்டுள்ள விபரங்கள் **இணைப்பு I***இல் குறிப்பிடப் பட்டுள்ளன. (சிங்கள மொழியிலுள்ள இணைப்பு Iஐப் பார்க்கவும்)

(ii)

ஆண்டு	**2021**	**2022**	**2023**	**2024**	**2025**	**2026**
சட்ட உதவி						
அங்கீகரிக்கப்பட்ட எண்ணிக்கை	24	38	46	03	22	02
நிராகரிப்புகளின்/ மூடல்களின் எண்ணிக்கை	05	12	11	01	37	03
எஞ்சியுள்ள எண்ணிக்கை	40	51	45	51	03	16
புலமைப்பரிசில் உதவி						
அங்கீகரிக்கப்பட்ட எண்ணிக்கை	49	83	78	38	40	11
நிராகரிப்புகளின்/ மூடல்களின் எண்ணிக்கை	04	37	21	10	24	08
எஞ்சியுள்ள எண்ணிக்கை	20	30	11	18	24	22
மருத்துவ உதவி						
அங்கீகரிக்கப்பட்ட எண்ணிக்கை	04	06	14	03	31	-
நிராகரிப்புகளின்/ மூடல்களின் எண்ணிக்கை	03	01	-	-	03	-

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ஆண்டு	2021	2022	2023	2024	2025	2026
அனர்த்த நிவாரணக் கல்வி உதவி						
அங்கீகரிக்கப்பட்ட எண்ணிக்கை	-	2,000	2,200	739	-	-
துப்புரவு நிகழ்ச்சித்திட்டம்						
அங்கீகரிக்கப்பட்ட எண்ணிக்கை	147	-	-	-	-	-
ஏனைய கல்வி உதவிகள்						
அங்கீகரிக்கப்பட்ட எண்ணிக்கை	-	-	-	28,983	-	-

(iii)

ஆண்டு	வழங்கப்பட்ட நிதியுதவித் தொகை (ரூ. மில்லியன்)
2021	14.4
2022	18.23
2023	20.08
2024	75.42
2025	6.35
2026	3

- வருடம், மாவட்டம் மற்றும் உதவி வகை ஆகியவற்றின் அடிப்படையில் தனித்தனியாக **இணைப்பு II*இல்** குறிப்பிடப் பட்டுள்ளது. (சிங்கள மொழியிலுள்ள இணைப்பு IIஐப் பார்க்கவும்)

(இ)

மாகாணம்	கிடைக்கப்பெற்ற விண்ணப்பங்களின் எண்ணிக்கை
வடக்கு மாகாணம்	4,877
கிழக்கு மாகாணம்	3,511
மத்திய மாகாணம்	3,736
மொத்தம்	**12,124**

இக்காலப்பகுதியில் வழங்கப்பட்ட மொத்த நிதியுதவிகளின் எண்ணிக்கை 34,750 ஆகும். வடக்கு, கிழக்கு மற்றும் மத்திய மாகாணங்களுக்கு வழங்கப் பட்ட நிதியுதவிகள், மொத்த நிதியுதவிகளில் 35% ஆகும்.

(ஈ) எழவில்லை.

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

(a) (i) The number of pending applications as at 30th September, 2026.

Legal Aid	
District	**Number of Applications**
Kandy	27
Badulla	5
Nuwara Eliya	13
Kegalle	1
Puttalam	1
Kalutara	5
Gampaha	4
Colombo	11
Kurunegala	2
Galle	4
Ratnapura	2
Ampara	1
Matale	1
Matara	2
Hambantota	12
Total	**91**

Scholarships	
District	**Number of Applications**
Kandy	02
Nuwara Eliya	03
Puttalam	03
Colombo	02
Galle	04
Hambantota	07
Jaffna	01
Total	**22**

(ii) It has been assigned to the Additional Secretary (Policy Formulation and Foreign Relations) of the Ministry of Labour.

(iii) Yes.

(b) (i) A total of 34,750 applications were received by the Fund from 2021 to 2026.

Number of Applications Received							
Year	**2021**	**2022**	**2023**	**2024**	**2025**	**2026**	**Total**
Legal Aid	31	61	51	10	11	18	**182**
Scholarships	56	130	80	55	70	43	**434**
Medical Assistance	07	07	14	03	34	-	**65**
Disaster Relief and Educational Assistance	-	2,000	2,200	739	-	-	**4,939**
Sanitation Programme	147	-	-	-	-	-	**147**
Other Educational Assistance	-	-	-	28,983	-	-	**28,983**
Total	**241**	**2,198**	**2,345**	**29,790**	**115**	**61**	**34,750**

* The details of other educational assistance provided by district is set out in Annex I*. (Refer to Annex I in Sinhala)

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

(ii)

Year	2021	2022	2023	2024	2025	2026
Legal Aid						
Number of Applications Approved	24	38	46	03	22	02
Number of Applications Rejected/ Closed	05	12	11	01	37	03
Number of Pending Applications	40	51	45	51	03	16
Scholarships						
Number of Applications Approved	49	83	78	38	40	11
Number of Applications Rejected/ Closed	04	37	21	10	24	08
Number of Pending Applications	20	30	11	18	24	22
Medical Assistance						
Number of Applications Approved	04	06	14	03	31	-
Number of Applications Rejected/ Closed	03	01	-	-	03	-
Disaster Relief and Educational Assistance						
Number of Applications Approved	-	2,000	2,200	739	-	-
Sanitation Programme						
Number of Applications Approved	147	-	-	-	-	-
Other Educational Assistance						
Number of Applications Approved	-	-	-	28,983	-	-

(iii)

Year	Amount of Financial Assistance Provided (Rs. Million)
2021	14.4
2022	18.23
2023	20.08
2024	75.42
2025	6.35
2026	3

* The details are provided separately by year, district and type of assistance in Annex II*. (Refer to Annex II in Sinhala)

(c)

Province	Number of Applications Received
Northern Province	4,877
Eastern Province	3,511
Central Province	3,736
Total	12,124

A total of 34,750 applications were received during this period. The financial assistance provided to the Northern, Eastern, and Central Provinces accounts for 35 per cent of the total financial assistance provided.

(d) Does not arise.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

සැ.යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මීන් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

NOTE

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

Contents of Proceedings :

Final set of manuscripts Received from Parliament :

Printed copies dispatched :

හැන්සාඩ් වාර්තා
කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්
මිල දී ගත හැක.

මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්
බාගත හැක.

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.